

71 කැරැල්ලට වසර 50යි
කැරලිකරුවන් සොයා
දිස්ත්‍රික්ක 17කට
සිළුමිණ ගිය ගමන

14-15 ▸▸


# සිළුමිණ

சிழுமின The Silumina

- ආරම්භය - 1930 මාර්තු 30
- 92 වැනි කාණ්ඩය 14 වැනි පත්‍රය
- ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී
- ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මීන රවි 25 භාග මැදින් අව අටවක ඉරිදා
- වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස 04 වැනි ඉරිදා

අද පත්‍රය පිටු 108 | මිල රුපියල් 80.00


# අලුත් ඊපීඑෆ් පනතින්



# ලක්ෂ 35කට වැඩි වාසි

## හාම්පුතුන්ට පැන යාමේ මඟ ඇහිරේ

## කම්කරු උසාවිවල නඩු පවරන්නත් කොමසාරිස්ට බලය

(තාරක වික්‍රමසේකර)

**පෞද්ගලික අංශයේ හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයන්ගේ අර්ථසාධක, පාරිතෝෂික හා වන්දි ගැටලු කඩිනමින් විසඳීම සඳහා නව පනතක් ලබන මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව කම්කරු අමාත්‍ය නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා සිළුමිණට කීය.**

ඒ අනුව රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල හා පෞද්ගලික අංශයේ සේවය කරන සේවක සේවිකාවන් ලක්ෂ 36කට ආසන්න පිරිසකට විශාල ආරක්ෂාවක් සැලසෙන බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය. ඇතැම් අර්ථසාධක නඩු අවුරුදු 10ක් පමණ අධිකරණවල විභාග වන බවත් මේ නිසා විශ්‍රාම ගිය සේවකයාට විශාල අපහසුතාවක් තම අර්ථසාධක ලබා ගැනීමේදී සිදු වන බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

නව පනතට අනුව අර්ථසාධක සම්බන්ධව හෝ පාරිතෝෂික දීමනා සම්බන්ධව හෝ කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා විසින් සේව්‍යයාට ගෙවන්නට නියම කරනු ලබන මුදලට එරෙහිව ඉහළ අධිකරණයක් කරා යන්නේ නම් එම මුදල අනිවාර්යයෙන්ම කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා වෙත හෝ පළමු තීන්දුව ලබා දුන් අධිකරණයේ තැන්පත් කළ යුතුය.

අර්ථසාධක, පාරිතෝෂික හා වන්දි ලබාදීම සම්බන්ධ ගැටලුවලදී මේ දක්වා සිදුව ඇත්තේ කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමෙන් පසු අදාළ මුදල් නොගෙවා නඩුව මහාධිකරණයටත් එතැනින්ද එම තීන්දුවම ලබා දුනහොත් අභියාචනාධිකරණයටත් ඉන් පසු ශ්‍රේෂ්ඨාධිකරණයටත් දක්වා යාමට සේව්‍යයන් විසින් කටයුතු කිරීම බවද ඇමැතිවරයා පෙන්වා දෙයි.

මේ වන විට අර්ථසාධක හා පාරිතෝෂික දීමනා සම්බන්ධ නඩු 15,078ක් අධිකරණවල විභාග වෙමින් පවතින බවද ඇමැතිවරයා කීවේය.



කිරි දෙන්න ඉඩ දෙන්න

02 ▸▸



ඇමැති විමල්ට හූ කිව්වේ ඇයි ?

03 ▸▸



විවෘත සරසවියේ අවනඩුව

13 ▸▸



පන්නිපිටියේ යකා නැටූ 'රෙස්ලින් රාලහාමි'

16 ▸▸

## සහන මල්ලට ලොකු ඉල්ලුමක්

(නිහාල් පී. අබේසිංහ)

**මෙරට ඉතිහාසයේ සතොස වැඩිම ආදායම පසුගිය බ්‍රහස්පතින්දා හා සිකුරාදා දිනවල ලැබුණු බව වෙළෙඳ අමාත්‍යාංශය පවසයි.**

මේ පිළිබඳව කරුණු පැහැදිලි කරන වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන පවසන්නේ සතොස අලෙවි සල් ජාලය හරහා ක්‍රියාත්මක සතොස සහන මල්ල නිසා හා අඩු මිලට අත්‍යවශ්‍ය ආහාර වර්ග 27 ක් දීම නිසා මෙම තත්ත්වය ඇතිවී ඇති බවයි.

4 වැනි පිටුවට

## මෙවර අවුරුදු සිරිය ඉහළින්ම



**කොරෝනා වසංගතය නිසා පසුගිය වසරේ අලුත් අවුරුද්ද සැමරීමට ශ්‍රී ලාංකේය ජනතාවට අවස්ථාවක් නොමැති විය. එහෙත් මෙවර ජනතාව කොරෝනා මධ්‍යයේ වුවද අවුරුදු සැමරීමට සූදානම් වන්නේ ගම්බිම් බලා යාමට පෙර නෑදෑ හිතවතුන්ට පිරිනැමීමට ඇඳුම් පැලඳුම් ආදිය ලබා ගැනීමෙනි. කොළඹ පිටකොටුවේදී පසුගිය සිකුරාදා පස්වරුවේ සිළුමිණ ඡායාරූප ශිල්පී ගයාන් පුෂ්පිකගේ කැමරාවට අසු වූ මේ සේයාරුවෙන් කියා පාන්නේ මෙවර අවුරුද්ද සැමරීමට ජනතාව සෞඛ්‍යාරක්ෂිතව කටයුතු කරනා අයුරුය.**

## ඩී.ආර්.විජයවර්ධන සමරුවට ලේක්හවුස්හිදී පිංකම්



ලේක්හවුස් නිර්මාතෘ ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ 135 ජන්ම සංවත්සරය නිමිත්තෙන් සිකුරාදා හා සෙනසුරාදා දිනවල ලේක්හවුස් ආයතන පරිශ්‍රයේදී පිංකම් මාලාවක් පැවැත්විණි.

ඒ මහතාගේ 135 වැනි ජන්ම දින සැමරුම පසුගිය පෙබරවාරි 23 දාට යෙදී තිබුණේ ය.

ඒ අනුව සිකුරාදා රාත්‍රි සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්මදේශනයක් හා සෙනසුරාදා දහවල් සපිරිකර සංඝගත දක්ෂිණාවක් ද පැවැත්විණි.

### මැතිවරණ තේරීම් කාරක සභා යෝජනාව

## සඳුදා පාර්ලිමේන්තුවට

**මැතිවරණ පැවැත්වීම සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ පවත්නා අඩුපාඩුකම් හඳුනා ගැනීම සඳහා පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවක් පත් කිරීමේ යෝජනාව 5 වැනි සඳුදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යෝජිතය. විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන විසින් යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.**

මැතිවරණ කටයුතු වෙනුවෙන් විශේෂ තේරීම් කාරක සභාවක් පත් කළ යුතු බවට අගමැති මහින්ද රාජපක්ෂයන් විසින් යෝජනා කර තිබූ අතර එම විශේෂ තේරීම් කාරක සභාව සාමාජිකයන් 15 දෙනෙක්ගෙන් සමන්විතවේ.

4 වැනි පිටුවට

## අවුරුද්දට ගමේ යන්න විශේෂ දුම්රිය 21ක්

(තාරක වික්‍රමසේකර)

**අලුත් අවුරුදු සමයේ ගම්බිම් බලා යන ජනතාවගේ පහසුව තකා විශේෂ දුම්රිය 21ක් ලබන 9 වැනිදා සිට ධාවනයට යොදවනු ලබන බව දුම්රිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන) ගාමිණී සෙනෙවිරත්න සිළුමිණට කීය.**

මේ අතුරින් කොළඹ කොටුව සහ බදුල්ල අතර ධාවනය වන දෙනුවර මැණිකේ නගරාන්තර දුම්රිය මේ වන විටත් ගමන් ආරම්භ කර ඇතැයිද එම දුම්රියට අමතරව දුර සේවා දුම්රිය කිහිපයක් හා දකුණු කළුතර හා රඹුක්කන අතර වැඩි දුම්රිය ප්‍රමාණයක්ද අනෙක් මාර්ගවලද දුම්රියන් ධාවනය කිරීමට කටයුතු යොදා ඇතැයි සෙනෙවිරත්න මහතා කීය. මෙම විශේෂ දුම්රිය සේවා අප්‍රේල් 19 වැනිදා දක්වා පැවැත්වෙනු ඇතැයිද ඔහු පැවසීය.

4 වැනි පිටුවට



## පාස්කු ප්‍රහාරයේ අනු කමිටු වාර්තාව 05දා ජනපතිට

**පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ සලකා බැලීමට පත් කෙරුණු අමාත්‍ය අනුකමිටුවේ වාර්තාව ජනාධිපතිවරයා බාරදීම හෙට 5 වැනි දා සඳුදා සිදු කෙරේ.**

**අනුකමිටු වාර්තාව පසුගිය 31 වැනිදා බාරදීමට නියමිතව තිබුණු නමුත් කමිටු වාර්තාවේ පූර්ණ වාර්තාවක් ලබා දීමට අවශ්‍ය නිසා 5 වැනිදා දක්වා එය කල් දමන ලදී.**

## උණුසුම වැඩිවෙයි

(නිහාල් පී. අබේසිංහ)

**අප්‍රේල් 05 සිට අප්‍රේල් 14 දින දක්වා ශ්‍රී ලංකාවට හිරු මුඳුන්වීම සිදුවෙන බවත් ඒ නිසා ඒ දිනවල මෙරට බොහෝ ප්‍රදේශවල උණුසුම් කාලගුණයක් බල පැවැත්වෙන බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසයි.**

**ඒ අනුව 5 වැනිදා තෙල්වත්ත, බද්දේගම, මුලටියන හා අඟුණකොළපැලැස්ස යන නගරවලටත් 6 වැනිදා දොඩන්ගොඩ, අගලවත්ත යන ප්‍රදේශවලටත් හිරු මුඳුන් වෙයි.**

**7 වැනිදා කොළඹට හා කොස්ගම සීතාවක තලවකැලේ පස්සර යන ප්‍රදේශවලට හිරු මුඳුන් වන අතර 8 වැනිදා හිරු මුඳුන්වන්නේ දිගන, ගල්ගමුව, අම්පාර, ඔලුවිල් යන නගරවලට හිරු මුඳුන්වෙයි.**

## ඇඟලුම් සේවකයන් කබළෙන් ළිපට

(අමිල මලවිසූරිය)

**කොවිඩ් 19 වසංගත තත්ත්වයට මුවාවී ඇඟලුම් කර්මාන්ත සේවකයන් ලක්ෂ තුනකගේ පමණ අයිතිවාසිකම් දිගින් දිගටම කප්පාදු කරමින් කර්මාන්තශාලා හිමියන් ලාබ ලබමින් සිටින බව නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමයේ සමලේකම් ඇන්ටන් මාකස් සිළුමිණට පැවැසීය.**

ඉකුත් සමය තුළදී නිදහස් වෙළෙඳ කලාප සේවකයන් 55,000කගේ පමණ රැකියාද අහිමිකොට ඇති බවත් 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාසයන්හි සමස්ත නිදහස් වෙළෙඳ කලාප සේවකයන්ගේ දළ මාසික වේතනයෙන් 40%ක පමණ ප්‍රමාණයක් අහිමිකර ඇති බවත් එය ඇමෙරිකානු ඩොලර් මිලියන 24ක පමණ අතිවිශාල මුදලක් බවද හෙතෙම කීවේය.

4 වැනි පිටුවට




## වැලිකන්ද සභාපතිගේ පැටිකිරිය එළියට

**වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා එම ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධ විස්තර ලබන සඳුදා වන විට හෙළි කිරීමට හැකි වන බව උතුරුමැද ආණ්ඩුකාර මහීපාල හේරත් සිළුමිණට කීවේය.**

වැලිකන්ද ප්‍රාදේශීය සභා සභාපති කවිඳු අබේසූරිය විසින් සිදු කරන ලදැයි කියන අකටයුතුකම් පිළිබඳව විමර්ශනය කළ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු සමන් වික්‍රමාරච්චිගේ ප්‍රධානත්වයෙන් විමර්ශන කමිටුවෙන් කළ නිර්දේශ අනුව ලේකම්වරයා විසින් ඔහු ඉවත් කිරීමට අදාළ ගැසට් නිවේදනය සකස් කර ඇති බවත් අදාළ සවිස්තරාත්මක වාර්තාව සඳුදා තමන්ට ලැබුණු විට ඒ සම්බන්ධ සියලු තොරතුරු හෙළි කළ හැකි බවද ආණ්ඩුකාරවරයා පැවසුවේය.




බාධා නැති සීමා නැති
SLTMobitel Home 4G
දැන් පුළුල් ආවරණයක් සහිතව

නිවසේ සිටම ඉගෙන ගන්න... වැඩ කරන්න... විනෝද වෙන්න... මේ කුමන අවශ්‍යතාවයක් වුවත්, නිවසේ ඕනෑම තැනක හිඳ කිසිදු බාධාවකින් තොරව ඉටුකරගන්න, SLTMobitel 4G බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණය දැන් ඔබ වෙනුවෙන් වඩාත් ශක්තිමත් කර ඇත.

www.sltmobitel.lk



# ‘කිරි දෙන්න ඉඩ දෙන්න’

## උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ ප්‍රසූත නිවාඩු කප්පාදුවේ ගැටලුව

● හර්ෂා සුගතදාස

**“මාතෘ සුරක්ෂිතතාව මූලික මානව අයිතිවාසිකමක් වන අතර පවුල සහ රැකියාව සම්බන්ධ පූර්ණ ප්‍රතිපත්ති සකස් කිරීමේදී ද අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු අංගයකි. වැඩපොළේදී කාන්තාව නොසලකා හැරීමට ලක් නොවීම සහ මවගේත් දරුවාගේත් සෞඛ්‍යාරක්ෂාව ප්‍රවර්ධනය උදෙසා එය තීරණාත්මක සාධකයකි. (ලෝක කම්කරු සංවිධානය)” සේවා ආයතනයේ මාතෘ සුරක්ෂිතතාව හා බැඳුණු කම්කරු අයිතීන් පිළිබඳ පළමු ප්‍රඥප්තිය සම්මත කෙරුණේ ලෝක කම්කරු සංවිධානයේ සමාරම්භක ජාත්‍යන්තර සමුළුවේදීය. කාල වකවානුව සලකා බලන විට 1919 තරම් ඈතට දිව යයි.**

ශ්‍රී ලංකාවේ මාතෘ ප්‍රතිලාභ හිමිකම් පිළිබඳව විමසා බැලීමේදී ඒ සම්බන්ධයෙන් ප්‍රථම වරට ක්‍රියාත්මක වී තිබෙන්නේ ලංකාව ඉංග්‍රීසීන්ට යටත්ව තිබූ 1939 වර්ෂයේදී ය. ඒ, 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත මඟිනි. දරු ප්‍රසූතියක් සඳහා සේවිකාවන්ට නිවාඩු දීම, නිවාඩු කාලයට වැටුප් ගෙවීම, දරුවාට මවුකිරි දීම සඳහා විවේක කාලයක් ලබාදීම යන කරුණු කෙරෙහි එයින් අවධානය යොමුකර තිබිණි. ඉන්පසුව 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ 18 වැනි වගන්තිය යටතේ ප්‍රසූත නිවාඩු හිමිකම තවදුරටත් තහවුරු විය.

මේ ආකාරයට කාර්යාල සේවිකාවක් මාතෘත්වයට පත්වූ විට ප්‍රසූත නිවාඩු හිමිකම නීතිගත කර තිබෙන්නේ මාතෘත්වය සුරක්ෂිත කිරීම මූලික මානව හිමිකමක් වන නිසා ය. මේ වනවිට රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවන්හි නිරත කාන්තාවන්ට වැඩ කරන දින 84 ක ප්‍රසූත නිවාඩුවක් හිමිවේ. එයින් උපරිම දින 14 ක් ප්‍රසූතියට පෙර හා දින 70 ක් ප්‍රසූතියට පසු ගත හැකි ය. 2005/4 චක්‍රලේඛයට අනුව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 18.1 වගන්තියෙන් ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධාරිනියන්ට ප්‍රසූති නිවාඩු හිමිකම තවදුරටත් තහවුරු වී ඇත. ඊට අමතරව 18.2 වගන්තියෙන් වැටුප් සහිත ප්‍රසූති නිවාඩු ද 18.3 වගන්තියෙන් අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු ද 18.4 වගන්තියෙන් වැටුප් රහිත ප්‍රසූති නිවාඩු ද දක්වා තිබේ. මවක් වන කාන්තාවකට ප්‍රසූති නිවාඩු ලබාදීම නීති මඟින් තහවුරු කර තිබෙන්නේ අලුත උපන් බිළිඳාට මවුකිරෙන් පෝෂණය වීමේ අයිතිය සුරක්ෂිත කරමිනි. අලුත උපන් බිළිඳකුට මුල් මාස 6 තුළ මවුකිරි දිය යුතු බවත් ඉන් අනතුරුව අතිරේක ආහාර සමඟ අවුරුදු 2 ක කාලයක් මවුකිරෙන් පෝෂණය කළ යුතු බවත් සෞඛ්‍ය නිර්දේශයයි.



### ‘කැබිනට් පත්‍රිකාව සකස් කර යවා තිබෙනවා’

- රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ජේ. ජේ. රත්නසිරි

එහෙත් මේ වනවිට රාජ්‍ය සේවයට බඳවා ගෙන සිටින අභ්‍යාසලාභි උපාධිධාරීන්ට ලබාදෙන ප්‍රසූත නිවාඩු දින 42 ක් ලෙස ඔවුන්ගේ පත්වීම් ලිපිවල සඳහන් වී තිබේ.

“අභ්‍යාසලාභී උපාධිධාරීන් 51,000 කට ගිය සැප්තැම්බර් 02 වැනිදා පත්වීමේ ලිපි ලබාදුන්නා. ඒ ලිපිවල ප්‍රසූත නිවාඩු දින 42 ක් ලෙස සඳහන් කර තිබෙනවා. ආයතන සංග්‍රහයේ 12 වැනි පරිච්ඡේදයේ 18.1 වගන්තියේ සඳහන් වී තිබෙනවා ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධාරිනියන්ට දින 84 ක ප්‍රසූති නිවාඩු හිමිවන බව. ආයතන සංග්‍රහයට පිටින් ගිහින් තමයි ආණ්ඩුව මේ අයට දින 42 ක ප්‍රසූත නිවාඩු දීලා තිබෙන්නේ. කෙළින්ම දින 42 ක් කප්පාදු කරලා. මෙය මවුවරුන්ගේ මානව හිමිකම් කඩවීමක්. ඒ නිසා අපි සැප්තැම්බර් 07 වැනිදා මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. දැන් මාස 6 කුත් ගත වුණා. මාස 6 ක් ගෙවුණට පසුව එය විභාගයට ගැනීමට සූදානම් වෙනවා. මේ අසාධාරණය ගැන කියලා අපි ජනාධිපති, අගමැති, විෂය භාර නිලධාරීන් ඇතුළු හැමෝම දැනුම්වත් කළා.” යනුවෙන් අදහස් දක්වමින් සාකච්ඡාවට පිවිසියේ ඒකාබද්ධ සංවර්ධන නිලධාරීන්ගේ මධ්‍යස්ථානයේ ලේකම් ධම්මික මුණසිංහ ය.

ඔහු තවදුරටත් සඳහන් කරන්නේ ප්‍රසූත නිවාඩු කප්පාදුවට මුහුණ දී සිටින්නේ පසුගිය සැප්තැම්බර් මාසයේ බඳවා ගත් උපාධිධාරිනියන් පමණක් නොවන බවයි. පෙබරවාරි මාසයේ බඳවා ගත් උපාධිධාරිනියෝ ද අඩු ආදායම්ලාභීන් ලෙසින් රාජ්‍ය සේවයට බඳවා ගත් ලක්ෂයට ඇතුළත් කාන්තාවෝ ද ප්‍රසූත නිවාඩු දින 42 ක කප්පාදුවට අයත් අය වෙති. දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් හමුවී දින 84 ක ප්‍රසූත නිවාඩුවක් හිමි විය යුතු බව පෙන්වා දී තිබේ. එහිදී දින 84 ක ප්‍රසූත නිවාඩුවක් ලබාදීමට කැබිනට් පත්‍රිකාවක් සූදානම් කරන ලෙස අමාත්‍යවරයා අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ. රත්නසිරිට දන්වා තිබේ. අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් එය ලේකම්වරයාට දන්වා ඇත්තේ දෙසැම්බර් 24 දාතමින් යුතු ලිපියකිනි. එහෙත් අමාත්‍යවරයා සඳහන් කළ ආකාරයට කැබිනට් පත්‍රිකාවක් සූදානම් වූයේ නැත.

“ඇමැතිවරයාගේ නියෝගය අමාත්‍යාංශ ලේකම් ක්‍රියාත්මක කරන්නේ නැහැ කියන්නේ මේක හරිම විහිළුවක්. වෙලාවකට අපිට හිතෙනවා මේක එකිනෙකාට බෝලය පාස් කර ගැනීමක් ද කියලා. ඒ නිසා අපි නැවතත් අමාත්‍යවරයාට මේ ගැන මතක් කළා. 2021 මාර්තු 02 වැනිදා අමාත්‍යාංශ ලේකම්වරයාට නැවතත් ලිපියක් යැව්වා. මෙවර අමාත්‍යවරයා එහි සඳහන් කළා දින 14 ක් ඇතුළත කැබිනට් පත්‍රිකාව සූදානම් කළ යුතු බව. දැන් දින 14 නෙමෙයි මාසයක් ගෙවිලා ඉවරයි. තවම මුකුත් සිද්ධ වුණේ නැහැ.” යනුවෙන් ඒකාබද්ධ සංවර්ධන නිලධාරීන්ගේ මධ්‍යස්ථානයේ ලේකම් ධම්මික මුණසිංහ පැවසීය.

සැප්තැම්බර් මාසයේ බඳවා ගත් අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ සේවා කාලය මේ වනවිට මාස 6 ඉක්මවා තිබේ. පෙබරවාරි මාසයේ බඳවා ගත් අයගේ සේවා කාලය මාසයක් ගත වී තිබේ. මෙම අභ්‍යාසලාභී උපාධිධාරීන්ගෙන් බහුතරයක් කාන්තාවෝ වෙති.

එහෙත් ඔවුන්ට හිමි විය යුතු සති 12 ක ප්‍රසූත නිවාඩුව තවමත් හිමිවී නැත. “අභ්‍යාසලාභී උපාධිධාරීන්ට ප්‍රසූත නිවාඩු දින 42 ක් හිමිවීම 2013 දී කැබිනට් පත්‍රිකාවකින් අනුමත වුණු දෙයක්. එහි සඳහන් වෙන්නේ සේවා කාලය මාස 9 ක් සම්පූර්ණ වනතුරු ප්‍රසූත නිවාඩු වශයෙන් දින 42 ක් හිමිවන බව. සේවා කාලය මාස 9 ක් සම්පූර්ණ වුණාට පස්සේ දින 84 ක ප්‍රසූත නිවාඩු ඒ අයටත් හිමි වෙනවා.

ඒත් 2019 දී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් දින 84 ක ප්‍රසූත නිවාඩු හිමිවන බවට චක්‍රලේඛයක් නිකුත් කරලා. ඒක වරදක්. නිවාඩු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මිස සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය නෙමෙයි. අනික ඒ අමාත්‍යාංශ ලේකම් නිකුත් කළ චක්‍රලේඛයට කැබිනට් අනුමැතියක් අරගෙන නැහැ. ඇත්තටම ඒක බලයක් නැති, වැරදියට නිකුත් කරපු චක්‍රලේඛයක්.

අමාත්‍යවරයා මට දැනුම් දුන්නානේ කැබිනට් පත්‍රිකාවක් හදන්න කියලා. මම ඒක හදලා යවලා තියෙන්නේ. එය අනුමත වුණොත් අපි දින 84 ක ප්‍රසූත නිවාඩු දෙනවා” යනුවෙන් පැහැදිලි කළේ රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි ය. වර්තමානයේ අපේ රටේ ජනගහනයෙන් බහුතරයක් කාන්තාවෝ ය. එය 52% කි. අද වනවිට රටේ ඉහළ තනතුරු දරන අයගෙන් වැඩි ප්‍රමාණයක් කාන්තාවෝ වෙති. තේ දළු නෙළන, ඇඟලුම් සේවයේ යෙදී සිටින, මැදපෙරදිග රටවල්වල සේවය කරන කාන්තාවන් අපේ රටට විදේශ විනිමය උපයාදෙන ආකාරය අපට කිසිසේත් අමතක කළ නොහැකිය. ගැබිනි මවුවරුන්ට බස් රථවල වෙන්වූ ආසනයක් තිබෙන්නේ මාතෘත්වයට ගෞරව කරමිනි. කාලයෙන් කාලයට පත්වන රජයන් කාන්තාවන් වෙනුවෙන් දුම්රිය මැදිරි වෙන් කරන්නේත් කාන්තාවන්ට පමණක් ගමන් කළ හැකි බස් රථ යොදන්නේත් කාන්තාවන්ට ගරු කිරීමක් වශයෙනි. එහෙත් අභ්‍යාසලාභී උපාධිධාරී කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු කප්පාදු කර වෙනම හැන්දකින් බෙදීම යුක්ති සහගත නැත. ඒ සම්බන්ධයෙන් ‘ස්ත්‍රී’ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා පද්මිණී වීරසූරියගෙන් විමසුවේ එබැවිනි. “මෙය අපි සම්පූර්ණයෙන් ම හෙළා දකිනවා. ඉස්සර ප්‍රසූත නිවාඩු වශයෙන් වැඩ කරන දින 84 අයිතිවෙලා තිබුණේ රාජ්‍ය අංශයට විතරයි. පෞද්ගලික අංශයට තිබුණේ නිකම්ම දින 84 ක්. ඒකට සෙනසුරාදා, ඉරිදා, පෝය ඇතුළු නිවාඩු දවස් සියල්ල ඇතුළත් වුණා. කාන්තා සංවිධාන, වෘත්තීය සමිති එකතුවෙලා හඬක් නගලා ජාත්‍යන්තර කම්කරු සංවිධානය දැනුවත් කරලා තමයි පෞද්ගලික අංශයේ කාන්තාවන්ටත් වැඩ කරන දින 84 ක් ප්‍රසූත නිවාඩු වශයෙන් හිමිවුණේ. මේ වනවිට 1 වැනි දරු ප්‍රසූතියටත් 2 වැනි දරු ප්‍රසූතියටත් වැඩ කරන දින 84 ක් හිමිවී තිබෙනවා. රාජ්‍ය හෝ පෞද්ගලික හෝ ස්ථිර හෝ අනියම් හෝ ඔවුන් සියලුදෙනාම රටේ ශ්‍රම බළකායට දායක වී සිටින කාන්තාවෝ.

ඔවුන් සියලුදෙනාටම මවු පදවිය ලැබීමේදී එක සමාන ආකාරයට වරප්‍රසාද හිමිවිය යුතුයි. අභ්‍යාසලාභී උපාධිධාරිනියන් ගැන කියන්න තියෙන්නෙත් ඒකම තමයි. අභ්‍යාසලාභීන් වුණා කියලා මවු පදවිය ලැබුණාම ඒ අයත් අනිත් අම්මලා වගේම තමයි. වෙනස් වෙන්නේ නැහැ. අනික දැන් වෛද්‍යවරු කියන්නේ අලුත උපන් දරුවන්ට මාස 6 ක් යන තුරු මවුකිරි දෙන්න කියලා. අඩුම ගණනේ වතුර ටිකක්වත් පොවන්න එපා කියනවා. වෛද්‍යවරුන් ඒ විදිහට උපදෙස් දෙන විට රජයෙන් ප්‍රසූත නිවාඩු කප්පාදු කිරීම හරිම අසාධාරණයි.



### ‘අභ්‍යාසලාභී මවුවරුන්ගේ දරුවන්ට පෝෂණය මදිවුණාට කමක් නැද්ද?’

- ස්ත්‍රී සංවිධානයේ අධ්‍යක්ෂිකා පද්මිණී වීරසූරිය

එතකොට අභ්‍යාසලාභී මවුවරුන්ගේ දරුවන්ට මන්දපෝෂණය හැදුණාට කමක් නැද්ද? මේ අම්මලා දරුවන් ලැබිලා දින 42 කට පසු සේවයට වාර්තා කළත් ඔවුන් ඉන්නේ හොඳ මානසික තත්ත්වයකින් නෙමෙයි. මවගේ උණුසුමෙන් කිරි බොන දරුවන් අත් හැරලා එන මවුවරුන් ලොකු මානසික පීඩනයෙන් ඉන්නේ. ඒ අයගෙන් හොඳ සේවයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා භේදයක් නැතිව සෑම වැඩ කරන කාන්තාවකටම වැඩකරන දින 84 ක ප්‍රසූත නිවාඩුවක් හිමි විය යුතුයි.” යනුවෙන් ස්ත්‍රී මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා පද්මිණී වීරසූරිය විස්තර කළාය. අමාත්‍යාංශ ලේකම් පැවසූ ආකාරයට අභ්‍යාසලාභී උපාධිධාරිනියන්ගේ ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාව සකස් කර අමාත්‍යවරයාට යවා අවසානය. දැන් තිබෙන්නේ එයට කැබිනට් අනුමැතිය හිමිවීම පමණි.



### ‘ඇමැතිවරයාගේ නියෝගය තමයි අමාත්‍යාංශ ලේකම් ක්‍රියාත්මක කරන්නේ’

- ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානයේ ලේකම් ධම්මික මුණසිංහ

---

● ටී. චන්ද්‍රසේකර

**බදුල්ල මොනරාගල මාර්ගයේ පස්සර 13 කණුව ප්‍රදේශයේ දී මගී ප්‍රවාහන බස් රථයක් ප්‍රපාතයට පෙරළීමෙන් 14 දෙනෙකු ජීවිතක්ෂයට පත් වූ අතර තවත් 34 දෙනෙකු බරපතළ ලෙස තුවාල ලැබීය. මෙසේ තුවාල ලැබූ සියල්ලන්ම සුවවූවත් ඔවුන්ගෙන් වැඩිපිරිසක් සදාකාලික ආබාධ සහිත පුද්ගලයන් වනු ඇත. එහෙත් අද ඇති ගැටලුව මේ අයගේ අනාගතයට වග කියන්නේ කවුද යන්නයි.**

මේ අනතුර සිදුවූ මොහොතේ පටන් මෙහි වගකීම බස් රථයේ හා ට්‍රක් රථයේ රියදුරු පිට පැටවීමට සියලු පාර්ශ්වයන් දැඩි උත්සාහයක නිරත වන බව පෙනෙන්නට තිබිණි. විශේෂයෙන් මෙම අනතුරට වගකිවයුතු ප්‍රධාන පාර්ශ්වයන් කිහිපයක් ඒ වෙනුවෙන් දැවැන්ත වැඩපිළිවෙළක් දියත් කළේ රියදුරන් බිල්ලට දී තමන් බේරෙන්නටය. මේ අනතුර සම්බන්ධයෙන් රියදුරන් දෙපළම වගකිවයුතු බව සැබෑය. අනතුර වළක්වා නොගැනීම, අපරීක්ෂාකාරී ධාවනය ඇතුළු වැරදි කිහිපයක් සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. ඒ සමඟම මෙම වදන් රියදුරන් පිට පමණක් පටවා ඇඟ බේරගන්නට උත්සාහ කරන උදවිය සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතුව ඇත.

මාරක බස් අනතුර සිදුවී දින 5කට පසු අනතුර සිදුවූ ස්ථානයේ අනතුරු සංඥා සවිකිරීමටත්, මාර්ගය අවහිරවන පරිදි මාර්ගයට ඇද වැටී අනතුරට ප්‍රධාන හේතු සාධකය වූ දැවැන්ත කළුගල මාර්ග සංවර්ධන අධිකාරියේ පිරිසක් එක්ව විද කඩා ඉවත් කිරීමටත් පියවර ගෙන තිබේ. මෙම අනතුරට පෙර ඒ කාර්ය සිදුකර තිබුණේ නම් මේ ජීවිත සියල්ල බේරා ගැනීමට තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය අනතුරෙන් පසුව සිදුකළ කාර්ය අනතුරට කලින් සිදු නොකළේ ඇයි?

බදුල්ල චෙන්කලඩි මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතිය කොටස් තුනකට වෙන්කර කොන්ත්‍රාත් සමාගම් තුනක් විසින් බාරගෙන තිබූ අතර බදුල්ල සිට පස්සර දක්වා වූ දුර කිලෝමීටර් 20 ක මාර්ගයේ ඉදිකිරීම අයි. සී. සී. සමාගම ලබාගත් කොන්ත්‍රාත් මුදල බිලියන 2.6 කි. මේ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට විස්සක් හෙවත් රුපියල් මිලියන 531 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර එහි වැඩ කටයුතු අවසන් කර ඇත.

පස්සර සිට ලුනුගල දක්වා වූ කිලෝමීටර් 21 ක් වූ කොටස රුපියල් බිලියන 2.7 කින් මාස 30ක කාලයක් තුළ නිම කිරීමට වීවීකේ - ඒ එම් එස් කේ/ වී කොන්ත්‍රාත් සමාගම රුපියල් මිලියන 556 ක් සමඟ බාරගෙන ඇත්තේ 12/01/2017 දිනය. එහි වැඩකටයුතු 11/07/2019 අවසන් විය යුතුව තිබුණ ද, එදිනට අවසන් නොකර 27/02/2020 දින දක්වා කාලය දීර්ඝ කරවාගෙන ඇත. එසේ වුවද මේ දක්වා අවසන් කර ඇත්තේ සියයට 76.8 ක ප්‍රමාණයකි. ලුනුගල සිට බිබිල දක්වා වූ කිලෝමීටර් 19 ක ප්‍රමාණය මාස 30 ක කාලයක් තුළ රුපියල් බිලියන 2.2 කින් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 401 ක අත්තිකාරම් මුදලක් සමඟ 26/07/2017 දින බාරගත් ඊබට් ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම මේ ව්‍යාපෘතිය 25/01/2020 දින අවසන් කළ යුතුව තිබුණත් 20/11/2020 දක්වා කාලය දීර්ඝ කරගෙන ඇතත් මේ දක්වාම නිම කර ඇත්තේ සියයට 52 ක් තරම් වැඩ කොටසකි.

බදුල්ල චෙන්කලඩි මාර්ගයේ ඉදිකිරීම් නිල වශයෙන් වැඩ කටයුතු පටන් ගත්තේ 2017 පෙබරවාර මස 19 වෙනි දින ඓතිහාසික බදුල්ල පුරවරය සමීපයෙනි. මෙදින රජය නියෝජනය කරමින් එවකට මහමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල සමඟ, නිමල් සිරිපාල ද සිල්වා, ඩිලාන් පෙරේරා, හරින් ප්‍රනාන්දු , චාමර සම්පත් දසනායක, ඌව පළාත් හිටපු ආණ්ඩුකාරවරුන් වූ නීතිඥ පී.බී.ජයසිංහ, ජනාධිපති නීතිඥ මාෂල් පෙරේරා යන අය සහභාගී වූහ.

එහි ව්‍යාපෘති වර්තාව සඳහන් කරන ආකාරයට වැඩ බිමෙහි ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය කොළඹ පිහිටුවා ඇත. අතර ඒ යටතේ MG සහ RDC නමින් හැඳින්වෙන උපදේශක සමාගම් දෙකකින් මෙහි පරිපාලන කටයුතු ඇතුළු අනෙකුත් කාර්යයන් ඉටු කරයි. මෙමව්‍යාපෘතිය සඳහා ඔපෙක් සංවිධානයෙන් හා සෞදි අරාබි රජයෙන් ද ලබා දී ඇති අතර ඩොලර් මිලියන 20,000 ක් රජය විසින් සපයා ඇත. එහි කාර්යක්ෂමතාව වැඩිකර ගැනීම උදෙසා එම උපදේශක සමාගම් හා බද්ධ කොට ICC, AMBC,KD EBERT,CEC,හා MAGA යන කෙටි නාමයන්ගෙන් ප්‍රකාශක කර ඇති පළමු පන්තියේ පිළිගත්, ක්‍රියාකාරී තවත් ඉදිකිරීම් ආයතන 5ක ක්‍රියාකාරීන් මෙම මාර්ග සංවර්ධන ක්‍රියාදාමයේ වැඩ බිමට බද්ධ කොට තිබුණි.

බදුල්ල සිට චෙන්කලඩි දක්වා කි.මී. 147 ක බිලියන ගණනක් වැය කර ඉදි කෙරෙන මාර්ග ව්‍යාපෘතියේ සියලු කටයුතු සඳහා කොළඹ පිහිටා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙක්, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙක්, අඩවි ඉංජිනේරුවන් පස්දෙනකු, අභ්‍යන්තර විගණක නිලධාරියෙක් ද කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිට මේ දක්වා මෙම නිලධාරීන් කී දවසක් බදුල්ලට පැමිණියේ ද, මාර්ගයේ කටයුතු අධීක්ෂණය කළේද යන්න කිසිවකුත් නොදන්නා තැනට ක්‍රියාත්මක වෙමින් පවතී. විගණන නිලධාරියා මේ ගැන විගණනය කළේ ද යන්නත් සැක සහිතය.

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු, උපදේශක සහ සේවා යෝජකයා (එනම් ව්‍යාපාති කළමනාකරණ අංශය) ඇතුළුව ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම මසකට වරක් පවත්වනු ලැබුවද, එහි සාකච්ඡා කළේ කුමක් පිළිබඳවද, එහිදි මෙවන් අවදානම් ස්ථාන හා ඊට පිළියම් යෙදීම පිළිබඳව කිසිවක් සාකච්ඡා කර හෝ මෙවැනි ගැටලු විසඳීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් නොගැනීමට හේතු වූ කාරණා කවරේද? මේ අවදානම් ගල ඉවත් කරන ලෙස ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන් මාර්ග සංවර්ධන අධිකාරියේ හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අවස්ථා රැසක දී ඉල්ලා ඇතත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැති බව ද අනාවරණය කෙරිණි. මාර්ග පළල් කිරීම සඳහා කඳු කැපීමේ දී ඇති වූ මේ අවදානම් ගල් පර්වතය පහතට ඇදී විත් දීර්ඝ කාලයක් පවතින බැවින්, එය මේ අනතුර සිදුවන තෙක්ම ඉවත් කිරීමට පියවර නොගැනීම සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය කරන ඉහළ පෙළේ වගකිවයුතු නිලධාරියකු ලෙස අවසාන වගකීම ඔහු විසින්ම බාර ගත යුතු නොවේද?.

වසර 100 ඉක්මවූ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් මාර්ගයක් ලෙසට මෙය ලේඛනගත කොට ඇත. ඒ නිසා අදාළ සාමාගම්වලට පනවා ඇති යම් යම් නියමයන්ට යටත්ව මාර්ගයේ ඇතැම් කොටස් වැඩි දියුණු කිරීමට සිදු ව තිබිණි. උදාහරණයක් ලෙස මාර්ගයේ හඳුනාගෙන තිබූ බෝක්කු 800 සහ පාලම් 57 වැඩිදියුණු කිරීමේදී යම් යම් සීමාවන්ට යටත්ව කටයුතු කිරීමට අදාළ සමාගම්වලට උපදෙස් ලබා දී වැඩ ආරම්භ කර තිබිණි. එසේ වැඩ ආරම්භ කරන මොහොතේ බදුල්ල MG සමාගමේ ප්‍රධාන උපදේශක කණ්ඩායම් නායක ඉංජිනේරු උදේනි වික්‍රමරත්න කියා සිටියේ මාර්ග තනා වසර 30ක් අත්දැකීම් සහිත මා මේ ව්‍යාපෘතිය ගිවිසුම් ගතවූ කාලය වන මාස 30ට මෙහි වැඩ නිමා කරන්න හැකි වේවි යැයි හිතනවා යනුවෙනි.

මෙම මාර්ග ව්‍යාපෘතිය අධීක්ෂණය සහ පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවා තිබුණි. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම මේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත පැවරී ඇති අතර එතුළින් විය හැකි අවදානම් අවම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් විසින් මෙම මාර්ග ව්‍යාපෘතිය අධීක්ෂණය කරමින් නිවැරදි ලෙස පාලනය කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන් අතින් සිදුවන වැරදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුය.

ඒ සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක විය යුත්තේ වැඩබිමේ මිස බත්තරමුල්ලේ සීතල කාමර තුළ නොවේය. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් දෙදෙනා වෙනුවෙන් මසකට රුපියල් 342500 ක මුදලක්ද ඉංජිනේරුවකුට රුපියල් 170000 ක වැටුපක් හා රුපියල් 70000 ක දීමනාවක් වශයෙන් රුපියල් 240000 බැගින් පස් දෙනකුට රුපියල් රුපියල් 12,00000 ක් බැගින් ව්‍යාපෘති කාර්යාලයේ ඉහළ නිලධාරීන් සඳහා පමණක් මසකට රුපියල් රුපියල් ලක්ෂ විස්සකට ආසන්න මුදලක් වැය කරනු ලබයි.



# පස්සර බස් අනතුරේ අනියම් මිනීමරුවෝ

මීට අමතරව මෙම ව්‍යාපෘතිය සඳහා පත්කරන ලද උපදේශක මණ්ඩලය ඉහළ නිලධාරීන් 27 දෙනෙකුගෙන් සමන්විතය. එම උපදේශක මණ්ඩලයට කණ්ඩායම් නායක, නේවාසික ඉංජිනේරුවෙක්, සහකාර නේවාසික ඉංජිනේරුවරු තිදෙනෙකු, ද්‍රව්‍ය හා පදික ඉංජිනේරුවරයෙක්, මහමාර්ග සැලසුම් ඉංජිනේරුවරයෙක්, ව්‍යුහාත්මක ඉංජිනේරු, බලපත්‍ර මිනින්දෝරු, පාරිසරික විශේෂඥ, අඩවි ඉංජිනේරුවන් - 03, ප්‍රමාණ මිනින්දෝරුවන් - 03, තාක්ෂණික නිලධාරීන් 06, සහයක මිනින්දෝරුවරුන් 03, පර්යේෂණ සහකාරවරු 03 දෙනකුද සේවයේ නිරතව සිටිය දීත් මේ කිසිවකුට මේ අවදානම් ගල හෝ මාර්ගයේ අවදානම් තත්ත්වය නොපෙනීම ගැන විමර්ශනයක් සිදු නොවිය යුත්තේ ද ? රජය එතරම් වියදමක් දරා හෝ නිසි සේවාවක් ලබාගත්තේ ද යන ගැටලුව මතුව තිබේ.

කොන්ත්‍රාත්කරු ඊබට් ඇන්ඩ් සන්ස් හට අදාළ වන ලුනුගල සිට බිබිල ප්‍රදේශය දක්වා සිවිල් කටයුතු සම්පූර්ණ කර නැතත් ඔහු ගිවිසුමට අනුව 26/01/2020 කොන්ත්‍රාත් වැඩ නිම කළ යුතුය. ඔහු මේ වන විට සම්පූර්ණ කර ඇත්තේ 52% ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග භාවිත කරන්නන්ට විශාල දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වේ.

ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් 2019/07/11 දිනට වැඩ නිම කළ යුතු වුවත්, මේ වනවිටත් කොන්ත්‍රාත්කරු සම්පූර්ණ කර ඇත්තේ 77% ක් පමණ වැඩ කොටසකි. මේ අනුව එකී ගිවිසුමට අනුව වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී ඇති අතර; මාර්ග ආරක්ෂාව පවත්වා ගෙන ගොස් නැති බව මේ අනතුරෙන් පමණක් නොව තවත් අනාරක්ෂිත යැයි හැඟෙන ස්ථාන නිරීක්ෂණය කිරීමේ දී පෙනී යයි. එවැනි භයානක ස්ථානයන් හි මාර්ග බාධක, දැනුම්වත් කිරීමක සඳහා දැන්වීම් පුවරු, බිඳ වැටීම් බාධක ආදිය කිසිවක් මෙම මාර්ගයේ සවිකර නොතිබිණි.

වසරකට අධික කාලයක් තිස්සේ අන්තරාදායක ගල ඉවත් නොකර අවදානම සලකුණු කරන කහ පොලිතින් තීරුවක් වුවද නොදා සිටි කොන්ත්‍රාත්කරුවන් එම පියවර ගන්නට කටයුතු කළේ ජීවිත 14 ක් බිලිදීමෙන් පසුවය.

මේ පිළිබඳව කරන ලද විමසුමකට පිළිතුරු දුන් බදුල්ල චෙන්කලඩි මාර්ග ව්‍යාපෘතියේ හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂ ජේ. ඒ. වී. එස්. ජයකොඩි පැවසුවේ,

මේ අනතුර සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය ද වගකිව යුතුයි. මේක අහඹු ලෙස සිදු වූ සිදුවීමක් වගකීම් පැහැර හැරීම්ද සිදුව තිබෙනවා. උපදේශක මණ්ඩලයක් තියෙන එකත් ඇත්ත. මේ ගැන ක්‍රියාමාර්ග ගත යුත්තේ කොන්ත්‍රාත්කරුවන්. ඒ අය හරියට වගකීම් ඉටු නොකළේ නම් දඬුවම් කළයුතු බවයි.


උද්ඝෝෂකයන් හමුවට ගිය ඇමති විමල් කරුණු පැහැදිලි කරමින්

# ඇමති විමල්ට හූ කිව්වේ ඇයි?

● රසික කොටුදුරගේ

**හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් කිරින්ද වෙරළතීරයේ පිහිටා තිබෙන ඛනිජ වැලි නිධිය සම්බන්ධයෙන් කිරින්ද ප්‍රජාශාලාවේ පැවති ජනහමුවකට සහභාගි වීම සඳහා පසුගියදා (27) කර්මාන්ත ඇමැති විමල් වීරවංශ එහි ගියේය. ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡා කළ අමාත්‍යවරයා ප්‍රකාශ කර සිටියේ කිරින්ද ඛනිජ වැලි නිධියෙහි කැණීම් කටයුතු රාජ්‍ය සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම මඟින් සිදු කර එම ජාතික සම්පතෙහි ප්‍රතිලාභ 'සෞභාග්‍යයේ දැක්ම' අනුව යමින් ජාතියට දායාද කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවය.**

එලෙස කරුණු දැක් වූ අමාත්‍යවරයා ප්‍රකාශ කළේ මේ සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් අතර නොසන්සුන්තාවක් ඇති වී තිබෙන බැවින්, ජනතාව සමග සාකච්ඡා කර මේ කටයුත්ත සිදු කරන ලෙස අමාත්‍ය චමල් රාජපක්ෂයන් හා අමාත්‍ය නාමල් රාජපක්ෂයන් විශේෂ ඉල්ලීමක් කළ බවයි. එම අවස්ථාවේ එහි මහින්ද අමරවීර අමාත්‍යවරයාද සිටි බව හෙතෙම සිහිපත් කළේය. ඔබ තමුන්නාන්සේලා සහ රජය එකතු වී සෑහීමකට පත් විය හැකි විසඳුමකට එමු යැයි අමාත්‍යවරයා එහිදී යෝජනා කළේය.

දකුණු වෙරළ තීරයේ තංගල්ලේ සිට වලවේ ගඟ මුහුදට වැටෙන ස්ථානය දක්වා පැතිරී තිබෙන ඉල්මනයිට් සහ ගානට් ඛනිජ වැලි නිධියේ කැණීම් කටයුතු රජය විසින් සිදු කරන්නේ ද? නැතිනම් ඉන්දියානු සමාගමකට ලබා දෙන්නේ ද? යන්න සම්බන්ධයෙන් මෙහිදී ආන්දෝලනාත්මක කතාබහක් ඇති විය.

එහිදී නැඟීසිටි ගම්වැසියකු ප්‍රකාශ කර සිටියේ ඉන්දියානු සමාගමක් ඉදිරිපත් වී ප්‍රදේශයේ ගම්වාසීන් පිරිසක් විසින් පිහිටුවාගෙන ඇති සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ ඇති බවත්, එනිසා එම සමාගමට අවශ්‍ය පරිදි කටයුතු කරගෙන යෑමට ඉඩ සලසාදෙන ලෙසය. ඔහු තවදුරටත් අදහස් දක්වමින් ''මේ ඛණිජ නිධියේ කැණීම් කටයුතු ඉන්දියානු සමාගමකට දෙන්න මේ වනවිට ඒ ඉන්දියානු සමාගම සමඟ අපි ගිවිසුම්ගත වෙලා ඉන්නවා. ඉන්දියානු සමාගම මඟින් වැඩ දින වරුවකට රුපියල් 4000ක මුදලක් අපිට ලබා දෙන්න පොරොන්දු වුණා. එයාල කියන්නේ ඕගොල්ලෝ අපිට වැලි ටික අරන් දෙන්න; අපි ඔයාලට වැටුප් දෙන්නම් කියලා. ඒ අය මීට අමතරව ගමේ පාරවල් ටික, ප්‍රජා ශාලාව, පල්ලිය, පන්සල හදලා දෙන්නම් කිව්වා.

අපි මේ වැලි ගන්න කිලෝමීටර් 03 ඈත තියෙන කැලෑ ප්‍රදේශයකට යන්න ඕන. පවුල් 1500ක් මේ ගමේ ඉන්නවා. ඒ හැමෝටම රැකියා ලැබෙනවා. අපේ රටට අහසින් වැටෙන හොඳ දෙයක් මේක. අපි සියලුදෙනාම ඉල්ලන්නේ ඒ ඉන්දියානු සමාගමත් එක්ක ඒ කටයුත්ත කරන්න අවසර දෙන්න කියලා. ඔබ තුමා එහෙම කළොත් ඒ පින ඇති ඔබ තුමාට ස්වර්ගයට යන්න.

රජයේ සම්පත් විජාතික කරණයට විරුද්ධව ජනතාව පෙළ ගැසී සිටින මොහොතක මෙවැනි කතාවක් කණ වැකීම ගැන අමාත්‍යවරයා තුෂ්නිම්භූත විය. අමාත්‍යවරයා කියා සිටියේ ''ඊට වැඩිය හොඳයි මං කැමැත්තෙන්ම අපායට යනවා.

දැන් මට කියන්නේ ඒ සමාගම වගේ තමුන්නාන්සෙලව අන්දන්න කියලද? ඕව වචන විතරයි. මේක රජයට පවරගත්තාම ඒ ලැබෙන ලාබය යන්නේ මහ භාණ්ඩාගාරයට. ඒක එයාලට දෙන්න කියන්න ඒනිසා. මේක පිටරටකට හූරගෙන කන්න දෙන්න නෙමෙයි අපි බලයට ආවේ. මේ දෙන්නෙ අල්ලසක්. ඔයාලා ගිවිසුමක් ගහල තියෙනවද'' අමාත්‍යවරයා ප්‍රශ්න කළේය.

ඔව් ''තියෙනවා.''

''ඔය කියන ගිවිසුම නිත්‍යානුකූලව වලංගුදැයි'' ප්‍රශ්න කළ වීරවංශ අමාත්‍යවරයා ''මේ රටේ මේ සම්පත රජයේ ආයතනයක් මඟින් කළොත් විතරයි ඕගොල්ලන්ට ඔය කියන සාධාරණයක් වෙන්නේ. ඔබතුමා ඔය කියන සහන ලැබෙන්නේ පිටරටට අපේ වටින ඛනිජ සම්පත් ටික ගෙනියන්න දීලද? මෙච්චර දේවල් දෙන්න ඒ අය පොරොන්දු වෙන්නේ මේ සම්පත එච්චරටම වටින නිසා. මේක පිට රට කොම්පැනි කාරයින්ට හූරන් කන්න දෙන එක නෙමෙයි අපේ යුතුකම. තමුන්නාන්සෙලා කරුණාකරල ඔය කියනදේට රැවටෙන්න එපා. ඒ අය ඉස්සරහට ඔයිට වඩා දේවල් කියයි. මම විස්වාස කරනවා; මේ පොළවේ ජීවත්වෙන මිනිස්සු පිටරට සමාගමකට කඩේයන මිනිස්සු නෙමෙයි කියලා. ඉන්දියන් සමාගම මේක භාරගෙන යයි. ඊට පස්සේ පරිසරයට වගකියන්න කෙනෙක් ඉතුරුවෙන්නේ නැහැ''

''අපි නම් හිතුවේ කැණීම් කටයුතු කිරීම නිසා පරිසරයට වන හානිය ගැනයි. යළි සුනාමියක් ආවොත් වැලිවැටිය ඉවත් කිරීම නිසා සිදුවන ගැටලූ ගැන මෙතන කථා කරාවි කියලා. පසුගිය යහපාලන ආණ්ඩුව මඟින් මෙම වැලිවැටියේ කැණීම් කටයුතු ඉන්දීය සමාගමකට දෙන්න පොරොන්දු වෙලා තිබුණේ'' සාකච්ඡාව සඳහා සහභාගි වී සිටි අජිත් රාජපක්ෂ මන්ත්‍රීවරයා කීවේය.

''අපි තමයි මහන්සිවෙලා මේවා හොයාගෙන ඉන්දියන් කොම්පැනියක් ඒක්ක කතා කරලා මේ වැඩේ පටන් ගත්තේ'' යැයි තවත් අයෙකු පවසන විට, එහි සිටි තවත් ප්‍රදේශවාසියකු කියා සිටියේ ''ඒත් බහුතරයක් මිනිස්සු කැමතියි මේක රජයෙන් කරනවට'' කියාය.

නැවත සිය හඬ අවදි කළ අමාත්‍යවරයා ''ඉතාම සුළු පිරිසක් වුවත් මේක රජයෙන් කරගෙන යනවට වඩා පිටරට සමාගමක් කරගනෙ යන එක ගැන විශ්වාස තැබීම ගැන මම කනගාටු වෙනවා. ඒ පිටරට සමාගම සෑහෙන්න මුදලක් වියදම් කරන්න ඇති; ඒ විශ්වාසය දිනාගන්න. ඒත් කිසිම විදේශීය සමාගමකට අපේ සම්පත් කොල්ල කන්න ඉඩදෙන්නේ නැහැ''.

අනතුරුව මේ සාකච්ඡාව සඳහා පැමිණ සිටි සමිතියට සම්බන්ධ ප්‍රදේශවාසීන් කර්මාන්ත අමාත්‍යවරයාගේ අදහසට පටහැනි අදහස් දැක්වීමට පටන් ගැනීමත් සමඟ නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති විය. තත්ත්වය බරපතළ නොවූ නමුත්, සමහරෙක් අමත්‍යවරයාට හූ කියන්නට පටන් ගත්තේය. එහෙත් අමාත්‍යවරයා ඉන් සැලුණු බවක් පෙනෙන්නට නොතිබුණි.

පරිසරයද සුරකිමින් ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි රාජ්‍ය සමාගමක විශ්වාසය යටතේ කිරින්ද ඛනිජ වැලි නිධියෙහි කැණීම් කටයුතුවලට සහාය ලබාදෙන ලෙස අමාත්‍යවරයා එම පිරිසගෙන් ඉල්ලා සිටියේය. අමාත්‍යවරයාගේ අදහසට ඇතැමුන් විරෝධතාව මතුවීමත් සමඟ තීරණයකින් තොරව මෙම සාකච්ඡාව අවසන් විය.

මෙම ඛණිජ සම්පත ප්‍රදේශ වාසීන්ගේ උවමනාව මත විදේශ සමාගමකට විකිණිය හැකිදැයි අපි හම්බන්තොට දිස්ත්‍රික්කය බාර දිසාපති ඩබ්ලිව්.එච් කරුණාරත්නගෙන් විමසුවෙමු. හෙතෙම සඳහන් කර සිටියේ ''කුමන හෝ ආකාරයෙන් හඳුනාගත් රටේ සම්පතක් තියෙනව නම් ඒ සම්පත පරිහරණය කිරීම සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයකුට හෝ කණ්ඩායමකට ඔවුන්ගේ අභිමතය පරිදි කටයුතු කළ නොහැකි බවයි. පරිසර සක්‍යතා වාර්තා සකස් කර ඒවා අධ්‍යයනය කර, ඉඩම් පරිහරණ රටාව බලා ඒ සඳහා අදාළ විෂයභාර අමාත්‍යාංශයෙන් නීතිමය අවසර ගැනීම අත්‍යාවශ්‍යයි.



**මේ සඳහා පරිසර ශක්‍යතා වාර්තා සකස් කර ඉඩම් පරිහරණ රටාව බලා ඒ සඳහා අදාළ විෂයභාර අමාත්‍යාංශයෙන් නීතිමය අවසර ගැනීම අත්‍යාවශ්‍යයි.**

- හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්.එච්.කරුණාරත්න

පරිසර අමාත්‍යාංශය යටතේ පවතින භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පවතින වෙරළ සංරක්ෂණ කාර්යාංශය සහ ලංකා ඛනිජ වැලි සංස්ථාව මේ යටතට ගැනෙනවා. ඒ වගේම කර්මාන්තයක් විදියට කර්මාන්ත අමාත්‍යාංශයත් මීට සම්බන්ධ වෙනවා.

විෂයයන් වර්ග කර තිබෙන ආකාරය අනුව තවත් බොහෝ අමාත්‍යාංශ මීට සම්බන්ධ වෙනවා. මේ අදාළ අමාත්‍යාංශවලින් කැබිනට් පත්‍රිකාවක් නිකුත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත් පසුව පවා කැනීම් කටයුතු සඳහා පාර්ලිමේන්තුවෙන් අවසර ගතයුතු වෙනවා. ඉන් අනතුරුව තමයි මෙය රජයෙන් කරනවද පෞද්ගලික අංශයට දීල කරනවද කියන ප්‍රතිපත්තිමය තීන්දුවකට රජයක් එළඹෙන්නේ.

උදාහරණයකට තෙල් නිධි පරික්ෂා කරන්න අපට ඒ සඳහා අවශ්‍ය උපකරණ හා තාක්ෂණය නැහැ. එවැනි අවස්ථාවල ජාත්‍යන්තර ආයතනයකට එය ලබාදිය යුතු වෙනවා. ඒ ආකාරයටයි මෙවැනි කාරණා සිදු වන්නේ'' කියාය.


විදේශ රටවලින් බේබිශිට් අුවා, සරොන් ඇතුළු විවිධ දේවල් ගෙන්වා තොග බෙදා හරින ආයතනයකට

**කැෂියර්වරියන් / වෙළෙඳ සේවිකාවන් සහ ජූකි මැෂින් ඔපරේටර්වරියන් අවශ්‍යයි.**

මූලික වැටුප 31,000යි. දක්ෂතාවය මත කොමිස් සමඟ 50,000කට අධිකව උපයාගත හැක. ආරක්ෂිත නවාතැන් නොමිලේ.

**සැම්රිච්චා බේබිශිට් කොම්පැනි**
ඇවරිවත්ත පාර, මිරිගම, ජා-ඇල. 075 93 35 416

BOVANS

**ලොව ප්‍රකට ලේයර්ස්**

ශ්‍රී ලංකාවේ සරු එළ නෙළා ගත් කිකිළි පැටවුන්

* වැඩි බිත්තර නිෂ්පාදනයක්
* ඉතාම ශක්තිමත් බිත්තර කටුවක්
* වැඩි ජීවන ශක්තියක්

**දික්කන්ද ෆාම්ස්**
යක්කල පාර, වතුරුගම. බ: ප:
ටෙලි: 033 5626501 ෆැක්ස්: 033 2279674



වෙළෙඳ අමාත්‍යාංශය

# අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 27 ක සහන මල්ල.

**ගුණාත්මකයෙන් ඉහළ අත්‍යවශ්‍ය පරිභෝජන භාණ්ඩ 27 ක් තරඟකාරී අඩුම මිලට ලංකා සතොස, සමූපකාර සහ Q-Shop වෙතින් මිලදී ගත හැක.**

| | භාණ්ඩය | ජනවාරි මස විවෘත වෙළඳපොල පැවති මිල (රු.) | පෙබරවාරි මස සිට සතොස අලෙවි ජාලය හරහා අලෙවි කෙරෙන මිල (රු.) | පාරිභෝගික ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| 1 | රතු කැකුළු (1kg) | 106 | 89 | 17 |
| 2 | සුදු කැකුළු (1kg) | 105 | 93 | 12 |
| 3 | සුදු නාඩු (1kg) | 109 | 96 | 13 |
| 4 | සම්බා (1kg) | 120 | 98 | 22 |
| 5 | කිරි සම්බා (1kg) | 140 | 125 | 15 |
| 6 | තිරිඟු පිටි (1kg) | 105 | 84 | 21 |
| 7 | සුදු සීනි (1kg) | 110 | 99 | 11 |
| 8 | දුඹුරු සීනි (1kg) | 140 | 125 | 15 |
| 9 | තේ (කො. 01 - පැකට් 100 g) | 130 | 95 | 35 |
| 10 | රතු පරිප්පු - ඕස්ට්‍රේලියානු (1kg) | 188 | 165 | 23 |
| 11 | ලොකු ළූනු - පාකිස්තාන / ඉන්දියන් (1kg) | 140 | 70 | 70 |
| 12 | අර්තාපල් - දේශීය (1kg) | 215 | 140 | 75 |
| 13 | අර්තාපල් - පාකිස්තාන (1kg) | 190 | 140 | 50 |
| 14 | කඩල (1kg) | 225 | 175 | 50 |
| 15 | වියළි මිරිස් (1kg) | 550 | 495 | 55 |
| 16 | ටින් මාළු - දේශීය (425g) | 240 | 220 | 20 |
| 17 | ටින් මාළු - ආනයනික (425g) | 280 | 265 | 15 |
| 18 | හාල්මැස්සන් - තායිලන්ත (1kg) | 700 | 575 | 125 |
| 19 | කුකුළු මස් - සම සහිත (1kg) | 430 | 400 | 30 |
| 20 | ලුණු (ක්‍රිස්ටල් අයඩිකෘත) (1kg) | 55 | 43 | 12 |
| 21 | කිරි පිටි (400g) | 380 | 355 | 25 |
| 22 | සෝයා තෙල් (500ml) | 470 | 310 | 160 |
| 23 | රෙදි සෝදන සබන් - STC (115g) | 53 | 48 | 05 |
| 24 | රෙදි සෝදන / බාර් සබන් - BCC (650g) | 325 | 260 | 65 |
| 25 | සුවඳ සබන් - STC (100 g) | 63 | 56 | 07 |
| 26 | දත් සෝදන දියර (100 ml) ITI | 350 | 250 | 100 |
| 27 | මුව ආවරණ ( SLS සහතික ලත් ) | 25 | 14 | 11 |

**සතොස**
ජාතියේ මිල තීරක ස.තො.ස.



ඔබ සැමට ඉතුරුම් පිරි - ඉසුරු සපිරි සුබ අලුත් අවුරුද්දක් වේවා !

මේ අවුරුද්දේ හොඳම ගණුදෙනුව RDB බැංකුවත් එක්ක

RDB ජය නිධාන
Jaya Nidhana

6% (වා.පො)
සහිත ඉතුරුම් සහතිකය

ලංකාවේ වැඩිම පොලිය
දිවයිනේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුවෙන්

අප්‍රේල් 15 වෙනි දින පෙ.ව 8.30 සිට
අලුත් අවුරුදු ගණුදෙනු සඳහා
අපගේ ශාඛා ජාලය විවෘතව පවතින බැවින්
අප සමඟ ගණුදෙනු කිරීමට
ඔබ සැමට ආරාධනා !

අප්‍රේල් 15 වන දින ගණුදෙනු කරන
සැමට තිළිණයක්!

HOTLINE
0112 425 262
www rdb lk

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank

## වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන



**1.** වර්තමාන ලෝක ව්‍යසන තත්ත්වය තුළ අප රජයක් ලෙස ජීවන වියදම පාලනය කරගෙන සිටිනවා. රජයකට කරන්න පුළුවන් බඩුමිල වැඩි වෙන වේගය පාලනය කිරීම පමණයි. උද්ධමනය පාලනය කිරීම සඳහා වත්මන් රජය පසුගිය රජයට වඩා බරපතළ ලෙස මැදිහත් වී තිබෙනවා.
එවිට ජීවන වියදම අඩු කිරීම සඳහා භාණ්ඩ මත පනවන බදු අසාමාන්‍ය ලෙස පහත හෙළා තිබෙනවා. වැට් බද්ද 15% සිට 8% දක්වා අඩු කර තිබෙනවා. ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කර තිබෙනවා, උපයන විට ගෙවීමේ බද්ද ඉවත් කර තිබෙනවා, ආනයන තීරු බදු 30% සිට 15% දක්වා අඩු කර තිබෙනවා. ඇතැම් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා රජය බදු අයකරන්නේ සත 25 යි, මේ බදු නැවත පැනෙව්වොත්, සත විසිපහේ බද්ද රුපියල් 50 ට 60 ට වැඩි කළොත්, බඩු මිල වැඩි වෙනවා. සතොසින් භාණ්ඩ වර්ග 28ක් ජනවාරි මාසේ මිලට වඩා අඩුවෙන් පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාස 3 ම ලබා දෙනවා. පළවෙනිදා සිට රු 1400ක් වටිනා භාණ්ඩ වර්ග 12ක්, රුපියල් දාහකට සතොසට පැමිණෙන පාරිභෝගිකයන්ට ලබා දෙනවා. පාරිභෝගිකයන්ට අවුරුදු දීමනා වශයෙන් තමා මෙය ලබා දෙන්නේ.

**2.** ජනවාරි මාසේ වෙනකොට අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු වෙලා තියෙන්නේ. පරිප්පු තිබුණේ රුපියල් 180-190ට, දැන් පරිප්පු මිල රුපියල් 165 යි. රුපියල් 230ට තිබුණු ලූනු රුපියල් 70 යි, සීනි තිබුණේ 120 - 110 යි, දැන් රුපියල් 99 යි, හාල්මැස්සෝ තිබුණේ රුපියල් 700 ට, දැන් 500g 75 යි, නාඩු සහ කැකුළු හාල් රුපියල් 100 ට අඩුවෙන් සතොස සමුපකාර වෙළෙඳසැල්වල තියෙනවා. ඒ විතරක් නෙවෙයි, අත්‍යවශ්‍ය භාණ්ඩ බොහොමයක් මේ මිලට සුපිරි වෙළෙඳසැල් තුළත් අලෙවි කරනවා කියලා දිගටම පුවත්පත් දැන්වීම් පළ කළා.

**3.** ගැටලුවක් නැහැ. දැන් සීනි දිගටම රුපියල් 99 ට අලෙවි වෙනවා. සීනි මිල සම්බන්ධයෙන් කිසිම වංචාවක් වෙලා නෑ, සීනි බද්ද සත 25 ට අඩු කරලා තියෙනවා. ඊට පස්සේ රුපියල් 30 ට නැත්තම් 40 ට වැඩි කරලා වංචා කළේ පසුගිය රජයයි. ඒක මේ ආණ්ඩුව කරලා නැහැ.

**4.** බඩු මිල තීරණය කරන්නේ ආණ්ඩුව නෙවෙයිනේ, අපි මේ වැරදි තැනක ඉන්නේ. වෙළෙඳපොළ හසුරවන්න ආණ්ඩුවකට බැහැ, රජය නෙවෙයි නිෂ්පාදකයෝ. සහල් නිෂ්පාදනය කරන්නේ මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ගොවියෝ. පිටි නිෂ්පාදනය කරන්නේ පිටි කර්මාන්තකරුවෝ, සීනි නිෂ්පාදනය කරන්නේ ඒවා නිපදවන ආයතන.
අනිත් සියලුම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නේ පෞද්ගලික අංශයයි. පසුගිය ආණ්ඩුව අනුගමනය කළේ ගොවීන්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෝ, සුළු ව්‍යාපාරිකයෝ සහ පෞද්ගලික සමාගම් වනසලා, විදේශයන්ගෙන් භාණ්ඩ අඩු මිලට ගෙන්වන භාණ්ඩ ගෙන්වීමයි.

**5.** එහෙම වෙන්නේ නැහැ. අපි මේ භාණ්ඩ වර්ග 24 ක මිල පිළිබඳ පාරිභෝගිකයා ඇතුළු සියලු දෙනාවම දැනුම්වත් කරලා තියෙන්නේ. ඒ නිසා පාරිභෝගිකයන්ගේ දැනුම්වත්කම තුළයි ඔවුන් ඒ භාණ්ඩ ලබා ගන්න යන්නේ, පාරිභෝගිකයෝ සුපිරි වෙළෙඳසැල්, ආර්ථික මධ්‍යස්ථාන, සතොස , පොළ ආදී විවිධ වෙළෙඳපොළට යනවා. ඒක ඒ අයගේ කැමැත්ත. සමහරු හිතනවා තමන් හැසිරෙන විදිහටම තමයි පාරිභෝගිකයෝ වෙළෙඳපොළේ හැසිරෙන්නෙ කියලා.

# ජීවන වියදම ගැන සිළුමිණෙන් ප්‍රශ්න 5 ක්

**1** ජීවන වියදම ඉහළ යෑමට සාපේක්ෂව රජය දෙන සහන ප්‍රමාණවත්ද?

**2** උත්සව සමයේදී අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යෑමට හේතුව කුමක්ද?

**3** සීනි, පොල්තෙල් සහ සහල් සම්බන්ධ සුවිශේෂ ගැටලුවලට විසඳුම කුමක්ද?

**4** උත්සවය සමයේ පාරිභෝගිකයන්ට වන පීඩා වැළැක්වීමට ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව ඇතැමුන්ගේ අදහසයි. එයට එකඟද?

**5** අතරමැදි වෙළෙඳුන් පාලනයකින් තොරව ඇතැම් භාණ්ඩ මිල ඉහළ දැමීමක් කර ඇති බව පේනවා. එසේ කරන වෙළෙඳුන්ට එරෙහිව නීතිමය පියවරගත හැකිද ?



## මත ගැටෙන තැන

● සුභද්‍රා දේශප්‍රිය

## සමගි ජන බලවේගයේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර



**1.** .ආණ්ඩුව කිසිම සහනයක් දෙන්නේ නැහැ, ආණ්ඩුවේ සහන අද ගැසට් එකට පත්තරේට සහ වේදිකාවට සීමා වී තිබෙනවා., බඩුමිල අහස උසට නැගලා තියනවා, එක පැත්තකින් ආණ්ඩුව පත් කරන්න මුදල් වියදම් කරපු, ආධාර කරපු අයට හම්බ කරන්න දීලා බලාගෙන ඉන්නවා. ඒ සහනවලින් ආණ්ඩුවට බදු මුදලුත් නෑ,පාරිභෝගිකයාට සහනයකුත් නෑ, ආණ්ඩුවේ වියදම් කරපු ගජමිතුරෝ අද ඒකෙන් කෝටි ගාණක් හම්බ කරනවා, ඒ විතරක් නෙවෙයි අද ආණ්ඩුව කිසිම සහනයක් දීලා නැහැ, හැම බඩුවක්ම මිල තුන් හතර ගුණයකින් වැඩි වී තිබෙනවා.

**2.** අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යෑමට හේතුව ආණ්ඩුවේ නිසි කළමනාකරණයක් නැතිකම. එදා යහපාලන ආණ්ඩුවට පුළුවන්කම ලැබුණා අවුරුදු හතර හමාරක කාලයක් ඇතුළත අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලගේම මිල ගණන් සියල්ල එක තැනක රඳවා ගන්න. ආණ්ඩුව ඒකට බදු සහන වගේම අරමුදල් යෙදෙව්වා. අද වෙලා තියෙන්නේ ආණ්ඩුවේ පාලනයකින් තොරව මේ කටයුතු සිදුවීමයි. එක පැත්තකින් ආණ්ඩුවේ අය කොමිස් ගහනවා.
මේ ආණ්ඩුව ආපු ගමන් කළේ ආණ්ඩුවට උදවු කරපු කොම්පැණිකාරයන්ට ධනපතියන්ට බිලියන 600 ක බදු සහනයක් ලබාදීමයි. දුප්පතා බදු ගෙවනවා, පෝසත් කෙනා බදු ගෙවන්නේ නෑ.

**3.** මේ ආණ්ඩුවේ මැති ඇමතිවරු බොහොම දක්ෂයි වේදිකාවේ සහ මාධ්‍යවලට කතා කරන්න. ආණ්ඩුවට කඩේ යන පෞද්ගලික මාධ්‍ය බඩු මිල අඩු කළා කිව්වට කඩේ ඒ මිලට බඩු නෑ. සතොස වෙළෙඳසැල් හාරසියයකින්, පන්සියයකින් මේ රටේ ජනතාවට කන්න දෙන්න පුළුවන්ද කියලා අපි ආණ්ඩුවෙන් අහනවා.ආණ්ඩුවේ ටිකිරි මොළේට අඩු තරමේ මේදේවත් තේරෙන්නේ නැද්ද? සතොසෙන් සියලු දෙනාටම බඩු දෙන්න බැරි බව තේරුම්ගන්න බැරිද? අනිත් පැත්තෙන් දැන් මේ සැරේ අවුරුද්දට ජනතාවගේ ජීවිත අවදානමට දාලා ආණ්ඩුවේ ගජ මිතුරෝ පිළිකාකාරක තෙලුත් ගෙන්වා තිබෙනවා. එයින් පිළිකා හැදෙන බව මේ රටේ විශේෂඥයන් පවසා තිබෙනවා. සාමාන්‍යයෙන් කරන්නේ මේ වගේ නීති විරෝධී ආනයනයක් කළොත් නැවත එය කරන්න දෙන්නේ නැහැ. නමුත් ආණ්ඩුවේ හිතවතුන්ට රිදෙන්නේ නැති වෙන්න ඒ අයගේ මුදල් බේරා ගන්න මේ දේ කරනවා.

**4.** අපේ ආණ්ඩු කාලයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළා නම් බඩු මිල එතැනම තියාගන්න තිබුණා. ජාතික ප්‍රතිපත්තියක් නැතුව ආණ්ඩුවට ඕන ප්‍රතිපත්ති හදනවා. ආණ්ඩුව කියන මිලට කඩේ හාල් විතරක් නොවෙයි කිසිදෙයක් නැහැ. ජනතාව ආණ්ඩුවට ඇහුම්කන් නොදෙන තත්ත්වයට පත්වෙලා. උත්සව සමය එන්න කලින් ආණ්ඩුව සැලසුම් කරල තියෙන්න ඕනේ මේ බඩු මිල පාලනය කිරීමට. අද වෙනකොට ඒ සැලසුම් සියල්ලම අසාර්ථකයි.

**5.** ඔය කියන අතරමැදියන් සිටියදී අපේ ආණ්ඩුව කාලේ බඩුමිල වැඩි නොවී එක තැන තියාගන්න පුළුවන්කම ලැබුණා. අද ආණ්ඩුව කරන්නේ අතරමැදියාගේ පිට දාලා බඩු මිල වැඩි කරන එක. ආණ්ඩුව තමන්ගේ වැරැද්ද වහගන්න එක එක්කෙනාට වැරැදි පැටවීමේ වැඩපිළිවෙළක නිරත වී සිටිනවා.

## ජවිපෙ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ. ඩී. ලාල් කාන්ත



**1.** ජීවන වියදම ඉහළ යෑමේ සාපේක්ෂ බලපෑම තියෙන්නේ වැටුපක් ලබලා ජීවත්වන අයටයි. ඊට හේතුව ඔවුන්ට ස්ථිර ආදායමක් තිබුණට ඒ අයට රජයේ කිසිම වැටුප් වැඩිවීමක්, ඒ වැඩිවන ජීවන වියදමට සරිලන ගෙවීමක් කරලම නැහැ.
අනිත් හැම කෙනෙක්ම ජීවන වියදම වැඩිවෙනකොට තම තමන් විසින්ම ආදායම වැඩි කරගන්නවා. පෙදරේරුවා එයාගෙ කුලිය වැඩි කරගන්නවා. වඩුවා එයාගෙ කුලිය වැඩිකරනවා. කුලියක් කරන කෙනා ඒ ගාස්තුව වැඩි කරගන්නවා. එතකොට ස්ථිර රස්සාවක් කරලා ජීවත්වෙන අයට තමයි ජීවන වියදම වැඩි වෙනකොට වැටුප් වැඩි වෙන්න ඕනේ. ආදායම වැඩි කරන්න ඕනේ. නමුත් මේ දක්වාම කිසිම වැඩිවීමක් කරල නැහැ.

**2.** එයට බලපාන ප්‍රධාන කාරණාව තමයි නිෂ්පාදනය ප්‍රමාණවත් අයුරින් සිදු නොවීම. ඒක දිගටම තිබුණු තත්ත්වයක් වුවත් කොරෝනා වටපිටාව තුළ එහි බලපෑම තවත් වැඩි වී තිබෙනවා. මේ ආණ්ඩුව දැන් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නැහැ. නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම සිද්ධවෙන්නේ බාහිරෙන්, එනම් රජයට පිටින්. එතකොට එම නිෂ්පාදනයන් මේ වෙනකොට බිඳ වැටිලා තියෙනවා. ඒකත් එක්ක ජීවන වියදම ඉහළ යනවා. ප්‍රමාණවත් නිෂ්පාදනයක් නැති වෙනකොට අනිවාර්යයෙන්ම ජීවන වියදම ඉහළ යනවා. ඒක තමයි මේ සිදුවී තිබෙන්නෙ. අපි බලාපොරොත්තු වෙන්නේ නෑ ආණ්ඩුව ජීවන වියදම අඩු කරයි කියලා. ඒ නිසා වැඩි වන ජීවන වියදමට සරිලන විදිහට ආදායම් ඉහළ දමා ගැනීමේ සාකච්ඡාව අපි දිගටම කරගෙන යනවා.

**3.** බොහෝ දේවල් රජයේ මැදිහත්වීමක්, සැලසුමක් නොමැතිව රජයේ පාලනයෙන් ගිලිහී ගොස් තිබෙනවා. මේ වෙද්දි ජනතාව වෙනුවෙන් මැදිහත් විය යුතු ආයතනවල ක්‍රියාකාරීත්වය සහ ජනතා විශ්වාසය බිඳ වැටී තිබෙනවා. බලධාරීන් අල්ලසට, දූෂණයට යටවී තිබෙනවා. ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රේගුව ආදී ආයතන ගැන විශ්වාසයක් නැහැ. සියලු රාජ්‍ය යාන්ත්‍රණයන් ඉහළ සිට පහළ දක්වාම දූෂණයට ලක්වෙලා, දේශපාලනය දූෂණය වෙනකොට ඒ හා බැඳී පවතින සියලු ආයතන දූෂණයට ලක්වීම වළක්වන්න බෑ. ඒ නිසා මේ වෙනකොට අපේ රටේ දේශපාලන සංස්කෘතිය බිඳවැටීමත් එක්ක ඒ දේශපාලනය විසින් මෙහෙයවනු ලබන ආයතන පද්ධතියත් බිඳ වැටිලා. යහපත් ක්‍රියාකාරීත්වයක් පිළිබඳ විශ්වාසය ජනතාවට නෑ. එය කනගාටුදායක තත්ත්වයක්.

**4.** ප්‍රමාණවත් ලෙස භාණ්ඩ හා සේවා සැපයීම කෙරෙනවා නම් ප්‍රශ්නයක් නෑ. අවුරුදු ගණනාවක් ආපස්සට බලනකොට අදාළ වගකිව යුතු ආයතනවලට මේ සම්බන්ධයෙන් තීරණය කරන්න පුළුවන්. රජය මේ සියල්ලෙන් ඉවත් වීමේ ප්‍රතිඵලයක් හැටියට අද වෙනකොට රජයට එයට මැදිහත් වෙන්න බෑ. රජය සතු ආයතනත් දූෂිත සංස්කෘතික වළල්ලේ කොටසක් බවට පත්වී තිබෙනවා. ආර්ථික වශයෙන් පීඩාවට පත්වන ජනතාව වෙනුවෙන් ආණ්ඩුවට යමක් කරන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ, ආණ්ඩුවට පොල්, පොල් තෙල්, සීනි හා පරිප්පු මිල වෙනුවෙන් යමක් කරන්න බෑ. බදු අඩු කිරීමකින් හෝ ජනතාවට සහනයක් දෙන්න තරමේ ආර්ථිකමය ශක්තියක් රටේ නෑ. ඒ වගේම ආණ්ඩුවට හාල් මිල පාලනය කරන්න බෑ, ඒකට යාන්ත්‍රණයක් නෑ, ඒකේ තේරුම ඒවා පෞද්ගලික අංශයට දීලා රජය නිදහස් වෙන එක. ඒ අය ලාබ පස්සේ දුවන්නේ. එතකොට රජයට ජනතාව වෙනුවෙන් කරන්න දෙයක් නැහැ.

**5.** රජයට යමක් කරන්න බෑ, ඒකට අවශ්‍ය කරන උපකරණ නෑ. ඒවා රජය ඔක්කොම අත්හැරගෙන තියෙන්නේ, දැන් තියන ආර්ථිකය තියෙන්නේ තමන් හම්බ කරන ක්‍රියාවලියක්. තනි තනියෙන් තමාම හම්බ කරනවා. ඉතින් වෙළෙන්දෝ ඒක කරනවා. ඒක ගැන කතා කරන්න ආණ්ඩුවට බෑ, දැන් ආණ්ඩුයි ආර්ථිකයයි අතර සම්බන්ධය ගිලිහී තිබෙනවා. දැන් රජය කියන්නේ ආයතනයක්. එක යුගයකදී රජය කියන ආයතනය පවරාගත් කාර්යභාරයක් තිබුණා, ඒ තමා කඩේ බඩු මිල පාලනය කිරීම, වෙළෙඳපොළ හැසිරවීම, තොග රැස්කරගෙන සම්බන්ධ වීම ආදී විවිධ ක්‍රම තියෙනවා. ඔක්කොම අත්හැර ගත්තට පස්සේ රජය මැදිහත් වෙලා හසුරුවන්න කිසිම ක්‍රමවේදයක් නැහැ.

## ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වෘත්තීය සමිති කෑගල්ල දිස්ත්‍රික් සමුළුව අප්‍රේල් 04 වැනිදා

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සිවුවන සංවත්සර සැමරුම වෙනුවෙන් පවත්වනු ලබන දිස්ත්‍රික් නියෝජිත සමුළු මාලාව යටතේ කෑගල්ල දිස්ත්‍රික් සමුළුව අප්‍රේල් 04 ඉරිදා සවස 2.30 ට කෑගල්ල නගර ශාලාවේදී පැවැත්වේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රගතිශීලී වෘත්තීය සමිති ජාතික මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන් පවත්වනු ලබන මෙම සමුළුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වෘත්තීය සමිති නායක ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේගේ ප්‍රධානත්වයෙන්, රාජ්‍ය ඇමැති කනක හේරත් සහ තාරක බාලසූරිය ඇතුළු කෑගල්ල දිස්ත්‍රික් පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ප්‍රධාන ලේකම් අග්‍රාමාත්‍ය වෘත්තීය සමිති අධ්‍යක්ෂ නීතිඥ සුමිත් විජේසිංහ, බන්දුල සමන් කුමාර, සුදත් අබේවර්ධන, අමරපාල ගමගේ, සමන් කුමාර ඇතුළු වෘත්තීය සමිති නායකයන් මේ සමුළුව සඳහා සහභාගි වේ.

මෙම සමුළුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කෑගල්ල දිස්ත්‍රික් වෘත්තීය සමිති නායකයන් වන චන්දන බණ්ඩාර සහ සුසන්ත කරුණාසිංහ විසින් සංවිධානය කරනු ලබයි.

## හේමන්ත පුෂ්පසිරි පැවිදි බිමට පිවිසෙයි

(එච්.ඒ. සමරවංශ)

මීරිගම මක්කනිගොඩ ජී.ආර්. හේමන්ත පුෂ්පසිරි පසුගිය 21 වැනිදා හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානයේදී පැවිදි දිවියට පත් විය.

නැසීගිය ජී.ආර්. සෝමසිරිගේ සහ එන්.කේ. නාලනී හේමලතාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා වූ ඒ මහතා, බටලීය කණිෂ්ට විද්‍යාලයෙන් සහ පස්යාල මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ඇත. හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානාධිපති, රාමඤ්ඤ මහා නිකායේ පටිපත්ති සංවර්ධන සභාවේ ලේඛකාධිකාරී මක්කනිගොඩ අස්සජී ස්වාමීන්වහන්සේගේ ඇසුර ලැබූ ඔහු හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානයේ ෆොන්සේකා දහම් පාසලේ ආචාර්යවරයකු වශයෙන් ප්‍රදේශයේ සිසු දරු දැරියන්ට දහම් අධ්‍යාපනය ලබාදීමටද ඔහු කටයුතු කළේය.

නිවසේ සිට පෙරහරකින් හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානය වෙත කැඳවාගෙන විත් පෙ.ව. 8.30 ට එළඹුණු සුබ මොහොතින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක, අග්ගමහා පණ්ඩිත මකුලෑවේ ධර්ම කීර්ති ශ්‍රී සරණංකර විමල නාහිමිපාණන්ගෙන් පැවිද්ද ලබා ගනිමින්, මක්කනිගොඩ හේමකිත්ති නමින් සසුන්ගත වූහ.

## පසුගිය මාස 27 ට අලි මරණ 844

නිහාල් පී. අබේසිංහ

අලි - මිනිස් ගැටුම නිසා පසුගිය මාස 27 ඇතුළත මෙරටදී අලි මරණ 844 ක් සිදුවී ඇති බව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරයි.

වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදාන පතිරණ මහතා පවසන්නේ මේ වසරෙදී පමණක් අලි මරණ 83 ක් සිදුවී ඇති බවයි. මේ අතර 2020 දී අලි 400 කට ආසන්න ගණනක් මිය ගොස් ඇති බව වනජීවී හා වන සංරක්ෂණ ඇමැති සී.බී. රත්නායක මහතා පෙන්වා දෙයි.

වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර මහතා පවසන්නේ මෙම අලි මරණවලින් 50% කට හේතුව මානව ක්‍රියාකාරකම් බවයි. මේ අතර 2019 වසරේදී අලි මිනිස් ගැටුම නිසා අලි 361 හා මිනිසුන් 101 ක් මරණයට පත්වී ඇතැයි පරිසරවේදියෝ පෙන්වා දෙති.

1 වැනි පිටුවෙන්

### සහන මල්ලට...

මේ යටතේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 27 ක් මිල අඩුකර ජනතාවට ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බවත් ඊට අමතරව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 12 ක් ඇතුළත් බඩුමල්ලක් රුපියල් 1,000 ක් වැනි මිලට ලබාදෙන බවත් ඇමැතිවරයා පවසයි. මේ අතර කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ පවසන්නේ උත්සව සමය වෙනුවෙන් කැකුළු හාල් කිලෝවක් රුපියල් 93 ටත් නාඩු කිලෝවක් රුපියල් 97 ට සතොස සමුපකාර හා සුපිරි වෙළෙඳ සංකීර්ණ මඟින් ලබාදීම දැන් ක්‍රියාත්මක බවයි. වී අලෙවි මණ්ඩලය තමන් සතු වී හාල් කර මෙලෙස ලබාදෙන බවත් ඇමැතිවරයා කීය.

### මැතිවරණ තේරීම්...

කථානායකවරයා විසින් තේරීම් කාරක සභාව පත් කිරීමෙන් පසු මාස 06ක් ඇතුළත නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව යෝජනාවේ සඳහන් වේ. මෙම විශේෂ තේරීම් කාරක සභාවේ ප්‍රධාන වගකීම වන්නේ පවත්නා මැතිවරණ ක්‍රමවේදයේ හා ඡන්ද විමසීම් ව්‍යුහයේ නීති රීතිවල පවතින අඩුපාඩු හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් සංශෝධන නිර්දේශ කිරීමයි.

### ඇඟලුම් සේවකයන්...

හදිසි ව්‍යසනකාරි තත්ත්වයක වුවද රටේ ආර්ථිකය පවත්වාගෙන යා යුතු බැවින් කොවිඩ් වසංගතය උත්සන්නව පැවැති සමයේ වුවද නිදහස් වෙළෙඳ කලාප කම්කරුවන් 275,000කට අධික පිරිසක් රටේ මුළු අපනයනවලින් 40%ක් නියෝජනය කරමින් සේවයෙහි නියුතු වූ බවත් වෘත්තිය සමිති එකමුතුවක් ලෙස අවම කොන්දේසි කෙරෙහි හෝ අවධානය යොමු නොකොට හාම්පුතුන් විසින් සේවකයන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් නොසලකා හැරීම පිළිබඳව සේවකයන් ඇතුළු වෘත්තිය සමිති දැඩි විරෝධය පළ කරන බවද සමලේකම්වරයා පැවැසීය.

### අවුරුද්දට ...

කෙසේ වෙතත් අප්‍රේල් 14 වැනිදා දුම්රිය ධාවනයේ අඩුවක් වීමට ඉඩ ඇතැයිද ඔහු පෙන්වා දුන්නේය. එසේම බස් රථ 200ක් පමණ අතිරේකව යොදවන බව ශ්‍රී ලංගම සභාපති නීතිඥ කිංස්ලි රණවක පවසයි.

## නීතිඥවරියක ලෙස පත්වෙයි



රාගම, වල්පොළ දුල්මිණි රසදරී කුලතිලක ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක වශයෙන් අගවිනිසුරු ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන් ඉදිරියේ දිවුරුම් දුන්නාය. කුලතිලක මෙනෙවිය ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් පළමු පන්තියෙන් නීතිවේදී උපාධිය සමත්වූ අතර, ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිඥවරියක වශයෙන් ගෞරව පන්තියෙන් සමත් වී ඇත. ඇය මේ වන විට නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා සූදානම් වෙමින් සිටී. දුල්මිණි පර්යේෂණ නිලධාරිනියක වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවයේ යෙදී සිටින අතර ඇය විශ්‍රාමලත් විනිසුරු ජී. ඩී. කුලතිලකගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂකවරියක වශයෙන් සේවය කර විශ්‍රාම ලැබූ කුමාරි කුලතිලකගේ දියණියයි. ඇය කොළඹ විශාඛා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවකි.


## ඇරතියුසා විදුහලේ ආදි සිසුන්ට නව කාර්යාලයක්



කොළඹ 6, වැල්ලවත්ත, ඇරතියුසා මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ නව කාර්යාලය හිටපු නියෝජ්‍ය විදුහල්පති, ශ්‍රී ලංකා පාසල් බොක්සිං සංගමයේ හිටපු සභාපති ඩොනල්ඩ් මුණසිංහ විසින් විවෘත කළ අයුරු. ඇරතියුසා විදුහලේ විදුහල්පති නිහාල් වික්‍රමනායක සමඟ ආදි සිසු සංගමයේ නිලධාරීහු ද මේ අවස්ථාවට එක් වූහ. පාසලේ ආදි සිසු එම්.එසෙඩ්. එම්. අම්ජාඩ්ගේ අනුග්‍රාහකත්වය යටතේ මෙය ඉදි කළ අතර හිටපු විදුහල්පතිවරයකු වන යූ. බී. තිලකරත්න විශේෂ ආරාධිතයකු ලෙස සහභාගි විය.

# හදවත් එකතු කළ මිනිසෙක්

# ඇල්බර්ට් ඒ. පේජ් මහතාගේ 100 වන ජන්ම දින සැමරුම




විවිධත්වයෙන් පිරුණු රටක් තුළ සාමූහිකත්වය ගොඩනැංවීම ඉතා අපහසු කටයුත්තකි. එහෙත් එම අසීරු කර්තව්‍ය සඳහා උරදී ඒකීය ශ්‍රී ලංකාවක් පිළිබඳ වූ ස්වකීය දැක්ම ක්‍රියාවට නංවමින් ජනයා සාමූහිකත්වය කෙරෙහි ඒකරාශී කිරීමේ මෙහෙවරෙහි නියැලුණු මහත්මා ගුණයෙන් පිරි ශ්‍රේෂ්ඨ මිනිසෙක් අප අතර සිටියේය. ශ්‍රී ලංකාවත් එහි ජනතාවත් මත නිරන්තරයෙන් විශ්වාසය තබා කටයුතු කළ ඔහු ඇල්බර්ට් ඒ. පේජ් මහතායි.

එතුමන් ජන්මය ලබා වසර 100ක් ගතවන අද දිනයේදී ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙකුගේ ජීවිත ආලෝකවත් කළ එතුමන්ගේ අප්‍රතිහත ධෛර්යයත් උතුම් වූ නිහතමානිත්වයත් ඉතා ගෞරවයෙන් යුතුව සිහිපත් කරමු. සිලෝන් තියටර්ස් (වර්තමානයේ සී.ටී. හෝල්ඩිංග්ස්) හි මූල්‍ය අංශයේ කනිෂ්ඨ ලිපිකරුවෙකු වශයෙන් සම්බන්ධ වූ එතුමන් පසු කාලයේදී එහි සභාපතිත්වය දක්වා නොපසුබස්නා උත්සාහයෙන් යුතුව කටයුතු කළේය. සමගිය සහ සාමූහිකත්වය ගොඩනැංවීම කෙරෙහි සිනමා කර්මාන්තයට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය තැබූ එතුමන් සිලෝන් තියටර්ස් මඟින් ශ්‍රී ලංකාවේ විනෝදාස්වාද ක්ෂේත්‍රය ගොඩනංවාලීමටත් මැජෙස්ටික් සිටි හරහා ශ්‍රී ලාංකිකයන්ට ජාත්‍යන්තර මට්ටමේ වින්දනීය අත්දැකීමක් ලබා දීමටත් පුරෝගාමී මෙහෙවරක නිරත විය. නගරයෙන් නගරය ආලෝකවත් කරමින් ශ්‍රී ලංකාවේ සිල්ලර වෙළඳ ව්‍යාපාර ක්ෂේත්‍රය නංවාලීමටත් මූල්‍ය සහ දේපළ වෙළඳාම් ක්ෂේත්‍රය නඟාසිටුවීමටත් එතුමා ක්‍රියා කළේය. ගමත් නගරයත් අතර දුරස්ථභාවය මඟ හරවාලීමටත් ශ්‍රී ලාංකීය තාරුණ්‍යයට නායකත්වය කරා යාමට අවස්ථාවන් නිර්මාණය කිරීමටත් එතුමන් නිරන්තරයෙන් ඇපකැප වී කටයුතු කළේය.

සිය අභීත තීරණයන් සහ නිහතමානී චින්තනය යොදා ගනිමින් ශ්‍රී ලංකාව තුළ සාමූහිකත්වය ගොඩනැගීම සඳහා ගත හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම එතුමා විසින් ක්‍රියාවට නංවනු ලැබීය. ශ්‍රී ලංකාව සමෘද්ධිමත් දේශයක් බවට පත්කිරීමේ මාහැඟි විශ්වාසය අප තුළ ස්ථාපිත කරනු ලැබූ ඇල්බර්ට් ඒ. පේජ් මහතා, එතුමන්ගේ 100 වන ජන්ම දිනය සමරන අද දිනයේදී ඉමහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන යන අපගේ ගමනේ ඇල්බර්ට් ඒ. පේජ් මහතාගේ නාමය සදා අමරණීය වනු ඇත.

CTH
CREATING VALUE SINCE 1928

CEYLON THEATRES

Majestic City

Millers
Established 1854
MILLERS LIMITED

SINCE 1844
Cargills



## ජනපති, අගමැති සහ ඇමැති ඩලස් එක්ව තිරසර බලශක්ති සංවර්ධනයක්

# හිරු දෙවියන්ගේ පිහිටෙන් සෑම ගමකටම සූර්ය බලාගාර

● නිහාල් පී. අබේසිංහ

**අපේ රටේ බලශක්ති ඉල්ලුම දිනපතාම වැඩිවෙයි. එසේ වුවත් රටේ අනාගතය පදනම් වී ඇත්තේ පුනර්ජනනීය බලශක්තිය මතයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්මට අනුව 2030 වන විට ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය 70% දක්වා වර්ධනය කිරීමට විදුලිබල අමාත්‍යාංශය හා විදුලිබල මණ්ඩලය වැඩපිළිවෙළ රැසක් ක්‍රියාවට නංවා ඇත.**

මෙරට විදුලි ඉල්ලුම සපිරීම පිණිස වත්මන් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා මෙරට සමස්ත බලශක්ති කළමනාකරණය සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කරමින් පවතී. ඒ අනුව කෙටිකාලයකට මෙරට බලශක්ති අවශ්‍යතාව බලගැන්වීම දැනටම අරඹා ඇත.

ඒ සමගම මධ්‍ය කාලීන හා දිගු කාලීන සැලසුම් අනුව එතුමන් තම විද්‍යාත්මක හැදෑරීම ජනගත කරමින් සිටී. ඒ අනුව මෙතෙක් ආරම්භ කර නවතා දමා තිබූ ව්‍යාපෘති වේගවත්ව අවසන් කිරීමත්, ස්වභාවික ජල විදුලි බලාගාර ක්‍රමවත් හා නවීකරණය කිරීමත් සිදුවෙමින් පවතී. හදිසි අවශ්‍යතා සඳහා තාප හා සූර්යශක්ති බලාගාර ග්‍රාමීය ප්‍රදේශ මුල් කරගනිමින් ස්ථාපිත කිරීමත්, පරිසර හිතකාමී දිගුකාලීන ස්වභාවික වායු සුළං, සූර්ය බලය මුල් කරගත් බලශක්ති බලගැන්වීම ආරම්භ කිරීමත් ඉන් ප්‍රධාන අංග කීපයකි. එහි ප්‍රතිඵලයක් ලෙස මසක් ඇතුළත විදුලි බලාගාර 03 ක් ජනගත කිරීමට හැකි විය.

'සැමට විදුලිය' යන සංකල්පය යටතේ මේ වනවිට අඩු ආදායම්ලාභීන් සඳහා නොමිලේ විදුලිය ලබාදීම, නොමිලේ නිවස තුළ විදුලි රැහැන් ගත කිරීමත් විදුලි පරිභෝජනය හරවත් ලෙස යොදා ගැනීමත්, අරපිරිමැස්ම සඳහා ජනතාව දැනුම්වත් කිරීමත්, ජනතා සහන සඳහා නව තාක්ෂණය මගින් ජනහදට ළඟාවීම පිණිස සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදුකර ඇත. මෙරට විදුලි පාරිභෝගිකයා දිරිගන්වමින් නව ලොව දැකීමට අවැසි නව බලශක්ති ජනනය නොකඩවා ඉදිරියට ගෙන යන බව ද එමගින් සිදුවන්නේ මහින්ද චින්තන ඉදිරිදැක්ම සෞභාග්‍යයේ දැක්මක් ලෙස ජනහදට ළංවීම බවද විදුලිබල අමාත්‍යවරයාගේ අදහස වේ.

මෙම වැඩපිළිවෙළ යටතේ ක්‍රියාත්මක අලුත්ම විදුලිබල නිපැයුම් වැඩපිළිවෙළ වන්නේ මෙරට සෑම ගම්මානයකට සූර්ය බල විදුලි බලාගාරයක් ඉදිකිරීමේ වැඩපිළිවෙළයි. ඒ අනුව රටපුරා ගම්මාන 7000 කිලෝ වොට් 100 සූර්ය විදුලි බලාගාර 7000 ක් ඉදිකිරීමට දැන් ටෙන්ඩර් පත් කැඳවා ඇත.

## ට්‍රාන්ස්ෆෝමර් එකක් ළඟ පර්චස් 40ක් ඇත්නම් රජයෙන් සල්ලි උල්පතක්

මේ පිළිබඳව අදහස් දක්වන විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම පවසන්නේ මේ වැඩපිළිවෙළ මෙරට විදුලිබල ක්ෂේත්‍රයේ අලුත් පිටුවක් පෙරළන බවයි.

"මෙය රටේ මෙන් ම ජනතාවගේ ඉතිහාසය වෙනස් කරන යෝධ පිම්මක්. මෙතෙක් ජාතික විදුලිබල පද්ධතියට සූර්ය බලයෙන් ලැබුණ දායකත්වය මෙගාවොට් 517 ක් පමණයි. අදින් ආරම්භ වූ ගමට බලාගාරයක් වැඩසටහන මගින් එම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීමට හැකිවේවි. රටේ ආර්ථිකයට දිය හැකි සුවිශාල දායකත්වයක් සපයමින් පරිසරයට සෙත් පිරිතක් බඳු වූ ගමට බලාගාරයක් ව්‍යාපෘතිය මගින් අභිනවයෙන් ජනිත වන සූර්ය විදුලි බලාගාර 7000 වසර 03 ක් ඇතුළත නිම කර ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 700 ක දායකත්වයක් ලබාදීමට කටයුතු කරනවා" යැයි අමාත්‍ය ඩලස් අලහප්පෙරුම අවධාරණය කරයි.

අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මේ ගැන අදහස් දක්වමින් සූර්ය විදුලිය සම්බන්ධයෙන් ලංකාවේ පළමු වරට කථිකාවක් ඇතිවන්නේ 1980 වසරේ බවත්, රටේ අනාගතයට නව මානයක් කියාපාමින්. අදින් ඇරඹෙන මෙම 'ගමට බලාගාරයක්' සංකල්පය මගින් දේශීය ව්‍යවසායකයන් 7000 ක් මෙන් ම නව රැකියා අවස්ථා 20000 පමණ බිහිවීම වන බවත් පැවසීය.

ලංකා විදුලිබල මණ්ඩලය සමග වසර 20 ක ගිවිසුමක් අනුව මෙම විදුලි බලාගාර 7000 ස්ථාපිත කෙරෙන බවත්, දේශපාලනමය වශයෙන් ඒ වෙනුවෙන් කිසිදු බලපෑමක් ඇති නොවන බවත්, ඇමැතිවරයා පෙන්වා දෙයි. එසේ ම මෙතෙක් විදුලිය පහසුකම් නොලැබූ සමෘද්ධිලාභීන් සහ අඩුආදායම්ලාභී පවුල් වෙත නොමිලයේ විදුලිය සබඳතා ලබාදීම සඳහා පවුල් 99862 ක් හඳුනාගෙන ඇති බවත්, පසුගියදා ගිරිබාවෙන් ආරම්භ කළ දැයට එළිය ජාතික වැඩසටහන තුළින් මේ වනවිට නිවාස 1881 ක් වෙත විදුලිය පහසුකම් ලබාදී ඇති බවත්, ඉතිරි පිරිස් අතරින් 37363 ක් වෙත එළඹෙන අප්‍රේල් මස අවසන් වීමට ප්‍රථම විදුලි සබඳතාව නොමිලේ ලබාදීමට කටයුතු කරන අතර සෙසු සියල්ල වෙනුවෙන් මේ වසර අවසන් වීමට ප්‍රථම විදුලිය ලබාදෙන බවත් ඇමැතිවරයා පවසයි.

රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා මේ ගැන අදහස් දක්වමින් "රටක් වශයෙන් අපි මෙතෙක් කාලයක් සිටියේ අනෙක් රටවල්වලට පසුපසින්. නමුත් දියුණුවන ලෝකයත් සමඟින් අනෙක් රටවල් සමඟ සම සමව යාමට නම්, සමස්ත ලෝකය මෙන් ම අපිත් පුනර්ජනනීය බලශක්තිය වෙත යොමුවීම අනිවාර්ය බව කීය. ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මේ වනවිට අපට ඉලක්කයක් ලබාදී තිබෙනවා, වසර 2030 වනවිට පුනර්ජනනීය බලශක්ති දායකත්වය 70% ක් දක්වා ගෙන ඒමට. එම ඉලක්ක ජයගැනීමේ එක් පියවරක් වශයෙන් ගමට බලාගාරයක් සංකල්පය අපි ක්‍රියාත්මක තලයට ගෙන ඒමට සමත් වුණා. මේ යටතේ පළමු අදියර වශයෙන් ඉදිවන සූර්ය බලාගාර 880 ක් වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීම සිදුවුණා.

මේ මඟින් රටේ ආර්ථිකයට මෙන් ම සමස්ත රටවැසියාට සුවිශේෂී ප්‍රතිලාභයන් රාශියක් හිමිවීමට නියමිතයි. 'ගමට බලාගාරයක්' සංකල්පය වසර 03 ක් වැනි කාල සීමාවක් තුළදී යථාර්ථයක් බවට පත්කර ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 700 ක් ලබාදීමේ අරමුණ වෙනුවෙන් සූර්යබල, සුළං සහ ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් පූර්ණ කැපවීමකින් කටයුතු කරන අතර ම, මෙවැනි ම තවත් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන් රැසක් හඳුන්වාදීමට ඉදිරි කාලසීමාවේ දී කටයුතු කරනවා දුමින්ද දිසානායක පවසයි. මේ පිළිබඳව අපට කරුණු පැහැදිලි කළ විදුලි බල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී රෝහාන් සෙනවිරත්න මහතා පවසන්නේ මේ අලුත් සූර්ය බලාගාර වැඩපිළිවෙළ යටතේ රටේ ගම්මාන 7000 ක කිලෝවොට් 100 සූර්ය බලාගාර 7000 ක් වසර 3 ක් ඇතුළත පිහිටුවන බවයි."



නව බලශක්ති වැඩසටහනට උපදේශකත්වය ලබාදෙන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් සහ අගමැති මහින්ද රාජපක්ෂයන් ද, වැඩසටහන මෙහෙයවන විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම ද මෙහි වෙති.

"දැන් අපේ මේ ජල විදුලිය මගින් විදුලිය නිපදවීම අවසන් වෙමින් පවතිනවා. නව ජලවිදුලි බලාගාර 2 - 3 ක් පමණයි හදලා අවසන් කරන්නට තිබෙන්නේ. නමුත් සූර්ය බලය අපට ඕන තරම් තිබෙනවා. සියලු දිස්ත්‍රික්කවල සියලු ගම්මානවල අපට ට්‍රාන්ස්ෆෝමර් 32000 ක් තිබෙනවා. ඉන් ස්ථාන 7000 ක් අසල මේ සූර්ය බලාගාර ඉදිකිරීමට හුගක් සුදුසුයි. ඒ අනුව ඒ ස්ථානවල සූර්ය බලාගාර ඉදිකිරීමට අපි දැනටම ටෙන්ඩර් කැඳවලා තිබෙනවා.

මේ බලාගාරයක් ඉදිකිරීමට අපේ ඉහත පැවසූ විදුලි ට්‍රාන්ස්ෆෝමර් අවට මීටර් 400 ක රවුම් ප්‍රදේශයක පර්චස් 40 ක පෞද්ගලික ඉඩමක් තිබිය යුතුයි. මේ එක් බලාගාරයක් ඉදිකිරීමට රුපියල් ලක්ෂ 120 ක් පමණ වියදම් වෙනවා. බලාගාර ඉදිකිරීමට රාජ්‍ය බැංකු මගින් සියයට 7.5 පොලියට ණය ලබාදෙන්න අපිත් උදවු කරනවා. මේ සූර්ය බලාගාර මගින් නිපදවන විදුලිය ඒකකයක් අඩුම ගණනේ රුපියල් 14 බැගින් වසර 20 ක් ලබාගන්නට විදුලි බල මණ්ඩලය සූදානම් . මෙවැනි වැඩක් මේ රටේ කෙරෙන්නේ ප්‍රථම වරට. මේ බලාගාර මගින් නිපදවන විදුලිය මාස 20 ක් මිලදී ගැනීමට අදාළ ගිවිසුම් අදාළ ව්‍යවසායකයා හා විදුලිබල මණ්ඩලය අතර අස්සන් කරනවා. ඒ අනුව අදාළ ආයෝජනකයාට වසර 20 ක් ඇතුළත වසරකට සියයට 15 ක පමණ ප්‍රතිලාභ ලැබීම ස්ථිරයි. ඒ අනුව මෙය මේ කාලයේ හැටියට එය ඉතා හොඳ ආයෝජනයක් බව ද රෝහාන් සෙනෙවිරත්න මහතා පවසයි.

මේ අනුව ඉදිරි වසර තුන ඇතුළත මේ සූර්ය බලාගාර 7000 අපේ රටේ ඉදිවේ. කිසිම පරිසර දූෂණයක් නොමැති මේ සූර්ය බලාගාර මගින් සූර්ය බලය පැය 7 - 8 ක් ඇති දිනවල උපරිම ධාරිතාවෙන් සූර්ය විදුලිය නිපදවන බවත් රෝහාන් සෙනෙවිරත්න පෙන්වා දෙයි.

## අලුත් රැකියා 20000ක් විදේශ විනිමය කෝටි ගාණක් ඉතිරියි

මේ යටතේ මුලින් ම සූර්ය බලාගාර 880 ඉදිවන අතර ඒවායේ විදුලිබල ජනන කටයුතු ඉදිරි වසර දෙක ඇතුළත ආරම්භ කිරීමට සූදානම්ය. මේ වැඩපිළිවෙළ මගින් ගමේ තරුණයන්ට රැකියා අවස්ථා සමග රටේ ආර්ථික අර්බුදයට කදිම විසඳුමක් ලැබෙනු ඇතැයි විදුලිබල ඉංජිනේරුවෝ පෙන්වා දෙති.

පුනර්ජනනීය බලශක්ති විදුලි ඉංජිනේරුවරුන් කර ඇති පරීක්ෂණ අනුව අපේ රටට ඉදිරි වසර 8 - 9 පමණ වන විට සූර්ය බලය මගින් මෙගා වොට් 2300 ක් සූර්ය විදුලියක් නිපදවීමට විභවතාව තිබේ.

සූර්ය බලයෙන් තවමත් අප නිපදවා ඇත්තේ මෙගාවොට් 525 ක විදුලි බලයක් පමණි. ඒ අනුව නව වැඩපිළිවෙළ යටතේ අලුත් මෙගා වොට් 700 ක් අප රටට ඉදිරි වසර 3 ඇතුළත ලැබේ. එය මෙරට බල ශක්ති ක්ෂේත්‍රයේ වාර්තාවකි.

මෙම වැඩපිළිවෙළ යටතේ සූර්ය විදුලි බල උත්පාදනය මගින් ජාතික විදුලිබල පද්ධතිය වෙත විදුලිය සැපයීමට වොට් 75 ක ධාරිතාවයෙන් යුත් පොළොවෙහි සවිකරන සූර්ය විදුලි බලාගාර ව්‍යාපෘතිය ඉදිකිරීම, අයිතිය සහ පවත්වාගෙන යාම යන පදනම මත සුදුසු යෝජනා ඉදිරිපත් කරන ලෙස පළාත් 7 ක ජනතාවගෙන් විදුලිබල මණ්ඩලය ඉල්ලා ඇත. උතුරු, උතුරුමැද, නැගෙනහිර, වයඹ, මධ්‍යම හා දකුණු පළාත් ඒ අතර වේ.

මෙම ව්‍යාපෘතිය අනුව සූර්ය බලාගාර ඉදිකළ හැක්කේ පෞද්ගලික අයිතිය ස්ථිර ලෙස ම ඇති ඉඩම්වල පමණි. මෙම ව්‍යාපෘතියට අදාළ වන සියලු පාරිසරික අනුමැතිය රාජ්‍ය ආයතනවල අනුමැතිය හා ව්‍යවස්ථා මත බලපත්‍ර ආදිය ව්‍යවසායකයා විසින් ලබාගත යුතු ය.

## ස්වේච්ඡා, සමාජ සේවා, හා සමෘද්ධි සංවිධානවලට ඉල්ලුම් කරන්න පුළුවන්.

අදාළ බලාගාරය ඉදිකරන ඉඩම ආසන්නම තාරා පැවිය (ට්‍රාන්ස්ෆෝමර්) සිට මීටර් 400 ක් අහස් දුරින් තිබිය යුතු ය. අදාළ සූර්යබල විදුලි බලාගාරය ලංකා විදුලිබල මණ්ඩලය සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමක් අත්සන් කළ යුතු අතර විදුලිය මිලදී ගැනීම සඳහා එම ගිවිසුම වාණිජ මෙහෙයුම් ආරම්භ කරන දිනයේ සිට වසර 20 ක කාලයක් සඳහා වලංගු වෙයි. මෙම ව්‍යාපෘතියේ ආයෝජකයන් වීමට ද සුදුසුකම් කිහිපයක් සපුරාලිය යුතුය. ඒ අනුව සංස්ථාපිත සමාගම්වලට එවැනි සමාගම් වල ඒකාබද්ධ ව්‍යාපාරවලට මේ සඳහා ඉල්ලුම් කළ හැකියි. ඊට අමතරව තනි ව්‍යාපාර හිමිකරුවකු ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ හවුල්කාරිත්වය යටතේ ලියාපදිංචි හිමිකාරිත්වයක් ඇති ව්‍යාපාරවලට ද මේ ජාතික කර්තව්‍යයට එක් විය හැකිය. ඊට අමතරව ස්වේච්ඡා සමාජ සේවා සංවිධානවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට ද මේ සූර්ය බලාගාර ඉදිකිරීමට ඉල්ලුම් කළ හැකි ය.

ඒ සමගම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන වලට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකි බව විදුලිබල මණ්ඩලය කියයි.

ජල විදුලිය මත පමණක් යැපෙමින් දිනෙන් දින වැඩිවන විදුලි ඉල්ලුමට පිළිතුරු දීමට ඓතිහාසික දේශපාලන භාවිතයේ ප්‍රායෝගික විකල්ප උත්සාහයන් වෙත යොමු වූයේ වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන් පමණි. මීට දශක 2 කට ආසන්න කාලයක සිට එතුමන් හෙට දවස වෙනුවෙන් දේශීය බලශක්ති අවශ්‍යතාව මැනවින් වටහා ගෙන තිබුණ බව පැහැදිලිව දක්නට ලැබෙන්නේය.

ඒ නිසා ම දිනෙන් දින ඉහළ යන විදුලිබිල පාලනය කරමින් ජනතා සහන ලබාදීම සඳහා දේශයේ වේගවත් සංවර්ධනයට පිටිවහලක් වන බලශක්තිය පිළිබඳ නිවැරදි අවබෝධයක සිටි බව එතුමන් එදා සිට අද දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙස බැලීමේ දී හොඳින් ම අවබෝධ වේ.

නොයෙක් විරෝධතා මැද නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරය අරඹන්නේ මේ අභියෝගයට එක් විසඳුමක් ලෙසය. එමගින් පසුගිය කාලයන් හි ඇතිවූ මහා නියඟයන් හමුවේ ජාතික විදුලිබල පද්ධතිය සමබර කර ගැනීමට විශාල පිටුබලයක් ලැබිණ. එහි අඩුපාඩු සකසමින් ඉදිරියට යන අතරතුර ජාතික බලශක්ති පද්ධතිය ස්ථාවර කිරීම සඳහා තව තවත් විකල්ප ව්‍යාපෘති කෙරෙහි එතුමන් අවධානය යොමු කළේය. ඒ අනුව ලංකාවේ ප්‍රථම චක්‍රීය තාප බලාගාරය ආරම්භ කිරීම,

## ගම් 7000 කට බලාගාර 7000 ක්: රටටම මෙගා වොට් 700 ක්

ලංකාවේ ප්‍රථම සුළං විදුලි බලාගාරය ඇරඹීම, ලංකාවේ ප්‍රථම සූර්ය ශක්ති විදුලි නිපදවීම හා ලංකාවේ ප්‍රථම ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරය ආරම්භ කිරීමත් මෙරට බලශක්ති ක්ෂේත්‍රයේ සුවිශේෂී ක්‍රමෝපායන් හි අග්‍රඵල ලෙස පෙන්වා දිය හැකි ය.

මේ තත්ත්වය මත මෙරට පරිසර හිතකාමී ජාත්‍යන්තර ප්‍රමිතියේ ඉහළම තාක්ෂණයෙන් යුත් ස්වාභාවික ද්‍රව වායු බලාගාරය ඉදිකිරීම ද ඇරඹෙන්නේ මහින්ද රාජපක්ෂ අගමැතිවරයාගේ මෙහෙයවීම හා ජනපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ පූර්ණ උපදෙස් අනුවය. එම බලාගාරය මගින් අපේ රටට ලැබෙන මුළු විදුලිය මෙගා වොට් 300 කි.

මේ අනුව වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂයන්ද, අගමැති මහින්ද රාජපක්ෂයන්ද එක්වී ක්‍රියාවට නංවන අපේ තිරසර බලශක්ති සංවර්ධන වැඩපිළිවෙළ නිසා අප රටට ඉදිරියේදී බලශක්ති ගැටලුවක් ඇතිවීමට ඉඩ නැත.

මේ නිසා රටට හිතකාමී අය කළ යුත්තේ රජයේ මේ පරිසර හිතකාමී විදුලි උත්පාදනය වැඩපිළිවෙළට උපරිම සහාය දීමයි. එමෙන් ම විශේෂයෙන් මේ පරිසර හිතකාමී බලශක්ති වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමට විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම දරන ප්‍රබල උත්සාහය ද අපි අගය කළ යුතු වෙමු.


## මාතර නිල්මිණී ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත මහතා අභාවප්‍රාප්ත විය



**මාතර නිල්මිණී ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත**

**ජී. එච්. චන්ද්‍රසෝම (නිල්මිණී මුදලාලි) මහතා**

**අභාවප්‍රාප්ත විය.**

දේහය අංක 21, C.A. ආරියතිලක මාවත, මාතර යන නිවසේ තැන්පත් කර ඇත.

ඒ පිළිබඳ අවසන් කටයුතු 2021/04/03 වන සෙනසුරාද සවස 5.00 ට මාතර පොදු සුසාන භූමියේදී සිදුකෙරේ.

**අලෙවි දෙපාර්තමේන්තුව - ලේක්හවුස්**

Website: www.spiceswijay.com | Email: wijayaproducts@sltnet.lk

Wijaya Agro Private Limited | Wijaya Products (Pvt) Ltd. Estd 1989 | Wijaya Leisure

# විශිෂ්ටත්වයට උපරිම සම්මාන




CNCI CRYSTAL AWARD

CNCI TOP 10 AWARD

FCCISL GOLD AWARD WESTERN PROVINCE

FCCISL NATIONAL PLATINUM AWARD



විශිෂ්ටතම කර්මාන්තය සඳහා පිදෙන CNCI ක්‍රිස්ටල් සම්මානය ලබා ගැනීම



වසරේ විශිෂ්ටතම ශ්‍රී ලාංකේය ව්‍යවසායකයාට පිදෙන ප්ලැටිනම් සම්මානය ලබා ගැනීම



තාරුණ්‍යයේ ජනප්‍රියම ආහාර වෙළඳ නාමයට සහ ජනප්‍රියම ආහාර වෙළඳ නාමයට හිමි ජනතා සම්මාන ලබා ගැනීම



විශිෂ්ටතම කර්මාන්තකරුවන් 10 දෙනාට හිමි TOP 10 සම්මානය ලබා ගැනීම

## පාරිභෝගික ඔබ සැමට අපගේ ගෞරවනීය ප්‍රණාමය

Estd 1989

## විජය ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ටෙලි. 034-2280092,2280093,2280286,
දොඩන්ගොඩ, කළුතර, ශ්‍රී ලංකා.

ISO 9001-2015 CERTIFIED COMPANY
ISO 22000-2018 CERTIFIED COMPANY
ISO 14001-2015 CERTIFIED COMPANY
ISO 45001-2018 CERTIFIED COMPANY
ISO 50001-2011 CERTIFIED COMPANY

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2021ක් වූ අප්‍රේල් මස 04 වැනිදා ඉරිදා

# මානව හිමිකම් හා පොලීසිය

ලංකාවේ නීතිය අනුව; වැරදිකරුවන්ට දඬුවම් දීමේ බලය ඇත්තේ අධිකරණයට මිස පොලිසියට නොවේ. පොලිසිය නීතිය අතට ගත් අවස්ථා කිහිපයක් ම ගැන අමිහිරි අත්දැකීම් ලාංකීය අපට තිබේ. ප්‍රජාතන්ත්‍රීය පොලිස් සේවයක් යනු සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නකි. මහජන යහපත හා මානව අයිතිවාසිකම් එහි කේන්ද්‍රීය නිමිත්ත හෙවත් සාධකය වෙයි. පොලීසියේ කාර්යභාරය මහජන සාමය පවත්වා ගෙන යෑමයි. ඒ අනුව මහජනතාවගේ අපේක්ෂාව වූයේ නීතියේ ආධිපත්‍යය සුරකින, සේවය ලබන ජනතාවට වගකියන, මහජන හිතකාමී පොලිස් සේවයක් මිස සිය ජනතාව මත බලය පටවන හිංසාකාරී පොලිස් සේවයක් නොවේ.

සිය සේවාව වඩාත් ඵලදායී සේවාවක් කරනු වස් පොලිස් දෙපාර්තමේන්තුව සතුව පරම වගකීමක් වෙයි. එම වගකීම යථාර්ථයක් කරනු වස් මෙරට තුළ රාජකාරියෙහි නිරත 85,000කට ආසන්න පොලිස් නිලධාරීන් පිරිසක්; රට පුරා විසිරී තිබෙන පොලිස් ස්ථාන 494ක සහ පොලිස් කොට්ඨාස 44කට අනුයුක්තව 24 පැයේම රාජකාරියට කැපවී සිටී. රාජකාරියේ නිරත අතිශය සුළුතරයක් පොලිස් නිලධාරීන් නිසා මෙරට පොලිස් දෙපාර්තමේන්තුවට සිදුව ඇති අවමානය නම් වර්තමානය වන විට සුළුපටු නොවේ. ඒ අවමානයේ අලුත් ම චූදිතයා අප්‍රේල් 5 වැනිදා දක්වා රිමාන්ඩ් බාරයට පත්කළ කොස්තාපල් ඉස්මයිල් රිෆයිඩීන් ය. මහරගම පොලිසියේ රථවාහන අංශ ස්ථානාධිපතිවරයා ලොරි රියදුරකු විසින් හප්පා ගෙන යෑම නිසා; පොලිස් කොස්තාපල් ඉස්මයිල් රිෆයිඩීන් ලොරි රියදුරාට තිරිසන් ලෙස පහර දුන් සිද්ධිය ගැන කතා කළ යුතු වන්නේ මෙකී පසුබිමේ ය.

1866 සැප්තැම්බර් 03 වැනිදා ප්‍රථම පොලිස්පති ජී. ඩබ්. ආර්. කැම්බල් යටතේ ජාතික පොලිස් සේවයක් බවට නිල වශයෙන් ස්ථාපිත වූ මෙරට පොලිස් දෙපාර්තමේන්තුවේ වසර 155කට ආසන්න කාලසමය ඇතුළත මෙවැනි අවමන් සහගත සිදුවීම් රැසක් සිදුවී තිබේ.

ඒ අතර 1970 දී පේරාදෙණිය සරසවියේ සිසුවකුව සිටි වීරසූරිය පොලිස් වෙඩි පහරින් මරණයට පත්වීම එකල රට ම කම්පාවට පත්කළ පුවතක් විණි. වීරසූරිය මෙරට ඉතිහාසයේ එලෙස මියගිය පළමු සරසවි සිසුවාද විය. ජනතාව; පොලිසියට ගල්මුල් ප්‍රහාරවලින්ද සංග්‍රහ කළ සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවේ ම නාමයට අවමන් සහගත කළු පැල්ලමක් එක්කළ සිදුවීමක් අඟුලාන පොලිසියෙන් වාර්තා වී තවමත් වැඩි කලක් නැත. ඒ ද මනුෂ්‍ය ඝාතනයක් සිදු වීම නිසා ය. පසුගිය ජූලි 10 වැනිදා රාත්‍රියේ මාර්ග ආරක්ෂාවේ යෙදී සිටි අඟුලාන පොලිසියට අනුයුක්ත නිලධාරීන් දෙදෙනකුගේ පොලිස් වෙඩි පහරින් අඟුලානේ පදිංචි ධීවරයකු වූ 39 හැවිරිදි අමිත් කරුණාරත්න නමැති සිවු දරු පියා ඝාතනය වීම එකී සිද්ධියයි. ඊට පෙර ද 2009 වසරේ දී ද්විත්ව ඝාතනයක් සම්බන්ධයෙන් එවකට අඟුලාන පොලිස් ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කළ නිව්ටන් සහ තවත් නිලධාරීන් තිදෙනෙකුට මරණ දඬුවම් නියම විණි. මෙකී කළු පැල්ලම් පොලිස් ඉතිහාසයෙන් අකාමකා දැමීම පහසු නැත.

නොහික්මුණු රියැදුරන්ගේ කල්ක්‍රියාව නිසා ද පසුගිය කාලය පුරා සාමාන්‍ය ජනතාව ජීවිතයෙන් වන්දි ගෙවූ අවස්ථා විරල නොවේ. පස්සර 14 දෙනකුට මරු කැඳ වූ බස් අනතුරේ උණුසුම් සුසුම් තවමත් වාතලයෙන් නික්ම ගොස් නැත. නොහික්මුණු රියැදුරකු නිසා රාජගිරියේදී උප පොලිස් පරීක්ෂකවරයකුට ජීවිතය අහිමි වී දින 10කට වඩා ඉක්ම ගොස් නැත. රාජකාරිය දේවකාරිය සේ කරන පොලිස් නිලධාරීන් ට වන මෙවැනි අනතුරු ගැන රට ම කම්පා වෙන්නේ එක්සිත්ව ය. රැයක් - දවාලක්, අවුවක් - වැස්සක් නොතකා මහමඟම ජීවිතය ගෙවන රථවාහන පොලිස් නිලධාරීන් ගැනත්, ඔවුන්ගේ කටුක දිවිපෙවෙත ගැනත් ජනතාව දනිති. රිෆයිඩීන් වැනි සංයමයක් නැති, නොහික්මුණු නිලධාරීන් මේ අගෞරව කරන්නේ එවැනි කැපවීමක් සහිත බහුතරයක් ජනතා සේවය කරන නිලධාරීන්ට වීම අභාග්‍යයකි. ගමේ ගොඩේ මේවැනි දෑට කියන්නේ කිරි කලයක් දොවා ගොම බින්දුවක් වැටුණා වැනි ය කියා ය. නිල ඇඳුම පිටුපස ජාතියේ ආරක්ෂාව සපයන, විනය රකින නිලධාරීන් මෙන්ම බලය අවියක් කරගන්නා මේවැනි නිලධාරීන් ද සිටී.

බිම වැටී පහර කන රියැදුරාට බේරීමට කිසිත් කරගැනීමට නොහැකි තරම් ආවේගශීලී ව හා මැරකමින් පහර දෙන කොස්තාපල්වරයා ප්‍රසිද්ධියේ හැසිරෙන්නේ මෙසේ නම්; හිර කූඩු ඇතුළේ සිටින සැකකරුවන්ට කෙලෙස සලකන්නට ඇත්දැයි ජනතාවට කුකුසක් මතු වීම සාධාරණ ය. ලොව පුරා සමාජ මාධ්‍ය ඇතුළු විද්‍යුත් මාධ්‍යයට පුවත් මැවූ මේ ක්‍රියාව සමස්ත ශ්‍රී ලංකාවට ම අපකීර්තියකි. මේ සිදුවීම සිදුවී පැය කීපයක් ගතවීමටත් මත්තෙන් පොලිසිය බාර අමාත්‍යවරයා ලෙස මහජන ආරක්ෂාව බාර අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර, පොලිස්පතිවරයාට දන්වා තිබුණේ ඒ නිලධාරියාගේ සේවය අත්හිටුවන ලෙසයි. සාමාන්‍ය පුද්ගලයකුට පහර දීමට පොලිස් නිලධාරියකුට අයිතියක් නැති බව ද හෙතෙම අවධාරණය කළේ ය. 'මකා දමා හෝ පොලීසිය සුද්ධ කරනවා' යැයි මාධ්‍ය ඔස්සේ පවසා එහි උණුසුම යන්නටත් කලින් මෙවැන්නක් සිදු වීම ඔහුට එකී පොරොන්දුව ඉටු කිරීමට උත්තේජනයක් සපයන්නක් වන්නට ඇත.

පසුගිය මාස තුනක කාලයකදී පොලිස් නිලධාරීන් 72ක් රිය අනතුරුවලට ලක්වී ඇති අතර, ඉන් 18කගේ ජීවිතය අහිමි වී තිබේ. 2020 වසරට පමණක් පොලිස් නිලධාරීන් 293 දෙනෙක් රථවාහන රාජකාරියේ යෙදී සිටියදී අනතුරුවලට ලක් වී ඇති අතර, ඉන් 28 න් මිය ගොස් තිබේ.

රිෆයිඩීන් වැනි කිහිපදෙනෙක් නිසා අපකීර්තියට පත් වුවත් පොලිස් සේවය රටකට අත්‍යවශ්‍ය සේවයකි. පොලිසිය විසින් රටේ සාමය, විනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ක්‍රියාදාමය ක්‍රියා විරහිත වුවහොත් අරාජික තත්ත්වයක් උදා වෙනු ඇත. ම්ලේච්ඡත්වය හා සභ්‍යත්වය අතර ඇත්තේ කෙස් ගසක වෙනසකි. දළ සිතේ පැන නැඟෙන අනන්ත අප්‍රමාණ ම්ලේච්ඡ හා නොදැමුණු සිතිවිලි පාලනය කරන්නේ පොලිසිය වැනි නීතිය, සාමය රැකීමට ඉන්නා සංස්ථාපිත රාජ්‍ය ආයතන විසිනි.

පොලිසියේ සේවය අක්‍රිය වුවහොත් සභ්‍යත්වය අබිබවා ම්ලේච්ඡත්වය හිස ඔසවනු ඇත. ඒ දිනය මෙදා අපි මේ එරෙහි වන දෑට වඩා බෙහෙවින් බිහිසුණු ය. එබැවින් කළ යුත්තේ නීතිය අතට ගන්නා පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් වීම ය.

ඒ දැනුම්වත් වීම විසින් නීතිය හා සාමය ආරක්ෂා වීමේ ශක්තිමත් හා සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගෙනු ඇත. කොස්තාපල් රිෆයිඩීන් වැන්නන් නොව පොලිස් සේවයේ වගකීම පිළිබඳ සවිඥානික නිලධාරීන්ගේ අවශ්‍යතාවක් රටට තිබේ.

● සුභද්‍රා දේශප්‍රිය

# ‘සෑම නිලධාරියෙක්ම මානව හිමිකම් රැකීමට බැඳී සිටිනවා’

## ● නීතිඥ උදුල් ප්‍රේමරත්න

**පොලිස් කොස්තාපල්වරයකු විසින් මහමඟදී රියැදුරකුට අමානුෂික ලෙස පහරදීමේ සිදුවීමත් සමඟ පොලිස් පහරදීම් සම්බන්ධයෙන් සමාජ කතිකාවක් ගොඩනැඟී ඇත. පොලිසිය විසින් සිවිල් ජනතාවට පහරදීමේ සිද්ධි කිහිපයක්ම පසුගිය කාලය පුරා සිදුවූ අතර එවැනි සිදුවීම් සමාජ ජාල වෙබ් අඩවි මඟින් සමාජගත කිරීමත් සමඟ සමාජ කතිකා ගොඩනැඟුණද ඒ සිදුවීම් සියල්ල මඟින් සමස්ත පොලිස් පහර දීම් සම්බන්ධයෙන් හැඳින්වීමක් කළ නොහැකිය. පොලිස් පහරදීම් විශාල සංඛ්‍යාවක් සමාජගත නොවී සිදුවන අවස්ථාද බොහෝය.**

මෙවැනි සිදුවීමක් සමාජගත නොවුණේ නම් තත්ත්වය මීට වඩා වෙනස් වන අතර, කිසිවකු විසින් මේ සිදුවීම් පිළිබඳ කතා නොකරනු ඇත. මෙවැනි සිදුවීම් කතබහට ලක්කිරීමට නම් ඒවා සමාජ ජල මාධ්‍ය හරහා ප්‍රචාරය විය යුතුමද යන්න ගැටලුවකි. සාක්ෂි සම්බන්ධ ගැටලු නිසා මෙවැනි සිදුවීම් බොහෝ දුරට යටපත් වී යන අවස්ථා ද වෙයි. ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුම්වත්වීමක් නැති වීම පිළිබඳ කාරණාව මෙහිදී සාකච්ඡාවට බඳුන් විය යුතු ප්‍රධාන කරුණකි.

පොලිස් නිලධාරියාගේ රාජකාරියට බාධා කිරීමක් හෝ යම් පීඩාවක්, හිංසනයක් කිරීමට තැත් නොකරන සිවිල් පුද්ගලයකුට පහරදීමට කිසිසේත් අයිතියක් නැත. මෙලෙස අමානුෂික ලෙස පහර දීම කිසිසේත් අනුමත කළනොහැකිය. කෙසේ වෙතත් පොලිස් නිලධාරියකුට විරුද්ධව ආත්ම ආරක්ෂාවේ අයිතිය යටතේ ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට සිවිල් පුද්ගලයකුටද අයිතියක් ඇත.

මෙහිදී පැහැදිලි කළ යුතු කරුණක් ඇත. එනම්, පොලිසියට නිලධාරීන් බඳවා ගැනීමේදී රජයෙන් විශාල මුදලක් දරා කාලයක් මුළුල්ලේ පුහුණුවක් ලබා දෙයි. එවැනි පුහුණුවක් ලත් නිලධාරියකුට මෙවැනි ප්‍රහාර එල්ල කළ නොහැකිය. මේ සිදුවීමට අදාළව පහර කෑමට ලක්වූ පුද්ගලයාට යම් සාධාරණයක් ඉටු වී ඇත.

එහෙත් පහරදීම පිළිබඳ සැලකීමේදී පොලිසිය මෙලෙස පහරදෙන්නේ ඇයි යන කාරණාවට ස්ථිරසාර විසඳුමක් නැතිවා සේම විසඳුමක් ලබාගැනීමටද පොලිසිය සමත් වී නැත. අපරාධ මර්දනය සම්බන්ධයෙන් පොලිසියට සාර්ථක පුහුණුවක් ඇත. එහෙත් පොලිසිය සිවිල් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කළ යුත්තේ මොනවාද? පොලිසියට ඇති වගකීම් කුමක්ද? ජනතාවගේ දඩ මුදලින් නඩත්තු වන, ජනතාව වෙනුවෙන් පවතින පොලිසිය, ජනතාවට සේවය සපයන, ජනතාවට සමීප ආයතනයක් බවට පත් කරන්නේ කෙසේද? යන කාරණා පිළිබඳ දැනුම්වත් වී නැත. පසුගිය කාලයේදී පොලිසියේ මතුපිට වෙනස්කම් යම් ප්‍රමාණයක් සිදුකර ඇති බව පෙනේ. පොලිසිය ඉදිරිපිට ස්ථානාධිපතිගේ දුරකථන අංකය හා ජනතා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රදර්ශනය කිරීම හා පැමිණිලිකරුවන්ට පොලිසියේදී සිදු වන ප්‍රමාදය වැළැක්වීම ආදී බාහිර කරුණුවලට වඩා ප්‍රගතිශීලී ගැඹුරු වෙනස්කම් අවශ්‍යව ඇත.

සාධාරණයක් ඉල්ලා පොලිසියට ගිය කෙනකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයට කටයුතු කරන්නේ නම්, නීතියට පිටින් මිනිසුන් ඝාතනය වේ නම්, අතපය කඩන්නේ නම් එහි ඇති ඵලය කුමක්ද? සිවිල් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අපරාධ මර්දන ක්‍රියාවලිය සිදු කරන්නේ කෙසේද යන කාරණාව පිළිබඳ පොලිසිය මනා පුහුණුවක් ලැබිය යුතුය.

අපේ රටේ පොලිසියට ස්තුතිවන්ත විය යුතු ඇතැම් කරුණු ද වේ. දේශපාලනික බලපෑම්වලට යටත් නොවී ස්වාධීනව රාජකාරිය ඉටු කරන නිලධාරින් විසින් අපරාධ කඩිනමින් විසඳීමට කටයුතු කිරීම අගය කළ යුතුය. ඇතැම් රජයන් යටතේ දැවැන්ත දේශපාලන අතපෙවීම් ඇති සිදුවීම් තවමත් නොවිසඳුණු අපරාධ ලෙස ඉතිරි වී ඇත. අනෙක් සියලු අපරාධ විසඳීම සම්බන්ධයෙන් චෝදනාකරුවන් අත්අඩංගුවට ගැනීම, කරුණු විමසීම්, චෝදනා ගොනු කිරීම හා උසාවියට ඉදිරිපත් කිරීමට පොලිසිය සමත් වී ඇත.


එහෙත් පසුගිය කාලය පුරා අපි පොලිසිය සම්බන්ධයෙන් දුටු ප්‍රධාන කාරණාවක් වෙයි. මාධ්‍ය සමඟ ඇති ගනුදෙනුව තුළ සමහර පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයන් පුවත් මවන්නකු බවට පත්වීමක් දැකිය හැකි විය. වත්මන් මාධ්‍ය ප්‍රකාශකවරයා සම්බන්ධයෙන් අපට එවැනි විවේචනයක් නැත.

උදාහරණයක් ලෙස සේයා සදෙව්මී දැරියගේ ඝාතනය සම්බන්ධයෙන් ගත් විට විශාල ආන්දෝලනයක් රට පුරා ඇති විය. එවැනි තත්ත්වයක් ඇති වූ විට පොලිසිය උත්සාහ කරන්නේ ඉතාමත් කඩිනමින් අපරාධකරුවන් සෙවීමටය. ඒ තුළ යම් කිසි ලෙසකින් විමර්ශනයේ ප්‍රතිඵල නිතර ලබා ගැනීමටත් එය මාධ්‍ය හරයා ප්‍රචාර කිරීමටත් කලබලයක් වෙයි.

ඉහත කී සේයාගේ සිදුවීමේදී දාහත් හැවිරිදි පාසල් සිසුවකු අත්අඩංගුවට ගැනීම හා පොලිස් පහරදීම් ගැන සමාජයේ කතාබහක් ඇති විය. කොටදෙනියාව පොලිසියේ නිලධාරින් එම දරුවාට විරුද්ධව ගොනු කර තිබූ සියලු කරුණු සත්‍යයෙන් තොර බව තහවුරු වීමෙන් එම තරුණයාගේ චරිතය විශාල ඝාතනයකට ලක්විය. ඒ දරුවා වෙනුවෙන් ඔහුගේ මව පොලිසියට විරුද්ධව මානව හිමිකම් කවුන්සිලයේ පැමිණිල්ලක් ගොනු කිරීම සිදුවිය. ඉන්පසු ඒ සිදුවීම සම්බන්ධයෙන් එක්දරු පියකු ද සැකපිට අත්අඩංගුවට ගනු ලැබිණි.

ඉන් පසුව පොලිසියට විරුද්ධව ඔහුත් මානව හිමිකම් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලදී. එහිදී යලිත් කොණ්ඩයා යන පුද්ගලයා පිළිබඳ විශාල සමාජ කතිකාවක් ගොඩනැගුණු බව අපි දනිමු. මාධ්‍ය ප්‍රකාශකවරුන් ඒ සම්බන්ධයෙන් කරුණු රැසක් හෙළිදරව් කරන ලද අතර අවසානයේ කොණ්ඩායාගේ වැඩිමහල් සොහොයුරා ඝාතකයා විය. ඔහු එල්ලුම් ගසට නියම විය.

පුවත් කඩිමුඩිය නිසා මෙවැනි සිදුවීම් විය හැකිය. අපරාධයක් සිදුවූ විට සාධාරණ විමර්ශනයක් කර සැකකරුවන් පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට වඩා මාධ්‍යවලට පුවත් මැවීමට ඇතැම් පොලිස් නිලධාරින්ට උනන්දුවක් ඇත. පොලිස් පහරදීම් ආදී අසාධාරණ සිදුවීමට ප්‍රධාන හේතුව එයයි. අමානුෂික පහරදීම්වලට අමතරව තවත් මෙවැනි මානුෂික හිංසනයන් සිදුවන්නේද යන්න ගැටලුවකි. පොලිසියේ විමර්ශන ක්‍රියාවලියේදී කොතරම් මානව හිමිකම් කඩවීම සිදුවනවාද යන්න එහිදී ඉතා පැහැදිලි වෙයි.



තවද පහරදීම් සම්බන්ධයෙන් කතා කිරීමේදී රත්නපුර ප්‍රදේශයේ බට්ටි නැමැති කාන්තාවට පොලිස් නිලධාරියකු පහර දෙන ලදී. ඇය විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ආකාරයට ඇය ලිංගික ශ්‍රමික කාන්තාවකි. ලිංගික ශ්‍රමිකයන්ට සහ සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන්ට පොලිසිය විසින් කරන අඩත්තෙට්ටම් රැසකි. අහම්බෙන් වීඩියෝගත නොවුණා නම් එම සිදුවීමත් ඒ ආකාරයෙන් යටපත් වීමට ඉඩ තිබුණි. මූලික අයිතිවාසිකම් නඩුවක් ඇගේ අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරිණි. කරුණු විමසීමෙන් පසුව ඇයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම නිසා රුපියල් පනස් පන්දහසක මුදලක් පොලිස් නිලධාරියාට සහ පොලිස් දෙපාර්තමේන්තුවට ගෙවීමට නියම විය. මෙවැනි ලිංගික ශ්‍රමිකයන්, යාචකයන් දුවිලි ලෙස ඇතැම් මිනිස්සු සලකති. එහෙත් එවැනි මිනිස්සුන්ට පවා මූලික අයිතිවාසිකම් සමානය.

පසුගිය දිනක සිදුවූ පොලිස් නිලධාරියා විසින් ඝාතනය කරන ලද තරුණිය සම්බන්ධයෙන් කතා කිරීමේදී අදාළ හෝටල් කාමරයේ දොර අසල තිබුණ රුධිර පැල්ලම හැර සියල්ල අතුරුදන් කිරීමට ඔහු කටයුතු කර ඇති බව පෙනේ. විනයක් සහ ශික්ෂණයක් යටතේ අවම බලයක් ලබාදීම යන කරුණ ඉතා වැදගත් වේ. අපරාධකරුවකු වෙනුවෙන් පමණක් අවම බලය පාවිච්චි කළ යුතුයි.

විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට පහරදිම සම්බන්ධයෙන් කතා කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව භාෂණයේ රැස්වීමේ සමාගමේ රැකියාවේ සහ යාම්ඊම් යනාදියේ නිදහස, භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස, සාමකාමීව රැස්වීමේ නිදහස යන අයිතීන් වෙයි. වෘත්තිය සමිති පිහිටුවීමට වෘත්තිය සම්බන්ධයෙන් උද්ඝෝෂණ සාමකාමීව රැස්වීමට අයිතිය පවතී. ඒ සියලු අයිතිවාසිකම් වෙනුවෙන් උද්ඝෝෂණය කිරීමේ අයිතිය ජනතාවට වෙයි.

බොහෝ රජයන් යටතේ මේ උද්ඝෝෂණ මර්දනය කිරීමට නිල නොවන බලපත්‍රයක් පොලිස් නිලධාරින්ට ලැබෙයි. ඒ නිල නොවන අවසරය යටතේ මේ වෘත්තිය අරගල සහ උද්ඝෝෂණ මර්දනය වන්නේ දේශපාලන අධිකාරිය යටතේය.

කෙසේ වෙතත් මෙතැනදී අවශ්‍ය වන්නේ අදාළ ප්‍රඥාප්ති, ව්‍යවස්ථා, නීති රීති උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් තර්ක ගොඩනැගීමට වඩා මිනිසුන් විසින් තමන්ගේ අයිතිය පිළිබඳ දැනුම්වත් වීමයි. පොලිස් නිලධාරින්ගෙන් පහර කෑමට ලක් නොවී, නින්දා අපහාසවලට ලක්නොවී පොලිස් නිලධාරීන්ට පාවිච්චි කළ අවම බලය පිළිබඳ ජනතාව දැනුම්වත් විය යුතුයි. තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සහ අනෙක් අයගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුම්වත් වී සිටිය යුතුයි. නීත්‍යානුකූලව හැසිරෙන්නේ නැති පොලිස් නිලධාරියකුට විරුද්ධව ක්‍රියා කිරීමටට පමණක් නොව යම් කෙනෙකුට හිංසා පීඩා, පහරදීම් සිදුවේ නම් ඊට එරෙහි වීමේ අයිතියද වෙයි. එවැනි අසාධරණවලට විරුද්ධව කටයුතු කිරීමට වෙනත් පාර්ශ්වයකට හැකිය.

> **අමානුෂික පහරදීමකදී එය වීඩියෝ කිරීමට වඩා එයට විරුද්ධවීමේ අයිතිය ජනතාවට වෙයි. මෙවැනි දේකට නිහඬව සිටීමෙන් සමාජය කෙතරම් බරපතළ තැනක සිටින්නේද යන කාරණාව මතුවෙයි. ඒ මොහොතේ ඒ විරෝධතාව ගොඩ නොනැඟෙන්නේ නම්, තම අයිතිවාසිකම් පිළිබඳව සමාජයේ නොදැනුවත්කම බව ඉතා පැහැදිලිය.**

තමන්ගේ බලය පාවිච්චි කිරීමට පොලිස් නිලධාරීන්ට හැකි අවස්ථා වෙයි. තම නිලධාරියාගේ ආරක්ෂාවට යම් තර්ජනයන් වන අවස්ථාවලදී අවම බලය පාවිච්චි කිරීමට පොලිස් නිලධාරියාට හැකියාව ඇත.

නමුත් නිරපරාදේ යම් පහරදීමක් කරන්නේ නම් එවැනි අවස්ථාවලදී විරුද්ධ වීමට හැකියාවක් සිවිල් ජනතාවට ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තියේ මේ බව ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව කිසිම තැනැත්තකුට වධ හිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය. එමෙන්ම 12 වැනි වගන්තියේද මූලික අයිතිවාසිකම් පිළිබඳ පැහැදිලි කර ඇත. සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම ( නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය )

2. කිසිම පුරවැසියකුට වර්ගය, ආගම, භාෂාව, කුලය ස්ත්‍රී, පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපත් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය. යන්න ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත.

එබැවින් ජනතාව තම අයිතිවාසිකම් පිළිබඳව දැනුම්වත් විය යුතුය.

අමානුෂික පහරදීමකදී එය වීඩියෝ කිරීමට වඩා එයට විරුද්ධවීමේ අයිතිය ජනතාවට වෙයි. මෙවැනි දේකට නිහඬව සිටීමෙන් සමාජය කෙතරම් බරපතළ තැනක සිටින්නේද යන කාරණාව මතුවෙයි.

ඒ මොහොතේ ඒ විරෝධතාව ගොඩ නොනැඟෙන්නේ නම්, තම අයිතිවාසිකම් පිළිබඳව සමාජයේ නොදැනුවත්කම බව ඉතා පැහැදිලිය. පොලිස් නිලධාරීන් පහර දීමේදී එයට විරුද්ධ වීමට ආත්මාරක්ෂාවේ අයිතිය වෙනුවෙන් ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට පවා තමන්ට අයිතියක් ඇති බවට ජනතාව දැනුම්වත් විය යුතුය.

පහරදීමට ලක්වන පුද්ගලයාට හෝ අවට සිටින පුද්ගලයන්ට විරුද්ධ වීමේ අයිතියක් තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10.1 වගන්තිය අනුව සිරභාරයට ගැනීමේ සිට පහරදීම දක්වා කරුණු ගණනාවක් වෙයි.

යම් සමාජයක නීතිය ක්‍රියාත්මක කිරීමේදී අභිමතානුසාරී බලයක් යම් පිරිසකට ලබාදී ඇත. සීමාවන්ට යටත්ව පොලිස් නිලධාරින්ටත් යම් අභිමතානුසාරී බලයක් වෙයි. නමුත් අභිමතානුසාරී බලයක් ලබා දිය යුතු වන්නේ සුවිශේෂී පුහුණුවකින් සහ බලයකින් විනයානුකූල ශික්ෂණයක් තුළයි. මේ සියලු පුහුණුවීම් හා දැනුම්වත්වීම් යාවත්කාලීන විය යුතුය. පොලිස් පුහුණුවීම් යාවත්කාලීන වූයේ කෙතරම් කාලයකට පෙරද යන කරුණ ගැන සැලකිලිමත් විය යුතුය. විනයක් සකසන්නේ නොමැතිව යම් පිරිසකට අභිමතානුසාරී බලය ලබාදිය යුතුද යන්න පිළිබඳ සුවිශේෂයෙන් සාකච්ඡා විය යුතුය.

විශේෂයෙන් පොලිස් නිලධාරින් සම්බන්ධයෙන් කතා කිරීමේදී ඔවුන් වැඩිදෙනකු ගත කරන්නේ අතෘප්තිකර දැඩි පීඩාකාරී ජීවිතයකි. ඔවුන්ට ප්‍රමාණවත් වැටුපක් නොලැබෙයි. පැනේ සිට දුරකථන පහසුකම්, ගමනාගමනය ආදී සියල්ල තමන් විසින් සපයාගත යුතුය. එවැනි පහසුකම් නැති අතෘප්තිකර සේවයකට බලහත්කාරයෙන් නිරත කර සිටින පිරිසකි. උසස්වීම් ලබාදීමේදීද ප්‍රමාදයක් වෙයි. අයිතිවාසිකම් වෙනුවෙන් ඔවුන්ට උද්ඝෝෂණ කිරීමට නොහැකියි. මේ පීඩාවන් පිටවන්නේ බොහෝ අවස්ථාවලදී ජනතාවගෙනි. කෙසේ වෙතත් තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජනතාව දැනුම්වත් විය යුතුයි. එසේ තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුම්වත් වූ විට පොලිසිය මෙවැනි මෙවැනි හිංසනයන්ට විරුද්ධව නැඟී සිටීමට ජනතාවට හැකිවනු ඇත.



# බබා පාට්

හීය



● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

**හිටපු ජනාධිපතිවරයකු වූ මෛත්‍රීපාල සිරිසේන ඉකුත් කාලය තුළ වැඩිපුරම ගත කළේ නිහඬවය. එතුමා පාර්ලිමේන්තු රැස්වීම් වලට ඉඳහිට සහභාගී වූවද තමන් පෙනී සිටින ඇතැම් ප්‍රසිද්ධ රැස්වීම් වලදී පවා ජනමාධ්‍යවේදීන් උපායශීලීව මගහැර යන අයුරු අපට නොයෙක් වර දැක ගත හැකි විය.**

කෙසේ වෙතත් 2019 අප්‍රේල් මස 21 දා එල්ල වූ පාස්කු ප්‍රහාරය පිළිබඳව ඉකුත් සතියේ පැවති පාර්ලිමේන්තු විවාදයේ දී ඔහු තම සුපුරුදු නිහඬ බව අමතක කර දීර්ඝ දේශනයක් කර තිබුණේය. එදින රාත්‍රී විද්‍යුත් මාධ්‍යයෙන් විකාශය කෙරුණු එම දේශනය ඇසූ අපට සිතුණේ හිටපු ජනාධිපතිවරයා දැන් තමන්ගේ සියලු දොස් අකාමකා දමා දැත් පිරිසිදු කර ගැනීමට අසාර්ථක උත්සහයක් ගෙන ඇති බවයි.

සාමාන්‍යයෙන් රටක රාජ්‍ය නායකත්වයක් දැරීම යනු සුළුපටු වගකීමක් නොවේ. තමන්ගේ පාලන කාලය තුළ රටේ කොතැනක හෝ සිදුවන කුමන සිදුවීමක් පිළිබඳව වූවද එහි වගකීම පැවරෙන්නේ රාජ්‍ය නායකත්වයේ කරමතය. එහෙත් ඒ බව හිතාමතාම යටපත් කිරීමට තැත් කරන හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන 2019 අප්‍රේල් මස 21 දා එල්ල වූ පාස්කු ප්‍රහාරයේ වගකීම අන්‍යයන් මත පැටවීමට දැඩි උත්සාහයක් ගෙන තිබෙන්නේ ඒ මොහොත වන විට මෙරට රාජ්‍ය නායකයා තමන් බව සිතාමතාම අමතක කරමිනි.

ඉහත සඳහන් බිහිසුණු බෝම්බ ප්‍රහාරය එල්ල වන අවස්ථාව වනවිට මෛත්‍රීපාල සිරිසේනයන් විදේශගතව සිටි බව සත්‍යයකි. එසේ වූ පමණින් තමන්ට එම සිද්ධියේ වගකීම දැරිය නොහැකි කියා දැත් පිසදමා ගැනීමට ඔහුට නොහැකිය. එසේ වන්නේ එතුමා ඒ වන විටත් මේ රටේ ජනාධිපතිධුරය දරමින් සිටි බැවිනි.

එසේම මෙවැනි බෝම්බ ප්‍රහාරයක් එල්ල වෙතැයි සඳහන් බුද්ධි වාර්තා තමන්ට නොලැබුණු බව කීම හිටපු ජනාධිපතිවරයාගේ නිදහසට හේතුවක් නොවේ. ඇතැම් විට එය සත්‍යයක් විය හැකිය. එසේම එම ප්‍රකාශය අසත්‍යයක් වීමට ද පුළුවනි. පාස්කු ඉරිදා දින සිදුවිය හැකි ත්‍රස්ත ප්‍රහාරය ගැන විදේශ බුද්ධි අංශයකින් කල්තියා තොරතුරු ලැබී තිබුණ බව තමන් පසුව දැනගත්තේ යැයි කියන හිටපු ජනාධිපතිවරයා තම ප්‍රකාශය මඟින් වැඩිදුරටත් සඳහන් කරන්නේ මෙරට සිටි කිසිදු වගකිව යුතු නිලධාරියකු ඒ බව තමන් වෙත දැනුම් දීමක් සිදුකර නැති බවයි.

ඔහු එලෙස ඇඟිල්ල දිගු කරන්නේ අග්‍රාමාත්‍යවරයා වෙත විය හැකිය. නැතහොත් ජනාධිපති ලේකම්, ආරක්ෂක ලේකම් හෝ පොලිස්පතිවරයා දෙසට විය හැකිය. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ එම විදේශ බුද්ධි වාර්තා පිළිබඳ තොරතුරු කල්තියා දැනගෙනත් ඔහු ජනාධිපතිවරයා වෙත ඒ බව දැනුම් නොදුන්නේ නම් එයද බරපතළ වැරැද්ද පැටවෙන්නේ ජනාධිපති ලේකම් හෝ ආරක්ෂක ලේකම් වෙතද? නැත්නම් පොලිස්පතිවරයා වෙතද? යන ප්‍රශ්නය මෙහිදී පැන නැගේ.

කෙසේ වෙතත් තමන්ට එවැනි තොරතුරක් නොලැබුණු බව එවකට සිටි අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ පාස්කු කොමිසමේ දී පවා ප්‍රකාශ කර තිබුණේය. මේ අතර එම කාලය තුළ ආරක්ෂක මණ්ඩලය සතිපතා රැස් නොවූ බවත්, අඩුම වශයෙන් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට තමන් කැඳවා නොතිබුණ බවත් වික්‍රමසිංහ ඊට පෙර සඳහන් කර තිබුණු බව ද අපට මතකය. එය සත්‍යයක් නම් තමන් එම රැස්වීම් වලට නොකැඳවීම පිළිබඳව තම ඉහළ බලධරයා වන ජනාධිපතිතුමන්ගෙන් විමසීමට ඔහුට ද යුතුකමක් තිබුණේය.

මේ වන විට රටේ ආරක්ෂක ඇමති ධුරය පැවතුණේ ජනාධිපතිවරයා සතුවය. එසේ නොවුණද රටේ ජනාධිපතිවරයා වන ඔහුට තමන් විදේශගත වන අවස්ථාවේ වැඩ බලන ආරක්ෂක ඇමතිධූරය අග්‍රාමාත්‍යවරයාට හෝ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා වෙත පවරා යාමට ඕනෑ තරම් ඉඩ තිබුණේය. එහෙත් විපක්ෂ මන්ත්‍රීවරයකු ඒ පිළිබඳව විමසූ විට හිටපු ජනාධිපතිවරයා කියා සිටියේ ඉහත සඳහන් පාස්කු ප්‍රහාරය සිදුවන අවස්ථාව වන විට රට තුළ ත්‍රස්තවාදයක් නොපැවැති නිසා එවැනි පියවරක් ගැනීමේ අවශ්‍යතාවක් නොතිබුණු බවයි.

හිටපු ජනාධිපතිවරයා තම පාර්ලිමේන්තු කතාවේ දී එසේ කීවද එම අවස්ථාව වන විට මෙරට ආරක්ෂක අංශවල පූර්ණ අවධානය යොමුවී තිබුණේ නාමල් කුමාර නැමැත්තකු විසින් හෙළි කළ ජනාධිපතිවරයා ඝාතනය කිරීමේ උත්සහය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම කෙරෙහිය. මාවනැල්ලේ බුදු පිළිම කැඩීමේ සිද්ධිය පිළිබඳව පැවැති පරීක්ෂණ කටයුතු පවා අඩාළ වී තිබුණේ ජනාධිපති ඝාතනය කිරීමට සිදු කර ඇතැයි කියන කුමන්ත්‍රණය පිළිබඳව තොරතුරු සෙවීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පූර්ණ අවධානය යොමුවී තිබීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

රටේ ජනාධිපතිවරයා වූ තමන් ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක් පිළිබඳව තොරතුරු හෙළිවී ඇතැයි කියන වාතාවරණයක් තුළ රටේ ත්‍රස්තවාදයක් නොතිබුණැයි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනයන් කරන ප්‍රකාශය තරමක් ගැටලු සහගතය. එසේම ඒ අවස්ථාව වන විටත් සහරාන් අත් අඩංගුවට ගැනීම සඳහා විවෘත වරෙන්තුවක් පවා නිකුත් වී තිබුණේය. 2017 දී නිකුත් කර තිබූ එම වරෙන්තුව අනුව ඔහු අත් අඩංගුවට ගැනීම පොලීසියේ කාර්යයක් බව මෛත්‍රීපාල සිරිසේනයන් කියයි.

අනෙක් අතට 2015 සහ ඉන් අනතුරුව එළඹුණු කාලයේ ලෝකයේ බොහෝ රටවල ත්‍රස්තවාදී ක්‍රියා බහුලව සිදුවී ඇති නිසා ලෝක ත්‍රස්තවාදී ප්‍රහාරයන් ගැන සැලකිලිමත් විය යුතු යැයි තමන් ආරක්ෂක මණ්ඩල රැස්වීම් වල දී නිතර කියා සිටි බවත් මෛත්‍රීපාල සිරිසේන තම පාර්ලිමේන්තු කතාවේ දී සඳහන් කර තිබුණෝය. එසේ කියන හිටපු ජනාධිපතිවරයා ඒ සමඟම සඳහන් කරන්නේ උතුරේ යුද්ධය පැවැති සමයේ දී මෙන් රට තුළ ත්‍රස්තවාදී ප්‍රහාර ඇති වීමේ වාතාවරණයක් නොමැතිවීම නිසා තමන් විදේශ ගත වන විට ආරක්ෂක ඇමතිධූරයේ වැඩ ආවරණය කිරීම සඳහා වෙනත් පුද්ගලයෙකු පත් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බවයි.

එය තරමක් හතර බීරි කතාවකි. මන්ද 2015 සිටම ලෝකයේ බොහෝ රටවල ත්‍රස්ත ප්‍රහාර සිදු වී ඇතැයි ඔහුම කියන අතර ශ්‍රී ලාංකාවේ දී ජනාධිපති ඝාතන කුමන්ත්‍රණයක් පිළිබඳව නාමල් කුමාර නැමැත්තා විසින් තොරතුරු හෙළිදරව් තිබූ බැවින්, එවැනි තත්ත්වයක් රට තුළ තිබිය දී පවා මෛත්‍රීපාල සිරිසේනයන් විදේශගතවී ඇත්තේ තමන් සතු ආරක්ෂක ඇමති බලතල සුදුසු අයකුට පවරා නොදෙමිනි.

අපට පෙනෙන අන්දමට නම් හිටපු ජනාධිපතිවරයා තමන් සතු ආරක්ෂක ඇමති බලතල වෙනත් අයකුට පවරා නොදී ඇත්තේ එතුමා තුළ පැවති සැකයක් මුල් කර ගෙනය. එහෙත් ඒ බව ප්‍රකාශ නොකරන මෛත්‍රීපාල සිරිසේනයන් අද වෑයම් කරන්නේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් තමන් සූදානම් වීමය. එපමණකින් ද නොනවතින හෙතෙම පාස්කු ඉරිදා ප්‍රහාරයට තමන් පැටලවීමේ උත්සාහයක් පවතින බවට වත්මන් ආණ්ඩුවට ද චෝදනා කරයි. එහෙත් හිටපු ජනාධිපතිගේ එම බබා පාට් මෙරට බුද්ධිමත් ජනතාව විසින් අවඥාවෙන් යුතුව ප්‍රතික්ෂේප කරන බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

● **ඔස්වල්ඩ් ගොඩකුඹුර**, රඹුක්කන විශේෂ

# දෙවනගල යළි කැලඹෙයි!



මහනුවර යුගයේ නිම කළ බුද්ධ ප්‍රතිමා



දෙවනගලට යාමට ඇති මාවත

**හිටපු පුරා විද්‍යා කොමසාරිස්වරයකු වූ එච්. සී. පී. බෙල් දෙවනගල ගැන සිය කෑගලු වාර්තාවේ සඳහන් කළේ සතර කෝරලේ වෙනත් කිසිම තැනකදී දැකගත නොහැකි තරමේ මනස්කාන්ත දර්ශනයක් දෙවනගල පර්වතය මතට නඟින කවරකුට වුවද දැකගත හැකි බව ය. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාධකද සහිත දෙවනගල පුදබිම අනුරාධපුර යුගයේ ධාතුසේන රාජ්‍ය සමයේ (ක්‍රිස්තු වර්ෂ 460 – 479) ඉදිකරන ලද බව සැලකේ. බතලේගලට දෙවැනි වන ගල නිසාත්, අලුත්නුවර දැඩිමුණ්ඩ දෙවියන් දෙවැනි වරට වැඩමවූ ස්ථානය නිසාත් මෙය "දෙවනගල" ලෙසින් හඳුන්වන බව ජනප්‍රවාදයේ සඳහන්ය.**

මෙහි පොළොන්නරු යුගයේ සහ මහනුවර යුගයේ සෙල්ලිපි දෙකකි. ගල් විහාරය හෙවත් පැරැණි විහාරය, මහනුවර යුගයේ මූර්ති හා සිතුවම් සහිත ටැම්පිට විහාරය, සංඝාවාසය, ධර්ම ශාලාව, පොකුණ මෙන්ම සිරිපතුල වැනි ප්‍රධාන ස්මාරක කීපයකි.

එක් සෙල්ලිපියක පළමුවන පරාක්‍රමබාහු රජු සමයේ මෙරට නාවිකයන්ට බුරුම රාජ්‍යයෙන් එල්ල වූ වද හිංසාවලට විරුද්ධව එරට සමග යුද වැදුණු සෙනෙවියකුට පිදූ ගම්වරයක් ගැන සඳහන්ය. අනෙක් සෙල්ලිපිය මහනුවර යුගයේ වන අතර, පළමුවන විමලධර්මසූරිය රාජ්‍ය සමයේ විසූ රතනාලංකාර නම් හිමියන් ශාසනයේ උන්නතියට කළ සේවය වෙනුවෙන් වූ සඳහනකි.

මෙවැනි දිගු ඉතිහාසයකට නෑකම් පවසන දෙවනගල මෑතකාලීනව නිතර කතාබහට ලක්වන පුදබිමක් බවට පත්ව ඇත. ඒ දෙවනගල පුදබිමට අයත්ව තිබූ ඉඩම්වල පදිංචි පිරිස් විහාරස්ථානයට එරෙහිව සිදුකරනවා යැයි පවසන විවිධ ක්‍රියා හේතුවෙනි.



මෙහි වත්මන් තත්ත්වය පිළිබඳ කරුණු හෙළිකරන දෙවනගල රජමහා විහාරස්ථානයේ භාරකාර මැදිරිගිරියේ පුඤ්ඤසාර හිමියෝ මෙසේ වදාළහ.

'මේ ඉඩම් රජකාලේ පන්සලට පැවරුණු ඉඩම්. මේ ඉඩම්වල සිංහල, මුස්ලිම් දෙගොල්ලම සිටිනවා. ඒ අයගේ ගෙවල් ඉවත් කරගන්න, පල්ලි කඩන්න, ඒ අයට කරදර කරන්න කියලා අපි කියන්නේ නැහැ. මේ ඉඩම්වල ඉන්න සිංහල, මුස්ලිම් හැමදෙනාම මේ සෙවණේ සමඟියෙන්, මෛත්‍රියෙන් ඉන්න ඉඩකඩ ලබා දීලා මේවා විහාර දේවාලගම් පනත ක්‍රියාත්මක කරලා පන්සලට බදු මුදලක් ලැබෙන්න වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලයි අපි ඉල්ලා සිටින්නේ. මේ තත්ත්වයෙන් ජීවත්වෙලා ඉදිරියට යම් ආක්‍රමණයක් නොවෙන්න තව පල්ලි හැදෙන එක, ගෙවල් හැදෙන එක නතර වෙන්නයි ඕනෑ.

අපේ විහාරස්ථානයේ බෝධියට හානි කරනවා නම්, නාම පුවරුවලට හානි කරනවා නම්, බෞද්ධ කොඩියක් දැමුවාම ඒක ඉරා දමනවා නම්, විහාරයට යන පාර ශුද්ධ කරන්න දෙන්නේ නැතිනම් ඒකනේ ජාතිවාදය කියන්නේ. මේ රටේ මුස්ලිම් ජනතාව බහුලව ජීවත්වන ප්‍රදේශවල සිංහල ජනතාව ඔවුන්ට කරදර හිරිහැර කරන්නේ නැහැ. මෙච්චර කල් නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. පන්සලට එන පාර දැක්වෙන බෝඩ් එකක් රකින්න පොලිස් නිලධාරියෙක් පැය විසිහතරක් එතැන හිටගෙන ඉන්න ඕනෑද; මේ බෞද්ධ රටේ. අපි කවදාවත් පල්ලියකට හානි කරලා නැහැ. මේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව ජීවත්වෙනවා අපිත් සමඟ හිතවත්ව. සීමිත පිරිසක් තමයි අන්තවාදී වැඩ සිදුකරන්නේ.''

පසුගිය කාලය තුළ විහාරස්ථානයේ පුරාවිද්‍යාත්මක වටිනාමින් යුත් උරුම රැසකට විවිධ පිරිස්වලින් හානි පැමිණ තිබේ. මෙම විහාරස්ථානයේ ස්ථිරව ස්වාමින් වහන්සේ නමක වැඩ නොසිටීමද මෙම පුද්ගලයන්ට එම කටයුතුවල යෙදීමට පහසුවක් වී ඇත. සමහර පුද්ගලයන්ට දේශපාලන රැකවරණය සැලසීමද මෙම ඉඩම් අල්ලා ගැනීමට රුකුලක් වූ බව පුඤ්ඤසාර හිමියෝ පවසති.

''මෙම අන්තවාදී පිරිස් දෙවනගල විහාරයේ ඓතිහාසික වටිනාකමින් යුතු ගල් ඇඳි, ගල් පුවරු, ගල් පාදම, සඳකඩ පහණ විනාශ කරලා. ඒවා අපේ උරුම. සිංහල, දෙමළ, මුස්ලිම් අපි කාගෙත් උරුම. ඇයි මේ උරුම, පුරාවස්තු විනාශ කරන්නේ. පුරාවස්තු විනාශ කරනවා කියන්නේ සිංහලයාගේ, බෞද්ධයාගේ, මේ රටේ සිටින අනෙකුත් පුරවැසියන්ගේ ඉතිහාසය විනාශ කිරීමක්. ඒවා රැකෙන්න ඕනෑ. පහුගිය යහපාලන ආණ්ඩුව කාලේ දෙවනගල ගල් පාදම ඩෝසර් කළා. තැන් දෙකක විතරයි ගල් පාදම බේරාගන්න පුළුවන් වුණේ.

මේක පැහැදිලිවම සිංහල මුස්ලිම් ප්‍රශ්නයක් නොවෙයි. දෙවනගල ගල වටේ ගත්තාම තුන් පැත්තකම පදිංචි වෙලා ඉන්නේ සිංහල මිනිස්සු. ඒ අයගෙන් සමහරක් අන්තවාදී වැඩ කරනවා, මුස්ලිම් අයගේ නමින් යන්න. මේ දේවල්වලින් අසමඟියයි ඇතිවෙන්නේ. අපේ බෝධීන් වහන්සේ දෙපාරක් කැඩුවා; බෝඩ් කැඩුවා; පාලම් කොඩි ඉරා දැමුවා. කරපු කෙනෙක් දන්නේ නැහැ. අපිට හිතාගන්නත් බැහැ. අපි රුපියල් ලක්ෂ එකහමාරක් දෙකක් මේ බෝඩ් දමන්න වියදම් කළා. තුන් පාරක් බෝඩ් දැම්මා. මේවා ඉවරයක් වෙන්න ඕනෑ. බෝඩ් කඩා දමන නිසා වාහල්කඩක් හදන්න අපි තීරණය කළා.

යහපාලන රජය කාලයේ නීතිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මේ හැම එකක්ම දේශපාලනයට යටවෙලා තිබුණේ. නිලධාරින් අසරණයි. දේශපාලන වාසි ගන්න දෙවනගල විනාශ කළා. අද දේශපාලන බලපෑම්, ඇඟිලි ගැසීම් නැහැ.



වමේ සිට - විහාරාධිකාරී මැදිරිගිරියේ පුඤ්ඤසාර හිමි, කෑගල්ල දිසාපති මහින්ද එස්.වීරසූරිය හා ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජන්ත දිසානායක

දැන් නීතිය ක්‍රියාත්මක වෙනවා. මේ පාර බෝඩ් එක විනාශ කරපු කෙනාවත් අත්අඩංගුවට ගත්තා. මේ අපරාධකරුවන් මෙතෙක් අල්ලා ගන්න බැරි වුණා. අද වන විට දෙවනගල ගැටලුව සම්බන්ධයෙන් ජනාධිපතිතුමාගේ අගමැතිතුමාගේ, සබරගමුව ආණ්ඩුකාරතුමාගේ, දිසාපතිතුමා ඇතුළු රාජ්‍ය නිලධාරින්ගේ අවධානය යොමුවෙලා තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධශාසන අමාත්‍යාංශය මේ හැමෝම එකතුවෙලා තමයි දැන් මේකට විසඳුම් හොයන්නේ. මල්වතු මහා විහාරයේ මහානායක හිමියන් ඇතුළු සංඝ සභාව මාව මේ ස්ථානයට පත්කර තිබෙනවා.''

මේ වන විට පන්සල් භූමිය සම්පූර්ණයෙන්ම මැන අවසන්ය. එම භූමියේ එක් එක් පුද්ගලයා සතු ඉඩම් මැනීම ඉදිරියේදී සිදුකිරීමට නියමිතය. බිම් අඟලක්වත් මැනීමට නොදෙන බවට පිරිසක් තර්ජනය කරද්දීත් එම කාර්යය සාර්ථක කරගැනීමට හැකිවීම සතුටක් හා ජයග්‍රහණයක් බවද පුඤ්ඤසාර හිමියෝ පෙන්වා දෙති.

''රජය මඟින් පන්සල් බිමට අයිති අක්කර අසූ පහක් මැන්නා. අපිට දෙවෙනි මැනුම පටන් ගන්න බැහැ නඩුවක් තියෙන නිසා. ඒකේ නීති කටයුතු අවසන් නැහැ. ඊළඟට තියෙන්නේ දෙවනගල විහාරය සතු බිම මනින්න. අක්කර අසූ පහක් මේ ගම මැන්නාට ඒවා කට්ටි වශයෙන් යළි මනින්න ඕනෑ. එක් එක් පුද්ගලයන් අල්ලාගෙන තිබෙන ඉඩම් ප්‍රමාණ වෙන වෙනම මනින්න ඕනෑ; බදු අයකරන වැඩපිළිවෙළකට යන්න. එතකොට ගහක් කපාගන්න, ගෙදර හදාගන්න ඒ අයට නීතිමය අවසරයක් ලබාදෙන්න පුළුවන්. මෙහෙම තියෙනකොට එහෙම කරන්න අවසර නැහැ. එයින් මිනිස්සුන්ට අසාධාරණයක් වෙනවා. මේ මැනපු අක්කර අසූ පහ නිදහස් කර දෙන්න රජය මුල්වෙන්න ඕනෑ. ඒක කරන්න තියෙන්නේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

වටිනාම පුරාවස්තු සහිත විහාරගෙය තිබෙන්නේ ගල ඉස්මත්තේ. ඒවා තමයි රැකගන්න ඕනෑ. දෙවනගල විහාර මැනුම අයිති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට. පුරාවස්තු රකින්න ඕනෑ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. පුරාවස්තු සහිත බිම තමයි ගල පාදමේ සිට අඩි විස්සක් දුරට මනින්න ආණ්ඩුකාරතුමා තීරණය කළේ. නමුත් ඒකට විරුද්ධව මේ මැනුම නතර කරන්න කියලා සිංහල හත්දෙනෙකුත් අධිකරණයට ගිහින් තියෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුත් මේකට සම්බන්ධයි. එයා සිංහල අන්තවාදින් සහ අර මුස්ලිම් අන්තවාදින් සමඟ එකතුවෙලයි මේ වැඩේ කරන්නේ.සිංහල හොඳ පිරිසක් ඉන්නවා. මුස්ලිම් හොඳ පිරිසකුත් ඉන්නවා.ඒ දෙගොල්ලන්ටම නැඟිටින්න දෙන්නේ නැහැ මේ අන්තවාදීන්. මේ සිංහල බෞද්ධයන් නමට පමණක් බෞද්ධ. අපේ රට, ජාතිය, ආගම රැකගන්න කලවම් ලේ තියෙන අයට හැඟීමක් නැහැ. සුජාත ලේ තියෙන අයට මේ උරුම රැකගන්න ඕනෑකම තියෙනවා.''




නාමපුවරුවට හානිකළ බවට සැකපිට තරුණයකු අත්අඩංගුවට ගනිමින්

මාවනැල්ල බුදු පිළිම විනාශ කිරීමේ සිදුවීමත් සමඟ දෙවනගල ගැටලුවද ජාතිවාදී ගැටලුවක් බවට පත්කිරීමට පිරිසක් වෙර දරති. මේ අතර මෙහි මෑතදීම වූ සිදුවීම නම් සංඝාවාසයට යන මාර්ගය පෙන්වා දීමට තිබූ නාම පුවරුවක් කිසියම් පුද්ගලයකු විසින් විනාශ කිරීමය. මෙම සිද්ධියට සැකපිට මුස්ලිම් ජාතික තරුණයෙක් මාවනැල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ මස 06 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

අරනායක ප්‍රාදේශීය සභාවේ පොදුජන එක්සත් පෙරමුණ මන්ත්‍රී අජන්ත දිසානායක මෙම ගැටලුවට ඍජුවම සම්බන්ධ වූවෙකි. ඔහු මේ සම්බන්ධයෙන් පවසන්නේ මෙබන්දකි.

'මම 1997 අවුරුද්දේ ඉඳලා නොකඩවා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරනවා. දෙවනගල, තල්ගමුව, අට්ටාපිටිය සහ රුවන්දෙනිය ග්‍රාම නිලධාරි වසම්වලට අයත් ගම්මාන නවයක් මගේ කලාපයට තිබෙනවා. මේ කලාපයේ මුස්ලිම් ජනතාව පදිංචි නැහැ. බහුතරයක් වූ මේ මිනිසුන් වෙනුවෙන් ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයා ලෙස මම කතා නොකළොත් කවුද කතා කරන්නේ. මේක මේ ජනතාවට බලපාන මූලිකම ප්‍රශ්නයක්. මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කටුගහවත්ත පමණයි මුස්ලිම් අය ඉන්නේ. සමහරු මම මුස්ලිම් අය වෙනුවෙන් සල්ලිවලට කතාකරනවා කියලා කීවත් මම පගාවට වැඩ නොකරන බව මගේ විරුද්ධ පාක්ෂිකයොත් දන්නවා. මෙතන කවුරුවත් පූජා භූමියට අයිතිවාසිකම් කියන්න යන්නේ නැහැ. පාරම්පරිකව භුක්ති විඳින ඉඩම් ගැන විතරයි අපි කතා කරන්නේ.

දෙවනගල ජාතිවාදී ප්‍රශ්නයක් නැහැ. වාසියට ජාතිවාදය පෙන්නුම් කරනවා. අරනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආණ්ඩුකාරතුමා සමඟ තිබූ සාකච්ඡාවේදී මම මේ මිනිසුන් වෙනුවෙන් කතා කළා කියලා මට මරණ තර්ජනත් ආවා. නමුත් මම ඇත්ත කියන්න ඕනෑ. අපේ ගම්මානයට මේක හරිම කරදරයක් වෙලා. දෙවනගල රජමහා විහාරය රජවරුන්ගෙන් පස්සේ වැඩිදියුණු කළේ අපේ අත්තලා මුත්තලා. අදටත් අපේ පුදබිම මේ විහාරයයි. මුලින්ම දෙවනගල ගල පාමුල ඉඳලා මීටර් හාරසීයක් ප්‍රේරණ කලාපයක් කරනවාට මේ හැමෝම විරුද්ධ වුණා. ආණ්ඩුකාරතුමා ඇතුළු උසස් නිලධාරින් ඒ ගැන සලකා බලලයි ගල පාමුල සිට අඩි විස්සකට සීමා කළේ.එවැනි රක්ෂිත කලාපයක් වුණොත් මිනිස්සුන්ට ගහක අත්තක් කපාගන්නත් අවසර ගන්න වෙනවා. මේවා මේ අය පරම්පරා ගණනක් පදිංචිව සිටි ඉඩම්. අද තමන්ගේ ඉඩම වටේ බැම්මක් බැඳගන්න ඉඩදෙන්නේ නැහැ. හැබැයි එක පාර්ශ්වයකට විතරක් අනුන්ගේ ඉඩම්වල පාරවල් කපන්නත් පුළුවන්''


කෑගල්ල දිසාපති මහින්ද එස්. වීරසූරියගෙන්ද අප මේ පිළිබඳව විමසුවෙමු.

"දෙවනගල පූජාභූමිය ආශ්‍රිතව පැනනැගුණු ගැටලුවේදී විහාරාධිකාරී ස්වාමීන් වහන්සේ, අරනායක සහ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම්වරු, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ඉඩම් අමාත්‍යාංශය, පොලිසිය සහ සියලුම පාර්ශ්වයන් සමඟ ඒකාබද්ධ සාකච්ඡා වට කීපයක් පැවැත්වූවා. දැනට භාරකාර ස්වාමීන් වහන්සේ සහ දායක සභාවෙන් ඓතිහාසිකව පැවැති විහාරස්ථානයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීමත්, පුරා විද්‍යා රක්ෂිතයට හානි වන බවත් ප්‍රකාශ වූවා. මෙහි ඉතිහාසය බලන විට යම් යම් අවස්ථාවලදී වසර ගණනාවක් තිස්සේ ඉඩම් අල්ලා ගැනීම් සිදුව තිබෙනවා. අවුරුදු අසූව,අනූව පැරැණි ඔප්පු හදාගත් අයත් සිටිනවා.

කෑගල්ල දිසාපතිවරයා ලෙස බුද්ධශාසනයට අදාළ කටයුතු සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ පහසුකම් සැලසීමත්, පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ජාතික උරුම ආරක්ෂා කිරීමත් මට පැවරී තිබෙන වගකීමක්. පූජනීය හා පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන අනාගත පරපුරට ආරක්ෂා කිරීමේ ස්ථාවරයෙන් ඒ අනුව මම කටයුතු කරනවා. සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමාගේ සහ මගේ ප්‍රධානත්වයෙන් කච්චේරියේ රැස්වීම් දෙකක් පැවැත්වුණා. ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්, පුරාවිද්‍යා කොමසාරිස්, බෞද්ධ කටයුතු කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඉඩම් අමාත්‍යාංශයේදීත් සාකච්ඡාවක් පැවැත්වුණා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් තීරණය කර තිබුණා; පර්වතයට අදාළ කොටස සහ පර්වතය පාමුල සිට යාර හාරසියයක ප්‍රේරණ කලාපයක් සලකුණු කිරීමට. ඒ සම්බන්ධව ගැටලු හා විරෝධතා මතුවුණා ගෙවල් හා ඉඩම් ඇතුළත්වීම නිසා. ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් අරනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති සාකච්ඡාවේදී විශාල විරෝධතාවක් ඇතිවුණා.

අපි නැවත කමිටුවක් පත්කරලා තීරණය කළා; පුරාවිද්‍යා ප්‍රේරණ කලාපය නම් කරනතුරු දැනට පර්වතය පාමුල සිට අඩි විස්සක ස්ථිර ආරක්ෂිත කලාපයක් ලෙස සලකුණු කිරීමට. ඒ සඳහා දෙපාර්ශ්වයම එකඟ වූවා. ඒ අනුව අරනායක සහ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මැනුම් නියෝග නිකුත් කළා. නමුත් ඊට එරෙහිව පුද්ගලයකු අධිකරණයට ගොස් තිබෙනවා. එය සමථයකට පත්වූ පසු ඉදිරි කටයුතු සිදු කෙරෙනවා. නමුත් තවදුරටත් අනවසර වැඩ සිදුවෙන බවට චෝදනා හා පැමිණිලි ලැබෙනවා. ග්‍රාම නිලධාරීන්ට, පොලිසියට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට සාමය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට උපදෙස් දී තිබෙනවා. මෙම ගැටලුව සමඟියෙන් බේරා ගැනීමට විහාරාධිකාරී හිමියන්ගේත්, ප්‍රදේශවාසීන්ගේත් සහය අපිට අවශ්‍ය වෙනවා.''

# එදා රත්තරන් අශ්වයෝ, ලැම්බොගිනි... මෙදා පරිසර විනාශය...






**"බේබිලාට පදින්න ලැම්බෝ ගිනි ගෙනල්ලා. බේබිලාට පිට උඩයන්න රත්තරන් අශ්වයෝ ගෙනල්ලා. බේබිලාට හෙලිකොප්ටර් ගෙනල්ලා." "ශාරුක් ඛාන්ලා ඇවිල්ලා මෙහේ බජව් දානවා." යනුවෙන් ප්‍රචාරයක් දිගට හරහට ගෙන ගියේ 2014 වර්ෂයේ අග ජනාධිපතිවරණයේ පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ප්‍රචාරක වේදිකාවෙනි. "මහින්දගේ රුපියල් බිලියන 19 ක් ඩුබායිවල හංගලා; ඩුබායි මැරියට් හෝටලයක් අරගෙන. මේ සේරම අපි හෙළි කරනවා." යනුවෙන් ද පොදු අපේක්ෂකයාගේ වේදිකාවෙන් සටන් පාඨ අසන්නට ලැබිණ.**

"මෙන්න රාජපක්ෂලාගේ තවත් ගෙවල් අහු වෙලා. කෞතුකාගාරය ඉස්සරහ තියෙන බංගලාවත් බැසිල්ගෙලු, කිරුළපන බලපොකුණ පාරේ තියෙන මහ විශාල මන්දිරයත් බැසිල්ගෙලු." යනුවෙන් ද ප්‍රචාර එක දිගට ගෙන ගියේය.

මෙම මඩ ප්‍රචාරයේ මූලිකත්වය ගත්තේ මංගල සමරවීරය. ෆේස්බුක් ඇතුළු අන්තර්ජාලයට අමතරව කටකතා බළකායක් ද මංගල මේ සඳහා යොදා ගත්තේය.

උදාහරණයක් ලෙස මංගලගේ අනුදැනුමින් සහ වියදමින් ඈත පළාතකට යන දුම්රියට නගින හතර පස් දෙනකු රාජපක්ෂවරුන්ට මඩ ගසමින් විවිධ කටකතා පතුරවන්නේ ඉතාම නිර්මාණශීලීවය; එය ඇඟට පතට නොදැනී සිදු කිරීම ද එක්තරා දක්ෂතාවකි.

මෙම මඩ ප්‍රචාර යොදා යොදාගනිමින් රාජපක්ෂවරුන් ජනතාවගෙන් ඈත් කරමින් ජනතාව තුළ කලකිරීමක් ඇති කිරීමේ ක්‍රමවේදය ඉතා සූක්ෂම ආකාරයෙන් සිදුකරගෙන ගිය අතර රාජිතගේ සහ පාඨලීගේ සහාය ද මංගලට ලැබුණි.

මෙම මඩ ප්‍රචාර එල්ල කිරීමේ බළඇණියට ඇතැම් බටහිර රටවලින් සහ ඇතැම් විදෙස් සංවිධානවලින් හොඳ හැටි මුදල් පොම්ප කරමින් ඔවුන් ද උපදෙස් ලබා දුන්නේ රාජපක්ෂවරුන් පන්නා දැමීමට ක්‍රියා කළ යුතු බව ප්‍රකාශ කරමිනි.

එම මඩ ප්‍රචාර මුළුමනින් ම අසත්‍ය බව යහපාලන ආණ්ඩුව සමයේ දීම ඔප්පු විය.

යළිත් වර්තමානයේ දී සිදු වෙමින් පවතින්නේ ද 2015 ට පෙර රාජපක්ෂවරුන්ට සහ ඒ ආණ්ඩුවට එල්ල කරන ලද මඩ ප්‍රචාරයක් ද යන්න කියා දේශපාලන භේදයකින් තොරව මෙම කාරණා දෙස බලන ඕනෑම කෙනකුට වැටහෙන කාරණයකි.

අලුත් ම මඩ ප්‍රහාරය වී ඇත්තේ කැලෑව විනාශ කරනවා යන ප්‍රචාරයන් ය.

"ආණ්ඩුව කැලේ කපනවා. ආණ්ඩුව බලාගෙන ඉන්නවා. කැලේ කපන්න ආණ්ඩුව සම්බන්ධයි. සිංහරාජය විනාශ කරනකම් ආණ්ඩුව නිදාගෙන ඉන්නවා. ජනාධිපතිවරයාගේ ගම සමඟ පිළිසඳරෙනුත් කැලේ විනාශ වෙනවා." යනුවෙන් මෙම ප්‍රචාර විපක්ෂයට හිතවත් ෆේස්බුක් හා ඇතැම් මාධ්‍ය හරහා දිගින් දිගට ම ප්‍රචාරය වෙයි.

මේ ගැන ආණ්ඩුව එතරම් තැකීමක් කරන බවක් නොපෙනුණ ද මෙහි තිබෙන බරපත-

## ● යහපාලන ආණ්ඩුවේ මඩ ප්‍රචාර අසත්‍ය බව ඒ කාලෙම ඔප්පු වුණා...

ළකම වැටහුණු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා පසුගිය දා එක් රැස්වීමකදී ප්‍රකාශ කළේ එදා බොරු ප්‍රචාරවලට රැවටී කරගත් විනාශය යළිත් සිදුකර ගැනීමට කටයුතු නොකරන ලෙසයි.

එදා කරගත් විනාශයට බලපෑ කටකතා, මඩ ප්‍රචාරවල අසත්‍යතාව එකින් එක යහපාලන ආණ්ඩුව සමයේ දී ඔප්පු වූ ආකාරය ඉතා වැදගත්ය.

2015 ජනවාරි 08 වැනි දා බලයට පත්වූ යහපාලන රජයට අවශ්‍ය වූයේ එම චෝදනා කෙසේ හෝ ඔප්පු කර ගැනීමටය.

"බේබිලාට පදින්න ලැම්බෝ ගිනි" මෙම කතා රහ කරමින් ප්‍රකාශ කරන ලද්දේ පොදු අපේක්ෂකයාගේ වේදිකාවේ දී පමණක් නොවේ. පොදු අපේක්ෂකයාට සහයෝගයක් ලබාදුන් ජනතා විමුක්ති පෙරමුණෙන් ද එම ප්‍රචාරයන්ට ලැබුණේ ඉතා ඉහළ ප්‍රතිචාරයකි.

අනුර කුමාර දිසානායක, බිමල් රත්නායක ඇතුළු පිරිස මෙම චෝදනා එල්ල කළේ නාමල් රාජපක්ෂ ලැම්බෝ ගිනි පදිනවා තම ඇස් දෙකෙන් බලා සිටියාක් මෙනි.

ලැම්බෝ ගිනි සොයා යහපාලන ආණ්ඩුවේ පොලිසිය විශේෂ මෙහෙයුම් රැසක් සිදු කළේය. සොයා ගැනීමට හැකි වූ ලැම්බෝ ගිනියක් නොවීය.

අවසානයේ දී පිළියන්දල ප්‍රදේශයේ දී ලැම්බෝ ගිනියක් සොයාගත් අතර එයට රාජපක්ෂ කෙනෙකුගේ නමක් සම්බන්ධ කර ගැනීමට දැඩි උත්සාහයක් ගත්ත ද එය සාර්ථක නොවීය.

එම ලැම්බෝ ගිනිය අයිතිව තිබුණේ එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සහෝදරයකුටය.

එම මන්ත්‍රීවරයා සුජීව සේනසිංහ වූ අතර ඔහු රඟපෑ "යහළුවෝ" සිනමාපටය සඳහා එම ලැම්බෝ ගිනිය යොදා ගත් අතර; එම ලැම්බෝ ගිනියේ අයිතිකාරයා වූයේ සුජීව සේනසිංහගේ විදේශගතව සිටින සහෝදරයාය.

වැඩි කාලයක් යන්නට කලින් රාජපක්ෂ පුත්‍රයන්ට ලැම්බෝ ගිනි නැති බවට කරුණු අනාවරණය විය.

රත්තරන් අශ්වයන් ගැන කතාව ද ඊට එතරම් වෙනස් නොවේ.

බේබිලාට ගෙනාපු රත්තරන් අශ්වයන් සොයා ද මෙහෙයුම් දියත් වූ අතර සොයාගැනීමට හැකිවූ රත්තරන් අශ්වයෙක් නොවීය.

මේසය උඩ තිබෙන ෆයිල් හෝ කඩදාසි සුළඟේ යනවාට තබන කුඩා ප්‍රමාණයේ අශ්වයන් එක්කෙනෙක් දෙන්නෙක් අරලියගහ මන්දිරයේ සිටිය ද එම අශ්වයන් නිර්මාණය කර තිබුණේ රත්තරන්වලින් නොවේ.

නමුත් ඉන් සෑහීමට පත් නොවූ යහපාලන ආණ්ඩුවේ පොලිසිය විසින් නුවරඑළිය, මහනුවර ඇතුළු ප්‍රදේශ රැසක වැටලීම් සිදු කළේ රත්තරන් අශ්වයන් සොයා ගැනීමටය. නමුත් ඔවුන් බොහෝ දෙනෙකුට හමුවූයේ නුවරඑළියේ සිටින පෝනියන්ය.

මේ ගැන විමසූ විට යහපාලන ආණ්ඩුවේ හිටපු ප්‍රබල ඇමතිවරයකු ප්‍රකාශ කළේ සමහර අශ්වයන්ගේ හිසේ සිට බෙල්ල දක්වා විහිදී තිබෙන කෙඳි රන්පැහැ බවයි.

එම මඩ ප්‍රචාරයට ද ඉන්පසුව අත්තටු ලැබුණේ නැත.

බේබිලාට හෙලිකොප්ටර් යන ප්‍රචාරයට ද අත් වූයේ ලැම්බෝ ගිනි, රත්තරන් අශ්වයන්ට අත්වූ ඉරණමට සමාන ඉරණමකි.

සැහැල්ලු ගුවන් යානයක් රාජපක්ෂ පුත්‍රයකු ගෙන්වා ඇති බවට ද යහපාලකයන් දිගින් දිගට ම ප්‍රචාර ගෙන ගියේය.

නමුත් කිසිදු සැහැල්ලු ගුවන් යානයක් තබා රාජපක්ෂ පුත්‍රයන්ගේ සෙල්ලම් ගුවන් යානයක්වත් ඔවුන්ට සොයා ගැනීමට නොහැකි විය.

අවසානයේ දී නාරාහේන්පිට ප්‍රදේශයේ ගබඩාවක තිබී සැහැල්ලු ගුවන් යානයක කොටස් හමුවීම මංගල, රාජිත, පාඨලී ඉතා සතුටින් ඉපිල ගියේ රාජපක්ෂ පුත්‍රයකුගේ ගුවන් යානයක් හමුවූ බව සිතා ගත් නිසාය.

ඔවුන්ගේ එකම අරමුණ වී තිබුණේ ඔවුන් කරන ලද එක් ප්‍රචාරයක් හෝ සත්‍ය වන බව දැකීමටය.

නමුත් කරන ලද සොයා බැලීම්වල දී අනාවරණය වූයේ එම ගුවන් යානය චිත්‍රපටයක් සඳහා ෆිල්ම් ලොකේෂන් සර්විස් ආයතනයේ අධිපති චිත්‍රපට අධ්‍යක්ෂක චන්ද්‍රරත්නම් විසින් මෙරටට ගෙන්වා ගත් සැහැල්ලු ගුවන් යානයක් කියාය.

හෙලිකොප්ටර්, සැහැල්ලු ගුවන් යානා ප්‍රචාරයක් අසත්‍ය ප්‍රචාරයක් බව එතනින් ම ඔප්පු විය.

ෂාරුක් ඛාන්ලා ගෙනවිත් බජව් දමන බව ප්‍රකාශ කළේ ද පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන විසිනි.

නමුත් මෙරටට පැමිණියේ ෂාරුක් ඛාන් නොව සල්මන් ඛාන්ය. ෂාරුක් ඛාන් පැමිණි බවට කරන ලද ප්‍රකාශය එතනින්ම අසත්‍යක් විය. සල්මන් පැමිණ සිටියේ ඔහුගේ කැමැත්ත අනුව මෙරට සංචාරයක් සිදු කිරීම සඳහාය. මීට පෙර ද මැයි දින රැලිවලට සහ එක් එක් ප්‍රචාරක රැලිවලට ඉන්දියානු කලා ශිල්පීන් මෙරටට පැමිණීම සාමාන්‍ය දෙයක් වී තිබුණි.

රණසිංහ ප්‍රේමදාස අග්‍රාමාත්‍යවරයා වශයෙන් සිටින විට 80 දශකයේ මැද භාගයේ දී එවකට බලයේ සිටි එක්සත් ජාතික පක්ෂය සංවිධානය කරන ලද සංගීත ප්‍රසංගයකට ඉන්දියානු ගායක නිතික් මුකේෂ් ඇතුළු ඉන්දියානු ශිල්පීහු රැසක් මෙරටට පැමිණියහ.

දෙරට අතර මිත්‍රත්වය තහවුරු කරගැනීම සඳහා මෙසේ කලා ශිල්පීන් දෙරටටම යාම සාමාන්‍ය කටයුත්තක් වුවත් රාජපක්ෂ ආණ්ඩුව සමයේ ඉන්දියානු ශිල්පීන් මෙරටට පැමිණීම යහපාලකයන්ට නම් එතරම් දිරෙව්වේ නැත.

මහින්ද රාජපක්ෂ පිටරට මුදල් සඟවා තිබෙන බවට ප්‍රචාරය ගෙන ගිය පිරිසට අවශ්‍ය වූයේ එසේ සඟවා තිබෙනවා නම් එම මුදල් පොලිස් භාරයට ගැනීමටය.

## ● ලැම්බොගිනි රත්තරන් අශ්වයෝ වෙනුවට දැන් පරිසර විනාශය අල්ලන්...

එතකින් නොනැවතුණු ඔවුන් රාජපක්ෂවරුන්ගේ මැදමුලන වීරකැටිය ප්‍රදේශවල පිහිටා තිබෙන ඉඩම් ද හැරුවේය.

යහපාලකයන් සමඟ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් ද කීවේ රාජපක්ෂවරුන් හම්බකරගත් මුදල් යාන වාහන ආදිය කෙසේ හෝ සඟවා තිබෙන්නට ඇත කියාය.

රාජපක්ෂවරුන්ගේ ඉඩම් පමණක් නොව රාජපක්ෂවරුන්ට හිතවත් අයගේ ඉඩම් ද ඩෝසර් යොදා හැරීමට යහපාලකයන් කටයුතු කළේය.

මහින්ද රාජපක්ෂගේ ඇතැම් ආරක්ෂක නිලධාරීන්ගේ ඉඩම් ද බැකෝ යන්ත්‍ර දමා හැරුවේය.

රත්තරන්, මුදල්, රථවාහන, තෑගිබෝග ඇතුළු වටිනා දේ සොයා සිදුකරන ලද මෙම බැකෝ මෙහෙයුම්වලින් සිදුවූයේ ගැඩවිල්ලන් හමුවීම පමණි.

මේ වන විට සමගි ජන බලවේගයේ ප්‍රබලයෙකු වන එවකට රාජපක්ෂ ආණ්ඩුවේ ද ප්‍රබලයකු වූ කුමාර වෙල්ගමගේ ගේ ද මතුගම පිහිටි වත්තක් බැකෝ යන්ත්‍ර යොදා ගෙන මුළු දවසක් තිස්සේ හැරුවත් කිසිවක් හමු නොවීය. විශාල ගෙයක් දුටු විට ඒ රාජපක්ෂ කෙනකුගේ යැයි පෙන්වීමට ද එවකට විපක්ෂය දැඩි වෙහෙසක් ගත්තේය. මංගල ඇතුළු ඔවුන්ගේ කටකතා බළකාය ද මෙහිදී විශාල කාර්යභාරයක් සිදු කළ බව අමතක නොකළ යුතුයි.

කොළඹ කෞතුකාගාරය ඉදිරිපිට පිහිටි දැවැන්ත නිවස බැසිල් රාජපක්ෂයන්ගේ බවට ප්‍රබල කටකතාවක් ඒ දිනවල ප්‍රචාරය කෙරිණ.

## ● විපක්ෂයේ සමාජ මාධ්‍ය එදා තිබුණා නම් මහවැලියත් ගම්උදාවත් අපට නැහැ...

නමුත් මේ සුවිශාල නිවස බැසිල්ගේ නොව එය ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයකු වන ධම්මික පෙරේරාගේ නිවසක් බව තහවුරු වී තිබුණි.

නමුත් ඒ බව දැන දැනත් කිසිදු ලැජ්ජාවක් බියක් නැතිව මෙසේ වැරදි ප්‍රචාර සිදුකරමින් මඩ ගැසුවේ ඇයි ද? කියා තේරුම් ගැනීම අපහසු නොවේ.

තවත් නිවසක් බැසිල්ගේ බව සඳහන් කරමින් තවත් කටකතාවක් ඒ දිනවල ප්‍රබලව ගෙන ගියේය.

මංගල ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ සමාජ මාධ්‍ය ජාලා ක්‍රියාකාරීන් මේ නිවාසවල ඡායාරූප යොදා ගනිමින් මෙම ප්‍රචාර සිදු කර තිබුණි.

බැසිල්ගේ කීවට මෙම නිවස ද බැසිල්ට අයත් නොවූ අතර මෙම නිවස අයත් වූයේ ප්‍රකට ව්‍යාපාරිකයකු වන හවුස් ඔෆ් ෆැෂන් ආයතනයේ හිමිකරුට ය.

මෙසේ කරුණු එකින් එක පසුගිය යහපාලන ආණ්ඩුව කාලය තුළ දී අනාවරණය විය.

එසේ එම කරුණු අනාවරණය වුව ද ගොබෙල්ස් න්‍යාය අනුව මේවා සමාජගත කිරීමට එවකට පැවති විපක්ෂය ගත් ප්‍රබල උත්සාහයක් සැලසුම් දෙස රාජපක්ෂ ආණ්ඩුව දැඩි අවධානයක් යොමු නොකිරීම දුර්වලකමකි.

හිට්ලර්ගේ කාලයේ සිටි ගොබෙල්ස්ට අවශ්‍ය වූයේ අසත්‍ය නිතර නිතර කියමින් එම අසත්‍ය සත්‍යයක් ලෙස සමාජගත කිරීමයි.

බොරුව නිතර නිතර කියන විට එය ඇත්තක් ලෙස සමාජගත වීම ගොබෙල්ස් න්‍යායයි. එය එක් පැත්තකින් මහා ගොබ්බ වැඩක් යනුවෙන් හැඳින්වූවාට ද වරදක් නැත.

යහපාලන ආණ්ඩුව වැඩි කාලයක් යාමට පෙර මේ රටේ පොදු මහජනතාවට එපා වූයේ ඇයි?

ජනතාවට සේවාවන් සිදුකර රට සංවර්ධනය කරනවාට වඩා ඔවුන් කළේ දේශපාලන පළිගැනීම් සිදු කිරීමයි.

මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය නීති විරෝධී ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව දිගට හරහට දේශපාලන පළිගැනීම් සිදුකිරීම සඳහා එවකට පැවති යහපාලන ආණ්ඩුවේ මූලික අරමුණ වී තිබුණි.

FCID ට අමතරව ජනාධිපති කොමිසන් සභා ද ගණනාවක් ම මෙම දේශපාලන පළිගැනීම් දිගින් දිගටම සිදු කළ අතර ඊට වැඩි අවධානයක් යොමු කරන විට රටේ සංවර්ධන කටයුතු සිදු කිරීමට එවකට පැවති යහපාලන ආණ්ඩුවට අවස්ථාවක් හිමිවූයේ නැත.

එම පාඩම සැලකිල්ලට ගෙන වර්තමාන ආණ්ඩුව බොරු ප්‍රචාරවලට පිළිතුරු ලබාදීමට එතරම් කාලයක් ගත කිරීමට අකමැත්තක් දක්වනවා වෙන්නට පුළුවනිය.

නමුත් 2015 දී රාජපක්ෂ ආණ්ඩුව කඩාගෙන වැටුණේ එම අසත්‍ය ප්‍රචාරයන්ට එරෙහිව නිසි පිළිතුරු ලබා නොදුන් නිසා බව ද හොඳින් සිහි තබා ගත යුතුව ඇත.

එදා ලැම්බෝ ගිනි, රත්තරන් අශ්වයන් බොරුව සමාජ ගත කළ ආකාරයට මෙදා සමාජගත කිරීම සඳහා තෝරාගෙන ඇත්තේ ඉතාම සංවේදී කාරණයක් වන පරිසරයයි.

පරිසරයට තිබෙන දැඩි සංවේදීකම නිසා අපි සියලුම දෙනා කිසිදු භේදයකින් තොරව පරිසරයට ආදරය කරන්නෙමු.

ආණ්ඩුව සිංහරාජයේ කැලෑ කපනවා යනුවෙන් ඉතාම සංවේදී කාරණයක් ඉතාම සැලසුම් සහගත ලෙස සමාජගත කිරීමේ සාර්ථක ආරම්භයක් විපක්ෂය විසින් ගෙන තිබුණි.

මේ සඳහා ඇතැම් විදෙස් රටවලින් යම් යම් ආධාර ලබා දී සමාජ මාධ්‍ය ජාලා මෙහෙයවීමටත්, ඇතැම් පරිසර සංවිධාන එක්කරගැනීමටත් ඉතා සූක්ෂම ලෙස කටයුතු කර තිබුණි.

ඇතැම් පරිසර සංවිධාන මීට එක්කර ගත්තේ මේ ආණ්ඩුවට එරෙහිව සිදු කරනු ලබන පහරදීමක් නොවන බවට සහතිකයක් ද ලබා දෙමිනි.

අවසානයේ දී මෙම සටන් පාඨ සැකසෙන්නේ කාගේ වුවමනාවට දැයි දැනගත් ඇතැම් පරිසර සංවිධාන මෙම ක්‍රියාවලියෙන් ඉවත් විය.

සිංහරාජයේ කතාවට ආණ්ඩුවෙන් පිළිතුරු ලබා දීම සිදු වූයේ බොහෝ ප්‍රමාදවයි. මෙය සමාජගත වීමට එය ද හේතුවක් විය.

සිංහරාජයේ එවැනි විනාශයක් සිදු නොවුව ද ආණ්ඩුව කොළඹ සිට ලබාදෙන පිළිතුරු එතරම් සාර්ථක නොවීය.

ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමක් සිංහරාජයට ගොස් එම චෝදනා අසත්‍ය බව තම ඇස් දෙකෙන් ම තහවුරු කර ගත්තේය.

නමුත් ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ ගමන කලින් ගියා නම් සිංහරාජය ගැන මවපු බොරුව මෙතරම් සමාජගත වෙන්නේ ද නැත. එදා රාජපක්ෂ ආණ්ඩුව කාලයේ දී එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ නිරීක්ෂණය කිරීමට ගිය අන්දම වර්තමාන ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයක් සිටින ජනතා නියෝජිතයන්ට අමතක වීම කනගාටුදායකය.

අනෙක් කාරණය රජයේ ඇතැම් නිලධාරීන් කුමන හෝ ආකාරයකට ජනප්‍රිය වීම සඳහා කුමන හෝ ආකාරයකට රජයේ සංවර්ධන ක්‍රියාවලියට විරුද්ධවීම වර්තමානයේ දී යම් මෝස්තරයක් වී තිබේ.

සාධාරණ හේතු මත පරිසර විනාශ වෙනවාට විරුද්ධව නැඟී සිටිනවාට අපි ද කැමතිය.

නමුත් ඒ මුවාවෙන් වෙන වෙන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කර රටේ සංවර්ධනය අවුල් කිරීමට වගකිව යුතු රජයකට නොහැකිය.

කරඳ ගහ යොදාගෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම්වලට කරනු ලැබූ බලපෑම කෙතරම් අසාධාරණ ද යන්න සමාජය මේ වන විට තේරුම් ගෙන තිබේ.

නමුත් කරඳ ගහ සම්බන්ධයෙන් ඇතැම් නිලධාරීන් සිදුකළ ප්‍රකාශ කෙතරම් දුරට සත්‍යයක් ද කියා දැන් වැටහෙනු ඇති. තිරසාර සංවර්ධනයක් යටතේ ඕනෑම සංවර්ධනය සිදුවිය යුතු බව ලෝක මතයයි.

විපක්ෂයට සටන් පාඨවල හිඟයක් පවතින නිසා දැන් පරිසරය සුරැකීමේ සටන් පාඨ තරගයක සමගි ජනබලවේගය, එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ නිරතව සිටී.

පරිසරය සුරකිමු බෝඩ් ලෑලි උස්සාගෙන ඔවුන් දැන් පෙළපාළි යන්නේ තරගයකට මෙනි. ලැම්බෝ ගිනි, රත්තරන් අශ්වයන්, බේබිලාට හෙලිකොප්ටර් සටන් පාඨ බොරු වූ නිසා යළිත් එම සටන් පාඨ ඉදිරිපත් කිරීමට නොහැකිය. ලැම්බෝ ගිනිවලින් පරිසරයට සටන් පාඨ මාරු කළේ එම නිසා විය හැකිය.

විපක්ෂය අද මෙහෙයවනු ලැබූ ඇතැම් සමාජ මාධ්‍ය ජාලා එදා තිබුණා නම් රණසිංහ ප්‍රේමදාසට ගම් උදාව හෝ ගාමිණී දිසානායකට කඩිනම් මහවැලි ව්‍යාපාරය සිදු කිරීමට නොහැකි වනු ඇත.

ගස්ලබු ගසක් කැපුවත් එය සමාජ මාධ්‍ය යොදාගෙන එය ආණ්ඩුවේ කැලෑ විනාශය වශයෙන් පෙන්වීමට තරම් මේ දේශපාලන අද පහතට වැටී ඇත. ඔය විදිහට ගොයම් කැපීම ද ඉදිරියේ දී ප්‍රශ්නයක් විය හැකිය.

# අපේකමට මුල්තැන දී නික්ම ගිය මානව විද්‍යාඥ පණ්ඩුල ඇඳගම

● හර්ෂා සුගතදාස



**බක් මාසය උදාවත් ම මුළු රටම සූදානම් වන්නේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සැමරීමටය. සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද හෙළයන්ගේ අවුරුද්ද ලෙස හැඳින්විය යුතු බව සඳහන් කළේ පණ්ඩුල ඇඳගමයන් ය. නව වසරක උදාව ලෙස ජනවාරි 01 වැනිදා සැලකීම බටහිරින් පැටවූ දෙයක් බව පැවසූ පණ්ඩුල ඇඳගමයන්, හෙළයන්ගේ අලුත් අවුරුද්ද ඇරඹිය යුත්තේ බක් මාසයේ බවත් සඳහන් කළේය. එසේ පැවසූ ඇඳගමයන් 2021 සිංහල අලුත් අවුරුද්ද සැමරීමට අද ජීවතුන් අතර නැත. ඔහු මෙලොවින් සමුගෙන ගියේ පසුගිය 26 වැනිදාය.**

රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ප්‍රදේශයේ තුත්තිරිපිටිය නම් හද්දා පිටිසර ගමක ඇඳගමගේ මොහොට්ටි සහ යසෝහාමිට දාව උපන් පණ්ඩුල ඇඳගමට සහෝදරයන් පස්දෙනකුත් සහෝදරියන් හත් දෙනකුත් සිටියේය. හෙතෙම සිවු හැවිරිදි වියේ සිටියදී මව මිය ගිය බැවින් ඔහුගේ මව වූයේ ලොකු අක්කා ය.

ගමේ පන්සල සමග සමීප සබඳතාවක් තිබූ ඔහුගේ ළමාවිය දේශීයත්වය, අපේකම, අපේ උරුමයන් වැනි අදහස්වලින් පෝෂණය වූයේ පන්සලේ වැඩ විසූ නායක හාමුදුරුවන් නිසා ය. එවකට ලංකාව යටත් විජිතයක්ව තිබීම හේතුවෙන් රට ජාතිය ආගම මුදා ගැනීමේ විප්ලවීය අදහස් තිබුණු භික්ෂූහු වැඩ වාසය කළහ. එවැනි හාමුදුරුනමකගේ ඇසුර ලැබීමෙන් ඔහු තුළ ජාතික හැඟීම් ජනිත වූයේ කුඩා වියේ පටන් ය.

## ගන්නෝරුවේ පිහිටි කෘෂිකර්ම කෞතුකාගාරය ඔහුගේම නිර්මාණයක්

එකී හාමුදුරුනමවූයේ රාජකීය පණ්ඩිත අධිකරණ නායක හේන්පිටගෙදර ඥානසීහ හිමිපාණන්ය. උන්වහන්සේගේ ගෝල හිමිනමක් ලෙස පණ්ඩුල ඇඳගමගේ එක් සහෝදරයකු පැවිදි වීම නිසා පණ්ඩුල ඇඳගමට උන්වහන්සේගේ ඇසුර හා ගුරුහරුකම් ලැබීමෙන් දේශීය සංස්කෘතිය සිරිත් විරිත් හා ජාතික හැඟීම් වගාවට මූලික පදනම වැටුණි. ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ පණ්ඩුල ඇඳගම කරවිට මහ විදුහලට ඇතුළත් විය. සරසවි ප්‍රවේශය සඳහා අධ්‍යාපනය ලැබුවේ රත්නපුර සීවලි මධ්‍ය මහා විද්‍යාලයෙනි. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූයේ 1959 දීය. පාසල් වියේදී නාට්‍ය කලාවට සම්බන්ධ වී සිටි නිසා ඔහු මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ වෙල්ලවැහුම්, එලොව ගිහින් මෙලොව ආවා, රත්තරන් වැනි වේදිකා නාට්‍යවලට රංගනයෙන් දායක විය. එමෙන්ම දේශපාලන කටයුතුවලට ද සම්බන්ධ වූයේ ගමේ සිටියදී වාමාංශික අදහස්වලින් පන්නරය ලබා සිටි බැවිනි. මානව විද්‍යාව අංශයෙන් මූලික උපාධිය අවසන් කළ ඔහුට මුලින්ම රැකියාව ලෙස ලැබෙන්නේ ගුරු පත්වීමකි. ඒ බණ්ඩාරවෙල ඇල්ල මහා විදුහලටය.

එහෙත් එය ප්‍රතික්ෂේප කළ ඔහු පිළිමතලාවේ පිරිවෙනක ගුරුවරයකු වශයෙන් සේවය කළේය. ඉන් අනතුරුව පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ අනුරාධපුර සේනපුර නිවාසයේ භාරකරු ලෙස කටයුතු කළේය. බන්ධනාගාර නිලධාරීන්ගේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක වෙමින් තිබුණ එම නිවාසයේ දරුවන්ට දරුවන් ලෙස සැලකීම නිසා ඔහුට නිලධාරීන්ගෙන් බලපෑම් එල්ල වන්නට විය. උපාධියට මානව විද්‍යාව හදාරා තිබූ පණ්ඩුල ඇඳගම පරිවාසය භාරයේ සිටි දරුවන්ට පියකු මෙන් කරුණාවන්ත වුවත් ඉහළ නිලධාරීන් කෙරෙහි ඔහුගේ සිත තුළ හට ගැනුණේ දැඩි කලකිරීමකි. පුවත්පතක පළ වී තිබූ සිංහල විශ්වකෝෂයේ මානව විද්‍යා තනතුරට ඔහු ඉල්ලුම් කළේ එම නිසාය. ඒ අනුව සිංහල විශ්වකෝෂයට ලිපි රචනා කිරීමට ඔහුට හැකි විය.

1972 දී ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මානව විද්‍යාඥ තනතුරට පත් වූ පණ්ඩුල ඇඳගමයන් එහි මානව විද්‍යා අංශයේ ප්‍රධානි, සහකාර අධ්‍යක්ෂ දක්වා පැමිණියේ ජාතික කෞතුකාගාරයට අනුපමේය සේවයක් ඉටු කරමිනි. කුඩා වියේ පටන් ජාතිකත්වයට අපේකමට ඇලුම් කළ ඔහුට ජාතික කෞතුකාගාරය හොඳ තෝතැන්නක් විය. කෞතුකාගාරයේ මානව විද්‍යාත්මක කෞතුක වස්තූන් එකතුව වැඩි කිරීම සඳහා ඔහු ගම් නියංගම්වල සැරිසැරුවේය. ගැමි ගෙවල්වල අටු, දුම්මැහි අතපත ගාමින් පැරණි දේ සෙව් පණ්ඩුල ඇඳගමයන් පැරණි මුළුතැන්ගෙයි උපකරණ, පැරණි ගෘහභාණ්ඩ, ගොවි උපකරණ වැනි පැරණි සාම්ප්‍රදායික ආම්පන්න එක්රැස් කර ගෙනැවිත් ජාතික කෞතුකාගාරයේ මානව විද්‍යා තැන්පතුවක් ඇති කිරීමට විශාල කැපවීමක් කළේය. මෙම භාණ්ඩ විශ්ලේෂණය කරමින් අධ්‍යයනය කළ ඔහු සමාජය සහ සංස්කෘතිය අලළා ජනතාව දැනුම්වත් කළේය. උදැල්ල සහ නගුල ගැන ඔහු විශේෂ පර්යේෂණයන් සිදු කළේ රත්නපුර, මොනරාගල, තිස්සමහාරාමය වැනි ප්‍රදේශයෙන් ප්‍රදේශයට උදැල්ලේ සහ නගුලේ වෙනස්කම් තිබෙන නිසාය. ඔහු මේ පිළිබඳව විශේෂඥයෙක් විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ආර්.එල්.එස්. ගුණවර්ධන මහතා "සිවුර සහ නගුල" යනුවෙන් පර්යේෂණාත්මක නිබන්ධනයක් කළ විට පණ්ඩුල ඇඳගමගේ මිතුරන් ඔහුට "උදැල්ල සහ නගුල" යනුවෙන් පොතක් රචනා කරන ලෙස පැවසුවේ ඒ සම්බන්ධයෙන් ඔහු සතු හසළ දැනුම නිසා ය.

ජාතික කෞතුකාගාරය තුළ තාවකාලික ප්‍රදර්ශන රාශියක් සංවිධානය කර කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන අයගේ වර්ධනයක් ඇති කිරීමට ඔහු සමත් විය. ජාතික කෞතුකාගාරයේ සේවය කරන වකවානුවේදී ඔහු ඕස්ට්‍රේලියාවේ ජේම්ස් කුක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වී බැරී රෙනෝල්ඩ් මහාචාර්යවරයා යටතේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීය. පණ්ඩුල ඇඳගමයන් ජාතික කෞතුකාගාරයේ සේවය කළ කාලය වසර 20කි. ඉන් අනතුරුව පණ්ඩුල ඇඳගමයන් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ කලා මණ්ඩලයේ සභාපති ධුරය සහ අමාත්‍යාංශයේ උපදේශක තනතුර හෙබවීය. සංස්කෘතික අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරන ලද සඟරා, පුවත්පත් වැනි ප්‍රකාශනවලට ලිපි ලියූ ඔහු, රජය මගින් සබරගමුව පිළිබඳව පළ කරනු ලබන ලිපි සංග්‍රහයේ සංස්කාරකවරයා විය. ශ්‍රී ලංකා මානව විද්‍යා සංගමය බිහි කිරීමට පුරෝගාමීව කටයුතු කළ ඔහු එම සංගමයේ ලේකම් ධුරය දරමින් එහි උන්නතිය උදෙසා වටිනා මෙහෙරවක් ඉටු කළේ භාෂාව, සංස්කෘතිය හා ජාතිකත්වය කෙරෙහි උපන් ඇල්ම ලේ නහර පමණක් නොව ඇට මිදුළුවලට කාවැදී තිබූ නිසාය. ඔහු මහාචාර්ය නිමල් ද සිල්වා සමග එකතු වී ශ්‍රී ලංකා ධජ සංගමය ආරම්භ කර ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස කටයුතු කළේ ශ්‍රී ලංකාවේ ධජ පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනතුරුවය.



මානව විද්‍යාඥ පණ්ඩුල ඇඳගමයන් බිරිය මහාචාර්ය මාලනී සමඟ

ලාංකේය ගැමි සමාජය පිළිබඳව ඔහුට ඇති දැනුම ශ්‍රී ලංකාවේ කිසිවකුට නැති තරම්ය. සමාජ සංස්කෘතිය හා අපේකම සම්බන්ධයෙන් පුවත්පත්වලට ලිපි සම්පාදනය කළේ පාඨකයන් දැනුම්වත් කිරීමේ උදාර අරමුණෙනි.

## සරච්චන්ද්‍රයන්ගේ වේදිකා නාට්‍ය කීපයක රඟපෑවා

එමෙන්ම ඔහු විශ්වවිද්‍යාලීය බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කළේ අපේ උරුමයන් සහ ජාතිකත්වය ගැන මතු පරම්පරාව පෝෂණය කරමිනි. ඔහු මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ප්‍රවර්ධන තනතුර වසර 3ක් හෙබවූයේ ඔහු සැබෑ පරිසරවේදියකු ද වූ නිසාය. සූප ශාස්ත්‍රය, කෞතුකාගාර අත්පොත, සබරගමු වංශ කතාව, ඌව වංශ කතාව, පරිසරයයි අපි සැවොමයි ආදි වශයෙන් ග්‍රන්ථ රාශියක් රචනා කළ පණ්ඩුල ඇඳගමයන් සිංහල විශ්වකෝෂයේ ජ්‍යෙෂ්ඨ උපකර්තෘ වශයෙන් ද කටයුතු කර තිබේ. ගන්නෝරුවේ පිහිටි ජාතික සාම්ප්‍රදායික කෘෂිකර්ම කෞතුකාගාරය ඔහුගේ නිර්මාණයකි. පැරණි ගල්කැටයම්, චිත්‍ර හා මූර්ති, වාස්තු නිර්මාණ පමණක් නොව ගිරය, බුලත් හෙප්පුව, කිල්ලෝටය වැනි උපකරණවලින් පවා මානව ක්‍රියාකරකම් සහ මිනිසුන්ගේ භාව ප්‍රකාශන හදාරමින් මානව විද්‍යාඥයකු ලෙස ඔහු ඉටු කළ විශිෂ්ට සේවය මිල කළ නොහැකිය.

මිනිසා සහ ස්වාභාවධර්මය 2ක් නොව 1ක් ලෙස තරයේ ඇදහූ පණ්ඩුල ඇඳගමයන් බටහිර සංස්කෘතියට ආවඩන සමාජයේ අපේකමට මුල්තැන දෙමින් දේශීයත්වය සනිටුහන් කිරීමට නිර්භීතව ක්‍රියා කළේය. අපේ උරුමයන් රැක ගැනීම උදෙසා පෙනී සිටීමට ඔහු තුළ කිසිදු පැකිළීමක් තිබුණේ නැත. රටේ ජාතික ආගමික ගැටලුවලදී මැදිහත් වූ පණ්ඩුල ඇඳගමයන් සැබෑ දේශප්‍රේමියෙකු ලෙස හැඳින්වූවාට වරදක් නැත. අපේ දියුණුව රඳා පවතින්නේ අපේකම තුළ යන්න සිය දර්ශනය කරගත් හෙතෙම අපේකම ගැන හැඟීමක් ඇති කිරීමටත් එහි අගය වටහාදීමටත් සැම තත්පරයක් ම කැප කළ අතර කිසිම විටෙක තනතුරු සහ ලාභ අපේක්ෂා පසුපස හඹා ගියේ නැත. මානව විද්‍යාඥයකු වශයෙන් පමණක් නොව මානව හිතවාදියකු වශයෙන් ද ඔහුව හැඳින්විය හැක්කේ කිසිම භේදයකින් තොරව ලොකු පොඩි කාටත් ඔහුගේ නිවසේ දොරටුව විවෘතව ඇති නිසාය. කොයි කාටත් බතින් බුලතින් සංග්‍රහ කරන නිසාය. 1938 දෙසැම්බර් 16 වැනි දින උපත ලැබූ පණ්ඩුල ඇඳගමයන් 2021 මාර්තු 25 වැනි දින අවසන් සුසුම් හෙළුවේ වසර 82ක ආයු කාලයක් සපුරමිනි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වූ මහාචාර්ය මාලනී ඇඳගම සමග විවාහ වී සිටි පණ්ඩුල ඇඳගමයන්, දියණියන් සිවුදෙනකුගේ පියෙකි. ඔහුගේ අවසන් කටයුතු පසුගිය 28 වැනි ඉරිදා සිදු කෙරිණි. පණ්ඩුල ඇඳගමයන්ගේ අභාවය ශ්‍රී ලාංකික ජනතාවට සිදු වූ බලවත් පාඩුවකි.


pyramid wilmar

පිරමිඩ් විල්මා (පුද්ගලික) සමාගම විසින් සිදු කරන ප්‍රකාශය

**පිරමිඩ් විල්මා (පුද්ගලික) සමාගමේ ('පිරමිඩ් විල්මා') කළමනාකාරිත්වය විසින්, මෑත කාලීනව සමාජ මාධ්‍ය ඇතුළු විවිධ මාධ්‍ය හරහා පැතිර යන, ආනයනික පොල්තෙල් වල අඩංගු ඉහළ මට්ටමේ ඇෆ්ලාටොක්සින් (Aflatoxin) හා සම්බන්ධව පහත කරුණු අනාවරණය කර සිටියි.**

1) පිරමිඩ් විල්මා යනු යහපත් මූලධර්ම සහ ව්‍යාපාරික ප්‍රතිපත්තීන් අනුගමනය කරමින්, සදාචාරාත්මක ලෙස සිය ව්‍යාපාරයේ සියලුම මෙහෙයුම් කටයුතු සිදු කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගමකි. පිරමිඩ් විල්මා හි සෑම මෙහෙයුම් අංශයක්ම ආවරණය වන පරිදි උසස්ම ප්‍රමිතීන් ස්ථාපනය කර ඇත. එහි ගනුදෙනුකරුවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ යහපත උදෙසා වූ අඛණ්ඩ කැපවීම හේතුවෙන් පිරමිඩ් විල්මා හි 'ෆෝචූන්' වෙළඳ නාමය යටතේ වෙළඳ පොළට නිකුත් වන නිෂ්පාදනයන්, පාරිභෝගිකයින් අතර මෙන්ම පිසින තෙල් හා සම්බන්ධ වෙළඳ පොළ තුළද ඉහළ ප්‍රමුඛත්වයක් හිමිකර ගෙන ඇත.

2) පිසින තෙල් ඇතුළු සියලුම පිරමිඩ් විල්මා නිෂ්පාදන, ඉහළම දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුව දැඩි අධීක්ෂණයක් යටතේ නිෂ්පාදනය කරන අතර, එම සියලුම නිෂ්පාදන **FSSC 22000, ISO 14001, ISO 9001, HACCP, GMP, සෞඛ්‍ය සහ ආරක්ෂණ මාර්ගෝපදේශයන් සමග අනුකූල වේ.**

3) පිරමිඩ් විල්මා විසින් ආනයනය කරන සියලුම පිසින තෙල් නිෂ්පාදන දේශීය වෙළඳපොළට මුදා හැරීමට පෙර දීර්ඝ හා දැඩි තත්ත්ව පරීක්ෂාවකට භාජනය වන බව අවධාරණය කිරීමට කැමැත්තෙමු. තවද, පිරමිඩ් විල්මා විසින් වෙළඳ පොළට නිකුත් කරනු ලබන සියලුම පිසින තෙල් හා සම්බන්ධ නිෂ්පාදන, පාරිභෝගිකයා අතට පත් වනුයේ ශ්‍රී ලංකා නියාමන බලධාරීන් විසින් නියම කර ඇති, පොල්තෙල්වල අන්තර්ගත සමස්ථ ඇෆ්ලාටොක්සින් (Aflatoxin) මට්ටම ඇතුළුව, අනෙකුත් සියලුම නිෂ්පාදන ප්‍රමිතීන්ට අනුකූල බව නිසි පරිදි සහතික කිරීමෙන් පසුව පමණි.

4) වගකිවයුතු ආයතනික පුරවැසියකු ලෙස පිරමිඩ් විල්මා සිය පාරිභෝගිකයින්ගේ මෙන්ම සමස්ථ ප්‍රජාවගේ යහපත් සෞඛ්‍යය සහ පෝෂණය පිළිබඳ නිරන්තර අවධානයක් යොමු කරයි. සෑම විටම පාරිභෝගිකයින්ට හොඳම තත්ත්වයේ නිෂ්පාදන ඉදිරිපත් කරමින් ඔවුන්ගේ යහපත් සෞඛ්‍ය වෙනුවෙන් පිරමිඩ් විල්මා කැපවෙමින් ක්‍රියා කරයි.

**5) මෑත කාලීනව පිරමිඩ් විල්මා සමාගම ඉලක්ක කර ගනිමින් ඇතැම් පාර්ශවයන් විසින් සමාගමේ පිසින තෙල්, ෆැට් ස්ප්‍රෙඩ්, ඉන්ඩස්ට්‍රියල් මාගරින් ඇතුළු ඇතැම් නිෂ්පාදන සඳහා සිදු කරන ලද ව්‍යාජ චෝදනා සමාගම තරයේ ප්‍රතික්ෂේප කර සිටියි. මෙම පදනම් විරහිත චෝදනා පැහැදිලිවම අසත්‍ය බවත්, පිරමිඩ් විල්මා හි කීර්තිනාමයට හා වෙළඳ පොළ නායකත්වයට සෘණාත්මක බලපෑමක් ඇති කිරීමේ අරමුණින් ඒවා ද්වේෂ සහගත ලෙස සැලසුම් කර ඇති බවත් පෙනී යයි. පිරමිඩ් විල්මා හට මෙලෙස අසත්‍ය ප්‍රචාර/චෝදනා ගෙනයන්නන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පූර්ණ බලය හිමිය.**

6) මේ පිළිබඳ ඕනෑම අයෙකුට කිසිඳු විමසීමක් අවශ්‍ය නම්, සමාගම් කළමනාකාරිත්වය නියෝජනය කරමින් එහි සමූහ නීති නිලධාරිතුමන්, දුරකතන අංක 0775973182 හරහා හෝ consumercare@pyramidwilmar.com හරහා සම්බන්ධ වී ලබා ගත හැකිය.

7) පිරමිඩ් විල්මා හි සියලුම අයිතිවාසිකම් මෙමඟින් පැහැදිලිවම අනාවරණය කර ඇත.

Fortune | Better Baker's Choice MASTERLINE Since 1955 | MeadowLea

රුවන් පතිරණ කියයි... edmediaunit@gmail.com

# සජිත් - තලතා ගැටුම එළියට

**අප්‍රේල් මාසය ආරම්භ වීමත් සමඟම සිංහල, හින්දු අලුත් අවුරුද්ද ගැන සමාජයේ වැඩි අවධානයක් යොමුවූයේ කෝවිඩ් - 19 වසංගතය හේතුවෙන් පසුගිය වසරේ අලුත් අවුරුද්ද හිතේ හැටියට සැමරීමට ඔවුන්ට නොහැකි වූ නිසා ය.**

සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් අනුව අලුත් අවුරුද්ද සැමරීම සම්බන්ධයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ද එතරම් වාදයක් තිබුණේ නැත.

සමස්තයක් ලෙස සියලුම දේශපාලන පක්ෂවල මතය වූයේ ද සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් සමඟ අලුත් අවුරුද්ද සැමරීමේ අවස්ථා මෙවර ජනතාවට ලබාදිය යුතු බවයි.

පසුගිය සතියේ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම් දෙකේදී පසුපෙළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යම් යම් වගකීම් පැවරීමට තීරණය කිරීම විශේෂත්වයකි.

මහ වන විනාශයක් සිදුකරන බවට විපක්ෂයේ ගෙන යන ප්‍රචාරයන්ට එම ස්ථානවලටම ගොස් ස්ථානීය පරීක්ෂාව සිදුකර පිළිතුරු ලබාදීමේ වගකීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමේදී තීරණය කර තිබුණි.

## පරිසරය රැක්ක හැටි ජනපති දියත උයනේ සිට කියයි

සමගි ජනබල වේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨයෙකු තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙතුන් දෙනෙකුගෙන් ම විමසා සිටියේ "කෝ තලතා පේන්නේ නැහැ නේද" කියාය.

මාස 2 කට වැඩි කාලයක් තිස්සේ රත්නපුර දිස්ත්‍රික් සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනි තලතා අතුකෝරාළ කිසිම රැස්වීමකට සහභාගි නොවීම ගැන කණ්ඩායම් රැස්වීමේ සිටි කිහිප දෙනෙක් ම රැස්වීම් ශාලාවෙන් පිටතට පැමිණ කතා කරන්නට වූහ.

"මොකෝ මේ තලතා පේන්න නැත්තේ" එක් හිටපු ප්‍රබල ඇමැතිවරයකු විමසුවේ තරමක කුතුහලයකිනි.

"තලතා ලොක්කත් එක්ක ටිකක් ඔරොප්පු වෙලා ඉන්නේ" නවක මන්ත්‍රීවරයකු කීවේය.

"ඒ මොකද?" යැයි විමසුවේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයාය.

"දිස්ත්‍රික් නායකයාගෙන් අහන්නේ නැතුව ආසනවලට විපක්ෂ නායකතුමා ආසන සංවිධායකවරුන් දැමීම, ඒකට තලතා කැමැති නැහැ" යනුවෙන් පැවසුවේ සබරගමුව පැත්තේ තවත් දේශපාලනඥයෙකු ය.

"ඒ මොකෝ. තලතට කියන්නේ නැතුව රත්නපුරේ කවුරු හරි පත් කරලාද?" යළිත් විමසුවේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයාය.

"ඔව්. ඔව්. හේෂා විතානගේ කොලොන්නේ ප්‍රධාන සංවිධායක කරපු එකට තලතා කැමැති නැතිලු. තලතාගෙන් අහන්නේ නැතුව තමයි රක්වානේ හිටපු හේෂාට කොලොන්න භාරදීලා තියෙන්නේ" යනුවෙන් එම මන්ත්‍රීවරයා පැවසුවේය.

"ඇයි කොලොන්න ආසනයේ ඡන්ද වැඩියිනේ" යනුවෙන් පැවසුවේ තවත් මන්ත්‍රීවරයෙකි. රත්නපුරට විතරක් නොවෙයි, කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කවලටත් දිස්ත්‍රික් නායකයාගෙන් අහන්නේ නැතුව සංවිධායකවරුන් පත් කරල කියලා ආරංචියි. හැබැයි රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා නම් කවදත් දිස්ත්‍රික් නායකයාගෙන් අහන්නේ නැතුව කිසිම ආසන සංවිධායකවරයෙක් පත්කරලා නැහැ" යනුවෙන් පැවසූ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයා එම ස්ථානයෙන් යන්නට ගියේය.

## මිනුවන්ගොඩ සභාපතිට ප්‍රසන්නගෙන් තල්ලුවක්

සමාජ මාධ්‍යයේ පළවෙන පරිසර හානි සහ වන විනාශයන් ගැන ආණ්ඩුවේ පාර්ශ්වයේ අවධානය යොමු වූයේ පසුගිය 26 වැනිදා බත්තරමුල්ල දියත උයන පරිශ්‍රයෙහි පැවැති පොදුජන පෙරමුණේ පළාත් පාලන ආයතන නියෝජිත හමුවේදීය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම පැවැත්විණ.

බැසිල් රාජපක්ෂ, ප්‍රසන්න රණතුංග, රොෂාන් රණසිංහ, ඩී.වී. චානක, උදේනි අතුකෝරාළ, සුමිත් උඩුකුඹුර, සාගර කාරියවසම්, මිලාන් ජයතිලක, මධුර විතානගේ, ජයන්ත කැටගොඩ, සුදත් මංජුල එම අවස්ථාවට එක්ව සිටියහ.

මෙහිදී මුලින්ම අදහස් පළ කරන ලද්දේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති කුමාර අරලගංවිලයි.

"පරිසර හානියයි, වන විනාශය ගැනයි චෝදනාව ආණ්ඩුවට එල්ල කරන්නේ සංවිධානාත්මක විදියටයි. ඒ වුණාට ආණ්ඩුව පාර්ශ්වයෙන් මීට පිළිතුරු ලබාදීමේ වැඩපිළිවෙළක් නැහැ. මේකෙන් වෙන්නේ ආණ්ඩුව ගැන ජනතාවගේ තියෙන විශ්වාසය නැතිවෙන එක. ජනාධිපතිතුමනි, මේ තත්ත්වය නොසලකා හරින්න එපා." යනුවෙන් මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් එහිදී ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරන ලදී.

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කතාවට ප්‍රසන්න රණතුංග ඇමැතිවරයාගෙන්ද ලැබුණේ තල්ලුවකි.

"ඔව්. ජනාධිපතිතුමනි, ඒ කතාව ඇත්ත. එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂය හිතා මතාම ආණ්ඩුවට එරෙහිව මේ විදියේ මතවාදයක් නිර්මාණය කරමින් ඉන්නේ." යනුවෙන් ප්‍රසන්න රණතුංග පැවසීය.

"අද බොහෝ දෙනෙකුට මතක නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී මේ ප්‍රදේශවල පරිසරය සංරක්ෂණය කරන්න අපි කරපු දේවල්."

අනුරාධපුරය, පොළොන්නරුව පළාත්වලින් පැළ ගෙනල්ලා තමයි අද මේ විදියට රුස්ස ගස් වවලා තියෙන්නේ" යනුවෙන් ප්‍රකාශ කළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා අවට පරිසරය ඕනෑකමින් නිරීක්ෂණය කළේය.

පරිසරය අල්ලාගෙන ආණ්ඩුවට විරුද්ධව ලොකු කැම්පේන් එකක් ගෙනියනවා. මේ කියන දේවල් ඇත්ත නම් කමක් නැහැ. ආණ්ඩුවට මඩ ගහන්න හිතාගෙන ජනතාවට බොරු කියන එක තමයි වැරැදි. මේ ගැන මගේ අවධානය යොමු වෙලා තියෙන්නේ. මං සෑහෙන කාලයක් තිස්සේ බලාගෙන හිටියා. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර අරන් තියෙන්නේ" යනුවෙන් ජනාධිපතිවරයා තම ස්ථාවරය පැහැදිලි කළේ ය.

## ඇතැම් සභාපතිවරුන් ගැන ජනපතිට පැමිණිලි

'ගම සමඟ පිළිසඳර' වැඩසටහන ගැන ද මෙහිදී කතා බහ විය. එම වැඩසටහන සාර්ථක බවට පළාත් පාලන ආයතන නියෝජිතයින්ගේ ප්‍රසාදය පළවිය.

"අපේ පළාත් පාලන ආයතන නියෝජිතයන් වැඩි දෙනෙකු 'ගම සමඟ පිළිසඳර' වැඩසටහන අගය කරනවා. ගමේ ප්‍රශ්න ජනාධිපතිතුමාට කියන්න අවස්ථාව ලැබෙන එකට අපි සතුටුයි" යනුවෙන් පැවසුවේ ප්‍රසන්න රණතුංගයි.

"ඔව්. ඒක ඇත්ත. මං ඒකෙදි දැක්ක දෙයක් තමයි යම් ගැටලුවක් ඉදිරිපත් වෙනකොට ගැටලුව ගැන පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ට හොඳ දැනුමක් තියෙනවද? කියන කාරණය.

පරිසර විනාශයන් සිදුවෙනවා නම් ඒ ගැන වහාම සොයා බලා කඩිනමින් අපිව දැනුම්වත් කරන්න. ඒවා වළක්වන්න අවශ්‍ය පියවර අපි ගන්නවා?" යනුවෙන් ද ජනාධිපතිවරයා පැවසීය.

ඇතැම් රාජ්‍ය ආයතනවල සභාපතිවරුනගෙන් වැඩ කරවා ගැනීම අපහසු බව සඳහන් කරමින් පළාත් පාලන ආයතන නියෝජිතයෝ ජනාධිපතිවරයාට වැඩි වශයෙන් කරුණු දක්වන්නට වූහ.

## මීගමුව කලපුවෙන් රැස්වීම උණුසුම් වෙයි

ජනතාව වෙනුවෙන් තමන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්වලට ඇතැම් රාජ්‍ය ආයතනවල සභාපතිවරුන් කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීම කනගාටුවට කරුණක් බව ද ඇතැම් පළාත් පාලන ආයතන නියෝජිතයන් විසින් උදාහරණ සහිතවම පෙන්වා දෙන ලදී.

"අපි ආරක්ෂා කරන්න ඕන, පුද්ගලයන් නොවෙයි, පක්ෂයේ ප්‍රතිපත්ති මාලාවයි.

බොරු ප්‍රචාරවලින් සහ ජනතාවට ලබාදුන් පොරොන්දු ඉටු නොකිරීමෙන් සිද්ධ වෙන්නේ පසුගිය වසර 5 තුළ සිදුවූ දේමයි.

බොරු ප්‍රචාර නිසා ජනතාවට ආණ්ඩුව ගැන කලකිරෙනවා නම් ඒවා නිවැරැදි කරන්න ඔබට පුළුවන්" යනුවෙන් ද ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ ය.

මේ අතර ගම්පහ දිස්ත්‍රික් කමිටු රැස්වීම පසුගිය අඟහරුවාදා පැවැත්විණ. මෙහිදී වැඩි අවධානයක් යොමු වූයේ මීගමුව කළපුවේ කඩොලාන සම්බන්ධයෙනි.

මේ ගැන ධීවර ජනතාව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර නඩුවක් පවතී.

නඩුවට අදාළ කොටස හැර ඉතිරි ප්‍රදේශ ධීවරයන්ගේ ධීවර කටයුතු සඳහා පිරිසිදු කරදෙන ලෙස ධීවර ජනතාව ඉල්ලා සිටින්නේ සෑහෙන කාලයක සිටයි.

ධීවර ජනතාවගේ යෝජනාව සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී අවධානය යොමු කළේ නිමල් ලන්සා රාජ්‍ය ඇමැතිවරයා ය.

"නඩුවට හේතුවෙලා තියෙන කොටස අතහැරලා ඉතිරි කොටස ධීවර ජනතාව වෙනුවෙන් පිරිසුදු කරලා දෙන්න" යනුවෙන් නිමල් ලන්සා යෝජනා කළේ ය.

දිසා වන නිලධාරි දේවානි ජයතිලක ඊට වහාම ප්‍රතිචාර දැක්වීය.

"වන හානි සිදුකරන කෙනෙකුට උදවු කරන්න මට බැහැ. පස් ගේන එක කරන්නේ වනයට හානි කරන කෙනෙක්" යනුවෙන් දේවානි ප්‍රකාශ කළා ය.

මේ අවස්ථාවේදී ඊට ප්‍රතිචාර දැක්වූයේ ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරයාය.

"ඔබතුමිය කියන ආකාරයේ වන හානියක් සිදුවෙන්නේ රජයේ ව්‍යාපෘතියකින්ද? ඊට අදාළ තත්ත්ව වාර්තා හැම දෙයක් ම අරන්නේ රජයේ ව්‍යාපෘති කරන්නේ. ඒ නිසා එහෙම වෙන්න බැහැ" යනුවෙන් දිස්ත්‍රික් ලේකම්වරයා ප්‍රකාශ කළේ ය.

## ධීවරයන් වෙනුවෙන් ලන්සා පෙරට

"ධීවර ජනතාවගේ අවශ්‍යතාවයි ඉටු වෙන්න ඕන. ඒ නිසා නඩු සම්බන්ධ කොටස අත්හැරලා ධීවර ජනතාවගේ ආදායම් උපයා ගැනීමේ අවස්ථාව හදාදෙන එක අපේ යුතුකමක්. අපිත් කැමැති නැහැ පරිසරය විනාශ වෙනවා දකින්න. පරිසරය ආරක්ෂා කරගන්න අතරේ මිනිස්සුන්ගේ ප්‍රශ්න විසදෙන්න ඕන." නිමල් ලන්සා අමාත්‍යවරයා ද පෙරළා ප්‍රකාශ කළේ ය.

මෙම සාකච්ඡාව ඉතා උණුසුම් ආකාරයෙන් දිගින් දිගටම ඇදුණ ද ඊට විසඳුමක් ලැබුණේ නැත.



# සජබ කට්ටිය මිනී පෙට්ටියක් අරන් කොහෙද ගියේ?

මේ අතර මිලාන් ජයතිලක, නිමල් ලන්සා, සිසිර ජයකොඩි පසුගිය සතියේ දිනයක සංචාරක අමාත්‍යාංශයේදී මුණගැසුණහ.

බොහෝ කාලයකට පසුව මංගල සමරවීර හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා කරළියට පැමිණීම සම්බන්ධයෙන් මෙම හමුවේදී සාකච්ඡා විය.

"මංගල මහත්තයත් කාලයක් නිශ්ශබ්දව ඉඳලා එළියට බැහැලා තියෙනවා. යනුවෙන් නිමල් ලන්සා රාජ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කළේ මුවගට සිනහවක් ද නංවමිනි.

ආණ්ඩුව වට්ටන්න ප්ලෑනක් ගහන්නේ. හීන් නූලේ මිනිහානේ. යනුවෙන් සිසිර ජයකොඩි රාජ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කළේ ය.

"මංගල සමරවීර කියන දේවල් කතා කරලා තේරුමක් නැහැ. එයා දැන් අවලංගු කාසියක්. මිනිස්සු ඉස්සරහට යන්න ශක්තියක් නැති නිසානේ ඡන්දයකටත් ඉදිරිපත් වුණේ නැත්තේ" යනුවෙන් ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයා ඊට ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කළේ ය.

මේ අතර සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රී භෝජනාගාරයේදීත් පුස්තකාලයේදීත් යම් කාරණයක් ගැන ඉතා රහසිගතව සාකච්ඡාවක් පවත්වා තිබේ.

පාර්ලිමේන්තු සංකීර්ණයේ විපක්ෂයේ මන්ත්‍රී ආලින්දයේදී මෙම පිරිස මේ ගැන අවස්ථා කිහිපයකදීම සාකච්ඡා කර ඇත.

## සජබ පසුපෙළෙන් අවනඩුවක්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 6 දෙනෙකු පමණ මෙම අවස්ථාවට සහභාගි වී ඇති බව ද වාර්තා වේ.

"බලන්න විපක්ෂ නායකතුමා අපිට කිසි දෙයක් කතා කරන්න ඉතුරු කරන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ හැමදාම ප්‍රකාශ නිකුත් කරනවා.

පාස්කු ඉරිදා ගැනත් ප්‍රශ්න අහනවා. සීනි ගැනත් අහනවා, පොල් තෙල් ගැනත් අහනවා, පරිසරය ගැනත් අහනවා. ටයිල් ගෙන්නන එකත් අහනවා. එතකොට අපි වගේ මන්ත්‍රීවරුන් කතා කරන්නේ මොනවා ගැනද? අපිට විෂයයන් වෙන් කළාට වැඩක් නැහැ. විපක්ෂ නායකතුමා තමයි හැම දෙයක් ම බදාගෙන කතා කරන්නේ." යනුවෙන් ඔවුන්ගේ අවනඩුව ගැන කතා බස් කර තිබිණි.

රනිල් වික්‍රමසිංහ එක්සත් ජාතික පක්ෂයේ නායකයාට පසුගිය සතිය ඇඩි ලෙස කාර්ය බහුල එකක් විය. පක්ෂය යළි ගොඩනැංවීම වෙනුවෙන් සහ එහි යාන්ත්‍රණය ශක්තිමත් කිරීම වෙනුවෙන් පැවැති සාකච්ඡා රැසකටම රනිල් වික්‍රමසිංහට සහභාගිවීමට සිදුවීම ඊට හේතුවයි.

## රනිල් හමුවීමට 'දුරකතනයේ' පිරිසක් ඇවිත්

පසුගිය සඳුදා හිමිදිරි පාන්දරින් ම රනිල් වික්‍රමසිංහට දුරකථන ඇමැතුමක් ලබාදුන්නේ එක්සත් ජාතික පක්ෂයේ සභාපති වජිර අබේවර්ධන විසිනි.

"සර් අර කට්ටිය අද හම්බවෙන්න ඕන කියනවා. අද ඒක ලෑහැස්ති කරන්න කියලා මං බැලුවේ." වජිර කියන විට එම හමුව සවස් කාලයේ යොදාගන්නා ලෙසට රනිල් වික්‍රමසිංහ විසින් වජිර අබේවර්ධනට උපදෙස් ලබාදෙන ලදී.

නායකයාගේ උපදෙස් අනුව වජිර එය සංවිධාන කළේය.

කලින් යොදාගත් පරිදි වජිර සඳහන් කළ ස්ථානයට රනිල් යනවිට සමගි ජනබලවේගයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ම එම ස්ථානයට පැමිණ සිටියහ.

පසුව තවත් පිරිසක් එම සාකච්ඡාවට එක්වූහ.

සමගි ජනබලවේගයේ තරුණ නායකයෙකු රනිල් සමඟ සාකච්ඡා කොට මෙම හමුව සූදානම් කර තිබූ අතර එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසා තිබුණේ වජිර අබේවර්ධන විසිනි.

ආණ්ඩුවේ ක්‍රියා කලාපය සහ වර්තමානයේ සමාජයේ පවතින තත්ත්වය පිළිබඳව මෙහිදි දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණ.

"මහ මැතිවරණයට කලින් මං මේ කතාව කිව්වා. වටු කුරුල්ලන්ගේ කතාවක් මතක් කළා. ඒත් අපේ අය එය විශ්වාස කළේ නැහැ. එකතුවෙලා ගියොත් දැළ උස්සන්න පුළුවන්. බෙදී වෙන් වුණොත් වැද්දාගේ ග්‍රහණයට හසුවෙනවා කියලා මං කිව්වා. දැන් අපි වැද්දගේ දැළට අහුවෙලා ඉවරයි. ඒ නිසා එකතු වෙන්න ඕන කියන තැන මමත් ඉන්නවා. දෙපැත්තෙන්ම තරුණ නායකයෝ ඉස්සරහට දැම්මොත් දැළ ඔසවන එක මහ දෙයක් නොවෙයි" යනුවෙන් රනිල් වික්‍රමසිංහ සමගි ජනබලවේගයේ තරුණ නායකයෙකු සමඟ පැවසීය.

ආණ්ඩුවට එරෙහි බලවේගයක් නිර්මාණය කරගැනීම රනිල් වික්‍රමසිංහ නොමැතිව කළ නොහැකි බව පැවසූ ඔහු සමගි ජනබලවේගයේ මන්ත්‍රීවරුන් මෙය සාර්ථක කරගැනීමට උපරිම ශක්තිය යොදන බව ද පැවසීය.

## සජිත්ට සුගත්ගෙන් අභියෝගයක්

තවත් දේශපාලන කරුණු ගණනාවක් පැය ගණනක් කතාබහ කිරීමෙන් අනතුරුව එම මන්ත්‍රීවරු එම ස්ථානයෙන් පිටව ගියහ.

'පරිසරය සුරකිමු' යන තේමාව යටතේ සමගි ජනබල වේගය කොළඹ පුරහලේ සිට විහාරමහා දේවි උද්‍යානය දක්වා සංවිධාන කරන ලද පාගමනට මිනී පෙට්ටියක් එක් කරගත්තේ ජාතික රෝහල ආසන්නයේ පිහිටි මල් ශාලාවකිනි.

මල් ශාලාවකින් මිනී පෙට්ටිය මිලදී ගත් සමගි ජනබලවේගයේ පිරිසක් මිනී පෙට්ටියේ එක් පැත්තක 'පරිසරය' හා අනෙක් පැත්තේ 'සිංහරාජය' යනුවෙන් සඳහන් කරනු ලැබීය.

සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයා පසුගියදා කාක දූපතේදී පැවැති විපක්ෂ නායක ජංගම සේවයට සහභාගි විය.

"ගිය අවුරුද්ද කොරෝනා එක්ක සැමරුවා. මේ පාර අවුරුද්ද විෂ පොල් තෙල් එක්ක සමරනවා. දැන් වස පොල් තෙල් හොර පාරෙන් එළියට ගියාද ? මේවා එළියට යවන්න කොච්චර අල්ලස් මුදලක් ගත්තා ද කියලා සොයා බලන්න ඕන." යනුවෙන් සජිත් කාකදූපතේදී පැවැති ජංගම සේවයට එක්වෙමින් පැවසුවේය.

"ඔය අල්ලපු පොල් තෙල්වලට මොකද වෙලා තියෙන්නේ කියලා සර් දන්නවාද" යනුවෙන් මුජිබර් රහුමන් මන්ත්‍රීවරයා විමසා සිටියේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයාගෙන්."

"ඔව්. ඔව්... පොලිසිය අල්ලපු පොල්තෙල් ටික ආයෙමත් රේගුවටම දීලනේ" සජිත් කීවේය.

## නාමල් මාසේ අන්තිම සෙනසුරාදා කරන්න හදන දේ

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ තවත් අලුත් වැඩකට අතගසා තිබේ. ඒ ස්වේච්ඡාවෙන් වැඩ කරන පිරිස්වලට යම් වටිනාකමක් ලබාදීම සඳහාය.

සෑම මසකම අවසන් සෙනසුරාදා Volunteer day යනුවෙන් නම් කර සමාජයට ස්වේච්ඡාවෙන් වැඩ කරන සමාජ සේවකයන්ට වටිනාකමක් ලබාදී ඔවුන් අගය කිරීමේ කාර්යයන් සිදු කිරීම නාමල් රාජපක්ෂගේ අභිප්‍රාය වී තිබේ.

ආණ්ඩුවට සමගි ජනබලවේගය එල්ල කරනු ලබන චෝදනාවලට දේශප්‍රේමී එක්සත් ජාතික පක්ෂය පිළිතුරු දීමට පටන්ගෙන තිබේ.

දේශප්‍රේමී එක්සත් ජාතික පක්ෂය යනු එක්සත් ජාතික පක්ෂයෙන් ඉවතට ගිය පිරිසකි. ඔවුන් තවත් දේශපාලන පක්ෂයක් ලෙස ක්‍රියාත්මක වන අතර එහි නායකයා ලෙස කටයුතු කරන්නේ සුගත් හේවාපතිරණයි.

සුගත් හේවාපතිරණ ප්‍රකාශ කරන්නේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායක හමුවී අභියෝගයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවයි.

සජිත් හමුවී මෙම අභියෝගය ඉදිරිපත් කරන බව සුගත් ප්‍රකාශ කරයි.



විවෘත විශ්වවිද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඒ අරියදුරෙ



විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග



පාඨමාලා ගාස්තු අඩු කරන ලෙසට ඉල්ලා විවෘත සරසවි ශිෂ්‍ය විරෝධතාවක්



අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ



විවෘත විශ්වවිද්‍යාලයේ මහ ශිෂ්‍ය සංගමයේ සභාපති හර්ෂ මධුශංක

# විවෘත විශ්වවිද්‍යාලයේ සිසු අවනඩුව

● සුභාෂිණී ජයරත්න

**විශ්වවිද්‍යාලයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම විශ්වවිද්‍යාලයේ ඇති විශේෂත්වයක් වන්නේ අධ්‍යාපනය ලබන බොහෝ විද්‍යාර්ථීන් රැකියා කරන අය වීමය. මේ වන විට විවෘත විශ්වවිද්‍යාලයේ යම් යම් ගැටලු තත්ත්ව උද්ගත වෙමින් පවතින බව එහි ශිෂ්‍ය සංගම්වල අදහස වී ඇත්තේය. අනිකුත් විශ්වවිද්‍යාල මෙන් නොව මෙහි පාඨමාලා සඳහා ඒකක ක්‍රමයට මුදල් අය කිරීමක් සිදුවන හෙයින් සිසුන්ගේ චෝදනාව වී ඇත්තේ විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් හිතුමතේ පාඨමාලා ගාස්තු වැඩි කරමින් සිසුන්ව අපහසුතාවයට පත් කරන බවකි. මේ නිසා අතරමඟදී විවෘත විශ්වවිද්‍යාල උපාධි පාඨමාලාව හැර යන පිරිස් වැඩි බව ඔවුන්ගේ චෝදනාවයි.**

විවෘත විශ්වවිද්‍යාලයේ මහ ශිෂ්‍ය සංගමය පවසන පරිදි විවෘත විශ්වවිද්‍යාලයේ වසරකට සිසුන් 45,000 ක් පමණ ඉගෙනීම් කරති. ඒ අධ්‍යනාංශ 5 ක් වෙනුවෙනි. දළ වශයෙන් වසරකට සිසුන් 5000-10000 ක් අතර ඇතුළත් වන අතර එයින් 6000-7000 ක් අතර පිරිසක් උපාධිය සම්පූර්ණ කර පිටව යති. ඔවුන් පවසන පරිදි ඒ අතරමැදි විශාල පිරිස විවිධ හේතු මත පාඨමාලාව සම්පූර්ණ කර නොගෙන හැලෙන පිරිසකි. විවෘත විශ්වවිද්‍යාලයේ මහ ශිෂ්‍ය සංගමය පවසන පරිදි වසර 5 කට එසේ හැරගිය පිරිස 14,000 ක් පමණ වෙති. ඔවුන් පවසන්නේ විද්‍යා පීඨයේ පමණක් මේ වසරේ සිසුන් 200 ක පමණ අධ්‍යාපනය අතරමග නතර කර දමා ඇති බවකි.

"අනිකුත් විශ්වවිද්‍යාලයමෙන්ම මේ විශ්වවිද්‍යාලයත් පාලනය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟිනුයි. පසුගිය කාලයේ සිටම මෙම විශ්වවිද්‍යාලයට විශාල වශයෙන් ප්‍රතිපාදන කප්පාදුවක් සිදුවුණා. ඒ නිසා එයට විරුද්ධව අපි සෑහෙන සටනක් කළා. අනිකුත් විශ්වවිද්‍යාලවලට සේම මෙයටත් ප්‍රතිපාදන ලැබිය යුතු වුවත් එය එසේ සිදුවූයේ නැහැ. රජය විසින් දිගින් දිගටම මේ විශ්වවිද්‍යාලයට ලබාදෙන ප්‍රතිපාදන අඩු කළා. උදාහරණ වශයෙන් 2017 වසරේදී රජයෙන් රුපියල් මිලයන 230 ක මූල්‍යාධාරයක් දුන්නා. 2018 දී එය රුපියල් මිලියන 150 ට අඩුකළා. 2018 වසරේදි ඒ ලබාදෙන ප්‍රතිපාදන රුපියල් මිලියන 50 ට බැස්සුවා. එතැන් සිට මේ විශ්වවිද්‍යාලට වසරකට ප්‍රතිපාදන වශයෙන් ලැබුණේ රුපියල් මිලියන 50 ක් පමණයි. මේ ප්‍රතිපාදන කප්පාදුව අනිකුත් විශ්වවිද්‍යාල සිසුන්ට වඩා අපේ විශ්වවිද්‍යාලයට දැඩිව දැනෙන්න පටන් ගත්තා. මෙම විශ්වවිද්‍යාල සිසුන් ආරම්භයේ සිටම පාඨමාලා ගාස්තු ගෙවමින් තමයි ඉගෙනීම් කටයුතු කරන්නේ. නමුත් රජයෙන් ලබාදෙන ප්‍රතිපාදන අඩු වූ පසු විශ්වවිද්‍යාල නඩත්තුවට අවශ්‍ය ඉතිරි මුදල් ප්‍රමාණය විශ්වවිද්‍යාලය සොයා ගත්තේ සිසුන්ගේ පාඨමාලා ගාස්තු වැඩි කරමින්. ඒ හිඟ මුදල් ප්‍රමාණය සිසුන්ගෙන් බෙදා පාඨමාලා ගාස්තු වලට එක් කළා. සාමාන්‍යයෙන් වසර 3 ක උපාධියක් සඳහා ඒකක 90 ක් සම්පූර්ණ කළ යුතුයි. නමුත් වසර 4 ක පාඨමාලාවක් කරන අයෙකුට ඒකක 120 ක් සම්පූර්ණ විය යුතුයි. විද්‍යාවේදී උපාධිය සඳහා 2014 වසරේදී ද අපි ලියාපදිංචි වුණේ ඒකකයක් 1100 ට. නමුත් 2020/21 අධ්‍යයන වර්ෂය වලට මෙම ඒකකයක මිල 2300 ක් වුණා." ඒ විවෘත විශ්වවිද්‍යාලයේ මහ ශිෂ්‍ය සංගමයේ සභාපති හර්ෂ මධුශංකය.

## වසර 5ක් තුළ උපාධිය ලබා ගැනීම අතරමඟ දමා ගිය සිසුන් 14,000ක්

ඔවුන පවසන පරිදි ඒ ඒ උපාධිය සඳහා ඒකක මිල ගණන් වෙනස් වෙයි. ස්වභාවික විද්‍යා පීඨයේ 2019/20 අධ්‍යනය වර්ෂය සඳහා ඒකකයක මිල රුපියල් 2100 කි. නමුත් 2020/21 සඳහා එක් ඒකකයක මිල රුපියල් 2310 දක්වා වැඩි විය. ඉංජිනේරු තාක්ෂණ පීඨය සඳහා 3 හා 4 මට්ටම 2019/20 අධ්‍යනය වර්ෂය සඳහා ඒකකයක මිල රුපියල් 1150 කි. නමුත් 2020/21 සඳහා එක් ඒකකයක මිල රුපියල් 1350 දක්වා වැඩි විය. ඉංජිනේරු තාක්ෂණ පීඨය සඳහා 5,6 හා 7 මට්ටම 2019/20 අධ්‍යනය වර්ෂය සඳහා ඒකකයක මිල රුපියල් 1750 කි. නමුත් 2020/21 සඳහා එක් ඒකකයක මිල රුපියල් 2100 දක්වා වැඩිවිය. එසේම කලාවේදී උපාධිය සඳහා 2019/20 අධ්‍යනය වර්ෂය සඳහා ඒකකයක මිල රුපියල් 1450 කි. නමුත් 2020/21 සඳහා එක් ඒකකයක මිල රුපියල් 1600 දක්වා වැඩි විය. මේ අනුව වසර 3 ක ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයේ පාඨමාලාවට අලුතින් එකතු වන කෙනෙකුට වසරකට පාඨමාලා ගාස්තු පමණක් රුපියල් 69,300 ක් පමණ යන බව ඔවුනගේ අදහසයි. එයට විද්‍යාගාර, නේවාසික මෙන්ම පුස්තකාල වැනි අනිකුත් සේවා ගාස්තුද එක් වූ විට වසරකට රුපියල් 75,000 ක් පමණ වෙයි. ඒ අනුව උපාධිය ලබා ගැනීමට රුපියල් ලක්ෂ 3 ක් පමණ වැයවෙයි.

"සෑම වසරකම මේ මුදල් ප්‍රමාණය 10% කින් වැඩි කරනවා. 2014 වසරේදී මේ ප්‍රමාණය 120% කින් වැඩි කළ අවස්ථාවේ අපි ඉල්ලීමක් කළා, ශිෂ්‍ය සංගමය සමග සාකච්ඡාවකින් තොරව වැඩි නොකරන ලෙසට. නමුත් අවස්ථා කිහිපයකදී මෙම වැඩි කිරීම් කළේ ශිෂ්‍ය සංගමයේ අනුමැතියකින් තොරවයි. දිගින් දිගටම ආ මේ ප්‍රශ්නය වැඩි වුණේ කොරෝනා වසංගතය හේතුවෙන්. මේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු වල යෙදෙන සිසුන් බහුතරයක් රැකියා කරන අය. කොරෝනා ප්‍රශ්නය නිසා සිසුන් බහුතරයකට රැකියා අහිමි වුණා, සමහරුන්ට වැටුප් පවා නොමැතිව ගියා. ඒ වගේම මේ වන විට අධ්‍යයන කටයුතු කෙරෙන්නේ දුරස්ථ අධ්‍යාපන මෙවලම් හරහායි. මේ නිසා අපි ඉල්ලීමක් කළා මෙවර එම පාඨමාලා ගාස්තු අය නොකර සහනයක් සලසන ලෙස. නමුත් පාඨමාලා ගාස්තු වැඩි කළා සේම මෙහි වූ නම්‍යශීලී අධ්‍යාපන ක්‍රමය පවා බිඳ දැම්මා....." ඒ මහ ශිෂ්‍ය සංගමයේ සභාපති ය.

## අපහසු සිසුන්ට පුද්ගලිකව සහන සලසන බව පාලනාධිකාරිය කියයි

"මෙය ලංකාවේ වැඩ කරන ජනතාවට උපාධිය ලබා ගන්න හදපු විශ්වවිද්‍යාලයක්. මෙහි සිසුන් 60% රැකියා කරන අය. මෙම විශ්වවිද්‍යාලයට රජයෙන් ලබා දී ඇති වියදම් අඩුකර සිසුන් මතට ඒ බර පටවලා. මෙහි ලියාපදිංචි ගාස්තු පවා සිසුන්ට දරන්න බැරි තරමට අය කරනවා. ඒ වගේම පාඨමාලා ගාස්තු ගෙවා ගන්න බැරි තරමට සිසුන්ට බර පැටවිලා. ආණ්ඩුවේ සැලසුම තමයි සෑම විශ්වවිද්‍යාලයකටම ලබා දෙන වියදම් 60% ක් කප්පාදු කිරීම..." ඒ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේය.

කෙසේ වෙතත් මේ පිළිබඳ විශ්වවිද්‍යාල බලධාරීන් පවසන්නේ මෙවන් අදහසකි. විශ්වවිද්‍යාලයක් නඩත්තු කිරීමට ප්‍රතිපාදන අවශ්‍යය. මේ නිසා වසරින් වසර යම් මුදලක් වැඩි කිරීමක් සිදු කරන්නට සිදුව ඇති බවකි. ඔවුන් පවසන පරිදි එවන් තත්ත්වයකදී යම් සිසුවකුට පාඨමාලා ගාස්තු ගෙවා ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති නම් ඒ අයට සහනයක් ලබා දීමට විශ්වවිද්‍යාල පාලනාධිකාරිය කටයුතු කරන බවයි.

## විශ්වවිද්‍යාල නඩත්තුවට අවශ්‍ය සියලු වියදම් රජයෙන් ලබා නොදෙයි

"සෑම වසරකම පාඨමාලා ගාස්තු 10% කින් වැඩි කරනවා. මෙය අතීතයේ සිට සිදුකරන දෙයක්. 2021/22 වසරට එවන් වැඩි කිරීමක් ගැන තවමත් සාකච්ඡා කර නැහැ. නමුත් යම් සිසුවකුට පාඨමාලා ගාස්තු ගෙවා ගත නොහැකි නම් ඒ සිසුන්ට සහනයක් ලබා දීම කෙරෙහි අපි සාකච්ඡා කරමින් යනවා. සියලු සිසුන්ට පොදු සහනයක් ලබා දෙන්න බැහැ. නමුත් ප්‍රශ්න ඇති අයට පමණක් සහනයක් ලබා දිය හැකියි. ...." ඒ විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඒ අරියදුරෙ ය.

අනිකුත් විශ්වවිද්‍යාල මෙන්ම මෙම විශ්වවිද්‍යාලයට ප්‍රතිපාදන වෙන් කෙරෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහාය. ඔවුන් පවසන්නේ මෙම විශ්වවිද්‍යාලය නඩත්තුවට අවශ්‍ය සියලු වියදම් රජය විසින්ම නොගෙවන හෙයින් විශ්වවිද්‍යාල විසින්ම ඒ මුදල් සොයා ගත යුතු බවකි.

"මෙය අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති සුවිශේෂී විශ්වවිද්‍යාලයක්. මෙහි අධ්‍යාපනය ලබන්නේ රැකියා කරන සිසුන්. ඇතුළේ සිට අධ්‍යාපනය ලබන දරුවන් අඩුයි. මුද්‍රිත හෝ අන්තර්ජාල හරහා දුරස්ථව අධ්‍යාපනය හදාරන මේ සිසුන් විශ්වවිද්‍යාලය තුළට පැමිණෙන්නේ විභාග සඳහායි. ඒ වගේම මේ විශ්වවිද්‍යාලය නඩත්තුවට අවශ්‍ය සියලු වියදම් රජයෙන් ලබා දෙන්නේ නැහැ. ගුරුවරුන්ගේ වැටුප් රජයෙන් ගෙවනවා. ඒ නිසා අනෙකුත් නඩත්තු වියදම් ඔවුන් විසින්ම සොයා ගත යුතුයි. මේ නිසා යම් මුදලක් අය කර ගැනීමට සිදු වෙනවා. එසේ නොමැතිව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමට නොහැකියි. ඒ වගේම මෙහි උපාධි වෙනත් තැනකින් කරනවා නම් මිලියන ගණනක් ගෙවන්න සිදු වෙනවා. මෙම විශ්වවිද්‍යාලයේ පාඨමාලා සඳහා අය කරන්නේ ඉතාම සාධාරණ අයකිරීමක්......" ඒ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංගය.


මහජනයා වෙත කෙරෙන නිවේදනයයි

**ශ්‍රී ලංකා රේගුව සම්බන්ධයෙන් එල්ලවන විවිධ චෝදනා හා සිදුවෙතැයි සැලකෙන දූෂිත ක්‍රියා හා අක්‍රමිකතා පිළිබඳ විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරිය වන) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර, ශ්‍රී ලංකා රේගුව සම්බන්ධයෙන් එල්ලවන විවිධ චෝදනා සහ සිදුවෙතැයි සැලකෙන දූෂිත ක්‍රියා හා අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ මතු දැක්වෙන කාරණා පිළිබඳව වාර්තා කිරීම පිණිස 2021 පෙබරවාරි මස 24 වැනි දින අංක 2216/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පූර්වෝක්ත කොමිෂන් සභාව පත්කරනු ලැබ ඇත.

(අ) ශ්‍රී ලංකා රේගුවෙහි සිදුවෙතැයි සැළකෙන දූෂිත ක්‍රියා වැළැක්වීම සඳහා ක්‍රමවේද නිර්දේශ කිරීම පිණිසත්, පරිපාලනමය හා තාක්ෂණික අඩුපාඩු හඳුනා ගැනීම සඳහාත්, පවත්නා තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහාත්, දැනට ක්‍රියාත්මක ව්‍යුහයන්, පද්ධති සහ ක්‍රියාපටිපාටි අධ්‍යයනය කිරීම.
(ආ) ආරක්ෂාව සහ නිරෝධායන නීති කෙරෙහි අවධානය යොමු කරමින්, උපරිම වෙළෙඳ පහසුකම් සැපයීම සහතික කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ රේගු ක්‍රියාපටිපාටි එකිනෙක සමායෝජනය වන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.
(ඇ) දැනට ක්‍රියාත්මක බන්ධිත ගුදම් පහසුකම්, ඒවායේ යටිතල පහසුකම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර, හොඳින් ඒකාබද්ධ වූ තොරතුරු තාක්ෂණ පද්ධතියක් මගින් ඒවායේ මෙහෙයුම් විධිමත් කිරීම.
(ඈ) ආදායම් සංරක්ෂණ නියෝග (Revenue Protection Order) සඳහා භාවිත කරනු ලබන බහුතීරු ගාස්තු සමාලෝචනය කිරීම.
(ඉ) ශ්‍රී ලංකා රේගුව සිදු කර ඇති සියළු අභ්‍යන්තර අධ්‍යයන සමාලෝචනය කිරීම.
(ඊ) රේගු වෘත්තීය සංගම් විසින් ඉදිරිපත් කර ඇති සියළු යෝජනා සමාලෝචනය කිරීම.
(උ) ස්වයංක්‍රීයකරණය මගින් රේගු පරිපාලනය නවීකරණය කිරීම.
(ඌ) ASYCUDA පද්ධතිය මගින් අවදානම් තක්සේරු කිරීම ශක්තිමත් කිරීම.
(එ) මානව සම්පත් පිළිබඳ ජාත්‍යන්තර පූර්වාදර්ශ ක්‍රියාත්මක කිරීම තුළින් රේගු කළමනාකරණය ශක්තිමත් කිරීම.
(ඒ) රජයේ ආදායම, ආර්ථිකය හා ජාතික ආරක්ෂාව, සොබා ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා රේගුව විසින් ක්‍රියාවට නංවන ලද ප්‍රතිලාභ පද්ධති සහ රේගු බුද්ධි කළමනාකරණයේ ඵලදායීතාව සමාලෝචනය කිරීම.
(ඔ) බැංකු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, විදේශ විනිමය හා නියාමන ආයතන සමඟ අන්තර් ආයතනික ගනු දෙනු සමාලෝචනය කිරීම.
(ඕ) ශ්‍රී ලංකා රේගුව කලාපයේ හොඳම රේගුව බවට පත්කිරීම සඳහා දූෂිත ක්‍රියාවන්, අක්‍රමිකතා සහ පරිපාලන බලය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා වහා ගත යුතු කෙටිකාලීන ක්‍රියා මාර්ග මෙන්ම, මධ්‍යම හා දිගු කාලීන ආයතනික ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම.

කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු පිණිස පූර්වෝක්ත කාරණා වලට අදාළ ලිඛිත නියෝජන, තොරතුරු හෝ යම් වෙනත් වැදගත් කරුණු ඉදිරිපත් කරන මෙන් යම් තැනැත්තෙකුට හෝ සංවිධානයකට කොමිෂන් සභාව මෙයින් ආරාධනා කර සිටී. සිද්ධි වාචික කරුණු වලට අදාළ සවිරුව නියෝජනයක් හෝ ප්‍රකාශයක් හැකි සෑම විටකදීම දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරනු ලැබිය යුතුය.

ඉහත ඡේදයන්හි දක්වා ඇති පූර්වෝක්ත කරුණු සියල්ලම හෝ කිසිවක් වෙනුවෙන් කෙරෙන එබඳු නියෝජන සිංහල, දමිළ හෝ ඉංග්‍රීසි බසින් කරනු ලැබිය හැකිය.

මෙකී සියළුම කරුණු නියෝජනයන් 2021 අප්‍රේල් මස 30 වැනි දින හෝ එදිනට පෙර පහත ලිපිනයෙහි ජනාධිපති කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ලැබෙන සේ එවිය යුතුය. මෙකී නියෝජනයන් ලියාපදිංචි තැපෑලෙන් එවීම වඩාත් මැනවි.

එකී සියළුම කරුණු නියෝජනයන්හි, නියෝජිතයාගේ හෝ තොරතුරු සපයන්නාගේ නම, ලිපිනය, ඇමතුම් අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය.

කොමිෂන් සභාව වෙත ලැබුණු ලිඛිත නියෝජන පරීක්ෂා කිරීමෙන් අනතුරුව වාචික නියෝජනයන් අවශ්‍ය යැයි සැලකෙන විටදී වාචිකව සාක්ෂි දීම පිණිස යම් තැනැත්තෙකු, තැනැත්තන් හෝ සංවිධානයක් කොමිෂන් සභාව විසින් කැඳවනු ලැබිය හැකිය. වාචික සාක්ෂි ලබා දියයුතු දිනයක් යථා පරිදි දැනුම් දෙනු ලැබේ.

මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන්නා වූ සාක්ෂිකරුවෝ 1948 අංක 17 දරන සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි විධිවිධාන සලසා ඇති පරිදි සාක්ෂිකරුවන්ගේ වරප්‍රසාදයන්ට සහ 2015 අංක 4 දරන අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ඔවුන්ගේ ආරක්ෂාව සලසාලීමේ සංශෝධිත පනතෙහි විධිවිධාන සලසා ඇති පරිදි අපරාධ වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් ලැබීම් සඳහා සුදුස්සෝ වෙති.

කොමිෂන් සභාවේ නියමය පරිදි,
කොමිෂන් සභාවේ ලේකම්.

2021 අප්‍රේල් මස 04 වැනි දින

සියළුම ලිඛිත නිවේදන මතු දැක්වෙන ලිපිනයට යොමුකළ යුතුය.

ලේකම්,
(ශ්‍රී ලංකා රේගුව සම්බන්ධයෙන් එල්ලවන විවිධ චෝදනා හා සිදුවෙතැයි සැලකෙන දූෂිත ක්‍රියා හා අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව),
අංක 4-209 ඒ,
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
දුරකථන: 011 269 1767 ෆැක්ස්: 011 269 1767
ඊ-තැපෑල: pcicustoms@presidentsoffice.lk




# 71 අප්‍රේල් 5

**වසර 1971 අප්‍රේල් කැරැල්ලේ ඔබ නොදත් කතාව සොයා මේ ලියුම්කරු දිස්ත්‍රික් 17 ක සංචාරය කර, 71 මුල් පෙළේ කැරලිකරුවන් 100කට අධික සංඛ්‍යාවක් ඔවුන්ගේ නිවෙස්වලට ගොස් ඉකුත් වසර කිහිපය ඇතුළතදී හමු විණි. එකී තොරතුරු ඇතුළත් ලිපි මාලාවක් මෙවර කලාපයේ සිට සිළුමිණ පුවත්පතේ සතිපතා කොටස් වශයෙන් පළ වනු ඇත.**


බොරැල්ල මැගසින් පාරේ නාගරික ප්‍රජා මණ්ඩලයේදී 1970 සැප්තැම්බර් 20 දා පැවැති ජවිපෙ මංගල පුවත්පත් සාකච්ඡාවේදී විජේවීර අදහස් දක්වමින්. කොටවල දේවසිරි හිමි, මොරවක භද්දිය හිමි, ලක්ෂ්මන් මහදුවගේ, සිසිල්චන්ද්‍ර ඉදිරිපෙළය. පසුපසින් සිටින්නේ ලක්ෂ්මන් චන්ද්‍ර සේකර හෙවත් කළු ලකී, ලක්ෂ්මන් මුණසිංහ හෙවත් පොඩි ලකී සහ ඔස්මන්ඩ් සිල්වාය.

**ලාංකීය දේශපාලනයේ ගමන්මඟ වෙනස් කළ පළමු වෙඩි මුරය වූයේ 1971 අප්‍රේල් කැරැල්ලය. එය මෙහෙය වූයේ රෝහණ විජේවීරගේ නායකත්වයෙන් යුත් ජනතා විමුක්ති පෙරමුණය (ජවිපෙ). වසර 2021 අප්‍රේල් 05 වැ**

**ස්ථාන 92කට ජවිපෙ විසින් අප්‍රේල් 5 වැනිදා රාත්‍රියේ රාජ්‍ය බලය ලබාගැනීම අරමුණ ඇතිව පහර දුන්හ. නිදහසින් පසු සන්නද්ධ අරගලයක් මඟින් රාජ්‍ය බලය ලබාගැනීමට දැරූ ප්‍රථම උත්සාහය ද මෙය විය. අප්‍රේල් කැරැල්ලේදී කැරලිකරුවන් විසින් පහර දුන් පොලිස් ස්ථාන 92ක අතරින් 57ක් විනාශ කළ අතර දෙනියාය, ඌරගහ, රාජාංගනය, කතරගම සහ වරකාපොල යන පොලිස් ස්ථාන 5 යටත්කර ගත්තේය. තවත් පොලිස් ස්ථාන 43ක් තාවකාලිකව ඉවත් කරගෙන තිබිණි.**

අප්‍රේල් කැරැල්ලේදී පොලිස් නිලධාරීන් 37ක් සහ හමුදා නිලධාරීන් 26ක් ජවිපෙ කැරලිකරුවන් අතින් ඝාතනයට ලක්විය. කැරලිකරුවන් විසින් මරා දමන ලද සිවිල් වැසියන් සංඛ්‍යාව 41කි. සමගි පෙරමුණ රජය මඟින් ප්‍රකාශ කළ නිල දත්ත අනුව මරාදමන ලද කැරලිකරුවන් සංඛ්‍යාව 1,200කි. එහෙත් මරාදමන ලද කැරලිකරුවන් සංඛ්‍යාව 5,000කට ආසන්න බව කියති. අත්අඩංගුවට ගත් සංඛ්‍යාව 18,000කට පමණ වූ අතර ඉන් 4,200ක් පමණ පොදු දේශපාලන සමාව යටතේ බාර වූ අය වේ. කැලණිය සහ ජයවර්ධනපුර සරසවි තාවකාලික සිර කඳවුරු බවට පත්විය.

අප්‍රේල් කැරැල්ලෙන් පසු පරීක්ෂණ කොමිෂන් සභා 4ක් මඟින් 1972 අගෝස්තු 10 සිට 1976 නොවැම්බර් 4 දක්වා කැරැල්ලේ මහ නඩුව ඇතුළු පරීක්ෂණ 140ක් පවත්වන ලදී. එයට චෝදනා ලැබූ චූදිතයන් සංඛ්‍යාව 3,908කි. ඉන් 3,014 කොමිෂන් සභා හමුවට ගෙන ආ අතර 894 දෙනෙකු අත්අඩංගුවට ගත නොහැකි විය. අත්හිටවූ සිර දඬුවම් මත නිදහස් කළ සංඛ්‍යාව 2,492කි. බරපතළ සිරදඬුවම් ලැබූ කැරලිකරුවන් ගණන 390කි. ජවිපෙ නායක රෝහන විජේවීර ඇතුළු 5 දෙනෙකුට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම විය. නිදොස් කොට යැවූ කැරලිකරුවන් ගණන 104කි. මහ නඩුවේදී 41 දෙනෙකුට එරෙහිව නඩු පැවරිණි. අප්‍රේල් මහ නඩුවේ තීන්දුව 1974 දෙසැම්බර් 20 වැනිදා ලබාදුන් අතර විත්තිකරුවන් 41 දෙනාගෙන් 4ක් නිදහස්වූ අතර සුසිල් සිරිවර්ධන, එස්.ඩී බණ්ඩාරනායක සහ ටී.ඩී. සිල්වාට අත්හිටවූ සිරදඬුවම් නියම විය. විජේවීර දිවි ඇති තෙක් හිරේය. බරපතළ වැඩ ඇතිව සිරදඬුවම් 28 දෙනෙකුට නියම විය.

කැරැල්ලේ නායක රෝහණ විජේවීර 1971 මාර්තු 13වැනිදා පස්වරුවේදී අම්පාරේදී අත්අඩංගුවට ගනු ලැබීය. ඔහු සමඟ කෙලී සේනානායක, නිශ්ශංක, ප්‍රේමරත්න, ලාල් සෝමසිරි සහ ඇල්පිටියේ ඒ. ප්‍රේමසේනද අත්අඩංගුවට ගෙන මඩකලපු බන්ධනාගාරයට දමා මාර්තු 15වැනිදා උදෑසන 7.30ට කොළඹ වැලිකඩ බන්ධනාගාරයට ගෙන එනු ලැබුවේ පොලිස් අධිකාරි රංජිත් සේනානායක විසිනි. පසුව විජේවීර, ප්‍රේමරත්න සහ ලාල් සෝමසිරි යාපනය බන්ධානාගාරයට ගෙන යන ලදී. ප්‍රේමරත්න සහ ලාල් සෝමසිරි 1971 මාර්තු 31වැනිදා කල්මුණේ උසාවියට ඉදිරිපත් කළ විට ඇප පිට නිදහස් විය. විජේවීර එයට පෙරදින එම

ආරම්භ කරන ලෙසට විජේවීර කියූ බවට කටඋත්තරයක් දෙන ලෙසය. ගිනි තැබූ නිවස සදා දෙන බවද පුතුන් නිදහස් කර රැකියා ලබා දෙන බවට ඉයන් වික්‍රමනායක පොරොන්දු වූව ද තමා බොරු කීවේ නැති බවද සීලවතී පසුව කියා සිටියාය. ලාල් සෝමසිරි විසින් 1971 මැයි 31වැනිදා දෙන ලද කට උත්තරයේදී විජේවීර කියන ලද කරුණු ඉයන් වික්‍රමනායක විකෘති කර තිබූ බව ලාල් සෝමසිරි, මෙම ලියුම්කරුට අවධාරණය කළේය.

ලොකු අතුල ඇතුළු ඇතැමකු කියන්නේ 1971 මාර්තු 13 අම්පාරේදී විජේවීර ස්වෙච්ඡාවෙන්ම අත්අඩංගුවට පත්වූ බවකි. එහෙත් මහ නඩුවේ 26වැනි සැකකරුවකු වූ එදා විජේවීරගේ සමීපතමයකු වුවද ජවිපෙ 2වැනි කැරැල්ලේ ඝාතන ලැයිස්තුවේ සිට දිවි බේරාගැනීමට සමත්වූ විජේවීර සමඟ අම්පාරේදී අත්අඩංගුවට ගත් පස් දෙනා පවසනුයේ සිය කැමැත්තෙන් විජේවීර අත්අඩංගුවට පත්වූවා යැයි කීම දැඩිව ප්‍රතික්ෂේප කරන බවය. අනපේක්ෂිත ලෙස අත්අඩංගුවට පත්වීමේ සිද්ධිය විකෘති කිරීමට කැමති නැති බවද ඔවුහු කියා සිටියහ.

අම්පාරේ 1971 මාර්තු 13 විජේවීර අත්අඩංගුවට ගැනීම පිළිබඳව සිදුවූයේ කුමක්දැයි සොයා බැලීමට බටපොල ලාල් සෝමසිරිගේ නිවෙසටත්, අම්පාරේ ප්‍රේමරත්නගේ නිවෙසටත්, කරන්දෙණියේ ප්‍රේමසේනගේ නිවෙසටත්, හෝමාගම නිශ්ශංකගේ නිවෙසටත් ගියේය. එමෙන්ම විදේශගතව සිටි කෙලී සේනානායක සමඟ ද දුරකථනයෙන් සම්බන්ධ විය.

වසර 1971 මාර්තු 15වැනිදා මඩකලපුවේ සිට කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට ගෙන ආ බවද එදින උදෑසන 11.00 පැමිණි ඔස්මන්ගේ අම්මා සහ කුමානායකට විජේවීර තමා ඉදිරිපිටදී කියා සිටියේ; ලොකු අතුල සහ සනත්ට ප්‍රශ්න අමතක කරගෙන පසුබසින ලෙසත් ආයුධ හංගා දිස්ත්‍රික්ක මාරුකරන ලෙසත් කෙලී සේනානායක ප්‍රකාශ කර ඇත.

අප්‍රේල් කැරැල්ලේ පහරදීමේ අවසාන තීරණය ගත්තේ 1971 අප්‍රේල් 2වැනිදා ගංගොඩවිල විද්‍යෝදය සරසවියේ සංඝාරාමයේදීය. නම දෙනෙකුගෙන් යුත් එම නායකත්ව මණ්ඩලයේ මුලසුන දැරුවේ පියතිලකය. අප්‍රේල් 5වැනිදා රාත්‍රී 11.30ට පොලිස් ස්ථානවලට පහර දිය යුතු යැයි වැඩි ඡන්දයෙන් තීරණය විය. එය 6ට 3ක් වශයෙන් බෙදුණු තීන්දුවකි. එම රැස්වීමට සහභාගි වූ පස්දෙනෙකු ද ලියුම්කරුගේ සාකච්ඡාවට එක්විය.

**වසර 1971 අප්‍රේල් කැරැල්ලේදී කියත් තලයෙන් අත්පා කැපීමෙන් පසු සිය හිස කඳෙන් වෙන්කර දැමෙද්දීත් බද්දේගම, ගිනිමැල්ලගහ කොඩිතුවක්කු මද්දගේ කමල බන්දු පෑ ජීව ගුණය ඔබට මතකයට නැඟෙනු ඇත. එමෙන්ම දියේ ගිල්වා මරා දමද්දීත් උනන්පිටියේ පදුම හිමියන් පෑ උපේක්ෂාව සිහියට නැඟෙනු ඇත. දූෂණය කොට මරා දමද්දීත් කතරගම ප්‍රේමවතී මනම්පේරි සුරක්ෂිත කළ විප්ලවීය සදාචාරය ආවර්ජනය වනු ඇත.**

දෙදෙනාට කියා සිටියේ පහර දෙනවානම් 500ක පමණ පිරිසක් තමා නිදහස්කර ගැනීමට එවන ලෙසට සනත්ට සහ පියතිලකට දන්වන ලෙසය. වඩුතන්ත්‍රිගේ සිරිල් නොහොත් ලාල් සෝමසිරි බටපොල සිය නිවෙසේදී ලියුම්කරුට පැවැසූ පරිදි විජේවීර එදා කැරැල්ල ආරම්භ කිරීමට දිනයක් සහ වේලාවක් තීරණයකර පහරදෙන ලෙසට පණිවිඩයක් කිවේ නැත. විජේවීර කියා ඇත්තේ පහර දෙනවා නම් 500ක් තමා බේරා ගැනීමට එවන ලෙසය. අප්‍රේල් 5වැනිදා වන විටත් විජේවීර සිටියේ යාපනය බන්ධනාගාරයේය.

ඔස්මන්ගේ අම්මා වන සීලවතී ද සිල්වා කියා සිටියේ යාපනය හිර ගෙදරදී තමා විජේවීර බැලීමට ගිය අවස්ථාවේදී පහර නොදී භේද අතහැර කටයුතු කරන මෙන් රෝහණ විජේවීර දුන් පණිවිඩය තමා සනත් සහ ලොකු අතුල ඇතුළු පක්ෂයේ නායකයන්ට දැනුම් දුන් බව ය. වනාතමුල්ලේදී ඔස්මන් සිල්වා හමුවූ ලියුම්කරු එම කරුණු සනාථ කරගත්තේය. එවකට රජයේ සොලිස්ටාර් ජනරාල්වරයා සහ කැරැල්ල මැඩලිමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් කළ ඉයන් වික්‍රමනායක සීලවතීගෙන් ඉල්ලා සිටියේ යාපනයේ හමුවූ අවස්ථාවේදී කැරැල්ල


ජවිපෙ ඉතිහාසයේ තමා ජීවත්වන දිස්ත්‍රික්කයෙන් පිටතට ගොස් වෙනත් දිස්ත්‍රික්කයක පූර්ණකාලීනව කාන්තා ක්‍රියාකාරීන් වශයෙන් 1970 මුල් භාගයේදී ප්‍රථමයෙන් වගකීම් බාරගත් සිවුදෙනාගෙන් තිදෙනෙකු මෙහි වේ.

හික්කඩුවේ උපන් හම්බන්තොට දිස්ත්‍රික් නායිකාවක් වූ සම්පතී අබේසේකර හෙවත් සුජාතා, අම්බලන්ගොඩ කන්දේගොඩ උපන් මාතර දිස්ත්‍රික් නායිකාවක් වූ ධම්මිකා ද සිල්වා හෙවත් අනෝමා සහ අම්බලන්ගොඩ උපන් නුවර දිස්ත්‍රික් නායිකාවක් වූ සේපාල ගිණිගේ හෙවත් රෝහිණී හෙවත් කාන්ති මෙහි වමේ සිටය.


අප්‍රේල් කැරැල්ලේදී කැරැලිකරුවන් යටත් කරගත් පොලිස් ස්ථාන පහට අයත් රාජාංගන පොලීසියට (වර්තමාන තඹුත්තේගම පොලීසිය) ප්‍රහාර එල්ල කළ කණ්ඩායමට නායකත්වය දුන් ආලෝක බණ්ඩාර හෙවත් කරුණාරත්න හෙවත් තඹුත්තේගම කරූ, අඹන්පොල පොලිස් කොට්ඨාසයේ ලේකම් ගුණවර්ධන විල්බට් හෙවත් විල්බට් මුදලාලි සහ රත්නායක විජේරත්න හෙවත් කළු විජේ මෙහි වමේ සිටය. කළු විජේ ඉකුත් වසර අවසාන භාගයේදී දිවියෙන් සමුගත්තේය.


අම්පාරේදී විජේවීර සමඟ අත්අඩංගුවට ගත් පස් දෙනාගෙන් තිදෙනෙකු වූ හෝමාගම නිශ්ශංක, බටපොල ලාල් කුමාරසිරි සහ කරන්දෙණියේ ප්‍රේමසේන මෙහි වමේ සිටය. එදින සිද්ධිය ඔවුහු මුල සිටම කියා සිටියහ.


අම්පාරේදී අහම්බෙන් විජේවීර අත්අඩංගුවට ගත් අම්පාර පොලිස් කණ්ඩායමේ සාමාජිකයකු වූ සැරයන් සමරසිංහ සිදුවීම ආවර්ජනය කරමින් (වමේ) උහන සිට අම්පාරට විජේවීර පැමිණි කුලී රථයේ රියැදුරු


අගමැතිනි සිරිමා බණ්ඩාරනායක මැතිනිය පැහැර ගැනීමේ කණ්ඩායමේ නායකයා වූ වත්තල වීරසිංහ සේනක රාජා නිමල් හෙවත් රොස්මිඩ් නිමල් එම සම්පූර්ණ සිදුවීම් පෙළ ලියුම්කරුට විස්තර කිරීමෙන් පසු.


අම්පාරේදී 1971 මාර්තු 13 වැනිදා විජේවීර අත්අඩංගුවට ගත් ස්ථානය ඉන් වසර 50කට පසු ලියුම්කරුට පෙන්වන්නේ විජේවීර සමඟ අත්අඩංගුවට පත්වූ පස් දෙනාගෙන් අයකු වූ අම්පාරේ ප්‍රේමරත්නය.



විජේවීරගේ දේශපාලන සංවිධානය සමගි පෙරමුණට එරෙහි විප්ලවවාදී සටන් වලට මුවාවී ආරම්භකර ඇති ඇමෙරිකන් රහස් ව්‍යාපාරයක් බවට චෝදනා කරමින් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ඇත්ත පුවත්පත 1969 ජුලි 18 ප්‍රධාන පුවතින් චෝදනා කළේ මෙසේය. වසර 1971 අප්‍රේල් කරැල්ල සඳහා විදේශ අනුග්‍රහයක් නොලැබිණි.


සෝවියට් චීන මතයේදී ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ද දෙකඩ වූ අතර, ශන්මුගදාසන් සහ ප්‍රේමලාල් කුමාරසිරි ඇතුළු පිරිස චීන පිලට නායකත්වය දුන්නේය. පසුව චීන පිලට අයත් ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්වරයා වූ ප්‍රේමලාල් කුමාරසිරි මෙහි දැක්වේ. විජේවීර රුසියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණීමේදී කටුනායකට ගොස් නාවල සිය නිවෙසට ගෙන ආවේද ප්‍රේමලාල් විසිනි. 1964 දෙසැම්බර් මසදී ශන්මුගදාසන්ගෙන් කැපී ගිය ප්‍රේමසිරි කුමාරසිරි පසුව ශන්ගේ ප්‍රතිපත්තිවලට එරෙහිව වැඩ කළ ජාතික අරමුණ, ගිණිපුපුර ඇතුළු කණ්ඩායම් වලට සිය සහාය ලබා දුන්නේය. එවකට ගිණිපුපුර කණ්ඩායමේ ක්‍රියාකාරිකයන් වූ පේරාදෙණිය සරසවියේ උපාධිධාරීන් වන පද්මරාජා විජේතිලක සහ වසන්ත කුලතුංග රහසිගතව චීනයට යවා මාස හයක විප්ලවීය දේශපාලන පුහුණුවක් ලබාදීමට මැදිහත් වූයේ ද ප්‍රේමලාල් කුමාරසිරිය.

# කැරැල්ලට වසර 50යි

මේ තීරණයට පෙර ජවිපෙ නායකයන් 9 දෙනෙකු රැස්වී තීරණයක් ගෙන තිබිණි. ඒ අනුව තීරණය වූයේ තවදුරටත් පහර දීම ප්‍රමාද වන්නේ නම් 1971 අප්‍රේල් 4 වැනිදා රාත්‍රී 10.00ට පොලිස් ස්ථානවලට එකවර පහර දීමටය. ඒ අනුව එම තීරණය දින කිහිපයකට පෙර රට පුරා දිස්ත්‍රික් ලේකම්වරුන්ට දැනුම් දෙමින් තිබිණි. අප්‍රේල් 5 වැනිදා උදේ වැල්ලවාය පොලිසියට පහර දෙන්නේ වැරදි විදුලි පණිවිඩයකින් නොව මෙම අලුතින් ගත් තීරණය ඔවුන්ට සන්නිවේදනය කර නොතිබීමෙනි. එහෙත් 1971 අප්‍රේල් 5 වැනිදා රාත්‍රී පහරදීමට ගත් තීරණය අනිකුත් සියලු ස්ථානවලට ගොස් තිබිණි.

අප්‍රේල් 3 වැනිදා සවස බටපොල අතුලගේ නිවසේදී ලාල් සෝමසිරිට කැරැල්ලේ දෙවැනි නායක සනත් නියම කළේ, අම්පාර උහනට ගොස් මොනරාගල දිස්ත්‍රික් නායක දොඩම්ගහවෙල ප්‍රේමසිරි හමුවී පහරදෙන්නේ අප්‍රේල් 4 වැනිදා රාත්‍රී 10 නොව අප්‍රේල් 5වැනිදා 11.30ට ලෙස වෙලාව වෙනස් වී ඇති බවය. පණිවුඩය ලබාදීමට අප්‍රේල් 4 වැනිදා හිමිදිරි පාන්දරම නුවර හරහා අම්පාරට යෑමට ගිය ලාල් සෝමසිරිට නුවර බස් නැවතුම්පොළේදී නිශ්ශංක ප්‍රේමරත්න හමුවිය. එවිට වේලාව දවල් 12.30 විය.

ප්‍රේමරත්න විසින් සෝමසිරිට එහිදී කියා සිටියේ වහාම යළිත් විද්‍යෝදය සරසවියට ගොස් පියතිලක හමුවන ලෙසට පියතිලක දන්වා ඇති බවත්; තමා වහාම මොනරාගල දිස්ත්‍රික් නායක දොඩම්ගහවෙල ප්‍රේමසිරි හමුවීමට ගොස් පහර දෙන්නේ අප්‍රේල් 4 රාත්‍රී නොව 5 වැනිදා රාත්‍රී බවට දැනුම් දෙන බවත්ය. කැරැල්ලට සහභාගි නොවී එදිනම සැඟවුණු ප්‍රේමරත්න එම පණිවිඩය මොනරාගල නායකයාට දැනුම් දුන්නේ නැත. එය තමා පසුපස සැකකටයුතු පුද්ගලයෙක් පැමිණීම නිසා මොනරාගලට නොගොස් අම්පාරට පැමිණි බව අම්පාරේ ප්‍රේමරත්න පිළිගත්තේය. වැල්ලවාය පොලිස් ස්ථානයට 1971 අප්‍රේල් 4 රාත්‍රී එල්ල කළ ප්‍රහාරය එම සන්නිවේදන සම්බන්ධීකරණයේ දුර්වලතාවක ප්‍රතිඵලයකි.

ප්‍රේමරත්නගේ දැනුම්දීම අනුව 1971 අප්‍රේල් 4 දහවල් 12.30ට නුවරින් කොළඹ බලා ආ ලාල් සෝමසිරි මහරගමට ගොස් විද්‍යෝදය සරසවියේදී පියතිලක හමුවිය. එදින රාත්‍රී කෑම කා සරසවියේ නවාතැන් ගත් සෝමසිරි 1971 අප්‍රේල් 5 උදෑසන ඊබට් සිල්වා බසයට නැඟී 60 දෙනෙකු සමඟ යාපනය සිංහල මහා විද්‍යාලයට පැමිණෙන විට රාත්‍රී 9.00 පමණ වී තිබිණි. නායකයන් හද්දිය හිමි සහ කරාටේ සැම්සන්ය. පිළියන්දල මධ්‍ය විද්‍යාලයේ සිසුන් 16ක්ද කණ්ඩායමට අයත් විය. දුම්රියෙන්ද පැමිණ යාපනයේ නාග විහාරයේ සිටි පිරිස සමඟ එක්ව කඩ වසා තිබූ බැවින් රාත්‍රී ආහාරයට බිස්කට් පමණක් කා බෝම්බ දෙක බැගින් ගෙන බන්ධනාගාරයට සහ පොලිසියට පහරදීමට ඔවුහු ගියහ. ප්‍රහාරයක් ද එල්ල කළහ.

මේ සියලු කරුණු කාරණා ඉතිහාසයට එක්වී 2021 අප්‍රේල් 05 වැනිදාට හරියටම වසර 50 කි. එම කාලය තුළදී අප්‍රේල් කැරැල්ල පිළිබඳව පළ වූ පතපොතද දුසිම් දෙකකට ආසන්නය. පුවත්පත් ලිපි ද ප්‍රමාණයෙන් අති විශාලය. එහෙත් එම කතා එකිනෙකට පරස්පරය. එසේත් නොමැතිනම් තම දෘෂ්ටිකෝණයන් අනුව ලියන ලද ලේඛනය. නැතිනම් පෙර පළකරන ලද පොත් සහ ලිපිවලින් එකතු කරගත් කරුණුය.

සිළුමිණ පුවත්පත අදින් ආරම්භ කරන 1971 අප්‍රේල් කැරැල්ල පිළිබඳ මෙම ලිපි මාලාව මෙතෙක් කිසිදු පුවත්පතක පළවී හෝ ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත්කොට හෝ නැත. අප්‍රේල් කැරැල්ලෙන් වසර 50කට පසු එළිදකින මේ ලිපි මාලාව සැකැසීම සඳහා ලේඛකයා කැරැල්ලේ මහ නඩුවේ ජනප්‍රිය නායකයන් පමණක් නොව සැබෑ ලෙසම ප්‍රහාරයට එක්වූ ඉදිරිපෙළ සටන්කාමීන් සිය ගණනක් දශකයකට ආසන්න කාලයකදී හමුවූ අතර මෙය ඒ පිළිබඳව කළ වාර්තාකරණයකි.

ජවිපෙ ආරම්භ වීමට හේතු, එම කාල වකවානුව තුළ තිබූ වෙනත් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් හැටේ දශකයේ අවසාන භාගය සහ කැරැල්ල දක්වා ජවිපෙ විකාශනය විස්තරාත්මකව මෙයට ඇතුළත්ය. ලේඛකයා ජීවත්ව සිටින එම සියලු නායකයන් ද, ඔවුන් ජීවත්ව නොමැතිනම් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ නායකයන් ද දිස්ත්‍රික්ක 17කට ගොස් කළ සාකච්ඡා මෙයට ඇතුළත්ය.

මෙම ලිපි මාලාව දත්ත සහ ඓතිහාසික කරුණු රැසකින් පොහොසත් වනු ඇත. වර්තමානයේ ජීවත්වන වයස අවුරුදු 50ට අඩු අය කිසිදා නොදුටු, එහෙත් ඔවුනට අසන්නට පමණක් ලැබුණු 71 අප්‍රේල් කැරැල්ලේ ඇතුළාන්තය පිළිබඳ සියලු තතු නොදන්නා අයටද ඒ අසම්පූර්ණ සිදුවීම් මාලාව පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මෙම ලිපි මාලාව තුළින් විද්‍යමාන වනු ඇත. මෙතෙක් බොහෝ දෙනා ඇසූ සහ කිය වූ උපකල්පන, විකෘති කිරීම්, වැරදි වැටහීම් මත වෙනුවට සත්‍ය ඉතිහාසය මෙම ලිපි මඟින් විවර කරනු ඇත.

ජවිපෙ 2වැනි කැරැල්ලද විජේවීරගේ නායකත්වයෙන් 1986 ඇරැඹී 1990 අවසන් වූ අතර එහිදී මියගිය හෝ අතුරුදන් වූ සංඛ්‍යාව මානව හිමිකම් සංවිධානවල වාර්තාවන්ට අනුව 67,652 කි. මින් 6,661ක් කැරැලිකරුවන් අතින් ඝාතනයට ලක්වූ අතර සෙසු අය ඝාතනයට පත් වූයේ ආරක්ෂක අංශ ඇතුළු එයට සෘජු සහ වක්‍ර සම්බන්ධකම් පැවතුණා යැයි කියන අතුරු හමුදා කණ්ඩායම් 13ක් මඟිනි. ජවිපෙ 2වැනි කැරැල්ල පිළිබඳවද නිරවද්‍ය විස්තරයක් මේ ලේඛකයා විසින් ඉකුත් දශකය තුළ සැපයීම හේතුකොටගෙන එම ලිපි මාලාව පුළුල් ලෙස සම්භාවනාවට පාත්‍ර විය.

**අම්පාරේ 1971 මාර්තු 13 විජේවීර අත්අඩංගුවට ගැනීම පිළිබඳව සිදුවූයේ කුමක්දැයි සොයා බැලීමට බටපොල ලාල් සෝමසිරිගේ නිවෙසටත්, අම්පාරේ ප්‍රේමරත්නගේ නිවෙසටත්, කරන්දෙණියේ ප්‍රේමසේනගේ නිවෙසටත්, හෝමාගම නිශ්ශංකගේ නිවෙසටත් ලේඛකයා ගියේය. එමෙන්ම විදේශගතව සිටි කෙලී සේනානායක සමඟ ද දුරකථනයෙන් සම්බන්ධ විය. එපමණක් නොව උහන සිට අම්පාර දක්වා විජේවීර පැමිණි කුලී රථයේ රියැදුරාගේ උහන නිවෙසට යෑමට ද අමතක නොකළේය.**

වසර 1971 අප්‍රේල් කැරැල්ලේදී කියත් තලයෙන් අත්පා කැපීමෙන් පසු සිය හිස කඳෙන් වෙන්කර දැමෙද්දීත් බද්දේගම, ගිනිමැල්ලගහ කොඩිතුවක්කු මද්දගේ කමල බන්දු පෑ ජීව ගුණය ඔබට මතකයට නැඟෙනු ඇත. එමෙන්ම දියේ ගිල්ලවා මරා දමද්දීත් උනන්පිටියේ පදුම හිමියන් පෑ උපේක්ෂාව සිහියට නැඟෙනු ඇත. දූෂණය කොට මරා දමද්දීත් කතරගම ප්‍රේමවතී මනම්පේරි සුරක්ෂිත කළ විප්ලවීය සදාචාරය ආවර්ජනය වනු ඇත.

එසේ තිරස්චීන අතවර සහ වද බන්ධනවලට ලක්ව ඝාතනය වූ තරුණ තරුණියන්ගෙන් ගලා ගිය උණුසුම් ලේ දහරා පිළිබඳව පමණක් නොව විප්ලවීය ජීව ගුණයෙන් පිරිපුන් කැරැල්ලට සහභාගි වීමෙන් සිය ජීවිතයේ අනාගතයම කැප කළ දහස් ගණනක් පිළිබඳ මතකය විනාශ කළ නොහැකි වුවද පරාජය කළ නොහැකි වුවද අපේක්ෂාවක් බව කියවෙනු ඇත. සෑම සතියකම සිළුමිණ පුවත්පතේ පළ වන මෙම ලිපි මාලාව ඔබ වෙනුවෙන් විවර වන්නේ එකී සැබෑ ඉතිහාසය වත්මන් පරපුර දැනගත යුතු නිසාය.



විජේවීර කොමියුනිස්ට් පක්ෂයේ නායක වෛද්‍ය එස්. ඒ. වික්‍රමසිංහගේ අනුග්‍රහය මත ශිෂ්‍යත්වයක් ලැබ රුසියාවේ මහජන මිත්‍රත්ව සරසවියට (ප්‍රැටිස් ලුලුම්බා) වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා ඇතුළු වූයේ 1960 සැප්තැම්බර් 25 වැනිදාය. ඒ සඳහා කඹුරුපිටිය කොමියුනිස්ට් නායකයෙක් වූ ඊලියන් නානායක්කාර ක්‍රියාකාරීව මැදිහත් වූ අතර, එය යෝජනා කළ දෙවිනුවර කොමියුනිස්ට් පක්ෂ ශාඛා ලේකම් හේවා කොපරගේ පීරිස් මෙම ඡායාරූපයේ දකුණේය. මැද සිටින්නේ ජේම්ස් ඉටින් සුදසිංහය.



ජවිපෙ උපත ලත් 1965 මැයි 14 අක්මීමන සාකච්ඡාවට සහභාගි වූ සමාරම්භකයන් සංඛ්‍යාව 12කි. ඉන් හතර දෙනෙකු 2018 වන විටද ජීවත්ව සිටි අතර ලියුම්කරුට ඔවුන් අතීත මතකය ආවර්ජනය කළේය. එවකට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අක්මීමණ ඩබ්ලිව් ටී. කරුණාරත්න, දොම්පෙ දෙල්ගොඩ රාජා සහ සතොස කාර්මික අංශයේ මහරගම ටී. ඩී. වෝල්ටර් මෙහි වමේ සිටය. කැරැලිකරුවන් වර්තමානයේ සිටිනුයේ ගම්පහ වැඩිහිටි නිවාසයකය.




අප්‍රේල් කැරැල්ලේ ළාබාලතම කැරැලිකාරිය වූ දොළොස් හැවිරිදි වයලට් ගුණවතී කහගල්ල හෙවත් වයලා කහගල්ල අත්අඩංගුවට ගැනීමෙන් පසු තමාට සිදුවූ අතවර පිළිබඳව විස්තර කිරීමෙන් පසු සිය නිවෙස ඉදිරිපිටදී ඡායාරූපයට පෙනී සිටි අයුරුය. ඇය 1958 දෙසැම්බර් මස 31 දින උපත ලැබීය. වයලාගේ දෙමාපියන් ඇතුළු පවුලේ සියලු දෙනා කැරැලි සමයේදී අත්අඩංගුවට ගත් අතර, එක් සොහොයුරෙක් එහිදී මිය ගියේය.



විල්පත්තු කණ්ඩායමේ නායකයකු වූ සෝමපාල ගුරුසිංහ, මොනරාගල දිස්ත්‍රික් ලේකම් අයි. ඩී. ප්‍රේමසිරි හෙවත් ප්‍රේමසිරි ගමගේ, පුත්තලම දිසා ලේකම් විල්සන් හේරත්, ගාල්ල දිස්ත්‍රික් ලේකම් ජනක හෙවත් ජගත් ප්‍රියන්ත වර්ණකුලසූරිය, විජේවීර මුදාගැනීමට යාපනයට බස් රථයෙන් ගිය කණ්ඩායමේ නායකයකු වූ අම්බලන්ගොඩ සැම්සන්, පේරාදෙණිය සිසු නායක සරත් විජේසිංහ කෑගල්ලේ දී විජේවීරට හඳුන්වා දුන් මහරගම ගුරු විදුහලේ කේ. පී. වීරරත්න සහ වෘත්තීය අංශයේ තැපැල් ප්‍රේමදාස 71 අප්‍රේල් කැරැල්ලට ප්‍රවේශවීමේ අතීතය ස්මරණය කළ සිය ගණනක් අතර විය.



හැටේ දශකයේ මැද සහ අවසාන භාගයේ ක්‍රියාත්මක වූ වාම කණ්ඩායම් කිහිපයක නායකයන් අතීතය මෙනෙහි කළේය. වමේ සිට පේරාදෙණිය සමාජවාදී සංගමයේ ලේකම් නිහාල් ඩයස්, ගිණිපුපුර කණ්ඩායමේ නායක නීතිඥ කල්‍යානන්ද තිරාණගම සහ කණ්ඩායමේ නායක සුමිත් දෙවිනුවර. (සුමිත්ගේ තොරතුරු එම කණ්ඩායමේ හිටපු ක්‍රියාකාරීන් සහ බිරිඳ විසින් ලබාදෙන ලදි)



මේ සිටින්නේ හෝමාගම පොල්ගස්ඕවිට මන්ත්‍රකරුවකු වූ හෙරළියාවල ජිනදාස කුමාරන්නැහැය. එඬේරමුල්ල දවටගහවත්තේ ටී. ඩී. සිල්වාගේ නිවෙසේදී අංජනමක් බලමින් සිටියදී ජවිපෙ රජයක නායකයා වන්නේ කවුදැයි විමලගුණේ ප්‍රශ්නයක් ඇසීය. සුදු උස අයෙකු බව මන්ත්‍රකරුගේ පිළිතුර විය. මෙය විමලගුණේ ජවිපෙ ඇතැම් නායකයන් ප්‍රකාශ කරන ලද්දේ ලොකු අතුල නායකයා වන බවකි. ජවිපෙ භේදයක් ඇතිවීමට එයද පසුකාලීනව බලපෑවේය.



ජවිපෙ කැරැල්ලට පිටරටින් අවි ගෙන ඒමේ අරමුණින් රෝහණ විජේවීර විසින් 1966 දී තිස්ස පාරේදී අරඹන ලද කිරින්ද ගොවිපළ කළපුව හරහා මුහුදට සම්බන්ධ වන ආකාරය දිස්වූයේ මෙසේය.



හැටේ දශකයේ මැද සහ අවසාන භාගයේ ක්‍රියාත්මක වූ වාම කණ්ඩායම් කිහිපයක නායකයන් අතීතය මෙනෙහි කළේය. වමේ සිට පෙරදිග සුළඟ කණ්ඩායමේ ලේකම් රිකිල්ලගස්කඩ විමල් විජේකෝන්, කෑගල්ල සරත් විජේසිංහ කණ්ඩායමේ ක්‍රියාකාරී කුරුණෑගල බෝල සමරේ (වසරකට පෙර මිය ගියේය) සහ ලංකා විමුක්ති ව්‍යාපාරයේ නායකයෙකු වන නීතිඥ ආනන්ද ගුණතිලකය.



# පාර මැද්දේ යකා නැටූ ‘රෙස්ලින් කොස්තාපල්’

● අමිල මලවිසූරිය

**මහජනයා සහ පොලිසිය අතර සහසම්බන්ධය හෑල්ලුවට ලක්කරමින් මෙරට පොලිසිය ගැන අල්ජසීරා වැනි ප්‍රමුඛ පෙළේ අන්තර්ජාතික මාධ්‍ය ඇතුළු විදෙස් රටවල් රැසකම මාධ්‍යයන්හි පුවත් මැවූ ශ්‍රී ලංකා පොලිසියේ නිරුවත පෙන්නූ තත්පර කිහිපයක වීඩියෝවක් පසුගියදා කරළියට ආවේය. ඒ පසුගිය මාර්තු 29 වැනිදා පෙරවරුවේ සිදුවූ පොලිස් නිලධාරියෙකුගේ අමානුෂික පහරදීමක් පිළිබඳ වූ පුවතකි. සමාජ මාධ්‍ය ඇතුළු විද්‍යුත් නාළිකාවන්හි 'තලු' මරමින් ප්‍රචාරය වූ ඉන් සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවටම අත්වූයේ නින්දා සහගත අවමානයකි. එම වීඩියෝව පිළිබඳව බොහෝ දෙනා උනන්දු වෙද්දී පොලිස් දෙපාර්තමේන්තුවද වහා සොයා බැලුවේ ඊට අදාළ නිලධාරියා කුමන පොලිසියකට අනුයුක්ත නිලධාරියෙක්ද යන්න හඳුනා ගැනීමටයි. ඒ අනුව වාර්තා වූයේ එම නිලධාරියා මහරගම පොලිසියේ රථවාහන අංශයට අනුයුක්ත පොලිස් කොස්තාපල් 50855 ඉස්මයිල් රීෆයිඩීන් නමැති වසර 29ක පමණ පොලිස් සේවයකට හිමිකම් කියන නිලධාරියෙක් බවයි.**

පසුගිය 29 වැනිදා සඳුදා දින පෙරවරුවේ කොළඹ නගරය සහ අවට මාර්ගයන්හි අධික තදබදයක් හටගෙන තිබුණේ කොරෝනා වසංගතය නිසාවෙන් මාස හයක පමණ කාලයක් වසා දමා තිබූ බස්නාහිර පළාතේ පාසල් පද්ධතියද පූර්ණ ලෙස විවෘත වීමත් සමගිනි.

හයිලෙවල් මාර්ගයේ පන්නිපිටිය ගුවන්

## ● මහමග ගිය කාරයක ස්වයංක්‍රීය කැමරාවකින් සියල්ල පටිගත වෙලා...

පාලමට ආසන්න මංසන්ධියේ 29 වැනිදා පෙරවරු අටට පමණ මහරගම පොලිසියේ රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මෛත්‍රීපාල ඇතුළු කණ්ඩායමක් රථ වාහන හසුරුවමින් රාජකාරියේ යෙදී සිටියහ.

එම අවස්ථාවේ මාර්ගය මධ්‍යයේ පිහිටි මාර්ගය දෙපසට වෙන්කර තීරුවේ සැරිසරමින් දෙපස රථවාහන හසුරුවමින් මහරගම රථවාහන අංශ ස්ථානාධිපතිවරයා වෙහෙසකර රාජකාරියක නිරතව සිටියේය. ඒ අවස්ථාවේ කොළඹ දෙසට ධාවනය වූ 'බට්ටා' වර්ගයේ කුඩා ලොරි රථයක් පැවැති අධික රථවාහන තදබදයද නොතකා ධාවනයකර තිබුණේ විදුලි වේගයෙනි.

එලෙස ඇදුණු රථය මාර්ගය මධ්‍ය තීරුවේ රාජකාරියේ නිරතව සිටි මහරගම රථවාහන ස්ථානාධිපතිවරයාද හප්පාගෙන යන ආකාරය කිසියම් කැමරා කාචයකද මනාව සටහන්ව තිබී සමාජ මාධ්‍ය ඔස්සෙ කරළියටද ආවේය.

එම අනතුරත් සමග ඊට මඳක් වන්නට රාජකාරියේ නිරතව සිටි මහරගම පොලිසියේ රථවාහන අංශයට අනුයුක්ත පොලිස් කොස්තාපල් ඉස්මයිල් රීෆයිඩීන් සැණින් එම ස්ථානයට පැමිණ සිය අංශ ප්‍රධානියා හප්පාගෙන රිය ධාවනය කළ රියැදුරු සමග වූ බහින්බස් වීම කෙළවර වී තිබුණේ එම රියැදුරාට කොස්තාපල්වරයාගෙන් 'රෙස්ලින්' ක්‍රීඩාවේ පහරවල් කිහිපයක සංග්‍රහයකිනි.

බිම ඇද වැටෙන්නට පහර කෑ රියැදුරාගේ සිරුරට පනිමින් පොලිස් කොස්තාපල් සහ තවත් පුද්ගලයෙක්ද රියැදුරාට පහර දෙන ආකාරය කිසියම් පුද්ගලයකු වීඩියෝගතකොට එසැණින් සමාජ මාධ්‍යයට මුදාහැර තිබුණේ සිදුවීම වී විනාඩි කීපයක් ඇතුළතයි. නිල ඇඳුමින් සැරසුණු පොලිස් කොස්තාපල්වරයාගේ එම අමානුෂික පහරදීම පිළිබඳව



පොලිස් කොස්තාපල් බිම වැටුණු රියදුරුට අමානුෂික ලෙස පහර දුන් ආකාරය

එසැණින් රටේ මහත් ආන්දෝලනයක් ඇතිවූයේ පොලිස් දෙපාර්තමේන්තුවටම මහත් කළු පැල්ලමක් එක්කරලමිනි.

## ● රථවාහන OIC හැප්පූ තරහට ලොරි රියදුරාට තිරිසන් ලෙස පහර දෙයි...





රියැදුරුට පහර දුන් පොලිස් කොස්තාපල් 50855 රීෆයිඩීන් නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ සිට බන්ධනාගාර නිලධාරීහු රැගෙන ගිය අයුරු.

රටේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් මහජනයාට නිදහස් නිවහල් දේශයක සාමකාමීව ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම පොලිස් දෙපාර්තමේන්තුව සතු පරම වගකීම වේ. එම වගකීම යථාර්ථයක් කරනු වස් මෙරට තුළ රාජකාරියෙහි නිරත අසූපන් දහසකට ආසන්න පොලිස් නිලධාරින් රටපුරා විසිරී තිබෙන පොලිස් ස්ථාන 494ක සහ පොලිස් කොට්ඨාස 44කට අනුයුක්තව 24 පැයේම රාජකාරියට කැපව සිටී.



**‘කුමන තරාතිරමක පුද්ගලයකු වුවත් අපරාධ චෝදනාවකට ලක්ව හෝ අත්අඩංගුවට පත්වූ මොහොතක එකී තැනැත්තාට පොලිසියෙන් ක්‍රෑර ලෙස නැතිනම් අමානුෂික ලෙස සැලකීම නීතියෙන් සහ ව්‍යවස්ථාවෙන්ම පටහැනි ක්‍රියාවක්’**

**අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා**

රාජකාරියේ නිරත අතිශය සුළුතරයක් පොලිස් නිලධාරීන් නිසා මෙරට පොලිස් දෙපාර්තමේන්තුවට සිදුව ඇති අවමානයනම් වර්තමානය වන විට සුළුපටු නොවේ.

එලෙස සමාජ මාධ්‍යයේ සැරිසැරූ පොලිස් කොස්තාපල්වරයකු පුද්ගලයකුට පහර දෙන ආකාරය දිස්වන එම වීඩියෝව පිළිබඳව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණද ප්‍රකාශයක් කරමින් කීවේ,

"තමන්ගේ ස්ථානාධිපතිවරයා රාජකාරි අවස්ථාවේ අවිනීත රියැදුරෙක් විසින් යටකර යෑම නිසා මනුෂ්‍යයෙක් ලෙස පොලිස් නිලධාරියකුට ආවේග විය හැකියි. එහෙත් වෘත්තිය නිලධාරියෙක් ලෙස කටයුතු කිරීමේදී එලෙස මහජනයාට පහරදීම් සිදුකළ නොහැකියි. මෙවැනි සිදුවීම් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව කිසිසේත්ම අනුමත කරන්නෙ නෑ. යම් පුද්ගලයෙක් වරදක් සිදුකර තිබේ නම් ඊට කටයුතු කළ යුතු නීත්‍යානුකූල ක්‍රමවේදයක් තියෙනවා. එම නිසා මෙකී පොලිස් කොස්තාපල්වරයාට එරෙහිව අපරාධ නීතිය යටතේත් පොලිස් විනය සංග්‍රහය යටතේත් කටයුතු කරනවා."

## ● රීෆයිඩීන් රාලහාමි අප්‍රේල් 5 දක්වා රිමාන්ඩ්; රියැදුරා ශරීර ඇප මත මුදා හැරේ...

එම අමිහිරි සිදුවීම සිදුවී පැය කීපයක් ගතවීමටත් මත්තෙන් පොලිසිය බාර අමාත්‍යවරයා ලෙස මහජන ආරක්ෂාව බාර අමාත්‍ය සරත් වීරසේකර, පොලිස්පතිවරයාට දන්වා තිබුණේ එම නිලධාරියාගේ සේවය අත්හිටුවන ලෙසයි. එසේම අමාත්‍යවරයා කීවේ, "කිසිම විටෙක සාමාන්‍ය පුද්ගලයකුට පහර දීමට පොලිස් නිලධාරියකුට අයිතියක් නෑ. ඒත් අපි

## ● පහරදුන් ඉස්මයිල් රීෆයිඩීන් (50855) රාලහාමිගේ වැඩ තහනම්...

දන්නවා පොලිස් නිලධාරින්ද අතිශය මානසික පීඩනයක රාජකාරි කරන්නෙ. මේ මාස තුන වන විට අපගේ පොලිස් නිලධාරින් 72ක් රිය අනතුරුවලට ලක්වෙලා තියෙනවා. ඉන් 18 දෙනෙක් මියගිහින්. ගිය වසරේ පොලිස් නිලධාරින් 293 දෙනෙක් රථවාහන රාජකාරියේ යෙදී සිටියදී අනතුරුවලට ලක්වෙලා. එම පිරිසෙන් 28 දෙනෙක්ම මියගිහින්. ඒ කුමක් වුවත් පොලිස් නිලධාරින්ට මහජනයා තාඩන-පීඩනයට ලක්වන ආකාරයෙන් හැසිරිය නොහැකියි. ඒ නිසා අපි මේ සිදුවීමට පාදක නිලධාරියාට එරෙහිවත් පියවර රැසක්ම ගත්තා. මුලින්ම සේවය අත්හිටෙව්වා; අනතුරුව අත්අඩංගුවට ගත්තා."

නොහික්මුණු රියැදුරා නිසාවෙන් අනතුරට පත් පොලිස් පරීක්ෂක මෛත්‍රීපාල කළුබෝවිල රෝහලට ඇතුළත්කොට ප්‍රතිකාර ලබද්දී පොලිස් කොස්තාපල්ගේ පහර කෑමට ලක්වූ රියදුරු තලෙයි මගන් ප්‍රවීන්ද කළුබෝවිලට ඇතුළත්කර තිබුණේ නිලධාරියාගේ පහර දීමෙන් වූ තුවාල නිසාවෙනි.

අනතුරුව මහජන ආරක්ෂාව පිළිබඳව අමාත්‍ය සරත් වීරසේකරගේ දැනුම් දීම මත පොලිස්පතිවරයාගේ උපදෙස් මත බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ගේ නියෝග මත පොලිස් කොස්තාපල්වරයාගේ සේවය අත්හිටුවමින් ඒ පිළිබඳ පොලිස් මූලස්ථානය විශේෂ පොලිස් කණ්ඩායමක් පත්කරමින් පුළුල් විමර්ශනයක් ආරම්භ කෙරිණි. එම විශේෂ පොලිස් කණ්ඩායමේ විමර්ශනයෙන් මහරගම රථවාහන ස්ථානාධිපතිවරයා අනතුරට ලක්කළ බදුල්ල ප්‍රදේශයේ අයෙක් වන 24 හැවිරිදි තලෙයි මගන් ප්‍රවීන් නමැත්තා 29 වැනිදා පස්වරුවේ මහරගම පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුණේ කළුබෝවිල රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදියි.

රියැදුරාට පහර දුන් පොලිස් කොස්තාපල්වරයාද 30 වැනිදා පෙරවරුවේ අත්අඩංගුවට ගැනුණේ අපරාධ නීතිය යටතේයි.

මහරගම පොලිස් නිලධාරින්ගේ අත්අඩංගුවට පත් පොලිස් කොස්තාපල්වරයා සහ රියැදුරා 30 වැනිදා පස්වරුවේ නුගේගොඩ, ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රියැදුරු ප්‍රවීන්ට පෙර වැරදි කිසිවක් නොවූ හෙයින් රුපියල් ලක්ෂයක ශරීර ඇපයක් මත මුදාහැරුණේ රියැදුරු බලපත්‍රය තාවකාලිකව අත්හිටුවමිනි.

එසේම ඔහුට එළැඹෙන ජුනි 06 වැනිදා නැවත අධිකරණය හමුවේ පෙනී සිටින ලෙසත් නියෝග කෙරිණි.

කෙසේ හෝ රියැදුරාට අමානුෂික ලෙස පහර දුන් පොලිස් කොස්තාපල් රීෆයිඩීන් ලබන පස්වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

වසර 1866 සැප්තැම්බර් 03 වැනිදා නිල වශයෙන් ස්ථාපිත මෙරට පොලිස් දෙපාර්තමේන්තුවේ වසර 155කට ආසන්න කාලසමය ඇතුළත මෙවැනි අවමන් සහගත සිදුවීම් රැසක්ම සිදුවී තිබෙන බව ඉතිහාසය හාරා ඇවිස්සීමේදී මනාව පසක් වන සත්‍යයයි. ඒ අතර 1970 දී පේරාදෙණිය සරසවියේ සිසුවෙකුව සිටි වීරසූරිය පොලිස් වෙඩි පහරින් මරණයට පත්වීම එකල රටම කම්පාවට පත්කළ ශෝචනීය සිදුවීමකි. වීරසූරිය මෙරට ඉතිහාසයේ එලෙස මියගිය පළමු සරසවි සිසුවාද විය.

මෑතකදී පොලිසියට ගල්මුල් ප්‍රහාරවලින්ද ජනතාව සංග්‍රහ කළ සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවේම නාමයට අවමන් සහගත කළු පැල්ලමක් එක්කළ මෙවන් සිදුවීමක් වාර්තා වූයේ අඟුලාන පොලිසියෙනි.

ඒ, පසුගිය ජූලි 10 වැනිදා රාත්‍රියේ අඟුලාන ධීවරයකු වූ 39 හැවිරිදි අමිත් කරුණාරත්න නමැති සිවු දරු පියා මාර්ග ආරක්ෂාවේ යෙදී සිටි අඟුලාන පොලිසියට අනුයුක්ත නිලධාරින් දෙදෙනකුගේ පොලිස් වෙඩි පහරින් ඝාතනය වීමයි.

අඟුලාන පොලිසියෙන් වාර්තා වූ එම ශෝචනීය සිදුවීමට පෙරද අඟුලාන පොලිසියට අඟුලාන වැසියන් ගල්මුල්වලින් සංග්‍රහ කළේ 2009 අගෝස්තු මාසයේයි.

ඒ, සුළු වරදකට අඟුලාන පොලිසියේ අත්අඩංගුවට පත් අඟුලානේ තරුණයන් දෙදෙනෙක් වූ දිනේෂ් තරංග සහ ධනුෂ්ක උදයංග දෙදෙනා වෙඩි තබා ඝාතනයකොට මළසිරුරු ස්ථාන දෙකක තිබී හමු විණි. 2009 අඟුලාන ද්විත්ව ඝාතනය ලෙසින් රටේම මහත් ආන්දෝලනයක් ඇතිකළ එම සාහසික අපරාධය කළ බවට එවකට අඟුලාන පොලිස් ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කළ නිව්ටන් සහ තවත් නිලධාරින් තිදෙනෙකුට මරණ දඬුවම් නියම විණි.

පොලිසියේ ඇතැම් දෙනාගේ මෙවැනි අධම හැසිරීම් නිසා බහුතරයක් වූ පොලිස් නිලධාරින් දිවා රෑ නොතකා කරන රාජකාරියට අබමල් රේණුවකින් හෝ නිගරුවක් කිරීම කිසිවකුගේ හෝ ප්‍රයත්නය නොවිය යුතුය.

---

# තීන්ත ඉවර වුණාම පොළවේ වැවෙන පෑනක් හැදූ තාත්තයි දුවයි

● අසේල කුරුළුවංශ

**මෙරට පාසැල් ළමුන් ලක්ෂ 40 ක් පමණ සිටිති. ඔවුන් හැරුණු විට කොන්දොස්තරගේ සිට දොස්තර දක්වා වෘත්තීන් බොහොමයක නිරත වන්නෝ පෑන් පාවිච්චි කරති.භාවිතයෙන් පසු දෛනිකව මොවුන් විසින් පරිසරයට එකතු කරන ලක්ෂ ගණනක් වන පෑන් මඟින් සිදුවන පරිසර හානිය සුළුපටු නොවන්නේය.මේ පෑන් වසර සිය ගණනක් යනතුරුත් විනාශ නොවී පරිසරයේ පවතින බව විද්‍යාඥයන් තහවුරු කර තිබෙන පසුබිමක පරිසර හිතකාමී පැළවෙන පෑන පරිසරයට ආදරය කරන බොහෝ දෙනෙකුගේ අවධානය දිනාගැනීමට සමත් නිර්මාණයකි.**

මෙරටින් පළමු කොවිඩ් රෝගියා වාර්තාවීමෙන් අනතුරුව රට වසා දැමීමට රජය තීරණය කිරීමත් සමඟ නිවසට කොටුවී සිටි ක්‍රිස්ටිනාට මේ අපූරු පෑන නිර්මාණය කරන්නට සිත් පහළ වී තිබෙන්නේ රූපවාහිනියේ විකාශනයවූ ප්‍රවෘත්තියකින් අනතුරුවය.

‘අපේ රටේ රජයේ පාසැල් වල 05 පන්තියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් භාවිතයෙන් පසු ඉවත දමන පෑන් සම්බන්ධව තමයි මේ ප්‍රවෘත්තියෙන් කියවුණේ. ළමුන් 320000 ක නියැදියක් අරගෙන සිදුකළ පරීක්ෂණයකින් තහවුරු වෙලා තිබුණා දවසකට පෑන් බට කිලෝ 80 ක් විතර පරිසරයට එකතු වෙනවා කියලා. ඒ කියන්නේ මාසෙකට කිලෝ 2400 ක්. අවුරුද්දකට නම් ඒක කිලෝ 876000 ක්. රාජකාරියේදී පෑන් භාවිත කරන වෘත්තිකයන් කොච්චර නම් තියෙනවාද? මේ ඔක්කොම අය දිනකට ප්ලාස්ටික් පෑන් කොපමණ පරිසරයට එකතු කරනවාද කියන එක හිතා ගන්නත් බැහැ. පෑනේ තීන්ත ඉවර වුණාට පස්සේ තමයි ඒකෙන් පරිසරයට සිදුවන හානිය ආරම්භ වන්නේ. මම හිතුවා අපිට ඇයි මේකට පිළියමක් යොදන්න බැරි කියලා. මම මේ ගැන තාත්තට කිව්වම එයත් මේ ගැන උනන්දු වෙලා අපි පරිසර හිතකාමී පෑනක් හදන්න උත්සාහ කරමු කියලා කිව්වා‘

ක්‍රිස්ටිනා තම නිර්මාණයේ ආරම්භය සම්බන්ධව පැවසුවේ එවන් කතාවකි.

බෙන්තර ඇල්පිටියේ උපන් සුගිර්තන් කුමාරවේල් දැන් පදිංචිව සිටින්නේ මහනුවර වටපුළුවේය. ඔහුගේ එකම දියණිය ක්‍රිස්ටිනා මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන්නීය. සෙංකඩගල මහවැලි උයන විරෝදාර විදුහලින් සිප්සතර හදාරා සාමාන්‍ය පෙළ විභාගය ඒ



පරිසර හිතකාමී පෑන ක්‍රිස්ටිනා විසින් පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාට පිළිගැන්වූ අයුරු



පරිසර හිතකාමී පෑන

සමාර්ථ 08 ක් හා එක් බී සමාර්ථයක් සමඟ සමත්ව මහනුවර පුෂ්පදාන විදුහලට 2017 වසරේදී ඇතුළත්ව තිබෙන ඇය උසස් පෙළට පෙනීසිට ඇත්තේ ජෛව පද්ධති තාක්ෂණ අංශයෙනි. වෛද්‍ය ඉඳුනිල් පෙරේරා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ මහාචාර්ය සනත් අමරතුංග, ධර්මරාජ විදුහලේ උප විදුහල්පති පුබුදු බණ්ඩාරනායක හා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ පර්යේෂණ නිලධාරී එරංග ලක්මාල් යන අය මේ පරිසර හිතකාමී පැළ කළ හැකි (Eco Friendly plantable pen) පෑන නිර්මාණය කිරීමටත් පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමටත් මඟ පෙන්වීම කළා. ඇත්තටම සාමාන්‍ය

## බටේ පිටින්ම බිම සිටවූවාම ටික කලකින් බටේ දිරා ගොස් පැළ මතුවෙන්න පටන් ගන්නවා

කාබන් පෑනක් වෙනුවට මේ පෑනක් භාවිත කරනවා කියන්නේ පරිසරයට දිරාපත් නොවන ප්ලාසිටික් ග්‍රෑම් 06 ක් එකතු වීම වළක්වනවා කියන එකයි‘ ක්‍රිස්ටිනා පවසයි.

තම සිතේ උපන් සිතිවිල්ල යථාර්ථයක් බවට පත්කර ගන්නට ක්‍රිස්ටිනාට යෝධ ශක්තියක් වූයේ ඇගේ තාත්තා ය. අත්කම් නිර්මාණකරුවකු වන ඔහු පෑන් බටය 96% ක් පරිසර හිතකාමී ලෙස නිර්මාණය කරන්නට සමත්ව ඇත. එය ඇසූ පමණින් මේ පෑන 100% ක් පරිසර හිතකාමී ලෙස නිෂ්පාදනය කළ නොහැකිද යන ප්‍රශ්නය මතු වෙයි. ඒ සම්බන්ධව සුගිර්තන් මෙසේ පැවසුවේය.

‘මොන දේ කළත් ඒක සමාජගත කරන්න යනකොට මිල බලපානවා. පරිසර හිතකාමී වුණත් වැඩි මිලක් දීලා පෑනක් ගන්න ගොඩක් දෙනා කැමැති නැහැ. අද වෙළෙඳ පොළෙන් සාමාන්‍ය පෑනක් රුපියල් 20.00 ක් වගේ මුදලකට ගන්න පුළුවන්. මේ පෑන තුළට අපි එළවළු, කුළුබඩු හා මල් වර්ග වල බීජ දාලා තියෙනවා.100% ක්ම පරිසර හිතකාමී ලෙස පෑන් බටය සකස් කරන්න ගියොත් අපිට පෑනකට රුපියල් 150.00 ක් 200.00 වගේ මිලක් නියම කරන්න වෙනවා. ඒ වගේ ගානක් දීලා පෑනක් ගන්නේ සීමිත පිරිසක්. අපිට දැන් මේ පෑනක් රුපියල් 50.00 ක් වගේ මුදලකට දෙන්න පුළුවන්. අපි කිසිම යන්ත්‍රයක් භාවිත නොකර මිනිස් ශ්‍රමයෙන්ම තමයි පෑන හදන්නේ. පරිසරය රකිනවා කියන සංකල්පය පෑනේ විතරක් තිබිලා වැඩක් නැහැ. නිෂ්පාදන ක්‍රියාවලිය තුළත් ඒ සංකල්ප ආරක්ෂා වෙන්න ඕන. පෑන ඉවර වුණාම ඒක පසේ හිටවන්න ඕන. දින 10 ක් විතර යනකොට පැළ එන්න පටන් ගන්නවා. පෑනේ බඳ කොටස මාසයක් වගේ ඇතුළත දිරාපත් වන නිසා පැළ ඒ තුළම වැඩෙන්න හරින්න පුළුවන්. අපි මේ සියල්ල පිළිබඳව පරීක්ෂණ කරලා අවසන් වුණාම තමයි පෑන රටට හඳුන්වා දුන්නේ. මේ වැඩේට දුවගේ යාළුවෝ පිරිසකුත් එකතු වෙලා ඉන්නවා. අපිට දැන් දවසකට පෑන් 400 ක් විතර නිෂ්පාදනය කරන්න හැකියාව තිබෙනවා‘

මෙම පරිසර හිතකාමී පෑන සඳහා පේටන්ට් බලපත්‍රය සුගිර්තන් හා දියණිය ක්‍රිස්ටිනා නමින් ලබාගෙන තිබේ. තවත් නුදුරු දිනකදී මෙම පෑන ඔබට වෙළෙඳ පොළෙන් මිලදී ගැනීමට පුළුවන. මෙරට වෙරළ තීරයට එකතුවන දිරාපත් නොවන අපද්‍රව්‍යය වලින් 70 % ක්ම පැමිණෙන්නේ රට අභ්‍යන්තරයේ සිටය. දෛනිකව පරිසරයට අප විසින් දැන හෝ නොදැන කරනු ලබන විනාශයේ තරම ඉන් තේරුම් ගැනීමට පුළුවන. සුගිර්තන් හා ක්‍රිස්ටිනා පරිසරය සුරැකීමේ අරමුණින් කළ නිර්මාණයට වටිනාකමක් ලැබෙන්නේ අප ප්ලාස්ටික් පෑන ඉවත දමා මේ පෑන වැලඳ ගැනීමෙන් පමණි.

ඡායාරූප - නිහාල් ජයවර්ධන (මධ්‍යම පළාත් සමූහ)



කැනඩාවේ විදී පොත් ගුල පේරාදෙණියේ
පිටුව 22



පිටුව 23
සිංහල සිනමාවේ ස්වර්ණ ලකුණ



බාලගිරි දෝෂය අද නොවේ හෙටද?
පිටුව 24

# කළ ගුණ සැලකීමට ඉදි කළ සඳහිරු සෑය



රැස්ව සිටි ජනතාව චූඩා මාණික්‍ය වන්දනා කරමින්



ආරක්ෂක ලේකම්වරයා විසින් අටමස්ථානාධිපති හිමියන්ට නිධන් කිරීම පිණිස නිධන් වස්තු පිරි නැමූ අවස්ථාව.



හතරැස් කොටුවේදී මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමියන් හා ආරක්ෂක ලේකම්වරයා විසින් නිධන් වස්තු තැන්පත් කළ අවස්ථාව.

● තාරක වික්‍රමසේකර

**මෙරට රජ කළ සිංහල බෞද්ධ රජකු වූ අසේල රජුගෙන් රජකම පැහැරගෙන රජරට රාජධානිය කේන්ද්‍ර කරගෙන වසර 44ක් පාලනය කළ ආක්‍රමණික දෙමළ පාලකයකු ලෙස එළාර රජු හැඳින්විය හැකිය. එළාර රජු හා සටන් වැදී ඔහු පරාජයට පත් කිරීමෙන් පසු රට එක්සේසත් කිරීමෙන් ලද සතුට හැම විටම බෞද්ධ ශාසනයේ කටයුතු වෙනුවෙන් වෙන් කරන්නට දුටුගැමුණු රජතුමා කටයුතු කෙළේය. යුද ජයග්‍රහණය වෙනුවෙන් යැයි සෘජුව නොපැසුවද අහස සිඹින මහා දැගැබ් ඉදි කරන්නට රජතුමා කටයුතු කෙළේය.**

එළාරගේ පාලන සමයෙන් පසුව දීර්ඝ කාලයක් මෙරට රාජ්‍ය පාලනයෙන් මිදී වෙනම පාලන තන්ත්‍රයක පාලනයක් උතුරේ සිදුවූයේ එල්ටීටීඊ ත්‍රස්තවාදය ක්‍රියාත්මක වූ සමයේදීය. රට රැක ගැනීම වෙනුවෙන් තිස් වසරක් තිස්සේ දිවි පුදමින් රට රැක ගැන්ම පිණිස මෙරට යුද හමුදා, නාවික හමුදාව හා ගුවන් හමුදාවත් පොලිසිය හා සිවිල් ආරක්ෂක බළකායක් කටයුතු කරන ලදී.

ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයෙන් සමස්ත ශ්‍රී ලංකාවම මුදා ගැනීම 2009 වසරේ මැයි මස 19 වැනිදා සිදුවිය. ඒ මුදාගැනීම වෙනුවෙන් මෙරට ත්‍රිවිධ හමුදාවේම 29,000කට අධික පිරිසක් දිවි පුද කළහ. යුද හමුදාවේ පමණක් 20,474 මෙන්ම දිවි පුද කළ අතර අතුරුදන් පිරිස 3488කි. ගුවන් හමුදාවේ 443 දෙනකු දිවි පිදූ අතර 236 දෙනකු ආබාධිත තත්ත්වයට පත්විය. එය නාවික හමුදාවේ 1,168 කි.

මීට අමතරව පොලිසියේ සහ සිවිල් ආරක්ෂක බළකායේද දහස් ගණනක් මිය යන ලදී. ඔවුන් එදා ජීවිත පූජා නොකළානම් අප අපට ජීවත්වන්නට රටක් ඉතිරි වන්නේ නැත.

ශ්‍රී ලංකාවේ මෑත දශක ගණනාවක ඉතිහාසයේ අප මුහුණ දුන් බෙදුම්වාදී යුද්ධය වෙනුවෙන් දිවි පිදූ මෙන්ම රණක්ෂිතයට පත් රණවිරුවන් උදෙසා කළ ගුණ සැලකීමට අතීත ශ්‍රී විභූතියට හිමිකම් කියන අනුරාධපුරයේම සුවිසල් දාගැබක් ඉදි කරන්නට සැලසුම් කළේ 2010 වසරේදීමය. ඒ එවකට ජනාධිපති ධුරය දැරූ මහින්ද රාජපක්ෂ මැතිතුමා විසිනි.

ඒ අනුව 2010 වසරේ නොවැම්බර් 22 වැනිදා රණවිරුවන් උදෙසා ඉදිවන සෑයට මුල්ගල් තබන ලදී. රට වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් හා රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් කළ ගුණ සැලකීමක් ලෙස ඉදි කරන්නට යෝජිත වූ මේ සෑයට ආරම්භයේදී 'රණවිරු සෑය' යන නම යොදන්නට තීරණය කළද පසුව එය සඳහිරු සෑය යන නමින් හඳුන්වන්නට වූයේ සඳ හිරු පවතිනා තුරු විරාජමානව පවතිනු ඇතැයි යන සංකල්පයෙන් යුක්තවය. සෑය ඉදි කිරීමේදී රජයට බරක් නොවන සේ පරිත්‍යාගශීලීන්ගෙන් මෙන්ම රණවිරුවන්ගේ වැටුපෙන් ඉතා සුළු මුදලක් ලබා ගෙන එහි ඉදි කිරීම් කරන්නට යෝජනා වී තිබුණි.

එකල මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ආරක්ෂක ලේකම්ව සිටි වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෘජු මෙහෙයවීම මත එවකට යුද හමුදාපතිව සිටි ලුතිනන් ජෙනරාල් දයා රත්නායකගේ අධීක්ෂණය යටතේ යුද හමුදාවේ 4 වැනි ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ නිලධාරීහු මෙම සඳහිරු සෑය ඉදි කිරීම ආරම්භ කළහ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවේ සහාය ඇතිව එහි ඉදි කිරීම් සිදු කෙරුණේ ශ්‍රී ලාංකික ඉංජිනේරු තාක්ෂණයට අනුරූපවය.

ඒ අනුව මෙරට විශාලත්වයෙන් හතරවැනි චෛත්‍යය ලෙස අනුරාධපුරයේ මහ මෙවුනා උයනට අයත් භූමි භාගයක සෑයේ ඉදි කිරීම් ආරම්භ කෙරුණි. 2014 වසරේ නොවැම්බර් 23 වැනිදා සෑයේ ගර්භයේ ධාතු නිධන් කිරීමද සිදු කෙරුණු අතර ඒ වෙනුවෙන් කිලෝ 8ක දඹ රන්පිළිමයක් නිධන් කරන ලදී.

රත්රන් වලින් නිම කළ බුදු පිළිමයට අමතරව රත්රන්වලින් සැකසූ බෝධින් වහන්සේ නමක්, රන් පත් ඉරුවල ලියන ලද ත්‍රිපිටකය ද මෙහි තැන්පත් කෙරිණි. ඊට අමතරව බාහිර අය ලබාදුන් රිදී, මුතු, මැණික් ද මෙහි තැන්පත් කෙරිණි. සඳහිරු සෑයේ උස අඩි 282 අඟල් 6ක් වන අතර එයට වඩා උසින් වැඩි වන්නේ රුවන්වැලි මහා සෑය, අභයගිරිය හා ජේතවනාරාමයට පමණක් වීමද විශේෂත්වයකි. සෑයේ විෂ්කම්භය අඩි 255 ක් වන අතර වට ප්‍රමාණය අඩි 801කි. සඳහිරුසෑය ඉදිවන සම්පූර්ණ භූමිය අක්කර 13ක් වන අතර වැලි මළුව අක්කර 6ක් රූඩ් එකක් හා පර්චස් 30 ක් භූමි භාගයකට අයත් වේ. සලපතළ මළුවට අක්කර 4 ක් හා රූඩ් 2 ක් අයත් වන අතර චෛත්‍යය ආවරණය වන භූමි ප්‍රමාණය අක්කරයක් හා පර්චස් 20 කි. බුබ්බුලාකාර හැඩයෙන් ඉදිවන සඳහිරු සෑය ඉදිකිරීමට පාදම සකස් කිරීම නවීන තාක්ෂණය අනුව සිදුකරන්නට ඉදි කිරීම් කටයුතු කරන යුද හමුදා ඉංජිනේරු අංශය විසින් කටයුතු කරන ලදී. 'සඳහිරු පවතින තුරු පවතින්නට යෝජිත සෑයේ අත්තිවාරම පොළොව මට්ටමේ සිට අඩි 45 ක් යටට කළුගල් ස්ථරය හමුවන තෙක් යොදා ඇත. ඒ කිසිදු කම්පනයකින් ගිලා නොබසිනා ලෙසින් ඉදි කළ යුතු හෙයිනි.

## ● රජ කාලයෙන් පසු ඉදිවන විශාලතම දාගැබ

මේ සෑය ඉදි කරන්නට වැලි කළුගල් ඇතුළු පහසුකම් සපයා දෙන්නට ගුවන් හමුදාවත් නාවික හමුදාවත් සහාය ලබා දී ඇතත් වැඩි දායකත්වයක් දරන්නේ යුද හමුදාව විසිනි. මේ වන විට සෑයේ ඉදි කිරීම් හතරැස් කොටුව දක්වා ඉදි කර අවසාන් වී ඇත. පසුගිය මැදින් පුන් පොහෝ දින එහි හතරැස් කොටුවේ ධාතු නිධානෝත්සවය පැවැත්වුණේ ගිහි පැවිදි විශාල පිරිසකගේ සහභාගීත්වයෙනි. මැදින් පුන් පොහෝ දිනය වුවද විහාරස්ථානයන්හි වැඩ කටයුතු සියල්ල මධ්‍යයේ මහා සංඝරත්නය සිය ගණනක් වැඩම කර සිටියහ.

ධාතු නිධානෝත්සවයට පෙර සෑයේ පලඳවන්නට යෝජිත චූඩා මාණික්‍යය අලංකාර පෙරහරින් වැඩම කරවන ලද්දේ බෞද්ධ ධජ සේසත් හා අලංකාර නර්තන මධ්‍යයේය. චූඩා මාණික්‍යය පරිත්‍යාග කරමින් පුණ්‍ය කර්මයට දායක වූයේ ව්‍යාපාරික ආතර් සේනානායකයන්ය විසිනි.

චූඩා මාණික්‍යය වැඩම කිරීමෙන් පසු එය භික්ෂූන් වහන්සේ ඇතුළු ප්‍රභූවරුන්ගේත් ජනමාධ්‍යවේදීන්ගේ වන්දනාවට පත් විය.

ඉන් පසුව ආගමික උත්සවයේ වැඩ කටයුතු ආරම්භ වූ අතර රැස්ව සිටි ගිහි පිරිස පංචශීලයේ පිහිටුවා ආගමික වතාවත් ආරම්භ කරනු ලැබුවේ සෝමාවතී රජමහා විහාරාධිපති ආචාර්ය පහමුණේ සුමංගල නා හිමියන් විසිනි.

මේ අවස්ථාවට අටමස්ථානාධිපති ආචාර්ය පල්ලේගම සිරිනිවාස නා හිමි, රුවන්වැලි මහ සෑ විහාරාධිකාරී පල්ලේගම හේමරතන නා හිමි ඇතුළු මහා සංඝරත්නය විශාල පිරිසක් සහභාගි වී සිටියහ. එමෙන්ම උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, ඉඩම් අමාත්‍ය එස්. එම්. චන්ද්‍රසේන, රාජ්‍ය අමාත්‍යවරුන් වන මහාචාර්ය චන්න ජයසුමන, ෂෙහාන් සේමසිංහ ඇතුළු මැති ඇමැතිවරුද ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ, යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජනරාල් සෙනරත් බණ්ඩාර, පොලිස්පති චන්දන වික්‍රමරත්න, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, මේජර් ජෙනරාල් නන්දන සේනාධීර ඇතුළු ත්‍රිවිධ හමුදාවේ විශාල පිරිසක් සහභාගි වූහ.

පළාත් 9ම ආවරණය වන පරිදි මෙවන් සෑ රඳුන් ඉදි කිරීම කළ යුතු බව අනුශාසනාවේදී ලංකාරාමාධිකාරී රළපනාවේ ධම්මජෝති හිමියෝ පැවසූහ.

ආරක්ෂක ලේකම්වරයා මෙහිදී අදහස් දක්වමින් පවසා සිටියේ රට ජාතිය රැකගත් රණවිරුවන් වෙනුවෙන් ඉදි කළ මේ මහා සෑය 'කළගුණ සෑය' නමින් හැඳින්වුවද එහි වරදක් නොවන බව ය. එමෙන්ම පසුගිය පුන් පොහෝ දිනට පෙර දින පැමිණි බෞද්ධ උපාසක උපාසිකාවන් තම ගෙල පැලඳි රන් මාල මඟුල් මුද්ද කනේ පැලඳි කරාබු පවා ස්තූපයේ තැන්පත් කිරීමට ලබා දුන් බව ද ඔහු පැවසුවේය.

උත්සව සභාවෙන් පසුව මහා සංඝයා වහන්සේට මෙන්ම ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් හා ප්‍රභූවරුන් වෙත නිධන් වස්තු පිළි ගැන්වීම සිදු කරන ලදී.

නිධන් වස්තු පිරිනැමීමෙන් අනතුරුව භික්ෂූන් වහන්සේ සෑයේ හතරැස් කොටුව දක්වා වැඩම කළ අතර ආරක්ෂක අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසු ප්‍රභූවරුන්ද හතරැස් කොටුව දක්වා ගමන් කරන ලදී. ධාතු නිධානෝත්සවය සනිටුහන් කරමින් මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නා හිමිපාණන් වහන්සේ විසින් හතරැස් කොටුවේ නිධන් වස්තු තැන්පත් කිරීම අරඹන ලදී. සෙසු භික්ෂූන් වහන්සේද එහි නිධන් වස්තු තැන්පත් කළ අතර ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න ඇතුළු හමුදා ප්‍රධානීන් සියලු දෙනාද සෙසු ආරක්ෂක නිලධාරීන්ද නිධන් වස්තු තැන්පත් කළහ. මෙම දුර්ලභ අවස්ථාවට සහභාගි වූ මාධ්‍යවේදීන් ඇතුළු සියලු දෙනාද නිධන් වස්තු තැන්පත් කෙළේ ඉන් අනතුරුවය. මේ අවස්ථාවේදී රුපියල් කෝටි විස්සක් වටිනා මුතු මැණික් තොගයක් එහි නිධන් කිරීම උදෙසා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ලබා දීම මෑත ඉතිහාසයේ සිදු කළ විශාලතම පුණ්‍යකර්මය බවද පෙන්වා දිය හැකිය.

## ● වන්දනාකරුවෝ ගෙල බැඳි මාල, කරාබු පවා පුද කරති

හතරැස් කොටුවේ ධාතු නිධානෝත්සවය නිමවා සියලු නිධන් වස්තු ආරක්ෂිතව තැන්පත් කර නිමවන තුරු ආරක්ෂක ලේකම්වරයා එහි රැඳී සිටියේය.

මහා සංඝයා වහන්සේ හා විශේෂ ආරාධිතයන් හතරැස් කොටුවෙන් නික්ම ගිය පසුව පැමිණ සිටි දහස් සංඛ්‍යාවක් වූ බෞද්ධ ජනතාවෝ හතරැස් කොටුව දක්වා ගොස් තම තමන් ගෙනා නිධන් වස්තු තැන්පත් කළහ. සිල් සමාදන්ව සිටි උවැසි උවැසියෝද ඒ අතර වූහ. එසේම චූඩා මාණික්‍යද ඒ සියලු පිරිස් හට වන්දනාව පිණිස අවස්ථාව ලබා දී තිබුණි.

'සඳහිරුසෑය' යන්නෙහි තේරුම 'සඳමෙන් සෞම්‍ය හා හිරු මෙන් තේජස් බවින් යුක්ත රජුන්' යන්න බව පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමියෝ පෙන්වා දෙති. එමෙන්ම මේ පිළිබඳව කරුණු දක්වමින් හිටපු පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායකයන් පවසා තිබුණේ මෙම ඉදිකිරීම අවුරුදු දහසකට වඩා වැඩි කාලයකට පසු ලෝකයේ රටවල් ඇතුළත සිදු කෙරෙන ඓතිහාසික ඉදිකිරීමක් බවයි. ලෝකයේ රටවල සුවිසල් චෛත්‍ය ඉදිවුවත් සඳහිරු සෑය තරම් විශාලත්වයෙන් යුත් සර්වඥ ධාතූන් නිධන් කරන පාදමේ සිට ඉදිකරන චෛත්‍යයක් වසර 1600 කින් මෙපිට මෙරට ඉදිවී නැති බව පුරාවිද්‍යාඥයෝ පවසති. ඒ අනුව 21 වැනි සියවසේ ලෝකයේ ඉදිකෙරෙන විශාලතම හා සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කෙරෙන එකම දාගැබ මේ සඳහිරු සෑය වනු ඇත.



යුද හමුදාව පවසන්නේ සඳහිරු සෑය ඉදි කිරීම පිණිස ඒ සඳහා විශේෂ වූ ස්තූප ගඩොල් ලක්ෂ 310ක් අවශ්‍ය වන බවයි. මේ වන විට එහි ඉදිකිරීම් කටයුතු රැසක් අවසන්ව ඇති හෙයින් ඉදිරි කටයුතු කඩිනමින් සිදු කෙරෙනු ඇත. එසේම සඳහිරු සෑයට යොදා ගනු ලබන ගඩොල් සුවිශේෂී ස්තූප ගඩොල් විශේෂයකි. එම ගඩොලක් දිගින් අඟල් 16 ක් වන අතර පළලින් අඟල් 8 කි. එහි උස අඟල් 2 කි.

මෙම සුවිශේෂී ස්තූප ගඩොල් සියලු ආරක්ෂක හමුදාවල සහාය ඇතිව අනුරාධපුර ඇලයාපත්තුව, බිංගිරිය, මහියංගනය, ගල්කඩවල, ඇඹිලිපිටිය, අම්පාර වැනි ප්‍රදේශවල විශේෂ උළු කර්මාන්ත ශාලාවලින් නිපදවනු ලැබේ.

සඳහිරු සෑයේ තවත් විශේෂත්වයක් වනුයේ අනුරාධපුර විශාලතම ශෛලමය කලාගාරයක් ද මෙම දාගැබ් පරිශ්‍රයේ ඉදිකිරීමයි. සෑයේ සලපතළ මළුව හා වැලි මළුව අතර, ප්‍රාකාරයේ සතර දෙසට අඩි 400 බැගින් වූ ප්‍රදේශයේ ගලින් නෙළන ලද බෞද්ධ කැටයම්, දස පාරමිතා බුදු දහමේ විකාශය, ශාසන ඉතිහාසය මෙන් ම යුද්ධය අවසන් කිරීම දක්වා විවිධ අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු යොදා ඇත.

ආරම්භක ව්‍යාපෘතිය අනුව සඳහිරු සෑයේ සියලු වැඩ කටයුතු 2016 වසරේදී අවසන් කිරීමට යෝජිත වුවත් 'යහපාලන' රජය එහි ඉදිකිරීම් ප්‍රමාද කර දැමීම නිසා එහි ඉදිකිරීම් අතරමග ඇණ හිටින ලදී.

සඳහිරු සෑයේ ශ්‍රම දායකත්වයට හෝ වෙනත් සහාය ලබා දීම් වෙනුවෙන් දායකත්වය සැපයීමට ඕනෑම සංවිධානයකට හෝ පුද්ගලයන්ට අවස්ථාව තිබේ. මූල්‍ය ආධාර ද ලබා දිය හැකිය. ඒ සම්බන්ධ වැඩි විස්තර 0252056057 යන දුරකථන අංකය අමතා දැන ගත හැකිය.

දුටුගැමුණු රජුගෙන් පසුව මෙරට වංශකතාවන්ගේ ලියැවෙන පරිදි අධිරාජ්‍යවාදීන් හා ගැටෙමින් වීරපුරන්අප්පු ගොන්ගාලේගොඩ බණ්ඩා ඇතුළු විරුවන් සිදුකළ මෙහෙයටත් වඩා මෙහෙයක් තිස් වසරක යුද්ධය වෙනුවෙන් දිවිපුදමින් සටන් වැදුණු රණවිරුවන් විසින් සිදු කළ අප අමතක නොකළ යුතුය.

එමෙන්ම තවමත් රෝද පුටුවලට වී මෙන්ම කිහිළිකරුවෙන් පවා ජීවිතය ගැට ගසා ගන්නා අයද වෙති. එමෙන්ම රාගම රණවිරු සෙවණ හා අභිමංසල ඇතුළු රණවිරු රැකවරණ මධ්‍යස්ථානවල සමස්ත ජීවිත කාලයම ඇඳක් මතට වී දිවි ගෙවනා රණවිරුවෝද අප රටේ වෙති. යුද්ධය නිසා එසේ රණක්ෂිතයට පත් වූ රණවිරුවන් සංඛ්‍යාව තිස් දහසකට අධිකය. ඔවුන් වෙනුවෙන් කළ ගුණ සැලකීම පිණිස ඉදි කළ 'සඳහිරු සෑය' සඳහිරු පවතිනා තුරු තිබේවා යන්න අපගේද පැතුම විය යුතු වන්නේ රජ කාලයෙන් පසුව ඉදි කළ විශාලතම ස්තූපය 'සඳහිරු සෑය' වන හෙයිනි.

සේයාරූ- සුලෝචන ගමගේ

### සඳහිරු සෑයට යන්න පාර මෙන්න

**දුම්රියෙන් යන්නේ නම් අනුරාධපුරය ප්‍රධාන දුම්රිය ස්ථානයෙන් බැස තන්තිරිමලේ, විලච්චිය, මහා මාන්කඩවල බස් රථයෙන් කිලෝමීටර් 2.8ක දුරක් ගෙවා සඳහිරුසෑය වෙත යා හැකිය.**

**කොළඹ සිට අලුයම 5.45 (නගරාන්තර ශීඝ්‍රගාමී) පෙරවරු 6.35 (යාල්දේවී) පෙ.ව. 8.50 (අර්ධ ශීඝ්‍රගාමී - මේ දිනවල ධාවනය නොවේ) පෙ.ව. 11.50 (උත්තර දේවී නගරාන්තර ශීඝ්‍රගාමී) පස්වරු 1.15 (රජරට රැජිණ) පස්වරු 3.55 (ශ්‍රී දේවී - නගරාන්තර ශීඝ්‍රගාමී) රාත්‍රී 7.15 (තලෛයි මන්නාරම රාත්‍රී ශීඝ්‍රගාමී) රාත්‍රී 9.00 (කන්කසන්තුරේ රාත්‍රී තැපැල්) දුම්රියයන්ගෙන් අනුරාධපුරය දක්වා ගමන් කළ හැකිය.**

**පැමිණීමේ දුම්රියයන් අලුයම 12.10 පෙරවරු 5.05 පෙරවරු 6.45 (ශ්‍රී දේවී - නගරාන්තර ශීඝ්‍රගාමී) පෙ.ව. 9.15 (නගරාන්තර ශීඝ්‍රගාමී) පෙරවරු 10.50 (අර්ධ ශීඝ්‍රගාමී - මේ දිනවල ධාවනය නොවේ) පස්වරු 2.00 (යාල්දේවී) පස්වරු 5.00 (නගරාන්තර ශීඝ්‍රගාමී) රාත්‍රී 11.30**

**කොළඹ සිට බස් රථයෙන් ගමන් කරන්නේ නම් අනුරාධපුරය පැරැණි බස් නැවතුම්පොළින් බැස ඉහත බස් රථවලින් ගමන් කළ හැකිය.**

**පෞද්ගලික වාහනයකින් යන්නේ නම් ඉසුරුමුණියට ආසන්න මාර්ගයෙන් දකුණට හැරී පහසුවෙන් සඳහිරු සෑයට ගමන් කළ හැකිය.**

# International Business Magazine සම්මාන උළෙලේදී මහජන බැංකුවට සම්මාන

මහජන බැංකුව, 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ 'විශිෂ්ටතම ඩිජිටල් බැංකුව' වශයෙන් පසුගියදා **International Business Magazin** සම්මාන උළෙලේදි සම්මානයට පාත්‍රාවිය. එමෙන්ම එම සඟරාව විසින්ම මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු මහතා වෙත 'ශ්‍රී ලාංකීය බැංකුකරණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතම ප්‍රධාන විධායක නිලධාරී' යන සම්මානය පිරිනමන ලදි.

මෙම **International Business Magazin** සම්මාන උළෙලේදී ජාත්‍යන්තර ව්‍යාපාර හා මූල්‍ය ව්‍යාපාර අංශයන්හි ක්‍රියාත්මක ආයතනයන් දක්වන සුවිශේෂී දක්ෂතාවයන් ඇගයීමට ලක් කෙරේ.

2020 වර්ෂයේ දී කොවිඩ්-19 වසංගතයට මුහුණ දීමට සිදුවීමත් සමඟ ශ්‍රී ලංකාවේ බැංකුකරණ ක්ෂේත්‍රය සිය ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යාරක්ෂාව කෙරෙහි සැලකිලිමත් වෙමින් ඩිජිටල් බැංකු සේවා සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳව වඩාත් ඉහළ උනන්දුවක් දක්වන්නට විය.

මෙරට දැවැන්තම බැංකුව මහජන බැංකුව වන අතර, එය සතු අති විශාල ගනුදෙනුකාර පදනම හා ශාඛා ජාලය විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා නවෝත්පාදනීය, බලවත් හා සරල ඩිජිටල් බැංකු සේවා විසඳුම් ඔස්සේ අති සාර්ථක පිළිතුරක් ලැබෙයි.

මහජන බැංකුව විසින් හඳුන්වා දෙන ලද ඩිජිටල් බැංකු සේවා විසඳුම් කෙතරම් ඉහළ ජනප්‍රියතාවයක් හිමිකරගෙන තිබේද




යන්න තහවුරු කරගැනීම සඳහා හොඳම උදාහරණයක් ලෙස එහි මොබයිල් බැංකුකරණ යෙදවුම පෙන්වාදිය හැක.

ශ්‍රී ලාංකීය මූල්‍ය සේවා ක්ෂේත්‍රයෙහි වැඩියෙන්ම බාගත කරන ලද යෙදවුම එය වන අතර, සම්පූර්ණ බාගත කිරීම් සංඛ්‍යාත්මකව 900,000 ඉක්මවයි.

# මාතර ආසිරි සුපර් රන් සම්මාන දිනයි

මාතර පුරවරය කේන්ද්‍ර කරගනිමින් සේවා සපයන ප්‍රමුඛ පෙළේ වෙළෙඳ ජාලයක් වන ආසිරි සුපර් ආයතනය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සහ මාතර හා ගාල්ල වාණිජ මණ්ඩලවල දායකත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික් වානිජ මණ්ඩලය සංවිධානය කළ දකුණු පළාත් විශිෂ්ටතම ව්‍යවසායකයා 2020 සම්මාන උළෙලේදීම ධ්‍යම පරිමාණ කාණ්ඩයේ සේවා අංශයේ විශිෂ්ටතම ව්‍යාවසයාකයා ලෙස මාතර ආසිරි සුපර් අධිපති චමින්ද උඩගමගේ මහතා පිදුම් ලැබීය. කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් තංගල්ල ගෝල්ඩන් පර්ල් හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැති සම්මාන උළෙලේදී චමින්ද උඩගමගේ මහතා වෙත මෙම සම්මානය පිරිනමන ලදී.




මීට පෙරද විවිධ සම්මාන රැසකින් ආසිරි සුපර් ආයතනය පිදුම් ලබා ඇත.

"මාතර නගරයේ පාරිභෝගික විශ්වාසය ඉහළින්ම දිනූ ආයතනයක් වෙන්න අප වසර ගණනාවක සිට ලැබූ ව්‍යාපාර අත්දැකීම් රැසක් බලපෑවා. මෙම ව්‍යාපාරය වත්මන් තත්ත්වයට පැමිණියේ බාධක රැසක් මැද අභියෝග රැසක් ජයගෙන.

පාරිභෝගිකයන්ට විශිෂ්ට සේවයක් සැපයීම ප්‍රමුඛ අරමුණ කරගෙන කටයුතු කරන නිසා පාරිභෝගිකයන්ට අප කෙරෙහි ඇත්තේ විශාල විශ්වාසයක්.

මෙම ජයග්‍රහණයට සුවිශේෂදායකත්වයක් සැපයූ අපගේ සුපර් ආයතනය සුපිරි වෙළෙඳසැලක්, පොත් හා තෑගි භාණ්ඩ අලෙවිසැලක්, ඔසුසලක්, ගෑස්බෙදාහැරීමේ මධ්‍යස්ථානයක්, බේකරියක්, අවන්හලක්,තොග අලෙවිසැලක් හා මාතර - යටියන මඟී ප්‍රවාහන සේවාවක්ද ඇතුළු ව්‍යාපාර අංශ රැසකින් සමන්විතය. ආසිරි සුපර් තවදුරටත් විවිධ අංශ ඔස්සේ පුළුල් කිරීමටද නියමිතය.




# වසරකට රේඩියල් ටයර් ලක්ෂ 05ක් නිපදවමින් සියැට් නිෂ්පාදනය 72,000 කින් වැඩි කෙරේ

දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් විදේශ විනිමය පිරිමසා ගැනීමේ රජයේ උත්සාහය සඳහා සහයෝගය ලබාදීමට සියැට් කැලණි හෝල්ඩින්ග්ස් සමාගම සිය මෝටර් රථ ටයර් නිෂ්පාදන වාර්ෂික ධාරිතාවය 16% කින් ඉහළ නංවමින් සමාගමේ නිෂ්පාදනය පුළුල් කිරීමේ සැලසුම යටතේ වාර්ෂිකව නිෂ්පාදනය කරන මෝටර් රථ රේඩියල් (PCR/Van) ටයර් ප්‍රමාණය 72,000 කින් ඉහළ නංවා තිබේ.

මෝටර් රථ ටයර් නිෂ්පාදනය පුළුල් කිරීමේ සමාගමේ 2021 සැලසුමෙහි පළමු අදියර මේ ආකාරයෙන් ක්‍රියාත්මක කර තිබෙන අතර මේ සඳහා කැලණියේ පිහිටි සියැට් නිෂ්පාදන සංකීර්ණයේ අලුතෙන් ටයර් ප්‍රෙස් යන්ත්‍ර දෙකක් සවිකර තිබේ. මෙම නව ප්‍රෙස් යන්ත්‍ර දෙක ලංකාවේ සියැට් නිෂ්පාදන සංකීර්ණයේ සවිකර තිබෙන පළමු හයිඩ්‍රොලික් වර්ගයේ ප්‍රෙස් යන්ත්‍ර වන අතර මේ ආකාරයෙන් තාක්ෂණය ඉහළ නැංවීම නිසා සියැට් නිපදවන ටයර වල ගුණාත්මක තත්ත්වය තවත් ඉහළ නැංවීමට හැකිවනු ඇත.

මෙම පුළුල් කිරීම හේතුවෙන් සියැට් විසින් වාර්ෂිකව නිෂ්පාදනය කරන මෝටර් රථ සහ වෑන් ටයර් සංඛ්‍යාව 500,000 ක් ඉක්මවන අතර වඩාත් ප්‍රචලිත අඟල් 12 සිට අඟල් 14 ප්‍රමාණයේ ටයර් මෙම නව යන්ත්‍රවලින් නිපදවනු ලැබේ. මෙම ටයර් **Maruti 800, Suzuki Alto, Estilo, Wagon R, Omni, Swift** සහ **Liana, Mahindra Maximo, Nissan Sunny FB15, FB14, N16, March, Bluebird** සහ **AD Wagon, Toyota 110, 121, Vios,**



**Soluna, Starlet, Carina, Honda Civic, Hyundai Accent, Perodua (VIVA Elite)** සහ **Cherry QQ** රථ වලට ගැළපෙන බව සමාගම සඳහන් කරයි. මෙම ටයර් සඳහා දේශීයව ඉහළ ඉල්ලුමක් තිබෙන අතර විශේෂයෙන්ම රජය විසින් තාවකාලිකව ටයර් ආනයනය කිරීම සඳහා පනවා තිබෙන තහනම හේතුවෙන් ඉල්ලුම තවදුරටත් ඉහළ ගොස් තිබේ.

# උත්සව සමයේ පාරිභෝගික සේවා වැටලීම් දිගටම

● චන්දිමා එදිරිමාන්න

**කූට හා වංචනික වෙළෙඳුන් නිසා පාරිභෝගික ජනතාවට සිදුවිය හැකි අසාධාරණකම් වැළැක්වීම සහ ඇතිවිය හැකි ගැටලු මග හැර වීම අරමුණු කර ගනිමින් උදා වන සිංහල හා දමිළ අවුරුදු උත්සව සමය තුළ විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කටයුතු යොදා ඇත.**

උත්සව සමයේදී වට්ටම් තොග අවසන් කිරීමේ දීමනා ආදී විවිධ නම්වලින් මෙන් ම කල් ඉකුත් වූ හා භාවිතයට නුසුදුසු භාණ්ඩ රැසක් වෙළෙඳපොළට පැමිණෙන අතර, එවැනි දෑ පිළිබඳ ව දැඩි ව සොයා බලමින් නීතිය තදින් ම ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මාර්තු මස 15 වැනි දින සිට අප්‍රේල් මස 23 වැනි දින දක්වා මෙම විශේෂ වැඩපිළිවළ ක්‍රියාත්මක වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සියලු විමර්ශන නිලධාරීන් සහභාගී කර ගනිමින් දිවයිනේ සියලුම දිස්ත්‍රික්කයන්හි විමර්ශන හා වැටලීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

ඒ අනුව සෑම දිස්ත්‍රික්කයකම ඇති ප්‍රධාන තොග අලෙවිසල් හා ගබඩා පරීක්ෂා කිරීම ද සහිතව වැටලීම් සිදු කෙරෙන අතර එලෙස තොග ගබඩා සහ නිෂ්පාදනාගාර පරීක්ෂා කිරීම මගින් කල් ඉකුත් වූ හා තොරතුරු වෙනස් කරන ලද යම් යම් භාණ්ඩ වෙළෙඳපොළට පැමිණීම වැළැක්වීමට බලාපොරොත්තු වේ.

තවද සිල්ලර වෙළෙඳසල් වැටලීම් සඳහා ද විමර්ශන නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර, උත්සව සමයේ පාරිභෝගිකයන් වැඩි වශයෙන් මිලදී ගැනීම් සිදු කරන ඇඳුම් පැළඳුම්, රසකැවිලි, කුළු බඩු, විදුලි උපකරණ හා අනෙකුත් භාණ්ඩ හා සේවාවන්හි ප්‍රමිතිය හා ගුණාත්මකභාවය පිළිබඳව දැඩි ලෙස සැලකිලිමත් ව සිය විමර්ශන කටයුතු සිදු කරන ලෙසටද උපදෙස් ලබා දී ඇත.

උත්සව සමයට සමගාමීව ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැලඳුම්, ගෘහ උපකරණ, විදුලි උපකරණ වැනි භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා පාරිභෝගික ජනතාව වැඩි වශයෙන් පෙළඹෙන අතර ලාභය පමණක් පරමාර්ථ කරගත් අවස්ථාවාදී, කූට, වංචනික, වෙළෙඳුන් විවිධ උපක්‍රම භාවිත කර එකී පාරිභෝගික ජනතාව සූරාකෑමට ලක් කරන බව අවස්ථා ගණනාවකදීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් නිරීක්ෂණය කර තිබේ.

ජංගම වෙළෙඳුන් සහ සේල් වැනි වෙළෙඳ ක්‍රියාකාරකම් සම්බන්ධව ද විශේෂ අධීක්ෂණයක් සිදු කෙරෙන අතර, අත්‍යවශ්‍ය භාණ්ඩ සඟවා තැබීම, භාණ්ඩ හිඟයක් ඇතිවීම වැළැක්වීම ආදී දෑ සම්බන්ධව ද මේ වැඩපිළිවෙළ තුළ ප්‍රමුඛත්වයක් දක්වා ඇත.



පාරිභෝගික අධිකාරියේ නිලධාරීන් වැටලීමකදී වෙළෙඳසලක ආහාර ද්‍රව්‍ය පරීක්ෂාකරමින්



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පාරිභෝගික කටයුතු හා තොරතුරු අධ්‍යක්ෂ අසේල බණ්ඩාර

අදාළ භාණ්ඩ හා සේවා නියමිත මිලට වෙළෙඳසල් තුළ විකිණීම සිදුවෙන්නේ දැයි යන්න පිළිබඳව මෙහිදී විමර්ශන සිදු කෙරේ.

තවද භාණ්ඩ මිල සඳහන් කර ප්‍රදර්ශනය කර විකිණීමෙන් පාරිභෝගික අයිතීන් වඩ වඩාත් සුරක්ෂිත කිරීමටත් එලෙස මිල ප්‍රදර්ශනය නොකර එකී භාණ්ඩ හා සේවා අලෙවි කරනු ලබන වෙළෙඳසල් සඳහා නීතිය තදින් ම ක්‍රියාත්මක කිරීමටත්, විශේෂ අවධානයක් යොමු ව තිබේ. ඇත.

එම භාණ්ඩ හා සේවා පාරිභෝගික ජනතාව වෙත සැපයීමේදී විධිමත් බිල්පත් නිකුත් කිරීම මගින් විධිමත් වෙළෙඳාමක් සිදුවන බවට විමසිලිමත් වීම හා ඒ හා සම්බන්ධ වැටලීම් සිදු කිරීම ද අධිකාරියේ විමර්ශන නිලධාරීන් මඟින් සිදු කෙරෙන අතර පාරිභෝගිකයන් නොමඟ යවන සුලු වෙළෙඳ ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා ද අවධානයක් යොමු කර තිබේ.

මේ අතර මෙවැනි උත්සව සමයන්හිදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නම භාවිත කරමින් එහි විමර්ශන නිලධාරීන් ලෙස පෙනී සිටින ඇතැම් කූට ජාවාරම්කරුවන් හා කණ්ඩායම් සුලබ වන බැවින් එවැනි වංචා වලට හසු නොවන ලෙස සමස්ත වෙළෙඳ ප්‍රජාවම දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ද දැන් ආරම්භ වී තිබේ. මේ අතර විශේෂ දැනුම් දීමක් සිදු කරමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ එළඹෙන උත්සව සමය තුළ විවිධ වර්ගයේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳ වෙළෙඳපොළ අධ්‍යයනයක් සිදුකර හොඳ අවබෝධයකින් යුතුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කරන ලෙසයි.

උත්සව සමයේ සිදුවන වෙළඳ විෂමාචාරයන් සම්බන්ධයෙන් වන පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 1977 ක්ෂණික දුරකතන ඇමතුම් අංකයට ඇමතුම් ලබා දෙන ලෙසද එම අධිකාරිය පාරිභෝගික ජනතාවගෙන් ඉල්ලා සිටියි.

මෙම විශේෂ විමර්ෂණ හා වැටලීම් පිළිබඳව සිළුමිණ සමඟ අදහස් දැක්වූ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පාරිභෝගික කටයුතු හා තොරතුරු අධ්‍යක්ෂ අසේල බණ්ඩාර සඳහන් කර සිටියේ වෙළෙඳපොළ ගනුදෙනු සඳහා පාරිභෝගික ජනතාවට වඩා යහපත් පරිසරයක් ඇති කිරීමේ අරමුණින් පසුගිය උත්සව සමයන්හීදීද මෙම විමර්ශන හා වැටලීම් ඉතා සාර්ථක ලෙස සිදු කෙරුණ බවයි.

2020 වසරේ සිංහල හා දමිළ අලුත් අවුරුදු සමය තුළදීද වැටලීම් 15923ක් සිදු කෙරුණු බවත් එහිදී නඩු පැවරීම් 14906 ක් සිදු කර රුපියල් ලක්ෂ 654 ක් දඩ මුදල් ලෙස අය කර ගත් බවත් සඳහන් කළ අසේල බණ්ඩාර සහල්, සීනි, පරිප්පු, ටින් මාළු, එළවළු, පලතුරු, කේක් හා රස කැවිලි, කුළු බඩු, පාම් ඔයිල්, බී ලූනු, රටඉඳි, මුහුණු ආවරණ, රූපලාවණ්‍ය ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම්, ගෘහ උපකරණ, විදුලි උපකරණ ආදී වෙළෙඳ කටයුතු සම්බන්ධව මෙම විමර්ශන, වැටලීම් හා නඩු පැවරීම් සිදු වුණු බවද සඳහන් කළේය.

# 'ව්‍යවසාය විශිෂ්ටත්ව තරු' සම්මාන උළෙළේ දී ක්‍රිස්බ්‍රෝ ඇගයුම් ලබයි

ශ්‍රී ලාංකීය ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ඉහළ අවධානයක් යොමු කරන මෙරට විශාලතම කුකුළු මස් නිෂ්පාදන සමාගම වන ක්‍රිස්බ්‍රෝ, මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යංශයේ කර්මාන්ත සංවර්ධන සහ ව්‍යවසාය ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ 2020 ව්‍යවසාය විශිෂ්ටත්ව තරු සම්මාන උළෙලේදී ඇගයුමට ලක් විය.

මෙහි දී මධ්‍යම පළාතේ මහා පරිමාණ නිෂ්පාදන කාණ්ඩයේ විශිෂ්ටතම සමාගමට හිමි තරු සම්මානය ක්‍රිස්බ්‍රෝ සමූහ ව්‍යාපාරයට අනුබද්ධිත ෆාම්ස් ප්‍රයිඩ් පුද්ගලික සමාගම හිමිකර ගත් අතර මිඩ්ලන්ඩ් බ්‍රීඩර්ස් පුද්ගලික සමාගම මෙම කාණ්ඩයේ කුසලතා සහතිකයෙන් පිදුම් ලැබීය.

කර්මාන්ත සංවර්ධන සහ ව්‍යවසාය ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ 2020 ව්‍යවසාය විශිෂ්ටත්ව තරු සම්මාන පෙබරවාරි 12 වැනි දින මහනුවර ග්‍රෑන්ඩ් කැන්ඩි හෝටලයේ දී උත්කර්ෂවත් අන්දමින් පැවැති අතර මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ මහතා සහභාගී විය.



වාර්ෂිකව සංවිධානය කෙරෙන මෙම සම්මාන උළෙල මධ්‍යම පළාත් ව්‍යවසායකයන් ජාතික තලයට හඳුන්වාදෙනු ලබන ප්‍රධානතම සම්මාන උළෙළ ලෙස සැලකේ. ක්ෂේත්‍ර චාරිකා, සම්මුඛ පරීක්ෂණ සහ ඉදිරිපත් කිරීම් ඇතුළුව අවස්ථා ගණනාවක දී මේ සඳහා අයදුම් කරනු ලබන ව්‍යවසායකයන් දැඩි ඇගයුම් ක්‍රියාවලියකට ලක්කෙරේ.

මෙහි දී සලකා බැලෙන නිර්ණායකයන් තුළින් සමාගමේ මූල්‍ය කාර්යසාධනය, මෙහෙයුම් ක්‍රියාවලිය සහ ව්‍යවසාය ජීවගුණය පිළිබඳ විමසා බැලේ.

# 'The Grand' මහේශාක්‍ය දිවියක ඇරඹුම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දේපළ සංවර්ධන සමාගමක් වන ප්‍රයිම් සමූහය තම 25 වසරක අත්දැකීම් සමඟ ස්වර්ණමය පිය සටහනක් තබමින් කොළඹ 7 වෝඩ් පෙදෙසේ ඉදිකෙරන උසම සහ මෙරට ඉදිකෙරෙන අති සුඛෝපභෝගී නිවාස සංකීර්ණය වන **The Grand** ඉදිකරමින් දේපළ වෙළෙඳාම් ක්ෂේත්‍රයට නොමැකෙන සලකුණක් එක් කිරීමට සමත් වී තිබේ.


මීටර් 160ක උසක් සහිතව ඉදිවන අති සුඛෝපභෝගී **The Grand Ward Place** නිවාස සංකීර්ණය ආසියාවේ ඉහළම පිළිගැනීමක් සහිත **Property Guru Asia Property Awards** උළෙලේ දී ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම අතිසුඛෝපභෝගී සහධිපත්‍ය නිවාස **(Condominium)** ව්‍යාපෘතිය ලෙස සම්මානයෙන් පිදුම් ලැබීය.

මෙම අති සුඛෝපභෝගී නිවාස සංකීර්ණය අවට එදිනෙදා ජීවිතය පහසු කරවන පහසුකම් වන සුපිරි වෙළෙඳසැල්, අවන් හල්, රූපලාවන්‍යාගාර, **Spa,** උත්සව ශාලා, මෙන්ම ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම පුද්ගලික සහ රජයේ පාසල් පිහිටා ඇත.

මෙය ඉදිවන භූමි ප්‍රදේශය කොළඹ නගරයේ ආර්ථික සහ සාමාජීය වශයෙන් ඉහළම අගයක් සහිත ස්ථානයක් බැවින් මෙහි නිවාස හිමිකරුවන් කොළඹ නගරයෙහි අද්විතීය ලිපිනයක අයිතිකරුවන් බවට පත් වන අතරම මෙය ජීවිතකාලයක් පවතින ස්වර්ණමය ආයෝජනයක් ලෙස හඳුන්වා දිය හැකියි'' යනුවෙන් ප්‍රයිම් සමූහයේ සභාපති ප්‍රේමලාල් බ්‍රාහ්මණගේ මහතා පැවැසීය.

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

## මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 79



දෙවු ප්‍රවීණ චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මඟින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා **උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ** පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය.

තැපැල්පත් 2021 අප්‍රේල් 20 වැනිදාට පෙර **ගුරුගෝල වෙනස, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10** ලිපිනයට එවිය යුතු ය. ගුරු ගෝල වෙනස ජයග්‍රාහකයන්ට රුපියල් 2,500 බැගින් මුදල් ත්‍යාග 09 ක් පිරිනැමේ. ත්‍යාග පිරිනැමීම උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි.


සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

### රුපියල් විසිපන්දහසක තෑගි




පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කළ යුතුය.





# ව්‍යාපාර තරමට ම සිනමාවට ඇලුම් කළ ඇල්බට් ඒ. පේජ්

**කාගිල්ස් හිටපු සභාපති ඇල්බට් ඒ. පේජ් මහතා ගේ සියවැනි ජන්ම දිනය අදට යෙදී තිබේ. මේ මතක සැමරුම ඒ වෙනුවෙනි.**

ඇල්බට් ඒ. පේජ් යනු, මෙරට ව්‍යාපාර ලෝකයට සහ සිනමා කර්මාන්තයට බොහෝ වටිනාකම් එක්කොට, නිහඬවම මෙලොවින් සමුගත් අපූරු මනුෂ්‍යයෙකි. ඇවැන්ත නායකයෙකි. යාපනයේ උපන් ශ්‍රී ලාංකිකයෙකි.

අදින් සියවසකට එපිට, යාපනේ මනිපායි ප්‍රදේශය යනු, කුරුඳු උයන් බහුල සශ්‍රීක පළාතකි. 1921 අප්‍රේල් මස 04 වැනි දින ඇල්බට් ඒ. පේජ් උපන්නේ ඒ සශ්‍රීක මනිපායි පළාතේ ය.



මනිපායි හින්දු විද්‍යාලය, ඔහුගේ මුල්ම පාසල විය.

මනිපායි හිදී සරල සහ සුන්දර මතක රැසක් ඔහුගේ ජීවිතයට එක් වුවද, ජීවිතයට බොහෝ හැරවුම් ලක්ෂ්‍ය රැගෙන ආ ඔහුගේ දෙවැනි පාසල වූයේ කොළඹ ආනන්දයයි.

වෙනස් සමාජ වටපිටාවක, වෙනස් සංස්කෘතින් සහ නාගරික ජීවිතයක් වූ කොළඹ ආනන්දය, ඔහු ආකල්පවලින් පිරිපුන්, ශක්තිවන්ත තරුණයකු බවට පත් කළේය.

වෘත්තීය ජීවිතයේ ඉදිරිය උදෙසා අවශ්‍ය ගණකාධිකරණ විෂයේ දැනුමැත්තකු සහ ප්‍රාමාණිකයකු බවට පත්වන ඇල්බට් ඒ.පේජ්, සිය මවුපියන් හා විසූ නිවසේ සිට ආනන්දයට ගියේ පා පැදියෙනි. ඔහු නිහඬ හා ධෛර්යවන්ත සිසුවකු විය. කිසි විටෙක නැති දේ ඉල්ලා මවුපියන්ට කරදර නොකළ ඉවසිලිවන්තයකු සහ, ඇති පමණින් සැනහුණු ප්‍රඥාවන්ත දරුවකු විය. ඇතිකම් ඉදිරියේත්, නැතිකම් ඉදිරියේත් මැදි පිළිවෙතෙහි සිටීම, ඔහුගේ යහගුණ අතර කැපී පෙනිණි.

1942 වසරේ සිලෝන් තියටර්ස් සමාගමේ ගිණුම් අංශයේ කණිෂ්ඨ ලිපිකරුවකු ලෙස වෘත්තීය ජීවිතය ඇරැඹූ ඔහු, එහි ප්‍රධාන ගණකාධිකාරීවරයා දක්වා උසස් විය. ඉන්පසු සමාගම් ලේකම්වරයා බවට පත්වන ඔහු, අධ්‍යක්ෂ මණ්ඩලයට ද තේරී පත්විය.

වසර 30 ක් පුරා සමාගමත් සමග හැදී වැඩෙමින් පියවරෙන් පියවර ඉදිරියට ආ ඇල්බට් පේජ්, ටිකෙන් ටික සිලෝන් තියටර්ස් හි කොටස් මිලදී ගත්තේ, තමන් දුක් මහන්සියෙන් ඉපැයූ මුදලිනි.

එතෙක් සුද්දන්ට අයත් වූ කාගිල්ස් සමාගම, 1948 න් පසු ශ්‍රී ලාංකිකයන්ට අයත් වූ අතර, ඒ වන විටත් ඇල්බට් ඒ. පේජ් කාගිල්ස් සමාගමට අයත් සිලෝන් තියටර්ස්හි වගකීමක් ඇති ඉහළ ශ්‍රේණියේ නිලධාරියකු ලෙස නමක් දිනාගෙන තිබිණි. ඇල්බට් ඒ. පේජ් ඉතිහාස ගත වන්නේ ද, සුද්දන්ට අයත්ව තිබූ කාගිල්ස් සමාගම මිලට ගත් ශ්‍රී ලාංකිකයකු ලෙසය.

ගණන් ඉලක්කම් අතරේ වූ ගණකාධිකාරී වෘත්තීය තරමටම ඔහු සිනමාවටද ඇලුම් කළේය. බොහෝ විට ඒවා නරඹමින් විඳිනා අතර, කරන සෑම රාජකාරියක් ම, විනෝදාංශයක් තරම් ආස්වාදයකින් යුතුව ඉටු කළේය.

1972 දී රාජ්‍ය චිත්‍රපට සංස්ථාව පිහිටුවීමත් සමග එතෙක් පුද්ගලික අංශය සතුව තිබූ චිත්‍රපට කර්මාන්තයේ බහුතර කටයුතු රාජ්‍ය අංශය යටතට පත්විය. එහෙත්, ඒ වනවිටත් සිලෝන් තියටර්ස් නිෂ්පාදනය කළ චිත්‍රපට නිසාත්, ඔවුන් සතු වූ චිත්‍රපට ශාලා නිසාත්, ජනතාව තුළ සිලෝන් තියටර්ස් සදා මතකයේ මුල් බැස තිබිණි.

කලෙක මෙරට ප්‍රබල විනෝදාස්වාද මාධ්‍යයක් වූ චිත්‍රපට කර්මාන්තයට, සිලෝන් තියටර්ස් දායාද කළ මනරම් චිත්‍රපට රැසකි.

අශෝකමාලා, කපටි ආරක්ෂකයා, වැරදුණු කුරුමාණම, පෙරළෙන ඉරණම, සැඟවුණු පිළිතුර, කුසුම ලතා, එදා රෑ, සුරංගනී, වනලිය, දස්කම, සෝබා, අවිශ්වාසය, ගැහැණු ගැටය, ජීවිත පූජාව, සංසාරේ, වෙන ස්වර්ගයක් කුමටද, මංගලිකා, සුලලිත සෝබනී, සැඩොල් කඳුළු, ගොළු හදවත, අක්කර පහ, ප්‍රියංකා, නිධානය, ළසඳා, හිතුවොත් හිතුවමයි, සසර, ස්ත්‍රී, කුලගෙය, සහ සක්මන් මළුව... ඒ මනරම් චිත්‍රපට නාමාවලියෙන් කිහිපයක් පමණි.

ව්‍යාපාර විවිධාංගීකරණයෙහි ලා දක්ෂයකු වූ ඇල්බට් ඒ. පේජ්, බම්බලපිටියේ 'මැජෙස්ටික් සිටි' සාප්පු සංකීර්ණය හඳුන්වා දුන්නේ ද, නව්‍යතා රැසක් ශ්‍රී ලාංකීය ජනතාවට අත්දකින්නට සලස්වමිනි.

සිය වෘත්තීය ජීවිතය තුළ පියවරෙන් පියවර ඉදිරියට ආ ඇල්බට් පේජ්, මිලර්ස් සමාගමේ සභාපතිවරයා ලෙස පත් වූයේය. කාගිල්ස් සමාගමේ සභාපතිවරයා ද විය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු හා ලන්ඩනයේ වරලත් ලේකම්වරුන්ගේ හා පරිපාලකයන්ගේ ආයතනයේ සාමාජිකයකු ලෙසද කටයුතු කළ ඇල්බට් ඒ. පේජ්ගේ සුවිශේෂීම ලක්ෂණය වූයේ, විවිධ අංශවල විහිදුණු කුසලතාව සහ දක්ෂ නායකත්වයයි. ඒ නිසාම දෙස් විදෙස් සමුළු නියෝජනය කළ අවස්ථාද එමට විය.

අද කාගිල්ස් යනු, මෙරට සෑම වර්ගයකම ජන කොට්ඨාසයන් නගා සිටුවීම උදෙසා සැකසුණු ජාතික තලයේ ව්‍යාපාරයකි. මෙරට කෘෂි කර්මාන්තය නගා සිටුවමින්, ගොවි ජනතාවගේ ජීවිත ඔසවා තබමින්, කලාවට, සංස්කෘතියට අතහිත දෙමින්, අතු පතර විහිදුවාලමින් තව තවත් පැතිරෙන මහා වෘක්ෂයකි. හිටියා නම්, අද ඔහුට වසර සියයකි. එහෙත් රටට කාගිල්ස් ඉතිරිකොට, 2000 වසරේ ජූලි 16 වැනිදා ඔහු සදහටම සමුගෙන යන්න ගියේය.

ඇල්බට් ඒ. පේජ් මියගිය දා හුණුපිටිය ගංගාරාමයේ ශ්‍රී ජිනරතන කාර්මික විදුහලේ සිසුදරුවන් භාරදහසකට වැඩි පිරිසක්, ඔහුගේ නිවෙසේ සිට සුසාන භූමිය දක්වා පෙළ ගැසී සිටියේ, සිය අධ්‍යාපනයට අත හිත දුන් මේ ආදරණීය නායකයාට බුහුමන් දක්වන්නට ය.

මේ මහපොළවත්, එහි ජීවත්වන මිනිසුන්ටත් එක සේ සලකන යහපත් ව්‍යාපාරයක් ලෙස, කාගිල්ස් නම තවත් සිය වසක් මේ රටේ පවතිනු ඇත.

ඒ ඉතිහාසය පුරා ඇල්බට් ඒ. පේජ් නාමය ද සදා බැබළෙනු ඇත.

**ඉනෝකා පෙරේරා බණ්ඩාර**






# අනූ එක් විය සැපිරී සිළුමිණ වෙනුවෙන් පැවැත්වුණු සැමරුම් උලෙළ





වසර 1930 මාර්තු 30 දා ඇරඹි සිළුමිණ පුවත්පතට ඉකුත් 30 වැනිදාට 91 වැනි විය සැපිරිණි. ඒ නිමිත්තෙන් චාම් උත්සවයක් සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව පැවැත්විණි. එහිදී ලේක්හවුස් ආයතනයේ පාලන හා නීති අධ්‍යක්ෂ නීතීඥ රඛිත අබේගුණවර්ධන, මූල්‍ය අධ්‍යක්ෂ නීතීඥ ජනක රණතුංග හා සිළුමිණ කර්තෘ ධර්මන් වික්‍රමරත්න සමඟ සැමරුම ආරම්භ කළ අයුරුයි මේ. ලේක්හවුස් ආයතනයේ වැඩබලන සමාගම් ලේකම් නීතීඥ එච්. ඩබ්ලිව්. එස්. ප්‍රසංගා සහ සිළුමිණ ජ්‍යෙෂ්ඨ සමකර්තෘ නිහාල් පී. අබේසිංහ ද වම්පස ඡායාරූපයේ වෙති. දකුණුපස ඡායාරූපයේ දැක්වෙන්නේ සිළුමිණ ප්‍රවෘත්ති කර්තෘ තාරක වික්‍රමසේකර, විශේෂාංග කර්තෘ සුමුදු චතුරාණී ජයවර්ධන හා රසඳුනේ ටානියා මෝසස් ඇතුළු කර්තෘ මාණ්ඩලිකයන් පැමිණි ආරාධිතයන්ට සංග්‍රහ කළ අයුරුය. මේ අවස්ථාවට ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ප්‍රවීණ මාධ්‍යවේදී ධර්ම ශ්‍රී කාරියවසම්, පුවත්පත් කර්තෘවරු, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීහු, ලේක්හවුස් සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු සහ කළමනාකරුවෝ ඇතුළු ආරාධිතයෝ රැසක් එක්වූහ.

ඡායාරූප - තුෂාර ප්‍රනාන්දු

# ගාල්ල මහින්දේ ‘9 කල්ලිය’

මාර්තු 21 සිළුමිණ පුවත්පතේ 7 වැනි පිටුවේ පළවූ ‘මහින්දයේ 9 කල්ලිය’ පිළිබඳව ලියූ ලිපිය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් එහි විදුහල්පතිවරයා විසින් සිළුමිණ කර්තෘවරයා වෙත එවා ඇත. එම ලිපිය පහත පළවේ.

“උක්ත මාතෘකාව යටතේ 2021 මාර්තු 21 වැනි ඉරිදා සිළුමිණ පුවත්පතේ පිටු 07 හි පළවූ පිටු අඩක ව්‍යාජ තොරතුරු ද ඇතුළත් විශේෂාංග ලිපිය සම්බන්ධයෙනි.

විභාග කාල වකවානුවේ දී ඇති වූ හුදෙකලා සිද්ධියක් පාදක කරගෙන ලොකුකරවිට නම් මාධ්‍යවේදියකු මේ ලිපිය ලියා ඇතත්, එවැනි අයකු කිසිදු විටෙක මේ පිළිබඳව අප අමතා සම්මුඛ සාකච්ඡාවක් ලබාගෙන නැත.

එසේම ඉතා කැපවීමෙන් කටයුතු කරන ගුරු මණ්ඩලයක, කළමනාකරණ මණ්ඩලයක අධීක්ෂණයෙන් විනය පවත්වාගෙන යනු ලබන මෙම විද්‍යාලයට මෙවැනි අභූත චෝදනාවක් නඟා කල්ලියක් මෙය ඉටු කළ බව හුවා දැක්වීමෙන් සිළුමිණ පාඨක මහින්දීයන් තුළ ද අප්‍රසාදයක් හටගනී.

මෙය හුදකලා සිද්ධියක් ලෙස මෙම ලිපියේ ම දක්වා ඇති අතර, ලිපිය මඟින් ම හුවා දක්වා ‘9 කල්ලිය’ යන්න ‘අතේ රෝල්’ මාධ්‍ය භාවිතාවකි.

11 ශ්‍රේණි භාරව කටයුතු කරනුයේ පූජ්‍ය මාකුඹුරේ චන්ද්‍රාලෝක ස්වාමීන් වහන්සේ වන අතර, ඉතා කැපවීමෙන් හා මනා සංවිධානයකින් එම පන්තිවල විනය පවත්වා ගැනීමට උන්වහන්සේ කැපවේ. මෙවැනි කල්ලියක් හෝ වෙනත් ‘කල්ලි’වල සේයාවකුදු මෙම විදුහලේ නැත.

**විදුහල්පති - ගාමිණී ජයවර්ධන**

(ලිපිය කිසිදු සංස්කරණයකට බඳුන් කර නැත)

**මේ ලිපියට අදාළව සිළුමිණ කර්තෘවරයාගේ කරුණු පැහැදිලි කිරීම පහත පළ වේ.**

**පාසලක් යනු දැයේ දරු පරපුරට අධ්‍යාපනය ලබා දෙන ස්ථානයක් ම පමණක් නොවේ. දරුවන් යහමඟට යොමු කරන්නේත්, ඔවුන් සමාජයට වැඩදායක පුද්ගලයන් බවට පත්කරන්නේත් අධ්‍යාපනය ලබා දෙන පාසලෙනි.**

ගාල්ල මහින්ද විද්‍යාලය යනු මෙරට බෞද්ධ අධ්‍යාපනයේ පුනරුදය සමඟ ආරම්භ වූ ඕල්කොට් පාසලක් වන අතර එමඟින් මෙරට සමාජයට තිළිණ කළ රටට ජාතියට පමණක් නොව සමස්ත ලෝකයටම දායාද කළ වැඩදායී පුරවැසියන් සංඛ්‍යාව මහත්ය.



නමුත් මාර්තු 08දා මහින්ද විද්‍යාලයේ අපොස සාමාන්‍ය පෙළ විභාග ශාලාවක දී ළමයකුට පහර දී තුවාල සිදුකිරීමේ සිද්ධිය ඒ සියලු අතීත කීර්ති නාම ඉදිරියට දමා ලඝු කර දැමිය හැක්කක් නොවේ.

පාසල් සිසුවකුගේ ජීවිතයේ වැදගත්ම විභාගයක් පැවැත්වෙන අතරතුර ඔහුගේම සම වයසේ සිසුන් පිරිසක් විසින් අපරාධමය වරදක් සිදුකිරීම හේතුවෙන් එම සිසුවා රෝහල්ගත වී දින දෙකක් ප්‍රතිකාර ගත්තේය. සිද්ධිය පොලිසියටත්, එතැනින් අධිකරණයටත් ගොස් සැකකාර සිසුන් තිදෙනකුට රුපියල් ලක්ෂ දෙක බැගින් ශරීර ඇප නියම කෙරිණි.

මෙය කිසිසේතම පාසල් පද්ධතිය තුළ අසන්නට හෝ දකින්නට නොලැබිය යුතු සිදුවීමක්ය යන්න අපගේ පිළිගැනීමයි. මෙවැනි සිදුවීම් ඉදිරියටත් පාසල් තුළ සිදුවීම වළක්වාලීමේ සමාජ වගකීමක් සියලු මාධ්‍යයන්ට ඇත.

අප එසේ කියන්නේ නීතිමය වරදවල් සිදුවීම හා වෙනත් අපරාධ සිදුවීම වළක්වා ගැනීමට සාර්ථක ක්‍රමයක් ලෙස නිවැරදි මාධ්‍ය වාර්තාකරණය උදවු වන බව පිළිගැනීම බැවිනි.

සිළුමිණ පුවත්පතේ වගකීම වන්නේ මේ සිද්ධිය නිවැරදිව වාර්තා කරමින් එවැනි සිද්ධීන්ට ලක්වන දරුවන්ට විඳින්නට සිදුවන දඬුවම් ද පෙන්වා දී එවැනි සිදුවීම් වළක්වාගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද සමාජය දැනුම්වත් කිරීමයි.

අප ඉටු කළේ එම වගකීමයි. අප ඒ සිද්ධිය වාර්තා කර ඇත. සිදුවීමට අදාළ වින්දිත පාර්ශ්වයේ කරුණු ලිපියට ඇතුළත් කර ඇති අතර චූදිතයන්ට අධිකරණයෙන් ගත් ක්‍රියාමාර්ග ද සඳහන් කර ඇත.

එමෙන්ම මහින්ද විදුහලේ වත්මන් විදුහල්පති (?) වැඩබලන විදුහල්පති සමඟ සාකච්ඡා කරමින් ඔහුගේ අදහස් ද එම ලිපියට අන්තර්ගත කර ඇති අතර එවැනි සිදුවීම් තවදුරටත්

## සිළුමිණ පළ කළ ලිපිය කිසිදු ආකාරයකින් සාවද්‍ය නොවේ

සිදුවීම වළක්වා ගැනීමටත් අවශ්‍ය දැනුම ලබාදීම සඳහා උපකාරක තොරතුරු ලෙස විශේෂඥ මනෝ වෛද්‍ය රූමි රූබන්ගේ අදහස් ද ලිපියට ඇතුළත් කර ඇත.

එබැවින් මෙම ලිපිය මඟින් කිසිදු පාර්ශ්වයකට අගතියක් සිදු කිරීමට බලාපොරොත්තු නොවූ අතර මෙය මාධ්‍ය ආයතනයක් වෙත පැවරෙන සමාජ වගකීම මනාව ඉටුකිරීමක් බව ද නැවත නැවතත් සිහිපත් කරන්නෙමු.

විදුහල්පතිවරයා පවසන්නේ එම ලිපිය ලියන ලද එස්.ලොකුකරවිට නම් මාධ්‍යවේදියකු ඔහු අමතා සම්මුඛ සාකච්ඡාවක් ලබාගෙන නැති බවයි. නමුත් විදුහල්පතිවරයා එම ලිපියේ සඳහන් ඔහු කියූ කරුණු කිසිවක් ප්‍රතික්ෂේප කරන්නේ ද නැත.

එස්. ලොකුකරවිට අප මාධ්‍යවේදිනියගේ සැමියා ද මාධ්‍යකරණයේ නිරත ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකි.

අප දන්නා පරිදි මේ මාධ්‍යවේදියා හා මාධ්‍යවේදිනිය යන දෙදෙනාම වැඩබලන විදුහල්පති ගාමිණී ජයවර්ධන හොඳින්ම දන්නා හඳුනන අය වෙති.

මාධ්‍යවේදීන් දෙදෙනා විසින් ගාමිණී ජයවර්ධන වැඩබලන විදුහල්පතිවරයා සමඟ අදාළ සිද්ධිය පිළිබඳ සාකච්ඡා කරන විනාඩි 18 වැඩි කාලයක් සහිත හඬ පටයක පිටපතක් ද අප ආයතනය වෙත එස්.ලොකුකරවිට මාධ්‍යවේදිනිය විසින් එවා ඇති අතර, එම දුරකථන ඇමතුම ගෙන ඇත්තේ මාධ්‍යවේදිනියගේ සැමියා විසිනි.

සාකච්ඡාව අතරතුර මහින්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් පහරකෑමට ලක්වූ සිසුවා විසින් සමාජමාධ්‍ය ජාලයේ පළකරන ලදැයි කියන ඡායාරූපය ද එවා ඇත්තේ එස්.ලොකුකරවිට මාධ්‍යවේදිනියගේ ජංගම දුරකථනයට වට්ස්ඇප් තාක්ෂණය ඔස්සේය.

ඒ අනුව වැඩබලන විදුහල්පති ගාමිණී ජයවර්ධන එස්.ලොකුකරවිට මාධ්‍යවේදිනිය නොදන්නා බවත් ඇය මාධ්‍යවේදියකු (පිරිමි) ලෙස හැඟවීමට උත්සාහ ගනිමින් කිසිදු අවස්ථාවක සාකච්ඡා නොකළ බවත් සඳහන් කරමින් කරන ප්‍රකාශය සාවද්‍යය බව සඳහන් කර සිටිමු.

විදුහල්පතිවරයා විසින් කරුණු පැහැදිලි කරන ලද ලිපියේ දක්වා ඇත්තේ “9 කල්ලිය“ යන්න “අතේ රෝල්” මාධ්‍ය භාවිතයක් බවයි. සිළුමිණ පුවත්පත එවැනි අතේ රෝල් මාධ්‍ය භාවිතයක් නොකරන බව විදුහල්පතිවරයාට මේ අවස්ථාවේ අප දැනුම් දිය යුතුව ඇත.

තමන්ට පහර දුන්නේ පාසල තුළ ‘9 කල්ලිය’ යනුවෙන් හඳුන්වා ගන්නා කල්ලියක් බව පවසන්නේ පහර කෑමට ලක්වූ සිසුවා විසිනි. පහර කෑමට ලක්වූ සිසුවා 9 කල්ලිය ගැන පොලිසියට ද දැනුම් දී ඇති අතර; පහරදුන් අයගේ නම් පවා පොලිසියට දන්වා ඇත.

විදුහල්පතිවරයාගෙන් කරුණු විමසන හඬපටයේ “9 කල්ලිය” පිළිබඳ විමසීමේදී මහින්ද විද්‍යාලයේ වැඩබලන විදුහල්පතිවරයා එය ප්‍රතික්ෂේප නොකරන අතර ඔහු පවසන්නේ “කල්ලි තියෙනවා. ඔයත් ඔය ඉස්කෝලෙටනේ ගියේ. කල්ලි හදාගැනීම දරුවන්ගේ අවශ්‍යතාවක්” යනුවෙනි. එයින් තහවුරු වන්නේ කල්ලි ඇති බව වැඩබලන විදුහල්පති ගාමිණී ජයවර්ධන ද පිළිගන්නා බවයි.

නමුත් විදුහල්පතිවරයාගේ කරුණු පැහැදිලි කිරීමේ ලිපියේ දක්වා ඇත්තේ මෙවැනි කල්ලියක් හෝ වෙනත් කල්ලිවල සේයාවකදු නැති බවයි.

මේ පිළිබඳව සොයා බැලීමේදී විදුහල් ප්‍රජාවගෙන් මෙන්ම වෙනත් සිසු දරුවන්ගෙන් ලද තොරතුරු අනුව ‘9 කල්ලිය‘ නමින් හඳුන්වා ගන්නා කණ්ඩායමක් සහ තවත් කණ්ඩායම් කිහිපයක් පාසලේ තිබෙන බවත්, ඇතැම් කල්ලි සාදාගෙන සිටි සිසුන් දැන් පාසලෙන් සමුගෙන ඇති බවත්, දැනට මෙවැනි කල්ලි නිර්මාණ කරගත් සිසුන් පාසලේ වෙනත් සිසුන්ගෙන් කප්පම් ගැනීම්, සිසුන්ට පහරදීම් හා වද හිංසා පැමිණවීම් කරන බවටත් කරුණු අනාවරණය වී ඇති බව අපි විදුහල්පතිවරයාට පවසා සිටින්නෙමු. නමුත් මෙම සිදුවීමට ඒවා අදාළ නොවන බැවින් ඒ පිළිබඳ ලිපියේ සටහන් කර තිබුණේ නැත. මේවා සම්බන්ධව කරුණු අනාවරණය කරගැනීම විදුහල්පතිවරයාගේ කාර්යභාරයක් බවද අප මෙහි සඳහන් කරමු. එමෙන්ම පහර කෑ සිසුවාට තවත් සිසුන් කණ්ඩායමක් පහර දී ඇත්තේ ඔහු දැමූ අසභ්‍ය ඡායාරූපයක් නිසා යැයි පවසන විදුහල්පතිවරයා “එය එයාලගේ වැඩක්” යැයි පවසා ඇත.

මේ අනුව සිසුන් පිරිසක් තවත් සිසුන් පිරිසකට දඬුවම් දීම මහින්ද විද්‍යාලයේ වැඩබලන විදුහල්පතිවරයා අනුමත කරන්නේ නම් එය බරපතළ තත්ත්වයක් බව අපි විදුහල්පතිවරයාට අවධාරණය කරන්නෙමු.

කෙසේ වෙතත් කරුණු පැහැදිලි කිරීමේ ලිපියේ විදුහල්පතිවරයා සඳහන් කර ඇත්තේ මෙය හුදෙකලා සිදුවීමක් ලෙස එම ලිපියේ ම දක්වා ඇති බවයි.

අප විශේෂඥ මනෝ වෛද්‍ය රූමි රූබන්ගේ අදහස් මෙම ලිපිනයට අන්තර්ගත කළේ යම් සිදුවීමකට උපකාරක තොරතුරු ඇතුළත් කිරීම පිළිගත් මාධ්‍ය ආචාරධර්මයක් ලෙස අප සලකන බැවිනි.

එහි දී විශේෂඥ වෛද්‍යවරයා පවසන්නේ සමස්ත පාසල් දරුවන් හා කල්ලි ගැසීමේ මානසිකත්වය පිළිබඳ හා සියලුම පාසල් පිළිබඳව බව මෙහි දී විදුහල්පතිවරයාට සිහිපත් කරන්නෙමු.

ඔහු සඳහන් කර ඇත්තේ “මෙය මහින්ද විද්‍යාලයෙන් වාර්තා වූ එක් හුදෙකලා සිදුවීමක් වුව ද සෑම පාසලකම පසුගිය වකවානුවේ ඉතාමත් විශාල වශයෙන් මෙවැනි සිදුවීම් වාර්තා වී ඇති බවයි”

මෙය හුදෙකලා සිදුවීමක් ලෙස සඳහන් කර ඇත්තේ වෙනත් බාහිර සිදුවීම් සමඟ සම්බන්ධ දෙයක් නොවන බැවින් විනා මෙය ලඝු කර දැක්වීමට නොවන බව විදුහල්පතිවරයාට අපි අවධාරණය කරමු.

එමෙන්ම මෙය මහින්දයේ සිදුවූ එක් සිදුවීමක් පමණක් වුව ද එවැනි සිදුවීම් ගණනාවක තොරතුරු මේ වනවිට අප වෙත ලැබී ඇති බව ද එබැවින් එය හුදෙකලා සිදුවීමක් නොව වසර කිහිපයක සිට ඇතිවූ සිදුවීම් මාලාවක එක් ප්‍රතිඵලයක් බවද මෙහි දී අවධාරණය කරන්නෙමු.

***කර්තෘ - සිළුමිණ***

# කෝවිඩ් රෝහල්වලට බ්‍රැන්ඩික්ස් වෙතින් සත්කාර

## වටිනා ආරක්ෂිත ඇඳුම් කට්ටල හා ආරක්ෂිත මුඛ ආවරණ දෙලක්ෂ පනස් දහසක් පරිත්‍යාග කරති







**ශ්‍රී ලංකාව පුරා විහිදී පවතින බ්‍රැන්ඩික්ස් සමූහයේ කර්මාන්තශාලාවන්හි සේවයෙහි නිරත සාමාජිකයන් නිෂ්පාදනය කළ PPE සහ මුඛ වැසුම් එම ප්‍රදේශයන්හි රෝහල් වෙත පරිත්‍යාග කළ ආකාරය.**

කොළඹ - කොවිඩ් - 19 රෝගීන්ට ප්‍රතිකාර කරන රෝහල් හා ප්‍රතිකාර මධ්‍යස්ථානයන් හි සේවයේ නියුතු පිරිස් වෙත ස්තුති පුද කිරීමක් ලෙස, ශ්‍රී ලංකාව පුරා පැතිර පවතින බ්‍රැන්ඩික්ස් සමූහයේ කර්මාන්ත ශාලාවන්හි සේවය කරන සාමාජිකයන් අපනයන ප්‍රමිතියෙන් යුතු ආරක්ෂිත ඇඳුම් කට්ටල හා මුඛ ආවරණ (PPE) නිෂ්පාදනය කිරීමට එක්වූහ. මේ රෝහල් හා ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත PPE කට්ටල පරිත්‍යාග කිරීම පසුගිය සති කිහිපය තුළදී බ්‍රැන්ඩික්ස් සාමාජිකයන් විසින් සිදු කරන ලදී.

කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී බරපතළ සෞඛ්‍ය අවදානම් සඳහා මුහුණ දෙන සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩල වෙත කෘතවේදී සහාය පළකිරීමක් ලෙස, බ්‍රැන්ඩික්ස් සමූහයේ සාමාජිකයන් අපනයන ප්‍රමිතියේ ආරක්ෂිත ඇඳුම් කට්ටල 490,000 ක් හා මුඛ වැසුම් 250,000ක් නිෂ්පාදනය කළහ. ඒ ඇඳුම් කට්ටල හා මුඛ වැසුම් බෙදා දීමට පෙර බෝවන රෝග විද්‍යායතනය හෙවත් අයි. ඩී. එච් රෝහල විසින් භෞතික හා ක්ෂුද්‍ර ආසාදන පරීක්ෂණ පවත්වා නිසි ප්‍රමිතියට පවතින බවට සහතික කර අනුමැතිය ලබා දී තිබේ. රෝහල් 23ක් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල පරිත්‍යාග කළ අතර, රෝහල් 9ක් වෙත මුඛ වැසුම් පරිත්‍යාග කිරීම ද බ්‍රැන්ඩික්ස් සාමාජිකයන් අතින් සිදු කෙරිණි.

“කොවිඩ්-19 වසංගතය මීට පෙර අපි අසා දැක නොමැති රෝගී තත්ත්වයක්. කොවිඩ් රෝගීන් සඳහා ප්‍රතිකාර කරන සෞඛ්‍ය සේවකයන් මේ රෝගයට ගොදුරු වීමේ විශාල අවදානමක් තිබෙනවා. කොවිඩ් - 19 රෝගයට ගොදුරුවී ප්‍රතිකාර ලබන අතර තුර සෞඛ්‍ය සේවක පිරිස් රෝගීන්ගේ යහපැවැත්ම වෙනුවෙන් කරන සුවිසල් කැපකිරීම දැකගන්නට මට පුළුවන්කම ලැබුණා. මට ඔවුන් ගැන සැබෑ ආඩම්බරයක් දැනෙන්නට ඔවුන්ගේ කැපවීම දැකගන්නට ලැබීම හේතු වුණා. වගේම අප විසින් ඔවුන් වෙත නිසි ප්‍රමිතීන්ට අනුව නිපදවූ හොඳම ආරක්ෂිත ඇඳුම් කට්ටල හා මුඛ වැසුම් ලබා දෙමින් ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීමට හැකිවීම මගේ හිතට ආඩම්බරයක්.” යනුවෙන් බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලාවක පුහුණු නිලධාරිනියක ලෙස සේවය කරන නිලංකා ප්‍රනාන්දු පවසා සිටී.

කොළඹ අයි. ඩී. එච්. රෝහල, හෝමාගම රෝහල සහ නෙවිල් ප්‍රනාන්දු රෝහල, මඩකළපුව පූනානි රෝහල සහ කෑගල්ල රඹුක්කන රෝහල ඇතුළු තවත් කොවිඩ් ප්‍රතිකර්ම රෝහල් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල පරිත්‍යාග සිදු වූ අතර, රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත හා නිවිතිගල රෝහල්, කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල රෝහල හා වරකාපොල රෝහල සහ රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල ඇතුළු තවත් රෝහල් ආරක්ෂිත මුඛ වැසුම් පරිත්‍යාගයන්හි ප්‍රතිලාභීන් විය.



# ජනතා මුදල් කාබාසිනියා කර රට පැන්න ඇදුරෝ

● සුභාෂිණී ජයරත්න

**ලංකාවේ විශ්වවිද්‍යාලයකින් බිහිවන විද්‍යාර්ථීයකුට ජාත්‍යන්තරයේ ඇත්තේ ඉහළ පිළිගැනීමකි. එය කොතරම්ද පැවැසුවොත් ඉතා විශාල වැටුප් තලයන්ට සේවය කිරීමේ අවස්ථාවන්ට ඔවුහු උරුමක්කාරයෝ වෙති. නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන් මල්ඵල නෙළා ගත් ඔවුහු තමන් ලද ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් මෙරට තවත් දරු පිරිසකට සිය යුතුකම් පැහැර හරිමින් සිටි කතා පුවතක් දිග හැරුණේ පසුගිය රජය කාලයේ උසස් අධ්‍යාපන ඇමැතිව සිටි විජයදාස රාජපක්ෂ විසින් කළ අනාවරණයේදීය. ඒ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගනිමින් විදෙස්ගත වූ ඇදුරෝ 500 කට ආසන්න ප්‍රමාණයක් සිය ගිවිසුම් කොන්දේසි කඩ කළ බවත්, ඒ හේතුවෙන් රජයට ලැබෙන්නට තිබූ රුපියල් මිලියන 850 ක මුදලක්ද ගෙවීම පැහැර හැර ඇති බවත්ය. 2018 ජූලි, අගෝස්තු මස එවකට ඇමැති වූ විජයදාස රාජපක්ෂ විසින් කළ මේ හෙළිදරව්වේදී අදාළ ආචාර්යවරුන්ගේ නම් ගම් සහිතව ඔවුන්ටද ගෙවන්නට සිදුවන මුදල් වන්දිද ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ හෙළිදරව් විය.කෙසේ වෙතත් මේ අනාවරණයෙන් පසු ආචාර්යවරුන්ගේ ඒ ගිවිසුම් මුදල ගෙවා තිබුණේද නැද්ද යන්න පැහැදිලි කිරීමක් සිදුව නොතිබුණු අතර සමහරක් මාධ්‍ය හරහා අනාවරණය වූයේ එම වන්දි මුදලින් සියයට 25 ක ප්‍රමාණයක් ගෙවා අහවරව ඇති බවකි.**

ඇත්තෙන්ම එදා අනාවරණය වූ පරිදි එතරම් වන්දි මුදලක් ආචාර්යවරුන්ට ගෙවන්නට තිබුණද යන්න විමසීමේදී විවිධ පිරිස් ඊට දක්වන්නේ විවිධ ප්‍රතිචාරය. සාමාන්‍යයෙන් මේ වන්දි මුදල් පිළිබඳ ඇස්තමේන්තු පවතින්නේ ඒ ඒ විශ්වවිද්‍යාල වලට වන බැවින් එදා එක්රැස් වූ මේ තොරතුරු සාවද්‍ය බව සමහරකුගේ මතය වී ඇත්තේය. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් එදා ප්‍රමුඛ වී කටයුතු කළ හිටපු උසස් අධ්‍යාපන ඇමැති වූ ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ අද පවසන්නේ මෙවැනි අදහසකි.

"අපි එදා 500 කට ආසන්න වූ ආචාර්යවරු පිරිසක් පිළිබඳ නොබියව සෘජු අනාවරණයක් කළා. මේ අයගෙන් රුපියල් මිලියන 860 කට ආසන්න මුදල් ප්‍රමාණයක් ලැබෙන්න තිබුණා. මේ බොහෝමයක් දෙනා පශ්චාද් උපාධි කරන්න විදෙස්ගතව ඇත්තේ අදාළ ගිවිසුම්වලට යටත්වයි. එදා මම මේ තොරතුරු පුවත්පත් හරහා අනාවරණය කළේ ඉතා අමාරුවෙන්. ඒ ඒ ආචාර්යවරයාගේ නම, ගෙවීමට ඇති වන්දි මුදල, ඔවුන්ගේ පදිංචිය, විශ්වවිද්‍යාල ඇතුළු සියලු තොරතුරු ලබා ගෙන භාෂා තුනෙන්ම මාධ්‍ය හරහා පළ කළා. මේ අය අද විශාල වැටුප් ලබන්නේ රටේ ජනතාවගේ මුදලින්. ඒ නිසා මේ අයට රටේ ජනතාවට සේවයක් කිරීමේ වගකීමක් තියෙනවා. මේ අනාවරණයෙන් පසුව සමහරක් දෙනා කුඩා ප්‍රමාණවලින් මුදල් යළි ගෙවීමක් කළා. ඒත් දිගින් දිගටම මේ ගැන සොයා බැලීමක් වුණේ නැහැ. මම මේ දේවල් පුවත්පත්වල නොබියව පළ කළ පසු විශ්වවිද්‍යාල ආචාර්ය සංගම් නඩු දාන්න උත්සහ කළා. මම නොබියව ඊට අභියෝග කළා. ඇත්තටම ඔවුන් මේ පිළිබඳව ලැජ්ජා විය යුතුයි. අද විශ්වවිද්‍යාල අරාජික වෙලා. මම 2018 විශ්වවිද්‍යාලවලට යනකම් කිසිම ඇමැතිවරයෙක් විශ්වවිද්‍යාලවට ගිහින් තිබුණේ නැහැ. අවුරුදු 50 කට පසු විශ්වවිද්‍යාලයකට ගිය පළමු ඇමැතිවරයා මමයි...." ඒ හිටපු උසස් අධ්‍යාපන ඇමැතිවරයකු වන විජයදාස රාජපක්ෂයි.

සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාල ඇදුරකු සිය අධ්‍යයන කටයුතු සඳහා විදෙස්ගතවීම් අනිවාර්ය වන්නේ ඔවුන් පර්යේෂණ සිදු කර දැනුමින් යාවත්කාලීන විය යුතු නිසාය. මේ නිසා අදාළ විශ්වවිද්‍යාලයේ අවසරය ඇතිව විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු මෙන්ම කථිකාචාර්යවරු විදෙස් ගතවන්නේ වැටුප් සහිත රාජකාරි නිවාඩුද සමගිනි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පවසන පරිදි වසරකට ආචාර්ය මහාචාර්යවරු160 කට ආසන්න ප්‍රමාණයක් විදෙස්ගත වෙති.

## ● දැන් විශ්වවිද්‍යාල පද්ධතිය හැර යන ආචාර්යවරු අඩුයි

විශ්වවිද්‍යාල ආචාර්යවරුවරුන් සිය උසස් අධ්‍යාපනය සඳහා විදෙස්ගත වීමේදී ඊට අනුකූල ගිවිසුම්ගත වීම් මුලින්ම අර්ථකතනය වෙන්නේ 1988 අගෝස්තු 1 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම චක්‍රලේඛ අංක 377 නි. ඒ අනුව යම් ආචාර්යවරයකුගේ ගිවිසුම් කඩ කිරීම් ගණනය කර ඇත්තේ ඒ ආචාර්යවරයා ලබන වැටුපට අනුවයි. ආචාර්යවරුන්ගේ මෙම ගිවිසුම සම්බන්ධ කරුණු යළිත් සංශෝධනය වන්නේ 2009 මාර්තු 9 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් චක්‍රලේඛ අංක 907 නුයි. මෙහිදී ගිවිසුම් ගණනය කිරිමේදි වැටුපට අමතරව ඒ ආචාර්යවරයා විදෙස් ගතවූ ශිෂ්‍යත්වයේ වටිනාකමත් එකතු වෙයි. ඒ අනුව ගිවිසුමේ මුදලද විශාල අගයක් ගන්නේ ඒ වන විට ආචාර්යවරුන්ගේ වැටුප් වැඩිවීම හා වටිනා ශිෂ්‍යයත්ව අපේ ආචාර්යවරුන්ට හිමිවීම නිසාය. එසේම 907 යටතේ වූ 3 වන ඡේදයේ බී කොටසට යළිත් සංශෝධන එකතු වෙමින් මෙම ගිවිසුම් මුදලට ලබා දෙන පර්යේෂණ හා අධ්‍යයන වියදම් එකතු වන්නේය.

එසේම ඒ ඡේදයේ සඳහන් වන පරිදි යම් ආචාර්යවරයකු තමන්ගේ මහන්සියෙන් සොයා ගත් ශිෂ්‍යත්වයක් නම් එම ශිෂ්‍යත්වයේ මුළු වටිනාකම නොව එයින් තුනෙන් එකක වටිනාකමක් ගිවිසුම් මුදලට එකතු වන බවකි. ගිවිසුම් අත්සන් කිරීම ගැන සඳහන් වන්නේ චක්‍රලේඛ අංක 920 නි. මෙම ගිවිසුම කඩ කිරීමේදී එය නැවත අයකර ගැනීමේ මාර්ගද මේ චක්‍රලේඛයේ සඳහන් වෙයි. මෙහිදි ඇප කරුවන් 6 දෙනෙක් ගිවිසුමට අත්සන කරති. සාමාන්‍යයෙන් ආචාර්ය උපාධියක් වෙනුවෙන් අවුරුදු 3යි මාස 9 ක වැටුප් සහිත නිවාඩුවක් හිමි වෙයි. මේ නිසා එවන් අවස්ථාවක ගිවිසුම් ගත මුදල විශාලය.

"මේ පිළිබඳ පසුගිය කාලයේ විවිධ වාර්තා පළ වූ පසු අපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමග මේ ගැන කතා කළා. එවැනි තොරතුරු ලබා ගත් ක්‍රමවේදය ගැන අපි විමසීම් කළා. මෙවැනි තොරතුරු ලබා ගත යුත්තේ විශ්වවිද්‍යාල පරිපාලනයෙන්. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ මෙම ගිවිසුම් කඩකිරීම විවිධ අර්ථකථන වලින් විග්‍රහ කළ හැකියි. සමහරු ඇත්තමට ගිවිසුම් කඩකර රට දාලා ගිහින් තිබුණා. නමුත් බහුතරයක් එසේ වී නැහැ. විශ්වවිද්‍යා ප්‍රතිපාදන කොමිසම ගිවිසුම් කඩ කළා යැයි කිව්වට එසේ කර නැහැ. එදා 500 දෙනකු ගැන සඳහන් වුවත් පිරිසක් රට හැර ගිහින් තිබුණේ නැහැ. ඔවුන් ඒ වන විට වෙනත් විශ්වවිද්‍යාලවල සම්බන්ධව සිටියා. තවත් පිරිසක් උපාධිය අවසන් නොකර අතරමග ලංකාවට පැමිණ සිටියා. නමුත් තමන්ට ලබා දුන් අවස්ථාව පැහැර හැරීම හා උසස් අධ්‍යයන කටයුතු අවසන් නොකිරීම නිසා ඔවුන්ද ගිවිසුම් කඩ කිරීමට ඇතුළත් වුණා.

## ● ඔවුන් එදා මට නඩු දාන්න උත්සාහ කළා - හිටපු ඇමැති විජයදාස රාජපක්ෂ





හිටපු උසස් අධ්‍යාපන ඇමැති ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනයේ හිටපු සභාපති මහාචාර්ය කේ. කේ. අයි. යූ. අරුණ කුමාර

මෙහිදී ඔවුන්ටත් එම මුදල ගෙවන්න සිදුවුණා. සමහර ආචාර්යවරු තමන් රැකියාව කරන විශ්වවිද්‍යාලය හැර යෑමට විවිධ හේතු බලපාලා තිබුණා. විශ්වවිද්‍යාල ආචාර්යවරු විශ්වවිද්‍යාල හැර යෑම සම්බන්ධ සංඛ්‍යා ලේඛන කොහේවත් නැහැ. නමුත් විවෘත විශ්වවිද්‍යාලයේ ආචාර්ය චන්ද්‍රා ජයවර්ධන මේ පිළිබඳ පර්යේෂණයක් කර තිබුණා. එහි සඳහන් වුණේ 1990 සිට 2012 වසර දක්වා බුද්ධිගලනය වූ ආචාර්ය පිරිස 250ක් පමණක් බව. මෙයින් 24% ක් රට හැර ගොස් ඇත්තේ රටේ එවකට පැවැති තත්ත්වය අහිතකර වීම නිසා.

තවත 20% ක් රට හැර ගොස් තිබුණේ අදාළ විශ්වවිද්‍යාලයේ හෝ පීඨයේ තමන්ට පවතින තත්ත්වය සුදුසු නැති නිසා. තවත් 15% බැගින් රට හැර ගොස් ඇත්තේ ආකර්ෂණීය රැකියා ලැබීම හා තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසා. එදා හිටපු උසස් අධ්‍යාපන ඇමැතිවරයා හා අදාළ බලධාරීන් පුවත්පත් දැන්වීමකින් මේ ගැන ප්‍රසිද්ධ කර තිබුණා. ඒත් අපි දන්නේ නැහැ මේ තොරතුරු කොහොන් සොයා ගත්තද කියලා. එදා මේ අය කියා තිබුණා අය විය යුතු මුළු මුදල රුපියල් මිලියන 860 ක් කියලා. ඒත් මෙයින් භාගයක්වත් නැහැ කියලයි අපි කියන්නේ. ඔවුන් ශිෂ්‍යත්ව වටිනාකමත් මෙයට එකතු කළා. බොහෝමයක් ශිෂ්‍යත්ව ආචාර්යවරුන් ලබා ගන්නේ ඔවුනගේ දක්ෂතාව පෙන්වායි.

## ● ගිවිසුමට අනුව අයකර ගැනීමේ ක්‍රමවේදයක් තිබුණා

එදා මේ දේවල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම පුවත්පත්වල පළකර බලාපොරොත්තු වූයේ කුමක්ද? ඇත්තමට විශ්වවිද්‍යාල දාලා රට ගොස් සිටි සුළු පිරිසක් සිටියා. මේ අය නිසා අනිත් අයටත් සිදුවූණේ දැඩි අපහසුතාවකට ලක් වෙන්න. මෙම ගිවිසුම් කඩ කිරීමේදී හා එය අය කිරීමේදි බලය ඇත්තේ අදාළ විශ්වවිද්‍යාලවලට. නමුත් මේ අවස්ථාවේ විශ්වවිද්‍යාල කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන පුවත්පත්වල පළ කිරිම වැරදියි. ඒ වගේම මෙවැනි ගිවිසුම් ගත වෙද්දි එය කඩ කිරීම් කළහොත් නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග තිබෙද්දී ඒ කිසිවක් නොකර සිටිම වැරදියි" ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනයේ හිටපු සභාපති මහාචාර්ය කේ. කේ. අයි. යූ අරුණකුමාරය.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය පවසන පරිදි මේ වන විට යම් පිරිසක් තමනට ගෙවන්නට සිදුව ඇති මුදල් ප්‍රමාණයක් ගෙවා ඇතිද, එදා කියූ තරමේ විශාල මුදලක් අය කර ගැනීමට නැත. එසේම විශ්වවිද්‍යාල කොමිසම් සභාවට මේ සම්බන්ධ නීතිමය ක්‍රියාමර්ග ගැනීමට නොහැකි අතර ඔවුන්ට කළ හැක්කේ අදාළ විශ්වවිද්‍යාල වලට නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට යොමු කිරිමටය.කෙසේ වෙතත් මේ වන විට අපේ 15 ක්වූ ජාතික විශ්වවිද්‍යා පද්ධතියේ ජාත්‍යන්තර තලයේ විශ්වවිද්‍යාල බවට පත් වෙමින් තිබෙයි. විශ්වවිද්‍යාලවල ගුණාත්මක බවද දිනෙන් දින වැඩි වෙයි.

"මේ වන විට අපි විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් විශාල පරිවර්තනීය වෙනසක් සිදු කරමින් යනවා. සිසුන් ඇතුළත් කිරිම වසරින් වසර වැඩි කරමින් යනවා. ඒ නිසා මුලින්ම අපි මේ සංවර්ධන වැඩ වේගවත් කළ යුතුයි. අපේ විශ්වවිද්‍යාල පද්ධතිය ඉහළ ගුණාත්මක බවින් යුතු වෙනසක් ඇති කරනවා නම් මෙවැනි ගැටලු ඇති වීම අඩුයි. ඒ නිසා අපි වැඩි අවධානයක් විශ්වවිද්‍යාල පද්ධතියේ සංවර්ධනිය වැඩ කටයුතු කෙරෙහි යොමු කරන අතර, සමහර ආචාර්යවරු එවැනි ගිවිසුම් කඩ කිරීම් සිදු කර ඇති නම් ඒ කෙරෙහිත් අවධානය යොමු කරනවා. ......" ඒ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අදහසය.

කෙසේ වෙතත් නිදහස් අධ්‍යාපනයෙන් ඵල ප්‍රයෝජන ලබා ආත්මාර්තකාමිත්වයෙන් මෙසේ කටයුතු කිරීම උගත් බුද්ධිමතුන්ට නුසුදුසුය. දුපපත් ජනතාව ඔවුන්ව දැනුමින් පොහොසත් කරන්නේ තම දරුවන්ගේද අනාගත යහපත වෙනුවෙන්මය. ඒ නිසා එවන් පිරිසක් සිටි නම් ඊට නිසි ක්‍රියාමාර්ග ගැනීම බලධාරීන්ගේ වගකීමද වන්නේය.

---

● ලලිත් චාමින්ද - ගාල්ල



# දරුවන් 50 අඩු පාසල් 1,468 ක්...

**අප රටේ පාසල් පද්ධතිය වර්තමානයේ ජාතික පාසල් හා පළාත් පාසල් ලෙස පරිපාලනමය වශයෙන් බේදා වෙන්කොට තිබේ. මීට අමතරව ජාත්‍යන්තර හා පුද්ගලික පාසල්ද එම ජාලයට එකතුවී තිබේ. තම දරුවන් මෙරට ජනප්‍රිය පාසලකට ඇතුළත් කරගැනීම සෑම දෙමවුපියකුගේම එකම අභිලාෂය වේ. මෙරට පැවතිය යුතු පාසල් සංඛ්‍යාව රටේ ජනඝණත්වය අනුව තීරණය කළ යුතු වේ. ඒකොයිහැටි වුවද පාසල්වල ජනප්‍රියභාවය අනුව අදාළ ප්‍රදේශයෙන් පරිබාහිර ප්‍රදේශවල සිට දරුවන් අධ්‍යාපන කටයුතු සදහා පැමිණීම හේතුවෙන් මෙරට පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව අසමතුලිතව ව්‍යාප්තව ඇත.**

අප රටේ පාසල් සංඛ්‍යාව 10.165කි. ඉන් පාසල් 5161ක් එනම්, ඉන් හරි අඩක් ශිෂ්‍ය සංඛ්‍යාව 200ට අඩු පාසල්ය. 2019 වර්ෂයට අදාළ පාසල් සංගණන වාර්තාව අනුව පාසල් සිසු දරු දැරියන් 50ට අඩු පාසල් සංඛ්‍යාව 1468කි. පළාත් වශයෙන් ගතහොත් බස්නාහිර පළාතේ සිසු දරු දැරියන් 50ට අඩු පාසල් සංඛ්‍යාව 78කි. මධ්‍යම පළාතේ පාසල් 231කි. දකුණු පළාතේ පාසල් 114කි; උතුරු පළාතේ පාසල් 264කි; නැගෙනහිර පළාතේ පාසල් 151කි; වයඹ පළාතේ පාසල් 135කි; ඌව පළාතේ ඇති එවැනි පාසල් සංඛ්‍යාව 150කි. සබරගමු පළාතේ සිසු දරු දැරියන් 50ට අඩු පාසල් සංඛ්‍යාව 227කි. උතුරුමැද පළාතේ ඇති පාසල් සංඛ්‍යාව 110කි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 වර්ෂයට අදාළ පාසල් සංගණන වාර්තාව අනුව බස්නාහිර පළාතේ සිසු දරු දැරියන් 200ට අඩු පාසල් සංඛ්‍යාව 447කි.මධ්‍යම පළාතේ 804කි. දකුණු පළාතේ 530කි උතුරුපළාතේ 642කි. නැගෙනහිර පළාතේ පාසල් 549කි. වයඹ පළාතේ 607කි. උතුරුමැද පළාතේ 419කි; ඌව පළාතේ 492කි; සබරගමුව පළාතේ 632කි.

රජය මගින් පාසල් දරුවන් 50ට වඩා අඩු පාසල් මෙන්ම 200ට වඩා අඩු පාසල් නඩත්තු කළ යුතුය. අනිකුත් පාසල්වලට මෙන්ම දරුවන් 50 දෙනෙකු ඉගෙනුම ලැබුවද එකී පාසල් සඳහා ගුරුවරු ලබාදිය යුතුය. ඒ විතරක් එවැනි පාසල්වලට අවශ්‍ය භෞතික සම්පත් ලබාදිය යුතුය. ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල් බිහිවීමට කරුණු ගණනාවක් බලපා තිබේ. මින් ප්‍රධානම කාරණය වන්නේ දරුවන් කුඩා පාසල්වලට යැවීමට දෙමව්පියන්ගේ ඇති අකමැත්තයි.

ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල් වල ඉගෙනුම ලබන දරු දැරියන්ගෙන් අති බහුතරයක් දිළිඳු පවුල් වල දරුවන්ය. මෙකී පවුල්වල මවට හා පියාට ස්ථිර රැකියාවක් නැත. ඇතැම් පවුල් විසිරුණු පවුල්ය. දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට දෙමවුපියන්ට වුවමනාවක් නැත. දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වියදම් කිරිමට ප්‍රමාණවක් ආදායමක් ද නැත. අනික් කාරණය වන්නේ වතු ආශ්‍රිත පාසල් බෝහොමයක් ළමුන් 50ට අඩු පාසල්ය. ජාතික පාසල් මෙකී පාසල් අවට පිහිටා තිබීමද මෙකී පාසල්වල ළමුන්ගේ සංඛ්‍යාව අඩුවිමට හේතුවී ඇත.

එමෙන්ම ගුරුවරු මෙවැනි පාසල්වල ඉගැන්වීමට වැඩි කැමැත්තක් නොදැක්විම, හුදකලා ගම්මාන පැවතීම ආදී හේතු මේ සඳහා බලපා තිබේ. එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති නිර්ණායක වලට පටහැනිව නව පාසල් ආරම්භ කිරීම නිසා එම පාසල අවට ඇති අනිකුත් පාසල් වැසියාමට හේතුවී තිබේ. මෙකී පාසල් වැසී යෑම වළක්වා ගැනීම සඳහා විදුහල්පතිවරු හා ගුරුවරු මහත් වෙහෙසක් දරමින් කටයුතු කරති. ළමුන් සිය පාසල වෙත ඇතුළත් කරගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිත කරති. අනික් කාරණය වන්නේ මෙවැනි පාසල්වල විභාග ප්‍රතිඵලවල වර්ධනයක් අපේක්ෂා කළ නොහැකි වීමයි. මෙකී පාසල් සතුව විශාල භූමි ප්‍රමාණයක් හා ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් පවතින අතර එම සම්පත්වලින් නිසි ප්‍රයෝජනයක් ගැනිමට නොහැකි වී ඇත. මෙවැනි අතැම් පාසල්වල අතිරික්ත ගුරුවරු සිටීම නවීන භෞතික සම්පත් නැතිවීම, ද දැකිය හැකිය. මෙවැනි පාසල් නඩත්තු කිරීම සඳහා රජයට විශාල වැය බරක් දැරීමට සිදුවී ඇත.

කෙසේවුවද මෙකී ගැටලු අවම කිරීම සඳහා බලයට පත්වූ රජයන් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීය. විවිධ භෞතික සම්පත් පාසල් වෙත ලබා දී තිබුණි. හොඳම පාසල ළඟම පාසල ව්‍යාපෘතිය මේ අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතියකි. කෙසේවුවද 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ පාසල් 83ක් ළමුන් නැති වීම, රටේ පැවති වාතාවරණය හා වෙනත් හේතු, මත තාවකාලිකව වසා දමා තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන වලට අනුව 2018 වර්ෂයේ දී පාසල් 101ක් වසා දමා තිබුණි. හොඳම පාසල ළඟම පාසල් ව්‍යාපෘතියෙන්ද මෙකී ගැටලුව අවම කිරීම සඳහා විසඳුමක් ලැබී නොතිබුණි.

කෙසේ වුවත් ගාල්ල දිස්ත්‍රික් යටිතල පහසුකම් සංවර්ධන කමිටු රැස්වීමේ දී අධ්‍යාපන ඇමති මහාචාර්ය ජී.එල් පීරිස් මේ ගැන කතා කළේය. මෙරට පාසල්වල ශිෂ්‍ය සංඛාව ව්‍යාප්ත වීමේ අසමතුලිතතාව පිළිබඳ ඇමතිවරයා කිවේ මෙවැනි කතාවකි.









අධ්‍යාපන ඇමති මහාචාර්ය ජී.එල් පීරිස්, දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලි ගමගේ, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් රංජිත් යාපා සහ දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිමල් දිසානායක

'අපේ උත්සාහය වෙලා තියෙන්නේ හැකිතාක් දුරට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා විශාල ආයෝජනය කිරීම වෙනුවට වර්තමානයේ පවතින සම්පත් දියුණු කරලා අප සතුව පවතින මුල්‍ය සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමයි. මෙරට තියෙන පාසල් අතුරින් ළමුන් 500ට අඩු පාසල් තියෙනවා සියයට 73.6ක්. පාසල් 10.165න් සියයට 73.6ක් තියෙනවා ළමුන් 500ට අඩු පාසල්. ළමුන් 51 යි 100 අතර පාසල් 1500ක් විතර තියෙනවා.මේ තුළින් පේනවා සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් අවශ්‍යයි කියලා. ළමුන් 50ක් ඉන්න පාසලකට වුවත් ගුරුවරු වෙන්කරන්න ඕන. මුදල් වෙන් කරන්න අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් කඩිනමින් වැඩපිළිවෙළකට අවතීර්ණ වීම ඉතා වැදගත් වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාතික පාසල් වැඩපිළිවෙළ අපි ආරම්භ කරනවා. අදියර දෙකක් යටතේ එය ක්‍රියාත්මක කරනවා. පළමු අදියර යටතේ පාසල් 123 දෙවැනි අදියර යටතේ පාසල් 673ක් තෝරා ගන්නවා. ඒ සඳහා මුදල් ලැබී තියෙනවා. පළමු අදියර සඳහා රුපියල් මිලියන 950ක් හා දෙවැනි අදියර සඳහා රුපියල් මිලියන 1000ක් වෙන් කරනවා. රුපියල් මිලයන 950න් 450ක් උපකරණ සඳහා වෙන් කරනවා. අනික් මිලියන 500 පුනරුත්ථාපන කටයුතු සඳහා වෙන් කරනවා'

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනවලට අනුව දකුණු පළාත තුළ සිසු දරු දැරියන් 50ට අඩු පාසල් සංඛ්‍යාව 114කි.ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 45ක්, මාතර දිස්ත්‍රික්කයේ පාසල් 42ක් හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් 27 ක් තිබෙන බව දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක නිමල් දිසානායක පවසන්නේය.

අනිකුත් පාසල්වලට මෙන්ම මෙකි පාසල් සඳහා අවශ්‍ය භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් ලබාදිය යුතුව තියෙනවා. හුදෙකලා නොවූ පාසල් හැර සිසු දරු දැරියන් 50ට අඩු පාසල් සංඛ්‍යාව අවම කරගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය සමග එක්ව් සැලසුම් සකස් කරනවා. මේ සඳහා රේඛීය අමාත්‍යාංශය සමග එක්වී එකාබද්ධ වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර; හුදෙකලා පාසල් හැර අනිකුත් පාසල් වෙනත් පාසල් සමග එකාබද්ධ කළයුතු බවට යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. සිසු දරු දැරියන් 50ට අඩු පාසල් සඳහා විදුහල්පතිවරයකු ඇතුළු අවම වශයෙන් ගුරුවරු 07 දෙනෙකු යෙදවිය යුතුව ඇති බවද ඔහු කීවේය.

දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලි ගමගේගෙන් ද මේ සම්බන්ධව අපි විමසීමක් කළෙමු.

මෙකි පාසල් සම්බන්ධයෙන් ගත යුතු තීන්දු තීරණ පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලෙස දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දී තියෙනවා. මෙම පාසල් පිළිබඳ අපි තවම තීන්දුවක් ගෙන නැහැ. ඵලදායි නැති පාසල් ඵලදායි කටයුත්තකට යෙදවිය යුතු වෙනවා. ගුරුවරු 10යි ළමුන් 30ක් තියාගෙන පාසල් පවත්වාගෙන ගිහින් වැඩක් නැහැ. රජයේ ප්‍රතිපත්තියට අනුව එම පාසල් ඵලදායි කටයුත්තකට යොදවනවා. අධ්‍යාපන සම්බන්ධව වෙනත් වැඩකට යොදවන්න පුළුවන්. දරුවන්ගේ පාසල් යෑමේ අයිතිය තහවුරු කළ යුතුව ඇති බවද ආණ්ඩුකාරවරයා සඳහන් කළේය.

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් රංජිත් යාපාගෙන් මේ සම්බන්ධව අප කළ විමසුමකදී මෙසේ කීවේය.

මෙකී පාසල්වල ඇතැම් පන්තිවල දරුවන් එක්කෙනයි දෙන්නායි ඉගෙනුම ලබන්නේ. ඇත්තටම මෙය ඉතා සංවේදී කාරණයක්. මෙකී පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට කණ්ඩායම් ක්‍රියාකාරකම් යෙදෙන්න අවස්ථාවක් නැහැ. එක අතකින් ඒ දරුවන්ට ද අසාධාරණයක් වෙලා තියෙනවා. තවම මේ සම්බන්යෙන් ස්ථිර තීන්දුවක් අරගෙන නැහැ. පාසල් එකාබද්ධ කිරීම වෙන්න පුළුවන්, නැතිනම් සෞභාග්‍යා පාසලක් විදියට සංවර්ධනය කරන්න පුළුවන්. වෙනත් මහා විද්‍යාලයක් සමග එකාබද්ධ කරන්න පුළුවන් මෙවැනි යෝජනා කිහිපයක් තියෙනවා. මෙවැනි පාසල් වහනවා කියලා තීන්දුවක් නැහැ. මේ සම්බන්ධයෙන් සාකච්ඡා මට්ටමේ තමයි තියෙන්නේ. මාසයක් වගේ කාලයක් ඇතුළත මේ සම්බන්ධව අවසන් තීන්දුවක් ගන්නවා. බොහෝ විට එකාබද්ධ කිරීම තමයි කරන්න වෙන්නේ. මේ සම්බන්ධයෙන් පැති කිහිපයකින් බැලිය යුතුයි. පුළුල් සාකච්ඡාවක් කරලා තමයි තීරණය ගන්න වෙන්නේ. මෙය ලොකු ප්‍රශ්නයක් විදියට අපි හඳුනාගෙන තියෙනවා යැයිද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සඳහන් කළේය.



# නාගදීපය රැකගත් නවදගල පදුමකිත්ති නා හිමි

● තාරක වික්‍රමසේකර

**අතීතයේ යතිවරුන් දිවි හිමියෙන් බුදු දහම රැක ගන්නට කටයුතු කළත් මෑත අඩ සියවස තුළ ජාතිය ආගම වෙනුවෙන් එවන් අමරණීය සේවාවක් කළ හිමිවරුන් ගැන අපට අසන්නට දකින්නට නොලැබෙතත් බුදුරජාණන් වහන්සේගේ පාද ස්පර්ශයෙන් පවිත්‍ර වූ නාගදීප ඓතිහාසික පුද බිම රැක ගන්නට කටයුතු කළ හිමිවරුන් අතර නවදගල පදුමකිත්ති හිමියන්ගේ නාමය අමරණීය වනු ඇත.**

පදුමකිත්ති හිමියෝ උපත ලැබුවේ 1961 වසරේ අප්‍රේල් මස 3 වැනිදාය. ඒ ඇල්පිටියේ නවදගල ගම්මානයේ පදිංචිව සිටි බීටින් මැන්දිස් හා රොසලින් නෝනාගේ බඩපිස්සා ලෙසිනි. ගිහි නම වූයේ පදුමසිරි මැන්දිස් වන අතර පද්මසිරිට සහෝදර සහෝදරියන් 8 දෙනෙක් විය.

ඇල්පිටිය නවදගල මහා විදුහගේ අකුරු කළ පද්මසිරි පාසල් කාලයේදී ගමේ කොල්ලො කුරුට්ටන් සමඟ බට්ටා පනිමින් අඩදබර කරගත්තද ගමේ පන්සලට ගොස් මල් පහන් පූජා කිරීමටද කැමැත්තක් දැක්වීය. පද්මසිරිගේ පවුලට නෑකමක් ඇති බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස නා හිමියෝ පදුමසිරි පැවිදි කරන්නේ මේ අතරය. ඒ නවදගල පද්මකිත්ති තිස්ස නමින් නාගදීපයේදීය. ඒ වන විට පද්මසිරිගේ වයස අවුරුදු 11කි.

කොළඹ දෙමටගොඩ විද්‍යාංලකාර පිරිවෙන (අද විද්‍යාලංකාර විද්‍යාපීඨය) හා අනුරාධපුර සාරානන්ද පිරිවෙනින් අධ්‍යාපනය ලබන්නට උන්වහන්සේ කටයුතු කළද උන්වහන්සේගේ වයස අවුරුදු 22ක් වන විට ත්‍රස්තවාදී යුද්ධය ආරම්භ විය. උන්වහන්සේගේ අධ්‍යාපනය මුළුමනින්ම කඩාකප්පල් විය. 1985 වසරේ ජූනි මස 14 වැනිදා පදුමකිත්ති හිමියන්ගේ උපසම්පදාව සිදු කෙරුණේ බලපිටිය මෝය කටේ ඉදි කරන ලද සීමා මාලකයේදීය. ඒ කොටි ත්‍රස්තවාදී තර්ජන මැද ගුවන් මඟින් කොළඹට වැඩම කරමිනි.

එල්ටීටීඊ සංවිධානය හා ජේ.ආර්. ජයවර්ධන රජය සමයේ ඇති කරගත් සාම ගිවිසුම නිසා දකුණේ ජනතාව උතුරට පැමිණියද මූහමාලේ හා ඕමන්තේ කොටි ත්‍රස්තවාදී මුරකපොලුවලදී ඒ හරහා ගෙන යන සියලුම භාණ්ඩවලට බදු අය කරන ලදී. එකල සිටි සියලු මැති ඇමැතිවරුන් මෙන්ම මුරපොළ පසු කර යන සෙසු සියලු දෙනා බදු ගෙවා ගමන් ගත්හ. එහෙත් පදුමකිත්ති හිමියෝ අවස්ථා කිහිපයකදී කොටි සංවිධානයේ පිරිස් වෙත දැඩි ලෙස දෝෂාරෝපණය කළහ. එක් වරක් නාගදීපයට ගෙන ගිය පොත් පත්‍රිකා තොගයකට රුපියල් 15,000ක බදු නියම කළ අවස්ථාවේදී උන් වහන්සේ ඕමන්ත මුරපොළ දෙවනත් කළේ 'එක සත පහක් දෙන්නෙ නැහැ, රජවරුවත් පන්සල්වලට බදු අය කෙළේ නැහැ ' යනුවෙන් හඬ නගමිනි. අවසානයේ බද්ද රුපියල් 1000ක් දක්වා අඩු කරන්නට කොටි සංවිධානයේ එතැන සිටි නායිකාවක් විසින් කටයුතු කළද පදුමකිත්ති හිමියෝ එයටද අවනත නොවූහ.

තවත් විටෙක විහාරස්ථානයට රැගෙන ගිය ත්‍රිරෝද රථයකට රුපියල් 17,500ක බදු නියම කළ අවස්ථාවේද පදුමකිත්ති හිමියෝ දැඩි විරෝධයක් එල්ල කළහ.

පදුමකිත්ති හිමියන් ආරක්ෂක අංශ හා සබඳතා ඇති බව දැනගත් කොටි සංවිධානය උන් වහන්සේ මඟින් හමුදා නිලධාරීන්ගේ තොරතුරු ලබා ගන්නට තැත් කෙළේ උන් වහන්සේට මුරපොළ හරහා ඕනෑම භාණ්ඩයක් ගෙන යාමට අවසර ලබා දෙන බවද පවසමිනි. මුදල්ද ලබා දෙන බව පවසමිනි. එහෙත් රටත් ජාතියත් පාවා දෙන්නට උන් වහන්සේ කිසි විටෙක කටයුතු නොකළාක් මෙන්ම ත්‍රස්තවාදීන්ගේ එම ක්‍රියාව හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ටද දන්වන ලද්දේ ජීවිතය ගැන පවා නොතකාය.



පදුමකිත්ති නා හිමියන් යුද සමයේදී බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති නා හිමියන් සමඟ

ත්‍රස්තවාදීන් කුරිකඩ්ඩුවාන් ජැටියේ සිට නාගදීපයට මෝටාර් ප්‍රහාර එල්ල කළ නිසා නාගදීප නාවික හමුදා කඳවුරට අමතරව නාගදීප විහාරස්ථානයේද වහලේ මෝටාර් විදිනයක් සවි කරන ලදී. එයට මෝටාර් ඇතුළත් කිරීමට සහාය ලබා දුන්නේ පදුමකිත්ති හිමියන්ය. එසේම නාගදීපයේ නාවික මුරකපොලු තුළ රැය පහන් කරන නාවික සෙබළුන් හා එක්ව රාත්‍රිය පුරාම එය තුළට වී තේ කෝපි වළඳමින් රාත්‍රියම එතුළ ගත කරන්නට පදුමකිත්ති හිමියන් කටයුතු කරන ලදී. පදුමකිත්ති හිමියන් බර අවි ඇතුළු සියලුම අවිවලින් වෙඩි තබන්නටද පුහුණුව ලබන ලදී. එවන් අත්දැකීම් ඇති භික්ෂූන් වහන්සේ නමක් මෙරට තුළ තවත් නොමැත.

'සමහර අය හිතන්න පුළුවන් ගිනි අවි පුහුණුව භික්ෂූන් වහන්සේට අකැපයි එහෙම කිරීම සුදුසුද කියලා. මම එහෙම කෙළේ නාගදීපය රැකගන්න මිසක් ජීවිත හානි කරන්න නෙමෙයි. අනෙක් එක මම රෑ එළිවෙනකල් නාවික කඳවුරුවල හිටියෙ ආසාවට නෙමෙයි. ඒ විරුවො අපේ විහාරස්ථානය රැකගන්න යුද වදිනකොට අපිට සැතපිලා ඉන්න පුළුවන්ද? ඒ පදුමකිත්ති හිමියන්ගේ අදහසයි.

පදුමකිත්ති හිමියන්ගෙන් මා වරක් විමසුවේ අවුරුදු තිහක යුද්ධයට මැදිව සිටියදී ඇති වුණු හැඟීම් මොනවාද යන්නයි. උන් වහන්සේ පැවසුවේ 'නායක හාමුදුරුවොත් මමත් මරණයත් අතින් අරගෙන මෙහි ජීවත් වුණා. ඒත් අපේ ආරක්ෂාවට නාවික හමුදාව එදා සිටම කළ මෙහෙය කියා නිම කරන්න බැහැ' යනුවෙනි. 'එම අත්දැකීම් ජීවිතයට බලපෑ ආකාරය ගැන ජනතාවට කිව හැක්කේ කුමක්ද?' යන්න විමසා සිටි අවස්ථාවේදී උන් වහන්සේ මුද්‍රිත කොළයක් මා අත තැබුවේ 'මෙන්න මේ ටික රටේ හැමෝටම දැන ගන්න පළ කරන්න' යනුවෙනි. එය අඩුවක් නැතිව මෙහි පළ කරමි.

'මගේ භික්ෂු ජීවිතයේ වටිනාම කාල පරිච්ඡේදය වන යෞවන සමය මුළුමනින්ම ගෙවී ගියේ බිහිසුණු යුද්ධය මැද්දේය. එය සුළුපටු කාලයක් නොවේ. වසර තිහකට අධික කාලයකි. එ සමයෙහි සෙසු භික්ෂූන් මෙන් මට සුමධුර ධර්ම දේශනා කරන්නට අවස්ථාවක් නොවීය. මම ධර්ම දේශනයක් කළා නම් ඒ හමුදා කඳවුරක පිංකමකදී කළ කෙටි දම් දෙසුමක් පමණි. මට ධර්ම කාරණා අඩංගු වටිනා පොතපත කියවන්නට විවේකයක් නොතිබිණි. මගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම යුද්ධය විසින් උදුරා ගත්තේය. උදේ පටන් ගතවන සෑම මිනිත්තුවක් පාසා මගේ ජීවිතය ගෙවී යන්නට වූයේ වෙඩි හඬ මැද්දේය.

මම කඩවසම් භික්ෂුවක් නොවෙමි. සුමධුර හඬක් ද මා සතුව නැත. ගිනි කාෂ්ඨක අවිරශ්මිය, කරදිය මිශ්‍ර සුළඟ, පෝෂ්‍යදායි ආහාර නොමැතිකම, දීර්ඝ කාලීන යුද්ධය විසින් මා තළා පෙළූ මානසික පීඩනය ඇතුළු කාරණා හේතුවෙන් මගේ සිරුර කර්කශ විය. අදටත් එහි වෙනසක් නැත.

ත්‍රස්තවාදීන් බිම්බෝම්බ අටවා ඝාතනයට ලක් කරන හමුදාවේ නිලධාරීගේ සිරුරු සොයා ගැන්මටවත් නොහැකි වූ අවස්ථා තිබුණි. ඒ අවස්ථාවලදී කඳවුරු තුළ පවත්වන පාංශුකුල පින්කම් වෙනුවෙන් උන් වහන්සේත් නායක හිමියනුත් වැඩම කරන්නේ නාවික යාත්‍රා මඟින් කරෙයිනගර් හරහාය. එම අවස්ථාවලදී ත්‍රස්තවාදීන් එම යාත්‍රාවලට පහර දුන්නේ වරක් දෙවරක් නොවේ. කරෙයිනගර් නාවික කඳවුරේ සිට ගුවන් ගත වන හෙළිකොප්ටර් යානාවලටද ත්‍රස්තයෝ පහර දුන්හ. ත්‍රස්තයන්ගේ එම ඉලක්කයන්ට අසු නොවන සේ හෙළිකොප්ටර්, යානා ගුවන් ගත කරන්නේ කරණම් ගසමිනි. දානය වළඳා මුහුදින් වැඩම කිරීමෙන් පසු හෙළිකොප්ටරේ එසේ කරණම් ගසන විට දානය උගුරින් එළියට පැමිණෙන තරම් වේදනා දුන් අවස්ථාද තිබේ. ඇතැම් විට හෙළිකොප්ටරය ගුවන් ගත වන විට හෝ ගොඩ බස්වන විට සුළඟේ වේගයට පොරවා ගෙන සිටින ගැලවී මුහුදට ගිය අවස්ථාද විය. තෙත බරියම් වූ සිවුරු පොරවාගෙන පාංශුකුලය ලබා දුන් අයුරු අදත් පදුමකිත්ති හිමියෝ සිහිපත් කරති.

නායක හිමියන් අසනීප වී ගුවන් මඟින් කොළඹට වැඩම කිරීමට සිදුවන අවස්ථාවලදී උන් වහන්සේ වැඩම කළේ බරපතළ තුවාල ලැබ අතපය පවා අහිමිව මර ළතෝනි දුන් සෙබළුන් ගමන් ගත් හෙළිකොප්ටරයේය. හෙළිකොප්ටරයේ වැඩම කරද්දී තුවාල වූ සෙබළුන්ගේ ගලා ගිය රුධිරයෙන් පොරවා ගෙන සිටි සිවුරු රත් පැහැ ගැන්වූ අවස්ථා ගැනද උන්වහන්සේ සිහි කරන්නේ බලවත් ශෝකයෙනි.

> **මගේ භික්ෂු ජීවිතයේ වටිනාම කාල පරිච්ඡේදය වන යෞවන සමය මුළුමනින්ම ගෙවී ගියේ බිහිසුණු යුද්ධය මැද්දේය. එය සුළුපටු කාලයක් නොවේ. වසර තිහකට අධික කාලයකි. එ සමයෙහි සෙසු භික්ෂූන් මෙන් මට සුමධුර ධර්ම දේශනා කරන්නට අවස්ථාවක් නොවීය. මම ධර්ම දේශනයක් කළා නම් ඒ හමුදා කඳවුරක පිංකමකදී කළ කෙටි දම් දෙසුමක් පමණි. මට ධර්ම කාරණා අඩංගු වටිනා පොතපත කියවන්නට විවේකයක් නොතිබිණි. මගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම යුද්ධය විසින් උදුරා ගත්තේය. උදේ පටන් ගතවන සෑම මිනිත්තුවක් පාසා මගේ ජීවිතය ගෙවී යන්නට වූයේ වෙඩි හඬ මැද්දේය.**
>
> **මම කඩවසම් භික්ෂුවක් නොවෙමි. සුමධුර හඬක් ද මා සතුව නැත. ගිනි කාෂ්ඨක අවිරශ්මිය, කරදිය මිශ්‍ර සුළඟ, පෝෂ්‍යදායි ආහාර නොමැතිකම, දීර්ඝ කාලීන යුද්ධය විසින් මා තලා පෙලූ මානසික පීඩනය ඇතුළු කාරණා හේතුවෙන් මගේ සිරුර කර්කශ විය. අදටත් එහි වෙනසක් නැත.**



ඒ සියලු බාධා මැද උන් වහන්සේ නා හිමියන් හා එක්ව නාගදීප පුදබිම රැක ගත්හ. නාවික හමුදාව හා එක්ව නාගදීපයේ වෙසක් පින්කමක් පවත්වත්දී පන්සිල් දීම ආරම්භ කළ විටම ත්‍රස්තවාදීහු එයට මෝටාර් ප්‍රහාර එල්ල කළහ. නාවික හමුදාවේ නිලධාරීන් හා සෙබළුන් ප්‍රතිප්‍රහාර පිණිස කඳවුරට දිව ගියද උන් වහන්සේ ජීවිත අවදානම පවා නොතකා තනිවම පන්සිල් දී විහාරයට වැඩම කළහ.

අවසන් මානුෂීය මෙහෙයුමට පෙර නාගදීපයට අඛණ්ඩ ත්‍රස්ත ප්‍රහාර එල්ල වෙද්දී නාවික හමුදාවට පවා දින දෙක තුනක් විහාරයේ දාන මාන කටයුතු ගැන සොයා බලන්නට අවස්ථා නොවීය. එම අවස්ථාවේදී විහාරය පිටුපස වැලේ තිබූ වට්ටක්කා ගෙඩි ලුණු දමා තම්බා නායක හිමියන්ටද දානය සපයා තමන් වහන්සේද වළඳමින් උන් වහන්සේ විසින් ගත කළ ජීවිතය මෙරට කිසිදු භික්ෂූන් වහන්සේ නමක් අත්විඳ නැත. ජීවිත අවදානම් තත්ත්වය නිසා කොළඹට වැඩම කරන්නැයි කොළඹ වැඩ සිටි හිමිවරුන් දැනුම් දුන්නද කිසිදු හේතුවක් මත නාහිමියන් හෝ පදුමකිත්ති හිමියන් නාගදීපයෙන් පිටමං වූයේ නැත.

නායක හිමියන් 2003 වසරේ අපවත්වීමෙන් පසු සියලු ආගමික කටයුතු පමණක් නොව දූපතේ ජනතාවගේ කටයුතු පවා උන් වහන්සේට සොයා බලන්නට සිදු විය.

2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් පසුව වන්දනාකරුවන්ට නාගදීපයට බාධාවකින් තොරව පැමිණීමට උන් වහන්සේ අවශ්‍ය පසුබිම සකස් කළහ.

අද වන විට නාගදීපයේ අලංකාර නාග තොරණක් ඉදි කර ඇත. එමෙන්ම සිරිපතුලක් මෙන්ම බ්‍රාහ්මණවත්තේ නා හිමි අනුස්මරණ මන්දිරයක් ඉදි කර තිබේ. සුදු බෝධියක්ද උන් වහන්සේ විසින් රෝපණය කර තිබේ. දූපතේ අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් නිවාස තනා දීමටද උන් වහන්සේ කටයුතු කරන ලදී. අදටත් විහාරස්ථානයේ වැඩ කටයුතු කරන කුමරන් වසර 40ක් එහි සේවය කරන අයෙක් වන අතර ඔහුටද නිවසක් තනා දෙන්නට පදුමකිත්ති හිමියෝ කටයුතු කළහ. එමෙන්ම දිළිඳු ජනතාවගේ අවමංගල්‍යයක් වූ විට දේහය තබන්නට පෙට්ටියක් ලබා ගන්නට මුදල් නොමැතිව දියණිවරුන් විවාහයට පත් කිරීමට නොහැකිව සිටින මවුපියන්ට මුදල් ලබාදීමට පවා උන් වහන්සේ කටයුතු කර තිබේ. කොරෝනා රෝගය පැතිර යාම නිසා ඇඳිරි නීතිය පැනවූ විටදී දූපතේ අඩුආදායම්ලාභී සියලු ජනතාවට අවශ්‍ය අහාර පාන ලබා ලබා දෙන්නට උන් වහන්සේ කටයුතු කළහ.

සැබෑ සංහිඳියාව යනු කුමක්දැයි උන් වහන්සෙ අපට පසක් කර දුන්හ. පදුමකිත්ති හිමියන් පවසන්නේ මෙරට විහාරස්ථානයකට දශක ගණනාවක්ම උදෑසන හා දහවල් දානය සපයා දෙන්නට කටයුතු කළ එකම දෙමළ ජාතිකයා ගැනද සඳහන් කළ යුතුම බවයි. ඒ නාගදීපයේ සිටි රාමචන්ද්‍රන් මුදලාලිය. වර්තමානයේ නාගදීපයෙ මුහුදු පතුළේ නාග විමනක් ස්ථාපිත කර එහි අඩි 150ක අභය මුද්‍රාවෙන් නිර්මිත බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමට පදුමකිත්ති හිමියෝ කටයුතු කරමින් සිටිති. එය සාර්ථකව අවසන් කරන්නට හැකි වුවහොත් තමන් වහන්සේ දිවි හිමියෙන් රැකගත් නාගදීපය ගැන සතුටට පත්විය හැකි බව උන්වහන්සේ පවසති.

අප්‍රේල් 3 වැනිදා අවුරුදු 60 සපුරන උන්වහන්සේ විසින් සිදු කරන ලද ආගමික ශාසනික සේවාව මෙන්ම සංහිඳියාව මෙරට වෙනත් කිසිදු භික්ෂූන් වහන්සේ නමකට කිසිදු දිනක කළ හැකිවේයැයි සිතන්නට පවා අපහසුය. එවන් අතිවිශාල සේවාවක් කළ උන්වහන්සෙට නිකායෙන් ලබා දුන් උත්තර ලංකාවේ ප්‍රධාන සංඝනායක ධුරය පමණක් හිමිව තිබීම කනගාටුවට කරුණකි.

# කැනඩාවේ වීදි පොත් ගුල පේරාදෙණියටත්



● අසේල කුරුළුවංශ

**පුස්තකාලයක් නැත්නම් පොත් ගුලක් කිව්වම අපි කාගේත් සිත්වල මැවෙන්නේ පිළිවෙළකට රාක්ක වල අසුරා ඇති පොත් සිය දහස් ගණනක් තිබෙන තැනකි. එසේ වුවත් පුස්තකාලාධිපතිවරයෙකු හෝ කාර්යමණ්ඩලයක් නොමැතිව පාඨකයේ විසින්ම පාලනය කරනු ලබන පුස්තකාල අපට ආගන්තුකය. එළඹෙන බක් මහේ සියවසක් සපිරෙන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාලයට තරමක් නුදුරින් පිහිටි ගම්මානයක තිබෙන පුස්තකාලාධිපතිවරයෙක් නොමැති සාමාජිකත්වයක් පිරිනොනමන වීදි පොත් ගුලක් පිළිබඳ කතාව අපට මුලින්ම දකින්නට ලැබුණේ මුහුණු පොතෙනි.**

පේරාදෙණියේ සිට දොළුව මාර්ගයේ කිලෝ මීටර 10 ක පමණ දුරක් ගිය පසු මෙගොඩ කළුගමුවේ මවුන්ට් රේන්ජ් කොටසේ නිවසක් ඉදිරිපිට දකින්නට ලැබුණු මේ පොත්ගුල හරියට කුරුලු කූඩුවක් වැනිය. කුඩා නිවසක ආකෘතියකට අනුව දැවයෙන් නිර්මාණය කර තිබෙන පොත් ගුලෙන් පොතක් රැගෙන යාමට කිසිවෙකුගේ හෝ අවසරය අවශ්‍යය නැත. ගෙන ගිය පොත යළි එහි ගෙනැවිත් තබන්නට කවුරුවත්ම බලපෑම් කරන්නේද නැත. රැගෙන ගිය පොත කියවා යළි පොත් ගුලේ තැන්පත් කිරීම එය ගෙනගිය කෙනාගේ යුතුකමය. ඒ අනුව මෙය දැනුම පමණක් නොව විශ්වාසය, මනුෂ්‍යත්වයද ඉහළට ඔසවා තබන්නාවූ සංකල්පයක් යැයි කීම නිවැරදිය.

වීදි පොත්ගුල අපට ආගන්තුක වුවත් ලොව දියුණු රටවලට එසේ නොවන්නේය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වන දුල්මා කරුණාරත්න මෙරටට වීදි පොත්ගුල් හඳුන්වාදීමේ ක්‍රියාවලියේ නියමුවාය. පර්යේෂණ හා අධ්‍යයන කටයුත්තක් සඳහා කැනඩාවේ විශ්ව විද්‍යාලයකට ගොස් සිටින ඇය එරට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන වීදි පොත්ගුල් සංකල්පය හඳුන්වාදීමට කටයුතු කළේ මෙගොඩ කළුගමුවේ පිහිටි ඇගේ නිවෙස ඉදිරිපිට පොත්ගුලක් නිර්මාණය කරමිනි.

"ලෝකයේ බොහෝ රටවල මංමාවත් වල මේ වීදි පොත්ගුල් දක්නට ලැබෙනවා. තමන් කියවා අවසන් කළ පොත් අනෙක් අයටත් කියවන්න අවස්ථාව ලබාදීම පිණිස ඇතැම් අය තමන්ගේ නිවස ඉදිරිපිට පොත්ගුලක් හදලා ඒ පොත්ටික එහි තැන්පත් කරනවා. වීදියක පිහිටලා තිබෙන නිවාස වල වැඩි පිරිසක් තමන් කියවන පොත් මේකට දාලා මෙතනින් අලුත් පොත් කියවන්න අරගෙන යනවා. ඉබි යතුරු දාලා වහන්නේ නැති නිසා ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක ඇවිත් මෙතනින් පොතක් අරගෙන යන්න පුළුවන්. මේ වගේ දෙයක් ක්‍රියාත්මක කරන්න ගියාම අපිට ඇතිවන ලොකුම ප්‍රශ්නය පොත් ගුලෙන් කියවන්න ගෙන යන පොත් ආපසු රැගෙන විත් ඒ තුළ තබයි ද කියන කාරණය යි. මෙතනදී තමයි දැනුම සහ මනුෂ්‍යත්වය කියන කාරණා දෙක ඉස්මතු වෙන්නේ. සාමාන්‍ය පුස්තකාලයකින් පොතක් නිකුත් කරන්නේ බැඳීම් ගණනාවකට අපව යටත් කරමිනුයි. පොත තියාගන්න පුළුවන් කාලයක් තියෙනවා. ගෙනියන්න පුළුවන් පොත් ප්‍රමාණයක් තිබෙනවා. සාමාජිකත්වය ගන්න ඇපකරුවෝ අවශ්‍යයි. විශ්ව විද්‍යාල පුස්තකාල බාහිර සමාජයේ අයට භාවිත කරන්න අවස්ථාව ලැබෙන්නේ හරිම අඩුවෙන්. මෙතනදී ඒ කිසිදු කොන්දේසියක් අදාළ වන්නේ නැහැ. පොතක් කියෙව්වම රසයක් හා දැනුමක් ලැබෙනවා. තමන් ලබාගත් දැනුම හා රසය තවත් කෙනෙකුට ලබන්න අවස්ථාව ලබා දෙනවා කියන්නේ පරාර්ථය හා බැඳුණු දෙයක්. කොච්චර දැනුම ඇත්තෝ වුණත් වැඩක් නැහැ මනුෂ්‍යත්වය නැත්නම්. අපි අපේ රට තුළ මනුෂ්‍යත්වය ප්‍රවර්ධනය කරන්න ඕන. අපේ වත්මන් පරම්පරාව කියවීමෙන් දුරස් වෙලා. අනෙක් පැත්තෙන් අවංකත්වය හා ස්වයං විනය පිරිහිලා. මිනිස්සු ආත්මාර්ථකාමී වෙලා. තමන් ප්‍රයෝජනයක් ගත් දෙයකින් තවත් කෙනෙකුට ප්‍රයෝජනයක් ගන්න අවස්ථාව දෙන පිරිස හරිම අඩුයි. ඒ උසස් ගුණධර්ම යළිත් සමාජයට කැන්දාගෙන එන්න මේ වීදි පොත් ගුලකට පුළුවන්."





පොත් ගුලෙන් පොත් රැගෙන යන පාසැල් සිසුවෙක්

දුල්මා කැනඩාවේ සිට දුරකතනයෙන් සම්බන්ධ වෙමින් ප්‍රකාශ කළාය.

කැනඩාවේ වික්ටෝරියා නගරයේ වීදී කිහිපයකම පොත්ගුල් දක්නට ලැබීම නිසා දුල්මා ඒ පිළිබඳ වැඩිදුර විස්තර රැස් කරන්නට පටන්ගෙන තිබේ. එම ප්‍රදේශයේ සිතියම පරීක්ෂා කිරීමේදී වැලි ඇතිරුවාක් මෙන් ළං ළංව පොත්ගුල් සිය ගණනක් පිහිටා තිබෙනු දුටු ඇය ඒවා එකින් එක නිරීක්ෂණය කරන්නට අමතක නොකළාය. බස්නැවතුම් පොළවල්, පාසැල්, ආගමික ස්ථාන, ප්‍රජා ශාලා, ක්‍රීඩා පිටි, ළමා උද්‍යාන ආදි සෑම තැනකම ඇති පොත්ගුල් ජනතාව විසින් හරිම අපූරුවට නඩත්තු කරනු දුටු ඇය මෙම සංකල්පය මෙරට පැළ කරන්නට සිතා ගත්තාය. සැමියා සහ දරු දෙදෙනා සමග කැනඩාවේ සිටින දුල්මාට කොවිඩ් අර්බුදය නිසා තවත් මාස කිහිපයක් එරට රැඳී ඉන්නට සිදුවීම නිසා ඇය තම සැමියාගේ පියා වන ආර්. එම් කුඩාබණ්ඩා ලවා පොත්ගුලක් මෙගොඩ කළුගමුවේ පිහිටි ඔවුන්ගේ නිවස ඉදිරිපිට විවෘත කිරීමට පියවර ගත්තාය.

විශ්‍රාමික ගුරුවරයෙකු වන කුඩාබණ්ඩා පොත්ගුලේ ආරම්භය හා විකාශනය පිළිබඳ මෙසේ විස්තර කළේය.

"පොත්පත් කියවීම වර්තමාන සමාජයෙන් බොහෝ දුරට ඈත් වෙමින් යනවා. පාසැල් වල පුස්තකාල භාවිතය විශාල ලෙස අඩුවෙලා. දරුවෝ අද වැඩිපුර ඉන්නේ ෆෝන් එකේ. කියවීම මිනිසා සම්පූර්ණ කරයි කියලා කියමනක් තිබෙනවා. පොත්පත් කියවීම මඟින් දැනුමට අමතරව ආදරය, කරුණාව, දයාව වගේ දේවල් අපටත් නොදැනිම හිත්වල පුදින්න පටන් ගන්නවා. දුව කැනඩාවේ පොත්ගුලක ඡායාරූපයක් එවලා කිව්වා ඒ වගේ එකක් ගේ ඉස්සරහා හදන්න කියලා. මම වඩුකාර්මියකුට පෙන්නලා ඒ විදිහටම ලී වලින් ගෙයක හැඩයට පෙට්ටියක් හැදුවා. දුවගේ හිතවතුන් බොහෝ දෙනෙක් පොත් ගෙනත් මේකට දැම්මා. එදා ඉඳලා තමයි මේක පොත්ගුලක් බවට පත්වුණේ. දැන් ගොඩක් අය මෙතනින් පොත් අරගෙන යනවා. පාසැල් දරුවෝ තමයි වැඩිපුර පොත් ගෙනියන්නේ. සමහරු පොතක් කියවලා ආපහු ගේන්නේ තවත් පොතකුත් එක්කයි. පොත් අරගෙන ගිහින් නොගෙනෙන අයත් ඉන්නවා. එක්කෙනෙක් දෙන්නෙක් එහෙම කළා කියලා මේ සංකල්පය මැරෙන්න දෙන්න එපා කියලා දුව කිව්වා.

දුල්මා විසින් අපේ රටේ වීදි පොත්ගුල් සංකල්පය පැළකර මාස දෙක තුනක් පමණ වේ. මේ වන විට පොත්ගුල් සංකල්පය මහනුවර මැද බෝවල, අනුරාධපුර, ගම්පහ, පානදුර, මාතර, වවුනියාව ආදි ප්‍රදේශවල වීදි පොත්ගුල් දක්නට ලැබෙයි. ඒ දුල්මාගේ විශ්ව විද්‍යාල මිතුරන් හා මුහුණු පොතේ මිතුරන් සමග මේ සම්බන්ධව කෙරුණු සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙසිනි.

"මම කැනඩාවේ වීදි පොත්ගුල් සම්බන්ධව මුහුණු පොතට ඡායාරූප සමග සටහනක් එක් කළා. එය ගොඩක් දෙනෙක් ෂෙයාර් කරලා තිබුණා. මේ සංකල්පය අපේ රටෙත් ඇති කරන්න ඕන කියන හැඟීම ඒ හැමෝටම තිබුණා. ඒ අනුව තමයි අද වන විට වීදි පොත්ගුල් කිහිපයක්ම අපේ රටේ ගම් කිහිපයක ඇති වී තිබෙන්නේ. දුල්මා පවසන්නේ සතුටිනි.







දුල්මා කැනඩාවේ වීදි පොත්ගුලක් අසළ සිට ගත් ඡායාරූපයක්.

**ඡායාරූප - රුවන් මීගමන්න**



සත්සමුදුර චිත්‍රපටයේ



# සිංහල සිනමාවේ ස්වර්ණ ලකුණ

## ස්වර්ණා මල්ලවාරච්චි



● ඒ. ඩී. රන්ජිත් කුමාර

**ශ්‍රී ලාංකේය සිනමාවේ ප්‍රබල දෙබස් ඛණ්ඩයක් සහිත උපරිම රංග කෞශල්‍යයක් නිරූපණය කළ චරිත දෙකක් සහිත රන්මලී සහ ජයනාත් ඔබට කෙසේ අමතක කළ හැකිද? මේ චරිත දෙක රඟ පෑ ස්වර්ණා මල්ලවාරච්චි සහ රවීන්ද්‍ර රන්දෙනිය 1984 වසරේ සරසවි සම්මාන උලෙළේදීත් ජනාධිපති සම්මාන උලෙළේදීත් හොඳම නිළිය හා නළුවා ලෙස සම්මානයට පාත්‍ර වූහ. ඒ දඩයම චිත්‍රපටය වෙනුවෙනි.**

"විචාරකයන්ගේ නිළිය" නමින් ප්‍රකට ස්වර්ණා හැටේ දශකයේ අග භාගයේ සිනමාවට පිවිස 80 සහ 90 දශකයේ පෙර නොවූ, සංකීර්ණ, පුරුෂාධිපත්‍යයට අභියෝග කරන යථාර්ථවාදි ස්ත්‍රීත්වය නව මානයකින් නිරූපණය කළ චිත්‍රපට නිළියකි.

ස්වර්ණා කුඩා කාලයේ සිටම කලාවට ඇලුම් කළාය. කොළඹ ග්‍රෑන්ඩ්පාස් හී කොස්ගස්හන්දියේ උපන් ඇය අධ්‍යාපනය ලැබුවේ කොස්ගස්හන්දියේම පිහිටි විජයබා මහා විද්‍යාලයෙනි. සති අන්තයේ සිංහල සාහිත්‍ය සමිතිය ඉදිරියේ මුල්වරට ගීතයක් ගැයීමෙන් පසුව අනෙක් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මුලදීට වඩා සැලකිල්ලෙන් ඇය දෙස බලන්නට පටන්ගත්හ. එහෙත් ඇය හොඳින්ම කැපී පෙනෙන්නට පටන් ගත්තේ ඇය, මිතුරියක් සමඟ අතින් ලියා සංස්කරණය කළ සඟරාවක් නිසාය. මේ ගැන අපට කීවේ එදා සිංහල සාහිත්‍ය සමිතියේ සභාපතිව සිටි ඇම්. ඩී. ප්‍රේමරත්නය. ඔහු පදිංචිව සිටින්නේ ඔරුගොඩවත්ත මහල් නිවාස සංකීර්ණයේය. එදා එම සමිතියේ නිලධාරි මණ්ඩලයේ සිටි ප්‍රේමසිරි පෙරේරා (පසුව පළාත් සභා මන්ත්‍රී), තුංගසේන ද ප්‍රේමරත්න සරසවි වරම් ලබා කොළඹ විශ්වවිද්‍යාලයට ගියහ. ප්‍රේමරත්න අපට කී කතාවයි මේ.

"ස්වර්ණා සිටියේ අපට වඩා පන්ති දෙකක් පහළ පන්තියක. ඇගේ යෙහෙළියක් වූ කාන්ති කල්‍යාණි අටුගොඩ සමඟ "පිපෙන කුමුදු" නම් අතින් ලියූ සඟරාව එදා විදුහල්පතිව සිටි කේ. පී. වික්‍රමාරච්චි හා උපවිදුහල්පති නිශ්ශංක යන මහත්වරුන් අතට පත්වී සිංහල සමිතියේදී අගය කළා. ස්වර්ණා අපේ සමිතියේ මුලින්ම ගැයුවේ නන්දා මාලිනී ගැයූ "බුදු සාදූ, මම සමන් මලක් වෙන්නම්" ගීතය.

ස්වර්ණලාගේ පන්තියේ සිටි අනිත් මිතුරු මිතුරියන් වූයේ ඉන්ද්‍රා, මර්සි, ඥාණ සෞන්දරී, කමලා, රම්‍යා, යසවතී, මොනිකා, ආරියවතී, රත්නමාලී, පියසීලී, බන්දුල පියදාස, සහබන්ධු ආදීන්ය. මේ පිරිස අතර දඟකාර, කටකාර, එඩිතර සිසුවිය ස්වර්ණාය. ඇයටම පමණක් ආවේණික වූ සිනාව සෙසු සිනා හඬවල් අබිබවා දෝංකාරය දී දසත පැතිරී ගියාය. ස්වර්ණාට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වූයේ වජිරා බාලසූරියයි. (ගුවන් විදුලි ගායිකාවක් වූ ඇය විශේෂඥ අක්ෂි වෛද්‍ය දුෂ්‍යන්ත වාරියපොලගේ මවය.) ඉතිහාසය ඉගැන්වූයේ එවකට ලේඛකයකු, ග්‍රන්ථ කර්තෘවරයකු වූ ඇඩ්වින් රණවකය. සිංහල භාෂාව උගන්වා ඇත්තේ එවකට ගුවන් විදුලියේ නාට්‍ය ශිල්පියකු, රචකයකු වූ ධර්ම ශ්‍රී ජේ. දහනායක මහතාය.

"ස්වර්ණා අනාගතේ හොඳ පත්‍ර කලාවේදිනියක් වෙන්න. ඔයාට ඒ හැකියාව තියෙනවා." වරක් දහනායක මහතා ඇය දිරි ගන්වමින් කීවේය.

ස්වර්ණා තරම් පොතපත කියවූ සිසුවියක් පාසලේ නොසිටියාය. මාර්ටින් වික්‍රමසිංහ, සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර, කේ. ජයතිලක, මහගමසේකර, ජී.බී. සේනානායක, මඩවල එස්. රත්නායක ආදීන්ගේ පොත් නොතිත් ආසාවෙන් කියවූ ඇයට නිසඳැස් රාශියක් කටපාඩම් තිබුණාය.

මේ ලියුම්කරු ස්වර්ණා හඳුනන්නේ කුඩා කල සිටය. අපි දෙදෙනාම උපන්නේ ද, හැදී වැඩුණේ ද කොස්ගස් හන්දියේය. පාසල් යන කාලයේ ඇගේ හොඳම මිතුරිය පදිංචිව සිටියේ අප නිවසට යාබද ඩිස්පැන්සරියේ නිල නිවසේය. මේ දෙදෙනාම මගේ සොහොයුරියගේ යෙහෙළියන් වූ නිසා නිතරම අපේ ගෙදර ආව ගියෝය. මගේ පියාගේ හිතවත් මිතුරෙකු වූ ධර්ම ශ්‍රී කල්දේරා (පසුව ඔහු චිත්‍රපට අධ්‍යක්ෂවරයකු විය) පැමිණි අවස්ථාවක ස්වර්ණාත්, මගේ මිතුරියත් පැමිණියහ. මේ 1964 මුල යයි සිතමි. ස්වර්ණා දුටු කල්දේරා ඇගෙන් මෙසේ ඇසුවේය.

"ඔයා කැමති නැද්ද? චිත්‍රපටයක රඟපාන්න. මේක මම අධ්‍යක්ෂණය කරන මුල්ම චිත්‍රපටය. කලාත්මක චිත්‍රපටයක්."

"අනේ මාමේ, මම නිළියක් වෙන්න කැමති නැහැ. මම කැමති පත්තරේක මාමා වගේ වැඩ කරන්න. නැත්තං ගුරුවරියක් වෙන්න. මම ළඟදීම බොරැල්ලේ යසෝධරා විද්‍යාලයට ඉගෙන ගන්න යනවා."

"මේ චිත්‍රපටයේ ගාමිණී ෆොන්සේකයි, ෂෙල්ටන් සිල්වයි එක්ක රඟපාන්න තියෙන්නෙ." කල්දේරා කීය.

ස්වර්ණා සිනාසුණා මිස කිසිවක් කතා නොකළාය. එදා ඇය කැමති වූවා නම් ඇගේ මුල්ම චිත්‍රපටය වන්නේ "සීතල වතුර" ය. කලාත්මක ධාරාවේ එම චිත්‍රපටයේ ස්වර්ණාට යෝජිත නාමලී නම් ප්‍රධාන චරිතයට පසුව අනුලා කරුණාතිලක තෝරා ගන්නා ලදි. සත්‍ය වශයෙන් ඇය චිත්‍රපට නිළියක් වීමට සිහිනෙන්වත් නොසිතූ බව මට හොඳටම විශ්වාසය. එහෙත් ඇය හොඳ කලාත්මක චිත්‍රපට නැරඹීමට ආශා කළාය. එකල අප එකට පාඩම් කිරීමේ සිරිතක් තිබුණි. මේ පිරිස වූ ස්වර්ණා, මර්සි, කාන්ති හා ස්වර්ණාට එක්වූ පිට පාසලක එකම ශිෂ්‍යයා වූයේ මාය. අප හොඳට ඉගෙන ගන්නා නිසා චිත්‍රපට බැලීමට ගෙවල් වලින් අවසර ද තිබුණි. "බන්දනී" හා "සුජාතා" නම් හින්දි චිත්‍රපට නැරඹූ ස්වරණා නූතාන්ට ද, සිංහල චිත්‍රපට වලින් පුණ්‍යා හීන්දෙනියට ද ඇලුම් කළ බව මට මතකය.

කුඩා කල සිටම මානව හිතවාදි ගති තිබූ ඇය වාම අදහස් වලින් පන්නරය ලැබුවාය. පීටර් කෙනමන්, කේ. පී. ද සිල්වා ආදී කොමියුනිස්ට් නායකයන් සමඟ එක්වී එක්තරා කොළඹ නාගරික මැතිවරණයකදී ස්වර්ණා තම පක්ෂයෙන් උතුරු ග්‍රෑන්ඩ්පාස් කොට්ඨාසයට ඉදිරිපත් වූ අබේසේන නම් අපේක්ෂකයා දිනවීමට ටී. එම්. සංඝදාස (පසුව එ.ජා.ප. නාගරික මන්ත්‍රී) හා ප්‍රේමසිරි පෙරේරා (පසුව පළාත් සභා මන්ත්‍රී) සමඟ උරෙන් උර ගැටී දේශපාලනය කළේ ඡන්ද බලයවත් නොතිබූ අවදියකය. මේ මැතිවරණයට ස්වාධීන අපේක්ෂකයකු ලෙස තරග කළ ඩී.ජේ. මහකුමාරගේට අප කණ්ඩායමේ මාත්, කාන්තිත් වතු මීටින්වල කතා කළහ. යූ.ඇන්. පීයෙන් තරග කළේ ෆලීල් කෆූර්ය. ජය ලැබුවේ ද ඔහුය.

ස්වර්ණාගේ මෙන්ම අපේ මිතුරු කණ්ඩායමේ වීරයන් වූයේ නළු නිළියන් නොවේ එකල අප පොතපත කියවූ ලේඛකයන්ය. ඒ ලේඛකයන් සජීවීව දැක ගැනීම අප මිතුරු පිරිසේ ඒකායන ආශාව විය. සිරි ගුණසිංහ අධ්‍යක්ෂණය කරන "සත් සමුදුර" චිත්‍රපටයට නවක නිළියක් ඕනෑ කර තිබෙන බව දැක්වෙන දැන්වීමක් "විසිතුර" සිනමා පත්‍රයේ පළවී තිබෙනු මම දුටුමි.

"ස්වර්ණා, අපිට ඔන්න සිරි ගුණසිංහ දැක ගන්න අවස්ථාව ලැබිලා තියෙනවා." පසුදා අපේ හමුවේදී මම කීවෙමි.

"යමු... යමු... හොඳ චාන්ස් එක. අපි බොරුවට ඉල්ලුම් පත්‍රයක් දාමු." කමලා යෝජනා කළාය.

"මට නිළියක් වෙන්න ඕනෑ නෑ. සිරි ගුණසිංහ බලන්න ඕනෑ නිසා එහෙම කරමු. කොහොමත් මාව තෝරා ගන්නේ නැති නිසා." ස්වර්ණා කීවාය. අපි ස්වර්ණා වෙනුවෙන් ඇගේ ඡායාරූපයක් ද සහිත ඉල්ලුම් පතක් යැව්වෙමු.

"සත් සමුදුර" පරීක්ෂණයට කැඳවීමක් ලැබිණි. ස්වර්ණා කමලා සමඟ වෝඩ් පෙදෙසේ දොස්තර ලීනස් දිසානායකගේ නිවසට යාමට මාත් හවුල් වුනෙමි. එදා පරීක්ෂණ මණ්ඩලයට සිරි ගුණසිංහ, වසන්ත ඔබේසේකර, ඩී. බී. නිහාල්සිංහ, සිරිල් වික්‍රමගේ ඇතුළත් වූහ. සිරිල් හැර සෙසු සාමාජිකයන් ස්වර්ණාට කැමැත්ත පළ කළහ. සිරිල්ගේ මතය වූයේ නාගරික පෙනුමක් ඇති ඇය ධීවර ගමක තරුණ බිරියකට උචිත නොවන බවය. රඟ පෑ හැටි දුටු සිරිල් ස්වර්ණාට සුබ පැතූ අතර ඔහු පසු කලෙක අධ්‍යක්ෂණය කළ "කරදිය වළල්ල" චිත්‍රපටයට ද තෝරා ගත්තේය. එදා තමා මුහුණ දුන් අවස්ථාව මෙසේ ආවර්ජනය කළාය.

"දැන් මේ සිද්ධියට වසර 55ක් සපිරෙනවා. එදා පරීක්ෂණයට රඟපෑමේ අපේක්ෂාවෙන් ගැහැනු ළමයි 400ක් පමණ ඇවිත් හිටියා. අන්තිමට මාවයි, තව ළමයකුයි තේරුණා. චිත්‍රපට කරන කැමරාවෙන් මගේ මුහුණ මුලින්ම දැක්කේ නිහාල් අයියා. (ඩී.බී. නිහාල්සිංහ) මාව තෝරා ගත්තාට පස්සේ වේශ නිරූපණයකින් පසු මාව තෝරා ගත්තා."

"හන්තානේ කතාව" චිත්‍රපටයට කෙට්ටු ගැහැනු ළමයෙක් සොයා දෙන ලෙස අධ්‍යක්ෂ සුගතපාල සෙනරත් යාපා විසින් "විසිතුර" කර්තෘ ආතර් යූ. අමරසේන රෙකමදාරු කර ඇත්තේ ස්වර්ණා බව සෙනරත් යාපා පුවත්පතකට කියා තිබුණි. විජය කුමාරතුංග හා පුරා කියා රඟපෑවේ ස්වර්ණා සමඟ "හන්තානේ" කතාවෙනි. ඒ අත්දැකීම ගැන ස්වර්ණා ආවර්ජනා කළාය.

"මේ චිත්‍රපටයේ සුබා නම් සරසවි සිසුවියක් ලෙස මම ශෝභනී අමරසිංහ, සුනිලා ජයන්ති, සමන්ති ලැනරෝල්, සිසුන් ලෙස විජය, ටෝනි, දයා තෙන්නකෝන්, අමරසිරි කලංසූරිය, එඩ්මන්ඩ් ජයසිංහ, බර්ටි ජයසේකර, සෝමපාල ලැනරෝල්, පුෂ්පානන්ද වීරසිංහ වගේම චිත්‍රපටයට සම්බන්ධ ධර්මසේන පතිරාජ, බර්ටි ගුණසේකර, විජය ධර්ම ශ්‍රී සමඟ විනෝදයෙන් ගත කළ හැටි අදත් මට මතක් වෙනවා. විජයගේ මුල්ම චිත්‍රපටය නිසා ඔහු අහිංසක විදිහට හැසුරුණේ.

ස්වර්ණාට සත් සමුදුර චිත්‍රපටයේ රු. 250ක්ද, හන්තානේ කතාවට රු. 3,000 ක්ද ලැබුණු බව ඇය 'සරසි' පත්‍රයේ කීරගල ආරච්චිට කියා තිබුණි. ආනන්දයේ සිසුන්වූ අපි නිෂ්පාදනය කළ 'නිම්වළල්ල' චිත්‍රපටයට ගමේ කෙනෙකු නිසා ඇයට රු. 5000 ක් ලබා දුන් බව මට මතකය.

තම චිත්‍රපටයේ අසීරුම, අභියෝගාත්මක චරිතය රඟපෑවේ "දඩයම" යැයි ස්වර්ණා කිහිපවරක්ම මාධ්‍යයට කියා ඇත.

"තමාට වූ අසාධාරණයට විරුද්ධව ගෙන යන අරගලයක් නිරූපණය කළ ගැහැනියක් රන්මලී. ගැහැනිය සුකොමල මුදු මොළොක් වස්තුවක් හැටියටයි බොහෝ සිංහල චිත්‍රපට වලින් මතු කළේ. මුලදී සමනල ජීවිතයක් ගත කළ රන්මලී ජීවිතයේ කටුක ප්‍රශ්නවලට මුහුණ දෙමින් එඩිතරව එක අරමුණක් කරා යන සැහැසි ගැහැනියක් බවට පත්වන්නේ ඊට පස්සේ. චිත්‍රපටයේ අවසාන දර්ශනය තරම් ගැහැනියක් මේ තරම් දරුණු වුණාද කියලා මට සිතුණා. චිත්‍රපටයේ ඒ දර්ශනයේ මා මාරාවේශයෙන්, දරුවෙකු කුසෙහි දරාගෙන තම සැමියාගෙන් පළිගන්නා අවස්ථාව. මේ දර්ශනය රූපගත කළේ හොඳට ඉඩකඩ තියෙන කතරගම කිරින්ද පැත්තේ. මට එහිදී අවස්ථාවක් තිබුණා, අධික වේගයෙන් මාව යට කරන්න එන රවීන්ද්‍රගේ මෝටර් රථයේ



දඩයම චිත්‍රපටයේ



ඇගේ ඇස අග ප්‍රිතිමත් චැටර්ජී සමඟ



මංමුලාවැල් චිත්‍රපටයේ විජය කුමාරතුංග සමඟ

වින්ඩ්ස්ක්‍රීන් එකට දැත බදල පොල්ලකින් ගැසීමට. මේ සඳහා පොල්ලක් ප්‍රමාණවත් නොවන නිසා යකඩ විල්ලක් දාලා බර හිටින්න ලී පොල්ලක් හදල තිබුණා.

දැන් රවීන්ද්‍ර කිලෝ මීටර් 70ක් පමණ වේගයෙන් මා වෙතට එනවා. වරෙක ඔහු රථය නතර කරලා මා වෙත ඇවිත් මෙහෙම කිව්වා.

"ස්වර්ණා පොඩ්ඩකටවත් බය වෙන්න එපා. ඔයා කාර් එකේ වින්ඩ්ස්ක්‍රීන් එකට පොල්ලෙන් ගහලා ඉවර වෙනකොට මම ඔයාට ගැවෙන නොගැවෙන විදිහට ළඟින්ම යනවා. මතක තියා ගන්න වැටෙන්න ගියොත් පිටි පස්සට වැටෙන්න."

"දැන් රවීන්ද්‍ර කිලෝ මීටර් 70ක පමණ වේගයෙන් මා වෙතට කාර් එක පදවා ගෙන එනවා. ඊට වඩා වේගයෙන් එන්න උත්සාහ කළත් වැලිපොළොව නිසා රථය එරෙන නිසාත් රවීන්ද්‍ර උපරිම වේගයෙන් ආවේ. රවීන්ද්‍ර පදවන කාර් එකේ කැමරාවක් හයි කරලා තිබුණා. ඒත් කැමරා ශිල්පියෙක් නෑ. මිලි මීටර් 16 "වයිඩ් ඇන්ගල්" කාචයක් සහිත කැමරාවක් ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ යුනිට් එකට අයිති කැමරාවක් ඒක. මේ දර්ශනය රූගත කරන්නේ ඩොනල්ඩ් කරුණාරත්න. මම දැන් කාර් එක ළඟට පොල්ල අරං යන්න. මගේ ඇගේ ලේ වතුර වෙලා. මේ දර්ශනය රූගත වුණේ 'ස්ලෝ මෝෂන්' විදිහට. මම දැත බදලා පොල්ලෙන් ගැහැව්වා. වින්ඩ්ස් ක්‍රීන් එක ගානට බිඳලා. මල් රටා මවමින් වීදුරු කටු රවීන්ද්‍රගේ මුහුණ පුරාම ඇලිලා.

පස්සේ බැලින්නං ලෙස්ටර් මහත්තයා ජර්මනියෙන් ගෙන්වන ලද වයිඩ් ඇන්ගල් ලෙන්ස් එක බිඳිලා රූප රාමුව පිටින්ම. පස්සේ නිෂ්පාදකයා අලුත්ම ලෙන්ස් එකක් ජර්මනියෙන් රු. 40,000කට ගෙනත් දුන්නා." ස්වර්ණා කීවාය.

ස්වර්ණාත්, විජයත් රඟ පෑ චිත්‍රපට අතුරින් විශේෂ චරිත දෙකක් ගැන කතා කළාය. ඒ වසන්ත ඔබේසේකරගේ "කැඩපත ඡායා" හා තිස්ස අබේසේකරට නිම කර ගැනීමට නොහැකි වූ "මංමුලා වැල්" චිත්‍රපට ගැනය.

"කැඩපතක ඡායා" චිත්‍රපටයේ මම නන්දා. "දඩයම" චිත්‍රපටයේම දිගුවක් හැටියට මම දකින්නේ. මගේ වැඩිමහල් සොහොයුරියගේ සැමියා වූ ධනරත්න අතින් මම අනාථ වෙනවා. විජය කුමාරතුංග ධනරත්නට රඟපෑවේ. චිත්‍රපටයේ එක් අවස්ථාවක් තියෙනවා මම ධනරත්නට ඇසිඩ් ගහලා මරනවා. මම ඇසිඩ් තේ කෝප්පයක දාලා රෝගාතුරව රෝහල්ගතව සිටින ධනරත්න ළඟට එන විට

"එපා.... එපා... නන්දා එපා" යයි කෑ ගහසනවා.


මම මේ චරිතය රඟපෑවේ අසීරුවෙන්. විජයගෙත් මා දුටු හොඳම රඟපෑම ධනරත්නගේ චරිතය. එහෙත් ඔහු මිය ගිය පසු සම්මාන උලෙළවලින් ඔහුට අසාධාරණකම් කළා. මම චිත්‍රපටයේ ඒ අවස්ථාවේදී අන්දමන්ද වුණා." ස්වර්ණා කීවාය.

"මංමුලා වැල්' චිත්‍රපටයේ විජය හා මා රඟ පෑ චරිතය මට සිහිනයක් වගෙ. එය නැරඹීමට බුද්ධිමත් ප්‍රේක්ෂකයාටත්, මටත් අහිමි වීම අභාග්‍යයක්.

මෙරට 70 හා 80 දශකවල මෙරට සිනමාවට එක්වූ ප්‍රවීණ හා පළපුරුදු චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ හරවත් සිනමා කෘති රැසකට දායක වීමට ස්වර්ණා වාසනාවන්තියක් වූවාය. මහගමසේකරගේ තුංමංහන්දිය, රංජිත් ලාල්ගේ නිම්වළල්ල, ධර්මසේන පතිරාජගේ අහස්ගව්ව, සතිස්චන්ද්‍ර එදිරිසිංහගේ මාතර ආච්චි, ධර්මසිරි බණ්ඩාරනායකගේ හංස විලක්, සුද්දිලාගේ කතාව, බවදුක, බව කර්ම, සුමිත්‍රා පීරිස්ගේ මායා, යහළු යෙහෙළි, වසන්ත ඔබේසේකරගේ දඩයම, කැඩපතක ඡායා, ප්‍රසන්න විතානගේ අනන්ත රාත්‍රී, ඩී.බී. නිහාල්සිංහගේ රිදී නිම්නය, මල්දෙනියේ සිමියොන්, සුනිල් ආරියරත්නගේ මුහුදු ලිහිණි, අසෝක හඳගමගේ චන්න කින්නරී, ඇගේ ඇස අග යන චිත්‍රපට මේ අතර වෙයි. "ඇගේ ඇස අග" චිත්‍රපටයේ ඇය ප්‍රධාන චරිත රඟපෑවේ භාරතීය චිත්‍රපට නළු Dhritiman Chatterjee සමඟය. ඔහු සත්‍යජිත් රායිගේ Pratidwandi චිත්‍රපටයේ රඟ පෑ රංග ශිල්පියාය. "ස්වර්ණා යනු උපන් පොළොවේ හොඳින් පය ගසා ගෙන විශ්වය දෙස බැලූ ඇසූ විරූ තැන් ඇති නිළියක්" ලෙස එක් විචාරකයකු හඳුන්වා තිබුණි.

---

# තොරතුරු දැනුමෙන් නැණවත් වේද?





● මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

පන්ති කාමරයට පිවිසූ අපේ ගුරුතුමා වදන් කීපයක් කළුලෑල්ලේ ලියුවේය. ඉන්පසුව අපෙන් ඇහුවේ ඉතා කුඩා ප්‍රශ්නයකි.

"මේ වචනවල අර්ථ තේරුම් අරන් තියෙනවද කියල බලන්න" යි කියමින් ඒ වචන එකිනෙක ශබ්දනගා කියවීමට පටන් ගත්තේය.

"ගවේෂණය, විමර්ශනය, සමීක්ෂණය, නිරීක්ෂණය, විවරණය, විචක්ෂණය. මේ වචන හයම තොරතුරු සම්පාදනයට සම්බන්ධය. අපි නිතරම වාගේ තොරතුරු (Information) ගැන කතා කරනවා. තොරතුරු දැන ගැනීමට නම් අපට ඔය වචන හය හුඟාක් ඵලදායක වෙනවා. කොහොමද ඵලදායක වෙන්නේ?"

තොරතුරු කියන්නේ හොයන දෙයක්. එහෙමත් නැත්නම් සොයාගෙන යා යුතු දෙයක්. ඒකත් හරියට නැතිවුණු ගවයින් ලැග ඉන්නේ කොහේදැයි සොයා යනවා වගේ වැඩක්. ඒ ක්‍රියාව 'හරකුන් සෙවීම' යන අර්ථය දෙන 'ගවේෂණය' මඟින් සිදුවෙනවා. ඉංග්‍රීසි බසින් ගවේෂණය හැඳින්වෙන්නේ Investigation (ඉන්වෙස්ටිගේෂන්) යනුවෙන්. ඇති දෙයක්, දකින දෙයක් තව තවත් හොයන්න පුළුවන්. හැඟවුණු දෙයක් හොයන්නට වෙනවා.

"විමර්ශනය" ඊට වඩා වෙනස් මඟික් ගන්න සෙවිල්ලක්. එය නිකම්ම නිකං සෙවිල්ලක් වෙනුවට බුද්ධිමත් අයුරින් සිදුවන සෙවිල්ලක්. 'විමසීමෙන් දැන ගැනීම තමයි විමර්ශ' වෙන්නේ. ඒ නිසා 'විමර්ශනය' යන්න ගවේෂණය ඉක්මවූ සෙවීම් කාලයක්. ඒ සඳහා Inquiry එහෙමත් නැත්නම් Enquiring search කියන්නට පුළුවන්. යම්කිසි තොරතුරක හුදු මතුපිට තලය වෙනුවට තවත් දිශානතී (dimensions) ඇති බව හඳුනා ගැනීම නිසා අපේ යෙදුමක් තියෙනවා. 'විමර්ශන බුද්ධිය' කියල. කිසියම් තොරතුරක් ඇඳ දැක්වීමේදී විමසිලිමත්වීම මෙහි අදහසයි.

ඊළඟට යම් යම් තැන්වලට ගිහිල්ල තොරතුරු සෙවිල්ලේ යෙදෙන අය 'සමීක්ෂණ' පවත්වනවා. එක් තොරතුරක් තවත් තොරතුරක් සමඟ සන්සන්දනය (compare) කරනවා. ඒ මඟින් තමන් හමුවට විවිධාකාර තොරතුරු ගලා එන්නට පුළුවන්. ඒ තොරතුරු මැනලා බලනවා. කිරලා බලනවා. මේ ක්‍රියාදාමය සමීක්ෂණය (Survey) යනුවෙන් හඳුන්වනවා. ඉඩම් මනිනවා. එය සමීක්ෂණයක්. එය ඉටුකරන්නේ මිනින්දෝරුවා (Surveyor) දිගපළල, වටිනාකම, අගය සමීක්ෂාවට භාජනය කරනවා.

ඊළඟට එන්නේ 'නිරීක්ෂණය' (Observation) නිරීක්ෂණයකින් තොරව ඇතැම් තොරතුරුවල අගය තක්සේරු කිරීම අපහසුය. එය හුදු 'පරීක්ෂණය' ඉක්මවා තොරතුරක අගය දැකීමක් වෙනවා. මේ නිසා 'නිරීක්ෂණය' ඕනෑවට එපාවට වෙනුවට සියුම් ලෙස ගොඩ නැඟීමට පුළුවන්. වදන් භාවිතය (use of words) ඉගැන්වීමට වදන්කෝෂ අවශ්‍යයි. වදන් උගන්වන ගුරුවරුන් අවශ්‍යයි. 'විවරණය' අප හමුවේ ඇති අපූරු යෙදුමක්. යම්කිසි තොරතුරක් දැනගත් පසුව ඒ තොරතුර 'විවරණය' කිරීමට අතිරේක කුසලතාවක් (skill) අවශ්‍ය බව හඳුනාගත යුතුය. මේ නිසා ඒ කාරණය තොරතුරු සම්බන්ධයෙන් 'විවරණ ඇස' යන තේරුම දෙන Commentary නැතිනම් Commentarial යනුවෙන් හැඳින්වෙනවා. මේ සියල්ලටම වඩා තමන් හමුවේ පවතින තොරතුරු බෙදා වෙන් කරගැනීම ගැන දැනුමක් තිබෙන්නට ඕනෑ. ඒ දැනුම හඳුන්වන්නේ 'විචක්ෂණය' (discrimination) කියල. අපට ලැබෙන හැම තොරතුරක්ම එක හා සමානව නොවටිනා බවත් වටිනා හා නොවටිනා ලෙස වෙන් කිරීමේ ශක්තිය අප සතු විය යුතුය.

මේ කාරණා සියල්ල මෙනෙහි කරන කොට අපට එක් වැදගත් කාරණාවක් පැහැදිලි වෙන්ට ඕනෑ. ඒ මොකක්ද ඒ කාරණය. අපට ළඟාවන තොරතුරු අපි ආදරයෙන් වැලඳ ගන්නා තොරතුරු අපි බැහැර දමන තොරතුරු පිළිබඳව කල්පනා කිරීමට සිදුවෙනවා. අප තුළ පවතින්නේ දැනුවත් කමක්ද? නොදැනුවත් කමක්ද? යන්න සියුම් ලෙස විමසීමට ඔය වදන් හය මඟින් ප්‍රකාශිත අර්ථ ඵලදායක වෙන්නට ඕනෑ.


වෂී 2021ක් වූ අප්‍රේල් මස 04 වැනිදා ඉරිදා

## දිවසමය සුබ මුහුර්ත

04 ඉරිදා උදේ 07.14 සිට 07.32 දක්වා දකුණ බලා, 05 සඳුදා උදේ 06.31 සිට 06.52 දක්වා දකුණ බලා, 06 අඟහරුවාදා උදේ 07.45 සිට 08.04 දක්වා නැගෙනහිර බලා, 07 බදාදා උදේ 06.11 සිට 6.27 දක්වා උතුර බලා, 08 බ්‍රහස්පතින්දා උදේ 08.14 සිට 08.32 දක්වා උතුර බලා, 09 සිකුරාදා උදේ 07.14 සිට 07.31 දක්වා උතුර බලා, 10 සෙනසුරාදා උදේ 07.10 සිට 07.21 දක්වා නැගෙනහිර බලා.

| දිනය | රාහු කාලය |
|---|---|
| අප්‍රේල් 04 ඉරිදා | සවස - 04.48 - 06.19 අලුයම 04.39 - 06.07 |
| අප්‍රේල් 05 සඳුදා | උදේ 7.38 - 09.09 රාත්‍රි 07.48 - 09.16 |
| අප්‍රේල් 06 අඟහරුවාදා | සවස 03.17 - 04.48 අලුයම 03.10 - 04.38 |
| අප්‍රේල් 07 බදාදා | දහවල් 12.12 - 01.43 අලුයම 12.12 - 01.40 |
| අප්‍රේල් 08 බ්‍රහස්පතින්දා | දහවල් 01.44 - 03.15 අලුයම 01.41 - 03.09 |
| අප්‍රේල් 09 සිකුරාදා | දහවල් 10.40 - 12.12 රාත්‍රි 10.44 - 12.12 |
| අප්‍රේල් 10 සෙනසුරාදා | උදේ 09.08 - 10.40 රාත්‍රි 09.15 - 10.43 |

## සතියේ කුළුදවස



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ - අජිත් ධර්මසිරි, 077 3470914

**2021 අප්‍රේල් 04 සිට අප්‍රේල් 10 දක්වා ලග්න පලාපල**

### මේෂ - ආගමික උත්සවයකට මුල් තැන

මේෂ ලග්නයට අනුව ඔබට මෙම සතිය ඉතා පුණ්‍යවන්ත වෙයි. චන්ද්‍රයා 09,10,11,12 යන ස්ථාන පසුකර යන නිසා දේපළ රැකියා ආර්ථික යහපත්කම් සතිය අවසානයේ පිටරට යෝග පවා එළඹේ. තම ධන සම්පතක් පිළිබඳ යටපත්වූ උරුමයක් මතු කෙරේ. මවු පාර්ශ්වයේ සහයෝගය නොඅඩුව ලැබේ. සතිය ආරම්භ වන්නේ ද ආගමික උත්සවයකට මුල් තැන දෙමිනි.

### වෘෂභ - ආත්ම අභිමානය දැඩිවේ

වෘෂභ ලග්නයට අනුව මෙම සතිය ඔබගේ කේන්ද්‍රයට අනුව සතිය ආරම්භය යම් හදිසි අනතුරු ස්වභාවයක් පෙන්නුව ද සතිය මැද භාගයේ සිට සතුටු-දායක වෙයි. තමා නතරකර දමා තිබූ වැඩකටයුතු යළි ආරම්භ වේ. ඒ අතර නිවසක් පිළිබඳ සිහිනය සැබෑවේ ඉඩමක වැට මායිම් ගසා සකසා ගැනීමට හැකිවේ. සිය පුතකු නිසා සිය ආත්ම අභිමානය දැඩි වන සතියකි. තුනටියේ ආපදා පෙන්වයි.

### මිථුන - ආර්ථික වාසි

මිථුන ලග්නයට අනුව ඔබ කාර්මික අංශ කෙරේ වැඩි නැඹුරුවක් දක්වන සතියකි. චන්ද්‍රයා ද 07, 08,09,10 යන ස්ථාන පසුකරමින් යන නිසා විවාහ ස්ථානගත ගැටලුවකට මුහුණ දීමට සිදුවේ. ඔබ දුරදිග නොබලා කරන කටයුත්තක් නිසා අපහාස විඳින්නට පවා සිදුවේ බාල දරුවකුට උවදුරු පැමිණේ. ඒ උඩක සිට වැටීම හෝ දණහිසට සිදුවන ආපදා ලෙසිනි. කෙසේ නමුදු ආර්ථික සම්පත් උරුම වනු ඇත.

### කටක - නීති ගැටලුවකට විසඳුම්

කටක ලග්නයට අනුව මෙම සතිය ඔබට සුබයි. ඒ සතිය අවසාන භාගයේ උදාවන හදිසි ධන ලාභයක් නිසා ය. තම දේපළවලට තිබූ නීති ගැට-ලුවක් නිසා සතිය ආරම්භය සිට සතිය මැද භාගය වනතෙක් ඒ වෙනුවෙන් වෙහෙසීමට සිදුවේ. වෙහෙසේ ප්‍රතිඵල උදා කරමින් ඉහත කී පරිදි සැනසුම උදා වේ. තමාගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 06,07,08,09 යන ස්ථානවල ගමන් කිරීම තුළ තම වාසස්ථානයෙන් බැහැරට දුර බැහැර ගමනකට ද හේතු වනවා ඇත.

### සිංහ - වාසනාවන්ත දරු සම්පත්

සිංහ ලග්නයට අනුව චන්ද්‍රයා මෙම සතියේ ඔබ කේන්ද්‍රයේ 05,06,07,08 යන ස්ථානවල ගමන් කිරීම නිසා විශේෂයෙන් ආර්ථිකයට යහපත් ය. දරු සම්පත් අතින් වාසනාව මතු කරයි. නමුත් වියදම් ඉතා ඉහළ යනු ඇත. තම එදිනෙදා කටයුතු අධික වීම නිසා මානසික ඒකාග්‍රතාව බිඳෙනු ඇත. දණහිසට අගුණයි. වාහනවලින් ගමන් කිරීමේදී වේගය පාලනය කර ගත යුතුවෙයි.

### කන්‍යා - වාහනයක සිහිනය සැබෑවේ

කන්‍යා ලග්නයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 04,05,06,07 යන ස්ථාන පසු-කර යන නිසා සුබයි. වාහනයක් පිළිබඳ තිබූ සිහිනය සැබෑවේ. තම ඥාති පාර්ශ්වය විසින් තමාට ලබාදෙන සහාය සතුටුදායක වෙයි. පපුවේ ආබා-ධයක් මුල් වීම හේතුවෙන් සතිය මැද භාගයේ සිට කටයුතු අඩාළ වීමට පුළුවන. එහෙත් තම ආත්ම ශක්තිය වැඩිවීම තුළ ඇති වන බාධා මගහරවා ගැනීමට ඔබට හැකිය.

### තුලා - පැරැණි දේ අලුත්වැඩියාවට

තුලා ලග්නයට අනුව ඔබ කේන්ද්‍රයේ චන්ද්‍රයා 03,04,05,06 යන ස්ථාන පසුකර යන මෙම සතිය වඩාත් සුබ වන්නේ පරණ දේවල් අලුත්වැඩියා කර ගැනීමට වැඩි කාලයක් කැප කිරීමෙනි. නිවසක් හෝ වාහනයක් යළි අලුත්වැඩියා කිරීම් වැනි දේ ඒ අතර වෙයි. කෙසේ නමුදු හදිසි ධන සම්පත් පෙන්වයි. ලොතරැයි ජය, තරග විභාග ජය ඔබට හිමිවේ. බුධ 05 හි පුත්‍ර ඵලයකට ද චන්ද්‍රයා 03 හි තමාගෙන් ඈත්ව සිට ඥාතියකුගේ පැමිණීම ද සිදුවේ.

### වෘශ්චික - යුග දිවියට ගැටලු

වෘෂ්චික ලග්නයට අනුව ඔබට මෙම සතිය ඉතා සුබයි. ඒ චන්ද්‍රයා 02,03,04,05 යන ස්ථානවල ගමන් කිරීම ද බුධ 04 හි ගුරු ශනි 03 හි ද වන නිසා ය. ආර්ථික වාසි දේපළ උරුමකම් හදිසි මුදල් ලැබීම් ඒ අතර වෙයි. කොහොම නමුත් රාහු - කුජ 07 හි හැසිරෙන මෙම සතිය තම යුග දිවියට විවිධ ගැටලු මතු විය හැක. පිටස්තර අයගේ අතපෙවීම් නිසා එසේ විය හැකි අතර අන් අයගේ වචනවලට අවනත නොවී කටයුතු කිරීම ඔබට සුබවෙයි.

### ධනු - අන් අයගේ ප්‍රසාදය

ධනු ලග්නයට අනුව මෙම සතිය තුළ චන්ද්‍රයා 01,02,03,04 යන ස්ථාන-වල ගමන් කිරීම ද අනෙකුත් සුබ ග්‍රහයන් යහපත් ස්ථානවල හැසිරීම ද නිසා සතිය පුරාවටම සුබයි. අන් අයගේ ප්‍රසාදයට හේතුවීම - ආර්ථික ලාභ භෞතික සම්පත් ලාභ තෑගි බෝග ලැබීම ඒ අතර වෙයි. තම වෘත්තිය පිළිබඳව ද සතුටු විය හැකිය. රැකියා ස්ථානගත වගකිවයුතු අයගේ ප්‍රසාදය ඒ අතර වෙයි.

### මකර- අලුත් මිත්‍ර සංගම්

මකර ලග්නයට අනුව මෙම සතිය ආරම්භය දුර බැහැර කටුක ගමනකට හේතුවෙයි. බොහෝ විට සමීපතමයන් හා පවුලේ සාමාජිකයන්ගෙන් දුරස්වීම නිසා සිතේ අසහනයට හේතු වුව ද සතිය මැද භාගයේ සිට සතුටුදායක වෙයි. අලුත් අලුත් හිත මිතුරන් ඇසුරට ලැබේ. තම එදිනෙදා කටයුතු ඉතා අධිෂ්ඨා-නශීලීව කඩිනමින් කරගෙන යාමට හැකිවේ. හිසේ සෙම ගතිය නිසා හිස කැක්කුම් මෙන් ම දත්වල කැක්කුම් වේදනා නිසා ගැටලු මතු කෙරේ.

### කුම්භ - ඔබට නව ශක්තියක්

කුම්භ ලග්නයට අනුව මෙම සතිය ඔබගේ ජයග්‍රහණ කීපයක් නිසා සිත සතුට දැඩි වන සතියකි. චන්ද්‍රයා 11, 12, 01, 02 යන ස්ථාන පසුකර යාම ද බුධ ලග්න ගතවීම හා පැහැදිලි මානසික සුවතාව නිසා සිතේ සතුට ඇතිවනු ඇත. කෙසේ නමුදු තම අත්උදවුවට සිටින අය ද කැපවී කටයුතු කිරීම ඔබට නව ශක්තියක් වීමට හේතුවෙයි. පපුවේ නහරගත ආපදා මතුවීමට පුළුවන.

### මීන - රැකියා නව මුහුණුවරකින්

මීන ලග්නයට අනුව ඔබට මෙම සතිය සුබයි. චන්ද්‍රයා 10,11,12,01 යන ස්ථානවල හැසිරීම නිසා රැකියාවල ආර්ථික ප්‍රතිලාභ පෙන්වයි. තම දූපුතුන් නිසා අභිමානය තවත් වැඩි වන්නකි. තමා ගෙන ආ යෝජනාවකට අනුව රැකියා ස්ථානයේ කටයුතු නව මුහුණුවරකින් කරගෙන යාමට හැකිවේ. එයින් ආදායම් ඉහළ යයි. ප්‍රධානීන්ගේ සහාය නොඅඩුව ලැබේ. ඒ නිසා සතිය පුරා සතුට සැනසුම වැඩිවේ. තම ගමන ජීවිතය ද සතුටුදායක වෙයි. උරහිස ආශ්‍රිත අසුබ සතියකි.



## බාලගිරි දෝෂය අද නොවේ හෙටද?



● වල්පොළ සද්ධානන්ද හිමි

බාලේ ගිරි යකු දරු හඬවන්නේ
බාලේ ගිරි යකු දරු නළවන්නේ
බුදු ගුණ බලයට නෑ යකු ගෙට එන්නේ
බාලා ගිරි දොස අද දුරුවන්නේ

**උපන්දා සිට වසරක කාලයක් ගතවනතුරු මාස 12කට යකුන් 12 දෙනෙකුගේ ඇල්ම, බැල්ම වැටීම ඒ තුළින් බිලිඳු දරුවන් තුළ ඇතිවෙන දොස් බාලගිරි දෝෂය නමින් අදත් ගමේ නගරයේ කොතනත් ඉහළින් පිළිගත් සමාජ සම්මත මතයක් හා විශ්වාසයක් වී තිබේ.**

බිලිඳුන් උපන් දුගී පැලෙත් රජ, සිටු මැදුරක වුවත් එම බිලිඳා සිටින ස්ථානයේ දොරකඩක හෝ බිත්ති-යක "බාලගිරියා අද නොවෙයි හෙට" "බාලගිරි දෝෂය අද නොවෙයි හෙට" යනුවෙන් සඳහන් කිරීම සිදුවෙයි. මෙහි ඉතිහාස කථාවක් ඇත. එය ඉතා දිගුකාලයකට දිවයන්නකි. ගිරිදේවිය-නම් දේවියක් අරබයා මෙම කතා පුවත ගෙතී ඇත. එකල පෙර දවස දඹදිව දන්ත නම් පුරයේ රජකම් කළ සිංහකු-මාර රජු හා එම දේවිය වූ හංසවතී බිස-වට දරුවන් දෙදෙනෙක් විය. අනාගත වෘත්ත කරුවන් (අනාවැකි කියන්නන්) මතය වූයේ වැඩිමහල් කුමරා අතින් කුඩා කුමාරිය කෙලෙසෙන බවත් එය කිසිසේත්ම කාහටවත් වැළකිය නොහැකි බවත්ය.

මේ පුවත අසා කම්පාවට පත් දෙමා-පියන් කුඩා කුමරිය ගල්ලෙනක් තුළ සඟවා කාහටත් නොපෙනෙන ලෙස ඇති දැඩි කළාය. විශේෂයෙන්ම තම සොයුරා වන දළ කුමාරයාගේ ඇස නොගැටීමට වගබලා ගත්තාය. කුඩාකල සිටම ගිරිකුලක් තුළ ජීවත් වුණු නිසා ඇය වැඩිමහල් වියට පත්වුණු පසුවත් "ගිරිදේවිය" නමින් හඳුන්වනු ලැබීය. ගිරිදේවිය දළ කුමාරයාගේ එක කුස උපන් සහෝදරිය වූවාය.

කාලයාගේ ඇවෑමෙන් දෙදෙනාම තරුණ වියට පත් වුණු පසුව දළ කුමාරයාට ගිරිදේවිය ගැන තොරතුරු දැනගන්ට ලැබීමෙන් මහත් කලබලයක් ඇති කරන්නට පටන් ගත්තේය. දෙමා-පියන්ගෙන් තම නැගණිය බලන්නට අවසර ඉල්ලා සිටිය ද කිසිසේත්ම ඊට අවසර නොලැබිණි. නොයෙ-කුත් උපක්‍රම යෙදුවද ඵලක් නොවුණු අතර හොර ලෙඩක් බොරු අමාරුවක් පෙන්වා දැඩි ගිලන් බවක් ඇති කර ගත්තේය. අවසානයේ දෙමාපිය-න්ගෙන් තම නැගණිය බැලීමට හමුවී-මට කුමාරයාට අවසරය ලැබිණි.

ඉතාමත් රූපයෙන් අගතැන්පත් ගිරිදේවිය දැකීමෙන් සහෝදර ප්‍රේමය අමතක වී ගොස් කාමයෙන් උන්මාද වුණු දළ කුමාරයා අනාවැකිකරුවන්ගේ මතය සත්‍යයක් බවට පත් කරමින් කෙසේ හෝ ගිරිදේවිය පොළඹවාගෙන සංවාසයේ යෙදුණේය. (කෙලෙසී-මට ලක්විය) අධික චිත්තපීඩාවට පත් කුමරිය (ගිරිදේවිය) ගෙල වැලලාගෙන සියදිවි නසා ගත්තාය.

මේ පුවත අසා ආ දළ කුමාරයාට ගිරි දේවියගේ මළ සිරුර දක්නට ඕනෑ වුවත් එය අතුරුදන්ව තිබිණි. (ශක්‍රයා විසින් දේහය සඟවා තැබූ බව ගිරිදේවි අස්නේ හා තවත් පුරාණ පතපොතේ සඳහන් වේ.) ගිරි කුමරියගේ මළ සිරුර දක්නට නොලැබීමෙන් රාක්ෂයකු හා යක්ෂයෙන් මෙන් කිපුණු දළ කුමාරයා දඹදිව හා සක්වළ පුරාවට මහා විනා-ශයක් කරමින් ගම්බිම් පාළු කරමින් මිනිසුන්ට ශාප කරමින් සතුන් අල්ලා ලේ බොමින් ගමන් කරන්නට විය. මේ විනාශය දුටු ශක්‍ර දේවේන්ද්‍රයා දළ කුමරු හට සිය නැගණියගේ දේහය පෙන්වා සිත සනසවා කළ වරද කියාදී ගිරිදේවියට නැවත පණ පිහිටුවා ශක්‍ර භවනට රැගෙන ගියේය. අර්ධ යක්ෂ හා අර්ධ දේව ලෙස ගිරිදේවිය හඳුන්වන අතර දළ කුමාරයා ද විටක දේව-තාවෙක් හා විටක යක්ෂයෙකු ලෙස ප්‍රචලිත වෙයි.

**මාස 3ක් කල්ගතවන තුරු බිලිඳු දරුවා පෙර ආත්මයේ පෙර භවයේ සැරිසරන බවත් එහිදී දකින කරන දේ අනුව මෙසේ හඬනා බවත් තව මතයකි. මාස 3 ක කාලයක් යනතුරු අමනුෂ්‍ය බලවේගවල බලපෑම් හේතුවෙන් සිහිනෙන් පහර දීම්, වන සතුන්ගෙන් වන පීඩාවන් ඇතිවීම, ජලයේ ගිලීම, ගින්නෙන් දැවීම ආදී දේ නින්දේදී දකින දරුවා බියවී මළ මුත්‍ර පිට කරමින් ඇස් ලොකු කරගෙන උඩබලා හැඬීම බාලගිරි දෝෂයේ ලක්ෂණ වෙයි**

දෙවියකු, දේවතාවියෙකු - යකෙකු, යක්ෂණියක ලෙස ප්‍රචලිත වුවත් ඔවුන් වෙනුවෙන් වෙන්වුණු දේවාල ඇදැහීම් ක්‍රම ලංකාවේ නොමැති වුවත් සිංහල ගැමි සමාජයේ නොයෙක් පළාත්වල පුද පූජා ලැබීම සිදුවෙයි.

(ගිරියක්ෂණී - ගිරිදේවිය / දළකුමා-රයා - ගරා යක්ෂයා)

ජනප්‍රවාදයේ සඳහන් වෙයි.

මදන ගිරි ඤත ගිරි පට්ටි ගිරි
හපුමල් ගිරි නීල ගිරි කොට ගිරි
බාලගිරි රත්නගිරි අඳුන් ගිරි
මෝලන් ගිරි හඳුන් ගිරි වලියක් ගිරි

මේ අතරට දළ කුමාරයා හටද අවතාර දොළසක් ඇති බවද සඳහන් වෙයි. අඳුන්ගරා, සඳුන්ගරා, පුෂ්ප ගරා, කණ ගරා, සොහොන් ගරා, දේස ගරා, අමා ගරා, ලවුන ගරා, වාත ගරා, කොට ගරා, නීල ගරා, පට්ටි ගරා, බාලගිරි යක්ෂයා, බාල-ගිරි යක්ෂණී, බාලගිරා යන මේ කොයි නමිනුත් හඳුන්වන බාලගිරි දෝෂයට එක්වුණු කාල වකවානු-වක් පැහැදිලිව සොයාගත නොහැකි නමුත් එය මුල් බැසගත් සමාජ මතයක් වී තිබේ.

මාස 3ක් කල්ගතවන තුරු බිලිඳු දරුවා පෙර ආත්මයේ පෙර භවයේ සැරිසරන බවත් එහිදී දකින කරන දේ අනුව මෙසේ හඬනා බවත් තව මත-යකි. මාස 3 ක කාලයක් යනතුරු අම-නුෂ්‍ය බලවේගවල බලපෑම් හේතුවෙන් සිහිනෙන් පහර දීම්, වන සතුන්ගෙන් වන පීඩාවන් ඇතිවීම, ජලයේ ගිලීම, ගින්නෙන් දැවීම ආදී දේ නින්දේදී දකින දරුවා බියවී මළ මුත්‍ර පිට කරමින් ඇස් ලොකු කරගෙන උඩබලා හැඬීම බාලගිරි දෝෂයේ ලක්ෂණ වෙයි.

මවටවත් සනහාගත නොහැකි ලෙස අධික හැඬීම හා ඇඟ මුහුණ රතුවන සේ අධික බියක් ඇති බව දනවන ලෙස ඇඬීම මෙහි උච්චතම අවස්ථාවයි.

බාලගිරි, නීලගිරි, සඳුන්ගිරි, අඳුන්ගිරි, මදනගිරි යන ගිරි යක්ෂණිය හෙවත් ගිරිදේවියගේ අවතාර මෙම ලෙඩ රෝග පීඩා ඇති කරවන බව සඳහන් වෙයි.

දළ කුමාරයාගේ ලිංගික බලපෑම් හේතුවෙන් කුස තුළ හටගත් දරු කළ-ලය, ගිරි දේවියත් සමඟ මිය යාමත් හා ඇතිවුණු දුක - සෙනෙහස කෝපයකට ද්වේෂයකට හැරවී මෙම අදෘශ්‍යමාන බලවේග හටගෙන ඇති බව සඳහන් වේ. බාලගිරි දෝෂයටම මුල්තැනදී කට-යුතු නොකළ යුතුයි. කුඩා දරුවන්ගේ බඩ පිපුම, බඩ අජීර්ණ, ස්වසන පීඩා, කුඩා කෘමි සතුන් දෂ්ට කිරීම්, ශීත-ලෙන් වන පීඩා, රශ්මියෙන් වන පීඩා හේතුවෙන් බිලිඳු දරුවාට වන උපද්‍රව සොයා බලා කටයුතු කිරීම යහපත් වේ.

එවැනි පීඩාකාරී අමනුෂ්‍ය දෝෂ, බාලගිරි දෝෂ සඳහා දරුවා සිටින ස්ථානයේ මෙම ඔසු ධූපය, රතන සූත්‍රයෙන් 21 වර කරණීය මෙත්ත සූත්‍ර-යෙන් 21 පිරිත් කර උදේ සවස දුම් අල්ලන්න.

සල්දුම්මල කුඩු කාලයි, අබ, සුවඳ කොට්ටං, පූජා කරන ලද පිච්ච මල්, බෙලි කොළ, රත්ණ, කුරුඳු පොතු, එනසාල්, කරාබුනැටි ඉතා පිරිසිදුව සිහින්ව කොටා එකට මිශ්‍ර කර එයට තල තෙල් අවුන්ස එකක්, පැඟිරි තෙල් අවුන්ස එකක්, පිච්ච තෙල් අවුන්ස එකක් දමා නැවත හොඳින් මිශ්‍ර කර අසුරනයකට දමා භාවිතයට ගන්න.

හිස තබන කොට්ටයට - නවගුණ යන්ත්‍රය හෝ රතන යන්ත්‍රය පිරිසිදුව ඇඳ පිරිත් කර (108 වරක්) ඇතුළට දමන්න. අරුද කොළ, කොහොඹ කොළ, කරපිංචා, ගොටු කොළ ස්වල්පයක් ගෙන රන්තැඹිලි තෙල් කාලකට කොටා දමා මඳගින්නේ මැටි වලඳේ කකාරා තබා රතන සූත්‍රයෙන් පිරිත් කර තෙල් පෙරා ගෙන වීදුරු බෝතලයකට දමා උදේ කාලයේ බින්දු 3ක් ගෙන දකුණු අතින් හිසට දමා හිස අතගාන්න.

ගිරිදේවිය හා බැඳුන කථා පුවත් විශාල ප්‍රමාණයක් ඇති අතර ගිරිදේවි බලිය නමින් යාග බලි ශාන්තියක් ද රජරට ප්‍රදේශයේ පවතී.

ගිරිදේවි අස්න, ගිරිදේවි උපත, ගිරිදේවි කාව්‍ය, ගිරිදේවි නර්තනය ශ්‍රී ලංකාවේ චිරප්‍රසිද්ධ සම්ප්‍රදායන් වී හමාරය. බාලගිරි දෝෂය ඇති වන්නට මූලික වුන කථාව මෙසේ හෙයින් අද පැමිණෙන දෝෂය අද නොවේ හෙට යනුවෙන් සඳහන් කර-න්නට ගැමියා පෙලැඹුණේ ඒ සඳහා ශාන්තිකර්ම නොදැන නොවන බවට අප දැනගත යුතුවේ. බාහිරින් පැමි-ණෙන ඕනෑම අයෙකුට මෙම නිවසේ කුඩා බිලිඳකු සිටින බවට සමාජයට පණිවිඩයක් බෙදා හැරීමත් ඉන් සිදු-විය. එතුළින් දරුවා කිලිකුණු, විෂබීජ-වලින් වළක්වා ආරක්ෂා කර ගැනීමට හැකියාවක් ද නොදැනීම ඇතිවිය.

## කිරි පැණි ඉතිරෙන රවි - බුධ - සිකුරු සංයෝගය අප්‍රේල් මස ඇරඹේ

● අජිත් ධර්මසිරි

**බක් මාසය නැතිනම් භාග්‍යමත් මාසය එළඹී-මත් සමඟ විශ්වයේ අසිරිමත් ග්‍රහ රටාවක් නිර්මාණය වන්නේ ය. ඒ රටාවට අනුව රවි - බුධ සිකුරු ග්‍රහ ත්‍රිත්වය එකම රැසේ ගමන් කිරීමයි. ඒ අනුව රවි අප්‍රේල් 14 වැනි දින අලුයම 02.33ට සිය උච්ච රාශිය වන මේෂ රාශියටත් අප්‍රේල් 10 වැනි දින උදේ 06.29 ට සිකුරු සිය සම රාශියක් වන මේෂ රාශියටත් බුධ අප්‍රේල් 16 වැනි දින රාත්‍රි 08.58 ට සිය සම රාශියක් වන මේෂ රාශියට පිවිසීම සිදු කෙරේ. මෙසේ සුබම සුබ ලෙස එකට එක්වූ කල කිරි පැණි සේ රටට කිරි උතුරා යන බව අමුතුවෙන් කිව යුතු නොවේ.**

රවි යනු රාජකාරක ග්‍රහයාය. ග්‍රහලොව ප්‍රධානි-යාය. තේජස - එඩිතර බව ඉදිරිපත්වීම පිරිසිදු බව නිවැරැදි බව ආදී බොහෝ දේට ආලෝකය සපයන්නා ය. කුජ නීචව සිට රටට ජනතාවට ආයතන ප්‍රධානීන්ට රට කරවන අයට අවනඩු අපකීර්ති නින්දා සහිත බාධා කිරීම් කකුලෙන් ඇදීම් කළ ද මේ ග්‍රහ ත්‍රිත්වයත් සමඟ ගුරු නීචයෙන් මිදී බලවත් වීම ද රටේ ස්වෛරී භාවයට එකමුතු කමට අභිවෘද්ධියට හේතු වන්නේය. නීතිය සමානාත්මතාව හා එඩිතර තීන්දු තීරණ රැගෙන රට පෙරට යාමට මේ රවි මේෂ රාශි ගතවීම අප්‍රේල් 14 න් පසු නියත-වම සිදුවන්නේය. මීළඟට අපි බුධ මේෂ රාශි ගතවීම දෙස බලමු. ඥානයට නැණ නුවණට පොත පතට දැනුමට ප්‍රධාන වන්නා වූ හා සෘජු තීන්දුවලට සමානාත්මතාවට ආගමික සහජීව-නයට හේතු සාධක වන බුධ බලවත් වීම රටට බුද්ධිමත් තීන්දු තීරණ ගෙන පෙරට යාම-ටත් බුද්ධිමතුන්ගේ ඒකරාශිවීම එකට අත්වැල් බැඳ ගැනීම මත ශක්තිමත් වන පවුරක් ගොඩ නැගෙනු ඇත. කලක් බුධගේ නීචය මත වැරැදි ආකල්ප අනුවණ සහගත ක්‍රියා කළ බොහෝ අයගේ නුවණ පෑදී ඉතා යහපත් ආකල්ප ඇති පිරිසක් සඳහා මෙය ද හොඳ පිහිටීමකි.

සිකුරු නීචව සිට භාග්‍යමත් මාසයේ බලවත් වෙමින් කලක් පැවැති ස්ත්‍රී දූෂණ බාල අපචාර සොර මැරකම් එදිරිවාදිකම් ඉවත් වන සමාජ රටා-වක් නිර්මාණය වනු ඇත. විශේෂයෙන් කලාවට - ආගමික සහජීවනයට නිදහස් අදහස්වලට මෙන් ම කුසලතා පූර්ණ මිනිසුන් බිහි කිරීමට හේතු සාධක වන සිකුරු විශ්වයේ බලවත් වීම අප රටේ කාන්තා පරපුරට ළමා පරපුරට වැදගත් සන්ධිස්ථානයකි. මිනිසුන් හොඳ නරක තේරුම් ගෙන හොඳ ආක-ල්පමය වෙනසක් ඇති කර ගනිමින් එකිනෙකා අතර සහජීවනයට ද එදිරිවාදිකම් අවසන් කිරීමට ද හේතු සාධක වන්නේ ය. ඒ හැරෙන්නට යහපත් නිර්මාණශීලී මිනිසුන් බිහි කිරීමට සිකුරු හේතුවේ.

විශේෂයෙන් ම ලෙඩ රෝග උවදුරු අවසන් කොට සිකුරු යහපතේ හැසිරෙන බක් මාසය සැබවින් ම සතුටුදායක වෙයි. අනුකම්පාව සුහ-දත්වය සහිත නිර්මාණ බිහිවීම කලාව පෙරමුණ-ගෙන නාට්‍ය - චිත්‍රපට - හා සාරගර්භ පොතපත නිර්මාණයවීම යහපත් මුද්‍රිත මාධ්‍ය සම්ප්‍රදායයන් බිහිවීම මෙන් ම මුද්‍රිත ශ්‍රව්‍ය දෘෂ්‍ය යන සියලු ජනමාධ්‍ය අංශවල යහපත් ප්‍රගමණයකට හේතු වන්නේය. රවි - බුධ - සිකුරු ගත ග්‍රහ ත්‍රිත්වය ද ගුරු යන යහපත් උපදේශිකයා ද යහපතේ හැසි-රෙන බක් මාසය අපට රටට ඉතා සෞභාග්‍යවත් යුගයක ආරම්භයක් වනු නො අනුමානය.

## බිලිඳු නමට අකුරු



● සමන්ති අහුබුදු

**04 ඉරිදා**
02.38 තෙක් මූල නැකැත යි.
සුදුසු අකුරු "යෙ, යො, බ, බි"

**05 සඳුදා**
04 ඉරිදා 02.38 සිට 05 සඳුදා 02.05 තෙක් පුවසල නැකැත යි. සුදුසු අකුර "බු"

**06 අඟහරුවාදා**
05 සඳුදා 02.05 සිට 06 අඟහරුවාදා 02.04 තෙක් උත්‍රසල නැකැත යි. සුදුසු අකුරු "බෙ, බො, ජ, ජී"

**07 බදාදා**
06 අඟහරුවාදා 02.04 සිට 07 බදාදා 02.34 තෙක් සුවන නැකැත යි. සුදුසු අකුරු "ජු, ජෙ, ජො,ෂ"

**08 බ්‍රහස්පතින්දා**
07 බදාදා 02.34 සිට 08 බ්‍රහස්පතින්දා 03.32 තෙක් දෙනට නැකැත යි. සුදුසු අකුරු "ග, ගි, ගු, ගෙ"

**09 සිකුරාදා**
08 බ්‍රහස්පතින්දා 03.32 සිට 09 සිකුරාදා 04.57 තෙක් සියාවස නැකැත යි. සුදුසු අකුරු "ගො, ස, සි, සු"

**10 සෙනසුරාදා**
09 සිකුරාදා 04.57 සිට 10 සෙනසුරාදා 06.45 තෙක් පුවපුටුප නැකැත යි. සුදුසු අකුරු "සෙ, සො, ද, දි" ඉන්පසු ඉරිදා 08.57 තෙක් උතුරුපුටුප කැනැත යි. සුදුසු අකුර "දු"

මෙහි වේලාව දක්වා ඇත්තේ පැය 24 ඔරලෝසුව අනුවයි.



සුවස් ඇළේ හිරවී ලොව හෙල්ලූ 'එවර්ගිවන්' පිටුව 27



ශාන්ති දිසානායක ලියූ කෙටිකතාව පිටුව 29




# ගල්කිස්සේ මුහුදු වෙරළට දැන් ගිහින් බලන්න




ගල්කිස්ස වෙරළ හෝටලය සමඟ එදා සහ අද

● නිහාල් පී. අබේසිංහ

**අපේ රටට සල්ලි ලැබෙන සංචාරක ව්‍යාපාරයට ප්‍රධාන රුකුලක් වූයේ රට වටා ඇති මුහුදු වෙරළවල පවතින ස්වභාව සෞන්දර්යයි. වරක් ප්‍රවීණ විද්‍යා ප්‍රබන්ධ ලේඛක ආචාර්ය ආතර් සී. ක්ලාක් පැවසුවේ අපේ රටේ තරම් පළල වෙරළ තීර ලොව කොහේවත් නොමැති බවයි. අපේ රටේ ඇති වෙරළ තීර අතරින් එතෙර මෙතෙර සංචාරක සිත් දිනාගත් සුවිශේෂී වෙරළ තීරයක් ලෙස ගල්කිස්ස වෙරළ තීරය හැඳින්වීමට පුළුවන. ගල්කිස්ස මහ හෝටලය නිසාම එම වෙරළේ සුවිශේෂත්වය වැඩිවී තිබේ. එමෙන්ම පසුගිය වසරේ අප්‍රේල් මැයි කාලවලදී මේ ගල්කිස්ස වෙරළ තීරය සුවිශේෂී කතාබහකට ද ලක්විය. ඒ අන් කරුණක් නිසා නොව එහි වෙරළ තීරය වැලිවලින් ගොඩ කිරීම් පිළිබඳවයි.**

ගල්කිස්ස වෙරළ තීරය අසල දුම්රිය මාර්ගයකි. එමෙන්ම වෙරළේ සුන්දරත්වය විඳින්න එතෙර මෙතෙර සංචාරකයන් පැමිණෙන්නේ ගල්කිස්ස මහ හෝටලය ඇතුළු හෝටල් හා ආපනශාලා රැසක් වෙරළ අසල තිබෙන බැවිනි. එමෙන්ම සති අග දිනවලදී අපේ රටේ සංචාරකයෝ ද මේ වෙරළට විනෝදාස්වාදය හා සුන්දරත්වය විඳීමට පැමිණෙති. ඔවුන් සඳහා සුන්දර ආරක්ෂාකාරී වෙරළක් සුරැකීම රජයේ යුතුකම වේ. මේ අරමුණ ඇතිව 2020 අප්‍රේල් මාසයේ ගල්කිස්ස වෙරළ ප්‍රති පෝෂණය කිරීම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආරම්භ කළේය.

එසේ වුවත් ඊට පසු පැවැති කුණාටු හා මෝසම් නිසා එහි පිරවූ වැලි ප්‍රමාණය තරමක් අඩුවිය. ඒ පිළිබඳව සමගි ජන බලවේගයේ දේශපාලනඥයන් හා සමහර සමාජ මාධ්‍ය ජාල මේ ගල්කිස්ස වෙරළ තීරය පිළිබඳව විද්‍යානුකූල නොවන දේශපාලනික මත ප්‍රකාශ කළේ මේ වෙරළ තීරය වැලිවලින් පිරවීම මුදල් විනාශයක් පමණක් බවට රජයට බොරු චෝදනා කරමිනි. නමුත් දැන් මේ ගල්කිස්ස මුහුදු වෙරළට යන ඕනෑම කෙනෙකුට ඒ පාඨලි චම්පික හා ආචාර්ය හර්ෂ ද සිල්වා කළ බොරු දේශපාලන චෝදනාව අතේ පත්තුවන බොරුවක් බව පැහැදිලිව ඇස්පනා පිට ඔප්පු වේ.

මේ වෙරළ තීරය වැලිවලින් පිරවීම තනිකරම කර ඇත්තේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙනි. එහි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුදත් යාලේගම පවසන්නේ මේ මුළු වැලි පිරවීම් ව්‍යාපෘතියට වියදම් වූ මුදල රුපියල් මිලියන 110ක් පමණක් බවයි. "අපි මේ වැඩේ දවස් 6කින් අවසන් කළා. අපි ව්‍යාපෘතිය අවසන් කරන විටදීම බුරවි සුළං කුණාටුව හා නිරිතදිග මෝසම දරුණු ලෙස ආවා. පුරවපු වැලි ටිකක් ගියා. නමුත් ඒ වැලි ගල්කිස්ස අසල මුහුදු පතුලේ තිබී 2020 ජූලි මස වෙරළටම ආවා. දැන් මේ ව්‍යාපෘතිය සාර්ථක වී මීටර් 2500ක් දිග මීටර් 50ක් පළල වෙරළ තීරයක් අපට ලැබී තිබෙනවා." යැයි ඔහු කියයි.



**මේ වෙරළ 2017දී හුගක් විනාශ වුණා... හොඳම විසඳුම ලෙස වෙරළ ප්‍රතිපෝෂණය මඟින් අලුත් වෙරළක් හැදුවා...**

- වෙරළ සංරක්ෂණ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් **ආර්.ඒ.එස්. රණවක**

මේ පිළිබඳව අදහස් පළ කරන වෙරළ සංරක්ෂණ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්.ඒ.එස්. රණවක මහතා පැවසුවේ මෙම ගල්කිස්ස වෙරළ ප්‍රදේශය වරින් වර වසර ගණනාවක් තිස්සේ ඛාදනයට ලක්වූ බවයි.

ඒ අනුව අපි මේ ස්ථානය සුරැකීමට දිගුකාලීන හා කෙටිකාලීන විසඳුම් ක්‍රියාවට නැංවූවා. කෙටිකාලීන විසඳුම් ලෙස දුම්රිය මාර්ගය අසලට ගල් දැමුවා. දිගුකාලීන විසඳුම් ලෙස අපි තීරණය කළේ මේ වෙරළ තීරයට වෙරළ ප්‍රතිපෝණෂණය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටය. දැනට ලොව තිබෙන වැලි පිරවීමේ දියුණුම තාක්ෂණ ක්‍රමය වන්නේත් දැනට වෙරළබඩ ඉංජිනේරුවන් ලෙස ලබාදිය හැකි හොඳම විසඳුම් ක්‍රමය මෙන්ම වෙරළ ඛාදනයට දැනට ලබාදෙන හොඳම විද්‍යාත්මක විසඳුමක් වන්නේත් මේ වෙරළ ප්‍රතිපෝෂණ ක්‍රමයයි. වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා ගල් යොදා විසඳුම් සෙවීම අපහසු කාර්යයක්. ගල් යොදලා වෙරළ සුරකින විට සංචාරක ව්‍යාපාරයට, ධීවර කර්මාන්තයට, මෙම වෙරළට විනෝදාස්වාදය සඳහා භාවිත කරන අයට විශේෂ බාධාවක් වෙනවා.

ඒ අයගේත් ඉල්ලීම් අනුව ඒ අයට පහසුවක් වන පරිදි හා ඒ අයට වඩා පහසුවෙන් මේ වෙරළ




ගල්කිස්ස මුහුදු වෙරළ 2020 අප්‍රේල්වල සිට 2021 පෙබරවාරි දක්වා වර්ධනය වූ අයුරු

පාවිච්චි කිරීමට හැකිවන පරිදි සහ වෙරළ ඛාදනයට ලබාදිය හැකි හොඳම විසඳුම ලෙස තමයි මේ වෙරළ ප්‍රතිපෝෂණ ව්‍යාපෘතිය පටන් ගත්තේ." රණවක මහතා පවසයි.

මුලින්ම මෙම ස්ථානය පිළිබඳ ගැඹුර පිළිබඳ අධ්‍යයනය කළා. ඒ අනුව මීට වසරකට පමණ පෙර වැලි මීටර් කියුබ් 150,000 පමණ රත්මලානට නුදුරු මුහුදෙන් අරන් ආවා.

මීටර් 100ක් මුහුද දෙසටත් ගල්කිස්ස හෝටලය අසල සිට දෙහිවල දෙසට මීටර් 250ක් පළල ප්‍රදේශයක් සඳහා වැලි යෙදෙවුවා. බටහිර වෙරළේ වැලි ගමන් කරන්නේ දකුණ සිට උතුරට. ඒ අනුව මෙම කෘත්‍රිම ලෙස යොදන වැලි ප්‍රමාණය ස්වභාව ධර්මය අනුව යොමු කරලා අතිපෝෂණ කටයුතු නිමාවට පත්කළා.

දැන් මේ වෙරළ තීරය සම්පූර්ණයෙන් වැලිවලින් පෝෂණය වෙලා තිබෙනවා. ඒ අනුව ගල්කිස්ස මහ හෝටලයේ සිට කිලෝමීටර 2.5ක් විතර ප්‍රමාණයක් වෙරළ පුරා වැලි තිබෙනවා ඔබට දකින්න පුළුවන්. වෙරළ දැන් යළි ප්‍රතිනිර්මාණය වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් මීටර් 30 - 35 - 45 දක්වා පළලට මේ වෙරළ විකාශනය වෙලා තිබෙනවා. මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය අපිට දැන් දකින්න පුළුවන්. ඉදිරියේදි එන මෝසම්වලට ඔරොත්තු දෙන අයුරින් තමයි මේ වැලි යොදලා තිබෙන්නේ.



**දවස් 6කින් තමයි වෙරළට වැලි පිරෙව්වෙ... මෝසම් කාලයටත් මෙය ඔරොත්තු දෙනවා...**

- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු **ලිලානි රුහුණගේ**

මේ කටයුත්ත කරන්නේ කොටස් 3කට. ඒක කරන්නේ මෙහි සමතුලිතතාව රැක ගැනීම පිණිසයි. මෙහි වැලි ස්තර තුනක් දමනවා. පළමු වැලි ටික හේදිලා යනවා. ඒ වැලි වෙරළට ආසන්න ගැඹුරු මුහුදේ තැන්පත් වෙනවා. ඒ මඟින් එහි ගැඹුර අඩුකර අපේ ප්‍රධාන වැලි නිධියට දියවැල් වලින් හා තරංග ජල බලපෑම් අඩු කරනවා. ඒ අනුව ඊට පසු දියවැල් හා තරංග මඟින් උතුරට මේ වැලි ගමන් කරනවා.

මෙම වැලි නිධියේ තවත් ස්තරයක් තිබෙනවා.



**වැලි පිරවීමේ ව්‍යාපෘතිය සාර්ථකයි.... දැන් මී.2500ක් දිග මී.40-50 අතර පළල වෙරළක් ගල්කිස්සට තියෙනවා...**

- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් **ආචාර්ය සුදත් යාලේගම**

එමඟින් කරන්නේ කුණාටු හා මෝසම් සුළං අවස්ථාවලදි මුලින් පිරවූ ප්‍රධාන වැලි නිධිය සුරැකීමයි.

2017 ජුනි වලදි දරුණු ලෙස මේ වෙරළ ඛාදනය වුණා. 2020 පුරවපු වැලි ප්‍රමාණය ඒ අයුරින්ම දැන් මේ වෙරළ පුරා කිලෝමීටර් 2ක් පුරා පැතිරී තිබෙනවා" ඔහු කියයි.

මෙම ව්‍යාපෘතියට පසුබිම් වන බව පැවසෙන්නේ 2017 වසරේ යෝජනා කරන ලද කළුතර කැලිඩෝ වෙරළ තීරය සහ අඟුලාන වෙරළ තීරය වැලිවලින් කෘත්‍රිමව පෝෂණය කිරීමේ ව්‍යාපෘතියයි. මෙම යෝජනාවට පසුබිම වන්නේ එම වසරේ මැයි මාසයේ ඇති වූ මහා ගංවතුර තත්ත්වයි. ගල්කිස්ස මුහුදු තීරය සඳහා පිරවෙන්නේ වැලි කියුබ් 1,50,000කි. මීට වැලි මෝටර් සහ පොම්ප යොදා රත්මලාන මුහුදු තීරයේ සිට පොම්ප කර ඇත.

"පසුගිය වසරේ එම වෙරළට වැලි දමා තිබූ අයුරුත් ඊට පසු වාරකන් කාලයේදී එම වැලි කඩාගෙන ගොස් ඇති අයුරුත් බැලුවම අපිට ඉතා දුකක් ඇතිවුණා. නමුත් අද මේ ව්‍යාපෘතියෙන් ගල්කිස්සේ වෙරළට එන සියලු දෙනාටම යහපතක් සිදුවී තිබෙනවා." මේ ගල්කිස්ස වෙරළේ ව්‍යාපාරවල නිරත පිරිසකගේ අදහසයි.

"ඉස්සර මේ වෙරළ හරහා යන්න බැහැ. නමුත් දැන් වෙරළ හුගක් පළලයි. අපිට දෙහිවල ස්ටේෂන් එක දක්වා එක දිගටම වෙරළ දිගේ යන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම මේ ව්‍යාපෘතිය නිසා අපේ ව්‍යාපාරවලට ලොකු සෙතක් ලැබෙනවා." ගල්කිස්ස වෙරළ අසල පිහිටි සංචාරක හෝටලයක නිලධාරියෙක් අප සමඟ කීය.

"අපි මේ වෙරළේ හුගක් කල් ඉඳන් සෙල්ලම් කරනවා. 2016 - 2017 කාලවලදී මේ වෙරළ කැඩී ගිය නිසා සෙල්ලම් කරන්න බැරිවුණා. නමුත් දැන් සතුටුයි වෙරළ ලොකුයි. ඒ නිසා වෙරළේ සෙල්ලම් කරන්න බාධාවක් නැහැ." දෙහිවල තිළිණ රුවන් අප සමඟ කීය.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධාන ඉංජිනේරු ලිලානි රුහුණුගේ මහත්මිය පවසන්නේ ඔවුන් 2020 අප්‍රේල් මාසේ කළ වැලි පිරවීම දැන් සාර්ථක වී ඇති බවයි.

ගල්කිස්ස හෝටලය අසලට අපි මුලින්ම වැලි පිරවූවා. බටහිර වෙරළ තීරයේ වැලි ගමන් කිරීම වැඩිපුරම සිදුවන්නේ උතුරු දිසාවට. අපි 2020 අප්‍රේල් මාසේ 16 සිට 22 කාලය ඇතුළත මේ වැලි පිරවීම් කළා. නමුත් බුරවි සුළි සුළං හා අන්තර් මෝසම් වැසි බලපෑවා. මේ නිසා වැලි ටිකක් අඩුවුණා. අපි ස්ථාන 5ක් ඇතුළත පසු විපරම් කළා. ඒ අනුව පෝෂණ ස්ථානයේ සිට විවිධ දුරවලින් මේ පසු විපරම් කළා. ඡායාරූප බැලුවා. ඊට පස්සේ හරස්කඩ මැනීම මුහුදු පතුලේ වැලි තැන්පත්වීම් පිළිබඳව ස්ථාන 5ක බැලුවා. ඒ අනුව කිලෝමීටර් 2ක් දුරට මේ වැලි ගිහින් තිබෙනවා. මේ වැලි ප්‍රති පෝෂණය සකස් කර තිබෙන්නේ මෝසම් වැසි කාල දෙකක් සඳහායි.

ගල්කිස්ස හෝටලය ළඟ මුල්ම පිරවීම් කළත් එහි සිට මීටර් 500 ක් උතුරු දෙසට දැන් වෙරළ මීටර් 50ක් වැලි පිරී තිබෙනවා. හෝටලයේ සිටි මීටර් 1000ක දුරින් වෙරළ දැන් මීටර් 40ක් පළලට සැකසී තිබෙනවා. දැන් දෙහිවල දුම්රිය නැවතුම දක්වාම මේ වෙරළ සකස් වෙලා. එහි අලුත් වෙරළේ පළල මීටර් 20 ක පළලයි.

මේ අනුව කවුරු කෙලෙස කිව්වත් මේ ගල්කිස්ස වෙරළ පිරවීම සාර්ථක වෙලා තිබෙනවා. විද්‍යාවට බොරු කරන්න බැහැ. ප්‍රධාන ඉංජිනේරුවරිය පවසන්නීය.

ගල්කිස්ස මහ හෝටලයේ ප්‍රධාන සූපවේදී ආචාර්ය පබ්ලිස් සිල්වා මහතා මීට සති කිහිපයකට පෙර සමාජ මාධ්‍ය ජාලයකට පවසා තිබුණේ ගල්කිස්ස වෙරළ තීරය වැලිවලින් පිරවීම සාර්ථක කටයුත්තක් බවයි. ඒ නිසා දැන් සංචාරක ව්‍යාපාරයට ගල්කිස්ස වෙරළ ඉතා සුදුසු මට්ටමක පවතින බවත් එම සමාජ මාධ්‍යයට ඔහු පවසා තිබිණි. එසේ වුවත් සිළුමිණ ගල්කිස්සේ මුහුදු වෙරළට වැලි පිරවීම ගැන 30 වැනිදා පෙරවරුවේ ඔහුගෙන් විමසූ විට ඔහු පැවසූයේ "මම ඒක පිළිබඳව දැන් කිසිම ප්‍රකාශයක් කරන්නේ නැහැ" යනුවෙනි.



**ගල්කිස්ස වෙරළේ වැලි පිරවීම ගැන මම දැන් කිසිම ප්‍රකාශයක් කරන්නේ නැහැ...**

- ගල්කිස්ස මහ හෝටලයේ ප්‍රධාන සූපවේදී **පබ්ලිස් සිල්වා**

මේ සියලු කරුණු අනුව අපට කියන්නට තියෙන්නේ අගමැති තුමන් යටතේ ඇති වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කළ ගල්කිස්ස වෙරළ සංරක්ෂණ ප්‍රති පෝෂණ ව්‍යාපෘතිය දැන් ඉතා සාර්ථක බවයි. එයට අදාළ ව වෙරළ ඉංජිනේරුවන් විද්‍යාත්මක හේතු පැහැදිලිව පෙන්වා ඇත. ඒ නිසා පසුගිය වසරේ අප්‍රේල් මාසයේ විපක්ෂයේ සමහර දේශපාලනඥයන් කියූ කතා දැන් අතේ පැළවෙන බොරු බවට පත්වි ඇත.

මේ අනුව මේ දිනවල රටේ තැනින් තැන පරිසර විනාශයන් සිදුවන බවට මවා පෙන්වන සමහර මාධ්‍ය හා සමහර සමාජ මාධ්‍ය මඟින් පිළිබිඹු කරන වැරදි ප්‍රචාර ද නුදුරේදීම පදනමක් නැති බොරු ප්‍රචාර බවට විද්‍යානුකූලව ඔප්පු වෙනු ඇතැයි විශ්ලේෂකයෝ පෙන්වා දෙති.

**සේයා රූ - කැලුම් ලියනගේ**

# පහන සමඟ කෙළෙස් ගිනි ද නිවී ගියා...




**ඇගේ නම පටාචාරා ය. ඇය උපන්නේ සැවැත්නුවර සිටු මැදුරකය. ඇගේ පෙම්වතා වූයේ සිටු මැදුරේ මෙහෙකරුවෙකි. ප්‍රේමය විසින් වෙහෙසවනු ලැබූ ඇය ඔහු සමඟ එක් රැයෙක පලා ගියා ය.**

ඈත ගමක කුඩා ගෙයක පදිංචි වූ ඔවුන්ගේ ජීවිතය දුක් මුසු වුව ද පටාචාරා ඔහු හැර දැමීමට නොසිතුවාය. පළමු දරුවාගේ උපත සිදුවන්නට පෙර ගමට ගොස් මා පියන් බලා එමුදැ'යි ඇය සැමියාගෙන් ඇසුවාය. ඔහුගෙන් ඒ සඳහා කැමැත්තක් නොලැබිණ.

දෙවැනි දරුවාගේ උපත සිදුවන්නට පෙර ඇයට ගමට යාමට වුවමනා විය. මගදී පුතුගේ උපත සිදුවිය.

මහ වැස්සක් වැටිණ. වන මැද සිටි ඇයත්, දරු දෙදෙනාත් වැස්සෙන් රැක ගැනීමට සිතු සැමියා අතු කැබලි ටිකක් ගසකින් කඩා ගැනීමට ගියේය. ගසට අත තබන විට ම සර්පයෙක් ඔහුගේ පය දෂ්ට කළේය.

"ඇයි ඔහු පමා"

පටාචාරා තෙමී තෙමී දරු දෙදෙනා ද ගෙන සැමියා සෙව්වාය. ඇයට හමුවූයේ ගසක් මුල ඇද වැටී තිබුණු ඔහුගේ මළ සිරුර ය.

ඇය හඬා වැටෙමින් දරු දෙදෙනා ද ගෙන ගමට යන්නට සිතුවා ය. අතර මග ගඟකි. පෙරදා මහ වැස්ස නිසා ගඟ ඉදිරි දෙපස ද වතුරට යට වී තිබිණ. එහෙත් ඇය ඉවුරේ සිටිය දී බිළිඳා ද ගෙන එගොඩ යන්නට දියට බැස්සාය. එගොඩට ගොස් බිළිඳා බිම තණ මත තබා දෙටු පුතු ගෙන එන්නට යළි දියට බැස්සා ය.

එවිට උකුස්සෙක් තණ මත වැතිර සිටි බිළිඳා ඩැහැගත්තේය.

ගඟ මැද සිටි පටාචාරා බිළිඳු හඬ අසා උකුස්සා බිය ගැන්වීමට අත්පුඩි ගැසුවාය. ඒ හඬ ඇසූ දෙටු පුතු "මට අම්මා කතා කරනවා" යි සිතා දියට බැස්සේ, සැඩ පහරට හසුවූයේ නොපෙනී ගියේ ය.

"සැමියා සර්පයෙකුට, දෙටු පුතු ගංවතුරට, පොඩි පුතු උකුස්සාට ගොදුරු වූ පසු මා ජීවත්වන්නේ කුමකට දැයි අසමින් ඇය සිටු මැදුර දෙසට ගියාය.

ඈතින් මහ දුමක් නැඟිණ.

"ඒ කුමක් දැ'යි ඇය මඟියකුගෙන් ඇසුවාය.

"ඊයේ රෑ මහ වැස්සට හසු වී සිටු මැදුර කඩා වැටුණා. සිටුතුමා සහ සිටු දේවිය ඊට යට වී මැරුණා. ඔය පෙනෙන්නේ ඔවුන්ගේ දර සෑයෙන් නැඟෙන දුම" ඒ පුවත ඇසීමත් සමඟ ඇය සිහිසුන් ව ඇද වැටුණාය. නැඟිට්ටේ පිස්සියකි. ඇඳි වත ද ගිලිහී වැටෙද්දී ඇය නිරුවතින් මඟ දිගේ දිව ගියා ය.

"පිස්සියක්" යි කියමින් පුරවැසියෝ ඇයට කැට කැබිලිතිවලින් පහර දුන්හ.

හිස හැරුණු අතේ දිව ගිය ඇගේ ගමන අවසන් වූයේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙනි.

"නැඟණිය සිහිය පිහිටුවා ගන්න."බුදුහු වදාළහ.

ඇගේ උමතුව බිඳිණ. පියවි සිහිය ලැබිණ. තමා නිරුවත්ව සිටිනු ඇයට පෙනිණ. ඇය වහාම බිම හිඳ ගත්තාය. උවසුවෙක් ඇයට සළුවක් දුන්නේය.

ඇය එයින් විළි වසා ගන්නී බුදු රජාණන් වහන්සේට නමස්කාර කළා ය.

"ස්වාමීනි, මට පිහිට වුව මැනවි'යි කී ඇය සිදුවූ විපත හෙළි කළා ය.

"දූ පුතුන්, මා පියන්, සැමියත් ආදීන්ගේ මරණ නිසා මේ සසරේ ඔබ හෙළූ කඳුළු සාගරයේ දිය කඳටත් වැඩියි."

බුදුහු සසර පිළිබඳව දෙසූහ. දෙසුම අග පටාචාරා දුක තුනී කැර ගන්නී සෝවාන් පලයෙහි පිහිටියා ය.

එදිනම ඇය පැවිදි වූවා විදසුන් වැඩීම ඇරැඹුවා ය. දිනක් ඇය දිය කළයකින් පා දොවන්නී දිය පා මතට වැටී මඳ දුරක් ගලා ගොස් පොළොවේ සිඳී යනු දුටුවාය. තවත් වරක් කළයෙන් දිය හෙළූ ඇයට පෙනුණේ මුල් වරට වඩා තවත් ඈතට දිය ගලා ගොස් සිඳී ගිය අයුරු ය. තුන්වන වරට වැටුණු දිය තවත් ඈතට ගලා ගොස් සිඳී ගියේය.

විදසුන් වඩමින් සිටි ඇගේ සිතට එය අරමුණු විය.

"මුලින් ම වැටුණු දිය ගලා ගියේ මඳ දුරකි. එමෙන් ම සත්ත්වයෝ ප්‍රථම වයසේ දී ද මිය යති. දෙවැනි දිය පහර තවත් දුරට ගොස් සිඳී ගිය ලෙසින් සත්ත්වයෝ මධ්‍යම වයසේදී ද මිය යති. මුල් අවස්ථා දෙකටම වඩා තෙවැනි දිය පහර ගලා ගියා මෙන් සත්ත්වයෝ පශ්චිම වයසේදී ද මිය යති."

ඇය මෙසේ ජීවිතයේ අනිත්‍යය මෙනෙහි කළා ය.

ගඳ කුටියේ සිටි බුදුරජාණන් වහන්සේට පටාචාරා මෙහෙණියගේ නුවණ මුහුකුරා ගිය බව පෙනිණ. උන්වහන්සේ එතුමිය දෙසට ආලෝක ධාරාවක් යවමින් මෙසේ වදාළහ.

"පංච උපාදානස්කන්ධය ඇති නැති වන අන්දම නොදැන නිසි ලෙසින්, සිය වස් ජීවත් වෙනවාට වඩා එය ඇතිවන, නැතිවන හැටි දකිමින් එක දවසක් හෝ ජීවත්වන එක උතුම් ය, වෙහෙස වන්න එය දකින්න"

මෙයට සවන් දුන් දා ම පටාචාරා මෙහෙණින් වහන්සේ රහත් බවට පත්වූහ.

කෙලෙසුන්ගෙන් මිදුණු, නිවී සැනසුණු සිතින් ගලා ගිය පටාචාරා රහත් මෙහෙණින් වහන්සේගේ උදානය මෙසේ විය.

නඟුල්වලින් කෙත් සීසා බිජු වපුරා
දනෝ දනය සොයා ගනිති පවුල් රකිති
අලස නොවූ උඩඟු නොවූ සිල්වත් වූ
දහමෙහි බැඳී මා
කිම නොලබනුයේ නිවන්?
දෙපා දෙ වූ දිය පොළවේ ගලා ගොසින්
සිඳෙනු බලා ආනිසය වටහා ගත්තෙමි.
අජානීය අසකු දැමූ අස් ගොව්වකු
ලෙස නොදැමුණු සිත දමනය කර ගත්තෙමි
සමාධියට පත් වූයෙමි එයින් පසුව
පහනක් ගෙන කුටියට ගොස් යහනේ හිඳ
පහළට ඇද්දෙමි එහි වූ තිරය එවිට
පහන නිවිණ, එලෙසම මා තුළ පැවැතුණු
කෙලෙස් ගිනි ද නිවී ගියා නිවන් දිටිමි.

# මොනවා තිබුණත් සතුට නැත්නම් වැඩක් නෑ

● හර්ෂා සුගතදාස





**මෙලොව උපන් ඕනෑම කෙනකුගේ අපේක්ෂාව සතුටින් ජීවත්වීමයි. බොහෝ දෙනකුගේ විශ්වාසය සතුටින් ජීවත්වීමට නම් ධනය අවශ්‍ය බව ය. බලය, සමාජ තත්ත්වය වැනි සාධක මත සතුට රැඳී තිබෙන බව ය. එහෙත් සතුට රැඳී තිබෙන්නේ ධනය, බලය හෝ සමාජ තත්ත්වය මත පමණක් නොවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය සතුට පිළිබඳ ජාත්‍යන්තර දිනයක් ප්‍රකාශයට පත් කර තිබෙන්නේ රටවැසියන්ට සතුට දැනෙන ආකාරය සහ එම සතුටට හේතුවන කරුණු රාශියක් ඇති බැවිනි. සතුට පිළිබඳ ජාත්‍යන්තර දිනය යෙදී තිබෙන්නේ මාර්තු 20 වැනිදාටය. මෙම දිනයට සමගාමීව එක්සත් ජාතීන්ගේ සංවිධානය තිරසර සංවර්ධන විසඳුම් ජාලය විසින් ලෝකයේ සතුටින් සිටින රටවල් පිළිබඳව වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරයි. 2021 මාර්තු 20 වැනි දින එය නිකුත් කළේ 9 වැනි වතාවටය. මෙවර නිකුත් කළ වාර්තාව පිටු 212 කින් සමන්විත වේ.**

මෙම වාර්තාවට අනුව ලෝකයේ සතුටින්ම සිටින රට පින්ලන්තයයි. පින්ලන්තය ලෝකයේ සතුටින්ම සිටින රට ලෙස මෙවර තේරී සිටින්නේ 4 වැනි වතාවටය. 2017 දී සතුටින්ම සිටින රට බවට පත්වූයේ නෝර්වේ වන අතර ඊට පෙර ඩෙන්මාර්කය, ලෝකයේ සතුටින්ම සිටින රට බවට පත් විය. 2021 වර්ෂයේ ඩෙන්මාර්කය 2 වැනි ස්ථානයට පත්වී සිටියි. අනෙකුත් ස්ථාන පිළිවෙළින් හිමි කර ගත් රටවල් ලෙස ස්විස්ටර්ලන්තය, අයිස්ලන්තය, නෙදර්ලන්තය, නෝර්වේ, ස්වීඩනය, ලක්සම්බර්ග්, නවසීලන්තය සහ ඔස්ට්‍රියාව දැක්විය හැකි ය. ඕස්ට්‍රේලියාව හිමි කරගෙන සිටින්නේ 11 වැනි ස්ථානයයි. මහා බ්‍රිතාන්‍යය 17 වැනි ස්ථානයේ සිටින අතර ලෝක බලවතා ලෙස සැලකෙන ඇමෙරිකාව සිටින්නේ 19 වැනි ස්ථානයේ ය.



**දේශපාලන වශයෙන් ආගම් සහ ජාතීන් වශයෙන් බලවත් වීමට අරගල කළාට සතුට තියෙන්නේ එතන නෙමෙයි කියලා මේ ශ්‍රේණිගත කිරීමෙන් ම පැහැදිලි වෙනවා.**

ආචාර්ය ඔසන්ත නයනප්‍රිය
කැලණිය විශ්වවිද්‍යාලය

ලෝකයේ සතුටින් සිටින රටවල් ගැන විශ්ලේෂණය කර බලන විට සෑම වසරකම ස්කැන්ඩිනේවියානු රටවල් ඉදිරියෙන් සිටින බව පෙනෙනවා. ලෝකයේ දේශපාලන බලවතා වීම හෝ අභ්‍යවකාශය තරණය කිරීම රටේ ජනතාවට සතුටින් ඉන්න හේතුවක් නොවෙයි කියලා එයින් අපට පැහැදිලි වෙනවා. දේශපාලන බල අරගලයේ යෙදී සිටින, යුද ගැටුම් තිබෙන රටවල් හැමදාම පිටිපස්සෙන් ඉන්නේ.

ලෝකයේ සතුටින් සිටින රටවල් තෝරා ගැනීමේදී සලකා බලන දර්ශක 2 ක් තිබෙනවා. එකක් මානව සංවර්ධන දර්ශකය. අනික සමාජ සංවර්ධන දර්ශකය. දළ දේශීය නිෂ්පාදනය, ඒක පුද්ගල ආදායම, සෞඛ්‍ය සම්පන්න ආයු අපේක්ෂාව, මාතෘ හා ළදරු මරණ අනුපාතිකය ආදායම් ව්‍යාප්තියේ විසමතාව වැනි කාරණා නිර්ණායක ලෙස යොදා ගනිමින් මානව සංවර්ධන දර්ශකය සකස් කර ගන්නවා.

ඒ හැර ආගමික නිදහස, මානව අයිතීන්, සංක්‍රමණිකයන්ට රට තුළ ඇති නිදහස, ස්ත්‍රී - පුරුෂ - සමරිසි - සංක්‍රාන්ති ලිංගික වැනි සෑම දෙනකුටම සම අයිතීන් තිබීම වැනි කරුණු රාශියකින් සමාජ සංවර්ධන දර්ශකය සකස් කර ගන්නවා.

පරිසර දූෂණය අවම මට්ටමක තිබීම, පිරිසිදුකම, අල්ලස් හෝ දූෂණ නැතිවීම, සැමදෙනාට නීතිය එක සමාන අයුරින් ක්‍රියාත්මක වීම, මහජන සුබසාධනය, සමාජයේ එකිනෙකාට උපකාර කර ගැනීම සහ සමාජයෙන් ලැබෙන සහයෝගය, රැකියා අවස්ථා තෝරා ගැනීම් වැනි කරුණු පවා සමාජ සංවර්ධන දර්ශකය සකස් කිරීමේදී සලකා බලනවා.

මානව සංවර්ධන දර්ශකය සඳහා අවශ්‍ය තොරතුරු ලෝක බැංකු වාර්තා අනුව සකස් කර ගන්න පුළුවන්.

අනිත් කරුණුවලදී සෑම රටකින් ම පුද්ගලයන් 1000 ක් නියැදියක් ලෙස තෝරාගෙන ප්‍රශ්න අහලා තොරතුරු රැස් කරගන්නවා. දේශපාලන වශයෙන් ආගම් සහ ජාතීන් වශයෙන් බලවත් වීමට අරගල කළාට සතුට තියෙන්නේ එතන නෙමෙයි කියලා මේ ශ්‍රේණිගත කිරීමෙන් ම පැහැදිලි වෙනවා." යනුවෙන් කැලණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඔසන්ත නයනප්‍රිය විස්තර කළේය.

2021 වසරේදී ලෝකයේ සතුටින් සිටින රටවල් තේරීමේදී 2020 වර්ෂයේ ලෝක වසංගතයක් වූ කොවිඩ් 19 හමුවේ රටවල් මුහුණදුන් ආකාරය ගැන වැඩි අවධානයක් යොමු කර තිබේ. විශේෂයෙන් පුද්ගලයන්ගේ මානසික සතුටට ප්‍රමුඛත්වය දී තිබේ.

"පින්ලන්තය, ස්විස්ටර්ලන්තය, ඩෙන්මාර්කය වැනි රටවල්වල ජනතාව ලෙඩ හැදුණත් බය නැහැ. ඔවුන් සෞඛ්‍ය අංශයෙන් සුරක්ෂිතයි කියලා ඔවුන්ට රට ගැන විශ්වාසයක් තියෙනවා. ඒ රටවල්වල ධනවතුන්ගෙන් බදු ගහනවා. ඒත් ඒ බදු මුදලින් මහජන සුබසාධන කටයුතු උපරිමයෙන් සිද්ධ වෙනවා. බදු මුදල්වලින් වංචා කරන්නේ නැහැ කියලා ඒ රටවැසියන්ට විශ්වාසය තියෙනවා. නීතිය හැමෝටම එක සමානව ක්‍රියාත්මක වෙන බව ඔවුන් ඉතාමත් හොඳින් දන්නවා. රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වී තිබෙන බව දන්නවා. ඒ නිසා ඒ රටවල්වල ජනතාව සතුටින් ඉන්නවා. ඇමෙරිකාව ගත්තාම කොවිඩ් පාලනය කරගන්න බැරිව රටවැසියන් මැරුණු හැටි අපි දැක්කා. අඩුම ගණනේ ඇමෙරිකාවේ කාන්තාවන්ට ප්‍රසූත නිවාඩුවක් හිමි වෙන්නේ නැහැ.

ඇමෙරිකාවේ මානසික ආතතියෙන් විශාදයෙන් පෙළෙන අය ඉන්නවා. සිය දිවි හානිකර ගැනීම් වැඩියි. මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අය ඉන්නවා. උන්හිටි ගමන් වෙඩි තියලා දහ දෙළොස් දෙනා මරලා දානවා. ආයු අපේක්ෂණය අඩු වෙලා. ඇමෙරිකාවේ ජීවත්වන කළු අයට හිංසා කරනවා. ඇමෙරිකාව කොයි තරම් ඉහළට ගියත් රටේ ජනතාවගේ සතුට අඩුවීමට හේතු තියෙන බව අපට පැහැදිලිව පෙනෙනවා. මෙතනදී මිනිසුන්ට හිතෙන්න ඕනෑ ඒ අය සතුටින් සිටින බව. ඒක තමයි වැදගත් වෙන්නේ." යනුවෙන් පැවසුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධතා දෙපාර්තමේන්තුවේ ප්‍රධානි, ආචාර්ය මනීෂා වනසිංහ පැස්කුවල් ය.



**සමාජයෙන් සමාජයට මුහුණ දෙන ප්‍රශ්න වෙනස්. ඒ වගේම සතුටත් වෙනස් වෙනවා. සතුට දර්ශකයකින් මනින එක නම් හරිම සංකීර්ණ දෙයක්.**

මහාචාර්ය කමීනා ගුණරත්න
විවෘත විශ්වවිද්‍යාලය

මෙහිදී පින්ලන්තය ගැන මඳක් විමසා බැලීම වටී. පින්ලන්තයේ ජනගහනය මිලියන 5.5 කි. විල් දහස් ගණනින් ඇති පින්ලන්තයේ වනාන්තර ද දහස් ගණනින් ඇත. වන වැස්ම 70% කි. පින්ලන්තය එරට ස්වාභාවික පරිසරය මැනවින් සංරක්ෂණය කරයි. පරිසර දූෂණය අවම වන අතර පිරිසිදුකම අතින් ඉහළය. මුදල් පසුම්බිය හෝ ජංගම දුරකථනය නැතිවීමට අඩු ඉඩකඩක් පවතින රට මෙන් ම නැතිවූ දේ නැවත හිමිකරු වෙත ලැබෙන්නට වැඩි ඉඩකඩක් ඇති රට ලෙස හැඳින්වෙන්නේ පින්ලන්තයයි. වීදි හිරිහැර අවම රටකි. ධනවතුන් පවා පොදු ප්‍රවාහන සේවා යොදා ගනු ලබන්නේ කිසිදු බියකින් සැකයකින් තොරවය. එහි පාසල් අධ්‍යාපනයේ 'ගෙදර වැඩ' නැත. විෂය නිර්දේශ පවා නැත. දරුවෝ සිය ජීවන කුසලතා සහ විෂය දැනුම තමන් කැමති ආකාරයට හදාරති. යුරෝපයේ දියුලන ආහාර සංස්කෘතියක් ඇත්තේ පින්ලන්තයේය. බොහෝ සංක්‍රමණයන්ගේ සහ පින්ලන්ත රටවැසියන් අතර පවතින්නේ ද අපූරු බැඳීමකි. එබැවින් පින්ලන්ත රටවැසියන්ට පමණක් නොව සංක්‍රමණිකයන්ට පවා නිවහනක මෙන් සුරක්ෂිත බවක් ඇතිවේ.

"සතුටින් සිටින රටවල් තෝරා ගැනීමේ මානව සංවර්ධන දර්ශකය පැත්තෙන් ඇමෙරිකාව, ජපානය, බ්‍රිතාන්‍ය වගේ රටවල් ඉහළට එන අවස්ථා තියෙනවා. මොකද ආයු අපේක්ෂණය, දළ දේශීය නිෂ්පාදනය, ඒකපුද්ගල ආදායම, මාතෘ මරණ සහ ළමා මරණ අනුපාතය වගේ කාරණාවලින් ඒ රටවල්වලට ඉදිරියට එන්න පුළුවන්. ඒත් සමාජ සංවර්ධන දර්ශකයෙන් තමයි ඒ රටවල් පහතට වැටෙන්නේ. ඇමෙරිකාව 19 වැනි තැන. චීනය 84 වැනි තැන. චීනයේ කොමියුනිස්ට් අර්ථ ක්‍රමයක් තියෙන නිසා අනිත් රටවල්වලට වඩා විශේෂයක් එහි තියෙනවානේ. රටක් ජනතාවට සීමාවන් පනවලා සංවර්ධනය කරා ගියාට ජනතාව ඉන්නේ අසන්තෝෂයෙන්. ප්‍රජාතන්ත්‍රවාදය ඉහළින්ම තිබෙන සංවර්ධිත රටවල්වල නිදහසේ පාරේ යන්න බැරි නම්, හුස්ම ගන්න බැරි නම්, පාරේ වැටිලා ඉන්නකොට උදව් වෙන්නේ නැතිනම්, වයෝවෘද්ධ අය හුදකලාව ඉන්නවා නම් සතුටක් ඇති නොවෙන්න පුළුවන්. ආසියාව ගත්තාම භූතානය ඉහළින් ඉන්නවා. මේවායින් අපට පැහැදිලි වෙන්නේ සතුට කියන දේට ආර්ථික ක්‍රමය, රටක සංවර්ධනය වැදගත් නැති බව. සතුට තියෙන්නේ ධනය මත නොවෙයි. කෙනකුට කරදරයක් වුණාම සමාජයෙන් සහාය ලැබෙනවාද, රටේ තිබෙන වංචා හා දූෂණ ගැන අපරාධ ගැන අසතුටින්ද, තමුන්ට ජීවිතයේ තෝරා ගැනීම් තිබෙනවාද වගේ දේවල් අනුව තමයි පුද්ගලයන්ගේ සතුට තීරණය වෙන්නේ.



**ඇමෙරිකාව කොයි තරම් ඉහළට ගියත් රටේ ජනතාවගේ සතුට අඩුවීමට හේතු තියෙන බව අපට පැහැදිලිව පෙනෙනවා.**

ආචාර්ය මනීෂා වනසිංහ පැස්කුවල්
කොළඹ විශ්වවිද්‍යාලය

ආර්ථික සංවර්ධනය කියන්නේ එකක්. මානසික සතුට කියන්නේ තව එකක්." යනුවෙන් පැවසුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානී, මහාචාර්ය සිරිමල් අබේරත්නය. බුදුරජුන් සතුට යනු පරම ධනය බව වදාළේ එම නිසාය.

මෙම අවස්ථාවේදී ආසියාවේ ස්විස්ටර්ලන්තය ලෙස හැඳින්වෙන භූතානය ගැන මඳක් විමසා බැලිය යුතු ය. හතර වටින්ම ගොඩබිමෙන් වට වී ඇති භූතානය කලක් යන තුරු ලෝකයෙන් හුදකලා වූ රාජ්‍යයක් ලෙස පැවතුණි. අද වනවිට රූපවාහිනිය, අන්තර්ජාලය, ජංගම දුරකථන හා ගුවන් ගමන් නිසා නවීකරණය වී ඇත. නමුත් දළ ජාතික සතුට යන සංකල්පය ඔස්සේ පැරණි සංස්කෘතිය හා සම්ප්‍රදාය අනුව යමින් පාලනය කෙරෙන භූතානය සංස්කෘතික අනන්‍යතාව සහ පරිසර සංරක්ෂණයට ප්‍රමුඛත්වයක් දී ඇති රටකි.



**කෙනකුට කරදරයක් වුණාම සමාජයෙන් සහාය ලැබෙනවාද, රටේ තිබෙන වංචා හා දූෂණ ගැන අපරාධ ගැන අසතුටින්ද, තමුන්ට ජීවිතයේ තෝරා ගැනීම් තිබෙනවාද වගේ දේවල් අනුව තමයි පුද්ගලයන්ගේ සතුට තීරණය වෙන්නේ.**

මහාචාර්ය සිරිමල් අබේරත්න
කොළඹ විශ්වවිද්‍යාලය

2006 වසරේදී ලෙයිචෙස්ටර් විශ්වවිද්‍යාල සමීක්ෂණයට අනුව සතුටින්ම දිවි ගෙවන ජනතාව සිටින රටවල් අතරින් දකුණු ආසියාවෙන් 1 වැනි තැන ද ලෝකයෙන් 8 වැනි තැන ද හිමි වූයේ භූතානයට බව Business Week සඟරාව වාර්තා කළේය.

දකුණු ආසියාවේ පිහිටි නේපාලය, ලෝකයේ සතුටින් සිටින රටවල් අතරින් 87 වැනි ස්ථානය හිමි කරගෙන තිබේ. බංග්ලාදේශයට 101 වැනි තැන ද පකිස්ථානයට 105 වැනි තැන ද හිමි වී ඇති අතර ඉන්දියාවට හිමි වී තිබෙන්නේ 139 වැනි ස්ථානයයි. ලංකාව 129 වැනි ස්ථානයේ සිටියි. "ලංකාව 2020 දී 130 වැනි තැන හිටියා. 2021 දී 149 හිමිවී තිබෙනවා. දර්ශකයකින් සමස්ත රටක් මනින්න පුළුවන්ද කියලා ප්‍රශ්නයකුත් තියෙනවා. කොළඹ ඉන්න අය හිතනවා ගමේ ජීවත්වන අය සතුටින් ඇති කියලා. ගමේ අයට ඉඩෝර, අස්වැන්න පාළුවීම්, දරිද්‍රතාව, වන සතුන්ගේ පීඩා වැනි ගැටලු රාශියක් තිබෙනවා. නීතිය හැමෝටම එක විදිහට බලපාන්නේ නැහැ. සමාජයෙන් සමාජයට මුහුණ දෙන ප්‍රශ්න වෙනස්. ඒ වගේම සතුටත් වෙනස් වෙනවා. සතුට දර්ශකයකින් මනින එක නම් හරිම සංකීර්ණ දෙයක්. කොහොම වුණත් රටවල් 149 කින් ලංකාව 129 වැනි තැන ඉන්නවා කියන්නේ අපි සතුටින් සිටින රටක් නොවෙයි කියන එකනේ." යනුවෙන් පවසන්නේ විවෘත විශ්වවිද්‍යාලයේ නීති අංශයේ ප්‍රධානි මහාචාර්ය කමීනා ගුණරත්නය.

මේ අනුව ලෝකයේ අසතුටින් සිටින රටවල් ගතහොත් ලංකාව සිටින්නේ 20 වැනි ස්ථානයේය. ලෝකයේ අසතුටින් සිටින රටවල් අතරින් 1 වැනි තැන ගෙන තිබෙන්නේ ඇෆ්ගනිස්ථානයයි. සිම්බාබ්වෙ, රුවන්ඩාව, බොට්ස්වානා සහ ලෙසෝතෝ පිළිවෙළින් 2 වැනි, 3 වැනි, 4 වැනි සහ 5 වැනි ස්ථානවල පසුවෙයි. එහි අරුත ලෝකයේ සතුටින් සිටින රටවල් ලබා සිටින දර්ශක අනුව අවසානයට සිටින්නේ ඇෆ්ගනිස්ථානය ඇතුළු සෙසු රටවල් වීමය.



ලොව සතුටුම මිනිසුන් ජීවත්වන පින්ලන්තයේ (වමේ සිට) අධ්‍යාපන ඇමතිනියට වයස අවුරුදු 33කි. උප අගමැතිනියට වයස අවු. 33කි. අගමැතිනියට වයස 36කි. අභ්‍යන්තර කටයුතු ඇමතිනියට වයස අවු 36කි.



නෞකා ඇණිය අසල තිබූ මඩ ඉවත් කරමින්





නෞකාව සිරවී තිබූ අන්දම

# සූවස් ඇළේ හිරවී දිනකට ඩොලර් බිලියන 9ක් ලෝකයට පාඩු කළ

# EVER GIVEN



නෞකාව සිරවී තිබූ අන්දම ගුවනට දිස් වූ අයුරු

## සක්වළගල

• ටිරෝනි වැවලගේ

**මිනිසා නුවණින් ඉතා උසස් යැයි, තාක්ෂණයෙන් ඉතා දියුණු යැයි සිතා සිටි නමුදු කොවිඩ් වසංගතය හමුවේ ඒ සිතිවිලි සියල්ල ක්ෂණයකින් අවලංගු විය. ඒ මිනිස් මොළයට වඩා දියුණු ක්ෂුද්‍ර වයිරසයක් වසරක් පුරා මුළු ලොවම පාලනය කළ බැවිනි. එවැනිම වූ තවත් සිදුවීමක් පසුගියදා සිදුවූයේ මුළු මහත් ලෝකයේ ආර්ථිකය එක මොහොතකට අවිනිශ්චිත කරමිනි. ඒ සූවස් ඇළ හරහා අති විශාල නෞකාවක් සිරවීමෙන් ලෝකයේ නාවික ගමනාගමන කටයුතුවලින් හරි අඩකට වඩා අඩාළ වීමෙනි. පුරා දින පහක් පුරා ලෝකයේ ආර්ථිකය අවිනිශ්චිත වූ අතර ලෝක තෙල් මිල ඉහළ යෑමේ සිට, ආහාර හිඟයක් ඇතිවීම වැනිවූ සිදුවිය හැකි බොහෝ ආර්ථිකමය අයහපත් ප්‍රතිඵල පිළිබඳ කතාබහ ඇතිවිය .**

මේ සිදුවීම සිදුවූයේ පසුගිය විසිපස්වැනි බ්‍රහස්පතින්දා දිනයේ ය. සූවස් ඇළ දිගට යාත්‍රා කරමින් තිබූ එවර්ග්‍රීන් සමාගමට අයත් එවර් ගිවන් නෞකාව ලොව ඇති අති විශාලම නෞකා කිහිපයෙන් එකක් විය. එය ජපානයේ නිෂ්පාදිත නෞකාවක් වන අතර එවර්ග්‍රීන් සමාගම විසින් කළමනාකරණය කළද එහි හිමිකාරීත්වය පෞද්ගලික හිමිකරුවකු සතුය.

මේ අති විශාල නෞකාව දිගින් මීටර් 399.94ක් වේ. එය බහාලුම් තොගයක්ද සමඟ යාත්‍රා කරමින් තිබියදී පසුගිය බ්‍රහස්පතින්දා දිනයේ සූවස් ඇළ අවහිර වන සේ රැඳුනේ එහි ඉදිරිපස ඇණිය සූවල් ඇලේ නැඟෙනහිර ඉවුරේ මඩ අතර සිරවීම හේතුවෙනි.

මේ හේතුවෙන් සූවස් ඇළේ නෞකා ගමනාගමනය සම්පූර්ණයෙන් අඩාළ විය.

සූවස් ඇළ යනු ලෝක ආර්ථිකයට මෙතරම් බලපෑම් කළ හැකි ස්ථානයක් බව මිනිසුන් මේ දක්වා වටහාගෙන නොසිටින්නටද ඇත. කිලෝමීටර් 193ක් දිග සූවස් ඇල යනු ඊජිප්තු භූමිය දෙකඩ කරමින් ඉදිකර ඇති නෞකා ගමනාගමනය සඳහා වන සිහින් ඇළ මාර්ගයකි. මේ ඇළ මාර්ගය ඉදි වන්නේ අදින් අවුරුදු 150කට පමණ ඉහත දීය. එනම් මෙහි ඉදිකිරීම් කටයුතු 1859 දී ආරම්භ වන අතර අවසන් වන්නේ 1869දීය. ඒ සමඟම ලෝක නෞකා ගමනාගමන මාර්ගය අලුත් වන්නේ අති විශාල අමතර දුරක් යාත්‍රා කිරීමේ කටුක අවස්ථාවෙන් මිදී ආසියා මහාද්වීපය ප්‍රවිෂ්ට වීමේ අවස්ථාව යුරෝපා මහාද්වීපයේ සිට පැමිණෙන නෞකාවලට උදා කර දෙමිනි. සූවස් ඇළ ඉදි කිරීමට පෙර යුරෝපා මහාද්වීපයේ සිට පැමිණෙන නෞකාවලට ආසියා මහාද්වීපයට ප්‍රවිෂ්ට වීම සඳහා අප්‍රිකා මහාද්වීපය වටා යාත්‍රා කිරීමට සිදුවිය.



නෞකාව ඉවතට ගත් අවස්ථාවේ මාධ්‍ය වෙත ලැබුණු ඡායාරූප

එහෙත් ඉතා නුවණැතිව සිතූ එවකට සිටී ඊජිප්තු පාලකයෝ තම රටේ සිනායි අර්ධද්වීපය ආසන්නයෙන් කිලෝමීටර් දෙසීයකට ආසන්න දුරක් විහිදෙන නෞකා ගමන් කළ හැකි තරම් ගැඹුරැති ඇළ මාර්ගයක් තැනූහ. මේ ඇළ මාර්ගය මුහුදු මට්ටමට සමාන වූ අතර එම ඇළ මාර්ගය මධ්‍යධරණී මුහුද සහ රතු මුහුද එකිනෙක සම්බන්ධ කළෙන් ලෝක නෞකා ගමනාගමන මාර්ග ඉතා විශාල වෙනසකට මුහුණ දුන්නේය.

මේ ඇළ මාර්ගයේ ගමන් ගැනීම සඳහා ඊජිප්තු රජයට ගෙවීමක්ද කිරීමට නෞකාවලට සිදුවූ නමුදු එම ගෙවීම වඩා වාසිදායක වූයේ දින ගණනක මහාද්වීපයක් වටා ගමන් කිරීමේ දීර්ඝ ගමනක් ඒ හේතුවෙන් වැළකුණු බැවිනි.

කෙසේ වුවද සූවස් ඇළ වසර ගණනාවක් ක්‍රියාත්මක වෙමින් පැවතුණු නමුදු ලෝකයට එහි වැදගත්කම වැටහී ගියේ එවර් ගිවන් නෞකාව එහි සිරවුණු පසුගිය බ්‍රහස්පතින්දාවෙන් පසුව විය හැකිය. මීටර් 399ක් දිග නෞකාව මීටර් 400ක් පළලැති ඇළ මාර්ගය සම්පූර්ණයෙන් වැසෙන අන්දමින් සිරවිය. ප්‍රථමයෙන් නෞකාව ඉවතට ඇද ගැනීමට නොයෙක් උත්සාහයන් දැරුවද ඒ සියල්ල අසාර්ථක විය. ඒ සමඟ බැකෝ යන්ත්‍රයක් යොදමින් නෞකාවේ ඇණිය සිර වී ඇති මඩ තට්ටුව ඉවතට ඇද දැමීමට බලධාරීන් උත්සාහ දැරූ අතර ඒ අන්දමින් මඩ ටොන් 20000ක් ඉවතට ඇද දැමූ බව ප්‍රකාශ විය. එහෙත් නැව සාමාන්‍ය ගමන්මඟට ගැනීමට හැකියාව ලැබුණේ නැත. නැවේ පුරවා ඇති බහාලුම් ඉවත් කිරීමකින් තොරව නැව සාමාන්‍ය ගමන්මඟට ගැනීම අපහසු බව දින තුනකට පමණ පසු ප්‍රකාශ වූ අතර එසේ බහාලූම් තවත් නැවකට පැටවීමද අපහසු බව ප්‍රකාශ විය. ඒ වන විට සූවස් ඇළේ ගමන් ගැනීමේ අරමුණින් පැමිණි නෞකාවලින් ඇළ මාර්ගය පිරී යමින් තිබිණි.

ආසියා මහාද්වීපයට මෙන්ම යුරෝපා මහාද්වීපයට සාමාන්‍ය පරිදි මෙතෙක් සිදුකෙරුණු භාණ්ඩ ප්‍රවාහනය අඩාළ විය. මේ භාණ්ඩ ප්‍රවාහනය අඩාළ කිරීමට කොවිඩ් වසංගතයට පවා හැකියාවක් ලැබුණේ නැත. එහෙත් සූවස් ඇළ මාර්ගය මේ මහාද්වීපවල ජනතාවගේ දෛනික අවශ්‍යතා සැපයීම ගැටලුවක් බවට පත් කරන්නට විය. බොර තෙල් ප්‍රවාහනය අඩාළ වූ බැවින් ලෝකයේ බොරතෙල් මිල ඉහළ යෑමේ බියක් පැතිර ගියේය. දෙපසට ගමන් කිරීමේ අරමුණෙන් නවතා තිබූ නෞකා සංඛ්‍යාව 300ක් දක්වා ඉහළ ගියේ මහාද්වීප දෙකේ රටවල ආහාර අවශ්‍යතා සම්පාදනයේද ගැටලු ඇතිවීමේ බියක් ඉතිරි කරමිනි. ඇතැම් නෞකා බලාසිටීමෙන් තොරව අප්‍රිකා මහාද්වීපය වටා යාත්‍රා කිරීම ආරම්භ කළ නමුදු ඒ වන විටත් සූවස් ඇළ දිගේ පැමිණි නෞකා යළි ගමන් කිරීමටද නොහැකිව බලා සිටින්නට විය. මේ ඇතැම් නෞකාවල සතුන් පටවා සිටි අතර නියමිත දිනට ගමන අවසාන කළ නොහැකිව ආහාර අහිමිවීමෙන් මේ සතුන් මිය යෑමේ තර්ජනයක් ඇති විය.

නෞකාව සිර වීමෙන් පස්වැනි දිනය එනම් පසුගිය සඳුදා දිනය වන විට නෞකා ඇදීමට යොදා ගන්නා 'ටග්' යාත්‍රා දහයක් යොදා ගනිමින් බහාලූම්ද සහිතව නෞකාව සිරවී තිබූ මඩ තට්ටුවෙන් ඉවතට ඇද ගැනීමට සූවස් ඇළ මාර්ගයේ බලධාරීහු සමත් වූහ. ඒ වන විට එවර් ගිවන් නෞකාව හේතුවෙන් සමස්ත ලෝක ආර්ථිකය දිනකට ඩොලර් බිලියන 9ක පාඩුවක් ලබමින් තිබිණි.

යළිත් නිසි මාර්ගයට පිවිසි එවර් ගිවන් යළි තම ගමන ඇරඹුවේ ඒ සමඟ ගමන් ගැනීමට බලා සිටි සෙසු නෞකා 300කට පමණ යළි තම ගමන යෑමට අවස්ථාව ලබා දෙමිනි.

# ඊශ්‍රායලයේ ශක්තිමත් රජයක් පිහිටුවීමට බැරි ඇයි?

**වසර දෙකක් ඇතුළත පැවැත්වූ සිවුවැනි මැතිවරණයද අවසන් වූයේ ඊශ්‍රායලය තුළ ශක්තිමත් රජයක් පිහිටුවීමට නොහැකි බව තහවුරු කරමිනි.මෙවරද කිසිඳු දේශපාලන පක්ෂයක් ආණ්ඩුවක් පිහිටුවීම සඳහා අවශ්‍යවන බහුතර ආසන සංඛ්‍යාව ලබා ගැනීමට අසමත් විය. ඒ අනුව ශක්තිමත් රජයක් ලබා ගැනීම සඳහා වසර දෙකක් තුළ පැවැත්වූ සිවුවැනි මැතිවරණයද අසාර්ථක වී ඇත්තේ ඊශ්‍රායලය දේශපාලන උගුලක පටලවමිනි.**

ඊශ්‍රායල් පාර්ලිමේන්තුවේ හෙවත් 'නෙස්සෙට්' හි සමස්ත ආසන සංඛ්‍යාව 120කි. බහුතර බලය ලබා ගැනීම සඳහා එම ආසන සංඛ්‍යාවෙන් දිනා ගත යුතු ආසන සංඛ්‍යාව 61කි. එහෙත් මෙවරද ඊශ්‍රායලය තුළ ක්‍රියාත්මක දේශපාලන පක්ෂ රාශියෙන් එකද පක්ෂයක් හෝ එම සංඛ්‍යාව දිනා ගැනීමට සමත් වූයේ නැත.

හිටපු අග්‍රාමාත්‍ය බෙන්ජමින් නෙතන්යාහුගේ ලීකුද් පක්ෂය ඉදිරියෙන් සිටියද ඔහුටද ලබා ගැනීමට හැකිවී ඇත්තේ ආසන 52ක් පමණි. ඒද ඔහුගේ දක්ෂිණාංශික මිත්‍ර පක්ෂ රැසක දායකත්වය ලබමිනි. ලීකුද් පක්ෂය තනිව ලබා ගත් ආසන සංඛ්‍යාව 30ක් පමණි. එහෙත් එම ආසන 30 තනි පක්ෂයක් ලබාගත් වැඩිම ආසන සංඛ්‍යාව වීමද වැදගත් කරුණකි.

තනි පක්ෂයකට හෝ අවම වශයෙන් සන්ධානයකට වුවද ආණ්ඩුවක් පිහිටුවීමට අවශ්‍ය බහුතර ආසන සංඛ්‍යාව ලබා ගැනීමට නොහැකි වීම සාකච්ඡාවට බඳුන් විය යුතු කරුණකි. ඊශ්‍රායල් දේශපාලනය මෙසේ අස්ථාවර වීමට සැබෑ හේතුව කුමක් විය හැකිදැයි මේ දිනවල විචාරකයන්ගේ මතවාදයට බඳුන් වී තිබේ.

ඊශ්‍රායලය යනු දීර්ඝ ඉතිහාසයක් සහිත රටක් නොවේ. සැබවින්ම එය කල්ලතෝනි රටකි. එනම් ඊශ්‍රායලය යනු අනුන්ගේ ඉඩම්වල බලෙන් පිහිටවූ රටකි. දෙවැනි ලෝක යුද්ධයෙන් යුදෙව් ජාතිකයන් දරුණු අසාධාරණයකට ලක්වූ බව සැබෑය. එම අසාධාරණයට පිළියම් ලෙස ඊශ්‍රායලය බිහිවූ බවද සැබෑය.

එහෙත් එසේ බිහිවූයේ පෘථිවි තලය මත නොසිඳෙන කඳුළු උල්පතක් මවමිනි. ඊශ්‍රායලය බිහිවීමේදී පලස්තීනයට සිදුවූ අසාධාරණය හේතුවෙන් මුළු මහත් අරාබි ලෝකය යුදෙව්වන් සමඟ අප්‍රසාදයට ලක්වූයේ අරාබි ලෝකයේ කට මුල ඊශ්‍රායලය තනි කරමිනි.

එහෙත් ඇමරිකාවේ මිත්‍රත්වය සමඟ තමන්ගේම ශක්තියත් තනිව එහෙත් ස්ථාවරව රැඳී සිටීමට ඊශ්‍රායලයට හැකියාව ලබා දුන්නේය. ආරම්භයේදී එරට ජනතාව සතුවූයේ තමන් ලද භූමිය ස්ථාවර කර ගැනීමය. ඒ හා බැඳුණු අරමුණු තුළින් ශක්තිමත් නායකත්වයක් ජනතාව වෙත හිමි විය.

අද වන විට බහුතර බලයක් ලබා ගැනීමට නොහැකිව පසුවන නෙතන්යාහුගේ ලීකුද් පක්ෂය කලක් එරට ශක්තිමත්ම දේශපාලන පක්ෂය විය. එරට පැරණිතම දේශපාලන පක්ෂ අතරින් එකක් වන ලීකුද් පක්ෂය රටට බිහි කළ රාජ්‍ය නායකයන් රාශියකි.



1977 වසරේදී ලීකුද් පක්ෂය ජයග්‍රහණය ලැබුවේ අති විශාල බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබා ගනිමිනි. ඒරියල් ෂැරෝන් ලීකුද් බිහි කළ විශිෂ්ට නායකයෙකි. 1999දී එහුඩ් බරාක්ට පරාජය වුවද වර්තමාන අගමැති බෙන්ජමින් නෙතන්යාහුද ලීකුද් පක්ෂයට ප්‍රබල නායකත්වයක් ලබා දීමට සමත් වූ රාජ්‍ය නායකයෙකි.

අද වන විට බහුතර ආසන සංඛ්‍යාවක් ලබා ගැනීමට හෝ සන්ධානයක් ගොඩනගා ගැනීමට එවැනි අතීතයක් සහිත පක්ෂයකට නොහැකි වී තිබීම අති විශාල දේශපාලනමය කඩාවැටීමක් මිස අන් කිසිවක් නොවේ.

2021 මාර්තු 24 පැවති මැතිවරණයට තරග වැදුණු පක්ෂ සංඛ්‍යාව 21කි. මෙහි විශේෂත්වය වන්නේ මේ පක්ෂ සියල්ලම ආසන පහක් හෝ හයක් ලබා ගනිමින් පාර්ලිමේන්තුව හෙවත් 'නෙස්සෙට්' නියෝජනය කිරීමට අවස්ථාව ලබා ගැනීමය.

මේ පක්ෂ 21 අතර ජාතික ලිබරල්වාදී ලීකුද් පක්ෂය මෙන්ම, දක්ෂිණාංශික, වාමාංශික, ඕර්තඩොක්ස්, අරාබි, ජාතිකවාදී මෙන්ම ආගම්වාදී පක්ෂද වේ. මේ මහා වරණය අතර ජනතාව තම කැමැත්ත ඉතා සංකීර්ණ ලෙස බෙදා හරින අතර එහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ එක් පක්ෂයකට හෝ බහුතර ආසන සංඛ්‍යාව ලබා ගැනීමට නොහැකි වීමය.

කෙසේ වුවද මේ මැතිවරණය බොහෝ දෙනා සලකණු ලැබුවේ නෙතන්යාහු සම්බන්ධව ඉදිරිපත් වූ ජනමතවිචාරණයක් වශයෙනි.

ඔහුට දිගින් දිගටම දේශපාලන බලය පවත්වාගත හැකිද යන්න විමසා බැලෙන මැතිවරණයක් ලෙස මේ මැතිවරණය සලකණු ලැබීය.

වසර දෙකක් පුරා පාර්ලිමේන්තුවේ බහුතර බලය පවත්වා ගැනීමට නෙතන්යාහු අසමත් වූ අතර ඔහුට සහය දීමට ප්‍රමාණවත් පක්ෂ සංඛ්‍යාවක් දිනා ගැනීමටද ඔහු අසමත් වූයේය. එවැනි වාතාවරණයක් යටතේ මේ මැතිවරණය පැවති නමුත් මෙවරද බහුතර බලය දිනා ගැනීමට නෙතන්යාහු සමත් වූයේ නැත. ඒ අනුව දැන් ඊශ්‍රායලය දේශපාලන වියවුල්කාරී වාතාවරණයක පවතින බව පැහැදිලිය.

බොහෝ විචාරකයන් මේ තත්ත්වය පෙන්වාදුන්නේ දශකයකට පමණ පසු ඊශ්‍රායලය මුහුණ දී සිටින දැවැන්තම දේශපාලන අර්බුදය ලෙසිනි.

මෙසේ වීමට ප්‍රධාන හේතුව ලෙස දැකිය හැකි වන්නේ ජනතා මතය ඉතා සංකීර්ණ ලෙස බෙදී පැවතීමය. ඊශ්‍රායලය නිදහස් මතවාද වෙත වේගයෙන් ගමන් කරමින් සිටින අතර ඊට සාපේක්ෂව අන්තවාදයට එරට දේශපාලනය තුළට රිංගා ගනිමින් සිටින බව පෙනේ.

මේ සියල්ල අතර දෝලනය වන ජනතා මතය අවසන් වී ඇත්තේ කිසිවකුට ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවීමේ අවස්ථාව අහිමි කරමිණි. මේ තත්ත්වය මත කඩා වැටෙන්නේ රට මිස අන් කිසිවක් නොවන බව ජනතාවට තේරුම් යනු ඇත්තේ තවත් කල් ගතවීමෙන් පසුවය.

ඒ කෙසේ වුවද දක්ෂ, බුද්ධිමත්, නිදහස් මතවාදී ජනතාවක් වෙසෙන රටකට විධිමත් පාලනයක් ලබා දී විශ්වාසය දිනා ගැනීමට අසමත් නම් එම නායකයන් තමන් අසමත් බව පිළිගෙන තරගයෙන් ඉවත් වීම ප්‍රථමයෙන්ම කළ යුතුය.

මේ මැතිවරණය ඉලක්ක කර ගනිමින් නෙතන්යාහු ජනතාවගේ සිත් දිනා ගැනීමේ උපරිම උත්සාහයක නිරත වූ බවද කිව යුතුය. ඔහු විශේෂයෙන්ම කොවිඩ් වසංගතය හමුවේ ජනතාවගේ ආරක්ෂාව සැලසීමට උපරිම උත්සාහ දරමින්, එන්නතකරණ වැඩපිළිවෙල සඳහා මූලිකත්වය ගනිමින් කටයුතු කළ අතර තමන් තම ජනතාවට සේවය කිරීමට උපරිමයෙන් කැපවන බවත්, තමන් සතුව නිවැරදි වැඩපිළිවෙලක් පවතින බවත් ජනතාවට පෙන්වා දීමට ඔහු උපරිම වෙහෙස දැරුවේය. එහෙත් මෙවර මැතිවරණ ප්‍රතිඵලය පෙන්වා දෙන්නේ ඔහු ගත් ඒ උත්සාහයෙන් එතරම් පලක් වී නොමැති බවය.

# දුර ඈත සිට පාඨක අපට ආනන්දනීය ඉසව්වක් පෙන්වන්නී...

## ශමෙල් ජයකොඩි



**පියදෝර් දොස්තයෙව්ස්කි සියවසක් පුරා බිහිවූ විශිෂ්ටතම ලේඛකයෙකි. එහෙත් ඔබ දන්නා පරිද්දෙන් ම ඔහු සිය ජීවිතය ගෙවා දැමුවේ තැන තැන ඇවිදිමින්, රහමෙර යහමට පානය කරමින් රස්තියාදු කරුවකු ලෙස ය. පොත් ලියා දෙන බවට පොරොන්දු වී ඔහු පොත් ප්‍රකාශකයන්ගෙන් අත්තිකාරම් ලෙස මුදල් ලබා ගත්තේ ය. සූදු කප්පිත්තකු වූ ඔහු ඒ සියලු මුදල් පැරදී දඩාවතට වැටෙයි. එවිට ඔහුව කාමරයක දමා සිරකර සිය මුදල් සඳහා ඔහු ලිවීමට පොරොන්දු වූ පොත්; පොත් ප්‍රකාශකයෝ ලියවා ගනිති. අප විස්මයෙන් අළලන කෘති ඔහු අතින් ලියැවී ඇත්තේ එසේ සිරකොට තිබියදී ය. සිතන්න ඔහු ඒ අප පිළිකුල් කරන රස්තියාදුකාර ජීවිතයෙන් ලද අත්දැකීම් නොවන්නට, සිරගත කර සිටියදී එවැනි ශ්‍රේෂ්ඨ කෘති ලිවිය හැකි වේද?**

කවදා කෙදින හෝ ලබා ගන්නා අත්දැකීම් නිර්මාණකරණයේදී වැදගත් වන්නේ ඒ නිසා ය. අද නිර්මාණයක පෙරනිමිති ලිපියට සිය අත්දැකීම් ගොනු කරන ශමෙල් ජයකොඩි ලේඛිකාව ද වාසය කරන්නේ ලංකාවේ නොවේ; ප්‍රංසයේ ය. ඇය ද එක්තරා අන්දමකට සිය ඉපැදුණු දේශයෙන් පිට වෙනත් දේශයක ජීවත් වීමේ කාන්සිය දරා ගන්නියකි. ඇගේ නවකතා සිය අත්දැකීම් පරිධියෙහි හැඩ වන්නේ දොස්තයෙව්ස්කිගේ තරම් දුක් කම්කටොලු මැදින් නොවූව ද අපමණ විඳීම් මැදිනි. ඇගේ ඒ වෙනස් අත්දැකීම ස්වර්ණ පුස්තක අවසන් වටය ද නියෝජනය කළ 'ප්‍රංශ පෙම්වතා' ඇසුරෙන් ඇය විග්‍රහ කරන්නේ මෙසේ ය.

'ප්‍රංසයේ හිටිය කාලය තුළ මම ග්‍රහණය කර ගත් රසවත්ම කාරණාව තමා එරට ජන ජීවිතයේ ප්‍රමිතිය, සම්ප්‍රදාය කියන දේවල් සෞන්දර්යය මත පදනම්ව තිබීම. ප්‍රංස සම්ප්‍රදායයේ ඇති චින්තන විධි, හැඟීම්, ක්‍රියාවන් තැනී ඇත්තේ සදාචාරය රැකීම වෙනුවට සෞන්දර්යය රැකීම කියන කාරණාව මත, මේ ප්‍රංශ සමාජයේ සෞන්දර්යාත්මක රීතිය පසුබිම් කර ගත් නවකතාවක් ලිවීමට මට කැමැත්තක් ඇති වුණා. බොහෝ විට නිවැරදි බව, ප්‍රයෝජනවත් බව නොතකා සෞන්දර්යය රකින පරමාර්ථයෙන් තමයි ඔවුන් නොයෙක් තීරණ ගන්න පෙලඹෙන්නෙ. උදාහරණයක් විදිහට ප්‍රංස ජාතිකයන් ආහාර වර්ග, ඇඳුම් මෝස්තර ගැන ප්‍රමිතියට ගොඩනගා ගෙන ඇති සැටි, පැරීසියේ නගරාලංකාරය සඳහා ඇති සියවස් ගණනක් තිස්සේ ඇති ප්‍රතිමා, උද්‍යාන පරම්පරා කිහිපයක් පුරා, මහජන නැගිටීම්, ලෝක යුද්ධ, ආණ්ඩු බිඳ වැටීම් අතර පවා එකම තේමාවකින් නඩත්තු වෙන හැටි දැක්විය හැකිය. 'ප්‍රංශ පෙම්වතා' කතාවේදී පැරීසියේ ඉගෙනගන්න ලාංකීය ශිෂ්‍යයෙක් හා ශිෂ්‍යාවක්, ඔවුන්ට නවාතැන් දෙන ඊට කලකට පෙර පැරීසියට පැමිණි තරුණ දෙදරු මවක් කියන තිදෙනා අතර ඇති වෙන මිනිස් සබඳතා පසුබිම් කරගෙන තමයි මම මේ සෞන්දර්ය හා බැඳුණු ප්‍රංස ජන ජීවිතය ගැන ලියන්නෙ. මෙතැනදී ඔවුන් තිදෙනා විවිධාකාර අන්දමින් ප්‍රංස සමාජයේ හොඳ නරක උකහා ගත් හැටි කියවෙනවා'

අත්දැකීම් පිළුණු වන්නේ නැත. ඒවා විවිධ අවස්ථාවන්හි ඇතිවෙන මනෝභාව ඔස්සේ ඒ ඒ තැනට ආදේශ වෙයි. ජීවිතයේ කියැවීම ඒ ආදේශය ඇතුළට එකතු වෙයි. ඒවා සුන්දර ජීවන වියමන් ව අපමණක් පාඨක හදවත් කියවා ගන්නට යත්න දරයි. ශමෙල් ලේඛිකාව ලියන්නේ ද තමා ඇසූ දුටු දෑ ය. එහෙත් ඒවා පොදු සාමාන්‍ය පාඨකයාගේ මනසේ ශක්තිමත් බීජ සේ පැළ වෙන්නේ ය. ජීවත් වීමේ බර විසින් අහිමි කරන ලද නිදහස, එහෙත් අප සොයාගත යුතු අප්‍රමාණ නිදහස ගැන ලියැවුණු 'වීනස් උපත' කෘතියත් ශමෙල්ගේ ලේඛන දිවියේ නොමැකෙන ලකුණකි. නිර්මාණකරුවන් නිරන්තරයෙන් සිය සිත හා ආත්මභාෂණයක යෙදෙන්නේ ය. ඒ ආත්මභාෂණය ඔහුට හෝ ඇයට සිය අත්දැකීමට දාර්ශනික ප්‍රවේශයක් නිර්මාණය කිරීමේ ලා උපස්ථම්භක වෙන්නේ ය.

'ජීවත්වීමේ අරමුණ, සාරය කතා කිරීම, අපට අපේ ජීවිතය නිර්මාණ කර ගැනීමට තිබෙන අප්‍රමාණ නිදහස, අපේ ජීවිතයට අරමුණක් ඇති කිරීමට බල කෙරෙන පුද්ගලයන් අපමණයි කියන කාරණාව තමා මම 'වීනස්ගේ උපත" හරහා ඉදිරිපත් කරන්න උත්සාහ ගත් අදහස් වුණේ. මේ කතාව ගොඩනැගෙන්නෙ ටෙලි නාට්‍යයක රඟපෑමට අවස්ථාවක් හොයාගෙන දුර ඥාති සබඳතා පාවිච්චි කරමින් ගමෙන් කොළඹට එන දහඅට හැවිරිදි තරුණියකගේ චරිතයක් වටා. නිතර අහන දකින පුවත්පත්වලින් කියවන ප්‍රවෘත්ති, රියැලිටි වැඩසටහන්වලින් තමයි මම මේ කාල්පනික චරිතය කතාවට උකහා ගත්තේ. පොතේ විශේෂත්වය වන්නේ ඇය ඉතාමත් බොළඳ, හිතුවක්කාර දැරියක් නමුත් නොපසුබස්නා වීර්යයෙන් තම අරමුණ හඹා ගිය තරුණියක් වීම. ඇගේ ඒ වීරිය, නොවෙනස් වෙන අනාගත සැලසුම්, නොලැබීම් හමුවේ නැගී සිටීම් ඔප් නංවන තවත් චරිත ඇය වටා ගෙතෙනවා. ඇය ඇගේ අරමුණ වෙනුවෙන් දුරක් කැඳවාගෙන යන අතරම තරුණිය නිසාම ධනාත්මක පැත්තට හැරෙන තරුණයන් තිදෙනකු ගැන කතාවේ කියවෙනවා.



### නිමැවුමක පෙරනිමිති

● සුමුදු ඔතැරණී

මම හිතනවා පොතක් ලියන්න එහෙමත් නැතිනම් ඕනෑම කලා මාධ්‍යක් හසුරුවන්න පුළුවන්, තීව්‍ර විදිහට ආත්මභාෂණයේ යෙදෙන්න හැකි කෙනෙක්ට විතරයි කියලා. ඒ නිසා නිර්මාණයක් තුළට මම අහපු, දැකපු චරිත අතරට මගේ සිතිවිලි කාවැදීම වළක්වන්න බැහැ. මම කෙනෙක් තුළ දකින වටිනාම අංගයක් වෙන අනෙකාගෙන් ඉගෙනීමට තියෙන ඉඩ හසර අහුරගන්නෙ නැති එක, අපට අපෙන් ඉගෙනීමට ඇති ශක්තිය ප්‍රයෝජනයට ගැනීම මම මේ චරිතය තුළට ආරෝපණය කළා'

මනෝ මූලික කාරණා සුන්දර ව පොදු අත්දැකීම් බවට පත් කරන්නට කතුවරිය සමත් ය. මේවා පොදු මහ සමාජයේ ජනප්‍රිය අත්දැකීම් නොවූව ද වරින්වර චූල සම්ප්‍රදායේ අත්දැකීම් බවට පත්වූ එවා ය. කෙසේ වෙතත් යම් කිසි ඕනෑම අවස්ථාවකදී නිදහසේ ලද අත්දැකීම් කතුවරියට මඟ පෙන්වන්නට ඇති බව නම් නිසැක ය.

සාමාන්‍ය පිළිගැනීම අනුව නවකතාවක අත්දැකීම් වපසරිය පටුවන විට එහි පැතිරීම ද සීමා වෙයි. සමාජ පෘථුලකරණය රස වින්දනය සඳහා අනිවාර්යයෙන් බලපෑම් කරයි. පෘථුල අත්දැකීම් ලබාගන්නට නම් නිර්මාණකරුවා මහ සමාජයේ සැරිය යුතු ම ය. ශමෙල්ගේ අත්දැකීම් ගොන්නට මේ සියල්ල නිර්මාණ කාර්යයක්ව ආලෝකය දෙයි. සිය අත්දැකීමක් ම නොවුණත් තමා ලියන වපසරිය ගැන කරන හැදෑරීම සහෘදය සිත් රංජනය කරන නිර්මාණයක් බිහි වීමේ ලා හේතු කාරණා වන්නේ ය. ශමෙල්ගේ 'කුමර කොබෙයි' බිහි වීමේ ලා හේතු කාරණා සම්පාදනය වෙන්නේ මෙපරිද්දෙනි.

'උතුරු අමෙරිකානු රටවල් දෙකක රැකියාව කළ කාලය අතරතුර මට මුණ ගැසුණු අසාමාන්‍ය වීර්යයකින් යුතු චරිත ගැන ලියා තැබීමේ ආසාවක් මට තිබුණා. මොකද ඒ චරිත නොයෙක් හේතු උඩ තමන්ගේ මවු රටින් ඈත්ව හිඳිමින් ආගන්තුක සංස්කෘතියක, ගෝලීයකරණයට ලක් වූ ලෝකයක තමන්ගේ අනන්‍යතාව මතු කරගන්න ගන්නා අපිරිමිත උත්සාහය නිසා. විශේෂයෙන් අමෙරිකානුවන් වැඩ කිරීම සතුට කර ගත්, බාහිර ලෝකය ගවේෂණය කිරීමට කැමැති පිරිසක් නිසා අපේ ජීවිත ඇගයීම් සමඟ එහි ජීවත් වීම පහසු නැහැ. ඒත් එක්ක ම පවුල කියන සංකල්පය, සංස්කෘතික වටිනාකම්, ආදරය හා විවාහය අතර වෙනස්කම් බොහොමයක් තිබෙනවා. මෙහි කතාවෙන් කියැවෙන්නේ කෘෂිකර්ම උපාධියක් ඇතිව අමෙරිකාවට ගොස් කෘෂිකර්ම පර්යේෂණ සහායිකාවක ලෙස සේවය කරන වයස හතළිස් දෙකක ලාංකික තරුණියක්, අන්තර්ජාලයෙන් හොයාගත් පෙම්වතෙක් මුණ ගැසීමේ පරමාර්ථයෙන් යන ගමනක් ගැන කතාවක්. මම එතෙක් කල් හැඳිනගත් නොයෙක් හේතු උඩ විවිධාකාර විදිහට එරටට සංක්‍රමණය වුණු විශේෂිත චරිත කිහිපයක් එකතු කිරීමට ගත් උත්සාහය තමයි මේ කතාවේ කියැවෙන මහාද්වීපයක් හරහා යන ගමන. දේශ සීමා පසු කරමින් ඔවුන් ගිය අලුත් තැන ගැන ලියන්න, එතැනදී ඔවුන්ට ඉන්න තැනට හැඩ ගැහෙන්න වුවමනා නිසා අතහැරිය උපන් දා ඉඳන් රැකගෙන ආ තමන්ගේ වටිනාකම් ගැන, ඔවුන්ට වැලඳ ගන්න සිදු වුණු අනුන්ගේ කොටස ගැන ලියන්න මට ඕනෑ වුණා. ඒ වගේමයි මේ සියලු චරිත තමන් ගිහින් රැඳෙන තැනක පවතින ක්‍රමය තුළ තමන්ව වඩාත් හොඳින් ආලෝකවත් කර ගැනීම යුතුකමක් විදිහට හිතන අය ලෙසටයි නවකතාව තුළ පවතින්නේ.

අපි ලියන දේ ගැන විශ්වාසයක් කියවන කෙනා තුළ ඇති කරන්න නම් සත්‍ය කතාවක්ම ලිවිය යුතුයි කියලා මම හිතන්නේ නෑ. අවංකව ලිවීමයි කළ යුත්තේ. අපි වටපිටාවට සංවේදී නම් අපි අහන දකින දේවල් මතක ගබඩාවක තැන්පත් වෙනවා. අපි ඒක වුවමනාවෙන් කරන දෙයක් නෙමෙයි. ඉබේ වෙන දෙයක්. නවකතාවක් ලිවීමට ගත් විට අර අත්දැකීම් ඒ පසුපස එනවා'

ශමෙල් ජයකොඩි සිය අත්දැකීම් මෙන්ම පරිකල්පන ද සුන්දර ව ගොතා අප වෙත ඉදිරිපත් කරන්නී ලයාන්විත ව ය. ඒ අස්සේ අපේ ජීවිත වියමන් හරි අපූරුවට ලියැවී ඇත්තේ ය. ලෝකය පුරා මිනිසුන් කරන්නේ එකක් ය; කියන්නේ එකක් ය; පිළිගන්නේ තව එකක් ය; පෙන්වන්නේ තව එකක් ය. මිනිස් සිත කියන්නේ මේ වැනි එකකටය. මේ සියල්ල ම ජීවිතයට අයත් දෑ ය. මේ සියුම් දෑ හසු වන්නේ නිර්මාණකරුවන්ට ය. ශමෙල් ද මේ සියලු දෑ එක්තැන් කර පාඨක අපට ආනන්දනීය ඉසව්වක් පෙන්වන්නී ය. ඒ මාවතේ ජීවිතයේ සියලු දුක්ඛ දෝමනස්සයන් මෙන්ම සතුට සැනසුම ද නොඅඩුව තිබෙන්නේ ය.

# ඈන්ටික් කඩයක මරණයක්!

● අනුර දහනායක

**පරණ බඩු කඩය තිබුණේ කොළඹ 7 ලයනල් වෙන්ඩ් රඟහලේ වේදිකාවේ ය. රඟහල ට ගිය විට පරණ බඩු කඩයේ ගබඩාව හා ඉහළ මාලයේ ඇති විවෘත කාමරය දර්ශනය විය. විවෘත වේදිකාවේ ඉදිරිපිට විශාල ප්‍රමාණයක් රංගධරයන්ගේ භූමිකාවට ඉඩ සලසාදී තිබුණි. මේ වේදිකාවේ තව මොහොතකින් මරණයක් සිදුවන ඉඟියක් තිබුණි. නාට්‍යයේ නම ලෙස ඈන්ටික් කඩයක මරණයක් ලෙස නම් කර තිබීම එයට හේතුවයි.**

මෙම වේදිකාවේ ම තිස් අට වසරකට පෙර මරණයක් සිදුවෙනු දුටුවෙමි. එම මරණය ම අවස්ථා ගණනාවකදී නැවත නැරඹුවේ මරණයක රසයක් දැකීමට නොව පරම්පරා දෙකක ගැටුම නිර්මාණාත්මකව ගොඩනගා තිබූ බැවිණි. එහිදී පුතකු විසින් පියකු ඝාතනය කරන අනුවේදනීය සිදුවීම කාව්‍යමය හා නාට්‍යමය ඇසුරින් ගොඩනගා තිබුණි. එම අවස්ථාවේ වේදිකාවේ සංගීත කණ්ඩායම අසුන් ගන්නා ස්ථානය වැසීමට කුඩා තිරයකට අමතරව කිසිවක් නොවීය. 1961 දී නිෂ්පාදිත එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යයට දැන් වසර හැට කි.

මේ වසර හැට පුරා වේදිකාවේ මෙන් ම සමාජ ආර්ථිකයෙත් දේශපාලනයේත් කලාවේත් අධ්‍යාපනයේත් සිදුවූ වෙනස්කම් බොහෝය. සතයේ වටිනාකම නැත්තට ම නැතිවී ගිය අතර රුපියලේ වටිනාකම ඩොලරය විසින් පහත දමා පාලනය කර තිබුණි.

නොවෙනස් වූ සමාජ පරිහානියේ අසුන්දර කතාන්දරය කලාත්මක ලෙසින් කළ ඉදිරිපත් කිරීමක් ඈන්ටික් කඩයක මරණයක් ලෙස නම් කළ හැකිය. එය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ නැවත ඉපදීමක් ලෙසද හැඳින්විය හැක.

අශෝක හඳගම ඔහුගේ රංග කාර්යයක් ලෙස මෙම නාට්‍ය ගොඩනගන්නේ වසර තිහකට පසුවයි. ඒ අතර තුර ඔහු විසින් අක්ෂරය නමැති සිනමාපටයක් නිර්මාණය කළ අතර ඔහුගේ නිර්මාණ අතර එහි විශේෂත්වයක් තිබිණි.

මා දුටු මාර්තු 20 දින නාට්‍යය ඊට පෙර දිනවත් පසු දිනවත් රංග ගත වූ නාට්‍ය නොවේ. එය ගලා යන ගංගාව මෙනි. වෙනස් ය. මූලික පිටපත, සංගීත ස්වර පිටපත හා ශිල්පීන් සියල්ලම එක වුව ද ඒ නාට්‍ය දර්ශන ත්‍රිත්වය

## මාඝාතයෙන් උපන් හඳගම-වසර 34 කට පසු පෑ පෙළහර



කි. අප සාකච්ඡා කළ යුත්තේ නාට්‍යයේ පෙළ රචනය යි. දෘෂ්‍ය කාව්‍යයේ රූපමය චිත්‍රයයි. රැගෙන ආ නව්‍ය වූ ශිල්පීය සජීවී රූපාවලිය යි. සරලව කිව්වොත් එදින දුටු නාට්‍යමය අත්දැකීම යි. එය සමාජ සෝදාපාළුවේ වර්තමාන පැති කඩ වී තිබුණි. එය අපූරු නාට්‍යමය අත්දැකීමකි.

ලිංගිකත්වය මූලික වූ මිනිස් ගතික ස්වභාවය තුළ ලිංගික අතකොලුවක් බවට පත් වූ මනුෂය ඝාතනයක් සම්බන්ධයෙන් පරිවාසගතව ගත කළ තරුණයාගේ මානසික ගැටුම එක් පසකින් ගමන් ගනී. එම තරුණයාගේ මානසිකත්වය පිරිහී ගිය කල ඔහුගේ වත්කම හා දේපළ බල රහිතවේ. එවායේ වටිනාකමක් නොපෙනෙන අතර නොදැනේ. නිදහස් වූ ඔහුට කතාබහ කිරීමට, තමාට කීමට ඇති දේ ඇසීමට කිසිවෙක් නැත. කොතරම් පරිවාස ගත වූවද පුනරුත්තාපනය වීමට ඉඩ නොසලස්වා දූෂණයට ලක් වූ තරුණයාගේ ශෝකාන්තය විසින් ඔහුව නැවත ඝාතකයකු බවට පත් කරයි. දූෂිත සමාජයක් විසින් පුද්ගලයන් පුනරුත්ථාපනය කළ නොහැකි වග හඳගම ප්‍රශ්න කරයි.

මවක් නොමැතිව සමාජගත වන දියණියකගේ විලාපය තවත් දුක්ඛිත කතාන්දරයකි. උසස් අධ්‍යාපනය නමැති ඉලක්කයේ ගත කරන ඇගේ තාරුණ්‍යයේ ගොඩනැගෙන ස්වෛරී ස්ත්‍රී ස්වාධිපතිත්වය යටතේ ආරක්ෂකයෙක් එම වට පිටාවෙන් සොයා ගනී. ඔහුව පාවිච්චි කරන ඇය යම් සංදිස්ථානයකදී ඔහුව අතහැර දමන්නීය. එය ඔහුට වාවා ගතනොහැකි තත්ත්වයකට පත්වෙමින් පාරාජිතයකු වේ. මේ පරාජිතත්වය ම ඔහුගේ ජීවන ගමන තීරණය කරවයි.

බිරිදක් රහිත ව ගත කරන පරණ බඩු කඩේ පාලකයා පරණ බඩු හා ජීවිතය ගත කරයි. සියලු දේ විකිණෙන සමාජයක මිල මුදලින් සෑම දෙයක් දෙස ම බලන තත්ත්වයට පාලකයා පත් ව ඇත. තම පවුලේ අභිවෘද්ධිය දෙස බලන්නේ ද වත්කම ශූන්‍ය වූ තරුණයාගේ වත්කමට මිල නියම කරමිනි. සියලු අරමුණු ඔහු අභිමුව විනාශව ඇත. තම දියණිය හා තම ආයතනය පිළිබඳව බලාපොරොත්තු දියවන ඔහුට ඉතිරිව ඇත්තේ සියල්ලන්ටම ද්වේෂ කිරීමට පමණි.


ආත්මාර්ථය ඉහවා ගිය කළ සියල්ල ශූන්‍ය වේ.

සෞම්‍ය ලියනගේ, පසන් රණවීර, නිපුනි ශාරදා හා ස්ටෙෆාන් තිරිමාන්න වේදිකාවේ නොසිටිමින් ඔවුන් රඟන චරිත පමණක් ප්‍රේක්ෂකයා අභිමුව තම රංග කාර්යය ඉටුකළ බව පැසසුමට ලක්විය යුතුය. ඒ අතරත් පසන් රණවීර හා නිපුනි ශාරදා ගේ රංග කාර්යභාරය මෑත ඉතිහාසයේ අමතක නොවන අද්විතීය රංගනයක් බව සටහන් නොකළහොත් එය ඔවුන් දෙපළට කරන අගෞරවයකි.

චින්තන ජයකොඩිගේ සංගීතය ද බිමල් දුෂ්මන්තගේ නිර්මාණ දායකත්වය ද හඳගමගේ රංග කාර්යය සාර්ථක කිරීමට ඉවහල් ව තිබුණි. ඉදිරියේදී තවත් ඔප දැමූ නාට්‍යයේ දිස්නය දැක ගත හැකි වන්නේ හඳගම විසින්ම නාට්‍ය තමාගේ නොවන අයුරින් දැකීමෙනි. එවිට එහි අමුතු හැඩයක් ඔහුටම දැකිය හැකිය. නාට්‍යය විවිධ පුද්ගලයන් කියවන්නේ විවිධ කෝණිය ව ය. ඔවුන් සියල්ලගේ දැක්ම ඔවුනොවුන්ට සාපේක්ෂ වේ. කෙසේ නමුත් හඳගමගේ නාට්‍ය හඳගම ට පිටස්තරයකු ලෙස දැකීමට හැකිනම් ඉදිරියේ දී මීටත් වඩා ඔපවත් වූ දර්ශනයක් ප්‍රේක්ෂකයන්ට දැක ගත හැකි වනු ඇත.


# පොත් පුවත්

● සුරේකා හිල්මිණී ඉලංගකෝන්




**කෘතිය- වියන් ඇඳ**
**කර්තෘ- දයා ද අල්විස්**
**ප්‍රකාශක- ඇම්.ඩී.ගුණසේන සහ සමාගම**
**මිල- රුපියල් 220 / පිටු ගණන- 60**
**විමසීම්- 0112 802 761**

ප්‍රවීණ නිවේදිකාවක සහ ජනප්‍රිය ගේය පද රචිකාවක වන ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදිනී දයා ද අල්විස් විසින් රචනා කරන ලදුව කලකට පෙර පුවත්පත් සහ සඟරාවල පළවූ කෙටි කතා කිහිපයක් කෘතියක් ලෙස එළිදකින පළමු අවස්ථාව මෙයයි. ජීවිතය, ප්‍රේමය හා මනුෂ්‍යත්වය පිළිබඳ සංවේදී ඉසව් ඉතා සෞම්‍ය ලෙස ස්පර්ෂ කරමින් කතුවරියටම ආවේණික සරල බස් වහරකින් ලියන ලද කෙටිකතා 9ක් මෙම කෘතියට ඇතුළත්ය.




**කෘතිය- ඉමෙල්ඩා**
**කර්තෘ- සෝමසිරි මුණසිංහ**
**ප්‍රකාශක- ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්**
**මිල- රුපියල් 600**
**පිටු ගණන- 374**
**විමසීම්- 0112 682 223**

සෝමසිරි මුණසිංහ විසින් රචිත පළමු සිංහල නවකතාව වන මෙහි අන්තර්ගතව ඇත්තේ කතුවරයාගේ විදේශීය මිතුරුමිතුරියන්ගේ අත්දැකීම් සහ සත්‍ය සිදුවීම් කිහිපයක් ඇසුරෙන් ලියන ලද ආදර කතාවකි. කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වන පුවත්පත් කලාවේදී සෝමසිරි මුණසිංහ, කලක් ඩුබායිහි ගල්ෆ් නිවුස් පුවත්පතේ සේවය කළ අතර මේ වන විට කැනඩාවේ ජීවත් වෙමින් නිර්මාණකරණයේ යෙදේ.




**කෘතිය- වැඩවැරුම අහවරයි**
**කර්තෘ- සුසන්ත රත්නායක**
**ප්‍රකාශක- නිශාන්ත ප්‍රකාශක**
**මිල- රුපියල් 500 / පිටු ගණන- 160**
**විමසීම්- 0718 024074**

වෘත්තියෙන් ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයකු වන වෛද්‍ය සුසන්ත රත්නායක විසින් රචිත මෙම කෘතිය ඔහුගේ පළමු කෙටිකතා සංග්‍රහයයි. සැබෑ ජීවිතයේදී මුහුණ දෙන සිදුවීම් සහ හමුවන පුද්ගලයන් පිළිබඳ අත්දැකීම් ඇසුරෙන් රචිත මෙම කෙටිකතා සංග්‍රහය ජීවිතය පිළිබඳ විවරණයක් වැනිය. වෛද්‍ය සුසන්ත රත්නායක මීට පෙර 'අකල් පිනි' කෙටි නවකතාව සහ 'සසල පෙම' නවකතා ප්‍රකාශයට පත්කර ඇත. 'වැඩවැරුම අහවරයි' කෙටිකතා සංග්‍රහය සමග කතුවරයාගේ 'සෙව්වන්දි' කාව්‍ය සංග්‍රහය ද පසුගියදා එළිදැක්විණි.



**කෘතිය- අබුද්දස්ස**
**කර්තෘ- ජයන්තිමාලා පෙරේරා**
**ප්‍රකාශක- ශාජය ප්‍රකාශන**
**මිල- රුපියල් 600/ පිටු ගණන- 208**
**විමසීම්- 071 010 5259**

කතුවරියගේ කුලුඳුල් නවකතාව වන මෙම කෘතිය තුළින් කියැවෙන්නේ පවුල් සංස්ථාව ප්‍රබල සුළිකුණාටුවකට හසුවීම තුළ සිදුවන සමාජ විපර්යාස පිළිබඳවය. මීට පෙර ඇය විසින් ළමා සාහිත්‍ය කෘති 7ක් ප්‍රකාශයට පත්කර ඇත. වෙනස් ආකාරයේ ලියවීමක් සහිත මෙම නවකතාව බිරිඳගේ ලියවිල්ල, යෞවනයාගේ ලියවිල්ල, මාධ්‍යවේදිනියගේ ලියවිල්ල සහ සැමියාගේ ලියවිල්ල ලෙස පරිච්ඡේද කිහිපයක් යටතේ රචනා කර ඇති අතර පාඨකයාට නවමු අත්දැකීමක් ගෙනඒමට සමත් කෘතියකි.



**කෘතිය- සිතුවිලි අකරතැබ්බය**
**කර්තෘ- ශ්‍රියානි අල්විස්**
**ප්‍රකාශක- රුසියාව ප්‍රකාශකයෝ**
**මිල- රුපියල් 300**
**පිටු ගණන- 78**
**විමසීම්- 071 488 1182**

කතුවරියගේ කුලුඳුල් කෙටිකතා සංග්‍රහය වන මෙම කෘතියේ අඩංගු වන්නේ ඇය විසින් රචිත, ජාතික පුවත්පත්වල පළවූ සහ තෝරාගත් වෙනත් කෙටිකතා කිහිපයකි. වෙනස් ආකාරයේ තේමා 10ක් ඔස්සේ රචිත මෙම කෙටිකතා තුළ "සමීප රූපයට - දුර රූපයක"රූප පද්ධතියක් ඇතුළත් කිරීමට දැරූ වෑයමක් බව කෘතියට පෙරවදනක් සපයමින් ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදී තිලකරත්න කුරුවිට බණ්ඩාරයන් පවසා ඇත.



**කෘතිය- පුංචි අපේ සමනළ ගී**
**කර්තෘ- ශ්‍රීමතී කුමාරි ජයකොඩි**
**ප්‍රකාශක- සී.ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ**
**මිල- රුපියල් 250 / පිටු ගණන- 28**
**විමසීම්- 071 5448993**

ශ්‍රීමතී කුමාරි ජයකොඩි විසින් රචිත මෙම ළමා ගීත සංග්‍රහයට ඇතුළත් කර ඇත්තේ කතුවරිය විසින් රචනා කොට රූපවාහිනී ළමා වැඩසටහනක ප්‍රචාරය වූ ගීත නිර්මාණ කිහිපයකි. ළමා ලෝකය තුළ දරුවන්ගේ සිතිවිලි සහ අවට පරිසරය සමඟ තිබෙන බැඳීම පිළිබඳ කියැවෙන මෙම ගී නිර්මාණ දරුවන්ට තාලයට ගායනා කළ හැකිය. එවැනි සුන්දර, ළයාන්විත ගී නිර්මාණ 28ක් මෙම කෘතියට ඇතුළත්ය.

# කෙටිකතාව

# සබන් පෙට්ටිය

● ශාන්ති දිසානායක



**මවු තුරුලට වන් බිලිඳෙකු මෙන් ඇය සංතෘප්ත වූවාය. බිලිඳු බඩ සා ද උණුහුම සහ සීත ද පලවා හරින තන පුඩුව සේම ඇළ දිය ඇගේ සිරුර සනහාලයි. මුරකාවලෙහි යෙදෙන දැවැන්තයන් සදිසි රුස්ස මාර ගස් ඇගේ ඇසින් අහස වසන් කරන්නට වෙර දරයි. එහෙත් දියෙහි ගිලි ගිලී ඇය ඒ සිය සියක් අතු ඉති අතරින් අහසේ නිල ද වලාකඩක සුදු ද දුටුවාය.**

නවම් හිරු මෙන්ම නවම් අහස ද අතිශයින් දීප්තිමත් විය. ළපල්ලෙන් ගැවසී ගත් ගහකොළ නුදුරෙහි එළඹෙන බක් මසෙහි පලවැල පුබුදුවාලන අපේක්ෂාවෙන් උතුරා යන්නාක් මෙනි.

බඩවැටියේ සරසරය ඇගේ සමාධිය බිඳ දමයි. ඇය අහසින් හා තුරු මුඳුනින් ඇස් ඉවතට ගත්තේ කැමැත්තෙන් නොවේ. තවත් වේලා වලාවක සුදෙන් සැනසෙන්නට තිබුණා නම් හොඳය.

“නානවද?“

ඇය දියෙහි ගිලී සිටියදීත් ඔහු ඇසුවේය. හුදෙක් සමීපයෙහි මනුස්ස පරාණයක් නොතකා සිටිය නොහැකි බැවිනි.

“ඉන්ඩ බෑ ගිරීස්මේ... ගිනි ගනී කියල හිතෙන්නෙ සේරම. ඒ තරං සැරයි පෑවිල්ල....“

“නවං ඉරට ඉතිං යකෙක් වැහෙනවනෙ කවදත්“

ඇය වඩාත් විමසිල්ලෙන් බැලුවේ ඔහු දක්කාගෙන ආ එළදෙන දෙසය.

“මේකි වෑ පිටියට එක්කාන යන්ඩ බෑ... පැටියා ගහන්න ඔන්න මෙන්න...“

මාර ගස් එක්ක සසඳා බලන කල කුරුම්ට්ටෙක් සදිසි ගසෙහි එළදෙන දිගේලි කරමින් ඔහු පහදා දුන්නේය.

“ගාලෙ තියලා එන්ඩ තිබ්බනේ“ යි ඇය කීවේ පරාජිත හඬිනි. දැරිය නොහැකි තරම් මහත් උදරයක් එක්ක වෑයමෙන් ගාටන එළදෙන ඇගේ දුක්ඛ දෝමනස්සයන් අලුත් කරයි.

“මට විතරද මේ ලෝකෙ ළමයි නැත්තෙ...? මේක හරිම කරුමයක්නෙ. එළි විච්චි වෙලේ ඉඳලා කියවනවා ඉවරයක් නෑ. මට කනක් ඇහිලා ඉන්ඩ දෙන්නෙම නෑනෙ යකෝ“ යි ඇය කෑ ගැහුවේ බැරිම තැනය. නිහඬව සිටීම වූ කලී නැන්දණියට තමා තළා පෙළා දමන්නට ලබා දෙන අවසරයක් බව ඇය අවබෝධ කරගත්තේ කාලාන්තරයකට පස්සේය.

“කට නං තියෙනවා වෙන මොක නැතත්. අර උඩහ ගෙදර ඉන්දරා ආයෙත් බඩිං... ආං ගෑනු... ඒකට මේ වඳියො.. මගේ කොල්ලගෙ කරුමෙ. වෙන මොකවත් නෙමේ සංසාරෙ කරපු පව් පල දීලා“

මවගේත් බිරින්දෑගේත් වදන් හරබයට මැදිහත් නොවන විජේපාල හෙමින් සීරුවේ මඟ හැර යයි. කමලාවතීගේ කටොළු කතාවලට වඩා ඉවසිය නොහැක්කේ එයයි. දුක සැප බෙදා හදා ගන්නට දිවුරා පොරොන්දු වූ මිනිසාගේ නිහැඬියාවයි. පිටුපෑමයි. ජයන්ති ශෝකයෙන් නොව කෝපයෙන් දැවුණාය. ශෝකය තමා දුර්වල කරන අතරේ කෝපය නව ශක්තීන් ජනිත කරවන වග ඇය ඉඳුරා දැන සිටියාය.

“මට ළමයි නෑ තමා. මං වඳයි තමා. ඉතිං... මට මැරෙන්ඩද කියන්නෙ...? ළමයි නැති ගෑනු සේරම මරනවද? මැරෙනවද..? මිනිස්සු ඒ ගෑනු අතාරිනවද..?“

දුනු ඊතල අතැති දුනුවායෙකු මෙන් ඇය අභීතව පෙරට ඇදෙයි. ලේලියගේ කෝපාග්නියෙන් සසලව යන කමලාවතී පසුබසියි. එහිලා ඇගේ කෝපය මඳින් මඳ වියැකෙන්නේ ජයන්තිගේ දෙනෙත ගිනි පුපුරු හේතු කොටගෙනය.

“මේකි යස්සනී වගේ... මගේ බොටුව මිරිකලා ලේ බොන්ඩත් බැරි නෑ.“ යි තිගැස්සෙන ගැහැනිය දන්නා ගාථා සියල්ල කියමින් බුදුන් වඳින්නට පටන් ගනී. ඇයට පහර දෙන්නට පමණක් නොව ඇය මරා දමන්නට පවා සිතෙන තරමට උමතු වූ ගැහැනියට ආපසු හැරෙන්නට බල කරන්නේ නැන්දණියගේ මුවින් පිටවන ගාථා සමුච්චයයි.

මද්දහනේ ඇළට බහින්නේ එහෙව් දුක්ඛ දෝමනස්සයන්ගෙන් අවපැහැ ගැන්වුණ එකියකි. කෝපය හා ද්වේෂය පවා සිතට කයට ගෙන දෙන පීඩාව අතිමහත්‍ය. එහෙයින්ම උණුසුම් දිය දහරම ඇයට මවු තුරුලකි. ලෙන්ගතු උරහිසකි.

දිය නාන ගැහැනියට උත්තර දෙන්නට හිස නැගූ ඩිංගිරා තිගැස්සුණේය. දණක් උස දියේ හිටගෙන ඉන්නා ඇය දිය රෙද්ද විසින් මනාව උළුප්පා දැමූ හැඩතල එක්ක සරාගී පෙනුමක් ඉසිලුවාය. ඔහු කිසි කලෙකත් ඇය දෙස මේසා විපරමින් බලන්නට උත්සුක නොවීය. එළදෙනක හෝ පැටවකු බඩවැටියට දක්කාගෙන එන කල ඇය දිය නාමින් සිටියහොත් වචනයක් දෙකක් කතා කරයි. එහෙත් ඒ කිසිඳු හැඟීමකින් නොවේ. මනුස්සයෙකුට මනුස්සයෙකු හමුවූ විට කතා බතා බැරි නම් හිනාවක් හෝ පා යුතු බවට නීතියක් ඔහුගේ පියා පනවා තිබූ බැවිනි.

දිය නාන ගැහැනියට උත්තර දෙන්නට හිස නැගූ ඩිංගිරා තිගැස්සුණේය. දණක් උස දියේ හිටගෙන ඉන්නා ඇය දිය රෙද්ද විසින් මනාව උළුප්පා දැමූ හැඩතල එක්ක සරාගී පෙනුමක් ඉසිලුවාය. ඔහු කිසි කලෙකත් ඇය දෙස මේසා විපරමින් බලන්නට උත්සුක නොවීය. එළදෙනක හෝ පැටවකු බඩවැටියට දක්කාගෙන එන කල ඇය දිය නාමින් සිටියහොත් වචනයක් දෙකක් කතා කරයි. එහෙත් ඒ කිසිඳු හැඟීමකින් නොවේ. මනුස්සයෙකුට මනුස්සයෙකු හමුවූ විට කතා බතා බැරි නම් හිනාවක් හෝ පා යුතු බවට නීතියක් ඔහුගේ පියා පනවා තිබූ බැවිනි.

“කුඹියෝ පේළියට යන දිහා බලාගෙන හිටපං. කුඹියෙක් තව කුඹියෙක්ට එයාකාර ළෙන්ගතුකමෙන් ළං වෙනවා නං මනුස්ස අපි කොහොම හිනාවෙලා කතා බහ කරන්ඩ ඕනෑ ද?“ යි අසන්නට ඔහුගේ පියා පුරුදුව සිටියේය. එහෙත් පොළොප්පත්ලේ වස විස මුසුවූ නළ ළිං වතුරෙන් දුර්වර්ණ වූ දත් දෙපොළෙ විහිදා සිනාසෙන්නට ඩිංගිරා මැළි වෙයි.

“මො... මොකක්ද කිව්වෙ?“

ඇගේ තෙත බරිත සිරුර මත සක්මන් කරන්නට තරම් නොහික්මුණු දෙනෙතට ශාප කරමින් ඔහු ප්‍රශ්න කළේය. එහි වූ වරදකාරී ස්වභාවය ඇය වටහා නොගත්තාය. මේ කෙසඟ කිළිටි ගොපල්ලා තුළ රාගාන්විත හැඟීම් පහළ වනු ඇතැයි ඇය කිසි විටෙකත් නොසිතුවාය.

“නෑ.. මං කිව්වෙ.. ගාලෙ හිටිය නං නෙ හොඳ මේ වැස්සි...“

ඔහු අත වූ කෙවිටෙන් තමාගේම පිට කැසුවේය. සිත නොසන්සුන් වූ විට එය නිතැතින්ම සිදුවන්නකි.

“ගාලට වැඩිය මේකිට මෙතන හොඳා.. කන්ඩ තණකොළ ඕසෙට තියෙනවා... බොන්ඩ ඇළේ වතුර තියෙනවා.“

ඇය හිස සලා එකඟ වූවාය.

“මෙතනම පැටිය ගැහුවොත් තමා වැඩේ“ යි කී ඇය සිනාසෙන්නට තැත් කළාය. නිබඳ නෙත ගැටෙන ගුරුපාර වගේම ඩිංගිරා නිතර දුටුවද හැඟීමක් හෝ දයාර්ද්‍ර බවක් නොඋපන් සිතට මේ මක්වී දැයි ඇය නොසන්සුන් වූවාය. මේ තාක් කලකට මේ සා වචන කන්දරාවක් ඔහු සමඟ කතා නොකළ බව සිහිපත් වීමෙන් ඇය හැකිළී ගියාය.

“දැං මං ගියාට හැන්දෑවෙ ආයෙ එනවා. හෙට මේකි මෙතන තියලා බෑ...“ යි කී ඔහු යන්නට හැරුණේය.

ඇය යළි දියේ නොගිලී ඔහු දෙස බලාගත්වනම සිටියාය. ගැහැනියක ප්‍රිය කරන රුවක් නැතත් ඇගේ සිත ගත් යමක් ඒ කාලවර්ණ සිරුරේ විය.

හරක් එක්කම දවස ගෙවන, හරක් මත්තේම හැපෙන ඩිංගිරාට ඩිංගිරා කියන්නෙක් ගංගොඩේ නොසිටියි.

“මයිලා...“

ඩිංගිරා මයිලා වූයේ කවදාදැයි කාට නම් කිව හැකිද? එහෙත් දෙවුර සිඹින කෙස්සද සිරුර වසාගත් ලොම් ද කුඩා දරුවන් බියබීත කරවන සුලුය.

“බට්ටික ඔක්කොම නොකෑවොත් මං එන්ඩ කියනවා මයිලා මාමට“ යි කියන්නට පුරුදු වූ අම්මලා එමටය.

“ආං... ආං... බිල්ලා එනවා... කන්ඩ... කන්ඩ.. බට්ටික කන්න...“ යි අනතුරු අඟවන අම්මලාට දරුවන් බියපත් කරන්නට ඔහු නොමසුරුව දායක විය.

බිල්ලා ද, මයිලා ද වන ඩිංගිරා අඳුරේ ද ආලෝකයේ ද කල්පනා කළේ හරක් පට්ටිය පිළිබඳවය. හඳයාගේ තුවාලයට ඔසු සෙව්වේය. රත්තිගේ පැටවා රකින්නට වෙහෙසුණේය. ලපීගේ දඩබ්බරකම මට්ටු කරන්නට වෙහෙසුණේය. ඒ ඒ ගවයා පිළිබඳව ඔහු පමණටත් වඩා දැන සිටියේය. ඒ නිසාම එක් එක් සතා කෙරෙහි ඔහු තුළ වූයේ එකිනෙකට වෙනස් හැඟීම් සමුදායකි. ගව ගාලෙහි නායකත්වය ගන්නා තලවාට ඔහු ගෞරවය දක්වන්නට මැළි නොවෙයි.

ඩිංගිරා ආපසු යන්නේ තමාද උසුලාගෙන බව අනුමාන නොකළද, ජයන්ති තවදුරටත් ඇළ දියෙහි උණුසුම ද සැනසුම ද නොලද්දාය.

“යං“ යි නැන්දණිය හැන්දෑකළුවේ සුදු වතින් සැරසී අණ කළ සැණින් ඇය කිපුණේ ද අසහනයෙන් පසුවූ බැවිනි.

“මට බෑ...“ යි එක එල්ලේ ප්‍රතික්ෂේප කරන්නට තරම් ඇය නිර්දය වූවාය.

“මොනවා... බෝධි පූජාවට යන්ඩ බෑ...?“

කමලාවතී ඇස් ගෙඩි උළුප්පාගෙන ඇසුවාය.

“යං... යං...“

විජේපාල වහා මැදිහත් වූයේ සුපුරුදු අඩ දබරයට බියෙනි.

“මට බෑ.. මට උණ ගැනෙන්ඩ වගේ...“ යි කී ඇය මඳක් කෙඳිරි ගාන්නට ද වග බලා ගත්තාය.

කමලාවතී සැකයෙන් දෙඇස හකුලා ගත්තද විජේපාල හිස සැලුවේය.

“එහෙනං ඉතිං මොනවා කරන්ඩද...?“ යි ඔහු කණස්සල්ලෙන් කීවේ අම්මාගෙන් බුරුලක් පතාගෙනය

“ඉතිං දෙයියෝ සාක්කි. අපි ගිහිං පලක් ඇතෑ පන්සල් ලෙඩා දූකා නැතුව“

“මං හෙට යන්නං... ඊයෙත් ගියානෙ..“

කමලාවතී මිදුලට බැස්සේ අමනාපයෙනි.

“දවස් හතම යන්ඩෝනා... නැත්තං වැඩක් නෑ..“ යි ඇය කොඳුළේ කණස්සල්ලෙනි.

“හරි හරි අම්මෙ... එයාට ඇඟට අමාරු ඇති. නැත්තං නෑවිත් ඉන්නෙ නෑනේ..“

“උණ නොගැනී තියෙයිද බං.. ගිනි මද්දහනෙ අර ඇළේ බැහැල ඉද්දි...“

කමලාවතීගේ වචන ගෙතුළට දුවන්නේ ඇඳ බදා වැලඳගත් ජයන්තිගේ දෙකනේ රිංගන්නටම වගේය.

ගිනි මද්දහනත් ඇළත් ඇගේ ඇස් අද්දරට කැන්දාගෙන එන්නේ ඔහු ය. ලොමින් ගහන ඩිංගිරා ය. ඇය වහා උඩුකය කෙළින් කළාය.

“මයිල්... දෙයි හාමුදුරුවනේ මයිල්..“ යි ඇය හදිසියේ හටගත් ආවේගයෙන් තොල් මතුළාය. යක්ෂා වේශයක් මවා පාන බවට ගම්මු අදහන ඒ ලොම් කැටියම ඇයට ඉන්ද්‍රජාලයකි. ඇය ඇඳෙන් බැස්සේ ද කාමරයෙන් පිට වූයේ ද කිසියම් ආවේශයකට නතු වූවක මෙනි.

අඩ අඳුරේ වුව පිළිකන්නේ මිරිස් ගල මත සබන් පෙට්ටිය දිලිණ. එහෙත් එය ගෙනා මිනිසා අඳුරට අඳුර එක් කළේය.

“ක... කව්ද?“ යි ඇය ඇසුවේ සැලෙන හඬිනි. අඳුර සඟවා ගන්නා අඳුරු රුව ඔහුගේම බව දැන දැනමය.

“මේ... ස.. සබං පෙට්ටිය බැරි වෙලා.. මං ඇරං ආවා.. කවුරුවත් පේන්ඩ නැති හිංදා යන්ඩ මේ හැදුවෙ...“

ඇය ඔහුගේ දුර්ගන්ධයෙන් නැහැපුඩු පිරී යනතුරුම ළං වූවාය. ඔහු වෙතින් හමන්නේ මනුස්ස සිරුරක ගන්ධය පමණක් නොවේ. හරක් පට්ටියකම ගන්දස්සාරයයි. ඇළේ වරුවක් ගිලී සිටියද සිරුර වෙළා ගත් ඒ ගඳ නොවියැකේ. ගොපල්ලෙකුට උරුම එවන් උරුමයක්මය.

“ස.. සබං පෙට්ටිය බැරි වුණේ නෑ..“ යි ඇය ඇත්තම කීවාය.

“ඇළ පඩිය උඩ තිබ්බෙ... මං හිතුවෙ.. මං හිතුවෙ..“

සුදුසු ආමන්ත්‍රණයක් සොය ගත නුහුණුව ඔහු තැතනුවේය. ඇගේ නම දැන සිටියද නම කියන්නට ඔහු පසුබායි.

“මගේ තමා... හැබැයි මට බැරි වුණේ නෑ.. මං බැරි කරලා ආවෙ..“

ඒ ඇයි දැයි වහා ප්‍රශ්න කළේ ඔහුගේ දෙනෙතයි. ඒ නොඇසූ ප්‍රශ්නය හේතු කොටගෙන ඔහුගේ දෙඇස වඩාත් මහත් විය.

“මං හිතුවා වැස්සි ගෙනියන්ඩ එද්දි සබං පෙට්ටිය දකී කියලා...“

ඔහුට ඇගේ කතාවද ඇගේ හැසිරීමද වටහාගත නොහැක.

ඇය මේ සා තමා වෙත ළං වන්නේ මන්දැයි ඔහු සිතුවේ අප්‍රසාදයෙන් නොවේ. ආශා හරිත හදිනි.

“එයි කියලා තමා පන්සල් ගියේ නැත්තෙත්“ යි කී ජයන්ති ඔහුගේ පුළුල් ළය මඬලෙහි හිස හොවා ගත්තාය. අප්‍රමාණ විමතියෙන් වුව ඔහු ඇය වැලඳ ගත්තේය. මද්දහනේ පටන් ඈ නිසාම වේදනා ගෙන දුන් සිත කය සනසන්නට ඇයම නොපැකිළ ඉදිරිපත් වූ විට තමා පලා යා යුතු නැතැයි ඔහුට සිතිණ. වෑ පිටියේ දිවා රෑ ගත කරන බැවින් මැසි මදුරු දෂ්ටනයෙන් ගොපල්ලා ගලවා ගන්නට යුහුසුළුව ලොම් වැඩෙන බවක් ඔහු දැන නොසිටියේය. එහෙත් හුදු මනුෂ්‍ය වේශයක් ඉසිලුවද තමා තිරිසන් සත්ත්වයෙකු බවට රූපාන්තරණය වන්නේ යැයි පශ්චත්තාපයෙන් මිරිකෙමින් ඩිංගිරා අන්ධකාරයට පිංපෙත් දුන්නේය.

කුඩාවුන් බය භීත කරවන ලොම් කැටිය ඇගේ දෑසින් වසන් කරන අන්ධකාරය අභිමුව දණින් වැටෙන්නට පවා ඔහු බැතිබර විය.

අන්ධකාරය බොහෝ දෑ වසන් කළ බව සැබෑය. එහෙත් නවම් හිරු ගෙනා දීප්තිමත් ආලෝකය ඇගේ ඔක්කාරය හෙළිදරව් කළේය.

මයිල් ඩිංගිරා යළි කිසි විටෙකත් දිය නාන ගැහැනියගේ බැල්මක් හෝ නොලද්දේය. එයින් ඔහු වේදනා වින්දේය. එහෙත් ඒ බව පිළිගන්නට ඔහු කැමති නොවීය. වරක් තමා වැලඳ බදා ගත් එකිය මේ අයුරින් නාඳුනන විලාසයෙන් ඉවත බලන කල ඔහුගේ හදවතේ සිහින් අග්නියක් දැල්විණ. එය නිවා දමන්නට විනා සරුසාර කරන්නට ඔහුට වුවමනා නොවීය. අව්වේ කරකුට්ටන් වෙනවා මදිවාට ගින්නේ දැවෙන්නට ද ඔහු කැමති වන්නේ කෙසේද?

“දෙයියො බැලුවා“ යි ඇගේ සැමියා තිස්තුන් කෝටියක් දෙවියන් අතරින් එකෙකු හෝ දකින රිසියෙන් ඉහළ බැලුවේය.

“බෝධි පූජාවෙ අනුහස්“ යි කමලාවතී දෑත එක් කළාය. මඳින් මඳ ඉදිරියට නෙරා එන උදරයත් එක්ක ජයන්ති සබන් පෙට්ටිය තලා කුණුවලට විසි කළාය.

ගැබ්බර දෙනක හෝ මහලු ගවයෙකු බඩවැටියට දක්කාගෙන එන මයිල් ඩිංගිරා යළි කිසි විටෙකත් දිය නාන ගැහැනියගේ බැල්මක් හෝ නොලද්දේය.

එයින් ඔහු වේදනා වින්දේය. එහෙත් ඒ බව පිළිගන්නට ඔහු කැමති නොවීය. වරක් තමා වැලඳ බදා ගත් එකිය මේ අයුරින් නාඳුනන විලාසයෙන් ඉවත බලන කල ඔහුගේ හදවතේ සිහින් අග්නියක් දැල්විණ. එය නිවා දමන්නට විනා සරුසාර කරන්නට ඔහුට වුවමනා නොවීය. අව්වේ කරකුට්ටන් වෙනවා මදිවාට ගින්නේ දැවෙන්නට ද ඔහු කැමති වන්නේ කෙසේද?

කොතෙක් වෙද හෙදකම් කළ ද සුවපත් නොවන සුද්දා ඇළ කණ්ඩියට දක්කාගෙන යමින් ඔහු ඇගේ විපර්යාසය සිහි කළේය. ඒ හාම ඇගේ සිරුරේ මටසිලිටි බව යළි යළි සිය දෑතින් පසක් කර ගැන්මේ බලවත් ආශාවෙන් හරිත විය.

බැල්මක් හෝ නොහෙළන අඟනකගේ ස්පර්ශය පිළිබඳව සිහින මැවීම ද නිෂ්ඵල බව සිතන්නට හඟින්නට තරම් නිරවුල් මනසක් ඔහු වෙත නොවිණ. ඇය වෙත දිව යන සිත මෙල්ල කර ගන්නට රත්ති, හඳයා හෝ කබරී වෙත අලවා ගන්නට ඔහු දරන ලද්දේ සුළුපටු ආයාසයක් නොවේ. නොහික්මුණු ගවයෙකු අවනත කර ගැන්ම ඒ සා දුෂ්කර නැත.

ඇය මංකඩේ සිටින්නේදැයි කුහුලින් ඔහුගේ දෑස දිදුලන්නට විය. එහෙත් ඔහු රෝගී ගවයා අත්තික්කා ගසේ දිගේලි කරන ලද්දේ ඇළට පිටුපා හිටගෙනය.

ඇගේ සිනා හඬ බමනවියේ සදාහරිත සුන්දරත්වයට සරාගී බවක් එක් කළේය.

විටින් විට නිවා දමන්නට වෙහෙසෙන ගිනිමැලය ඔහුගේ ළයෙහි යළි ඇවිලෙන්නට පටන් ගත්තේය. එහි වේදනාවෙන් ඔහුගේ මුහුණ විකෘතව රෝගීව ගියේය.

“බොරු නෙමේ... අපේ කිරියත්තා ගියේ ළමයා නාවන්ඩ බේසමක් ඇරං එන්ඩනෙ.. එවුන්දැට ටවුමෙදි දම්පිටියෙ නෑයෙක් හම්බවෙලා...“

ඇය පමණක් නොව ඇගේ සැමියා ද ඇළ දියේ සිහිලස විඳින බව ඒ උස් හා ප්‍රීතිමත් හඬ අවධාරණය කළේය. ඩිංගිරා ආපසු හැරෙන්නට පැකිළුණේය. හැරුණු සැණින් ඇය ද ඔහු ද නෙත ගැටෙන බව දන්නා බැවිනි.

ඔවුන් අඹු සැමියන් බව ඔහු දනියි. එහෙත් ඒ අඹු සැමියන් මේ මද්දහනේදී දැකීම වේදනාවකි.

“ඉතිං... ඉතිං... ඊට පස්සේ?“

ඇය කුහුලින් ද ප්‍රබෝධයෙන් ද ඇසුවාය. නිහඬ හා සාංකාකුල සැමියාගේ මේ නව වේශය ඇයට අසිරියකි. බිරින්දෑ ගැබ්බරව හිඳින වග සැල වූ පසු ඔහු හැව හළ නාගයෙකු සේම නව ජීවයෙන් ද හැඩයෙන් ද සපුරා වෙනස් එකෙකු බවට පත්ව සිටියි. තොර තෝංචියක් නැතිව කතා කරයි. කවදාවත් නැතිව ඇය සමඟ නාන්නට එයි.

ඇය ප්‍රිය කරන ආහාරපාන සොයා වෙහෙසෙයි.

“අපුච්චියේ... අපේ එකාට සන්තෝසෙ ඉහිලුං නෑ.. උඩ ඉර හඳ ඉල්ලුවත් ගෙනැල්ල දෙන්ඩ වලිකයි.“ යි කමලාවතීගේ ස්වරයෙහි ගැබ්ව තිබුණේ ද ඉසිලිය නොහෙන උද්දාමයකි. ජයන්ති වහා ළිප වෙත හැරුණේ මුහුණේ අඳුර නැන්දණියගේ ඇසින් වසන් කරගන්නටය.

“මං මහා පව්කාරියක්“ යි හඬා වැළපෙන්නට තරම් වන ශෝකයකින් හා පශ්චාත්තාපයකින් ඇය මිරිකී ගියාය. එහෙත් දිනෙන් දින ඒ ශෝකය ද පශ්චාත්තාපය ද සෙමින් වුවද නිශ්චිත ලෙස වියැකිණ.

ඇළ දියේ ගිලි ගිලී සැමියා සමඟ පිළිසඳරෙහි පසුවන්නිය වෙතින් ශෝකාන්ධකාරයක සේයාවක් හෝ දක්නට නොලැබේ. ජීවයක් දරා සිටින්නියකගේ අභිමානය ද පූර්ණත්වය ද ඇය නොමඳව පළ කළාය.

“ඉතිං තමයි... එවුන්දැ බේසමත් ඇරං එනකොට ළමයා මිදුලේ බට්ටො පනිනවලු. අම්මේ මේං කවුද ඇවිල්ලා කියලා කැගහනකොට කිරියම්මා කුස්සියේ උය උයා ඉඳලා දුවගෙන ආවලු. ළමයා නාවන්ඩ බේසම ගේන්ඩ ටවුමට ගිය මනුස්සයා මේං බේසමකුත් උස්සගෙන මිදුල මැද්දෙ. කිරියම්මට ආපු තරහ කොච්චරද කියනවනං ගත්තලු පොල් පිත්තක්.“

ජයන්තිගේ සිනා හඬ කොතෙක් උස් වී ද කිවහොත් රුස්ස මාර ගස් පවා සලිත වූ සෙයකි. දිය රළ රැළි නැගිණ.

“මොකද අපේ එච්චර කල් කරලා තියෙන්නෙ ටවුමට වෙලා?“

“අර නෑයත්තෙක්ක ගමේ ගිහිං.... ගොයං කැපිල්ලට අහුවෙලා.. ඊට පස්සෙ ආයෙ වපුරලා... ඒ අව් අස්සේ දෙයියන්ගෙ ලෙඩ හැදිලා. ඊටත් පස්සෙ හරකෙක් පස්සෙ දුවලා වැටිලා කකුල කඩාගෙන... ඔය ඔක්කෝටම පස්සෙ තමා ඕං ආපහු ඇවිත් තියෙන්නෙ“

යළිත් රැව් දෙන ඇගේ සිනාව ඉවසිය නුහුණු ඩිංගිරාට දෑතින් දෙකන වසා ගන්නට සිතිණ. එහෙත් බඩවැටියේ ඉන්නා තමා ද සුද්දා ද ඉතා පහසුවෙන් ඇළ දියේ සිටින්නෙකුගේ දෑසට ලක්වන බව දැන හුන් බැවින් අතක් පයක් සොලවා ගන්නට අපොහොසත් විය.

“බොරු අනේ... ඔයා බොරු කියන්නෙ...“

“බොරු නෙමේ.. ඇත්තමයි. ඇත්තටම අපේ කිරියත්තට වෙච්චි දෙයක්. මටත් මතකයි ඉස්සර අපේ කිරියම්මා ඔය කතාව කියනවා. එතකොට කිරියත්තා හීං සීරුවේ මගෑරලා යනවා...“

තවදුරටත් අත්තික්කා ගස දෙස බලා ගත්වනම සිටින්නට ඩිංගිරාට වුවමනා වුවද ඇගේ සිනාවෙන් පසුව කන වැකි හඬින් තිගැස්සුණේය.

“හා ඩිංගිරා... මොකද?“

විජේපාලගේ හඬ ද බැල්ම ද කුලුණුබරය.

ඩිංගිරා ආපසු හැරුණේ අකැමැත්තෙනි.

“හා... මේ... මේ... සුද්දට සනීප නෑ... ගෙඩියක්... හොඳ වෙන්නෙම නෑ...“ යි කියාගන්නට ඔහු සමත් විය.

“කෝ එන්ඩ පිට අතුල්ලන්ඩ“ යි ජයන්ති වහා ඉල්ලා සිටියේ සැමියා ගොපල්ලා සමඟ කතා බහ කිරීම නොඉවසමිනි.

ඇය ඔහුගේ පිට අතුල්ලන අයුරු බලා ඉන්නට ඩිංගිරාට වුවමනා නොවීය. එහෙත් ඉන්ද්‍රජාලයකට යටත් වූවෙකු මෙන් ඔහු බලාගත් වනම සිටියේය.

ඇය විජේපාලගේ ගැහැනිය බව ඒත්තු යාමෙන් ඔහු තුළ හට ගත්තේ මහත් වූ ශෝකයකි. ඊට කෝපය මුසු වන්නට වැඩි වේලාවක් ගත නොවීය.

කෙවිට තරයේ අමෝරා ගත් හෙතෙම ළපටි තණ පතක රසයට ලොබ වූ ගවයා වෙත කඩා පැන්නේය.

ඔහු වැරෙන් හා නොකඩවා එල්ල කරන කෙවිටි පහර වටහාගත නොහැකිව සුද්දා විපිළිසර වූ සෙයකි. තිරිසන් දෙනෙත නැගි වේදනාව නොපෙනෙන තරමට මිනිස් දෙනෙත කඳුළින් පිරී ගියේය.



මෙවර කෙටි කතාව ලියන්නේ රාජ්‍ය සම්මානලාභී ප්‍රවීණ ලේඛිකා ශාන්ති දිසානායකය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි ගම්මානයකට අයත් සේනපුර පදිංචි ඇය යාය හයේ දුටුගැමුණු විද්‍යාලයෙන් සහ කැකිරාව මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූවාය. නවකතා, කෙටිකතා, මෙන්ම තීරු ලිපි රැසක් ද ලියා පළකර ඇති ශාන්ති ලියූ නවකතා අතර පරඬැල්, පුළිඟු, සඳ මඬල, ද්වාර, වරාමල්, වාලුකා, සරුංගල්, හැන්දෑව, වංකගිරිය සහ අංගනා ආදි කෘති වේ. ඇය විසින් ලියන ලද කවිය නුඹ, විය සිඳුර, ගිරිකුළ, එරන්ලන්ඳු, මද්හන, හැන්දෑව ටෙලිනාට්‍යයට නැඟුන අතර රන්ගොල්ලය, සංග්‍රාමය චිත්‍රපටියටද නැඟුණි.

ශාන්ති විසින් ලියන ලද වරාමල් නවකතාවේ අත්පිටපත ඩී. ආර්. විජයවර්ධන සම්මානයෙන් පිදුම් ලැබීය. පසුකාලීනව එම කෘතියම මුද්‍රණයෙන් වූ අතර එය විදේ‍යාදය සම්මානයෙන් ද පිදුම් ලැබීය.

අගනුවරින් බොහෝ දුර මහවැලි කලාපයේ ගොවි ගම්මානයක වෙසෙමින් ඇය මේ දැනුදු සිය නිර්මාණකරණයේ යෙදෙමින් සිටින්නීය.




## කළණ මිතුරාට

කවුරුවත් නොකියවා ඉවත ලූ
මහා පතරංග ජාතක පොත ම
අකුරු නො නසා හොඳින් කියවාන "මගේ"
නුඹ නිසයි ගෙනියන්නෙ ජීවිතේ
අමුණලා දුන් නිසා ශෝධිත ව ජාතකේ..

කන්දක වුණත් ඇතුළතයි ගින්දර
ඇල්ලෙන් වැටෙන්නේ කඳුළුයි"සුන්දර"
ඇල්මක් නැතිවුණොත් හොයන්නට දුක් සැම
පැල්මක් වුණත් ඇති වැනසෙන්න හිත් ගම..

බැල්මක් නුඹේ හිරු කැල්මක් වුණා ගිර මත්තෙම
කුමක්දෝ වරදකින් අතහැරුණු බෝතලේ
බිම වැටී එකම ලේ දසත විසිරුණු වෙලේ
පෑහුනේ නුඹ රුහිරු පන ගන්න තනි වෙලේ
දුවිලිය චෝදනා නුඹේ පය පාමුලේ.

කුසේ සොයුරකු ලෙසේ පොවා කිරි සෙනෙහසේ
පසේ බුදුවන්නටද ගුණේ කරුණා මෙසේ
ගසේ පොතු ලෙස ඇලී පිපුණාට මල් රැසේ
පසේ මුල සවි ද ?, "සැඩ සුළං " කඳ ,බඩ, හිසේ
නුඹෙ කැදැල්ලේ කවුළු පවා සෙලවෙන ලෙසේ...

සැදූ බිඳී හද බිතම නුඹයි බැහැ රූ අඳිනු
ලෙයින් මනසින් ලියමි හද පවුරෙ ගුණ කරුණු
තොසින් තවමත් කැදැල්ලම දකින්නට රිසිළු
නුඹ නෙතට සුව වුණෙද මම දුන්නු දුක් කඳුළු..

මට කියා දුන්නේම හැඩය සතුටේ කඳුළු
"පියඹ මම දකින්නෙද දැන් නුඹේ දුක් කඳුළු ? "

● සෞම්‍ය ලලිත් කළුබෝවිල

## උදුම්බරා

කළු ගල් තලා නෙත් සොයනා පුංචි දුවේ
දුක් ගීයකි නුඹෙ සුසුමන් අඳුරු තලේ
අඳ මට දැස කුමටද මේ මහලු වියේ
කරගැට වැටුණු නුඹෙ දෑතින් ලොවම පෙනේ

පෙම් බස් දොඩ දොඩා දෑඟිලි බැඳි කාලේ
කුළු ගෙඩි පමණි නුඹෙ දෑතේ පැටලූයේ
නුඹෙ මිතුරියන් පති කුලයට යන වේලේ
කළු ගල් තලයි නුඹ කළු ගල් වළ මැද්දේ

නුඹෙ මව සඳක් වී ඇත දුර අහස් ගැබේ
ඒ සඳ මැවූ පින් මල මගේ නුඹයි දුවේ
නෙක නෙක මල් පිපී තිබුණත් මේ ලෝකේ
උදුම්බරා පිපුණේ මගෙ පුංචි පැලේ

● තරුෂි නිම්නදී

## සිතක ඉසිඹුව

සිතක් නම් අරමුණු තනයි
එයින් පැන තවෙකක් සදයි
ගඟක දිය පහරක් වගෙයි
සැලෙන ගිනි සිළුවක් බඳුයි
අසුරු සැණෙකින් සසල වන සිත
පුදුම බලගතු ශක්තියක්...

ක්ෂණයකින් දුර ගමන් යයි
තට්ට තනියම සැරිසරයි
සතර ආසව මෝර මෝරා
ප්‍රභාෂ්වර සිත අඳුරු වෙයි...

හිරෝෂීමා අදත් වැළපෙන්නේ
නාසි කඳවුරෙ පුළුටු ගඳ එන්නේ
රන් දෙවොල අස දෙවිඳු ඉකි බින්දේ
යාල් පානමෙ අකුරු කෙත දැවුණේ

කුළු හරක් සිත බාණ කැඩූ හින්දයි
මඩ වතුර පිරුණම විලේ
පතුල පැහැදිලි නෑ
නීල කැටයක් වගේ නම් සිත
ගැඹුර විනිවිද පෙනෙත්මැයි...

පියුම් ගැඹකින් නොඉපදී
සියුම් ලෙස දින දින වැඩී
නෙළුම් පත මත පිනි බිඳක් සේ
දිදුලවන්නට සිතට හැකි නම්
සසර ඉසිඹුව එතැනමයි

● විනීතා බී. අබේවික්‍රම

## විප්ලවවාදියකුගේ බිරිඳ

නිමිත්ත:
මියගිය වාමාංශිකයෙකුගේ බිරිඳ
උන්මාදයෙන් හැසිරෙන්නට විය...
හිමින් බිමින් තියන්න
ඔන්න ඔය ඔතනින්
ළමයිනේ
මහත්තයා කැමති නෑ
සාලේ තනියම නිදාගන්න...

මොකටද මේ ෆ්‍රෙෂ් මල්
මට මතක නැනේ
ඇනවසරිද? අද අපේවත් ද?
මගෙ හිතේ මංගල දිනේ...

දරුවන්ගේ ඉගෙනුමට
සවුක්කය තත්ත්වය ට
සලකනවා මදිලු කියන්නේ
මටනං නෑ ඔය මගුල්
දැනෙන්නේ
වතුර ටැංකියක උස
කවුද?
මයේ මිනිහට නගින්න කීවේ...

මාසේ පඩියට කවදාවත්
මං උඹව නෑ සැක කෙරුවේ
පක්සේ ළමයිනුත් ඇවිදින්
අදනම් මං බෑ කියන්නේ...

හංදියට අලුත් ෆිල්ම් එකක් ඇවිදින්
හයයි තිහේ ෂෝ එක
ඔය ඇඳුම හොඳා උඹ එනවද සෝමේ
අදත් අතේ පිච්චිය නෑ වගේ ඒකනේ
ඔහොම ඉන්නේ

● නදූෂ මදුරංග

## පුතු

'හිරු ලොවට උදාවෙයි'
නුඹෙ සිනහවත් සමඟ
සුදු රෝස මල් පිපෙයි
නුඹේ සුවඳත් සමඟ...
සිනිඳු නුඹෙ තෙපුල් මට...

රෝස මල් පෙති සේම
නුඹේ ඔය නෙතු සඟල
මට වටී මිණි සේම
නුඹ යනෙන මඟ දිගට...

මල් පිපෙයි හැමදාම
'පුතුනි' නුඹ මගෙ ලොවේ
මිණි පහන හැමදාම

● චන්ද්‍රා ලියනගේ

## දෙවියන්

අන්ධකාර උමඟක දෙපස වැසූ
ලාටුගා වැල්ඩින් කළ ලෙන් දොරක
කෙසේ සිදුරුවී දැයි නොදත්
කුඩා විය සිදුරකින් ගලන එළියක්

● සංජය ප්‍රියදර්ශන

## අන්තිම කැමති පත්තරේ

ගුණ නැණ බෙලෙන් යුතු
පුතුන් අද නැත
එයින් සසලයි මගෙ සිත
පන්සලට ලියන්නත්
සිතක් නැත
පන්සලෙත් හිමිකමට
නඩු ඇත
පින් මද පුතුන් එමට ඇත
කාට කෙසේ ලියන්නද
මගේ,
අන්තිම කැමති පත්තරේ

● දයානන්ද පොන්නම්පෙරුම

**මුහුණු පොතෙන් කවියක්**

## හිඩැස

පියරු තැවරූ
හතරැස් තනිරුල් කොළ...
පැවරුම් පොත් මැදිකර
ඉඳහිට හුවමාරු වුණු..

ඉවසීමෙන් උත්තර
පමා වෙනකොට
තනියම අඬපු...
උන් අද පවුල්රහ කර
කන හැටි
දකිනකොට...

දුරකථනයක් කළ හදි
ජේනවා දික්කසාද
පෝලිම් පිරෙනකොට.....

● ලලී සමරු සමරක්කොඩි

## සිත්තරාගේ ප්‍රේමය

සරසන්න නම් පාට මහ ගොඩයි පපුතුරේ
මැකිය හැකි වෙද පාට ගා තදින් ඇඳිඉරේ
දිය සායමෙන් ඇන්ද ධවල පැහැ සිත්තරේ
තිබුණේම මතකයයි උඹ දීපු ගින්දරේ

කියාපන් මට වඩා කොයිද වැඩි උණුහුමක්
නිවුණු සිත ළඟදි මගෙ වීද මදි පාඩුවක්
දිලි දිලි නිවුණාට තරුවෙ නෑ රස්නයක්
ආන් අර බලාපන් සිඳීගිය පියපතක්

මුරුගසන් වරුසාවෙ තෙමී හිටියත් නිතර
රැඳුණෙ නෑ දිය බිඳක් සියපතේ පත් අතර
තෙමෙන විට හිත පුරා ප්‍රේම වරුසා අතර
තිබුණාද රැකවරණ කැට කැබලි වදිනතුර

නිරාමිස සුව විඳිමි පාට ගා උඹෙ රුවේ
නෑ හිතක් ගරහන්න වින්ද සුන්දර සුවේ
අරවින්ද නොවේ මා බතිගේ පෙම් කවේ
තනිකමත් සුන්දරම විඳීමක් මේ ලොවේ

● තුෂාරි ජයසිංහ

## මගේ ගම

හිරු රැස් වැටී කෙත් යායම දිලෙන විට
සමනල රැන නටමින් යයි සතර වට
සියොතුන් ගී නාද රැව් දී ගයන විට
මගෙ ගම් පියස සුර විමනක් ලෙසය මට

පන්සල දෙසින් ඇසෙනා සණ්ටා නාදේ
දෙසවන් අබිබවා බොහො ඈතට වීදේ
ඈතින් පෙනෙන සමනල කඳු සිරි පාදේ
වැඳ සිහි කරමි ගෞතම මුණිඳුන් කීදේ

පෙනෙනා වෙහෙර තුරු වදුලට ඉහළ දෙසින්
මනරම් දසුන් මවමින් සිත තබයි තොසින්
පන්සල වෙතට යන බැතිමත් දනන් විසින්
සෙත සලසයි ගමට උවදුරු නසන ලෙසින්

ළා නිල්පාට කෙත් වතු හැම සරු සාරයි
පෙර දිග අහස කඳු පේළිය මනහාරයි
ළඟ එන කන්නයට අටු කොටු සරු සාරයි
මගෙ ගම් පියස පත්තිනි අම්මට බාරයි

● නන්දිසේන මුහන්දිරම්ගේ

## ප්‍රේමයෙන් නිවීම

එය අසම්මත අහසක්
තිබුණේ නෑ කිසි නිනව්වක්
මම... කඩාගෙන වැටුණු,
තරුවක්
නුඹ හඬන්නට ඇති
වරුවක්...

සමුගන්න කථාවක්
දැනගෙනම පෙම් කළා
වතාවක්,
ඒක ලස්සන හීනයක්
හිතවතිය, මේත් එක
ප්‍රේමයක්....

නික්ම යන්නට මොහොතක්
දෙන්ට ඇහැකිද හාදුවක්
තවත් එක ඇරඹුමක්
දෙන්ට නෑ ඉතිරිව කිසිත්
තියා යමි මං, නුඹ ළඟින්
ලියපු කවියක පේළියක්...

● නිශාන්ත දසනායක

## පෙළපත

වකුටු වූ අත් දෙපා දිග හැර
ඇරඹුවෙමි ගමනක් වෙහෙසකර
පෙකණිවැල මට ඉතින් අවසර
බිලිඳියක දුටු තිඹිරි ගෙයි ඉර..
.
ලද ද උණුසුම් තුරුලෙ මවු සුව
කිමද නොපහත් මුහුණු මුමුනන
නොවූ සැටි පුත් කුමර බිලිඳකු
රැගෙන යන්නට අපේ පෙළපත..
.
ඇයිද නැයිනි නුඹේ පෙළපත
අරන් ආවෙ ද තබා හිස මත
බරින් මිරිකී නොරිදුනෙ ද ගත
පවරනුද බර අන් කෙනෙකු වෙත...

සිනාසෙනු, දැක බිලිඳියක වත
මුදා පෙළපත් බරින් පුහු හිස
නගා සිටුවනු දිනෙක හැකිනම්
දෙපා යට වැතිරුණු මිනිස්කම..

● මාලා විජේකෝන්

## නිවැරැදි කර නැත

සුළඟ
අහසේ දැවටී
මඳහස පාමින්
ඈතින් ඈතට
ඉගිළ ගියා

අතු අග දැවටී
ඉගි බිඟි පාමින්
කොළමල් හලමින්
විසිර ගියා...

වරකට සුමුදුයි
වරකට නපුරුයි
එනමුත් නැතිවම
බැරි දෙයකි..
.
නැවතුන තැනකින්
ආපසු එනු මැන
මුලටම ඇදෙමින්
අහසේ ලෙළදෙනු
දකිනු රිසින්...

හැමදෙන
හැම දෙය
පවතින්නට නම්
ඔබ, අප අතර ම
විසිය යුතුයි...

● රාජා හේමන්ත පින්නවල

## විදෙස් කවිය

## නිහඬතාවේ කුමන්ත්‍රණය

රාත්‍රිය නිදිබරය,
කවුරුන් නමුදු
පිවිස ඇත හදමැදුරට රහසින්
සිහින සොරකම් කරනු උදෙසා-
සිහින සොරකමය
බිහිසුණුම අපරාධය.
සොරුන්ගේ පා සටහන්
රැඳී ඇති නමුදු
සෑම වීදියකම
සෑම නුවරකම
සෑම රටකම
කිසිදු ඇසකට හසු නොවේ ඒවා,
කිසිවකුද නැත බියපත්ව.
විටෙක හඬ නගයි හුදෙකලා කවක් පමණක්
බල්ලකු මෙන්, දම්වැලක බැඳ ඇති.
(පන්ජාබ් ජාතික කිවිඳියක වූ අම්රිතා ප්‍රිතම් විසින් රචිත කාව්‍ය නිර්මාණයක් ඇසුරිනි)

**අම්රිතා ප්‍රිතම් (1919 - 2005)**

පන්ජාබ් හා හින්දි භාෂාවලින් නිර්මාණකරණයේ යෙදුණු කිවිඳියක, නවකතා රචිකාවක හා විචාරිකාවක ලෙස ප්‍රකටව සිටි අම්රිතා ප්‍රිතම් කාව්‍ය නිර්මාණ හා ප්‍රබන්ධ කෘති රැසක් ලියා පළකර ඇත. ඉන්දියාවේ සාහිත්‍ය ඇකඩමි සම්මානය හා භාරතීය ඥාන්පිත් සම්මානය ඇතුළු ජාතික හා ජාත්‍යන්තර ඇගයීම් ප්‍රණාම රැසකින් පිදුම් ලබා ඇති ඇය රසික විචාරක අවධානය ඉහළින්ම දිනාගත් ප්‍රථම පන්ජාබ් කිවිඳිය මෙන්ම පන්ජාබි බසින් කාව්‍යකරණයේ යෙදුණු 20 වැනි සියවසේ ප්‍රමුඛතම කිවිඳිය ලෙසද සැලකෙයි. ඇගේ නිර්මාණ රැසක් වෙනත් ඉන්දියානු භාෂාවලට මෙන්ම ලොව පුරා වෙනත් විවිධ භාෂාවලටද පරිවර්තනය වී ඇත.

● අජිත් නිශාන්ත

## අම්මා එනවැති හන්දියේ

පොතානේ මහ වත්තියේ කටු ලන්ද පීරුවේ අපි නිසයි
හුරුල්ලේ දෙව් නොබල හිටියේ මන්ද තාමත් මට සැකයි
හිමේ පීරල බැද්ද වපුරල ගත්තේ දහඩිය විතරමයි
ලෙඩ ඇදට අප්පච්චි වී ගෙව්නෙ පුරහඳවල් දෙකයි..

අමාවකේ රුදු තිත්ත කළුවර බැද්ද අවටින් බැල්මවැටිලා
මිදුල මැද්දේ රැට දැල්වුණු පහන්පැල ඇත අඳුරුවීල
පැලේ කළුවර පිලෙන් මෙපිටට වැද්ද නොගනිම් කියලා
දෙතනේ වෑහෙන කිරිත් අරගෙන අම්ම අද කුලියට ගියා...

තවම ඉදුලක් කටගාල නැති මල්ලි කිරි ඉල්ලා අඬන්නේ
ගලෙන් පැන ආ ඇතින්නිය ගැන කෙලෙස නැළවිලි ගී ගයන්නේ
ඊයේ මැදියම් යාමේ ඇවිදින් ගමේ පනකෙදී දෙකක් ගත්තේ
වැවෙන් එගොඩහ ඉහත්තාවෙන් තවම අලි පුසුබයි හමන්නේ...

උදැසන කිරි කොක්කු රැනට සුදෝ සුදු පැහැ නැතිව බැහැ
කිරට යනවිට මල්ලි රැකගෙන ගෙදර ඉන්නට කෙනෙක් නැ
කිරිත් අරගෙන ගෙදර එනවිට කොක්කු රැනේ ගිහින් බහැ
කන කොකෙකු තටු සලා ගියබව දුටුව කාටත් නුහුරු නැ ...

දවසේ ගොම්මන් යාමයට පෙති හැලුව මල්ගහ මුදුණතේ
රැට දැන් දැන් උලලෙන් හඬ මොකද මන්දා හීතලේ
නැරපෝයට මෝදුවී හද රන්දනා සේ ආකාහේ
හැම දුක්කඳ නිවාලන අපේ අම්ම එනවැති හන්දියේ...

● විශ්ව චමෝද්

## විඳිම් සොබාදම් අසිරිය

වනවදුල තුළ සැරිසරන විට නැවුම් දිනයක සිසිල කැටිකොට
තුරු ලතා පත් සැලෙන රිද්මය දැනෙයි, හදවත අවදි කෙරුමට
සිසිල දනවන, නිසල වන පෙත පැතිර ගිය තුරු ලතා වටකොට
උදැසන හිරු කුමරු හිනැහෙයි, පවන් රැල්ලක සිසිලමැදිකොට

සැලෙන සුළඟට සුමුදු කෙහෙරැලි, සසල වි සැමතැනම යනවිට
ගැඹුරු සුසුමක් හදින් පිටවි, සෝ සුසුම් පා වේවි ඉවතට
කුරුල්ලන් හඬ නගන රිද්මය, උදැසන සිත අවදි කෙරුමට
ඔවුන් ආසිරි ගීත තෙපලයි, බිඳුණු හදවත් සනස වන්නට

මුළු ලොවම එළි පෙහෙළි කරමින්, හිරු කුමරු දිලෙනව නිලඹර
සුවඳ මල් පිබිදිලා සැමතැන, පරිසරය විය නිබඳ පැහැසර
බලා සිටිනෙමි, මලින් මල රොන් උරන මී මැස්සන්ගෙ කඩිසර
මෙවැනි සුන්දර සොබා දම් සිරි විඳින්නට අප ඇතිය පින්කර

සිඳු තුරුල රළ නැගෙන හඬ මැද ළමුන් දුව පැන ගීත ගයමින
සැදැ අඳුරෙහි සිරිය වැඩිකොට පරිසරය ගීතවත් කරමින
ඈත අහසෙහි සුදු කොකුන් රළ පියඹා යයි පවන් සලමින
බලා සිටිනෙමි හිරු බසින සැටි ලෝ දහම ගැන පසක් කරමින

● තක්ෂලා සේරසිංහ

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න**
**කවි සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10.**
**විද්‍යුත් තැපෑල - *edmediaunit@gmail.com***

## සතියේ කවිපොත


**කෘතිය- දළ පුට්ටුවාගේ ආත්ම කථනය**
**කර්තෘ- බණ්ඩාර ඇහැළියගොඩ**
**මිල රුපියල් - 300 පිටු 97**
**විමසීම් - 077 7486482**
**සන්ථව ප්‍රකාශනයකි**

මෙවර සතියේ කවි පොත ලෙස ඔබට ඉදිරිපත් කරන්නේ ප්‍රවීණ ගීපද රචක, මාධ්‍යවේදී බණ්ඩාර ඇහැලියගොඩ විසින් රචිත දළ පුට්ටුවාගේ ආත්ම කථනය කාව්‍ය සංග්‍රහයයි.

කවියෙකු ලෙසින් ලේඛන කාර්යයට පිවිසි ඔහු අද වන විට විවිධ ඉසව් ඔස්සේ තම දක්ෂතා පෙන්නුම් කර ඇත. සිවුපදයට මුල් තැන දෙමින් රටේ බොහෝ ජනප්‍රිය චරිත, සාහිත්‍යධරයින් ආදි සුවිශේෂි වූ පුද්ගලයන් තේමා කොට ගනිමින් ලියැවුණ සඳැස් කවි අපට මෙම කාව්‍ය සංග්‍රහයේදී හමුවේ.

අලි ඇත්තු පිළිබඳ මිනිස්සුන්ගේ ඇති ඇල්ම කිසිදා නැති නොවන්නකි. එමෙන්ම අලි මිනිස් ගැටුම ද නිමා නොවන්නකි.

කොහොම වුණත් ගෙවුණ කාලයේදී කාගෙත් කතා බහට ලක් වූ දළ පූට්ටුවාගේ කතාව හද සසල කරන්නකි. දළ පූට්ටුවාගේ මරණය පමණක් නොව ගෙවුණ කාලයේ ඇත්තුන්ට සිදු වූ ඛේදවාචක නිමක් නැත සමස්ත අලි ඇතුන් නියෝජනය කරමින් දළ පූට්ටුවා කියන්නේ ඒ කතාවයි. මිනිසුන් විසින් කැලේ සද්ධන්තයා විනාශ කිරිම, උන්ට ඇති බිම් වනසා දැමීම ගැන කියන අතරේම කවියා මේ පවතින ඛේදවාචකය ගැන අවසානයේ සඳහන් කරන්නේ උපාහාසයෙනි.ඒ උපහාසය යට කරමින් මතුවන්නේ දුකකි, තැවුලකි. මාතෘකාව දළ පුට්ටුවාගේ මරණය.





බණ්ඩාර ඇහැළියගොඩ

**ගේ දොර තනා යන මං අවුරා දමති**
**එවමින් යකඩ යකු නෑ පිරිවර මරති**
**කුම්බස්තල දෙබෑවන ලෙස ගිනි බිඳිති**
**ගජමුතු සොයා අමු අමුවෙම දළ කපති**

**ඒ දළ කපාගෙන යන්නේ මිනිසුන්ය**
**රඳවා තබන්නේ මිනියක දෙපසින්ය**
**මා මිය ගිය පසුත් කෙරුවේ අවමන්ය**
**මළ කළ තැබිය යුත්තේ ගව අංය**

මිනිස්සු පවතින ආර්ථික රටාවත් සමඟ හැල්මේ දුවති. පවුලක් ලෙස එකට එක්වී කෑම ගන්නටවත් වෙලාවක් නැත. එක් එක් කෙනා නිවෙසට එන්නේ එක එක වෙලාවටය. දරුවෝ මවුපියෝ පවුලක් ලෙසට එකට එක්වී සිටින්නට කාලය හරස් වී ඇත.

නමුදු ලොවටම වයිරසයක් වූ කොරෝනා අපේ රටට යම් අයුරකින් ආශිර්වාදයක් වූ සෙයකි. ඉවක් බවක් නැතිව ඉබාගාතේ දිවූ ජීවිත වලට තම පවුල දරුවන් ඥාතින් සමඟ එකට ඉන්නට විවේකයක් ලැබුණාක් වැනිය.

කොරෝනා වයිරසය හේතුවෙන්ම ලෝකය වෙනස් වූ අයුරු, මිනිසුන්ගේ සිතුම් පැතුම් ආකල්ප වෙනස් මඟක් ගත් අයුරු පමණක් නොව පවුලක් ලෙස එකට ඉන්නට ලැබීම ගැන කවියා පවසන්නේ සතුටෙනි. මරණයේ වේදනාව භීතිය, වයිරසය පැතිරීමේ අවදානම මේ සියල්ල අතරේ ලැබූ ආශිර්වාදයක් ලෙස ජීවිතය අලුත් වීමක් ලෙස "කොරෝනා" දකින කවියා මෙසේ ලියයි. මාතෘකාව කෝවිඩ් දහනවය.

**හිටියත් වෙන්ව මීටරයක් දුර ඈත**
**වෙනදට වඩා හිත ඇතුළෙන් ළඟපාත**
**ළංවී හිදී දරු පැටවුන් සහජාත**
**කොවිඩ් වුණත් එක අතකින් නරක නැත**

පසුගියා වියේ වූ මාධ්‍ය ලෝකයේ දැවැන්තයකු වූ ඇවිදින පුස්තකාලයක් බඳු එඩ්වින් ආරියදාසයන් ගැන කවියා මෙසේ ලියන්නේය.

**ලොව තතු ඇතැඹුලක් සේ එක මිටට ගෙන**
**සැකයක් බියක්නොමැතිව දිග හරින තැන**
**ඇස් කන් යොමාගෙන පසුවෙති සියලු දෙන**
**ආඩම්බරයි ඔබ වැනි ලක් පුතෙකු ගැන**

බණ්ඩාර ඇහැළියගොඩයන් ගේ දළ පූට්ටුවාගේ ආත්මකථනය කාව්‍ය සංග්‍රහයේ ජනප්‍රිය කලාකරුවන් මියගිය යුග පුරුෂයන් මෙන්ම තවත් බොහො දෙනා අපට හමුවේ.

කවියෙකුට කවි ලිවීම සැනසිල්ලකි. ඔහු ගී පද රචකයකු වුවද වඩාත් ඇලුම් කරන්නේ ගීතයට වඩා කවියට යැයි මේ පොත කියවන විට අපට හැඟේ. ඔහු සිය කාව්‍ය සංග්‍රහයේ පෙරවදන ලියන්නේ ද කවියෙනි.

**සිය ගණනකට වැඩියෙන් මා ලියන ලද**
**සමුදුරු ගොස් විරිත ඇතුළත් හතර පද**
**තැන තැන තිබිණි මම ඒවා එකට බැඳ**
**මේ පොත පළකරමි කියවා බලනවද**

# ඇසුර


මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

## විශිෂ්ටයකුගේ ආත්ම කථනය

කෘතිය-විශිෂ්ටයි ක්‍රිශ්ටොෆ්
පරිවර්තක- දිලීප ජයකොඩි
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රකාශනයකි
මිල රු. 700
විමසීම 077 114 3324



දිලීප ජයකොඩි




"චිත්‍රපටයක් සෑදීම යනු සැමදාම හිමිදිරි පාන්දර හයටවත් පිබිදීම සිදු වීම යි. සීතල විඳ ගැනීම යි. මඩ පිරී පොළවේ ඇවිදගෙන යාම යි. වර්ෂාවේ තෙත බරිත වීම යි. එය සිරුරේ සෑම ස්නායුවක් ම ප්‍රකම්පනයට පත් කරන්නකි. එක්තරා අවස්ථාවක දී එය ඔබේ ජීවිතයේ ප්‍රමුඛත ම කාර්යය බවට පත් වේ. අන් සියල්ල පැමිණෙන්නේ ඉන් පසුව ය. ඔබේ පවුල පවා, හැඟීම් පවා ඔබේ පුද්ගලික ජීවිතය පවා..... මේ කතාව දුම්රිය රියදුරන්ට, එසේ නැත්නම් බැංකු කරුවන්ට පවා කිව හැකි කතාවක් බව සැබැවි. ඔවුන් නිවැරැදි වීම් පිළිබඳ සැකයක් ද මට නැත. නමුත් මා ලියන්නේ මා ගැන යි. මම මගේ රැකියාව කරමින්, සමහර විට තවදුරටත් මම මේ රැකියාව නොකෙරිය යුතු බව මට සිතෙ යි. චිත්‍රපට නිර්මාපකයෙකුට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු ඉවසීම නම් ගුණාංගයේ අවසානයට මම පැමිණෙමින් සිටිමි."

කෙනෙකුට සිය චරිතාපදානය විස්තරාත්මක ආඛ්‍යායනයක් ලෙසින් ඉදිරිපත් කළ හැකි ය. ඇතැම්හු එය නිර්මාණාත්මක නවකතා ශෛලියකින් ද ලිවීමට කැමති වෙති. එහෙත් සිය චරිතාවලෝකනය ගැඹුරු අවංකත්වයකින් ඉදිරිපත් කරන්නෙකුගේ ප්‍රකාශයන් අවසන් වන්නේ ආත්ම කථනයක් ලෙසිනි. ඊට හොඳම උදාහරණයක් වන්නේ "විශිෂ්ටයි ක්‍රිශ්ටොෆ්" නමින් ප්‍රකාශිත ක්‍රිශ්ටොෆ් කිසලොව්ස්කි නම් පෝලන්ත සිනමාකරුවාගේ ජීවිත කතාව යි. එය අර කීව නමින් සිංහලට නගන්නේ දිලීප ජයකොඩි ය.

ක්‍රිශ්ටොෆ් සිනමා පාසැලෙන් ඉවත්ව මුලින් ම රජයේ වාර්තා චිත්‍රපට අංශයට සම්බන්ධ වන අතර පසුව ඉන් ඉවත් වෙමින් වෘතාන්ත සිනමා නිර්මාණකරණයට එක් වෙයි. එසේ එකතු වන ඔහු ක්‍රිස්තියානි සංස්කෘතියේ එන දස පනත මෙන් චිත්‍රපට දහයක් නිර්මාණය කිරීම විශේෂත්වයක් වේ.

ඉනුත් "ෂෝට් ෆිල්ම් අබවුට් කිලිං" හා "ෂෝට් ෆිල්ම් අබවුට් ලව්" නම් චිත්‍රපට ද්වය ඔහුට ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලබා දුන්නේ යැයි පැවසෙයි. එමෙන් ම "කලර්ස්" නමින් තුන් ඈඳුතු සිනමා කෘති පෙළක් නිර්මාණ කරන ඔහු ඒ කෘති ත්‍රිත්වය නම් කරන්නේ, "රෙඩ්", "බ්ලූ", හා "වයිට්" යන වර්ණවල නම් වලිනි.

මේ නිර්මාණ හරහා ද මහත් සම්මානනීයත්වයක් ලබා ගන්නා ක්‍රිශ්ටොෆ් පෝලන්ත සිනමාවේ විශිෂ්ට ප්‍රතිරූපයක් බවට ද පත් වේ.

ඔහුගේ මෙම චරිතාපදානය ගැන සලකන විට එය මුලින් කී ආකාරයට ම නිර්ව්‍යාජ ආත්ම කථනයක් ලෙසින් ගැනීම වඩාත් නිවැරැදි වේ. ඊට අදාළව ගත් කල කොමියුනිස්ට් දේශපාලනය හා බැඳුන රාජ්‍ය සමය ගැන පවසන අදහස් ඔහු ජීවත් වූ කාලය හා බැඳුණ ඔහුගේ චර්යාව පිළිබඳව පෙන්වා දෙන කදිම පැහැදිලි කිරීමක් ය.

"කොමියුනිස්ට් පාලන සමයේ දී චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකුට ගත හැකි මං පෙත් තුනක් තිබිණ. පළමුවැන්න නම් චිත්‍රපට නොසාදා ම සිටීම යි. නමුත් අවංකව ම කීවොත් කොමියුනිස්ට් පාලනය නිසා ඉන් බැහැර වුවෙක් ගැන මම නොදනිමි. නමුත් එවැන්නන් සිටීමට පුළුවන. දෙවැන්න නම් ඔවුන්ගේ ආශිර්වාදය ලබන වර්ගයේ චිත්‍රපට සෑදීම යි.

එනම් රුසියාව ගැන, ලෙනින් ගැන, හමුදාව ගැන සම්බන්ධ චිත්‍රපට සෑදීම යි. තෙවැන්න නම් ආදරය, ස්වභාව දහම ආදී දේ ගැන චිත්‍රපට සෑදීම යි. මෙතැන දී මම හතරවෙනි මගකුත් සොයා ගතිමි. මගේ නිර්මාණශීලි පෞරුෂයට සරිලන මගකි. එදා සිනමා පාසැලේදීත් අද ඉන් පිටතදීත් මා ගමන් ගන්නේ ඒ මගේම ය."

ඒත් සමඟම තවත් තැනක දී මෙම අපූර්ව සිනමාකරුවා තමන් සිනමාකරණයේ දී දේශපාලනය ගැන මඳ උනන්දුවක් හෝ නොදැක්වූවා නම් කොතරම් හොඳදැයි සිත යි. තමන් අතින් නිර්මිත කෘතීන් මතට දේශපලනයේ සෙවණැල්ල යාන්තමටවත් නොවැටුණා නම් කොතරම් යහපත් දැයි සිත යි.

බැලූ බැල්මට ම මේ ප්‍රකාශයෙන් හැඟී යන්නේ දේශපාලනය ගැන කලකිරුණු මනස්හි සාමාන්‍යයෙන් ඇතිවන සිතිවිල්ලකැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. නමුත් කෘතිය හොඳින් කියවන්නෙකුට එය තුළ පවත්නා වෙනස් සමාජ කියවීමක් ඔබ හමුවේ මතු වෙනු ඇත.

පරිවර්තන සාහිත්‍ය කලාව කැත සාහිත්‍ය ජාවාරමක් බවට පත්ව ඇති සමයක දිලීප ජයකොඩි වැනි තරුණ සමකාලීන පරිවර්තකයන් මෙවැනි විශිෂ්ටයන්ගේ චරිත කියවීම් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට එක් කිරීම, මෙන්ම ෆාස්ට් පබ්ලිෂින් වැනි ප්‍රකාශන ආයතන එහි ලා මැදිහත්වීම ප්‍රශංසා කටයුතුම ය.


අනිත් අතට මෙවැනි කෘති වෙහෙසකින් තොරව කියවාගෙන යෑමට නම් සරල සුගම මෙන් ම නිර්මාණශීලි බස් වහරක ඇවැසියාව ද වෙසෙසින් මතක් කළ යුත්තකි. මෙම තරුණ පරිවර්තකයා එහි ලා අසමත් නැත. ඔහු තවදුරටත් එහි ලා සමත් වනු ඇතැයි යන විශ්වාසය ද ඒත් සමඟම ඔහු විසින් ම අප තුළ තහවුරු කරනු ලබයි.

## අපේ කාලයේ පත්තරකාරයකුගේ කතාව

කෘතිය - පොදු ජනයාගේ පත්තරකාරයා
කර්තෘ - දෙනගම සිරිවර්ධන
කංචුක නිර්මාණය - ශාන්ත කේ. හේරත්
සරසවි ප්‍රකාශනයකි
මිල රු. 950
දුරකථනය 011 2841 302

"අපේ පුතාට සිවිල් සර්විස් පාස්වෙන එක මහ ලොකු කජ්ජක් නොවෙයි."

පියාගේ වචන නංගි කෙනෙක් දයාසේනට වාර්තා කළා ය. ඒ සතියේම කොළඹ ලේක් හවුසියේ සේවය කරන මිතුරෙක් දයාසේනට හමු විය."



දෙනගම සිරිවර්ධන

ජීවිතයේ ඇතැම් හමුවීම් අනපේක්ෂිත ය. සමහර විට අපේ මුල් කාලයේ අපේක්ෂාවන් කුමන හේතුවක් නිසා හෝ ඒ අනපේක්ෂිත හමුවීම් හමුවේ වෙනස් වෙයි. ඒ වෙනස්වීම් හි යහපත හෝ අයහපත ජීවිතය විසින් ම තීරණය කරනු ලබයි.

"සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ප්‍රධානියා වුයේ එස්මන්ඩ් වික්‍රමසිංහ මහතා ය.

ඔහු ලෝක දේශපාලනය, ලෝක සාහිත්‍යය, අන්තර්ජාතික පුවත්පත් කලාව පිළිබඳව ප්‍රශ්න කළේ ය. ඔහුගේ කෙටි ප්‍රශ්න වලට දයාසේනගෙන් ලැබුණේ දිගු පිළිතුරු ය.

එස්මන්ඩ් සතුටට පත් විය."

දේශපාලනික වශයෙන් කුමන තැනක සිටියත්, එස්මන්ඩ් වික්‍රමසිංහ වැනි කෘතහස්ත පුවත්පත් කලාවේදී ප්‍රවීණයෙකු සතුටට පත් කිරීම පහසු කටයුත්තක් නොවූ පසුබිමක දයාසේන එය සිදු කළේ ය. එය ඔහුගේ දීප්තිමත් අනාගතයක පළමු පියවර විය.

"පොදු ජනයාගේ පත්තකාරයා" මැයෙන් දෙනගම සිරිවර්ධන විසින් ලියන්නට යෙදුණ දයාසේන ගුණසිංහ චරිතාපදානය කතුවරයාට ම අනන්‍ය වූ සරල සුගම එහෙත් අලංකාර බස් වහරකින් ලියවුණක් යැයි කීමෙන් පමණ ඉක්මවා කරුණු කියාපෑමක් නොවේ යැයි සිතමි. යමෙකුගේ චරිතයක් තෝරා ගත්විට එම චරිතයේ ම අත්දැකීම් කියුම් කෙරුම් සිය අපූර්ව, ඇතැම් විට උත්ප්‍රාසාත්මක වුත්, තවත් විටෙක ලයාන්විත වුත්, සැමවිට ම අලංකාරාත්මක වුත් බස් වහරකින් එම චරිතය ප්‍රතිනිර්මාණය කිරීම දෙනගම නිසඟයෙන් ම වාගේ සිදු කරන්නකි. මෙම කෘතියට අදාළව ගත් කළ ඒ වනාහි පුවත්පත් කලාවේදියෙකුගේ සැබෑ හැසිරීම කෙසේ විය යුතුද යන්න දයාසේන ගුණසිංහ චරිතය ඇසුරින් කරුණු ගෙනහැර පෑමක් ද වන්නේ ය.

"ස්වාධීන නිදහස්, සත්‍යවාදී, යුක්තිගරුක වාර්තාකරුවකුට මුදල් නැතිව වුව ද ජීවත් විය හැකි ය. එහෙත් ඒ දින කිපයක් පමණකි. ඔහු මරණයට පත්වනු ඇත. සෘජු ප්‍රතිපත්ති රැක ගනිමින් උත්තම පත්තර කලාවකට සම්බන්ධ වීමට ඔහුට ජීවත්වීමට උදව් කළ යුතු ය."

එම උද්ධෘතය පසුබිමේ පවතින්නේ පොදුවේ ගත් කළ මෙරට ප්‍රවෘත්ති වාර්තාකරුවන් මුහුණ පා සිටින අවම ආර්ථික පැවැත්මේ කතාව යි. ඒ නිසා ම ඔවුන් පවත්වාගෙන යන විෂම කටයුතු, කාලය විසින් තමන්ගෙන් ඉල්ලා සිටින නව ප්‍රවෘත්ති පත්‍ර මෙහෙවරට නොගැළපෙන බව දත් දයාසේන නම් පුවත්පත් කලාවේදියා ඊට විසඳුම් සපයා ගත් ආකාරය එහිදී මැනවින් විස්තර වේ. එවැනි තැන්වල දී මෙම කෘතිය චරිතාපදානයක ස්වභාවය ඉක්මවා යමින් ප්‍රවෘත්ති පත්‍ර කර්තෘවරයෙකුට සුදුසුවන අත්පොතක් බවට ද පත් වෙයි.

"එදා උපාලි විජේවර්ධන දයා සමඟ කතාබහේ යෙදුණේ බොහෝ කාලයක සිට දන්නා හඳුනන අයෙකු මෙනි."

ලේක්හවුසියෙන් එළියට බට දයා ඇතුළු කණ්ඩායමේ ජීවිත වෙනස් ම තැනකට ගොනු වුයේ මෙතැන් සිට යැයි මෙතන දී ඔබට සිතෙන්නට පුළුවන. එහෙත් ඇත්ත වශයෙන්ම එහිදී සිදු වුයේ ලංකාවේ සාම්ප්‍රදායික පුවත්පත් කලාව එකලට පමණක් නොව අදට ද සාපේක්ෂව එය තිබූ තැනින් සොලවා වෙනස් කළා වූ විප්ලවීය යැයි කිව හැකි අන්දමේ වෙනසකි. ඒ වෙනස තුළ බොහෝ තරුණ ජනමාධ්‍යවේදීන් බිහි වී ඒ ආශිර්වාදලත් නියමුවාගේ මඟ පෙන්වීම ලබා අද වන විට ක්ෂේත්‍රයේ ම නියමු කාර්යභාරයන් ඉටු කරමින් සිටිනා ආකාරය දකින විට අපට යළි යළිත් සිහි කැඳවන්නේ ඒ විශිෂ්ට චරිතාපදානයම යි.

"1981 වන විට ලංකාව මත්ද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් වශයෙන් පැවති අයුරු දිවයින මුල් පිටුවේ පළ විය. ඔස්ට්‍රේලියාවටත්, බටහිර රටවලටත් හෂීස් මත්ද්‍රව්‍යය යවන ලංකාවේ දේශපාලන බලවතකු ගැන ද ඒ මඟින් හෙළිදරව් විය."

ඒ අයුරින් පැවති සම්මත ජාතික පුවත්පත් කලාව වෙනස් වූ ඒ අරුණෝදයේ දී, "සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විශේෂ සාකච්ඡාවක් අලුත් පුවත්පතට ලබා දුන්නා ය." "ශ්‍රී ලංකාවේ ඇත්තේ රජයේ දූෂණ හෙළි නොකරන ඊට එරෙහිව පැන මෙහෙය වන්නේ නැති, ලොක්කන්ට පන්දම් අල්ලන පුවත්පත් බව ඇය කීවා ය."

1982 දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ ජේ. ආර්. ජයවර්ධන පුවත්පත් දැන්වීමකින් සිදු කළා වූ "මට රකින්නට තනතුරක් නැත. රකින්නට බූදලයක් නැත....." නම් ප්‍රකාශය මෙරට මැතිවරණ සංස්කෘතියත් සමඟ බැඳී පවතින මහජනතාව නොමඟ යවන දේශපාලන ව්‍යාජය හෙළිදරව් කිරීමට දයාසේන ලියූ සීයාගේ කොලම නම් තීරු ලිපියේ වටිනාකම අද්‍යතන පුවත්පත් කලාව හමුවේ වුව කදිම පූර්වාදර්ශයක් නොවන්නේ ද? සැබෑ පත්‍ර කර්තෘවරයකුට තමන් ජීවත්වන කාලය මගහැර ලිවීම නොකළ හැක්කක් බවත්, එහිලා ඔහුගේ නිරීක්ෂණයේ සංවේදි විචක්ෂණ බව කොතරම් වැදගත් ද යන්නත් ඒ අනුව පැහැදිලි වෙයි.

එහෙත් ඒ කාලය එවැනි කාර්යයන්ට කොහෙත්ම හිතකර සමයක් නොවී ය. එය පුවත් වාරණයේ මෙන්ම මාධ්‍ය කතුවරුන්ට තර්ජනය කිරීමේ නරකම කාල වකවානුවක් වූයේ ය. ජනාධිපති ජේ ආර්. ජයවර්ධන උපාලි පුවත්පත් සමාගමේ සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා සිය නිවසට කැඳවා මෙසේ පැවසී ය.


"දිවයින අපට පහර දෙනවා වැඩියි. කතුවැකි, තීරු ලිපි, කාටුන් සහ ලිපි වලින් අපට ගහනවා. ඒවාට පිළිතුරු දෙන්න අපට සිදු වෙනවා. අපි පිළිතුරු දෙන්නේ කතුවැකි වලින්, තීරු ලිපි වලින්, කාටුන් වලින් නොවෙයි. මා ඔබ කැඳෙව්වේ පරිස්සම් වෙන්න කියන්න යි."

ප්‍රංශයේ පාලකයකු වූ චාල්ස් ඩිගෝල්ගේ ඒකාධිපති වියරුව හමුවේ ෂං පෝල් සාත්‍රෙ පැවසුවේ සීතල කාමරවල සිටිමින් විරෝධතා පැවැත්වීම නිෂ්ඵල කටයුත්තක් බව යි. ඒ වෙනුවෙන් මිනිසුන් අතරට යෑම අවශ්‍යම බව යි. ප්‍රවෘත්ති පත්‍ර කලාවට අදාළව දයාසේන ගුණසිංහයන් සිදු කළේ ද එවැනි ම දෙයකි. ඔහු අතින් නිර්මාණය වුයේ එවැනි වෙනසකි. දෙනගම සිරිවර්ධන ඉතා සුදුසු ලෙසින් දයාසේන සම්බන්ධයෙන් දක්වන ඔහු ලියූ දෑ හි උද්ධෘත කෘතිය පුරා ම විහිදී තිබේ. එය එම කෘතියේ අන්තර්ගතය සනාථ හා පෝෂණය කරන ආකාරයෙන් දක්වා තිබීම ද විශේෂයෙන්ම සඳහන් කළ යුත්තකි. නිදසුනක් ලෙස පහත දැක්වෙන උද්ධෘතය පෙන්වා දිය හැකි ය.

"පුවත්පත් කලාවේදියා අනිවාර්යෙන් ම සාහිත්‍යකරුවකු විය යුතු නොවෙතත් එසේ වීම පුවත්පත් කලාවේ සජීවි පැවැත්මට හිතකර වෙයි. එපමණක් නොව පුවත්පත් කලාවේදියාගේ යහ පැවැත්මට ද හේතු වෙයි.

මක්නිසාද යත් පුවත්පත් කලාවේ දොර වැසී ගිය ද ජනතාව දැනුම්වත් කිරීමේ උතුම් මෙහෙවර අඛණ්ඩව කරගෙන යාමට එමඟින් ඔහුට හැකිවන බැවිනි. පුවත්පත් කලාවේ පැන ඔහුගෙන් උදුරාගනු ලැබුව ද සාහිත්‍යයේ පැන ඔහු අත ඉතිරි වන හෙයිනි."

-එය දයාසේන ගුණසිංහයන්ගේ ජීවිත යෙන්ම ලබා ගත් උද්ධෘතයක් වෙයි.






## මිනිසුන්ගේ ජීවන සංවේදිතාවන්ට වයස් සීමාවක් පනවන්න පුළුවන් ද?

### තිලක් සේනාසිංහ

**දසක හතරක් තිස්සේ පූර්ණකාලීනව මාධ්‍ය ක්ෂේත්‍රය නියැළී සිටින තිලක් සේනාසිංහයන් වඩාත් නැඹුරුවක් දක්වන්නේ "ජන විශ්වාස හා ගුප්ත විශ්වාස" පිළිබඳ ගවේෂණාත්මක මාධ්‍යකරණයටය. මේ ඇසුරෙන් පොත පත ගණනාවක් ලියා පළකර ඇති ඔහුගේ නවතම කෘතිය වන්නේ "ජ්‍යෝෂ්ඨ පුරවැසියකුගේ ප්‍රේමකතාවයි".**

**ජ්‍යෝෂ්ඨ පුරවැසියෙකුගේ ප්‍රේමය නම්වූ මේ නවකතාවට අත්දැකීම වන්නේ කුමක්ද?**

ඒක මගේ පෞද්ගලික අත්දැකීමකට වඩා මට ලැබුණ අනුභූතියක් යැයි කියන්න පුළුවන්. මුලින් ම මෙහි එන ප්‍රධාන චරිතය මට හමු වන්නේ මා සේවය කළ පුවත්පතේ යම් කටයුත්තකට අනුරාධපුරයට ගොස් සිටිය දී යි.


සුදු වතින් සැරසී සිටි මේ සැට වයස් පසු කළ මේ මිනිසා මා දුටුවන ම පැකිළීමකින් තොරව කතා කිරීම මට පුදුමයක් වුණා. කොහොම හරි අපි හිතවත් වුණා. ඔහු කිව්වා දිගු කාලයක් තිස්සේ තමන් පදිංචිව සිටියේ ස්කැන්ඩිනේවියානු රටකය කියලා. මේ වන විට දරු මල්ලන් ද ලොකු මහත් කරලා බිරිඳටත් සාධාරණය ඉටුවන අයුරින් කටයුතු කරලා තමයි ලංකාවට ඇවිල්ලා හිටියේ. ඒ ඇයි කියල ඇහුවම ඔහු කියනවා ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා අතින් ඉහල ම සුබ විහරනයක් තිබුණ රටක තමන් සිටියත්, කුමක් හෝ අඩුපාඩුවක් තමන්ට දැනුණ බව යි.

ඒත් මේ කතාවේ අවසානය සිදු වෙන්නේ මා නොසිතූ විදිහට යි. අනුරාධපුර ප්‍රදේශයේ අවසාන සීමාවේ වනාන්තර රක්ෂිතයක් අසල වූ පැරණි නිවසක තමයි දෙවන වරට මේ පුද්ගලයාව මට හමු වෙන්නෙ. ඒ වගේ ම එතන දී තවත් චරිතයක් මට හමු වෙනවා.

ඒ ඔහුට වඩා අවුරුදු තිහකට තිස් පහකට වඩා වයසින් බාල කාන්තාවක්. ඔහුත් එදා වගේ සුදුවතින් සැරසිලා සිටියේ නෑ. මට මතක විදිහට බතික් සරමක්, කමිසයක් වගේ ඇඳුමකින් සැරසිලා සිටියේ. කාන්තාව හැසිරුණේත්, ගෙදර ස්වාමි දුව වගේ යැයි මට සිතුණා. ඔහුගේ මේ අලුත් වෙනස මම මගේ පරිකල්පනයෙන් නවකතාවක් බවට පෙරළුවා. ඒක තමයි "ජ්‍යෝෂ්ඨ පුරවැසියෙකුගේ ප්‍රේමය."

**ඔබ මේ කතාවෙන් කියන්න හැදුවේ කුමක්ද?**

මෙ කතා කරන අද දවසේත් මම දුටුවා සමාජ වෙබ් ජාලා අඩවියේ අවුරුදු 62 ක් වයසැති මිනිසෙක් තමන්ට වඩා අවුරුදු 40 කින් බාල කාන්තාවක සමඟ විවාහ වී සිටින පුවතක් පළ කරලා තියෙනවා. ඒ ගැන විවිධ අය විවිධ විදිහට අදහස් ප්‍රකාශ කර තිබුණා. ඒ බොහෝමයක් අදහස් හරිම සීමාන්තික යි.




තමන්ගේ මානසික විකෘතිතා එහෙම අදහස් ප්‍රකාශ කරලා තෘප්තිමත් කර ගනනවා ද කියලත් ඒවා කියවද් දි හිතෙනවා. මේකට කියන්නේ නීච කුතුහලය කියලා. මේ ඇවිල්ලා සැඟවුණ සෙවීමක්. යතුරු හිලෙන් බැලීමක්ය කියල කියන්න පුළුවන්. එහෙම නැතුව යහපත් නිරීක්ෂණයක් නෙවෙයි.

ගෙවල්වල නිදන කාමර එහෙම නැත්නම් නාන කාමරවල සාපරාධී අපරාධයක් වැනි දෙයක් සිදු වුණොත් එතන ප්‍රවෘත්ති වටිනාකමක් තියෙනවා. එහෙම නැතුව මෙවැනි මානුෂීය තත්ව ගැන තමන්ට හිතෙන හිතෙන විදිහට අදහස් පැවසීම හොඳ දෙයක් නෙවෙ යි.

අනිත්තෙක තමයි මිනිසුන්ගේ වයස්ගත වීම පිළිබඳ අපේ රටේ අය දක්වන අවිචාරී හැඟිම. තමන්ගේ දෙමවුපියන් ගැන පවා ඇතැම් දරුවන් හිතන විදිහ හරි අවලස්සන යි.

මේ නවකතාවෙන් මට ඕන වුණේ මෙන්න මේ සමාජ හැසිරීම ගැන කතා කරන්න යි. සමාජයක මනුෂ්‍ය සංවේදීතාවන් කියන හැඟීම්වලට වයස් සීමාවක් තියෙන්න බැහැනේ.

වයස් සීමාවකින් තොරව සෑම අයෙකුට ම අයිතියක් තියෙනවා අනෙකාට හිංසනයක් නොවන අන්දමින් තමන්ගේ සාධාරණ මනුෂ්‍ය හැඟිම භුක්ති විඳින්න.

**අද අපේ සාහිත්‍යයේ නවකතා ලිවීම ඉතාම ජනප්‍රියයි. මේ ජනප්‍රියකමට නවකතා වලට සම්මාන ප්‍රදානයත් මේ සඳහා හේතු වෙලා තියෙනවා. මේ ගැන ඔබේ අදහස?**

සම්මාන ලබපු ඇතැම් නවකතා මම කියවලා තියෙනවා. විශේෂත්වයක් හැටියට මා ඒවායින් අත් වින්දේ ඒවා කියවන්න කොයි තරම් අපහසු ද කියන එක යි.

යම් කතාවක් එක හුස්මට කියවාගෙන යන්න බැරි නම් මට නම් ඒක ලොකු ප්‍රශ්නයක්. ඒක කොයි තරම් අති උත්තම කතාවක් වුණත් වැඩක් නැනෙ ඒක කියවන්න පාඨකයෙක් පෙලඹෙන්නෙ නැත්නම්.

මගේ මේ නවකතාව ඉතා උසස් කෘතියක් යැයි කියන්න මම උත්සාහ කරනවා නෙවෙයි.

ඒත් මේ ගැන අදහස් දක්වමින් මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර කියූ දේ තමයි, "මේ නවකතාවේ තියෙන විශේෂත්වය තමයි එක හුස්මට කියවාගෙන යන්න පුළුවන් වීමය කියන එක." කොහොම නමුත් මට හිතෙනවා මං මේ කරලා තියෙන්නේ කම්මලක ඉඳගෙන රන් භාණ්ඩයක් හැඩ වැඩ කරනවා වගේ වැඩක්ය කියලා. නමුත් මට අවශ්‍ය වුණා මේ අත්දැකීම ගැන කියන්න.

ඒකට මම නවකතාව මාධ්‍යයක් හැටියට යොදා ගත්තා. ඒ සඳහා සම්මාන ලැබෙයි ද නැද්ද ඒ වගේ දේවල් මට වැදගත් නෑ.

**මීට පෙර ඔබ විවිධ පොත පත ලියා තිබෙනවා ඒ කෘති ලිවීමට හේතුව පැහැදිලි කළොත්?**


අද අපේ මේ සමාජයේ ම ඉන්නවා හොර වෙදුන්ය කියල කොටසක්.


මේ අය සමාජ ව්‍යසනයක් හා සමාන යි. මගේ "සසල විල" කෘතියට පාදක වෙන්නේ ඒ කියන හොර වෙදුන්ගේ සමාජ හැසිරීම. පුවත්පත් කලාවේදියෙක් හැටියට මගේ විෂය වුණේ ගුප්ත විශ්වාස ගැන ලිවීම. ඒ විදිහට කරුණු සොයා යද්දී ලබපු අත්දැකීම් තමයි මේ ලිවීමට හේතු වුණේ.


ඒ වගේ ම පැවිද්දෙක් පසුව උපැවිදිව සමාජයට ඇවිත් ගිහි සමාජයේ දී ලද අත්දැකීම් සාක්ෂාත් කර ගැනීම පසුබිම් කරගෙන "අග්නි චාමර" කෘතිය ලියනවා.


ඒ කොහොම නමුත් මම සාහිත්‍යධරයෙක් ය කියලා මම විශ්වාස කරන්නේ නැහැ.


මෙතන දී වුණේ මම ලබන ඇතැම් අත්දැකීම් ප්‍රකාශ කරන්න සාහිත්‍යකරණය මාධ්‍යයක් හැටියට යොදා ගැනීමට වැඩි දෙයක් නෙවෙ යි.









# හරි වහර

● ශ්‍රීනාත් ගණේවත්ත



## අත් පද - පර පද නිසි ලෙස දන්නේ

හරි වහර ලියැවෙනුයේ බසෙහි හරි වහර නිවැරැදි වහර - වැරැදි වහරින් වෙන් කොට පෙන්වා දෙනු පිණිස බව මෙයට පෙර ද කිහිප වරක් දක්වනු ලැබිණ. එසේ හරි වහර මතු කොට දැක්වෙනුයේ ද බොහෝ දෙනකුට වැටැහෙන පරිදි සරල ලෙසිනි. සිංහලය පිළිබඳ මඳ දැනුමක් ඇත්තකුට පවා වැරැදි - නිවැරැදි වහර තෝරා ගැන්මට හැකි වන පරිදි කරුණු දැක්වීමට මෙහි ලා උත්සාහ දරනු ලැබේ.

ව්‍යාකරණය ඉගැන්වීම මෙහි ලා අරමුණු කරනු නො ලැබේ. එ වුව ද ඇතැමුන්ගේ සැක පසිඳලීම පිණිස, ගැටලු විසැඳීම පිණිස ඇතැම් වියරණ කරුණු පැහැදිලි කොට දැක්වීමට සිදුවේ.

'හරි වහර' කියැවූවෙක් එසේ පැහැදිලි කොට කරුණු දැක්විය යුතු පැනයක් නඟයි. එ නම් ගිය වර 'හරි වහරේ' එක්තරා ක්‍රියා මූලයක් (ධාතුවක්) වර නැඟීමෙහිදී කියැවුණු ආත්මනේ පද - පරස් මෛ පද යනු කවරක් ද යන්නයි. එය පහදා දෙන ලෙස හේ ඉල්ලා සිටී. එහෙයින්, වෙන දා යන මඟින් තරමක් බැහැර වුවද ගැටලුව හැකි තරම් ලිහිල් ලෙස විසඳාලන්නට මෙහිලා තැතක් දැරේ.

පුරාණතම සිංහල ව්‍යාකරණය වන සිදත් සඟරාවේ හෝ ඒ අනුව ලියැවුණු ව්‍යාකරණ ග්‍රන්ථවල හෝ මේ ක්‍රියා ප්‍රභේදය ගැන කරුණු නොදැක්වේ. එසේ නොදැක්වුණ ද සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවල බෙහෙවින් මේ භේදය සහිත ක්‍රියා පද යෙදී ඇති සැටි දක්නා ලැබේ.

සිදත් සඟරාවේ ම පවා නිදසුන් වැකි ලෙස දැක්වුණු 'බෙළේ බළාම් කෙරේ' ආදියෙහි ආත්මනේ පදය යෙදී ඇති සැටි දැකිය හැකි ය.

සිංහලයෙහි ආත්මනේ පද -පරස්මෛ පද යන ප්‍රභේදය යෙදෙන බව මුලින් ම පෙන්වා දෙන ලදුයේ කුමාරතුංග මුනිදාස සූරීන් විසිනි. එතුමෝ සිය 'එළු අත්තනගලු වංශ විවරණයේදී මේ කරුණ සාධක සහිතව දැක්වූහ. ඉක්බිති වැ එතුමන් විසින් රචිත 'ක්‍රියා විවරණය', 'ව්‍යාකරණ විවරණය' යන ග්‍රන්ථ දෙකෙහි ම මෙය මැනැවින් පැහැදිලි කරනු ලැබ ඇත.

ආත්මනේ පද - පරස්මෛ පද භේදය ඇත්තේ ක්‍රියා වර නැඟීමෙහිදී යෙදෙන ප්‍රත්‍යයවල ය. (වර නැඟීම යනු යම් ක්‍රියා මූලයෙකින් හෙවත් ධාතුවෙකින් ඇති වන රූප සමූහය දැක්වීමයි.

එය පාඨකයාට පහසුවෙන් වටහා ගනු පිණිස මෙසේ සටහනක් මඟින් දැක්විය හැකියි. මුලින් ම දැක්විය යුතු කරුණ නම් ආත්මනේ පද පරස්මෛ පද යනු සංස්කෘත ව්‍යාකරණයේ දැක්වෙන යෙදුමක් බව යි.

පාලියෙහි දී අත්තනෝ පද - පරස්ස පද යනුවෙන් ඒ හැඳින්වෙයි. "ආත්මගාමීවෙත් ඵලමාත්මනේ පදං - පරගාමීවෙත් පරස්ස පදං ප්‍රයෝක්ත ව්‍යක්තම" යැයි සුප්‍රකට සාරස්වත ව්‍යාකරණයෙහි දැක්වේ. (ක්‍රියාවෙහි) ඵලය තමා කරා පැමිණේ නම් ඒ ආත්මනේ පද යැයි ද (ක්‍රියාවෙහි) ඵලය අනුන් කරා යේ නම් ඒ පරස්මෛ පද යැයි කියැවේ යනු එහි අරුතයි.

ව්‍යාකරණ කාරයන් එ සේ කියන නමුදු මෙහි දැකිය හැක්කේ රූප භේදයක් පමණෙකි. එ නම් ආත්මනේ පද - පරස්මෛ පද දෙක්හි ක්‍රියාරූපවල ඇති වෙනස පමණෙනි. අර්ථයෙහි වෙනසක් නැත. එහෙයින් අර්ථය අතින් ගත් කල්හි මෙහි එ තරම් වැදැගත් කමක් දැකිය නොහැකි ය. එහෙත් ආත්මනේ පද රූපය ම වෙනත් ක්‍රියා භේද සඳහා ද යෙදෙන බැවින් මෙය මැනැවින් විමසා බලා උගත යුතු ය.

සිංහලයෙහි ද ආත්මනේ පද - පරස්මෛ පද දෙකෙහි ඇත්තේ ක්‍රියා රූපවල වෙනස පමණෙකි. එහෙයින් දෝ, අද දක්නා ලැබෙන

ආත්මනේ පද ප්‍රත්‍යය

| | ඒක | බහු |
|---|---|---|
| වර්ත | ඒ | එති |
| අතීත | ඉණි | උණු |

පරස්මෛ පද ප්‍රත්‍යය

| ඒක | බහු |
|---|---|
| ආ, ඊ | අති, ඉති |
| ඊ, ඉ | උෟ, උ, ඉ |

මේ අනුව 'බබළ' (බැබැළීමෙහි) ධාතුව (ක්‍රියා මූලය) ආත්මනේ පද ප්‍රත්‍යයගෙන 'බැබැළේ - බැබැළෙති - බැබැළිණි - බැබැළුණු යනුවෙන් වර නැඟේ. (බැබැළිණි - බැබැළුණු' යනුවෙන් වර නැඟේ. (බැබැළුණු යන්න වහරෙහි බෙහෙවින් යෙදෙනුයේ 'බැබැළුණහ' යන රූපයෙනි. එහි 'හ' යනු වාක්‍ය වසනා නිපාතයක් ලෙස සැලැකේ.

ඒ 'බබළ' ධාතුව ම පරස්මෛ පද ප්‍රත්‍යය ගෙන 'බබළා - බබළති - බැබැළී - බැබැළූ' යැයි වර නැඟේ. ('බබළා' යනු 'බබළයි' යැයි ද 'බැබැළුණු යනු 'බැබැළූහ' යනුවෙන් ද වහරෙහි බෙහෙවින් යෙදෙන බව සැලැකුව මනා ය.

වෙනත් ධාතු ද මෙසේ වර නඟා බැලීමෙන් ආත්මනේ පද - පරස්මෛ පද භේදය හොඳින් අවබෝධ කැරගනු හැකි වනු ඇති. 'ක්‍රියා විවරණය වැනි ග්‍රන්ථ පරිශීලනයෙන් මේ පිළිබඳ වැ නිවැරැදි නිරවුල් දැනුමක් ලබාගත හැකිවේ. මෙහි දක්වන ලද්දේ කෙටියෙන් කරුණු විමැසුමක් ද පමණෙකි.

ආත්මනේ පද කර්මකාරක භේදය ද මැනැවින් වටහා ගත යුතු ය. කර්මකාරකයෙහි දී ද ආත්මනේ පදයෙහි යෙදුණු ප්‍රත්‍යය ම යෙදේ. මෙහි දී අර්ථයෙහි වෙනසක් වන බව ද වාක්‍යයෙහි කර්මය උක්තවන බව ද පැහැදිලිව පෙනේ.

1. මිනිසා රැකේ
2. මිනිසා විසින් බල්ලෙක් රැකේ.

යන වාක්‍ය දෙක ඉතා සැලැකිල්ලෙන් කියැවුවහොත් අර්ථයෙහි වන වෙනස මැනැවින් වටහාගත හැකි වේ.

උක්ත රහිත වැ යෙදෙන ආඛ්‍යාතවල දී ද ආත්මනේ පද ප්‍රත්‍යය ම යෙදේ. 'ඇයට හැඬේ' , 'රිළවාට නියැවේ' වැනි වාක්‍ය විමසා බැලීමෙන් එ බව වැටැහෙනු ඇති.

සිංහලයෙහි බොහෝ ධාතු ආත්මනේ පද, පරස්මෛ පද දෙක්හි ම වර නැඟේ. එ බඳු ධාතු උභය පද නමින් හැඳින්වේ.



පකිස්ථාන ප්‍රහාරක නෞකාවක් අභ්‍යාසයට එක් වෙමින් මිසයිල සාගරයට මුදාහැරිය අයුරු.



ආමාන් අභ්‍යාසයට එක්වූ පකිස්ථාන ගුවන් හමුදාවේ කොමාන්ඩර් සෙබළුන් කරච්චි වෙරළ තීරයට ගොඩ බසින අයුරු.



අමාන් නාවික අභ්‍යාසයට එක්වූ පකිස්ථාන ප්‍රහාරක නෞකාවක්.

# පාකිස්ථාන් මහ මුහුදේ රටවල් 43ක් පෑ පෙළහර

● චන්දන විජේකෝන්

**පාකිස්ථාන සංචාරයකින් පසු...**

**'සාමය යනු ජීවිතයේ සුන්දරත්වයයි. එය හිරු එළියයි. එය දරුවකුගේ සිනාව, මවකගේ ආදරය, පියකුගේ ප්‍රීතිය, පවුලක එකමුතුවයි. එය මිනිසාගේ දියුණුව, සාධාරණ හේතුවක් ජයග්‍රහණය කිරීම, සත්‍යයේ ජයග්‍රහණයයි' යනුවෙන් හඳුන්වාදීම වැරදි නැත.**

ලෝක සාමයේ නිම්වළලු පුළුල් කරමින් පසුගියදා පාකිස්තානයේ කරච්චි මුහුදු කලාපයේදී ඉතා සාර්ථකව නිමාවට පත්වූ "අමාන් - 21" (AMAN – 21) බහුජාතික නාවික අභ්‍යාසය අන්තර්ජාතික සහයෝගිතාව ශක්තිමත් කරන පෙර ගමන්කරුවකු වූ බව සඳහන් කිරීම වැදගත්ය.

'අමාන්' යනු 'සාමය' යන අරුත ලොවට ගෙනෙන ද්විවාර්ෂික ව්‍යායාමයකි. විශේෂයෙන් එහි මූලික පරමාර්ථය වන්නේ, ඉන්දීය සාගර කලාපයේ ක්‍රියාත්මක වන සහ කලාපීය නොවන නාවිකයන් අතර සහයෝගිතාව, අන්තර් ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීමයි.

2007 වර්ෂයේ මෙම නාවික අභ්‍යාසය පාකිස්ථානය විසින් ආරම්භ කිරීමත් සමඟ අන්තර්ජාතික සහයෝගිතාව තවත් ශක්තිමත් වීමට මඟ සැලසිණි.

විශේෂයෙන් අප ජීවත්වන කලාපයේ පමණක් නොව ඉන් බැහැර කලාපවල සහයෝගිතාව සහ ස්ථාවරත්වය රඳා පවත්වා ගැනීමට මේ මඟින් මූලික පදනම සැකසී ඇති බව පෙන්වාදීම ඉතා වැදගත්ය. මුහුදු මංකොල්ලයන්, ත්‍රස්තවාදය, සමුද්‍රීය ආධිපත්‍ය සහ අපරාධවලට එරෙහිව එක්සත් පෙරමුණක් ලෙස ක්‍රියාත්මක වීම මෙම නාවික අභ්‍යාසයේදී එකඟත්වයකට පැමිණීම කැපී පෙනෙන සිද්ධියක් විය.

එම එකඟතාව තුළින් සාගරයේ සිදුවන නාවික වෙඩි හුවමාරු හා මුහුදු මංකොල්ලකෑම්වලට එරෙහි මෙහෙයුම්, ඒකාබද්ධ සබ්මැරීන් අභ්‍යාස, සන්නිවේදන උපායන්, ගුවන් ආරක්ෂාව, නාවික උපායමාර්ග, ශිල්පීය ක්‍රම හා ක්‍රමවේද භාවිත කරමින් සාගර කලාප තුළ සාමය ඇති කිරීම මෙම 'AMAN' සංකල්පයේ මූලික පදනම වූ බව කිව යුතුය.

'AMAN-21' 7 වැනි ද්විපාර්ශ්වික නාවික අභ්‍යාසයි. 2007 වර්ෂයේදී 'AMAN' නාවික අභ්‍යාසය පළමුවරට පැවැත්වෙන විට නාවික



අමාන් නාවික අභ්‍යාසයට පැමිණි විදේශ ජනමාධ්‍යවේදීන්. චන්දන විජේකෝන් දකුණු කෙළවරේ වෙයි.

යාත්‍රා සමඟ ඊට රටවල් 28ක් එක්විය. නිරීක්ෂකයන් ලෙස රටවල් 29ක් සහභාගි විය. 2009 දී 'AMAN' දෙවැනි නාවික අභ්‍යාසය සඳහා රටවල් 24ක් ද නිරීක්ෂකයන් ලෙස රටවල් 29ක් ද එක්වූ අතර, 2011 පැවැති 'AMAN' තුන්වැනි අභ්‍යාසයට රටවල් 28ක් ද නිරීක්ෂකයන් 43ක් ද එක්වීම විශේෂත්වයක් විය. 2013 පැවැති 'AMAN' සිවුවැනි නාවික අභ්‍යාසයට රටවල් 29ක් එක්වූ අතර, නිරීක්ෂකයන් 36ක් එක්වී ඇත. පස්වැනි 'AMAN' අභ්‍යාසය 2017දී පැවැති අතර, ඊට රටවල් 34ක නාවික යාත්‍රා සමඟ නිරීක්ෂකයන් 67ක් සහභාගි වී තිබේ.

2019 පැවැති හයවැනි 'AMAN' නාවික අභ්‍යාසයට රටවල් 46ක නාවික යාත්‍රා සමඟ නිරීක්ෂකයන් 113ක් සහභාගි වී ඇත.

ක්‍රමයෙන් එම සහභාගිත්වය වැඩි වූ අතර, අමෙරිකාව, රුසියාව, චීනය, ප්‍රංශය, ජපානය, බ්‍රිතාන්‍ය, තුර්කිය, ඕස්ට්‍රේලියාව ආදී ලොව ප්‍රබල රාජ්‍යයන් සිය නාවික යාත්‍රා සමඟ 'AMAN' අභ්‍යාසයට එක්වීම සහ නාවික අත්දැකීම් හුවමාරු කැර ගැනීම මෙහි සාර්ථකත්වයට හා අදාළත්වයට හොඳම පිළිතුරකි.

මේ වසරේ පැවැත්වූ 'AMAN-21' නාවික අභ්‍යාසයට රටවල් 43ක ප්‍රහාරක විශාල නෞකාවන් සහභාගි වූ අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 'ගජබාහු' නමැති ප්‍රහාරක නෞකාව කපිතාන් හර්ෂ ද සිල්වාගේ නායකත්වයෙන් නැවියන් 180ක් සමඟ මෙයට එක්වීම විශේෂත්වයකි. 2019දී අමෙරිකාවෙන් මිලදී ගන්නා ලද මෙම නෞකාව අධිකාරි බලය ලැබීමෙන් පසු පළමු විදේශ ගමන සනිටුහන් කෙළේ AMAN-21 අභ්‍යාසයට එක්වෙමින් වීම විශේෂත්වයකි.

ලෝකයේ දියුණු යැයි සැලකෙන නාවික යාත්‍රා සමඟ කරට කර සිටිමින් 'ගජබාහු' ප්‍රහාරක නෞකාව සහ එහි නැවියන් දැක්වූ නාවික ශිල්පීය නිපුණතාවන් මෙම අභ්‍යාසය නැරඹීමට පැමිණි ලොව වටා ආරාධිතයන්, නාවික නිලධාරීන් මවිතයට පත්කළ බව කිව යුතු කරුණකි.

ශ්‍රී ලංකාව කුඩා රාජ්‍යයක් වුව ද එහි නාවික හමුදාව ලබා ඇති නිපුණතා හා අත්දැකීම් අතිවිශාලය. විශේෂයෙන් වසර 30කට වැඩි කාලයක් පැවැති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට කළ මෙහෙයුම් හා ශ්‍රී ලංකා නැවියන්ගේ අත්දැකීම් මේ අභ්‍යාසයට එක්වූ බොහෝ දෙනෙක් අතර නිරන්තර සාකච්ඡාවට බඳුන් වීම විශේෂත්වයකි. ශ්‍රී ලංකා නැවියන් න්‍යායාත්මකවත්, වඩාත් ප්‍රායෝගිකවත් සිය නාවික නිපුණතා විදහා දැක්වීමට මේ අභ්‍යාසයේදී සමත් වූ බව කිවයුතුය.



පකිස්ථාන ගුවන් හමුදාවේ පැරෂුට් බළකායේ සෙබළුන් අමාන් නාවික අභ්‍යාසයට එක්වූ අයුරු.

කෙසේ නමුත් AMAN සංකල්පය, සමුද්‍රිය ආරක්ෂාව වටා භ්‍රමණය වනවා පමණක් නොව, නාවික රාජ්‍ය තාන්ත්‍රික භාවයක් (Naval Diplomacy) ඇති කිරීමට දායකත්වය සපයයි.

නාවික බලයත්, වඩාත් නම්‍යශීලී, ජංගමශීලී ආදී ගුණාංගවලින් පෝෂණය විය යුත්තේ මේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය ඉදිරියට ගෙන යෑම සඳහාය. මේ නයින් බලන විට AMAN අභ්‍යාසය යනු නාවික රාජ්‍ය තාන්ත්‍රිකභාවය පවත්වා ගැනීම අරඹයා අතිශයින්ම වැදගත් මෙහෙයක් ඉටුකරන ගාමක බලවේගයක් බව පෙන්වාදීම ඉතා නිවැරැදි මෙන්ම කාලෝචිතය.

පාකිස්ථානයේ විදේශ ප්‍රතිපත්තියේ පරමාර්ථය මේ මඟින් ප්‍රකාශවීම කැපී පෙනෙන තවත් සිද්ධියක් ලෙස හඳුන්වා දීම වැදගත්ය.

අප ජීවත්වන ඉන්දීය සාගර කලාපයේ සිදුවෙමින් ඇති භූ දේශපාලනික, භූ ආර්ථික වෙනස්කම් කලාපීය නාවික හමුදාවන්ට අභියෝගාත්මකය. නිරන්තරයෙන්ම එහි ආරක්ෂිත පරිසරයක් තිබීම කලාපීය වශයෙන් පමණක් නොව ගෝලීය වශයෙන් සමුද්‍රිය වෙළෙඳාමට අදාළ වේ.

එමෙන්ම ඉහළ යමින් ඇති අවි සම්බන්ධ ක්‍රියාකාරකම්, මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම, මුහුදු කොල්ලකෑම් සහ නීති විරෝධී ක්‍රියාවන් අපට මැඩ පැවැත්විය හැක්කේ නාවික රාජ්‍ය තාන්ත්‍රිකභාවයක් ඇති කිරීම තුළින් බව කිව යුතු කරුණකි.

අද වන විට සාගරය කේන්ද්‍ර කරගනිමින් සිදුවන නීති විරෝධී ක්‍රියාකාරකම් පාලනය කිරීමට, මැඩපැවැත්වීමට ලොව ප්‍රබල රාජ්‍යයන් පවා අපොහොසත් වී තිබීම ප්‍රකට කරුණකි.

මේ පසුබිම තුළ AMAN අභ්‍යාස මඟින් සමුද්‍රිය ආරක්ෂාව හා අධිපත්‍ය පිළිබඳ ගැටලු හා විශේෂයෙන් සාම්ප්‍රදායික නොවන කාරණා පිළිබඳ තනිව ක්‍රියාත්මක වීමට රටකට ඇති නොහැකියාව හමුවේ එක්ව ක්‍රියා කිරීම පිළිබඳ ඇති වැදගත්කම හා රාජ්‍ය තාන්ත්‍රික පාඩම අපට මැනවින් කියා දෙයි. එසේම කලාපීය වශයෙන් සාමය හා ස්ථාවරත්වය වෙනුවෙන් පෙනී සිටීමේදී ක්‍රියා කිරීමේදී පාකිස්ථානයේ ධනාත්මක ප්‍රතිරූපය ලොවට දෙන ආදර්ශය මිල කළ නොහැකි බව මෙහිදී කිවයුතු ප්‍රබල කරුණකි.

කෙසේ නමුත් සමුදුරු බලයට සවිකම් කීම රටක කීර්තිය, ආරක්ෂාව සහ බලය වැඩි කරන අතර, එය දුර්වල වීම දේශපාලනිකව හා උපායමාර්ගිකව බලවත් වරදක් බව පෙන්නාදීම මෙහිදී වැදගත්ය.

වෂී 2021ක් වූ අප්‍රේල් මස 04 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# සිළුමිණ JOBS

சிழுமின The Silumina

රැකියා අතිරේකය


**දැන් ඔබටත් අපගේ රන්ක්‍රිස්ප් ආයතනයේ වෙළඳ සහයිකාවක් ලෙස එක්වීමට අනගි අවස්ථාවක්**

ඔබ වයස අවු. 20 ත් – 40 ත් අතරද?

අ.පො.ස. සා.පෙළ සමත්ද ?

අලෙවිකරණය සම්බන්ධව දැනුම් ඇතත් / නැතත් එන්න අප හා එක්වන්න

**ආකර්ෂණීය වැටුප්, පුහුණු වැඩසටහන්, නිල ඇඳුම් හා අනෙකුත් දීමනා**

අදම ඔබගේ අයදුම්පත අපට යොමු කරන්න.

**මානව සම්පත් අංශය : 0714379619 / 0703354304**

champa@rancrispcashew.lk

## ඇබෑර්තු

පිළියන්දල පිහිටි රබර් පාපිසි නිපදවීමේ ආයතනයකට **කාර්මික ශිල්පීන්, ලේත් සහ මිලිං යන්ත්‍ර ක්‍රියාකරුවන්, තත්ව පරීක්ෂකවරුන්, පරිගණක දත්ත ක්‍රියාකරුවන්, පිරිසිදු කරන්නන් සහ පුහුණු නුපුහුණු සේවක සේවිකාවන්** අවශ්‍යය කර තිබේ. නවාතැන් පහසුකම් ඇත. 50,000/- නොඅඩු වැටුපක් සහ අමතර දීමනා රැසක් රාත්‍රී වැඩමුර ඇත.

අදම අමතන්න

0770466611 / 011 2 708 908

NETSYS SOLUTIONS PRIVATE LIMITED

## පුහුණු නුපුහුණු විදුලි හා පරිගණක රැහැන් අදින්නන් අවශ්‍ය කර තිබේ

නෙට්සිස් සොලියුෂන්ස් පුද්ගලික ආයතනය සඳහා පුහුණු/ නුපුහුණු විදුලි හා පරිගණක රැහැන් අදින්නන් අවශ්‍ය කර තිබේ.

අවුරුදු 02 ක වෘත්තීය පළපුරුද්ද විශේෂ කොට සැලකේ.

කරුණාකර පහත සඳහන් විද්‍යුත් තැපැලට හෝ ලිපිනයට සවිස්තරාත්මකව අයදුම් කරන්න.

**මානව සම්පත් හා පරිපාලන කළමනාකරු**

**නෙට්සිස් සොලියුෂන්ස් පුද්ගලික සමාගම**

**44A, ලියනගේ මාවත, විජිතපුර පැලවත්ත, බත්තරමුල්ල.**

**විද්‍යුත් ලිපිනය : careers@netsys.lk**

**දුරකථන අංකය - 076-8237626**

## ඇබෑර්තු

**පෑස්සුම්කරු/ වෑද්දුම්කරු / ෆැබ්රිකේටර් (Welder/ Fitter / Fabricator)**

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 කට වැඩි පළපුරුද්ද තිබිය යුතුය.
- වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

සුදුසුකම් සහිත සහතික පත්‍ර සමග සම්මුඛ පරීක්ෂණ සඳහා පහත සඳහන් කාර්යාලීය වේලාවන්වලදී විමසා පැමිණෙන්න.

**සතියේ දිනවල : උදෑසන 9.00 සිට සවස 16.30 දක්වා**

**සෙනසුරාදා දිනවල : උදෑසන 9.00 සිට දහවල් 13.00 දක්වා**

**විස්කම් සහෝදර (පෞද්) සමාගම**

**නො. 312/1, කේ. සිරිල් සී. පෙරේරා මාවත, කොළඹ 13.**

**දුරකථන : 0112387873/ 0112324875**

**ෆැක්ස් : 0112348176**

**ඊමේල් : viskam@sltnet.lk**

J. Orchids THE FLOWER SHOP

## සහාය කළමනාකරුවෙකු / මල් සැකසුම්කරුවන්

ජයරත්න සමූහ ව්‍යාපාරයට අනුබද්ධිත මාරවිල කටුනේරිය පිහිටි අභිනවයෙන් විවෘත කිරීමට සැළසුම් කර ඇති 'ජේ ඕකිඩ්ස්' මල් කටයුතු පිළිබඳ ආයතනයට සහාය කළමනාකරුවෙකු සහ දක්ෂ මල් සැකසුම්කරුවන් අවශ්‍යව ඇත.

**සහාය කළමනාකරුවෙකු (පිරිමි / ගැහැණු)**

- අවංක, ප්‍රසන්න පෞරුෂයකින්, ඉංග්‍රීසි, සිංහල භාෂාවන් චතුර ලෙස හැසිරවිය හැකි පරිගණකය භාවිතා කළ හැකි අයෙකු විය යුතුයි.
- මාරවිල අවට පදිංචි අවුරුදු 45ට අඩු අයවලුන් විශේෂයි.

**මල් සැකසුම්කරුවන් (පිරිමි / ගැහැණු)**

- මල් සැකසුම් කරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ හෝ විදෙස් රටක සම්මත ආයතනයක රැකියාවේ යෙදී ඇත්නම් විශේෂ සුදුසුකමකි.
- මාරවිල අවට පදිංචි අවුරුදු 50ට අඩු අයවලුන් විශේෂයි.

කාර්යාල දිනවලදී උදේ 10ත් 1ත් අතර අමතන්න හෝ ලියා දන්වන්න,

**ජයරත්න සමූහ ව්‍යාපාරය,**

2 බී, ඇල්විටිගල මාවත, කොළඹ 08.

E-mail: jvip3pho@gmail.com

Tel: 0114 616 533

# ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය

## තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**01. තාක්ෂණ නිලධාරී තනතුර (පිරිමි)**

I. **අධ්‍යාපන සුදුසුකම් :**

- ක්ෂුද්‍ර ජීව විද්‍යාව සම්බන්ධ වෛද්‍යවේදී උපාධියක් හෝ
- ජීව වෛද්‍ය හෝ ජීව විද්‍යා උපාධියක් හෝ
- ජීව විද්‍යාව විෂය ධාරාව යටතේ අ.පො.ස. (උ/පෙළ) සමත් වී තිබීම හා අවම තරමින් රසායනාගර සහයකයෙකු වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද
- මූලික වැටුප : 36,500.00

**02. කළමණාකාර සහකාර තනතුර (ගිණුම්)**

I. **අධ්‍යාපන සුදුසුකම් :**

- අ.පො.ස. (උ/පෙළ) ගිණුම්කරණය විෂය ඇතුළත්ව වාණිජ විද්‍යා විෂයෙන් සමත්වීම.
- CIMA/CMA/AAT/HNDA/ ACCA මුල් අදියරයන් සපුරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

II. **වෘත්තීය සුදුසුකම් :**

- ගිණුම්කරණ පළපුරුද්ද සහිතව පිළිගත් ආයතනයක වසර 03 ක සේවා පළපුරුද්ද.
- මූලික වැටුප – 30,500.00

**03. කාර්යාල කාර්ය සහයක තනතුර (පිරිමි)**

I. **අධ්‍යාපන සුදුසුකම් :**

- සිංහල, ගණිතය හා ඉංග්‍රීසි විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.
- පරිගණක සාක්ෂරතාවය තිබීම.
- යතුරු පැදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම.
- බහුකාර්ය, ක්‍රියාශීලී හා මහජන සම්බන්ධතාව පිළිබඳ දැනුම.

II. **වෘත්තීය සුදුසුකම් :**

- රජයේ හෝ පෞද්ගලික අංශයේ කාර්යාල කාර්ය සහයකවරයෙකු වශයෙන් සේවය කිරීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
- මූලික වැටුප – 26,500.00

**04. ආරක්ෂක නියාමක තනතුරු (පිරිමි)**

I. **අධ්‍යාපන සුදුසුකම් :**

- අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සමත් වීම. (සිංහල/ ගණිතය හා ඉංග්‍රීසි යන විෂයන් ඇතුළුව)
- බහුකාර්ය, ක්‍රියාශීලී හා මහජන සම්බන්ධතාව පිළිබඳ දැනුම.

II. **වෘත්තීය සුදුසුකම් :**

- රජයේ හෝ පෞද්ගලික අංශයේ ආරක්ෂක සේවයේ වසර 03 ක සාර්ථක සේවා පළපුරුද්ද.
- පොලිස් හා ආරක්ෂක අංශ විශේෂයි
- චක්‍රගත සේවාමුර ක්‍රමය යටතේ සේවයේ යෙදිය යුතුය.
- මූලික වැටුප – 26,500.00

**සැලකිය යුතුයි.**

- ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු රා.සේ.අ. දායක මුදලට සේවකයාගෙන් 8% ක්ද ආයතනයෙන් 12%ක්ද සේවා නියුක්ති භාරකාර අරමුදල සඳහා ආයතනය මගින් 3% ක් දායක කරනු ලැබේ.
- ඉහත තනතුරු සඳහා වයස් සීමාව අවුරුදු 18 ත් 35 ත් අතර විය යුතු අතර, බස්නාහිර පළාත තුළ පදිංචිකරුවන් වීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
- පුද්ගලිකව සකස් කළ සවිස්තරාත්මක අයදුම්පත අදාළ සහතික පිටපත් සමඟ ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ සම්බන්ධතා විස්තර ද සහිතව 2021 අප්‍රේල් මස 30 වැනිදා හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුරේ නම සඳහන් කරන්න.

**ගරු ප්‍රධාන ලේකම්,**
**ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය, විද්‍යා මාවත, කොළඹ 07.**

# දේශාභිමානී

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලකායේ කෙඩෙට් නිලධාරියෙකු ලෙස බැඳීමට අවස්ථාවක්





**මූලික සුදුසුකම් :**

- **වයස** : 2021 ජුනි මස 30 දිනට අවුරුදු 18 - 23 අතර
- **උස සහ බර**: අඩි 05 අඟල් 06ට (සෙන්ටිමීටර 167.64) නොඅඩු හා බර කිලෝ ග්‍රෑම් 52 (රාත්තල් 118) ට නොඅඩු
- **දෘෂ්ඨි තීක්ෂණතාව** : උපැස් හා කාච රහිතව 6/6 විය යුතුය.
- **විවාහක/අවිවාහක බව** : අවිවාහක පුරුෂ විය යුතුය.
- **අධ්‍යාපන සුදුසුකම්** :

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ගණිතය, විද්‍යාව සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් පහකට (05) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් අටක් (08) එකවර සමත්වීම.

හෝ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) විභාගයන්ට සමගාමී ජාත්‍යන්තර විභාගයකින් (Pearson/ Edexel, GCSE, GCE and Cambridge) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

සහ

අ.පො.ස (උ/පෙළ) සමත්වීම, ක්‍රීඩා සහ වෙනත් ජයග්‍රහනයන් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලබයි.



තෝරාගනු ලබන අයඳුම්කරුවන් මාස 12 කට නොඅඩු මූලික කෙඩෙට් නිලධාරී පාඨමාලාව හැදෑරිය යුතු අතර පාඨමාලාව සාර්ථකව අවසන් කරන සෑම කෙඩෙට් නිලධාරියෙකුම දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබේ.

අයඳුම්පත් භාරගන්නා අවසන් දිනය : **2021 අප්‍රේල් මස 30 වන දින**

අයදුම්පත් හා තොරතුරු සඳහා https://www.army.lk/officers වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**විමසීම් : 0112 514 605**

පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ

# සිළුමිණ JOBS
சிழுமின The Silumina
රැකියා අතිරේකය



නවලෝක පයිලිං (පුද්ගලික) සමාගම

ISO 9001-2015, EMS 14001-2015 සහ OHSAS -18001-2007 ... (GP-B1) ...

- ... - (Boring Rig Operators)
- ... - (Bentonite Operators)
- ... - (Rigger) ...
- ... - (Mechanic)
- ... - (Electricians)
- ... - (Welders)
- ... - (Helpers)

... පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා ...

දුරකථන: 0115 888 888 / 0115 888 227
E MAIL- careers@nawaloka.lk



BE BETTER INFORMED!
Dinamina | Daily News | Thinakaran
News you can trust now free on your mobile phone.
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE
AVAILABLE AT


### ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

# ක්‍රීඩා උපදේශක /නේවාසිකාගාර පාලිකා තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම

ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වන ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ පවතින පහත සඳහන් ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්යෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | **තනතුර** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|
| 1. | ක්‍රීඩා උපදේශක | 03 |
| 2. | නේවාසිකාගාර පාලිකා | 01 |

**01. ක්‍රීඩා උපදේශක**

(පාපන්දු, වොලිබෝල්, ක්‍රිකට්, ටේබල් ටෙනිස්, බැඩ්මින්ටන්, ජූඩෝ, කබඩි, ශක්තිය හා යෝග්‍යතාව හදුරා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබාදේ)

**1.1 තනතුරේ ස්වභාවය - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත**

**සටහන** – විශ්‍රාම වැටුප් සහිත බව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ.

**1.2 බඳවා ගන්නා ශ්‍රේණිය** – III ශ්‍රේණිය

**1.3 වැටුප් පරිමාණය**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරණ වැටුප් චක්‍රලේඛනයට අනුව MN 4-2016, රු.31,490-10x445-11x660 -10x730-5x750-54,250/= ක වැටුප් පරිමාණයක් හිමිවේ.

**1.4 වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**1.5 බඳවා ගැනීමේ සුදුසුකම්**

**1.5.11 අධ්‍යාපනික සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩාව හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ කළමනාකරණය, සංඛ්‍යාන විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, පෝෂණය, කායික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව යාන්ත්‍රන විද්‍යාව, භෞතික විද්‍යාව, ක්‍රීඩා ආර්ථික විද්‍යාව, ක්‍රීඩා විශ්‍රාන්ති කළමනාකරණය, ක්‍රීඩා ශික්ෂණ ශාස්ත්‍රය යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම.

**1.5.2 වෘත්තීය සුදුසුකම්** – අදාළ නොවේ

**1.5.3 පළපුරුද්ද**– අදාළ නොවේ

**1.5.4 කායික සුදුසුකම්** – සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්තත විය යුය.

**1.5.5 වෙනත්** – 01. ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
02. විශිෂ්ඨ චරිතයක් ඇත්තකු වීම

**02. නේවාසිකාගාර පාලිකා**

**2.1 තනතුරේ ස්වභාවය -** ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**සටහන** – විශ්‍රාම වැටුප් සහිත බව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ.

**2.2 බඳවා ගන්නා ශ්‍රේණිය** – III ශ්‍රේණිය

**2.3 වැටුප් පරිමාණය**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛනයට අනුව. MN-1-2016 රු. 27,140-10x300-11x350-10x945-10x660- 45,540/- ක වැටුප් පරිමාණයක් හිමිවේ.

**2.4 වයස් සීමාව**

අයදුම්පත් භාර නේනා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**2.5 බඳවා ගැනීමේ සුදුසුකම්**

**2.5.1 අධ්‍යාපන සුදුසුකම්**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

හා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය අවම වශයෙන් එක් විෂයක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

**2.5.2 වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද**

I. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකම් සේ සැලකේ.

II. රජයේ හෝ රජයට අනුබද්ධ නේවාසිකාගාරයක / ආයතනයක සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී / සහකාර නිවාස පාලිකා හෝ ඊට සමාන හෝ උසස් තනතුරක වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**2.5.3 කායික සුදුසුකම්** – සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**2.5.4 වෙනත්** – 1. ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
2. විශිෂ්ඨ චරිතයක් ඇත්තකු වීම

❖ **පත්වීමේ ස්වභාවය**

බඳවා ගැනීම් සිදු කරනුයේ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයකින් ලද ප්‍රතිඵල මතය. එබැවින් ඔබ විසින් අත්‍යවශ්‍ය සියලු තොරතුරු සනාථ කරන ලිපි ලේඛන පිටපත් සහිතව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

❖ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය හා අයදුම්පත ඉදිරිපත් කරන ආකාරය

- පහත සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත සම්පූර්ණ කර 2021/05/03 දිනට පෙර ලේකම්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,12 වන මහළ, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර, අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
- අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ www.niss.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

**අධ්‍යක්ෂ,**
**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය**

**ලේකම්,**
**ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,**
**12 වන මහළ, බටහිර කුලුන,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.**

### ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
### ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
### ක්‍රීඩා උපදේශක / නේවාසිකාගාර පාලිකා තනතුරු සඳහා බඳවා ගැනීම
## ආදර්ශ අයදුම් පත්‍රය

01. අයදුම් කරන තනතුර :
02. i. මුලකුරු සමග අගට යෙදෙන නම :
    ii. මුලකුරු වලින් හැඳින්වෙන නම :
    iii. මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් :
03. ජාතික හැඳුනුම්පත් අංකය :
04. ස්ථිර ලිපිනය හා දුරකථන අංකය :
05. i. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :
    ii. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
06. කාර්යාලීය ලිපිනය :
07. උපන් දිනය :
    අවුරුද්ද : මාසය : දිනය :
08. ස්ත්‍රී / පුරුෂ භාවය :
09. විවාහක / අවිවාහක බව :
10. අදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු : මාස : දිනය :
11. අධ්‍යාපන සුදුසුකම් :

| විභාග / ඩිප්ලෝමාව / උපාධිය (සාමාන්‍ය ගෞරව) | වර්ෂය | පෙනී සිටි විෂයන් | ලබා ඇති සාමාර්ථයන් | ආයතනයේ විශ්ව විද්‍යාලයේ නම | භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|---|
| | | | | | |

12. වාත්තීය සුදුසුකම්

| විභාග / ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයන් | ලබා ඇති සාමාර්ථයන් | ආයතනයේ / විශ්ව විද්‍යාලයේ නම | භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|---|
| | | | | | |

13. සේවා පළපුරුද්ද

| සේවය | දරන ලද තනතුර | කාලය | | ආයතනය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

14. වෙනත් සුදුසුකම්
...............................................................................
...............................................................................
...............................................................................
...............................................................................

**අයදුම්කරුගේ / අයදුම්කාරියගේ සහතිකය :**

.................................................. වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමභාවය මත සේවයෙන් විශ්‍රාම ගත්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකුසේ සලකා හෝ නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා තනතුරින් ඉවත් කිරීමට හැකි බවත් දන්වමි.

..............................        ..............................
දිනය        අයදුම්කරු / කාරියගේ අත්සන

**රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.................................................. මහතා / මහත්මිය / මෙනවියගේ අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ .............................. ස්ථිර / තාවකාලික / අනියම් / සේවකයෙකු / සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවත් / නොහැකි බවත් දන්වමි.

..............................        ..............................
දිනය        දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
තිල මුද්‍රාව


SUNDAY OBSERVER adz it's what you want
வாரமஞ்சரி

පල දරන්න – පළ කරන්න

නවතම ලුහුඬු දැන්වීම් ගාස්තු... වචන 15ක් සඳහා
රු. 300/- * තිනකරන් වාරමන්ජරි හැර
රු. 500/- * තිනකරන් වාරමන්ජරි හැර
රු. 650/-

කොළඹ දිස්ත්‍රික්කය

කලුබෝවිල ........................ 011 2 767 259
195,රෝහල පාර, කලුබෝවිල.

පිලියන්දල ........................ 011 2 609 359
88/1, මහරගම පාර, මාම්පෙ, පිලියන්දල.

මහරගම ........................ 011 2 745 895
119/ඒ, විනෝදා ඇඩ්වර්ටයිසින්, මහරගම.

මාලබේ ........................ 077 2 017 409
පතිරු නිව්ස් එජන්සීස්, අතුරුගිරිය පාර, මාලබේ.

ගොඩගම ........................ 011 3 418 649
170, සීතාවක ඒජන්සීස්, ගොඩගම.

හෝමාගම ........................ 077 7 304 046
76/2/1, දුම්රියපොල පාර හෝමාගම.

උඩහමුල්ල ........................ 011 2 810 042
138, දුම්රියපොළ පාර, උඩහමුල්ල, නුගේගොඩ.

මත්තේගොඩ ........................ 071 8 619 448
මත්තේගොඩ නිව්ස් පේපර්ස්, 102/179 සී, ප්‍රධාන වීදිය,

අතුරුගිරිය ........................ 071 8 021 724
267, විතානගේ ස්ටෝර්ස්, ගොඩගම පාර, අතුරුගිරිය.

කොට්ටාව ........................ 077 5 121 887
72, හයිලෙවල් පාර, කොට්ටාව.

පිටකෝට්ටේ ........................ 075 4 009 648
435,පොත්ගුල පොත්හල, පිටකෝට්ටේ.

පුංචිබොරැල්ල ........................ 011 2 268 251
කොළඹ ........................ 071 0 748 900
කිරුළපන ........................ 071 5 439 396
මාකොල ........................ 078 5 200 648
ග්‍රෑන්ඩ්පාස් ........................ 071 2 321 968
වැල්ලවත්ත ........................ 071 7 182 900
කොල්ලුපිටිය ........................ 011 2 341 502
මට්ටක්කුලිය ........................ 011 2 520 602
බොරැල්ල ........................ 011 2 679 032
නාවින්න ........................ 071 4 252 138
මහරගම ........................ 011 2 896 373
කෝට්ටේ ........................ 077 9 878 933
කහතුඩුව ........................ 011 2 753 836


පුංචිබොරැල්ල ........................ 011 2 268 251
කොළඹ ........................ 071 0 748 900
කිරුළපන ........................ 071 5 439 396
මාකොල ........................ 078 5 200 648
ග්‍රෑන්ඩ්පාස් ........................ 071 2 321 968
වැල්ලවත්ත ........................ 071 7 182 900
කොල්ලුපිටිය ........................ 011 2 341 502
මට්ටක්කුලිය ........................ 011 2 520 602
බොරැල්ල ........................ 011 2 679 032
නාවින්න ........................ 071 4 252 138
කෝට්ටේ ........................ 077 9 878 933
කහතුඩුව ........................ 011 2 753 836


classified@lakehouse.lk
011 2 429 342 | 011 2 429 343
Fax - 011 2 429 375 / 011 2 429 380

# ඇබෑර්තු

දිවයින් ප්‍රමුඛ පෙළේ රාජ්‍ය බැංකුවක අනුබද්ධිත ආයතනයක් සහ කොළඹ කොටස් වෙළඳ පොළේ ලැයිස්තුගත සමාගමක් වන අප ආයතනය කොළඹ පුරෝගාමී මහල් ගොඩනැගිල්ලක හිමිකරුවන්වේ. ආයතනයේ මූලික මෙහෙයුම් ක්‍රියාදමය වනුයේ ගොඩනැගිල්ලේ තත්වය ඉහළ මට්ටමක පවත්වාගෙන යෑම සහ ඒ සඳහා අදාළ ගෘහනිර්මාණ ශිල්පය, විදුලි කාර්මික, ජලනල පද්ධතීන් සහ වර්ග අඩි 600,000 ගොඩනැගිල්ල සඳහා අනෙකුත් සේවාවන් පවත්වාගෙන යැමයි. ඒ අනුව පහත ඇබෑර්තු සඳහා ඉහළ හැකියාවන් ඇති අයවළුන් ආයතනය විසින් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

## ජ්‍යෙෂ්ඨ කාර්මික තනතුර - ජලනල/ පෙදරේරු

- විෂයන් හයකට සාමාර්ථ සහිතව අ.පො.ස. සා/පෙළ සමත් වීම.
- පිළිගත් කාර්මික ආයතනයක ජලනල / පෙදරේරු පිළිබඳ අවම වශයෙන් එක් වසරක පූර්ණ කාලීන සහතික පත් / ඩිප්ලෝමා (NVQ Level 4) පාඨමාලාවක් හදාරා තිබීම. පළපුරුද්ද අනුව මෙම සුදුසුකම ලිහිල් කෙරේ.
- පිළිගත් ආයතනයන්හි අවම වශයෙන් වසර 08 ක ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතුය.
- ඉල්ලුම් කරන දිනට වයස අවුරුදු 45ට අඩු විය යුතුය.

## කනිෂ්ඨ කාර්මික තනතුර - විදුලි /ජලනල /පින්තාරු

- විෂයයන් හයකට සාමාර්ථ සහිතව අ.පො.ස. සා/පෙළ සමත් වීම.
- පිළිගත් කාර්මික ආයතනයක ජලනල හෝ පින්තාරු පිළිබඳ අවම වශයෙන් මාස හයක සහතික පත් /ඩිප්ලෝමා කාර්මික පාඨමාලාවක් හදාරා තිබිය යුතුය, (NVQ Level 3) පළපුරුද්ද අනුව මෙම සුදුසුකම ලිහිල් කෙරේ.
- පිළිගත් ආයතනයන්හි අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.
- ඉල්ලුම් කරන දිනට වයස අවුරුදු 35ට අඩු විය යුතුය.

**සැලකිය යුතුයි :** අවම සුදුසුකම වශයෙන් යටත් පිරිසෙයින් වසර තුනක (03) පළපුරුද්ද සපුරා නොමැති වූ විට නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඔබ පිළිබඳ ස්වාධීනව තොරතුරු ලබාදිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර සහිතව 2021 අප්‍රේල් මස 17 දිනට පෙර සියලු සහතිකවල පිටපත් සමග අයදුම් කරන්න. ඔබ අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම්පස උඩ කෙලවරෙහි සඳහන් කරන්න.

**තැ.පෙ. S.10009, සිළුමිණ බාරේ,**
**ලේක්හවුස්, කොළඹ.**

---

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

# කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය

## උතුරු මැද පළාත

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ලෝක බැංකු ණය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය, කුඩා පරිමාණ ගොවීන්ට තරඟකාරී සහ අලෙවි කළ හැකි කෘෂි නිෂ්පාදනයන් වැඩිදියුණු කරගැනීමට සහ වාණිජ ගොවිතැන් කරා නැඹුරු කරවීම සඳහා සහයෝගය ලබා දේ. මෙම ව්‍යාපෘතියේ උතුරු මැද පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින පහත සඳහන් තනතුරහි පුරප්පාඩුව පිරවීම සඳහා, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ප්‍රකාරව මතු දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ඉල්ලුම්කරුවන් වෙතින් අයදුම් පත් කැඳවනු ලැබේ.

## ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (PS 3) - තනතුරු 01 යි

**ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයාගේ කාර්යභාරය සහ වගකීම්:**

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වන්නේ කෘෂි තාක්ෂණික ආදර්ශන උද්‍යාන පිහිටුවීම සහ ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනයයි. ඒ අනුව ඉහත තනතුරට අදාළ කාර්යභාරය සහ වගකීම් වනුයේ, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කෘෂි තාක්ෂණ ආදර්ශන උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම උදෙසා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, රේඛීය ආයතන, සේවා සපයන්නන්,කොන්ත්‍රාත්කරුවන්, ගොවි සංවිධාන,ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් මනාව සම්බන්ධීකරණය කරමින්, හඳුනාගත් නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු සහ ඉලක්ක කරා යාමට, ව්‍යාපෘති කණ්ඩායමේ ඵලදායි හා කාර්යක්ෂම සාමාජිකයකු ලෙස කටයුතු කිරීමයි.

**අවශ්‍ය සුදුසුකම්:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක සාමාජිකත්වය /පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකම් සමඟ,

   කළමනාකරණ තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

**හෝ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසු කමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක සාමාජිකත්වය /පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකම් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ අදාළ වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකයෙක් වීම සමඟ,

   කළමනාකරණ තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 8 ක පළපුරුද්ද.

**හෝ**

3. දීප ව්‍යාප්ත සේවයක පළමු පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ අයෙකු වීම සමඟ,

   පළමු පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.

**තෝරාගැනීමේ ක්‍රමවේදය:**

සුදුසුකම් සහ පළපුරුද්ද මත පාදකව,කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ.

වැටුප:2019.03.05 දිනැතිව නිකුත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/ 2019 මත පදනම් වනු ඇත.

**පොදු කොන්දේසි:**

අ) වයස් සීමාව–අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 64 නොඉක්මවා තිබීම.

ආ) සේවා කොන්දේසි –රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් ද්විතීය පදනම මත බඳවාගනු ලබන අතර,රජයේ සේවයෙන් බැහැර අයවළුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.සියලුම පත්වීම් සහ සේවා කාලය දීර්ඝ කිරීම් 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පාදක කර සිදු කරනු ලැබේ.

**අයදුම්පත්:**

සියලුම අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම් පත් ජීව දත්ත තොරතුරු ප්‍රකාශ සමඟින්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිතව 2021 අප්‍රේල් මස 19 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත් අදාළ දෙපාර්තමේන්තු /අංශ ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ.

අයදුම්පත් බහාලනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

මේ පිළිබඳව යම් වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම්,071 – 4899021යන දුරකථන අංකයෙන් ,කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ මඟින් ලබාගත හැකිය.

**ලේකම්,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**
**2021.04.04**

---

**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

# වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

## ඇබෑර්තු

**01. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරයක් :**

කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර (වරාය නගර ව්‍යාපෘතිය) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (ශ්‍රී ලංකා රජය වෙනුවෙන්), නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ CHEC පෝට් සිටි කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් (ව්‍යාපෘති සමාගම) යන පාර්ශවයන් තුන එක්ව ත්‍රෛපාක්ෂික ගිවිසුමක් අත්සන් කොට ඇත. මෙම ත්‍රෛපාක්ෂික ගිවිසුම් යටතේ, ශ්‍රී ලංකා රජය වෙත මහත්වූ වගකීම් රාශියක් පැවරී ඇත. ඒ අනුව, අමාත්‍යාංශය විසින්, ශ්‍රී ලංකා රජය වෙත පැවරී ඇති වගකීම් සම්බන්ධයෙන් සමබන්ධීකරණය කිරීම, කළමනාකරණය කිරීම, නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කොට ඇත.

**ඒ අනුව පිරවිය යුතු ඇබෑර්තු :**

| තනතුර | තනතුරු ගණන | 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් කාණ්ඩය |
|---|---|---|
| 1. ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | PS - 01 |
| 2. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ව්‍යුහාත්මක) | 01 | PS - 02 |

අංක 01/2019 දරන රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ඉහත තනතුරුවලට අයදුම් කිරීම සඳහා පහත සඳහන් අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කොට තිබීම අවශ්‍යවේ.

### 02. තනතුර - ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS - 01)

**2.1 අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

පහත (1) හෝ (2) හෝ (3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ,පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම් සමග සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 8 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආයතනික / වරලත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සමග**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව, කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 14 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සමාන සුදුසුකම්,

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සමග**

සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

**2.2 වැටුප් ගෙවීම**

රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන අය සඳහා :

200,000 - 2 x 10,000 - 220,000/-

**2.3 වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල්වල ප්‍රතිලාභ හිමිවේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂහට වාහනයක් හා රියදුරකු ලබාදෙනු ලැබේ.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අදාළවේ.

### 03. තනතුර - නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ව්‍යුහාත්මක) PS - 02

**3.1 අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

පහත (1) හෝ (2) හෝ (3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල් ඉංජිනේරු (ව්‍යුහාත්මක ඉංජිනේරු) ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සමග**

අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ තලයේ, සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු (ව්‍යුහාත්මක ඉංජිනේරු) ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්,

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග වසර 13 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**සහ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමග අවම වශයෙන් වසර 11 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සතුවිය යුතු අතර, ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

**3.2 වැටුප් ගෙවීම :**

රාජ්‍ය සේවයේ නොවන නිලධාරීන් සඳහා :

185,000 - 2 x 10,000 - 205,000/-

**3.3 වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථ සාධක හා සේවක භාර අරමුදල්වල ප්‍රතිලාභ හිමිවේ.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන අදාළවේ.

**04. වෙනත් සුදුසුකම් අවශ්‍යතා :**

ඉහත තනතුරු දෙකම සඳහා අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

**05. අයදුම්පත් :**

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, තමන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා අනෙකුත් අදාළ තොරතුරු, සමග දුරකථන අංක හා ඊමේල් ලිපින ඇතුළත්ව සකස් කරන ලද අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, 2021.4.19 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**08 වන මහල, "සුහුරුපාය",**
**බත්තරමුල්ල.**

# සිළුමිණ JOBS රැකියා අතිරේකය

## ඇබෑර්තු ඇත

1. Mechanics (කාර්මිකයන්)
2. Senior Mechanics (ජ්‍යෙෂ්ඨ කාර්මිකයන්)
3. Electricians (විදුලි කාර්මිකයන්)
4. Auto Electricians (වාහන විදුලි කාර්මිකයන්)
5. Stores Helper (ගබඩා සහායක) – අ.පො.ස සාපෙළ

SUNPOWER

**ඉතා ඉක්මනින් අවශ්‍යයි.**

**අප ආයතනය ඉදිකිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය අතින් ඉදිරියෙන් සිටින සමාගමකි.**

**ඉහත සඳහන් තනතුරු සඳහා අප සතුව ඉක්මන් පුරප්පාඩු තිබේ.**

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- NVQ 02 මට්ටම හෝ සමාන සුදුසුකමක් සමග අවුරුදු 05 ක පිළිගත් ආයතනයක පළපුරුද්ද.
- වැටුප සාකච්ඡා කළ හැක.
- ඔබේ අයදුම්පත නොපමාව පහත ලිපිනයට යොමු කරන්න.

**කළමනාකරු - මානව සම්පත්,**
**සන්පවර් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාගම,**
**03 වන මහල, ෆෝබ්ස් සහ වෝකර් ගොඩනැගිල්ල,**
**46/38, නවම් මාවත, කොළඹ 02.**
careers@sunpower.lk
Tel: 077-2258138

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

## නිවැරදි කිරීමකි

**වැවිලි අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**

**තේ පර්යේෂණ මණ්ඩලය**

**ඇබෑර්තු**

තලවාකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2021 මාර්තු මස 28 දින සිළුමිණ පුවත්පතේ 36 පිටුවේ ඉහත සඳහන් මාතෘකාව යටතේ පළවූ දැන්වීමේ තනතුරු කිහිපයක තනතුරු නාමය හා සුදුසුකම් පහත සඳහන් ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පළකරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

**01. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**

**බාහිර සුදුසුකම්**

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ දර්ශනවේදී (phD) උපාධියක් සහ වසර (08) ක පර්යේෂණ පළපුරුද්ද ඉන් වසර දෙකක (02) ඉහත උපාධිය ලබා ගැනීමෙන් පසුව විය යුතුය.

**අභ්‍යන්තර**

(අ) දර්ශනවේදී (phD) උපාධියක් සමග AR 1 පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්

**02. ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී**

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ දර්ශනවේදී (phD) උපාධියක් සහ වසර (08) ක පර්යේෂණ පළපුරුද්ද. ඉන් වසර දෙකක් (02) ඉහත උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

**අභ්‍යන්තර**

(අ) දර්ශනවේදී (phD) උපාධියක් සමග AR 1 උපදේශක නිලධාරියෙකු ලෙස අවම වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්

**03. පර්යේෂණ නිලධාරී**

**අභ්‍යන්තර**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අත්හද බැලීමේ නිලධාරි / ව්‍යාප්ත නිලධාරී වශයෙන් වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

**04. අත්හදාබැලීමේ නිලධාරී**

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බස්, තලවාකැලේ.**

**වැවිලි අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විමර්ශන නිලධාරී, විමර්ශන නිලධාරී (නීති කටයුතු) සහ විමර්ශන නිලධාරී (තොරතුරු තාක්ෂණ) තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### විමර්ශන නිලධාරී තනතුර (MA 5-2) II ශ්‍රේණිය

**රැකියා පිරිවිතරය**

බලයලත් නිලධාරියෙකුගේ මගපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයෙහි සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාළ විමර්ශන කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය/ තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම යන විෂයයන් සම්බන්ධයෙන් ලබාගත් ප්‍රථම උපාධිය **සහ** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

### විමර්ශන නිලධාරී (නීති කටයුතු) (MA 5-2) II ශ්‍රේණිය

**රැකියා පිරිවිතරය**

බලයලත් නිලධාරියෙකුගේ මගපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයෙහි සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාළ විමර්ශන කටයුතුවලට අදාළ නීති කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීති උපාධිය **සහ** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

### විමර්ශන නිලධාරී (තොරතුරු තාක්ෂණ) (MA 5-2) II ශ්‍රේණිය

**රැකියා පිරිවිතරය**

බලයලත් නිලධාරියෙකුගේ මගපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයෙහි සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාළ තොරතුරු තාක්ෂණ කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය **සහ** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

**වැටුප් පරිමාණය**

MA 5-2-2016 රු. (36,850-10X755-15X930-5X1,135-64,025)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව ආරම්භක මාසික වැටුප් පියවර 38,850/= හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

**වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපවත්වනු ඇත.

**තෝරා ගැනීම**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**පොදු කොන්දේසි :**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදු කරනු ලැබේ.
- සියලුම තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලයේ ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**අයදුම් කිරීම :**

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2021 අප්‍රේල් 21 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි. ප. තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලු පාර, කොළඹ 03.**

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වාණිජ මුද්‍රණ, සුරක්ෂා මුද්‍රණ, ප්‍රකාශන, ලිපි ද්‍රව්‍ය හා අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අලෙවිකරණ කටයුතුවල නියැලී සිටින ලාභදායී වාණිජ සංවිධානයක් වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### MA 2-2 කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ කාර්මික සහකාර (විදුලි) iii ශ්‍රේණිය තනතුර

**රැකියා විස්තරය**

★ මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත සියලුම විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග අලුත්වැඩියාව, ගොඩනැගිලි සම්බන්ධ එකලා හා තෙකලා විදුලි පද්ධති අලුත්වැඩියාව, ආරක්ෂක ලාම්පු අනෙකුත් විද්යුත් උපකරණ විදුලි මෝටර් එතීමට අදාළ සියලු අලුත්වැඩියාව හා වායු සමීකරණ අලුත්වැඩියාවන් හා විදුලි විසන්ධි වීමකදී විදුලි ජනක යන්ත්‍ර ක්‍රියා කරවීම.

**සුදුසුකම් (බාහිර / අභ්‍යන්තර)**

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ Level 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද

හෝ

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ට (NVQ Level 4) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර (03) පළපුරුද්ද.

### MA 2-2 කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ කාර්මික සහකාර (මුද්‍රණ යන්ත්‍ර කාර්මික) iii ශ්‍රේණිය තනතුර

**රැකියා විස්තරය**

★ මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත සියලු යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කටයුතු ඉටු කිරීම

★ වෙල්ඩිං වැඩ ලේත් වැඩ හා මිලින් මැෂින් ක්‍රියාකරවීමේ හැකියාව

**සුදුසුකම් (බාහිර / අභ්‍යන්තර)**

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද

හෝ

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර (03) පළපුරුද්ද.

**වෙනත්**

★ දිගු සේවා මුරවල වැඩ කිරීමේ හැකියාව

★ රාත්‍රී මුරවල වැඩ කිරීමේ හැකියාව

★ ඵලදායිතා සංකල්ප වලට (5S, ISO, Kaizen) අනුකූලව වැඩ කිරීමේ හැකියාව විශේෂ සුදුසුකම් වේ.

**වැටුප් පරිමාණය**

MA 2-2 - Rs. 30310/- 10 x 300 - 7 x 350 - 4 x 600 - 20 x 710 - 52360/-

**වයස් සීමාව**

වයස අවුරුදු 18 නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ප්‍රායෝගික පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසු

**සේවා කොන්දේසි**

මෙය වසර 03 ක පරිවාස කාලයකට යටත් ස්ථිර පත්වීමක් වන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ පත්වීම වසර 01 ක පරීක්ෂණ කාලයකට යටත් කරනු ලැබේ.

**වැටුපට අමතරව පහත සඳහන් දීමනාද අයත් වේ.**

★ ජීවන වියදම් දීමනාව

★ පැමිණීමේ දිරි දීමනා

★ ආහාර දීමනා

**අනෙකුත් ප්‍රතිලාභ**

★ සේවකයා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් ආවරණය වන වෛද්‍යාධාර ක්‍රමය

★ වාර්ෂික ප්‍රසාද දීමනාව

★ සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ප්‍රතිලාභ

★ ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් වැටුප් ගෙවීම

**අයදුම්පත්‍ර එවිය යුතු ආකාරය**

අයදුම්කරුවන් විසින් ලිපිනය, දුරකථන අංකය සහ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර සමග සම්පූර්ණ කරන ලද අයදුම්පතක් අදාළ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල ඡායා පිටපත් සහිතව ලියාපදිංචි තැපැල් මගින් 2021.04.19 දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතු අතර, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනයන්හි සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,**
**පානළුව, පාදුක්ක.**

සුළු දැන්වීම් සඳහා නවතම ගාස්තු...

රු. 300/- රු. 500/- රු. 650/-

Sunday Observer ADZ it's what you want

ඔබගේ සුළු දැන්වීම ලඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

අනුරාධපුර - TEL : 025 22 22 370 FAX : 025 22 35 411 / මහනුවර - TEL : 081 22 34 200 FAX : 081 22 38 910

කෑගල්ල - TEL : 047 22 35 291 FAX : 047 22 35 291 / මරදාන - TEL : 011 2 429 336 FAX : 011 2 429 335

මාතර - TEL : 041 22 35 412 FAX : 041 22 29 728 / කුරුණෑගල - TEL : 011 2 828 114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 22 25 361 FAX : 021 22 25 361

011 2 429 383 / 011 2 429 342

011 2 429 347 / 011 2 429 343

සිළුමිණ JOBS
රැකියා අභිමේකය

## වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

## තේ පර්යේෂණ මණ්ඩලය

# පුරප්පාඩු

තලවකැලේ හි පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයෙහි පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

**රැකියා විස්තරය :**

අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත තේ පර්යේෂණ ආයතනයේ CF, CESS සහ වෙනත් දායක අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල සියලුම මූල්‍ය කටයුතු හා ක්‍රියාකාරීත්වයන් පිළිබඳ අධීක්ෂණ හා කළමනාකරණ කටයුතු පිළිබඳව වගකීම දැරිය යුතුය.

**බාහිර :**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) හි අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් වසර පහළොවක (15) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද (සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද)

**සටහන :** පරිගණක හා ගිණුම්කරණ වාතාවරණයක පළපුරුදු බව හා විවෘත බව විශිෂ්ට වාසියක් වනු ඇත.

**අභ්‍යන්තර අපේක්ෂකයින් :**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) හි අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම්

සහ

මධ්‍යම මට්ටමේ කළමනාකරුවෙකු ලෙස (M.M) 1 වන ශ්‍රේණියේ ගණකාධිකාරීවරයෙකු හෝ අභ්‍යන්තර විගණකවරයෙකු ලෙස අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : HM 1-3 (2016) රු. 86,865-15x2,270 රු. 120,915/- (මාසිකව)

**වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ඇත.

**තෝරාගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ :**

01. තලවකැලේ තේ පර්යේෂණ ආයතනයෙහි කුලී රහිත හා ගෘහ භාණ්ඩ සහිත නිල නිවාසයක් සපයනු ලැබේ.
02. ආයතනයෙහි පවත්නා වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ පවතින නීති රීති රෙගුලාසිවලට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවනු ඇත.
03. ආයතනයෙහි මාර්ගෝපදේශවලට අනුව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලේ ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.
04. **අර්ථසාධක අරමුදල :** තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් තේ. ප. ආ. සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් 10% ක් වශයෙන් දායක විය යුතු අතර, ආයතනය විසින් එම අරමුදලට වැටුපෙන් 15% ක් වශයෙන් සිය දායකත්වය ලබා දෙනු ඇත. තවද ආයතනය විසින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) වැටුපෙන් 3% ලෙස දායක වනු ඇත.
05. එක් ගෘහ සේවක කම්කරු ඒකකයක්ද සපයනු ලැබේ.
06. තේ පර්යේෂණ ආයතනයේ (TRI) හි, සේවකයින්ට අදාළවන වෙනත් ආන්තික ප්‍රතිලාභ හිමිවනු ඇත.

මෙම තනතුර ස්ථිර එකකි. අයදුම්කරුගේ සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ප්‍රකාශය (CV) ඇතුළත් අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක් සහ අදාළ අධ්‍යාපනික සහ වෙනත් වෘත්තීයවේදී සුදුසුකම් පිළිබඳ සහතිකපත්වල පිටපත් සහ සේවා සහතිකවල පිටපත් සහ අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා හා දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් හා ලිපිනද සමගින් 2021 අප්‍රේල් 19 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වන අතර, මෙම අවශ්‍යතාවයට පටහැනි හා අනුකූල නොවන අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

කරුණාකර වැඩිදුර තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ (TRI) වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බස්, තලවකැලේ.**

ඔබ කැමති පුවත්පත් කීපයකම
දැරිය හැකි මිලකට
ලුහුඬු දැන්වීමක්
පල දරන්න - පළ කරන්න
* වචන 15ක් සඳහා

| | | |
|---|---|---|
| SUNDAY OBSERVER ADZ + සිළුමිණ වටපිට | රු. 500/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| SUNDAY OBSERVER ADZ + Daily News | රු. 350/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| සිළුමිණ වටපිට + දිනමිණ | රු. 350/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| SUNDAY OBSERVER ADZ + வாரமஞ்சரி | රු. 400/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| සිළුමිණ වටපිට + வாரமஞ்சரி | රු. 400/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| Daily News + தினகரன் | රු. 250/- | - වැඩි වන වචනයක් සඳහා රු. 10/- |
| දිනමිණ + தினகரன் | රු. 250/- | - වැඩි වන වචනයක් සඳහා රු. 10/- |

ඔබගේ ලුහුඬු දැන්වීම අදම අප වෙත E-Mail කරන්න...
classified@lakehouse.lk
වැඩි විස්තර සඳහා අමතන්න -
පියුමි - 011 2 429 383 / රමණි - 011 2 429 347

SUNDAY OBSERVER සිළුමිණ වටපිට තරුණී
මංගල යෝජනා
පුවත්පත් කිහිපයක දැරිය හැකි මිලකට
SUNDAY OBSERVER රු. 560/-
සිළුමිණ වටපිට රු. 560/-
- ඔබ්සර්වර් පුවත්පතේ පළකරන මංගල යෝජනා දැන්වීම සිළුමිණ පුවත්පතේ පළකිරීම සඳහා අමතර රු. 200ක් පමණි.
- සිළුමිණ පුවත්පතේ පළකරන මංගල යෝජනා දැන්වීම තරුණී පුවත්පතේ පළකිරීම සඳහා අමතර රු. 300ක් පමණි.
චාමර - 0777 270 067

බුදුසරණ
දහම් පාසල




ලේක්හවුස් වෙතින්
බුදුසරණ
දහම් පාසල
ඔබේ දරුවාගේ
දහම් දැනුම
ඔප්නංවයි

සෑම මසකම
1 වැනිදා
නිකුත් වේ

LAKE HOUSE
ලේක්හවුස් ප්‍රකාශනයක්

සිළුමිණ The Silumina **Tender/OTHER ADVERTISEMENTS**

silumina.advt@lakehouse.lk 011 242 9351 - 071 782 9018

# ලංසු ආරාධනයයි

## ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ භාවිතයට ගත නොහැකි අයිතම විකණීම

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ භාවිතයට ගත නොහැකි භාණ්ඩ අලෙවිය සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටිනු ලැබේ.

| ප්‍රසම්පාදන හැඳුනුම් අංකය | විස්තරය | ලංසු අවසන් වන/විවෘත වන දිනය සහ වේලාව | නැවත නොගෙවනු ලබන ගාස්තුව (රු) |
|---|---|---|---|
| AHQ/20/PUB/MIS/1013 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ භාවිතයට ගත නොහැකි අයිතම විකිණීම. | 2021 අප්‍රේල් 20, පැය 1030 | 2,000.00 |

2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු (NCB) පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෙබ් අඩවිය වන **www.airforce.lk** වෙතින් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය පරීක්ෂා කළ හැකි අතර **2021 අප්‍රේල් 01** සිට **2021 අප්‍රේල් 19** තෙක් **පැය 1000** සිට **පැය 1400** දක්වා සෑම වැඩ කරන දිනකම කොළඹ, ශ්‍රී ලංකා ගුවන් හමුදා කොළඹ කඳවුරේ ප්‍රසම්පාදන අංශයට පැමිණ සරප් වෙත නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවා එය මිලදී ගත හැකිය. ගෙවීම් රිසිට්පත නොමැති ඉදිරිපත් කිරීම් පිළිගනු නොලැබේ.

4. පිටපත් දෙකකින් යුතු මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**" වෙත එවිය යුතු අතර නැතහොත් අවසන් දිනට පෙර ප්‍රධාන ආරක්ෂක කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. සේව්‍යයන්ගේ අවසර ලිපි සහ ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණීමට අවසර දෙනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වීමෙන් පසුව කිසිදු ලංසුකරුවෙකුට හෝ නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීමට සහභාගි වීමට ඉඩ දෙනු නොලැබේ.

5. ලංසු ලේඛන මිලදී ගත් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021 අප්‍රේල් 05** සිට **2021 අප්‍රේල් 09** දක්වා සෑම වැඩ කරන දිනයකදීම **පැය 0900** සහ **1500** අතර කාලයේදී කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ භාවිතයට ගත නොහැකි අයිතම පරීක්ෂා කළ හැකිය.

6. එක් එක් ලංසු ලේඛනය තුළ අයිතම විකිණීම සඳහා වන විශේෂ කොන්දේසි ලැයිස්තුගත කර ඇත. භාණ්ඩවලට අදාළ ගාස්තු එක් එක් අයිතමය සඳහා වෙන වෙනම "**මිල සැලසුම**" තුළ පමණක් දක්වා ඇත. ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන මිල ගණන් **2021 ඔක්තෝබර් 30** වන තෙක් වලංගු වෙන අතර කිසිදු හේතුවක් මත වෙනස් වීමකට ලක් නොවිය යුතු ය.

7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී (දුර 011-2325468 දිගුව 23550) ප්‍රසම්පාදන නිලධාරී ටෙන්ඩර (දුර 011-2441553 හෝ 011-2441044 දිගුව 23569, ෆැක්ස් 011-2441553 සහ 011-2347694) වෙතින් වැඩි දුර තොරතුරු ලබාගත හැකිය.

ඉහත සියලු කරුණු සඳහා පහත දැක්වෙන ලිපිනය භාවිතා කළ හැකිය :-

**ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී**
**ශ්‍රී ලංකා ගුවන් හමුදාව,**
**ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 1592,**
**කොළඹ 02.**

**ගුවන් හමුදාධිපති**

---

ආරක්ෂක අමාත්‍යාංශය

**ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**

# ලංසු ආරාධනයයි

**රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශ්‍රවණාගාරය සඳහා ගිනි හඳුනාගැනීම් සහ ආරක්ෂණ පද්ධතියේ දෝෂ වගකීම් කාල සීමාව තුළ සැපයුම් ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව**

**ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**
**කොන්ත්‍රාත් අංකය: KDU/PRO/RP&SERVICE(AUD)/2703/2021**

1. රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා, විශ්ව විද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස, රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශ්‍රවණාගාරය සඳහා ගිනි හඳුනාගැනීම් සහ ආරක්ෂණ පද්ධතියේ දෝෂ වගකීම් කාල සීමාව තුළ සැපයුම් ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

2. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021 අප්‍රේල් 05 සිට 2021 මැයි 19 තෙක් පැය 0900 සහ පැය 1500 අතර කාලයේදී රු.15,000.00ක නැවත ගෙවනු නොලබන ගාස්තුවක්** ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ මූල්‍යාධිකාරී වෙත මුදලින් ගෙවා අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිල දී ගත හැකි ය.

3. ඉහත ලිපිනයේදී **2021 අප්‍රේල් 05 සිට 2021 මැයි 19 දක්වා වැඩ කරන දිනවල දී පැය 0900 සිට පැය 1500 අතර කාලයේදී ගාස්තුවක් ගෙවීමකින් තොරව** ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය. (**දුරකථනය 071-0219449/ 071- 0219384 ෆැක්ස් 0112-632430**)

4. මුද්‍රා තබන ලද ලංසු, භාරගැනීමේ අවසන් දිනයට හා වේලාවට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු ය. නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ.

5. **2021 මැයි 20 දින පෙ.ව. 10.00 ට** රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී ටෙන්ඩර් භාරගැනීම අවසන් කර විවෘත කරනු ලැබේ.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙතින් වැඩි විස්තර ලබාගත හැකි ය. (**දුරකථනය 0710219449/0710219384/ 0112632430 ෆැක්ස් 0112-632430,** සහ www.kdu.ac.lk/ocls/tender-notices හි පළ කර ඇති "ලංසු ආරාධනය")

**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**
**රත්මලාන, ශ්‍රී ලංකාව.**

---

# ලංසු සඳහා ආරාධනයයි

## මොරටුව විශ්වවිද්‍යාලය

**2021 ජූනි මස සිට 2022 ජූනි මස දක්වා එක් වසරක කාල සීමාවක් සඳහා, බාහිර නේවාසිකාගාර සහ ඉඩම් සඳහා ආරක්ෂක සේවය ලබාදීම**

UM/GA/SEC/DPC-01/2021

01. මොරටුව විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ආරක්ෂක සේවාවන් සැපයීම සඳහා වලංගු වාර්ෂික බලපත්‍රයක් හිමි, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති පිළිගත් ආරක්ෂක සමාගම් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

02. අපේක්ෂිත සේවා කාලය 2021 ජූනි මස 10 වන දින සිට 2022 ජූනි මස 09 වන දින දක්වා එක් වසරක කාල සීමාවක් සඳහා වනු ඇත.

03. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වෙනු ඇත.

04. අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මොරටුව විශ්වවිද්‍යාලයේ සරප් වෙත, ආපසු ගෙවනු නොලබන රුපියල් 5,000/- ක ගාස්තුවක් ගෙවීමෙන් හා කටුබැද්ද, මොරටුව විශ්වවිද්‍යාලයේ, නියෝජ්‍ය ලේඛකාධිකාරී/ සාමාන්‍ය පරිපාලන වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්ද අනතුරුව මිලදී ගත හැකිය.

05. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට, අවශ්‍ය වැඩිදුර තොරතුරු මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ සාමාන්‍ය පරිපාලන වෙතින් (දූරකථන 011-2651593 ෆැක්ස් : 011-2650622) විමසා ලබා ගත හැකි වන අතර, ලංසු ලිපි ලේඛන කටුබැද්ද, මොරටුව විශ්වවිද්‍යාලයේ, නියෝජ්‍ය ලේඛකාධිකාරී/ සාමාන්‍ය පරිපාලන කාර්යාලයේදී 2021 අප්‍රේල් මස 05 වන දින සිට 2021 අප්‍රේල් මස 29 වන දින දක්වා කාර්යාලීය වේලාවන් තුළදී පරීක්ෂා කර බැලිය හැකිය.

06. ලංසුකරුවන්, පඩිපාලක සභා ආඥා පනත යටතේ වැටුප් ගෙවීම් සඳහා වන ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්, සේවක අර්ථ සාධක අරමුදල් (EPF) සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් (FTF) දායකත්වයන් වලට අනුගතව ක්‍රියා කළ යුතුය.

07. මුද්‍රා තබන ලද ලංසු, 2021 අප්‍රේල් මස 30 වන දින, පැය 14.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, පහත සඳහන් ලිපිනයට, භාර දීම හෝ, නියෝජ්‍ය ලේඛකාධිකාරී/ සාමාන්‍ය පරිපාලන කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ලංසු විවෘත කිරීම, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම, මොරටුව විශ්වවිද්‍යාලයේ, ලේඛකාධිකාරී කාර්යාලයට යාව ඇති පාලක මණ්ඩල කාමරයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී සිදු කරනු ලැබේ.

09. සියලුම ලංසු සමග ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින, පිළිගත් බැංකුවක් විසින් නිකුත් කරනු ලැබ ඇති, 2021 අගෝස්තු මස 27 වන දින දක්වා වලංගු රුපියල් 125,000.00 ක වටිනාකමින් යුත්, ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**මොරටුව විශ්වවිද්‍යාලය,**
**කටුබැද්ද, මොරටුව.**

2021-04-04

---

# ඔසු පියස

## ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) සම්බන්ධ පැමිණිලි, අදහස් හා යෝජනා ලබා ගැනීම

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය ස්ථාපිත කර ඇති අතර, අංක 2187/27 දරන 2020-08-09 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විවිධ පාර්ශව වෙතින් පැමිණිලි, අදහස් හා යෝජනා ඉදිරිපත් වෙමින් පවතින බව නිරීක්ෂණය වේ. ඒ අනුව මේ පිළිබඳ විධිමත් ලෙස කරුණු විමසා බැලීම සඳහා පැමිණිලි, අදහස් හා යෝජනා විශේෂ කමිටුවක් වෙත ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශ සහිත වාර්තාවක් ලබාගැනීමට මෙම රාජ්‍ය අමාත්‍යාංශය අපේක්ෂා කරයි. ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත ක්‍රියාත්මක වූ 2015-07-01 දින සිට 2021-03-17 දින දක්වා කාල සීමාව තුළ මෙම ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමර්ශනය කිරීමට මෙකී කමිටුවට බලය පැවරේ.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශව තම පැමිණිලි, අදහස් හා යෝජනා, මුද්‍රා තැබූ කවරයක බහා ලේකම්, ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය, "ඔසු පියස", HQ ගොඩනැගිල්ල - 5 වන මහල, නො. 464/A, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ 2021අප්‍රේල් මස 23 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ **"ජාතික ඖෂධ නියාමන අධිකාරිය සම්බන්ධ පැමිණිලි, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය,**
**"ඔසු පියස",**
**HQ ගොඩනැගිල්ල - 5 වන මහල,**
**නො. 464/A, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**

**දුරකථනය** : 011 2103211
**ඊ මේල්** : psrp.addsec2@health.gov.lk

සිළුමිණ Tender/OTHER ADVERTISEMENTS
සිළුමින The Silumina
silumina.advt@lakehouse.lk
011 242 9351 - 071 782 9018

# කතරගම

## නගරය අවට්න් දිගුකාලීන බදු හෝ කුලී පදනම යටතේ

ප්‍රමුඛ පෙළේ පෞද්ගලික බැංකුවක් සඳහා නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාමට සුදුසු නිවසක් අවශ්‍යව ඇත.

අදාළ නිවසේ පහත සඳහන් පහසුකම් හා අවශ්‍යතා තිබිය යුතුය.

**ස්ථානය** - නගරයට කි.මී.1ක් තුළ පහසුවෙන් ළඟාවීමේ හැකියාව.
**බිම් ප්‍රමාණය** - නිවස අවම වශයෙන් වර්ග අඩි 2000ක් (බිම් මහළ) සහ අවම කාමර 4ක් සමඟ නාන කාමර සහිත විය යුතුය.
**ප්‍රධාන මාර්ගයට මුහුණත** - අවම වශයෙන් අඩි 30කි.
**වාහන නැවැත්වීම** - අවම වශයෙන් වාහන 3ක් නැවැත්වීමට හැකි විය යුතු අතර පූර්ණ මාර්ග පහසුකම් සහිත විම.
**පහසුකම්** - නොකඩවා විදුලිය හා ජලය.
ඉහත පහසුකම් සපිරි ඇත්නම් මෙම දැන්වීම පලවීම සිට සති තුනක් ඇතුළත පහත සඳහන් විස්තර සහිතව පහත ලිපිනයට දැනුම් දෙන්න.

- පිහිටීම / නිවසේ විස්තර / අපේක්ෂිත කුලිය / නිවසේ වර්ණ ඡායාරූප / සම්බන්ධ කරගත යුතු අයගේ දුරකථන අංක

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සංචාරක නිවාස සඳහා - (කතරගම)" යනුවෙන් සඳහන් කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පරිශ්‍ර හා පරිපාලන
තැපැල් පෙට්ටිය - 2098
කොළඹ

---

# ලංසු ආරාධනයයි

# උක් පර්යේෂණ ආයතනය

## (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කරුදු. කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)

උක් පර්යේෂණ ආයතනයට අයත්ව ඇති පහත සඳහන් නවීකරණයන් සඳහා සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

| ලංසුපත් අංකය | කාර්යය | ICTA ශ්‍රේණිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|---|
| SRI/NCB/RPC/W/2021/01 | උඩවලව කාර්යාලයේ ශ්‍රවණාගාරය, භෝග පෝෂණ අංශය, වැසිකිළි හා කන්තලේ උප මධ්‍යස්ථානයේ මුර කුටිවල ඇලුමිනියම් දෙරවල්, ජනේල සවි කිරීම | F 1 | රු. 25,000.00 |
| SRI/NCB/RPC/W/2021/02 | උඩවලව කාර්යාලයේ ආර්ථික විද්‍යා, ජෛවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය, භෝග සම්පත් කළමනාකරණ අංශය හා පුස්තකාලය යන ස්ථානයන්හි ටයිල් ඇතිරීම | C 9 | රු. 11,000.00 |

**කොන්දේසි හා නියමයන් :**

01. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි ඉහත ශ්‍රේණියේ හෝ ඊට ඉහළ සැපයුම්කරුවන්, සේවාව සැපයිය යුතු අතර, අසාධු ලේඛනගත (Blacklist) කොන්ත්‍රාත්කරුවන් ලංසු ඉදිරිපත් නොකළ යුතුය.
02. 2021 අප්‍රේල් මස 05 වන දින සිට අප්‍රේල් මස 23 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා වැඩ කරන සතියේ දින වලදී ලංසු පතකට රු. 2,000.00 ක ආපසු නොගෙවන තැන්පතු මුදලක් උඩවලව සහ කොළඹ කාර්යාලයේදී ගණකාධිකාරී වෙත ගෙවා අදාළ ලංසුපත ලබාගත හැකිය.
03. ඔබ විසින් ලංසු ආරාධනයෙහි සඳහන් පරිදි ලංසු සුරැකුමක් (Bid Bond) (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින්) ලංසු පත (Bid Document) සමග ඉදිරිපත් කළ යුතුය.
04. 2021 අප්‍රේල් මස 27 වන දින ප.ව. 02.00 ට පෙර පහත ලිපිනයට අදාළ ලංසුපත එහි පිටපතක් (Original & Duplicate) සමග ලැබීමට සැලැස්විය යුතුය. මුද්‍රා තබන ලද මිල ගණන් එවන ලද කවරය වම්පස ලංසුවේ නම සහ අංකය පැහැදිලිව ලිවිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත් භාරගනු නොලැබේ.
05. අදාළ ලංසුපත් සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, උක් පර්යේෂණ ආයතනය, උඩවලව යන ලිපිනයට මුද්‍රා තබා ලියාපදිංචි තැපෑලෙන්, කුරියර් සේවාවෙන් හෝ අතේ ගෙනවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.
06. මුද්‍රා තබන ලද මිල ගණන් විවෘත කිරීම 2021 අප්‍රේල් මස 27 වන දින ප. ව. 02.00 ට උක් පර්යේෂණ ආයතනයේ උඩවලව කාර්යාලයේදී සිදු කරනු ලැබේ.
07. මෙම කාර්ය සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ යම් ආයතනයකට පැවරීම හෝ නොපැවරවීමේ අයිතිය උක් පර්යේෂණ ආයතනය සතු වේ.

**අදාළ වැඩිදුර විස්තර පහත දුරකථන අංක මගින් ලබාගත හැකිය.**
**047-4937342 - ප්‍රසම්පාදන නිලධාරී**

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**උක් පර්යේෂණ ආයතනය,**
**උඩවලව.**

**කොළඹ කාර්යාලය :**
**නො. 743/25, 04 වන පටුමග,**
**උතුරු තලංගම, මාලබේ.**
**දු. ක. 011-4389152**

---

## ශ්‍රී ලංකා පොලිසිය
## විශේෂ කාර්ය බලකාය

# ලංසු ආරාධනයයි (IFB)

## (ගොඩනැගිලි ඉදිකිරීම්)

01. අණදෙන නිළධාරී, විශේෂ කාර්‍ය බලකාය, අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 විසින් පහත ඉදිකිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති ලංසු කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාල පරිච්ඡේදය | ඇස්තමේන්තුගත වැඩ වටිනාකම (රු.මිලියන) | ලංසු බැදුම්කරයේ වටිනාකම (රුපියල්) | ICTAD හෝ CIDA ලියාපදිංචිය | ලංසු ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 01. | විශේෂ කාර්‍ය බලකාය කුරුණෑගල කඳවුරේ 60'x20' බැරැක්ක ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම. STF/B/C/03/2021 | දින 182 | මිලියන 7.4 | 112,107.00 | සී 7 හෝ ඉහළ | 2,500.00 |
| 02. | විශේෂ කාර්‍ය බලකාය කඩවත - ගෝනහේන කඳවුරේ ආපනශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම. STF/B/C/28/2021 | දින 120 | මිලියන 23 | 200,000.00 | සී 6 හෝ ඉහළ | 5,000.00 |

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ සිදු කරනු ලබයි.
03. මේ පිළිබඳ උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසු කරුවන්ට වැඩි විස්තර අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, විශේෂ කාර්‍ය බලකායේ අධ්‍යක්ෂ/ගොඩනැගිලි වෙතින් ලබා ගැනීමට හැකි අතර, **2021.04.05** වන දින සිට **2021.04.28** දින දක්වා ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වල **පෙ.ව. 09.00 සිට** ප.ව.**03.00 දක්වා** කාලය තුල ලංසු ලිපි ලේඛණ පරීක්ෂා කිරීමද සිදු කල හැකිය.
04. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසු කරුවන්ට අදාල කොන්ත්‍රාත්තුව ඉටුකිරීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසු කරුවන් විසින් ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ICTAD/CIDA) හා 1987 අංක 3 දරණ ප්‍රසිද්ධ කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. ඉදිරිපත් කරනු ලබන ලංසුව සමග මෙම ලියාපදිංචි සහතික පිටපත් නොතිබීම ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ. ලංසු කරුවන්ගේ නම ජාතික ප්‍රසම්පාදන කොමිසම් සභාවේ (National Procurement Commission) අසාදු ලේඛණයේ ඇතුලත්ව නොතිබිය යුතුය අමතර විස්තර ලංසු ලිපි ලේඛණ වල සපයා ඇත.
05. අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, විශේෂ කාර්‍ය බලකායේ අධ්‍යක්ෂ / ගොඩනැගිලි වෙත ලිඛිත අයදුම්පතක් සහ CIDA ලියාපදිංචිය ඉදිරිපත් කර මේ සදහා උනන්දුවක් දක්වන ලංසු කරුවන් හට ආපසු නොගෙවනු ලබන ඉහත වගුවේ සදහන් ලංසු ගාස්තුව ගෙවීමෙන් **2021.04.05** වන දින සිට **2021.04.28** දින දක්වා ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වල දී **පෙ.ව. 09.00 සිට ප.ව. 03.00** දක්වා කාලය තුල ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත ලංසු ලිපි ලේඛණ කට්ටලයක් ලබාගත හැක. එක් ආයතනයක් වෙත එක් ව්‍යාපෘතියක් සදහා එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.
06. ලංසු පිටපත් දෙකක් සහිතව ලංසු විවෘත කරනු ලබන **2021.04.29 වන දින ප.ව. 02.00 ට** හෝ ඊට පෙර අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, විශේෂ කාර්‍ය බලකාය මූලස්ථානයේ අධ්‍යක්ෂ/ ගොඩනැගිලි කාර්‍යාලයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරන වේලාවට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙලවර ඉහල ලංසු අංකය පැහැදිලිව සටහන්කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරණු ලැබේ, තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසු කරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී **2021.04.29** දින අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 විශේෂ කාර්‍ය බලකා මූලස්ථානයේ දේශණ ශාලාවේදී **ප.ව. 02.00** ට අදාල ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා සහභාගි වන ලංසු කරුගේ නියෝජිතයින් විසින් ලංසු කරුගෙන් ලිඛිත අවසරයක් අනිවාර්‍යයෙන්ම රැගෙන ආයුතුය. ලංසු කරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිදු නියෝජිතයකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගි නොකරනු ලැබේ.
07. ඉදිරිපත් කරනු ලබන ලංසු වල වලංගු කාලය ලංසු විවෘත කරන දින සිට **දින 91** විය යුතුය.
08. සියලුම ලංසු, ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.
    - i. ඇපකරයේ වටිනාකම ඉහත වගුවේ සදහන් පරිදි විය යුතුය.
    - ii. මහ බැංකුවේ අනුමත ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වානිජ බැංකුවක් වෙතින් ලබා ගන්නා ලද ඇපකරයක් හෝ ඉදිකිරීම් සඳහා සහතික කිරීමේ අරමුදල මගින් (CGF) ලබා ගන්නා ලද ඇපකරයක් විය යුතුය. ලංසු ඇපකරය ඉල්ලූ විට ගෙවන, සහ කොන්දේසි රහිත එකක් විය යුතු අතර ලංසු ලියකියවිලි වල දක්වා ඇති ආකෘතිය අනුව විය යුතුය.
    - iii. ලංසු ඇපකර අකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ 9 වන කොටසේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය.
    - iv. ලංසු ඇපකරය අණදෙන නිලධාරී / විශේෂ කාර්‍ය බලකාය නමින් විය යුතුය.
    - v. ලංසු ඇපකරයේ වලංගු කාලය **2021.04.29** සිට **2021.08.26** දක්වා විය යුතුය.
09. වැඩබිම් සංචාරයෙන් පසුව, **2021.04.19** වන දින **පැය 1000 ට** අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 විශේෂ කාර්‍ය බලකා මූලස්ථානයේදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වේ එයට ලංසු කරුවන්ගේ පැමිණීම අපේක්ෂා කෙරේ.
10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කල හැකි අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුයි.
11. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදු කල හැක.

**ලිපිනය.**
අධ්‍යක්ෂ / ගොඩනැගිලි,
විශේෂ කාර්‍ය බලකාය.
නො. 223, බෞද්ධාලෝක මාවත.
කොළඹ 07.

**දුරකථන අංක**
සෘජු දුරකථන අංකය - 011 2589784
පොදු දුරකථන අංක - 011 2500471 / 2589741 - 262
ෆැක්ස් අංකය - 011 2588499 / 2589784

**අණදෙන නිලධාරී,**
**විශේෂ කාර්ය බලකාය.**

---

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

# ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා ගැනීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (SLLDC) සංස්ථා වැඩබිම් සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රසම්පාදන කමිටුව විසින් 2021 වර්ෂය සඳහා අනුමත පහත සඳහන් මිල ගණන් යටතේ සැපයීමට හැකි සැපයුම්කරුවන්ට ආරාධනා කරනු ලබයි.

| අංකය | ගොඩනැගිලි ද්‍රව්‍ය | ප්‍රදේශය | අනුමත කියුබ් ඒකක මිල (රු.) |
|---|---|---|---|
| 1 | ABC මෙටල් | කොළඹ ප්‍රදේශය | 5,495.00 |
| 2 | | මුතුරාජවෙල සහ රාගම අවට | 5,900.00 |
| 3 | | මීගමුව හා කටුනායක අවට | 6,993.00 |
| 4 | ½" මෙටල් | කොළඹ ප්‍රදේශය | 5,425.00 |
| 5 | | මුතුරාජවෙල සහ රාගම අවට | 5,900.00 |
| 6 | | මීගමුව හා කටුනායක අවට | 7,163.00 |
| 7 | 6" x 4" කළුගල් | කොළඹ ප්‍රදේශය | 5,489.00 |
| 8 | | මුතුරාජවෙල සහ රාගම අවට | 5,818.00 |
| 9 | | මීගමුව හා කටුනායක අවට | 6,146.00 |
| 10 | 6" x 9" කළුගල් * මෙම 6" x 9" කළුගල් වලින් 10%ක් ප්‍රමාණයක් කුස්තුර වෙනුවෙන් අඩු කරනු ලැබේ | කොළඹ ප්‍රදේශය | 5,993.00 |
| 11 | | මුතුරාජවෙල සහ රාගම අවට | 6,372.00 |
| 12 | | මීගමුව හා කටුනායක අවට | 6,692.00 |
| 13 | ගල් කුඩු | කොළඹ ප්‍රදේශය | 6,700.00 |
| 14 | | මුතුරාජවෙල සහ රාගම අවට | 6,850.00 |
| 15 | | මීගමුව හා කටුනායක අවට | 8,238.00 |

1. ඉහත මිල ගණන් වල කැමැත්ත පළ කරන සැපයුම්කරුවන්, 2021 අප්‍රේල් මස 05 දින සිට 2021 අප්‍රේල් මස 27 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.30 අතර කාලය තුළ (වැඩ කරන දිනයන්හිදී) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම් හා ගබඩා), ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය වෙත ලිඛිත එකගතාවයක් ලිපියක් මගින් ඉදිරිපත් කල යුතුය.
2. බිල්පත් ඉදිරිපත් කර **දින 30ක්** ඇතුලත ගෙවීම් කරනු ලැබේ
3. මේ සදහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර විස්තර දුරකථන අංක +94 11 2866832 (නයෝමි පෙරේරා මිය - සැපයුම් නිලධාරී ) මගින් ලබා ගත හැක.

සභාපති,
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
වෙබ් අඩවිය: www.landdevelopment.lk

# සිළුමිණ Tender/OTHER ADVERTISEMENTS

சிழுமின The Silumina

silumina.advt@lakehouse.lk 011 242 9351 - 071 782 9018

---

ලංකා සතොස

දේශයට මිල නියම කරන්නා

වෙළඳ අමාත්‍යාංශය

## මිල ගණන් කැඳවීම

**ලංකා සතොස ලිමිටඩ් ලොරි සංචිතය සඳහා ප්‍රවාහන කළමනාකරණ පද්ධතියක් ලබා දීම**

ලංකා සතොස ලිමිටඩ් (ලසලි) ආයතනය වෙත වසරක කාලයක් සඳහා ප්‍රවාහන කළමනාකරණ පද්ධතියක් ලබාදීම සඳහා **සභාපති ලංකා සතොස ලිමිටඩ්**, විසින් ඒ සඳහා උනන්දුවක් දක්වන සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද යෝජනා කැඳවනු ලැබේ.

පහත අංග ආවරණය කළ යුතුය.
1.GPS (මූලික ආකෘතිය)
2.ප්‍රවාහන කළමනාකරණ පද්ධතිය

මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම මගින් අදාල ලංසු ලේඛන, **රු. 1,000.00 ක මුදලක් (ආපසු නොගෙවන) ගෙවා 2021 අප්‍රියෙල් 05 දින සිට 2021 අප්‍රියෙල් 19 වන දින දක්වා** කාලය තුළ අංක 27, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටි ලංකා සතොස ප්‍රධාන කාර්යාලයේ මිල දී ගැනීම් අංශයෙන් (3 වෙනි මහල) ලබා ගත යුතුය.

පූර්ව ලංසු සාකච්ඡාව **2021 අප්‍රියෙල් 08** වන දින **පෙ.ව. 11.00ට** පැවැත්වේ.

ඉදිරිපත් කරන මිල ගණන්, **2021 අප්‍රියෙල් 19 වෙනි දින ප.ව. 01.00 ට හෝ ඊට පෙර**, ලංකා සතොස ලිමිටඩ්, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම ලිපිනයෙහි, මිල දී ගැනීම් අංශයෙහි (3 වන මහල) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. මුද්‍රා තබන ලද මිල ගණන් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ලංකා සතොස ලිමිටඩ් වෙත ප්‍රවාහන කළමනාකරණ පද්ධතියක් ලබාදීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

සියලුම ලංසුකරුවන් විසින් මිලදීගනු ලබන ලංසු ලේඛනය සමග ඇති **"ලංසු සුරක්ෂණ ප්‍රකාශය"** සඳහා වූ ආකෘති පත්‍රය සම්පූර්ණ කර ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

මිල ගණන් භාරගැනීම **2021 අප්‍රියෙල් 19 වෙනි දින ප.ව. 1.00 ට** අවසන් වන අතර මිල ගණන් විවෘත කිරීම, මිලගණන් භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේ සිදු කරනු ඇත. ජයග්‍රාහී ලංසුකරු විසින් (ලියාපදිංචි සැපයුම්කරුවන් හැර) ලියාපදිංචි ගාස්තු වශයෙන් **රු. 5,000/- ක මුදලක් සහ 3%ක වැට් මුදලක්** (ආපසු නොගෙවන) ගෙවිය යුතු අතර ... **10%ක මුදලක් කාර්යසාධන සුරක්ෂිතයක් (ආපසු ගෙවන)** ලෙස ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා පහත නිලධාරියා අමතන්න.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මිල දී ගැනීම්, ලසලි - 071 1506120

ටෙන්ඩරය/කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවසන් තීරණය, **ලංකා සතොස ලිමිටඩ් සභාපති සතු වේ.**

**ලංකා සතොස ලිමිටඩ්,
අංක 27, සතොස මහලේකම් කාර්යාලය
ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02**

---

# ලංසු සඳහා ආරාධනයයි

## කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම - අභ්‍යන්තර කාර්යයන්, අදියර 1**

**(MD/MR/C/36/2019-1)**

1. කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රු. මිලියන 18.0 ඇස්තමේන්තුගත පිරිවැයක් (VAT හැර) සහිත කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම – අභ්‍යන්තර කාර්යයන්, අදියර 1 (MD/MR/C/36/2019-1) සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ. 2021 අප්‍රේල් 29 දින ප.ව 2.30 ට ලංසු භාර ගැනීම අවසන් කෙරේ.
   - ♦ ප්‍රමාණ පත්‍රිහි විස්තර කොට ඇති පරිදි පවත්නා පාටිෂන් හා ගඩොල් බිත්ති කඩා බිඳ ඉවත් කරලීම, ටයිල් වැඩ, ඇලුමිනියම් හා ලෝහ පාටිෂන් වැඩ, නැවත විදුලි රැහැන් ඇදීම, අවශ්‍ය ගඩොල් හා කොන්ක්‍රීට් වැඩ සහ පිංතාරු වැඩ වලින් කාර්යයන් සමන්විත වේ.
   - ♦ ඉදිකිරීම් කාලය කැලැන්ඩර් දින 180 කි.
2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙවනු ලැබේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත වූවකු නොවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

   **අවශ්‍ය ඉක්ටැඩ් ලියාපදිංචිය**

   අ) **විශේෂත්වය** : සමාන ස්වභාවයේ හා සංකීර්ණත්වයේ වැඩ කාර්යයන් අඩු තරමින් එකක්වත් පසුගිය වසර තුළ සම්පූර්ණ කර පළපුරුද්ද (මෙම අවශ්‍යතාවය හා අනුගත වීමට ඉදිරිපත් කරන වැඩ අඩුතරමින් 80% ක් වත් සම්පූර්ණ කර තිබිය යුතුය)

   ආ) ශ්‍රේණිය C6 හෝ C5 (මූල්‍ය චක්‍රලේඛ 3/2020 පරිදි)
4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය අවශ්‍යතාවයන්ට පහත සඳහන් දෑද ඇතුළත් වේ.
   - ♦ රු. 13,000,000.00 වටිනාකමැති සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් අඩු තරමින් එකක් වත් සම්පූර්ණ කළ පළපුරුද්ද.
   - ♦ පසුගිය වසර පහ තුළ ඉටුකළ ඉදිකිරීම් කොන්ත්‍රාත්වල වාර්ෂික පරිමාවේ සාමාන්‍ය රු. 57,000,000.00 විය යුතුය.
   - ♦ ණය පහසුකම් අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් හැර සහ කොන්ත්‍රාත්තුව යටතේ ගෙවන ලද යම් අත්තිකාරම් හැර අවම ප්‍රමාණය රු. 9,600,000.00 ට නොඅඩු විය යුතුය.
5. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ප්‍රාග්ධන වැඩ හා සැලසුම්, වෙතින් ලබාගත හැකි අතර, කාර්යාල දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා** නියෝජ්‍ය ලේඛකාධිකාරී / ප්‍රාග්ධන වැඩ හා සැලසුම් කාර්යාලයෙන් ලංසුකරණ ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.
6. කොළඹ විශ්වවිද්‍යාලයේ, නියෝජ්‍ය ලේඛකාධිකාරී, ප්‍රාග්ධන වැඩ හා සැලැසුම් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රුපියල් පන්දහස් පන්සියයක (රු. 5,500.00) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ආපසු නොගෙවන ගාස්තුව, යොමු අංක 505170600013 ගෙන විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ගිණුමට ගෙවිය හැකිය. **2021.04.05 දින සිට 2021.04.28 දින දක්වා ප.ව. 2.30** තෙක් මිලදී ගත හැකිය. ඉහත සඳහන් ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ පසු පමණක් ලංසුකරණ ලිපලේඛන නිකුත් කෙරෙනු ඇත.
7. ලංසු විවෘත කරන දින සිට **දින 119 ක්** දක්වා (2021 අගෝස්තු 29 දින දක්වා) වලංගු විය යුතුය.
8. සියලුම ලංසු සමග රුපියල් එක් ලක්ෂ අනූ දෙදහසක (රු. 192,000.00) ලංසු සුරක්ෂණයක් (ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුම කළ වාණිජ බැංකුවකින් කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති නමට නිකුත් කළ **දින 119 ක්** දක්වා ((2021 අගෝස්තු 26 දින දක්වා) වලංගු කොන්දේසි විරහිත ඒක්ෂණ බැංකු ඇපකරයක්) ඉදිරිපත් කළ යුතුය.
9. ලංසුකරණ ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘතිපත්‍ර මගින් මුද්‍රා තැබූ ලංසු ඉදිරිපත් කළ යුතුය. යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් අනුපිටපත හා ලංසු සුරක්ෂණය සමග මුද්‍රා තැබූ මුල් කවරයක/ ඇසුරුමක බහා එක් එක් කවරයේ/ ඇසුරුමේ වම් ඉහළ කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුය. (ලංසු සුරක්ෂණය ලංසුකරණ ලිපිලේඛන මුල් පිටපත සමග ඉදිරිපත් කළ යුතුය.)
10. පූර්ව – ලංසු රැස්වීම **2021 අප්‍රේල් 20 දින පෙ.ව. 10.30 ට** කොළඹ 03, කුමාරතුංග මුනිදස මාවත, කොලේජ් හවුස් හි අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වේ.
11. මුද්‍රා තැබූ ලංසු, **2021 අප්‍රේල් 29 දින ප.ව. 2.30** ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් ලේඛකාධිකාරී කාර්යාලය අසල කොලේජ් හවුස් හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ පසු ලංසු භාර නොගැනේ.
12. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොලේජ් හවුස්හි අධ්‍යක්ෂ මණ්ඩල කාමර අංක 1 දී ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.
13. යම් ලංසුවක් හෝ ලංසු සියල්ලම හෝ කිසිදු හේතු දැක්වීමකින් තොර භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුවන අතර, එම තීරණය අවසාන හා නියත වනු ඇත.

**සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කොළඹ විශ්වවිද්‍යාලය,
94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.**

---

## ආරක්ෂක අමාත්‍යාංශය

# ලංසු කැඳවීම

**හෘද සහ උරස් සංකටක දැඩි සත්කාරක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම
රිජ්වේ ආර්‍ය ළමා රෝහළ කොළඹ - 08
(ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම)
කොන්ත්‍රාත් අංකය : MOD/SLN/02/2021**

1. **රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද සහ උරස් සංකටක සත්කාර සංකීර්ණයේ ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම** සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා අංක 15/5, බාලදක්ෂ මාවත කොළඹ 03 හි ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු සභාපතිතුමා වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා ආරාධනා නිකුත් කෙරේ. ඇස්තමේන්තුගත මුදල **රුපියල් මිලියන එකසිය පනස් පහකි (රු.මි. 155)** (අවිනිශ්චිතතා සහ බදු සහිතව). නිමකිරීමේ කාලය ලිත් දින 244 කි. ඉදිකිරීම් පරිශ්‍රය කොළඹ 08, රිජ්වේ ආර්යා ළමා රෝහල පරිශ්‍රයේ පිහිටා ඇත.
2. ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටියට (NCB) අනුව ලංසු තැබීම සිදු කරනු ලැබේ.
3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසුකරුවන් අසාදු ලේඛන ගත කර නොතිබිය යුතු අතර පහත සඳහන් සුදුසුකම් හා නිපුණතා නිර්ණායක සපුරාලිය යුතුය.

   අ) ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගිනි හඳුනා ගැනීම, ආරක්ෂණය කිරීම සහ මර්ධනය කිරීම **(FDPS& EM )1** ශ්‍රේණිය සඳහා ලියාපදිංචි වී තිබිය යුතුයි.

   ආ) පසුගිය වසර පහ තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් **රුපියල් මිලියන 350** ක් විය යුතුය.

   ඇ) තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය බැදීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර **රුපියල් මිලියන 77** ට විය යුතුය.

   ඈ) පසුගිය වසර පහ තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් සමාන ස්වභාවයකින් හා සංකීර්ණත්වයකින් යුතු ගොඩනැගිලි ව්‍යාපෘතියක් සඳහා ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය ඉදිකිරීමේ පළපුරුද්ද.

   ඉ) පහත සඳහන් කාර්යය මණ්ඩලය ද කොන්ත්‍රාත්කරු සතු විය යුතුය.

   - ■ යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - අර්ධ කාලීන) - විද්‍යාවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 2ක පළපුරුද්ද
   - ■ සහයක යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - පූර්ණ කාලීන) - ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ජාතික සහතික පාඨමාලාව (NDES) හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 3ක පළපුරුද්ද.
4. අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් **05/04/2021** දින සිට **03/05/2021** දින දක්වා වැඩකරන දිනයන්හි **පැය 0900 - පැය 1500** දක්වා අතරතුර ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය (බිම් මහල), ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 හිදී ලිඛිත අයදුම්පත්‍රයක් සහ ආපසු නොගෙවන **රුපියල් 30,000.00 ක (බදු රහිත)** ගාස්තුවක් ගෙවීමෙන් මිල දී ගත හැකිය. මුදල් ගෙවීම මුදලින්ම කල යුතුවේ.
5. ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි අතර සහ ලංසු කැඳවීමේ අදාළ ලේඛන ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය (බිම් මහල), ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 3 යන ලිපිනයෙන් **05/04/2021** සිට **03/05/2021** දක්වා ඕනෑම වැඩ කරන දිනයක **පැය 0900** සිට **පැය 1500** දක්වා මුදල් ගෙවීමකින් තොරව ලබාගත හැකිය.

   අධ්‍යක්ෂක ජෙනරාල් ඉංජිනේරු,
   නාවික හමුදා මූලස්ථානය ,
   ධජ වීදිය,
   කොළඹ 01.

   දුරකථන අංක - 011 7194211
   ෆැක්ස් - 011 2441456
   විද්‍යුත් තැපෑල - nhqdge@gmail.com

ලංසු **03/08/2021** දින දක්වා (ලංසු අවසන් වන දින සිට දින 91ක්) වලංගු විය යුතුය.

6. ලංසු ඇපකරය, **රුපියල් 2,300,000.00** වටිනා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් අනුමත ආකෘතියෙන් යුක්ත එකක් විය යුතුය.
7. අදාල ලංසු ඇපකරය, ලංසු අවසාන වන දිනයේ සිට **31/08/2021** දින දක්වා (දින 119 ක්) වලංගු විය යුතුය.
8. මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් **20/04/2021** වන දින **පැය 1030ට** කොළඹ 08 රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී පැවැත්වේ.
9. ලංසු මුල් පිටපත හා දෘඩ පිටපත (Hard Copy) එකකින් (01) ඉංග්‍රීසි බසින් සම්පූර්ණ කර ලංසු භාරගන්නා අවසාන වේලාව වන **04/05/2021** වන දින **1400 පැයට** හෝ ඉන් පෙර කොලඹ 03, බාලදක්ෂ මාවතේ, නො.15/05, ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ අතින් ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කල යුතුය. ලංසු ඇසුරුම් වල පිටත ලිපි කවරයේ ප්‍රසම්පාදනයේ යොමු අංක පැහැදිලිව සටහන් කල යුතුය.
10. නියමිත දිනට නොලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම ලංසු කැඳවීම අවසන් වූ වහාම **04/05/2021** දින **පැය 1400** ට පැමිණීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලැබේ. ලංසුකරු හැර ඔහුගේ නියෝජිතයකු සහභාගි වන්නේනම් ලංසුකරුගේ අනුමැතිය ලත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.ලංසුකරු විසින් ටෙන්ඩර් විවෘත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින තුනකට පෙර ටෙන්ඩර් විවෘත කිරීම සඳහා සහභාගිවන පුද්ගලයාගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ද ලංසුකරුට උපදෙස් දෙනු ලැබේ.
11. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) සතු වේ.
12. මෙම පුවත්පත් දැන්වීම ශ්‍රී ලංකා නාවික හමුදා වෙබ් අඩවිය **www.navy.lk** සහ ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය **www.defence.lk** මගින්ද නිරීක්ෂණය කල හැක.

**සභාපති,
අමාත්‍යාංශ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය (බිම් මහල),
ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03.**

---

# පහත සඳහන් ධාන්‍ය වර්ග මිලදී ගනු ලැබේ

• බඩ ඉරිඟු • උඳු • මුං ඇට • කව්පි • කුරක්කන්

**අමතන්න: 0707 906 906
0707 706 706**

---

# මිල ගණන් කැඳවීම

**POC (Push-to-talk Over Cellular) IP Radio Set (GSM)
මාසික කුලී පදනම මත ලබා ගැනීම**

**සී/ස එල්ආර්ඩීසී සේවා (පුද්) සමාගම**

2021 වර්ෂය සඳහා එල්ආර්ඩීසී සේවා (පුද්) සමාගමේ සභාපති, ප්‍රසම්පාදන කමිටුව විසින් රැකියා කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා POC (Push-to-talk Over Cellular) IP Radio Set (GSM) මාසික කුලී පදනම මත අවුරුද්දක කාල සීමාවක් සඳහා මිලදී ගැනීමට මුද්‍රා තබන මිල ගණන් කැඳවනු ලැබේ.

සම්පූර්ණ ලංසු ලිපි ලේඛන පරීක්ෂාකර බලා ලිඛිත ඉල්ලීම් පත්‍රයක් කළමනාකරු (මුදල්) වෙත ඉදිරිපත් කර, එක් සැපයුමක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2000/- මුදලක් (මුදලින් පමණක්) ගෙවා 2021 අප්‍රේල් 07 වන දින සිට 2021 අප්‍රේල් 28 වන දින 14.00 පැය දක්වා ගිණුම් අංශයෙන් ලබා ගත හැකිය.

මුද්‍රා තබන ලද ලංසු ලියුම් කවරයක බහා, වම්පස ඉහළ කෙළවර ප්‍රසම්පාදන විෂය නම සහ අංකය සඳහන් කර, පහත ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන පරිදි එවීමට හෝ ගිණුම් අංශයේ තබා ඇති නියමිත ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුයි.

ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාව 2021 අප්‍රේල් 28 වන දින 14:00 පැයට පෙර. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදිනම 14.00 පැයට, ලංසු භාරගත් විගස, ලංසු විවෘත කරනු ලැබේ.

ලංසු සම්බන්ධ වැඩිදුර විස්තර දුරකථන අංක 0112 053 251 වෙතින් ලබා ගත හැකිය.

සභාපති, ප්‍රසම්පාදන කමිටුව
LRDC සේවා (පුද්ගලික) සමාගම
අංක 88/10, ...
දුරක: 0112 861 848/ 860 083/ 083
වෙබ්: www.lrdcservices.lk

---

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ආපනශාලා පවත්වාගෙනයාම සඳහා අවම වශයෙන් අවුරුදු තුනකවත් ආපනශාලා පවත්වාගෙනයාම පිළිබඳව පළපුරුද්දක් ලබා ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

01. දුටුගැමුණු ආපනශාලාව (මිහින්තලේ පරිශ්‍රය)
02. ව්‍යවහාරික විද්‍යා පීඨ ආපනශාලාව (මිහින්තලේ පරිශ්‍රය)
03. ප්‍රධාන ආපනශාලාව (මිහින්තලය පරිශ්‍රය)
04. සංඝමිත්තා කාන්තා නේවාසිකාගාර ආපනශාලාව (මිහින්තලය පරිශ්‍රය)
05. කෘෂි විද්‍යාපීඨ මහාචාර්ය උපසේන ආපනශාලාව (පුලියන්කුලම පරිශ්‍රය)
06. වෛද්‍ය හා සමාන්තර විද්‍යාපීඨ ආපනශාලාව (සාලියපුර පරිශ්‍රය)

ඉහත අංක 01 සිට 06 දක්වා සඳහන් ආපනශාලාවන් සඳහා තෝරාගනු ලබන කොන්ත්‍රාත්කරු හට,

- විදුලිය, ජලය, උපකරණ හා ආපනශාලා කොන්ත්‍රාත්කරු සහ ඔහුගේ සේවකයින් සඳහා නවාතැන් පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සපයනු ලැබේ.

ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු රුපියල් 3,500/- ක මුදල හා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තු රු. 3,000/- ක මුදල ගෙවීමෙන් 2021.04.05 දින සිට සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යසේවා අංශයෙන් ලංසු ලිපි ලේඛන ලබා ගත හැකිය. මිල ගණන් ඉදිරිපත් කරන අයිතමය පැහැදිලි ලෙස කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන හා ටෙන්ඩර් ඉල්ලුම්කරුගේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

මුද්‍රා තැබූ ලංසු **ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ,** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැක.

**2021.04.21 දින පස්වරු 02.00** ට ප්‍රථම ටෙන්ඩර්පත් ලැබීමට සැලැස්විය යුතු අතර, පස්වරු 2.00 ට පසුව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් කිසිවක් භාරගනු නොලැබේ.

මිහින්තලේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කාර්යාලයේ **2021.04.21 වන දින පස්වරු 02.15** පැයට ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට එම අවස්ථාවට සහභාගි වන ලෙසට ඉල්ලීමක් කෙරේ. වැඩිදුර විස්තර ලබා ගැනීමට හෝ කරුණු පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වෙතොත් මෙම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සේවා අංශයේ **සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා)** වෙතින් පහත සඳහන් දුරකථන අංකයෙන් විස්තර ලබාගත හැකිය. **(දුරකථන අංකය 025-2266577)** මෙම කරුණු සම්බන්ධව විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
2021.04.04**

# මංගල යෝජනා

දශක ගණනාවක විශ්වසනීය සේවාව...



වචන 15ක් සඳහා රු. 560/-
(වැඩි වන වචනයකට රු. 23/-)

SUNDAY OBSERVER වචන 15ක් සඳහා රු. 560/-
(වැඩි වන වචනයකට රු. 23/-)

வாரமஞ்சரி වචන 15ක් සඳහා රු. 100/-
(වැඩි වන වචනයකට රු. 10/-)

දිවයින පුරා

ගාල්ල ............ 071 9 699 400
පරණගම ට්‍රේඩ් සෙන්ටර් - නො. 28, ටී ඇන්ඩ් ජේ සිටි, ගාමිණී මාවත, ගාල්ල.

අම්බලන්ගොඩ ............ 076 6 537 887
නො. 264, සමූපකාර මන්දිරය, පුංචි පොළ පාර, මහවීදිය, අම්බලන්ගොඩ.

පානදුර ............ 077 3 403 256
නො. 27/ඒ, වීරමන් පාර, පානදුර.

කළුතර ............ 071 8 074 666
පවර පොත් හල, වානිජ සංකීර්ණය, දුම්රිය පොල පාර, කළුතර දකුණ.

කලගෙඩිහේන ............ 077 0 693 989
ජේ. එම්. සී. එන්ටප්‍රයිසස්, 12/ ඩී/ 1, මංගලතිරිය පාර, කලගෙඩිහේන.

ජා-ඇල ............ 071 8 571 713
නො. 42/ ඒ, පරණ මීගමු පාර, ජා-ඇල.

දෙල්ගොඩ ............ 072 7 942 943
නො. 05, පූගොඩ පාර, දෙල්ගොඩ.

බෝපිටිය ............ 077 6 218 099
බෝපිටිය හංදිය, පමුණුගම.

ගම්පහ ............ 077 6 697 567
හේමාස් පොත්හල - සී. බී. එස්. 12, 13, 14, ඔරුතොට පාර, ගම්පහ

කිරිඳිවැල ............ 077 2 047 350
චන්දන නිව්ස් සෙන්ටර් - රදාවාන පාර, කිරිඳිවැල.

නිට්ටඹුව ............ 033 2 287 847
ගංගා ට්‍රේඩ් සෙන්ටර් - නො. 134, නුවර පාර, නිට්ටඹුව.

කඳාන ............ 071 9 115 499
ජයබිම ස්ටෝර්ස්, 105, දුම්රියපොල පාර, කඳාන.

කඩවත ............ 011 2 929 640

නයිවල ............ 033 2 288 143

සීදූව ............ 011 2 257 205

මල්වාන ............ 011 2 487 560

උඩුගම්පොල ............ 033 2 224 791

කිරිබත්ගොඩ ............ 011 2 906 695

වත්තල ............ 011 2 947 379

කොච්චිකඩේ ............ 077 9 767 192

ගම්පහ ............ 077 6 697 567
හේමාස් පොත්හල - සී. බී. එස්. 12, 13, 14, ඔරුතොට පාර, ගම්පහ

කිරිඳිවැල ............ 077 2 047 350
චන්දන නිව්ස් සෙන්ටර් - රදාවාන පාර, කිරිඳිවැල.

නිට්ටඹුව ............ 033 2 287 847
ගංගා ට්‍රේඩ් සෙන්ටර් - නො. 134, නුවර පාර, නිට්ටඹුව.

ජා-ඇල ............ 011 2 237 395
නො. 73, මහ වීදිය, ජා-ඇල.

මීගමුව ............ 071 4 804 355

තොරණ හංදිය ............ 078 6 573 012
නො. 696, තොරණ හංදිය, කැලණිය.

මොනරාගල ............ 076 6 565 653

මාතර ............ 047 2 230 093

තඹුත්තේගම ............ 025 2 276 431

අනුරාධපුර ............ 025 2 221 441

අනුරාධපුර ............ 025 2 222 806

අනුරාධපුර ............ 025 2 222 575

රත්නපුර ............ 071 2 900 35

රත්නපුර ............ 045 2 223 883

මිද්දෙණිය ............ 047 2 27 245

classified@lakehouse.lk
011 2 429 342 | 011 2 429 343
Fax - 011 2 429 375 / 011 2 429 380


# සිළුමිණ Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk
011 242 9351 - 071 782 9018

---

SriLankan Catering

## කොන්ත්‍රාත් පදනම මත මිනිස්බල සේවා සැපයීමේ රැකියා ඒජන්තවරු බඳවා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනයි

SLC/PRO/SER/2021/005

ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් 2021-2022 වසර සඳහා කොන්ත්‍රාත් පදනම මත මිනිස්බල සේවා සැපයීමේ රැකියා ඒජන්තවරු (කෝකිවරු - (Commis III Level) සහ වේටර්වරු- (Junior Steward Level) බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ලංසු ලියවිලි 2021 අප්‍රේල් 06 දින සිට http://www.srilankancatering.com/procurement-notices යන ශ්‍රීලංකන් කේටරින් නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.


මුද්‍රා තබාගලද ලංසු පත්‍රිකා 2021 අප්‍රේල් 27 දින පෙරවරු 10.30 ට පෙර පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුය.

ප්‍රධාන විධායක නිලධාරී,
**ශ්‍රීලංකන් කේටරින් සමාගම,**
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක, ශ්‍රී ලංකාව.

වැඩිදුර විස්තර සඳහා (තිලිණ)
දුරකථන අංකය: - +94-019-7334241
ෆැක්ස්: - +94-019-7334142
විද්‍යුත් ලිපිනය- thilina.siriwardana@srilankancatering.com

---


BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT

LAKE HOUSE


---

# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ට'මිනල්ස් ලිමිටඩ්

**2021 සිංහල/ දෙමළ අලුත් අවුරුදු නිවාඩු කාල සීමාවේදී ඉන්ධන බෙදාහැරීම් ක්‍රියාවලිය පහත දැක්වෙන අයුරින් සිදුකරනු ලැබේ**

| දිනය | | ඇණවුම් භාර ගැනීම | බෙදාහැරීම |
|---|---|---|---|
| | | කොළොන්නාව නිමාව, මුතුරාජවෙල පර්යන්තය සහ තොග ගබඩා | කොළොන්නාව නිමාව, මුතුරාජවෙල පර්යන්තය සහ තොග ගබඩා |
| 2021/04/10 (සෙනසුරාද) | | 11 වන ඉරිද දිනට නිකුත් කිරීමට ඇති ඇණවුම් ප.ව. 14.00 තෙක් භාර ගනු ලැබේ | සාමාන්‍ය පරිදි බෙදහැරීම් කටයුතු සිදු කරනු ලැබේ. |
| 2021/04/11 (ඉරිද) | | 12 වන සඳුද දිනට නිකුත් කිරීමට නියමිත ඇනවුම් ප.ව. 12.30 තෙක් භාර ගනු ලැබේ. | සාමාන්‍ය පරිදි බෙදහැරීම් කටයුතු සිදු කරනු ලැබේ. |
| 2021/04/12 (සඳුද) | | 13 වන අඟහරුවාද දිනට අත්‍යවශ්‍ය සේවා සඳහා පමණක් නිකුත් කිරීමට නියමිත ඇනවුම් ප.ව. 12.30 තෙක් භාර ගනු ලැබේ. | සාමාන්‍ය පරිදි බෙදහැරීම් කටයුතු සිදු කරනු ලැබේ. |
| 2021/04/13 (අඟහරුවාද) | සිංහල/ දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දින | 15 වන බ්‍රහස්පතින්ද දිනට නිකුත් කිරීමට නියමිත ඇනවුම් ප.ව. 12.30 තෙක් භාර ගනු ලැබේ. | අත්‍යවශ්‍ය සේවා සඳහා පමණක් ඉන්ධන බෙදහැරීම් සිදු කරනු ලබයි. |
| 2021/04/14 (බදාද) | සිංහල/ දෙමළ අලුත් අවුරුදු දින | වසා ඇත | වසා ඇත |
| 2021/04/15 (බ්‍රහස්පතින්ද) | | 16 වන සිකුරාද සිට ඉදිරියට ඇති දින සඳහා සාමාන්‍ය පරිදි ඇණවුම් භාරගනු ලැබේ. | සාමාන්‍ය පරිදි බෙදහැරීම් කටයුතු සිදු කරනු ලැබේ. |

**බෙදාහැරීම් කළමනාකාර, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ට'මිනල්ස් ලිමිටඩ්.**

**කොළොන්නාව**

| | බෙදාහැරීම් කාර්යාලය | ප්‍රවාහන කාර්යාලය | ඇණවුම් අංශය | මුතුරාජවෙල බෙදාහැරීම් කාර්යාලය |
|---|---|---|---|---|
| දුරකථන | 011-2572336<br>011-2572158 | 011-2531324 | 011-2696542<br>011-2532131<br>011-5668472 | 011-5668959<br>011-5355546<br>011-3193924/9 |
| ෆැක්ස් | 011-2572380 | | 011-2389136<br>011-2531325 | 011-5950136 |

---

# ප්‍රසම්පාදන දැන්වීම

## ආරක්ෂක අමාත්‍යාංශය

## සංශෝධිත ප්‍රසම්පාදන දැන්වීම
## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 2021 වර්ෂය

01. 2021 වර්ෂය තුළ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙත පහත සඳහන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා අංක 15/5 බාලදක්ෂ මාවත, කොළඹ 03 අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2021 මාර්තු මස 14 වන දින සිළුමිණ, සන්ඩේ ඔබ්සර්වර්, තිණකරන් පුවත්පත්වල පළකරන ලද ප්‍රසම්පාදන දැන්වීමෙහි ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන අවසන් දිනය සහ ටෙන්ඩර් විවෘත කරන දිනය සහ වේලාව පහත සඳහන් පරිදි සංශෝධන කර ඇති බැව් දැනුම් දෙනු ලැබේ.

| අනු අංකය | ටෙන්ඩර් හඳුනාගැනීමේ අංකය | විස්තරය | දේශීය/ විදේශීය | ප්‍රමාණය | ලංසු වැසීම හා විවෘත කරනු ලබන නව සංශෝධිත දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| 01 | MOD/SLA/02/2021 | බූට් හයිලෙග් කළු | දේශීය | යුවල් 100,000 | 2021 /04 /20 දින 1000 පැයට |
| 02 | MOD/SLA/06/2021 | සුදු ඇඳ ඇතිරිලි සඳහා රෙදි 60" | දේශීය | මීටර් 552,000 | 2021 /04 /23 දින 1300 පැයට |
| 03 | MOD/SLA/08/2021 | තුවා නාන රට වෙරළු පැහැති 60"X30" | දේශීය | ගණනින් 278,250 | 2021 /04 /23 දින 1000 පැයට |
| 04 | MOD/SLA/09/2021 | හෙල්මට් බැලැස්ටික් | දේශීය | ගණනින් 10,000 | 2021 /04 /22 දින 1100 පැයට |

02. 2021 මාර්තු මස 14 වන දින සිළුමිණ, සන්ඩේ ඔබ්සර්වර්, තිණකරන් පුවත්පත්වල පළකරන ලද ප්‍රසම්පාදන දැන්වීමෙහි සඳහන් අනෙකුත් සියලුම කොන්දේසි සහ නියමයන් නොවෙනස්ව පවතී.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.**
**ශ්‍රී ලංකාව.**

# දකුණු ලක බැබළූ මාධ්‍යවේදියකුගේ සමුගැන්ම

## සිරි වාච්චගේ



ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී සිරි වාච්චගේ

● ජයසිරි ජේදුරුආරච්චි,
ගන්දර සමූහ

**තම ජීවිතය අවධානමේ තබා මරණය දැක දැක ජනතාවගේ පුවත් දැනගැනීමේ අයිතිය වෙනුවෙන් පෙනීසිටි අභීත මාධ්‍යවේදීන් පිළිබඳ අප අසා ඇත. ඒ අය අතර බහුතරයක් සිටින්නේ ජාතික මට්ටමේ සිට සේවයේ යෙදුණ අයයි. 88, 89 මහා භීෂණ සමය ඒ අතර ප්‍රමුඛය. ඒ අඳුරුතම හා බියජනක යුගයේදී මාධ්‍යවේදීන් රැසකගේ ජීවිත අහිමිවද්දී ප්‍රාදේශීය වාර්තාකරුවන් ලෙස සිටිමින් "වැඩියෙ දඟලන්න එපා අඩි තුනක් යට හතර රියන තුළට යන්න වෙයි" යනුවෙන් මරණ තර්ජන එල්ලවද්දීත් තම සේවය අකුරටම ඉටුකළ මාධ්‍යවේදීන් සිටින්නේ අතළොස්සකි. ඒ අතර මාතර සිරි වාච්චගේ නම් ප්‍රාදේශී මාධ්‍යවේදියාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.**

සුන්දර තල්පාවිල ගම්මානයේ ඉපිද තල්පාවිල මධ්‍ය මහා විද්‍යාලයෙන් උසස්පෙළ දක්වා අධ්‍යාපනය හදාරන වාච්චගේ කලක් උපකාරක පන්ති ගුරුවරයකු ද තවත් කලෙක කෘෂිකර්ම අධිකාරියේ කළමනාකරණ සහකාරවරයකු ලෙස ද සේවය කරන්නේය. ඒ අතර ඔහු ප්‍රාදේශීය වාර්තාකරුවකු ලෙස සිය මාධ්‍ය මෙහෙවර ආරම්භ කරන්නේ දිවයින පුවත්පතේ ආරම්භයත් සමඟිනි.

කෝට්ටගොඩ වාර්තාකරු ලෙස වාර්තාකරණයට පිවිසෙන වාච්චගේ මාතර දිස්ත්‍රික්කය පුරාත් ඉන් ඔබ්බටත් ඇවිද යමින් ජනතා ප්‍රශ්න, දේශපාලන කාරණා, අපරාධ සිදුවීම්, හදිසි අනතුරු ආදී අංශ රැසකින් වාර්තා සැපයීමත් සමඟ දිස්ත්‍රික්කයේ නමගිය පුද්ගලයකු බවට පත්වූයේ සිය කැපවීමේ ප්‍රතිඵලය උපරිමයෙන් භුක්ති විඳිමිනි.

තල්පාවිල ඊ. ආර්. එච්. මල්ලිකා සමඟ 1981 දී ඔහු විවාහ වෙන්නේ මාධ්‍ය දිවියට ද ශක්තියක් එක්කරගනිමිනි.

1986 දී තම කැදැල්ලට දියණික එක්වීමත් සමඟ තම කාර්යබහුල ජීවිතයට වැඩි වගකීමක් ඇතිවුණි ද වාච්චගේ සිය ජනතා මෙහෙවර ද නොපිරිහෙලා ඉටු කළේය. 88, 89 භීෂණ සමය වාච්චගේට කාර්යබහුලත්වය සේම මරබිය ද ඇතිකළ කාලවකවානුවක් විය. ඒ අතර තම කැදැල්ලට දෙවැනි දියණිය එක්වීමට සූදානමින් සිටීමත් ඔහුගේ සිත නොසන්සුන් කළ තවත් එක් අවස්ථාවකි. එහෙත් වාච්චගේ පසු නොබැස්සේය.



සිරි වාච්චගේ ජීවත්වූ නිවස

"අපේ මහත්තයට භීෂණ සමයේ හරියට මරණ තර්ජන තිබුණා. අපේ දෙවැනි දුව ලැබෙන්න හිටියෙත් ඒ කාලෙදි. මහත්තයාට අපි මොනවා කීවත් ඒවා ගණන් නොගෙන ඒකාලයේ සිදුවූ සිදුවීම් වාර්තාකරමින් හිටියේ. හුගාත් වාර්තාකරුවො එහෙම කළේ නෑ. නමුත් අපේ මහත්තයා දිගටම ලියුවා. එක දවසක් සන්නද්ධ තරුණ කණ්ඩායමක් ඇවිත් මහත්තයා හෙව්වා. එයා ගෙදර හිටියෙ නැති නිසා මට ලියුමක් දීලා ඒ අය යන්න ගියා. ඒ ලියුමේ තිබුණේ ප්‍රේමවති මනම්පේරි මැරූ රත්නායක කියන පොලිස් නිලධාරියා හෙට කපුගමදී මරණවා; ඒ ගැන හොඳ වාර්තාවක් පත්තරේට දාන්න; නැත්නම් මරණවා කියායි. එදා ඉඳල මහත්තයා ගෙදර නිදාගත්තේ නෑ. මමයි දරුවොයි විතරයි රෑට ගෙදර හිටියේ"



බිරිඳ ඊ. ආර්. එච්. මල්ලිකා සහ දියණියක වන ඉසුරිකා සමාලි

සිරි වාච්චගේ ප්‍රවීණ මාධ්‍යවේදියාගේ දයාබර බිරිය වූ ඊ. ආර්. එච්. මල්ලිකා නෙතඟින් ඇදහැලුණ කඳුළු කැට ඇඟිලි තුඩින් ඉවත්කරමින් දිගු කතාවකට මුලපුරමින් පැවසුවාය.

"ඒ කාලෙ හරි බයයි. හැම තැනම මරණ පිච්චෙනවා. හිස නැති මළකඳන් වැටවල්වල එල්ලා තිබෙනවා. මහත්තයට මරණ තර්ජන තිබුණ නිසා අපි හරි බයෙන් දවස ගෙව්වේ. දෙනගම සිරිවර්ධන මහත්තයයි, දොස්තර විජෙගුණවර්ධන මහත්තයයි තමයි මහත්තයට ඒවායින් බේරිලා ජීවිතය රැකගන්න උපදෙස් දුන්නේ. අර තරුණයො ඇවිත් ලියුම දුන්නා වගේම ඊට පසු දින එයාල කියපු විදියටම රත්නායක කියන පොලිස් නිලධාරියා කපුගමදි මරාදමා තිබුණා. ඒ අතර අපේ මහත්තයාත් ටිකක් සැඟවී හිටියා. රෑට නිදාගත්තේ විජේගුණවර්ධන දොස්තර මහතාගේ ගෙදර. උදේට බයිසිකලයෙන් ළමයි බලන්න ගෙදර එනවා. පුදුම දුකක් ඒ කාලයේ අපි වින්දේ. කොච්චර හැංගුණත් ලියන්න ඕන එක ලියුවා. ඒත් හිටිහැටියේ ලියන්න බැරිවුණා." ඒ සමඟ මල්ලිකා මහත්මියගේ නෙතඟින් යළි කඳුළු වැටෙද්දී ඇය කතාව නවතා නිහඬ වූවාය.

අභියෝග මැද වාර්තාකරණයේ යෙදුණ වාච්චගේ එක්තරා දේශපාලනඥයකු පිළිබඳව ලියන ලද වාර්තාවක් "මන්ත්‍රීවරු මුදලාලිලාගේ සාක්කුවේ" යන සිරස්තලය යටතේ පළවීමත් සමඟ උරණ වූ දේශපාලනඥයා වාච්චගේට එරෙහිව විවිධ ක්‍රියාමාර්ග ගත්තේය. ඒ නිසාම පාර්ලිමේන්තු කාරක සභාවක් ඉදිරිපිටට ද යන්නට වාච්චගේට සිදුවිය. එම පරීක්ෂණයෙන් ඔහු සමත්වුව ද එකල අදාළ දේශපාලනඥයාගේ ක්‍රියාකලාපය හොඳින් දැන සිටි වාච්චගේ ජීවිත ආරක්ෂාව සඳහා සැඟව සිටියේය.

"අපේ මහත්තය තමයි මෙහේ හිටපු වාර්තාකරුවන් අතරින් වැඩිම දීමනා ගත් කෙනා. ඒ කාලයේ රුපියල් හැටපන්දහස ලැබුණු අවස්ථාත් තිබුණා. මගේ මතකයේ හැටියට මහත්තයාට ලියපු වාර්තා වලට අන්තිමටම ලැබුණේ රුපියල් පනස් පන්දහසක චෙක්පතක්. ඊට පස්සේ ලියන්න බැරිවුණා. අසනීප තත්ත්වය නිසා 2012 සිට මතකයේ ප්‍රශ්න නිසා ලියන ඒවා වරදින්න ගත්තා; එතකොට ලියන එක නවතා දැම්මා. අසනීපයෙන් පසුවද්දි මැතිවරණ කාලයට පත්තරේ විස්තරේ කියන විට ඇඳේ ඉන්න ගමන් කඳුළු වැටෙනවා මම දැක්කා. මම කිසි දෙයක් නොඅසා සිටියා. එහෙම අවස්ථා කිපයකදීම අඬනවා මට මතකයි. මේ ගේ හදන්න කිසි තැනකින් ණයක් ගත්තේ නෑ. පත්තරේ සල්ලි වලින් තමයි හැදුවේ. ළමයින්ට ඉගැන්වූවෙත් එහෙමයි. දරුවො එහි ප්‍රතිඵල ගත්තා. ලොකු දුවයි, දෙවැනි දුවයි රජයේ හෙද නිලධාරිනියන්. පොඩි දුව තාම ඉගෙනගන්නවා." මල්ලිකා මහත්මියගෙන් නෙතු අගින් යළි කඳුළු වැටෙන්නට වූවාය.

"අපේ තාත්ත වැඩියෙන්ම ආදරේ මට. තාත්ත වැඩිපුරම හිටියේ මාත් එක්ක. හතේ පන්තිය දක්වාම මම ඉස්කෝලෙ ගියේ තාත්තත් එක්ක. තාත්තා එන්නෙ නැත්නම් මමත් ඉස්කෝලෙ ගියේ නෑ. ඒ තරම්ම තාත්තා මට සමීපයි.

තාත්තා පත්තරේ වැඩකරන එක මට ලොකු ගෞරවයක් වුණා. ගුරුවරුත් තාත්තාට කියා පත්තරේ දාන්න කියල නොඑක් දේ දෙනවා. සමහර වේලාවට මට එය කරදරයක්වූ අවස්ථාත් තිබුණා. පන්සල් වලට, අහිංසක මිනිස්සුන්ට ගොඩාක් උදවුකළා. පක්ෂ භේදයක් නැතිව තමයි පත්තරේ වැඩකළේ. අපිට කැමති අංශ වලින් යන්න දුන්නා මිස බලපෑම් කළේ නෑ. තාත්තා අපිට අහිමි වීම ගැන කියන්න වචන නෑ" වාච්චගේ මහතාගේ බාල දියණිය වන මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අවසන් වසර ශිෂ්‍යාවකවූ ඉසුරිකා සාමලි වාච්චගේ පැවසුවාය.

දසක හතරක පමණ කාලයක් පුරා මාධ්‍යකරණයේ යෙදෙමින් ජනතා සේවයේ නිරවූ හැටහහතර හැවිරිදි වාච්චගේ පසුගියදා අවසන්ගමන් ගියේ තවත් අභීතව කටයුතු කළ මාධ්‍යවේදියකු දැයට අහිමිකරමිනි.

---

● සිගිරිය විශේෂ

# යාපනේ ගොවීන්ගෙන් පාරිභෝගිකයන්ට අලුත් අවුරුදු තෑග්ගක්

**සිංහල දමිල අලුත් අවුරුද්ද පසුගිය වසරේ මෙරට ජනයාට සමරන්නට නොහැකි වූයේ කොවිඩ් වසංගතය මෙරට වෙළා ගත්ත නිසාවෙනි. මෙවර 2021 සිංහල දමිල අලුත් අවුරුද්ද සමරන්නට බොහෝ දෙනා සූදානම් වුවද කූඨ සේරිවාණිජ වෙළෙන්දන් නිසා එයද අසා අසාර්ථක වේ යැයි බොහෝ ජනතාව තුළ ඇත්තේ කුතුහලයකි. නිවසට අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක මිල ශීඝ්‍රයෙන් ඉහළ යද්දී පොල් ගෙඩිය සහල් පොල් තෙල් ආදී මිල කෘතිමව ඉහළ දමද්දී පසුගිය කාලයේ එළවළු මිල ද අතරමැදි වෙළෙඳ ව්‍යාපාරිකයන් විසින් ඉහළ දමා තිබිණි.**

සිංහල දමිල අලුත් අවුරුද්ද ඉලක්ක කරගෙන අතමිට සරු කරගන්න බොර දියේ මාළු බාන්නට සිටි අතරමැදි වෙළෙන්දන්ගේ ඇස්වලට වැලි ගසා සංවිධානය වූ යාපනය අර්ධද්වීපයේ ගොවීන් ඉතා සූක්ෂම ලෙස තම වගා භූමි වැඩි දියුණු කරමින් 2021 සිංහල අවුරුද්දට රටේම සමරන්න හැකිවන පරිදි එළවළු මිල පහත දැමීමට ඔවුන්ට හැකි වී තිබේ.

යාපනය අර්ධද්වීපයේ ගොවීන් මේ දිනවල තම එළවළු අස්වැන්න දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට ගෙනැවිත් අලෙවි කරති. ඒ අනුව සිංහල අලුත් අවුරුදු සමයේ වැඩි ඉල්ලුමක් පවතින අර්තාපල් අල, රතු ලූනු ,මාළු මිරිස් ,අමු මිරිස් , බීට් රූට්, වට්ටක්කා ,වම්බටු ආදී එළවළු වලට අමතරව කෙසෙල් අස්වනු ද ඔවුන් අඩු මුදලට දඹුල්ලේ අලෙවි කරති.

බොහෝ දෙනාට සිංහල අලුත් අවුරුද්දට අඩු මුදලකට එළවළු ලබාදීම සහ අවුරුදු සතුට ළං කර දීමට යාපනේ ගොවීන්ට හැකි වී තිබේ. ඒ අනුව යාපනය අර්ධද්වීපයෙන් ගොවීන් රැගෙන එන පසුගිය කාලයේ රුපියල් සියයකට එහා මුදලකට අලෙවි වූ අර්තාපල් අල කිලෝවක් මේ දිනවල රුපියල් හැත්තෑවෙ සිට 65 දක්වා මිලකට අලෙවි කරති. රුපියල් 100 ඉක්මවා අලෙවි වූ බීට්රූට් කිලෝවක මිල රුපියල් 50කි. රුපියල් 500 ඉක්මවා අලෙවි වූ අමු මිරිස් කිලෝව රුපියල් 120 කි. රුපියල් 250 ත් 300 ත් අතර ඉහළ මිලකට අලෙවි වූ මාළු මිරිස් කිලෝව රුපියල් 150කි .රුපියල් 100 ත් 80 ත් අතර අලෙවි කළ වට්ටක්කා කිවලෝව රුපියල් හතළිහකි. රුපියල් 500 ඉක්මවා අලෙවි කළ රතු ලූණු කිලෝවක් රු 120කි

යාපනය ප්‍රදේශයේ ගොවියා සිංහල දමිල අලුත් අවුරුද්ද සඳහා උඩුයටුයටිකුරු කළ එළවළු මිල පිළිබඳව සොයා බැලීමට අප දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ගොඩ වැදුණේ අප්‍රේල් පළමුවැනිදාය. එනම් ඉතා සීමිත දින කීපයක් සිංහල අලුත් අවුරුද්දට තිබියදී ය. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳ ව්‍යාපාරිකයකු මෙන්ම යාපනය අර්ධද්වීපයේ වැඩි වශයෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එළවළු ගෙන්වූ යාපනයේ බොහෝ ගොවීන්ගේ විශ්වාසය තබා ඇති තරුණ ව්‍යාපාරිකයකු වන මුදිත බණ්ඩාර අප සමඟ මෙසේ පැවසීය .

"අද වනවිට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට යාපනයේ ගොවියෝ විශාල වශයෙන් එළවළු අරගෙන එනවා .ඒ අයට රුපියලක් හෝ වංචාවක් නොකොට සාධාරණ මිලක් ලබාදීම තමයි අපේ එකම අරමුණ වෙලා තියෙන්නේ ව්‍යාපාරිකයන් හැටියට වෙළෙන්දන් ගොවීන් පාරිභෝගිකයන් සියලු දෙනාම අපි ආරක්ෂා කරගත යුතුයි. අද වන විට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට අර්තාපල් අල බීට්රූට් අමු මිරිස් මාළු මිරිස් වට්ටක්කා රතුලූනු වම්බටු ආදී බොහෝ එළවළු වගේම මඤ්ඤොක්කා තොග පවා අරගෙන එනවා යාපනයේ ගොවීන්. ගොඩක් මිල ඉහළ ගිහිල්ලා තිබුණා හැබැයි මේ ගොවි මහතුන්ගේ නිෂ්පාදන නිසා සිංහල අලුත් අවුරුද්දට අඩු මුදලකට එළවළු ගන්න අපේ සිංහල දමිළ සමස්ත රටෙහි ජනතාවට හැකියාව තිබෙනවා."



දඹුල්ල ආර්ථිකයේ සේවය කරන මිල්ටන් කුලතුංග මේ පිළිබඳව පැවසුවේ මෙවැන්නකි.

" අපි අදක ඊයෙක ඉඳලා නෙවෙයි ආර්ථික මධ්‍යස්ථානයට යාපනයේ නිෂ්පාදන ගේන්න හැදුවේ. මුල් කාලයේ එයාලා එන්න අදි මදි කළා. කොළඹ වෙළඳපළට තමයි පැටෙව්වෙ. පස්සේ අපි ඒ ජනතාව සමඟ සාකච්ඡා කරලා යාපනයට ගිහිල්ලා කතා බහ කරලා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එළවළු අරන් එන්න සූදානම් වුණා

"යාපනේ බොහෝ ගොවීන් එළවළු ටික ලොරිවල දාලා එවනවා අපි රුපියලක් හෝ වංචාවක් නොකොට බර වෙනසක් කරන්නේ නැතුව එම ලොරි වලම ගොවීන්ට මිල මුදල් ටික යවනවා. ඒ තරම්ම යාපනයේ ගොවීන් අපිත් එක්ක විශ්වාසය පළ කළා. එම විශ්වාසය උඩ තමයි අද සිංහල අලුත් අවුරුද්දට යාපනයේ ගොවීන්ගේ එළවළු ටික සෑම කුස්සියටම යන්න තරම් වටිනාකමක් ලැබුණේ."

ආර්ථික මධ්‍යස්ථානයේ ඇවිදිමින් තම අස්වනු අලෙවිකරන කැඩුණු සිංහලෙන් සහ සම්පූර්ණ ද්‍රවිඩ භාෂාවෙන් කතා කරන යාපනයේ ජනතාව කිසිදු බියකින් සැකයකින් තොරව තම නිෂ්පාදන අලෙවි කරන අයුරුද දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ දී අපට දැක ගැනීමට හැකි විය.

යාපනයේ මල්ලාවි ප්‍රදේශ්යේ සිට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එළවළු රැගෙනවිත් තිබූ සෙන්ද්‍රන්ගේ අදහස මෙසේය.

"අපි යාපනයේ ඉඳල දඹුල්ලට එන්නේ ඇත්තටම ගොඩක් සතුටින්. යාපනය හැමතැනම තියෙන එළවළු ගොවියෝ අපට ලබා දෙනවා. අපි වගා කරන ඒවත් දාගෙන අපි හවස යාපනෙන් පිටත්වෙලා පාන්දර වෙනකොට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එනවා. මේ දවස් වල එළවළු මිල අඩුයි. ගොඩක් වැඩියෙන් තමයි තිබුණේ. ඒ දවස්වල අපිටත් අමාරුයි හැබැයි වැස්සත් එක්ක අපේ එළවළු කොටු විනාශ වුණා. ඒ වුණාට අපේ ගොවියෝ ගොඩක් මහන්සි වෙලා තිබුණු සීමිත එළවළු ටික රැක ගත්තා."

"ඒ නිසා තමයි සිංහල අවුරුද්දට එළවළු මිල පහත වැටුණේ. දැන් පවතින මිල ගොවියාටත් අපිටත් මිනිස්සුන්ටත් සාධාරණයි. ඒ නිසා ලොකු සතුටක් තමයි හිතේ තියෙන්නේ ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරික මහත්තුරු ඒ වගේම ආර්ථික මධ්‍යස්ථානයට එන සිංහල ගොවි මහත්වරු අපිත් එක්ක කතාබහ කරනවා; අපිට අලුත් යාළුවොත් එකතු වෙනවා. ඒ නිසා අපි මේ වෙළෙඳාම කරන්නේ සතුටින්."

යාපනයේ සිට පැමිණි කේ. කිලි මෙසේ පවසයි.

" මුල් කාලයේ දඹුල්ලට එනකොට ටිකක් බයක් තිබුණා. දැන් හැබැයි දඹුල්ලේ ඔක්කොමල වගේ අපේ ලොරි ටික එනකොට අපිව ආදරෙන් පිළිගන්නවා. ඇතින් ලොරිය එනකොටම එළවළු මිල දී ගන්නා ආපු අය අපිව හොඳට අඳුනගෙන මොනවද තියෙන්නෙ මිල කීයද ගණන් හිලව් කතා කරලා අපේ බඩු මිලදී ගන්නවා .වට්ටක්කා තමයි අපි වැඩියෙන් ගේන්නේ. යාපනේ ලොකු වට්ටක්කා හොඳට වැවිලා තියෙනවා. අපි ඒවා ලොරිවල පටවාගෙන දඹුල්ලට ගෙනල්ලා විකුණනවා. සිංහල අලුත් අවුරුද්ද දෙමළ අලුත් අවුරුද්ද අපි සමරන නිසා වැඩි වන එළවළු තමයි මේ දවස්වල යාපනේ ගොවියෝ වගා කරලා තියෙන්නේ. අපිට පුළුවන් වුණා ඉහළ ගියපු එළවළු මිල පහතට දාන්න. ඒ නිසා අපේ රටේම නිෂ්පාදනය කරගන්න එළවළු අපේ රටේ අය ම ආහාරයට ගන්න කොට සතුටක්නේ තියෙන්නේ."

යාපනයේ එළවළු රැගෙන එන ජේ .ජෙගන් මෙසේ පැවසීය.



" මේ දවස් වල අපේ රතු ලූනු වලට හොඳ ඉල්ලුමක් තියෙනවා. මොකද උත්සව සමයට රතුලූනු වැඩියෙන් අලෙවි වෙනවා. එ නිසා ගොවියෝ වැඩියෙන් හදලා තිබුණා. රුපියල් 500ක් විතර වෙලා තිබුණු රතු ලූනු ගණන් අඩු වුණා. හැබැයි පිටරට ඉඳලා තමා ගෙනල්ල තිබුණෙ. අද අවුරුදු සමයේ සියලුම සල්ලි අපේ රටේම ඉතුරු වෙනවා. මම මේ හැම කඩේකට ම ඇවිදලා ගිහිල්ලා බලනවා; අපි ගේන බඩු ටික බෙදල දෙනවා. විකුණගෙන අපි නැවත යාපනේ යනවා; ගොවීන්ට එන්න බැරි ගොවීන්ගේ බඩු ටික විකුණලා සල්ලි නැවත ගිහින් දෙනවා. ඒ අය දවල් රෑ නැතුව මහන්සි වෙනවා ඊළඟ කන්නයට වගා කරන්න."

"හැමදාම මේ එකමුතුවෙන් වගා කළොත් ඒළවළු විකුණන ක්‍රමවේදය හදා ගත්තොත් අපට පිටරටින් අර්තාපල් අල රතු ලූනු ගේන්න වුවමනා වෙන්නේ නෑ. බලධාරීන් එකතුවෙලා මේ සිංහල අලුත් අවුරුද්ද සිංහල දෙමළ මිනිස්සු එකතුවෙලා මිල බැස්සහම වගේ ඒ අයගෙන් සහයෝගය දෙනවා නම් අපට ගොඩක් හැකියාව ලැබෙනවා මේ සතුට ඊළඟ අවුරුද්ද දක්වාම පවත්වාගෙන යන්න.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී



# ETI මගඩියේ අලුත්ම කතාව

**ස්වර්ණවාහිනී ගනුදෙනුවට අදාළ විමර්ශන නිසි ආකාරව සිදුවී නැති හෙයින් ස්වර්ණවාහිනී ආයතනයේ කොටස් විකිණීමේ ගනුදෙනුවට අදාළ සම්පූර්ණ ලිපි ගොනු ආපසු පොලිස්පතිවරයා වෙත හරවා යවා විමර්ශනය සිදු විය යුතු ආකාරය සම්බන්ධයෙන් පසුගිය 22 දින නීතිපතිවරයා විසින් පොලිස්පතිවරයා වෙත සම්පූර්ණ උපදෙස් ලබා දීමක් සිදු කර තිබිණි.**

ස්වර්ණවාහිනී ආයතනයේ කොටස් විකිණීමෙන් ගනුදෙනුවට අදාළ විමර්ශනය හරියාකාරව සිදුව නැති බවත් එයා සම්පූර්ණ බවත් ඒ මත නඩු පැවරීම සිදු කළ නොහැකි බවත් නීතිපතිවරයා විසින් පොලිස්පතිවරයා වෙත වැඩිදුරටත් එදින දැනුම් දී ඇති බවත් ගෙවුණු සතිය පුරා පුවත්පත් වාර්තා කර තිබිණි.

කෙසේ වෙතත් රන් භාණ්ඩ ආනයනය, අපනයනය සහ අලෙවියට පමණක් නීතිමය අනුමැතිය ලබාගෙන තිබූ ස්වර්ණමහල් ජුවලර්ස් ආයතනය මහජනතාවගේ මුදල් තැන්පතු බාරගැනීම මඟින් බරපතළ ව්‍යවස්ථාපිත වරදක් කර ඇති බව නීතිපතිවරයා කොළඹ කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ වෙත දැනුම්දී තිබුණේ පසුගිය දාහත් වැනිදා ය.

නීතිපතිවරයා ලබා දුන් උපදෙස් පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය 10 වැනිදා පස්වරුවේ අත්අඩංගුවට පත් ස්වර්ණමහල් ආයතනයේ හිටපු අධ්‍යක්ෂකවරු වන ජීවක එදිරිසිංහ, නාලක එදිරිසිංහ, අසංක එදිරිසිංහ, සහ දීපා එදිරිසිංහ යන සිවු දෙනා අධිකරණය හමුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී නීතිපතිවරයා මේ බව අධිකරණයට දන්වා සිටියේය.

මොවුන් මෙසේ අත්අඩංගුවට පත්වූයේ එම සමාගම්වල ගනුදෙනු කරුවන් විසින් තැන්පත් කළ රුපියල් බිලියන 13.7 ක මුදලක් සාවද්‍ය පරිහරණය කිරීම ඇතුළු චෝදනා යටතේය.

කෙසේ වෙතත්, එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හා ඊට අනුබද්ධ සමාගම් හී සිදු වී ඇතැයි පැවසෙන මූල්‍යමය හා දේපළ ගනුදෙනු පිළිබඳ අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී. චිත්‍රසිරිගේ සභාපතිත්වයෙන් යුතුව, හිටපු සොලිසිටර් ජනරාල්වරයකු වන සුහද ගම්ලත් හා ජ්‍යෙෂ්ඨ බැංකුකරුවකු වන ඩී. එම්. ගුණසේකරගේ සාමාජිකත්වයෙන් යුත් ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාවක් පත් කරන ලද්දේ , 2020 ජනවාරි මස 09දාය.

එකී ගනුදෙනු පිළිබඳ සිය නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත්ව පිළියෙල කරන ලද වාර්තාව 2020 ඔක්තෝබර් මස 06 වැනි දින ජනාධිපතිතුමා වෙත බාර දුන් අතර, එම සමාගම් (ETI ) පසුගිය සමයේදී සිදු කළ මූල්‍ය හා දේපළ ගනුදෙනු රැසකදීම මූල්‍ය නීති රැසක් කඩ කර ඇති බවත්, අක්‍රමිකතා රැසක් සිදු වී ඇති බවත්, ඔවුහු එම කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර තිබිණි.

එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම් සමූහයට අයත් ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලය ඇතුළු දේපළ, 'බෙන් හෝල්ඩින්ග්ස්' නමැති සමාගමකට අලෙවි කරනු ලැබුවේ මීට වසර කිහිපයකට පෙරදී ය.

මෙම විකිණීම සිදුව ඇත්තේ නීති විරෝධී ආකාරයට බව ද, එහිදී මුදල් විශුද්ධිකරණයක් සිදුව ඇති බවටද කොමිසම කරුණු අනාවරණය කළේය.

ඒ අනුව, එම දේපළ රජයට පවරා ගැනීමටත්, එහි හිමිකරුවන් ලෙස කටයුතු කර, මෙම නීති විරෝධී ගනුදෙනු සිදු කළ පිරිසට එරෙහිව අපරාධ නීතිය යටතේ නෛතිකව කටයුතු කිරීමේ හැකියාව ඇති බවත් කොමිසම වැඩිදුරටත් පෙන්වා දී ඇති බවද වාර්තාවී තිබිණි.

මෙම කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වූ කරුණු පිළිබඳ දැඩි අවධානය යොමු කළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්, එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හා ඊට අනුබද්ධ සමාගම් හි සිදු වී ඇති මූල්‍යමය හා දේපළ ගනුදෙනු පිළිබඳ අක්‍රමිකතා සම්බන්ධයෙන් ඉහත කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් නීතිමය පියවර ගැනීම පිණිස නීතිපතිවරයාට යොමු කිරීම, මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා ඇති දෙපාර්තමේන්තුව මුළුමනින්ම ප්‍රතිසංවිධානය කර මූල්‍ය සමාගම් නියාමනය සඳහා නව ආයතනික ව්‍යුහයක් සකස් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට දැනුම් දීම, අධිකරණ අමාත්‍යවරයා මඟින් මෙම කොමිෂන් සභා වාර්තාව හා ඒ අනුව ගනු ලබන පියවර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම යන යෝජනාද සමඟ මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙතද ඉදිරිපත් විය.

ඒ අනුව කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් නීතිමය පියවර ගැනීමට නීතිපතිවරයාට යොමු කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි විය.

ඊ. ටී. අයි වංචාව පසු ගිය ජනාධිපතිවරණ හා මහා මැතිවරණ වේදිකාවන්හි ඉතාම සංවේදී මාතෘකාවක් බවට පත් වන්නේ ද මෙම සංගමය ගෙන ගිය නොනවතින අරගලයේ ප්‍රතිඵලයක් නිසා වන අතර, 2020 ජනවාරි මාසයේදී ම ජනාධිපතිතුමා විසින් ඔවුන්ගේ ඉල්ලීමට සාවධානව ඇහුම්කන් දෙමින් මෙම විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවද පත් කරන ලදී.

මේ සියලුම හැලහැප්පීම් මැද ඉදිරියට ආ ඊ.ටී. අයි. ගැටලුව, අද වන විට නීතිය හමුවේ යුක්තිය අපේක්ෂාවෙන් බලා හිඳී.

මෙම සැකකරුවන් මුදල් විශුද්ධිකරණ පනත සහ මූල්‍ය ව්‍යාපාර පනතේ හැටපස් වැනි වගන්තිය අනුව වරදවල් සිදු කර ඇති බැවින්, ඔවුන් අත්අඩංගුවට ගත් බව දැනුම්දුන් නීතිපතිවරයා ඊ.ටී. අයි. සහ ස්වර්ණමහල් ආයතන මහ බැංකුව වෙත අනාවරණය නොකරන ලද ගිණුම් පවත්වාගෙන යමින් රුපියල් බිලියන 13කට අධික තැන්පතු නීති විරෝධී ලෙස තබා ගැනීම මෙම සැකකරුවන් එම සමාගම්වල අධ්‍යක්ෂවරු ලෙස සිටිමින් සිදුකර ඇතැයි ද අධිකරණය වෙත හෙළි වී තිබේ.

නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් හරිප්‍රියා ජයසුන්දර දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් අධිකරණයට දන්වා තිබුණේ, නාලක එදිරිසිංහ ජීවක එදිරිසිංහ අසංක එදිරිසිංහ සහ දීපා එදිරිසිංහ යනු සැකකරුවන් අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කළ ස්වර්ණමහල් ජුවලර්ස් ආයතනය එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ආයතනයට අනුබද්ධ ආයතනයක් ලෙස පවත්වාගෙන ගොස් තිබෙන බවත්, ඊ.ටී. අයි. ආයතනය තුළ සිදුව ඇති අයථා ක්‍රියා පිළිබඳ සොයා බැලීමට ජනාධිපතිවරයා විසින් ජනාධිපති කොමිසමක් පත්කර තිබූ බවත් ය.

එසේම මෙම අවස්ථාවේදී පැමිණිලි පාර්ශ්වය විසින් අදාළ ජනාධිපති කොමිසමේ වාර්තාවේ පිටපතක් අධිකරණය හමුවට ඉදිරිපත් කළ බවද වාර්තා විය. සැකකරුවන් වෙනුවෙන් නීතිඥ මණ්ඩලයක් සමඟ ජනාධිපති නීතිඥ අනුර ප්‍රේමරත්න පෙනී සිටි අතර සැකකරුවන් සිවුදෙනා අප්‍රේල් 01 දින දක්වා රිමාන්ඩ් භාරයේ තැබූ අතර එදින මහේස්ත්‍රාත්වරයා විසින් ඔවුනට ඇප නියම කරන ලදී.


ජීවක එදිරිසිංහ, නාලක එදිරිසිංහ, දීපා එදිරිසිංහ, අසංක එදිරිසිංහ

# ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ශ්‍රී ලංකන් ගුවන් කාර්ය මණ්ඩලයට උපහාර

කොරෝනා වයිරසය ව්‍යාප්ත වී යාම හේතුවෙන් චීනයේ වුහාන් හි අතරමං වූ ශ්‍රී ලාංකික පුරවැසියන් නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා ඉටුකරන ලද සේවය වෙනුවෙන් ශ්‍රීලංකන් ගුවන් සේවයේ ගුවන් කාර්ය මණ්ඩලයේ සාමාජිකාවන් පසුගියදා උපහාරයට ලක්විය. ජාත්‍යන්තර කාන්තා දිනය මූලික කර ගනිමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් මෙම උපහාර පිදීම සංවිධානය කරන ලදී. මෙහිදී කොරෝනා වසංගතය අතරතුර රටේ අභිවෘද්ධිය උදෙසා දායක වූ නිලධාරිනියන් දස දෙනෙකු ශිරන්ති රාජපක්ෂ මැතිනිය අතින් උපහාරයට ලක්විය. මෙම උත්සවය Waters' Edge හි දී පසුගිය මාර්තු මස 8 වන දින පැවැත්විණි. මෙම අවස්ථාවට ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මානව සම්පත් හා ගුවන් සේවා අංශයේ ප්‍රධානී බුද්ධිකා මානගේ සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති කේ. ජයවර්ධන ද ඒක්ව සිටියහ.

උපහාරයට ලක් වූ කාන්තාවන් අතර ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ඉන්ෆ්ලයිට් සේවා සැපයුම් අංශයේ ජෙනලි ජැන්ස් (ගුවන් සේවා අධීක්ෂක) සහ අමාලි හෙට්ටිආරච්චි (ජ්‍යෙෂ්ඨ ගුවන් සහායක) ද ඇතුළත් විය. මෙම ශ්‍රී ලංකන් ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකාවන් 2020 පෙබරවාරි මස 1 වැනි දා චීනයේ වුහාන් සිට අපගේ සිසුන් UL1423 දරන ගුවන් යානයෙන් මෙරටට ගෙන්වා ගැනීමේ මෙහෙවරට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ලදී . කොරෝනා වයිරසය හේතුවෙන් අතරමං වූ ශ්‍රී ලාංකික පුරවැසියන් නැවත ගෙන්වා ගැනීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් මෙහෙයවන ලද පළමු ගුවන් යානය මෙය වේ.



# සෙලාන් බැංකුව වෙබ් අඩවිය නවීකරණය කරයි

වැඩිදියුණු කළ සේවා පහසුකම් සහිතව www.seylan.lk දැන් වර්චුවල් බැංකු (Virtual Bank) ශාඛාවක් ලෙස ලංකාවේ බැංකුක් ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු වන සෙලාන් බැංකුව, නවීකරණය කරනලද www.seylan.lk වෙබ් අඩවිය, කළමනාකාරිත්වයේ සහ කාර්යමණ්ඩලයේ සහභාගීත්වය ඇතුව සෙලාන් ප්‍රධාන කාර්යාලයේදී පසුගිය ජනවාරි 01 වැනි දින දියත් කළේය.නවීකරණය කරන ලද මෙම වෙබ් අඩවිය මගින් පාරිභෝගිකයින්ට එසැණින් තම බැංකු කටයුතු සපුරාගත හැකිය. ජංගමදුරකථන හා සියලු නවීන වෙබ් බ්‍රව්සර් මගින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි වෙබ් අඩවිය නවීකරණය කිරීමට සෙලාන් කණ්ඩායම පියවර ගත්තේය. www.seylan.lk මගින් දැන් ආයතනික, ව්‍යාපාර සහ පුද්ගලිකයන අංශයන්ට අදාළ සේවා, අතුරු මුහුණතෙහි වෙන් වෙන්ව දක්වයි. මෙමගින් පාරිභෝගිකයන්ට ඉක්මනින් හා පහසුවෙන් තමන්ට අවශ්‍ය සේවාව සඳහා යොමුවිය හැකි අතර නවීකරණය කරන ලද අතුරු මුහුණත, දැනටමත් භාවිතා කරන සහ නව පරිශීලකයින්ට නව අත්දැකීමක් වනු ඇත.

පාරිභෝගිකයින්ටතම එදිනෙදා බැංකු කටයුතු ඉටුකර ගැනීමට හා තොරතුරු දැනගැනීමට අවස්ථාව සලසයි.පවතින වසංගත තත්ත්වය තුළ සෙලාන් පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තවදුරටත් තහවුරු කිරීම, වෙබ්අඩවිය නවීකරණයට ප්‍රධාන හේතුවක් විය.



# SLT-MOBITEL ඩිජිටල් ලියාපදිංචි කිරීම අරඹයි

ජාතික තොරතුරු සහ සන්නිවේදන සැපයුම්කරු වන SLT-MOBITEL, කොළඹ මහ නගර සභාවේ තොරතුරු තාක්ෂණ අංශය හා එක්ව මොබිටෙල් eChannelling ඔස්සේ කොවිඩ්-19 එන්නත්කරණය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නවතම වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේ.

මෙහි පළමු අදියරේදී වයස අවුරුදු 60ට වැඩි, කොළඹ මහ නගර සභා බල සීමාවේ වෙසෙන වැඩිහිටියන්ට මෙම සේවාව නොමිලයේ ලබාගත හැක.

"ශ්‍රී ලාංකිකයන් නවීන තාක්ෂණයෙන් සවිබලගැන්වීමට කැපවී සිටින අප සමාගම, කොළඹ මහ නගර සභාවත් සමඟ අත්වැල් බැඳගනිමින් මෙම නවතම වැඩසටහන ආරම්භ කිරීම පිළිබඳව අපි මහත් සතුටට පත්ව සිටිමු. විශේෂයෙන්ම කොවිඩ් මර්දන ජාතික සටන හා බැඳුණු මෙවැනි වැඩසටහන් සඳහා අපි ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදෙනවා.

පළමු අදියරේදී මෙම සේවාව කොළඹ නගරයට පමණක් සීමා වුණත්, එන්නත්කරණ ක්‍රියාවලියේ ව්‍යාප්තියත් සමඟ නුදුරේදීම මෙය දිවයින පුරා ව්‍යාප්ත සේවාවක් ලෙස හඳුන්වාදීමට අපි කටයුතු සිදුකරනවා", යනුවෙන් මොබිටෙල් ප්‍රධාන විධායක නිලධාරී චන්දික විතාරණ ප්‍රකාශ කළේය.

වයස අවුරුදු 60ට වැඩි ඕනෑම වැඩිහිටියෙකු මෙම සේවාව ලබාගැනීමට කළ යුත්තේ www.echannelling.com හෝ www.colombo.mc.gov.lk යන වෙබ් අඩවිවලින් එකකට පිවිස හෝ eChannelling මොබයිල් ඇප් (Mobile App) එක හරහා 'COVID Vaccination' බොත්තම එබීම පමණි. ඒ සමඟ තමන්ට ආසන්නයේ පිහිටා ඇති කොවිඩ්-19 එන්නත්කරණ මධ්‍යස්ථාන පිළිබඳ දැනුම්වත් වීමේ හැකියාව ඔවුන්ට උදා වේ.




# රන්ක්‍රිස්ප් කැෂූට NCE අපනයන සම්මානය

අගය එකතු කළ කජු නිෂ්පාදනයෙහි පෙරළිකාර පුරෝගාමියා වන රන්ක්‍රිස්ප් කැෂූ ජාතික අපනයන මණ්ඩලය සංවිධානය කළ NCE අපනයන සම්මාන උලෙළේදී අගය එකතු කළ හොඳම අපනයනකරුවා සම්මානයෙන් සහ නැවුම් හා සැකසූ කෘෂි අපනයන අංශයේ රිදී සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන රාත්‍රිය කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. "අගයඑකතු කිරීමේ පුරෝගාමීන් ලෙස කළ කැපකිරීමට නිසි පිළිගැනීමක් ලැබීම සතුටක්. මාගේ කාර්ය මණ්ඩලයටත්, ගනුදෙනුකාර භවතුන්ටත් කෘතඥතාව පුදකරන අතරම කජු කර්මාන්තයට මුලින්ම අගයක් එකතු කරමින් රන්ක්‍රිස්ප් ව්‍යාපාරය ඇරැඹූ මගේ පියා, ඊඩන් තමෙල් වත් ආදරයෙන් සිහිපත් කරනවා" රන්ක්‍රිස්ප් කැෂූ කළමනාකරණ අධ්‍යක්ෂ සමන්ත තමෙල් පැවසීය.




## සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 120 රුපියල් 50,000 ක තෑගි

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | | ■ | | 6 |
| 7 | | | | ■ | 8 | | |
| 9 | | ■ | 10 | 11 | | | |
| | ■ | ■ | 12 | | | | ■ |
| 13 | 14 | | | | ■ | ■ | 15 |
| 16 | | ■ | | ■ | 17 | 18 | |
| | ■ | 19 | | 20 | | | |
| 21 | | | | | | ■ | |

Daintee X-TRA ප්‍රහේලිකා අංක 120

නම: ..............................

ලිපිනය: ..............................

අත්සන: ..............................

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

### කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5,000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 120 යනුවෙන් සඳහන් කර ඩේන්ටී මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 අප්‍රේල් 20 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් අංකයක් ඇත්නම් එයද ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

### උපකාරක පද

1 කොවිඩ් මළසිරුරු භූමිදානයට තෝරා ගත් උතුරුදිග දූපත
5 කාව්‍ය
7 රට රටවල තතු සඳහන් සිතුවම/ චිත්‍රය
8 සත 6ක වටිනාකමින් යුත් කාසිය
9 කකුල
10 හංස පේළිය/ පන්තිය
12 ගුවන් හමුදා කඳවුරක් නිසා ප්‍රකට හම්බන්තොට දිසාවේ ගමෙකි
13 නයාගේ භෝගාවලිය
16 රාවණාගේ ප්‍රතිවාදියා
17 නිවෙස් හි ඇතුළු ගේ/ කුටි
19 ගනුදෙනුවක් වෙනුවෙන් මුලින් ගෙවන මුදල
21 ගෙඩි-වණ-දද සඳහා ගන්නා දුර්ලභ ඖෂධ ශාකයකි

පහළට..
1 බුදුරදුන් මංගල දම් දෙසුම පැවැත් වූ විහාරය
2 රාගය/ ඇල්ම
3 පසුව දීමට ඉල්ලා ගන්නා මුදල
4 මේ දැස කුමට ද, සංගීතා, වන බඹරා ආදි චිත්‍රපටවල අධ්‍යක්ෂ
5 අන්ධ ජනයාට මඟ කියන ලීය හෝ වැල හෝ
6 මල නැති / පිරිසුදු
8 කෝට්ටේ යුගයේ බිහි වූ මුල්ම සංදේශ කාව්‍යය
11 පිහිට
14 ගම්මානය
15 රුබෙයෝලා නමින් ද හැඳින්වෙන වෛරස් රෝගය
17 කාර්යාල කාර්ය සහායක යන්නෙහි කෙටි යෙදුම
18 මාරයා
19 පහත්/නීච/නරක යන අරුත් දේ
20 තිහ





"ජපන් ගෙදර" කළමනාකාර අධ්‍යක්ෂ චතුරංග විතානගේ, සිය නිෂ්පාදන පිළිබඳ අගමැතිතුමාවෙත පැහැදිලි කරමින්.

# වඩා හොඳ සේවාවක් සැපයීමට 'ජපන් ගෙදර' ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමඟ එක්වෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉදිකිරීම් සන්නාමයක් වන ජපන් ගෙදර (සන්රිට්සු ඩෙකෝ පුද්ගලික සමාගමට අයත්) නවීන ජපන් ඉදිකිරීම් තාක්ෂණය ප්‍රචලිත කිරීමේ අරමුණින් සිය නවතම ශාඛාව කොළඹ 10, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා ප්‍රදර්ශනාගාරයේදී (B.M.C) පසුගියදා විවෘත කරන ලදී.

2013 වසරේ දී ජපාන හා ශ්‍රී ලංකා වෘත්තිකයින්ගේ සහයෝගයෙන් ශ්‍රී ලංකා ගොඩනැගිලි ඉදිකිරීම් වෙළෙඳපොළට නවීන ජපන් තාක්ෂණය හඳුන්වාදීමේ අරමුණින් ආරම්භ කරන ලද ජපන් ගෙදර ආයතනය අද වන විට නිවාස සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් විශාල පාරිභෝගික පිරිසකට සිය සේවාව සපයා ඇත. වෘත්තීය ඉදිකිරීම් සේවා සැපයුම්කරුවකු ලෙස, ජපන් ගෙදර පාරිභෝගිකයින්ගේ විශේෂිත අවශ්‍යතා සඳහා පුළුල් පරාසයක ඉදිකිරීම් සේවාවන් සපයයි. නේවාසික ඉදිකිරීම්, වාණිජමය ඉදිකිරීම්, අභ්‍යන්තර සහ බාහිර බිත්ති, උද්‍යාන බිත්ති, නාන කාමර බිත්ති, පැන්ට්‍රි කබඩ්, ගෘහ නිර්මාණ සැලසුම් සහ සිවිලිම්.

ස්වාභාවික පෙනුමෙන් යුතු පහසුවෙන් ස්ථාපනය කළ හැකි ඉහළ ගුණාත්මක බවින් යුතු පරිසර හිතකාමී මෙම නිෂ්පාදන දිගු කාලයක් වර්ණ නොවෙනස්ව පවතී. මේ සඳහා භාවිත කරන ලෝහ වර්ග දෙක වන්නේ ඇලුමිනියම් සහ වානේ ය.

මෙම උසස් තත්ත්වයේ අමු ද්‍රව්‍ය ජපානයෙන් පමණක්ම ආනයනය කරන අතර, එකම බෙදාහරින්නා ජපන් ගෙදර ආයතනය වේ.

## බිස්නස් නිවුස්

# උතුරු පළාතේ එයාර්ටෙල් ජාලය වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන්



ශ්‍රී ලංකා තාරුණ්‍යයේ වඩාත් ජනප්‍රියතම ජංගම විදුලි සංදේශ සේවා සැපයුම්කරුවා වන එයාර්ටෙල් ලංකා සමාගම උතුරු පළාත පුරාවට 900MHz සුපිරි සංඛ්‍යාත පරාසය හඳුන්වා දීමේ මෙහෙයුම් කටයුතු සාර්ථකව නිම කළ බව නිවේදනය කර ඇති අතර එමගින් පරිශීලකයින්ගේ අත්දැකීම් ඉතා විශාල ලෙස වැඩිදියුණු කිරීමට සමාගම අරමුණු කරයි.

නව 900MHz සුපිරි සංඛ්‍යාත පරාසය විසුරුවා හැරීම තුළින් පරිශීලකයින්ට වැඩිදියුණු කළ ජාල අත්දැකීමක් ලැබෙනු ඇති අතර සහ එමගින් භූගෝලීය වශයෙන් විශාල ප්‍රදේශයක් වන උතුරු පළාතේ සිටින ජනතාවට පුළුල් ආවරණයක් සැපයීමට හැකියාව ලැබීම විශේෂිතය.

එම පළාත තුළ දියත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින එයාර්ටෙල් 4G සේවා සඳහා මෙම වැඩිදියුණු කිරීම මනා පසුබිමක් සකස් කරයි. මේ පිළිබඳව අදහස් දක්වන එයාර්ටෙල් ලංකා, ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකාර අධ්‍යක්ෂ, අශීෂ් චන්ද්‍රා මහතා "මෙම නව සංඛ්‍යාත පරාසය විසුරුවා හැරීම අපගේ උපායමාර්ගික වර්ධනයට ඉතා වැදගත්. එමෙන්ම මෙම පරාසයට ඉහළ සංඥා විකාශනයක් තිබීම නිසා පරිශීලකයින්ට සුපිරි ගෘහස්ත අත්දැකීමක් ලබා දෙන අතර අපගේ ඉහළ සංඛ්‍යාත පරාසය භාවිතය මෙමගින් අඩු වන බැවින් ප්‍රදේශය පුරා සිටින වැඩි පිරිසකගේ ඉල්ලුම සපුරාලීමට අපට හැකි වනවා." යනුවෙන් පැවසුවේය.

මෙම සංවර්ධනයන් මෑත කාලයේ එයාර්ටෙල් සමාගම විසින් ගනු ලැබූ එඩිතර උපායමාර්ගයක කොටසක් වන අතර එමගින් පරිශීලක අත්දැකීම විශාල ලෙස ඉහළ නැංවීමට සමාගම අපේක්ෂා කරයි.

2009 ජනවාරි 12 වැනි දින ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ භාරතී එයාර්ටෙල් ලංකා, ග්‍රාහකයින් මිලියනයක් ඉතාමත්ම ඉක්මනින් සම්පූර්ණ කළ ජංගම සන්නිවේදන සේවා සමාගමයි. වර්ෂ තුනක් වැනි කාලසීමාවක් තුළ සිය ශ්‍රේණිගතවීම ඉහළ නංවාගත් එයාර්ටෙල් සමාගම රට පුරාම සිය ආවරණය පුළුල් කරගනිමින් ශ්‍රී ලංකාවේ වේගවත්ම ජංගම සන්නිවේදන සේවා ජාලය බවට පත්විය.

# AIA ඉන්ෂුවරන්ස් ප්‍රථම වරට, ව්‍යවසාය ශ්‍රේණියේ විසඳුමක් වන cloud - කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය හඳුන්වා දෙයි

ඩිජිටල්කරණය වෙත මාරුවීමේ ප්‍රයත්නයේ දී AIA ඉන්ෂුවරන්ස් විසින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය වෙත ප්‍රථම වරට, ව්‍යවසාය ශ්‍රේණියේ විසඳුමක් වන cloud පදනම් කරගත් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය නොබෝදා හඳුන්වා දෙන ලදී. AIA හී වඩාත් වැදගත් කාර්ය ප්‍රවාහයන් ස්වයංක්‍රීයකරණය කිරීම තහවුරු කිරීම සඳහා Microsoft Azure Logic ඒනන තෝරාගෙන ඇත.

AIA හී මෙහෙයුම් අංශයේ මෙන්ම සමාගම පුරාවට ඇති විවිධ අංශයන් වෙත මෙම ස්වයංක්‍රීයකරණ වැඩසටහන දියත් කෙරෙමින් පවතින අතර, මේ ඔස්සේ සමාගම වෙත ලැබෙන නව ව්‍යාපාරවල රක්ෂණ ඔප්පු සැකසීමේ සිට සාමාන්‍යයෙන් සාම්ප්‍රදායිකව කාර්යය මණ්ඩල සාමාජිකයකුගේ අතින් සිදුකරන ලද පාරිභෝගික සේවා ක්‍රියාවලීන් බොහොමයක් ඉදිරියේදී ඩිජිටල්කරණ තාක්ෂණය ඔස්සේ සිදුකිරීමට කටයුතු සැකසේ. මෙසේ තාක්ෂණික ස්වයංක්‍රීයකරණය මගින් ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරලීම මෙන්ම රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේ සහ රක්ෂණ හිමිකම් පෑමේ ක්‍රියාවලීන් වඩාත් නිරවද්‍යතාවයෙන් ද සිදු කෙරෙනු ඇත.

මේ පිළිබඳ අදහස් දක්වමින් AIA හි ප්‍රධාන




විධායක නිලධාරී නිකිල් අද්වානි කියා සිටියේ " AIA හි අප අපගේ සේවාලාභීන් වෙත වඩාත් විශිෂ්ට සේවාවක් ලබා දීම සඳහා ඩිජිටල්කරණය වෙත අපගේ සියලු ක්‍රියාවලීන් මාරු කිරීම වෙනුවෙන් කැපවී කටයුතු කරමින් සිටින අතර, එය අපගේ අත්‍යවශ්‍ය ප්‍රමුඛතාවයක්. ශ්‍රී ලංකාව තුළ මෙම කර්තව්‍ය සඳහා පුරෝගාමී සමාගම බවට පත්වීමට ලැබීම ද අපට මහත් අභිමානයක්. cloud පදනම් කරගත් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය ශ්‍රී ලංකාව තුළ ඩිජිටල්කරණ පරිවර්තනය සහ ස්වයංක්‍රීයකරණය නව මානයක් කරා රැගෙන යන අතර, එම කර්තව්‍ය සඳහා පුරෝගාමී සමාගම බවට පත්වීම අපට ආඩම්බරයක්. මෙම වැඩසටහන සමගින් අපගේ අවසාන ඉලක්කය වනුයේ රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේදී වඩාත් වේගවත්, කාර්යක්ෂම සහ නිරවද්‍ය වූ සේවාවක් අපගේ වටිනා සේවාලාභීන් වෙත ලබා දීමයි."

AIA ඉන්ෂුවරන්ස් හී ප්‍රධාන තාක්ෂණ නිලධාරී උමේෂ් ද ෆොන්සේකා සිය අදහස් දක්වමින් "කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය භාවිතයෙන් සමාගම තුළ අභ්‍යන්තර ක්‍රියාවලීන් වඩාත් වේගවත් සහ කාර්යක්ෂමව මෙන්ම කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ අවම මැදිහත්වීම සහ සහභාගීත්වය ඇතුව සිදු කෙරෙනු ඇති. මෙම විසඳුම සේවාලාභීන්හට වඩාත් පහසුවක් වනු ඇති අතර, අන්තර්ජාල පහසුකම් ඇති ඕනෑම උපාංගයක් භාවිතයෙන් ලොව ඕනෑම තැනක සිට ඊට පිවිසිය හැකිය. මෙම cloud සේවාව සමාගම පුරාවට ඇති විවිධ සේවාවන්ට සහ බහුවිධ පද්ධතිවලට අනුකූලව ක්‍රියාකරනු ඇති අතර, එමගින් ඉතාමත් පහසු, සුමට සේවා අත්දැකීමක් එය භාවිත කරන්නන්හට අත්පත් කරගත හැකිවනු ඇත. ඕනෑම යහක්‍රියාකාරිත්වයක් ලෙසම, සාම්ප්‍රදාය බිඳ දමමින් නැගී එන නව්‍යකරණය සිදුවිය යුත්තේ ද සමාගම ඇතුළතින්ම වන අතර, එමගින් අපගේ අගනා සේවාලාභීන් සැබෑ ප්‍රතිලාභ අත්විඳිනු ඇත. අපගේ මේ ප්‍රයත්නය ද ඒ සඳහාමයි!"

AIA ඉන්ෂුවරන්ස් හී අධ්‍යක්ෂිකා සහ ප්‍රධාන නිලධාරී නීති සහ මෙහෙයුම්, චතුරි මුණවීර මහත්මිය සිය අදහස් දක්වමින් "AIA හි අප, සේවාලාභීන්හට අසම සම පහසුකම් සහ සේවා ළඟා කරදිය හැකිවන අයුරින් අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් නිරතුරුව වැඩි දියුණු කරමින් සිටිමු. මෙම නව cloud පදනම් කරගත් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය, ව්‍යාපාරය පුරාවට ක්‍රියාවලීන් සහ මෙහෙයුම්වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට ඉවහල් වනු ඇති අතර, එමගින් සේවාලාභී අත්දැකීම වඩාත් සතුටුදායක තත්ත්වයක් දක්වා කළමනාකරණය කරවීම එමගින් සිදුවෙනු ඇත. මේ ඔස්සේ අපගේ අවසාන ඉලක්කය වනුයේ ව්‍යාපාරයේ වැඩි වර්ධනය සමගින්, සේවාලාභීන් සමාගම කෙරෙහි ඇති ලැදියාව වඩාත් වැඩි වර්ධනය කරවීමයි.

# LG ගම හදන නියමුවා ව්‍යාපෘතියේ ශ්‍රී ලංකාවේ පළමු නියමුවන් ප්‍රකාශයට පත් කෙරේ






ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන සඳහා ලොව සුපතළ නාමයක් වන LG සමාගම, Korea Friends of Hope International Sri Lanka සංවිධානය, ශ්‍රී ලංකාවේ කීර්තිමත් ව්‍යාපාරික නාමයක් වන අබාන්ස් ව්‍යාපාර සමූහය අතර සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාව තුළ දියත් කෙරෙන "LG ගම හදන නියමුවා" සමාජ සත්කාරක මෙහෙවරේ පළමු පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විට සූදානම් වෙමින් පවතියි.

KFHI - Sri Lanka සංවිධානයේ සභාපති choi මහතා සහ ලේකම් ලසිත නානායක්කාර මහතා පවසා සිටින්නේ, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල දුෂ්කර පහසුකම් මැද ජීවිතය ගත කරන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම උදෙසා මෙම වැඩසටහන දියත් කර ඇති බවයි. එමෙන්ම මෙම වැඩසටහන හරහා සෑම අයකුටම පෞද්ගලිකව තමාගේ ගම් ප්‍රදේශය වෙනුවෙන් තම යුතුකම ඉටු කිරීමේ අවස්ථාව හිමිවන බවත් ඒ මගින් ග්‍රාමීය සංවර්ධනයේ නියමුවෙකු බවට පත් වීමේ අවස්ථාව හිමිවන බවත් පවසා සිටියි.

මෙම වැඩසටහන සෑම වසරකම ලොව පුරා රටවල ක්‍රියාත්මක වන අතර, ඉදිරියේ දී වාර්ෂිකව ශ්‍රී ලංකාවේ ජන ජීවිතය ආලෝකමත් කිරීම සඳහා ද ක්‍රියාත්මක කිරීමට අදහස් කර ගෙන සිටියි.

මේ පිළිබඳ වැඩි දුරටත් අදහස් පළ කර සිටින ලසිත නානායක්කාර මහතා පවසා සිටින්නේ මෙම වැඩසටහන මේ වන විට බංගලාදේශය තුළ වාර්ෂිකව ක්‍රියාත්මක වන බවයි.

අබාන්ස් PLC වෙළඳනාම ප්‍රධානී බුද්ධික ධර්මවර්ධන මහතා පවසා සිටින්නේ, අතිනවීන නිෂ්පාදන ජන ජීවිතයට සමීප කරවීම මෙන්ම මේ අන්දමේ ප්‍රජා සත්කාරක සේවාවන්ට දායක වීම හරහා ශ්‍රී ලාංකික ජනතාව වෙත සුවිශේෂ මෙහෙවරක් සිය සමාගම විසින් සිදු කරන බවයි. "LG ගම හදන නියමුවා" ප්‍රජා සත්කාරක මෙහෙවර තමන්ගේ ගම් දනවුවල පවතින අඩු පාඩු හඳුනාගෙන ඒවා ඉටු කර ගැනීමට කදිම අවස්ථාවක් උදා කර දෙන බව පවසා සිටින ඒ මහතා එවැනි වැඩසටහනකට දායක වන්නට ලැබීම ආයතනයක් වශයෙන් ආඩම්බරයට කරුණක් බව පවසා සිටියි.

මෙම වැඩසටහන තුළ ප්‍රධාන වශයෙන් භෞතික, සෞඛ්‍ය, සංස්කෘතික සහ ක්‍රීඩා යන ක්ෂේත්‍ර 4 හරහා ගමේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය ආධාර උපකාර ලබා දීමට කටයුතු කරනු ලබයි. අවම පහසුකම් යටතේ ජීවත් වන ජනතාවට අතිශය වැදගත් වන ව්‍යාපෘති 4 ක් "LG ගම හදන නියමුවා" ප්‍රජා සත්කාරක මෙහෙවර සඳහා මේ වන විට තෝරා ගෙන ඇත.

01) පානීය ජල ව්‍යාපෘතිය – වවුනියාව, දරණිකුලම්

LG නියමුවා – කුනරත්නම් කජනගන් මහතා ව්‍යාපෘතියේ නම – දිවියට දිය බිඳක්

වවුනියාව, දරණිකුලම් හි වාසය කරන පවුල් 610 කට පානීය ජලය ලබා දීමේ සුවිශේෂී ව්‍යාපෘතියක් මෙහිදී ක්‍රියාත්මක කරනු ලබයි. එම ප්‍රදේශයේ ජනතාව බීමට ජලය සපයා ගන්නා අපිරිසිදු තත්ත්වයේ පවතින ළිඳ පිළිසකර කර දීමට මෙහිදී කටයුතු කරන අතර, ළිඳෙන් ලබා ගන්නා ජලය පිරිපහදු කිරීමට අවශ්‍ය අණී ජල පිරිපහදු පද්ධතියක් සවි කිරීමටද කටයුතු සම්පාදන වනු ඇත. පිරිසිදු පානීය ජලය නොමැතිකම නිසා මේ වන විටත් එම ග්‍රාමයේ ඇතැම් පිරිසක් වකුගඩු රෝගයට ගොදුරු වී සිටියි.

# එල් බී ෆිනෑන්ස් යළි SLIM - 'වසරේ මූල්‍ය සේවා සැපයුම්කරු'




එල් බී ෆිනෑන්ස් මූල්‍ය සමාගම තම ශක්තිය හා ස්ථාවරත්වය නැවත වරක් තහවුරු කරමින් SLIM ජනතා සම්මාන උළෙලේදී "වසරේ මූල්‍ය සේවා සැපයුම්කරු 2021" සම්මානයෙන් පිදුම් ලැබිය. පුරා වසර 50ක් ශ්‍රී ලාංකීය ජනතාවගේ මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලන එල් බී ෆිනෑන්ස් මූල්‍ය ආයතනය, විශිෂ්ට පාරිභෝගික සේවාවත්, විනිවිදභාවයත්, ශක්තිමත් ව්‍යාපාර ආචාරධර්ම හා මූල්‍ය ස්ථාවරත්වයත් නිසා බැංකු නොවන මූල්‍ය සමාගම් අතර විශ්වසනීය සන්නාමයක් හිමිකරගෙන ඇත.

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් (SLIM අලෙවිකරණය සඳහා වූ ජාතික පර්යේෂණ ආයතනය) ශ්‍රී ලංකා වෙළෙඳ නාමයන්ගේ සුවිශේෂී සේවය වෙනුවෙන් මෙම ජනතා සම්මාන උළෙල සංවිධාන කරයි.

සුවිශේෂී සේවාවන් තුළින් ජනතා හදවත් දිනාගත් වෙළඳ නාමයන්හී පාරිභෝගික කැමැත්ත පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා පුළුල් පර්යෂණ ක්‍රමවේදයක් මගින් SLIM ජනතා සම්මාන ප්‍රදානය කරයි. එහිදී දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි අහඹු ලෙස තෝරාගත් ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් වෙත ව්‍යුහාත්මක ප්‍රශ්නාවලියක් යොමු කරමින් සම්මුඛ සාකච්ඡා පවත්වා ප්‍රමාණාත්මක සමීක්ෂණයක් මෙම සම්මානය ප්‍රදානය සඳහා යොදාගනු ලබයි. එබැවින් මෙම සම්මානය මගින් සැබෑම ජනතාවගේ තේරීම පිළිඹිබු වේ.

"මෙම සම්මානය මගින් රටේ ජනතාවගේ කැමැත්ත පිළිබිඹු කරනවා. මූල්‍ය ආයතනයක් ලෙස අපගේ සාර්ථකත්වය රඳා පවතින්නේ ස්ථාවර මූල්‍ය සමාගමක් ලෙස අපගේ පාරිභෝගික ප්‍රජාව වෙත අප ලබා දෙන සේවාව මතයි. දශක පහක සේවාවක් තුළ, අපි වගකිව යුතු ව්‍යාපාරික භාවිතයන් තහවුරු කර ඇති අතර, අපගේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් හා විශේෂයෙන් අපගේ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉටුකිරීම, මෙම තිරසාර වර්ධනයේ හේතුවයි. ආයතනයක් ලෙස අපගේ ශක්තිය හා හැකියාව මෙන්ම විශේෂයෙන්ම අපගේ විශ්වසනීයත්වය නිසා අඛණ්ඩව තුන් වන වසරටත් මෙම ජනතා සම්මානය දිනාගැනීමට හැකි වී තිබෙනවා" යැයි එල් බී ෆිනෑන්ස් කළමනාකාර අධ්‍යක්ෂ සුමිත් ආදිහෙට්ටි මහතා පැවසීය.

අභියෝගාත්මක ආර්ථික තත්ත්වයකදී වුවද සියලුම පාර්ශ්වකරුවන්ට වගවීම, විනිවිදභාවය සහ මූල්‍ය ස්ථායිතාව පිළිබඳ එල් .බී ෆිනෑන්ස් ආයතනය එහි අගයන් දිගටම පවත්වා ගෙන යෑමට සමත්ව ඇත. පාරිභෝගිකයින් වෙත පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් ලබා දෙමින් ඔවුන්ගේ සාර්ථකත්වයේ හා දියුණුවේ හවුල්කරුවකු ලෙස එල් .බී ෆිනෑන්ස් කටයුතු කරයි. වෙනස් වන ආර්ථික තත්වයන් හමුවේ එල් බී ෆිනෑන්ස් ආයතනය මූල්‍ය සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා නවෝත්පාදන, සයිබර් ආරක්ෂණ පිළිවෙත්, මුදල් විශුද්ධිකරණ විරෝධි පිළිවෙත් සහ අවදානම් අවම කිරීමේ පියවර අනුගමනය කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් වන LB Finance මූල්‍ය සමාගම, 2011 මූල්‍ය ව්‍යාපාර පනතේ අංක 42 යටතේ කොළඹ කොටස් වෙළෙඳපොළේ ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත මූල්‍ය සමාගමකි. LB Finance වෙතින් ලීසිං, ෆැක්ටරින්, ක්ෂුද්‍ර මූල්‍ය, දේපළ ණය, නිවාස ණය, පුද්ගලික ණය, අධ්‍යාපනික ණය, රන් ණය, ස්ථාවර තැන්පතු ඉතිරිකිරීමේ ගිණුම්, විදේශ මුදල් හුවමාරු, Western Union ඇතුළු මූල්‍ය පහසුකම් දිවයින පුරා විහිදුණු ශාඛා හා රන් ණය මධ්‍යස්ථාන වෙතින් ලබා ගත හැක. LB Finance ආයතනය ෆිට් රේටින් හි ඒ - අගය සහිත ස්ථාවර මූල්‍ය සමාගමකි.

# ශ්‍රී ලංකාවේ විශාලතම කාර්යාල සංකීර්ණය සෙත්සිරිපාය අදියර III ඉදිකිරීම MAGA ආරම්භ කරයි

රජයේ පරිපාලන කේන්ද්‍රස්ථානය වන බත්තරමුල්ලේ පවතින සෙත්සිරිපාය අදියර III සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු මාග ඉංජිනේරු සමාගම විසින් ආරම්භ කර ඇත. වර්ග අඩි මිලියන 1.3 කට වඩා වැඩි බිම් ප්‍රමාණයක පිහිටුවනු ලබන මහල් 25 කින් යුත් මෙම අති නවීන කාර්යාල ගොඩනැගිල්ල, ලංකාවේ විශාලතම කාර්යාල සංකීර්ණය බවට පත්වනු ඇත. නගරය පුරා විසිරී ඇති අමාත්‍යාංශ, රාජ්‍ය සංස්ථා, දෙපාර්තමේන්තු සහ රජයේ කාර්යාල එක් ස්ථානයකට ගෙන ඒමට මෙම ව්‍යාපෘතිය මගින් හැකිවනු ඇත. මෙම ව්‍යාපෘතිය නිසා කොළඹ නගරයේ රථවාහන තදබදය අවම කිරීමට දායක වනවා සේම විවිධ සේවා එකම පරිශ්‍රයකින් ලබා ගැනීමේ හැකියාවද මහජනයාට ලැබෙනු ඇත. එමෙන්ම රජයේ ආයතන මෙන්ම අර්ධ රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය වන කාර්යාල පරිශ්‍ර එකම ස්ථානයක ලබාදීමේ ඉලක්කයද මෙමගින් සපිරෙනු ඇත.

යෝජිත සංකීර්ණය සෙත්සිරිපාය අදියර I සහ II ගොඩනැගිලිවලට යාබදව, අක්කර 4.3 ක භූමියක ස්ථාපිත කරනු ඇත. නවීන කාර්යාල පරිශ්‍ර, බහුකාර්ය ශාලා, රැස්වීම් සහ සම්මන්ත්‍රණ පහසුකම්, වාණිජ ප්‍රදේශ, ආපනශාලා සහ වාහන 700 ක් නැවැත්විය හැකි විශාල රථගාලක් ආදිය මෙයට ඇතුළත් වේ. සෙත්සිරිපාය අදියර III හි 7,500 කට අධික කාර්ය මණ්ඩලයකට මෙන්ම විවිධ අවශ්‍යතාවයන් සඳහා එදිනෙදා පැමිණෙන



1,000 ක් පමණ අමුත්තන්ට ඉඩකඩ පහසුකම ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බිලියන 16.7 ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් මෙම ව්‍යාපෘතියේ පූර්ණ හිමිකාරිත්වය නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සතුවන අතර, එය "ප්‍රජා කේන්ද්‍රිය සංවර්ධනය සහ ප්‍රවේශ විය හැකි ඵලදායී රාජ්‍ය සේවාවක්" සඳහා වන ශ්‍රී ලංකා රජයේ දැක්මෙහි එක් අංගයකි. ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක කටයුතු සම්බන්ධ උපදේශනය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම්, ව්‍යාපෘති කළමනාකරණය සහ උපදේශන අංශය විසින් සිදු කරනු ලබන අතර, මාග ඉංජිනේරු (පුද්ගලික) සමාගම ව්‍යාපෘතියේ ඉංජිනේරු සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධ වගකීම් දරයි. ව්‍යාපෘතිය ආරම්භයේදී මාග සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ එම්.ජී. කුලරත්න මහතා මෙසේ අදහස් දැක්විය. "ශ්‍රී ලංකාවේ විශාලතම රජයේ කාර්යාල සංකීර්ණය ඉදිකිරීමේ වගකීම අපට ලැබීම සැබවින්ම ආඩම්බරයක්. කොළඹ රේගු මූලස්ථානය සහ භාණ්ඩාගාර ගොඩනැගිල්ල තව දුරටත් පුළුල් කිරීම වැනි රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකරදීමේ අපගේ අභිමානවත් වාර්තාවට මෙම සෙත්සිරිපාය ව්‍යාපෘතිය එකතු වනු ඇත."

ගොඩනැගිලි නිර්මාණ ශිල්පී ආනන්ද සමරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නාගරික සංවර්ධන අධිකාරියේ වාස්තු විද්‍යා කණ්ඩායම විසින් සැලසුම් කරන ලද මෙම දැවැන්ත කාර්යාල සංකීර්ණය දිවා ආලෝකය සුලභව ලැබෙන, එමෙන්ම මැනවින් වාතාශ්‍රය සහිත මධ්‍යම ශාලාවක් සිසාරා ඇති, ප්‍රධාන පර්යන්ත දෙකක් දරා සිටින ශක්තිමත් අත්තිවාරමකින් සමන්විත වෙයි. රැකියා කටයුතු සඳහා කාර්යාල පෙදෙස් මෙන්ම රාජකාරිවලට සහ විවිධ අවශ්‍යතා සඳහා පැමිණෙන්නන්ට විශාල පොදු පරිශ්‍රයකින්ද මෙම සංකීර්ණය සමන්විත වේ.

# ස්ටාර් ගාමන්ට්ස් එකොළොස් වැනි කර්මාන්තශාලාව බුත්තල දී විවෘත කෙරේ

ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර ඇඟලුම් නිෂ්පාදන සමාගම් සමූහයක් වන ස්ටාර් ගාමන්ට්ස් සමූහය ('Star') අති නවීන තාක්ෂණයෙන් සවිබලගැන්වූ ඔවුන්ගේ නවතම කර්මාන්තශාලාව මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල දී පසුගියදා විවෘත කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථිකයන් සංවර්ධනය වෙනුවෙන් සහයෝගය ලබා දීමේ දැක්ම මූලික කරගනිමින් මෙම ස්ටාර් ගාමන්ට් කර්මාන්තශාලාව විවෘත කිරීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන ස්ටාර් ගාමන්ට් සමූහයට එක්වන එකොළොස් වැනි කර්මාන්ත ශාලාව වන මෙය 1,000කට වැඩි පිරිසකට රැකියා අවස්ථා නිර්මාණය කරදී තිබේ.



**Komar සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී - චාර්ලි කෝමාර් (වමේ) සහ ස්ටාර් ගාමන්ට් සමූහයේ කළමනාකාර අධ්‍යක්ෂ - ඒ. සුකුමාරන් යන මහත්වරුන්**

ඇඟලුම් කර්මාන්තශාලාවක් සතුව තිබිය යුතු අති නවීන යටිතල පහසුකම් හා තාක්ෂණයෙන් බුත්තල ස්ටාර් ගාමන්ට් කර්මාන්ත ශාලාව සවිබල ගන්වා තිබෙන අතර,ලෝකයේ කීර්තිමත් ඇඟලුම් සන්නාමයන් සඳහා knit clothing නිෂ්පාදන සැපයීමට කටයුතු සිදු කරයි. මෙම ඇඟලුම් කර්මාන්තශාලාව මගින් සෑම මසකම රුපියල් මිලියන 60කට වැඩි සෘජු ආදායමක් දේශීය ප්‍රජාව වෙත ලැබෙන අතර, ඇමෙරිකන් ඩොලර් මිලියන 12කට ආසන්න අපනයන ආදායමක් වාර්ෂිකව උත්පාදනය කරනු ලබයි.

බුත්තල ස්ටාර් ගාමන්ට්ස් ඇඟළුම් කර්මාන්තශාලාව විවෘත කරමින් Komar සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී චාර්ලි කොමාර් මහතා මෙසේ පවසා සිටියේය.

"ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයෙහි සංවර්ධනය වෙනුවෙන් අප දක්වන කැපවීම මෙවැනි ආයෝජන මගින් වැඩිදුරටත් තහවුරු කෙරෙනවා. ඒ වගේම මෙරට ග්‍රාමීය ආර්ථික පසුබිම සවිබලගැන්වීමටද මෙවැනි ආයෝජන මගින් ලැබෙන්නේ විශාල දායකත්වයක්. ඇඟලුම් කර්මාන්තයෙහි අනාගතය වෙනුවෙන් මෙවැනි ආයෝජනයන් අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා අපගේ දායකත්වය උපරිමව ලබා දෙන්නට හැකිවීම අපට ආඩම්බරයක්. සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැර වෙමින් ඉදිරියට යන ප්‍රජාවන් හා සාර්ථක ව්‍යාපාරයන් ඇතිකිරීම වෙනුවෙන් දායකත්වය ලබා දීමට අපි මෙවැනි අභියෝගාත්මක ආයෝජනයන් සිදුකරන්නට පසුබට වන්නේ නෑ."

ස්ටාර් සමාගම ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයෙහි වර්ධනය වෙනුවෙන් ප්‍රබල දායකත්වයක් ලබා දෙන අතර, දශක හතරකට වැඩි කාලයක් ඇඟලුම් කර්මාන්තයට සම්බන්ධව කටයුතු කරන පළපුරුදු සමාගමකි. ජත්‍යන්තර මට්ටමේ ඇඟලුම් නිෂ්පාදනයෙහි හා බෙදා හැරීමෙහි නිරත සමාගමක් වශයෙන් මේ වන විට 8,000කට වැඩි ශ්‍රී ලාංකිකයින් පිරිසකට රැකියා අවස්ථා නිර්මාණය කරදී තිබෙන ස්ටාර් ගාමන්ට්ස් යනු මෙරට ක්‍රියාත්මක වඩාත් නව්‍යකරණ හා තිරසාර ව්‍යාපාරයකි.

සමාගමේ වර්ග අඩි 70,000ක නව්‍යකරණ මධ්‍යස්ථානය 2020 වර්ෂයේ පැවැති AIA New York's annual Design Awards සම්මාන උළෙලෙහි කුසලතා සම්මානයෙන් පිදුම් ලැබීය. අග්නිදිග ආසියානු කලාපයෙහි පළමු Passive House design නිර්මාණය වන්නේද එයයි. අද වන විට ස්ටාර් ගාමන්ට් ඇඟලුම් සමාගමේ කර්මාන්තශාලා 14 සඳහාම CarbonNeutral® සහතිකය ලබා ගෙන තිබෙන අතර, එය ශ්‍රී ලංකාවේ දැවැන්තම carbon neutral සමාගම බවටද පත්ව සිටී. තම සමූහයට අයත් සෑම කර්මාන්තශාලාවක් සඳහාම ජාත්‍යන්තර carbon neutral සහතිකය හිමිව තිබෙන ශ්‍රී ලංකාවේ එකම ඇඟලුම් නිෂ්පාදන සමාගම වන්නේද ස්ටාර් ගාමන්ට්ස් ය.

වෂී 2021ක් වූ අප්‍රේල් මස 04 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.